# අභිධර්මචන්ද්‍රිකාව


## පූජ්‍ය පණ්ඩිත මාතර ශ්‍රී ධර්මවංශ
**ස්ථවිරපාදයන් වහන්සේ**
**විසින්**
**සම්පාදිතයි.**



පෙරවදන ........ 6

පළමු වන චිත්ත පාදය ........ 7

1. ද්විවිධ දේශනා ........ 7
2. චතුර්විධ අභිධර්මාර්ථ ........ 8
3. චතුර්විධ චිත්ත ........ 9
4. චාතුර්භූමක සිත් ........ 10
5. දෙළොස් අකුසල් සිත් ........ 11
6. දෙස මූලික සිත් (2) දෙක ........ 14
7. මෝහමූලික සිත් (2) දෙක ........ 14
8. අටළොස් (18) අහෙතුක සිත් ........ 15
9. කුසල අහෙතුක විපාක සිත් (8) අට. ........ 17
10. අහේතුක ක්‍රියා සිත් (3) තුන. ........ 19
11. කාමාවචර කුසල සිත් (8) අට ........ 20
12. කාමාවචර සහේතුක විපාක සිත් (8) අට. ........ 22
13. කාමාවචර සහේතුක ක්‍රියා සිත් අට ........ 24
14. රූපාවචර කුසල සිත් (5) පස ........ 25
15. රූපාවචර විපාක සිත් පස ........ 27
16. රූපාවචර ක්‍රියා සිත් පස. ........ 29
17. අරූපාවචර කුසල සිත් සතර. ........ 30

18. අරූපාවචර විපාක සිත් සතර. ....... 32
19. අරූපාවචර ක්‍රියා සිත් (4) සතර. ....... 33
20. ලෝකෝත්තර කුසල සිත් (4) සතර ....... 34
21. ලෝකෝත්තර විපාක සිත් (4) සතර ....... 36
22. සංග්‍රහ ගීතිකා ....... 37
23. ලෝකෝත්තර සිත් (40) සතළිස ....... 39
දෙවන චෛතසික පාදය. ....... 42
1. දෙපණස් චෛතසික. ....... 42
2. සබ්බචිත්ත සාධාරණ චෛතසික සත. ....... 44
3. පකිණ්ණක චෛතසික සය. ....... 47
4. තුදුස් අකුසල චෛතසික. ....... 50
5. පස්විසි (25) සෝභන චෛතසික ....... 53
6. එකුන් විසි සෝභන සාධාරණ. ....... 54
7. විරති තුන ....... 57
8. අප්පමඤ්ඤා-පඤ්ඤා ....... 58
9. ලොකොත්තර සිත්හි යෙදෙන චෛතසික. ....... 60
10. මහග්ගත සිත්හි යෙදෙන චෛතසික. ....... 61
11. කාමාවචර සොභන සිත්හි යෙදෙන චෛතසික. ....... 63
12. අකුසල සිත්හි යෙදෙන චෛතසික. ....... 64
13. අහේතුක සිත්හි යෙදෙන චෛතසික ....... 66
14. සංග්‍රහ ගීතිකා. ....... 67
තුන්වන ප්‍රකීර්ණක පාදය. ....... 72
1. තෙපණස් සම්ප්‍රයුක්ත ධර්ම ....... 72
2. වෙදනා සංග්‍රහය. ....... 73
3. හෙතු සංග්‍රහය ....... 75
4. කෘත්‍ය සංග්‍රහය (පළමුවන කොටස) ....... 77
5. කෘත්‍ය සංග්‍රහය (දෙවන කොටස) ....... 79
6. කෘත්‍ය සංග්‍රහය. (තෙවන කොටස) ....... 81
7. කෘත්‍ය සංග්‍රහය. (සතරවන කොටස) ....... 83
8. කෘත්‍ය සංග්‍රහය. (පස්වන කොටස) ....... 86
9. ද්වාර සංග්‍රහය. (පළමුවන කොටස) ....... 88
10. ද්වාර සංග්‍රහය. (දෙවන කොටස) ....... 90
11. ආලම්බන සංග්‍රහය. (පළමුවන කොටස) ....... 92

12. ආලම්බන සංග්‍රහය. (දෙවන කොටස) ........ 95

13. වස්තු සංග්‍රහය. ........ 98

සතරවන වීථි පාදය. ........ 101

1. ෂට්ක සය. ........ 101

2. චක්ඛුද්වාරික අතිමහන්තාරම්මණ චිත්ත වීථිය. ........ 103

3. චක්ඛුද්වාරික මහන්තාරම්මණ චිත්ත වීථි. ........ 106

4. චක්ඛුද්වාරික පරිත්තාරම්මණ චිත්ත වීථි. ........ 108

5. චක්ඛුද්වාරික අතිපරිත්තාරම්මණ චිත්ත වීථි. ........ 111

6. පරිත්ත මනොද්වාරික චිත්ත වීථි. ........ 114

7. අර්පණා චිත්ත වීථි ........ 117

8. අර්පණා නියමය. ........ 121

9. තදාලම්බන නියමය ........ 124

10. ජවන නියමය. ........ 127

11. පුද්ගල භේදය. ........ 130

12. භූමි විභාගය. ........ 132

පස්වන වීථිමුක්ත පාදය. ........ 134

1. චතුෂ්ක සතර. ........ 134

2. චතුර්විධ භූමි ........ 135

3. රූප භූමි හා අරූප භූමි. ........ 137

4. චතුර්විධ ප්‍රතිසන්ධි ........ 139

5. රූපාවචර අරූපාවචර ප්‍රතිසන්ධි ........ 142

6. චතුර්විධ කර්ම ........ 144

7. චතුර්විධ කර්ම (ගරුකාදි සතර) ........ 146

8. චතුර්විධ කර්ම (අකුශල) ........ 148

9. චතුර්විධ කර්ම. (කුශල) ........ 152

10. චතුර්විධ කර්මයන්ගේ විපාක ස්ථාන ........ 155

11. චතුර්විධ මරණොත්පත්ති ........ 159

සවන රූප පාදය. ........ 167

1. රූප සමුද්දේශය. ........ 167

2. රූප සමුද්දේශය (සතර මහාභූතරූප) ........ 169

3. රූප සමුද්දේසය (සූවිසි උපාදය රූප. පඤ්චපසාද.) ........ 172

4. රූප සමුද්දේශය (සූවිසි උපාදය රූප, විසය රූප) ........ 175

5. රූප සමුද්දේශය (සූවිසි උපාදය රූපː- භාව හදය ජීවිත ආහාර.) ........ 177

6. රූපසමුද්දේශය (සූවිසි උපාදාය රූප, පරිච්ඡේද විඤ්ඤත්ති විකාර ලක්ෂණ) ... 181

7. රූප විභාගය. ... 184

8. රූප සමුට්ඨාන. ... 187

9. රූප කලාප. ... 191

10. රූප ප්‍රවෘත්ති ක්‍රම. ... 194

11. රූප ප්‍රවෘත්ති ක්‍රම (දෙවන කොටස.) ... 198

12. නිර්වාණය. ... 199

සත්වන සමුච්චය පාදය. ... 203

1. වස්තු ධර්ම හා චතුර්විධ සංග්‍රහ ... 203

2. අකුසල සංග්‍රහය (ආසව, ඕඝ, යොග, ගන්ථ උපාදාන) ... 204

3. අකුසල සංග්‍රහය (නීවරණ, අනුශය, සංයෝජන, කිලෙස.) ... 207

4. මිශ්‍රක සංග්‍රහය ... 211

5. මිශ්‍රක සංග්‍රහය (බල, අධිපති.) ... 216

6. මිශ්‍රක සංග්‍රහය. (ආහාර) ... 218

7. බෝධිපාක්ෂික සංග්‍රහය. ... 221

8. බෝධිපාක්ෂික ධර්ම (සෘද්ධිපාද, ඉන්ද්‍රිය, බල) ... 224

9. බෝධිපාක්ෂික ධර්ම (සම්බොජ්ඣඞ්ග, මග්ගඞ්ග) ... 226

10. බෝධිපාක්ෂික සංග්‍රහය (තුදුස) (14) (පන්තිස) (35) වන සැටි.) ... 228

11. සර්ව සංග්‍රහය. ... 231

12. සර්වසංග්‍රහය (ආයතන, ධාතු, සත්‍ය) ... 233

අටවන පටිච්චසමුප්පාද පාදය. ... 238

1. ප්‍රත්‍යය හා ප්‍රත්‍යයොත්පන්න ... 238

2. පටිච්ච සමුප්පාද නය. ... 240

3. අවිද්‍යා ප්‍රත්‍යයයෙන් සංස්කාර වන්නේ ය. ... 242

4. සංස්කාර ප්‍රත්‍යයයෙන් විඥානවන්නේ ය. ... 244

5. විඥාන ප්‍රත්‍යයයෙන් නාමරූප වන්නේ ය. ... 248

6. නාම රූප ප්‍රත්‍යයයෙන් ෂඩායතන වන්නේ ය. ... 251

7. වේදනා ප්‍රත්‍යයයෙන් තෘෂ්ණා වන්නේ ය. ... 253

8. උපාදාන ප්‍රත්‍යයයෙන් භව වන්නේ ය. ... 256

9. අද්ධ, අඞ්ග, ආකාර, සන්ධි, සංක්ෂෙප, වට්ට, මූල. ... 259

10. සත්‍ය ප්‍රභව, කෘත්‍ය, වාරණ, උපමා, ගම්භීර, නය. ... 263

11. පට්ඨාන නය. ... 266

12 1. හේතු ප්‍රත්‍යය, 2. ආරම්මණ පච්චය, 3. අධිපති පච්චය. ... 267

13 4. අනන්තර ප්‍රත්‍යය, 5. සමනංතර ප්‍රත්‍යය, 6. සහජාත ප්‍රත්‍යය. ..... 270

14 7 අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය, 8 නිස්සය ප්‍රත්‍යය, 9 උපනිස්සය ප්‍රත්‍යය..... 273

15 10 පුරෙජාත ප්‍රත්‍යය, 11 පච්ඡාජාත පච්චය, 12 ආසෙවන ප්‍රත්‍යය, 13 කර්ම ප්‍රත්‍යය, 14 විපාක ප්‍රත්‍යය. . 276

16 15 ආහාර ප්‍රත්‍යය, 16 ඉන්ද්‍රිය ප්‍රත්‍යය, 17 ධ්‍යාන ප්‍රත්‍යය, 18 මාර්ග ප්‍රත්‍යය, 19 සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය. ..... 279

17. 20 විප්පයුත්ත ප්‍රත්‍යය, 21 අස්තිප්‍රත්‍යය, 22 නාස්ති ප්‍රත්‍යය 23 විගත ප්‍රත්‍යය, 24 අවිගත ප්‍රත්‍යය. ..... 282

18. පටිච්චසමුප්පාදයෙහි පට්ඨාන නය. ..... 285

19. සූවිසි පට්ඨාන පිළිබඳ ෂඩ්විධ සඞ්ග්‍රහය..... 288

20. සූවිසි පට්ඨාන පිළිබඳ ෂඩ්විධ සංග්‍රහ (දෙවන කොටස)..... 291

21. පට්ඨාන ප්‍රත්‍යය සංග්‍රහ. ..... 294

22. ප්‍රඥප්ති. ..... 296

නවවන කර්මස්ථාන පාදය..... 300

1. සමථ භාවනා හා විදර්ශනා භාවනා. ..... 300

2. දස කසිණ. ..... 302

3. දස අසුභ, දස අනුසසති..... 304

4. චතුඅප්පමඤ්ඤා, ආහාරපටික්කූලසඤ්ඤා, චතුධාතු වවත්ථාන, චතුරාරුප්ප..... 307

5. චරිතානුකූල කර්මස්ථාන..... 309

6. ත්‍රිවිධ භාවනා හා ත්‍රිවිධ නිමිති. ..... 311

7. පඨවිකසිණය වඩා ප්‍රථමධ්‍යානය ලබා ගන්නා ආකාරය..... 314

8. පංචවිධ වසිතා හා ද්විතීය ධ්‍යානාදිය..... 317

9. අරූපාවචර ධ්‍යාන ..... 320

10. (පඤ්චාභිඥා) සෘද්ධිවිධි. ..... 322

11. (පංචාභිඥා) දිබ්බසොත, පරචිත්ත විජානන, පුබ්බෙනිවාසානුස්සති, දිබ්බචක්ඛු. ..... 326

12. විදර්ශනා කර්මස්ථානය..... 330

13. (සප්ත විශුද්ධි) සීල විසුද්ධිය. ..... 331

14. චිත්ත විසුද්ධි, දිට්ඨි විසුද්ධි, කංඛාවිතරණ විසුද්ධි. ..... 333

15. මග්ගාමග්ගඤාණදස්සන විසුද්ධිය..... 336

16. මග්ගාමග්ගඤාණදස්සන විසුද්ධිය. උදයව්‍යය විදර්ශනාව හා විදර්ශනොපක්ලෙශ..... 340

17. පටිපදාඤාණදස්සන විසුද්ධිය. ..... 344

18. ඤාණදස්සන විසුද්ධිය..... 348

19. ලක්ෂණ, අනුපස්සනා, විමොක්ෂ, විමොක්ෂමුඛ. ..... 351

20. සමාපත්ති භෙදය. ..... 353

# පෙරවදන

දහම් පාසල් විභාග පැවැත්වීම පෙරසේම කරගෙන යාමට කොළඹ තරුණ බෞද්ධ සංගමයට 1978 මාර්තු මස 03 වැනි දින රජය මගින් නැවත පවරන ලදී. ඉකුත් තුන් වසර තුළ දහම් පාසල් අධ්‍යාපනය විධිමත් කොට, එක් එක් ශ්‍රේණියට අවශ්‍ය සියලු පාඩම් සඳහා එක් එක් පොත බැගින් පළකරවන ලදි. එබැවින් දැනට මූලික ශ්‍රේණියේ සිට 9 වැනි ශ්‍රේණිය ඇතුළුව පන්ති පාඩම් පොත් 9 ක් දහම් පාසල්වලට භාවිත වේ.

එහෙත් දම් පාසල් ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ට අභිධර්මය සරල බසින් ඉගැන්වීමට සුදුසු පොතක් නැතිවීම බලවත් පාඩුවක් ලෙස බොහෝ දෙනා අපට නොයෙක්වර පැමිණිලි කර ඇත. අපරදිග ජනතාව පවා මනෝවිද්‍යාව කෙරෙහි විශාල උනන්දුවක් දවන මේ යුගයේ අභිධර්මය ඉගෙන ගැනීමෙන් සිත පිළිබඳව මනා අවබෝධයක් ලබාගෙන ජීවිතය නියමාකාරයෙන් හැඩගස්වා ගැනීමට හැකිවන බව නොඅනුමානයි.

එදිනෙදා ජීවිතයේදී සැම කෙනෙකුටම විවිධ ප්‍රශ්න හා ගැටළුවලට මුහුණ පෑමට සිදුවේ. මේවා පිළිබඳව නියමාකාර හැඟීමක් තිබේනම් අවාසනාවන්ත දුක්ඛදායක සිදුවීම්වලින් මිදී ගැටළු නිරාකරණය කර ගැනීමට පහසුවෙනවා ඇත.

ගැඹුරු ධර්මයක් වන අභිධර්මය පාසල් සිසුනට ප්‍රගුණ කරවීමට මේ පොතේ ඇති පාඩම් බෙහෙවින් උපකාර වේයයි සිතමි.

අභිධර්මය හැදෑරීම සම්බන්ධයෙන් උගතුන් වැඩි දෙනෙකුගේ පිළිගැනීම පූජ්‍ය පණ්ඩිත මාතර ශ්‍රී ධර්මවංශ නාහිමියන්ගේ කාණ්ඩ නවයකින් යුක්ත පොත් පෙළ දහම් පාසල් සඳහා සුදුසු බවයි. එබැවින් ඒ පොත් පෙළේ පළමුවන කාණ්ඩය වන මේ පොත පළ කිරීමට අප විසින් තීරණය කරන ලදි.

පූජ්‍ය වලස්ගල පුණ්ණජි මයුරවංශ ස්වාමීන් වහන්සේ මේ පොත් පෙළ පළකිරීමට බලය අප වෙත පැවරීමෙන් කරන ලද අනුග්‍රහය ගැන උන්වහන්සේට අපගේ ගෞරවාදර ස්තුතිය පුදකරමි.

තවද මෙම ග්‍රන්ථය මුද්‍රණය කිරීමට මා දිරි ගැන්වූ අප සංගමයේ ගරු සභාපති තැන්පත් රාජනීතිඥ සිරි පෙරේරා මැතිතුමාටත් මගේ කෘතඥතා පූර්වක ගෞරවය හා ස්තුතිය පුදකරමි.

මෙයට ශාසනස්ප්‍රීතිකාමී,
**ඩී.සී. ශ්‍රී දිල්ලිමුනි**
ධර්ම පරීක්ෂණ පිළිබඳ ගරු ලේකම්.

තරුණ බෞද්ධ සංගමය,
කොළඹ 08.
07. 03. 81.

# අභිධර්මචන්ද්‍රිකාව

## පළමු වන චිත්ත පාදය

**නමො භගවතො සම්බුද්ධස්ස**

## 1. ද්විවිධ දේශනා

**1 සම්මුති දේශනා, 2 පරමත්‍ථ දේශනා** යයි බුදුරජාණන් වහන්සේගේ ධර්ම දේශනා දෙ වැදැරුම් වේ. සම්මුති දේශනා නම් සත්ත්ව, පුද්ගල, ස්ත්‍රී, පුරුෂ, දෙව, බ්‍රහ්ම, වෘක්‍ෂ, පර්වත යනාදී වශයෙන් ලෝක ව්‍යවහාරය නොඉක්මැ ලෝක ව්‍යවහාරයෙහි පිහිටා වදාළ දේශනා ය. පරමත්‍ථ දේශනා නම් ලෝක ව්‍යවහාරය ඉක්මැ ලෝක ව්‍යවහාරයෙහි නොපිහිටා ස්කන්‍ධ, ධාතු ආයතන යනාදී වශයෙන් ඒ ඒ ධර්මයන්ගේ අවිපරිතාර්ථය (- නො පෙරළෙන සුලු අර්ථය) ගෙනැ වදාළ දේශනා ය.

සම්මුති සත්‍ය පරමාර්ථ සත්‍ය, යනුදු මෙයට පරියාය නාම යː මෙයින් **සම්මුති** දේශනාව බොහෝ සෙයින් **විනය පිටකයෙහි** හා **සූත්‍ර පිටකයෙහි** ඇතුළත් ය. **පරමත්‍ථ** දේශනාව **අභිධර්මපිටකයෙහි** ඇතුළත් ය. ලෝක සම්මුතිය හෙයින් සම්මුතිය ද සත්‍ය ය. ධර්මයන්ගේ අවිපරිතාර්ථ හෙයින් පරමාර්ථය ද සත්‍ය ය. සම්බුද්ධයන් වහන්සේ සම්මුති ධර්මය අසා නිවන් අවබෝධ කරන්නවුන්ට එයින් ද, පරමාර්ථ ධර්මය අසා නිවන් අවබෝධ කරන්නවුන්ට එයින් ද ධර්මය වදාරන සේක.

### ප්‍රශ්න

1. බුද්ධ දේශනාව කී වැදැරුම් ද?
2. සම්මුති දේශනා, පරමාර්ථ දේශනා යනු කිම?
3. සම්මුති ව්‍යවහාරය බොරු නො වන්නේ මන්ද?
4. බුද්ධදාස, සඳුන්, සතිපට්ඨාන, ඉන්‍ද්‍රිය මනුෂ්‍ය යන මොවුන් අතුරෙන් සම්මුති කුමක් ද? පරමාර්ථ, කුමක් ද?

5. බුදුරජාණන් වහන්සේ කුමක් හෙයින් මේ දෙ ආකාරයෙකින් ධර්මදේශනා කරන සේක් ද?

## 2. චතුර්විධ අභිධර්මාර්ථ

**"තත්‍ථ වුත්තාභිධම්මත්‍ථා - චතුධා පරමත්‍ථතො,**
**චිත්තං චෙතසිකං රූපං - නිබ්බාණමිති සබ්බථා"**

1-චිත්ත, 2-චෛතසික, 3-රූප, 4-නිර්වාණය යි අභිධර්මපිටකයෙහි වදාළ තාක් අර්ථ පරමාර්ථ වශයෙන් සිව් වැදෑරුම් වේ. මෙහි අර්ථ නම් කුශලාදිය හා ස්කන්‍ධාදිය යි.

1. සිතන්නේ හෙවත් අරමුණ දැනැගන්නේ චිත්තය. සිත ඉපදීම පිළිබඳ කියයුතු අන්‍ය හේතු ඇත ද අරමුණ දැනගැන්ම එහි ප්‍රධාන හේතුව බව දතයුතු යි. අරමුණක් නැති වැ සිත කිසි කලෙකත් නූපදනා බැවිනි. අරමුණ දැනගන්නා යන අර්ථයෙන් සිත එකක් ම වියයුතු නමුදු මතු කියනු ලබන චෛතසිකයන්ගේ අසමාන සම්බන්ධය හේතු කොටැ ගෙනැ එය 89 ආකාර හෝ 121 ආකාර වන්නේය.

2. චිත්තයෙහි වූවෝ හෙවත් චිත්තයෙහි යෙදුණෝ චෛතසිකයෝ ය. ඔහු වනාහි ඵස්ස, වෙදනා, සඤ්ඤා, චෙතනා යනාදී වශයෙන් දෙපණස් (52) වැදෑරුම් වෙත්. කකාරා ගත් කෂායයෙහි ජලය චිත්තය මෙන් ද ඒ ජලයෙහි ඇතුළත් වූ නානාවිධ බෙහෙත් රස චෛතසික මෙන් ද සැලකිය යුතු. චිත්තය නැති වැ කිසි චෛතසිකයක් නූපදනා බැවින් චිත්තය ප්‍රධාන ය. චෛතසිකයෝ අප්‍රධානයහ. "**මනොපුබ්බඞ්ගමා ධම්මා**" = ධර්මයෝ චිත්තය පූර්වඞ්ගම කොට ඇත්තෝ ය, යනු ධර්මපියා යි. මෙහි ධම්ම ශබ්දයෙන් කියවුණේ චෛතසික යි.

3. ශීත උෂ්ණාදියෙන් විකාරයට පැමිණෙන්නේ රූපය. අරූප ධර්මයන්ගේ ද එසේ විකාරයට පැමිණීම ඇතත් එහි රූප ව්‍යවහාරය නො ලැබේ. ශීත උෂ්ණාදිය කරණකොටැ ප්‍රකට වූ විකාරය රූපයෙහි ම ඇති බැවිනි. චිත්තාදි අරූපයෙහි එබන්දක් නැති බැවිනි. ඒ රූපය ද පඨවි ආදි වශයෙන් අටවිසි (28) වැදෑරුම් වේ.

4. වාන යනු තෘෂ්ණාව ය. ඒ වාන සංඛ්‍යාත තෘෂ්ණායෙන් නික්මුණේ නිර්වාණ ය. රාග ගිනි ආදිය නිවන්නේ හෝ නිර්වාණ යි. ඒ වනාහි මාර්ග-ඵල චිත්තයන්ට අරමුණු වූ අසංඛත ධාතුව බව දතයුතු. අසංඛත නම් ප්‍රත්‍යයයෙන් නූපන්.

### ප්‍රශ්න

1. අභිධර්මාර්ථ කී වැදෑරුම් ද? ඔහු කවරහු ද?
2. චිත්තය යනු කිම? ඒ කී වැදෑරුම් ද? අරමුණක් නැති වැ සිත උපදනේ ද?

3. චෛතසික යනු කිම? ඒ කී වැදෑරුම් ද? චිත්ත චෛතසිකයන්ගෙන් ප්‍රධාන කවර ද? ඒ කුමක් හෙයින් ද?
4. රූප යනු කිම? කෙතෙක් ද?
5. නිර්වාණය යනු කිමෙක් ද? එය කවර සිතකට අරමුණු වේ ද?

## 3. චතුර්විධ චිත්ත

1-කාමාවචරය, 2-රූපාවචරය, 3-අරූපාවචරය, 4-ලෝකෝත්තරය යි යට දැක්වුණු චිත්තය සිව් වැදෑරුම් වේ.

1. (අ) කාම නම් කාමතෘෂ්ණාව ය. ඒ කාමතෘෂ්ණාව යම් සිතෙක අරමුණු කිරීම් වශයෙන් හැසිරේ ද - පවතී ද ඒ සිත කාමාවචර නමි. මෙයින් කාම තෘෂ්ණාව හැසිරෙන-පවතින සිත **කාමාවචරය** යි කී නියා දතයුතු.

(ආ) නොහොත් කාම නම් සදෙව් ලොව මිනිස් ලොව සතර අපාය යන එකොළොස් වැදෑරුම් කාමභවය යි. ඒ කාමභවයෙහි හැසිරෙන-පවතින සිත කාමාවචර ය. මෙයින් කාමභූමියෙහි පවතින සිත **කාමාවචරය** යි කී නියා දතයුතු.

(ඉ) තවද කාමාවචර යනු කැලම කාම භූමියට කියනු ලැබේ. එවිට කාමාවචරයෙහි පවත්නා සිත ස්ථානෝපචාර වශයෙන් **කාමාවචර** නම් වේ. ස්ථානොපචාර නම් "සයනයෝ ශබ්ද කෙරෙති" කී කල සයන ශබ්දයෙන් සයනස්ථයන් (-සයනයෙහි හුන්නවුන්) ගන්නා සේ ස්ථානයෙහි නාමය ස්ථාති හට ව්‍යවහාර කිරීම ය. රූපාවචර-අරූපාවචර යන්නෙහි විස්තර ද මෙසේ ම දතයුතු. කාමාවචර සිත් මුළුල්ල 54 කි.

2. (අ) රූපතෘෂ්ණාව අරමුණු කිරීම් වශයෙන් හැසිරෙන-පවතින සිත හෝ (ආ) බ්‍රහ්මපාරිසජ්ජාදී සොළොස් වැදෑරුම් රූප භවයෙහි හැසිරෙන-පවතින සිත=හෝ (ඉ) රූපාවචරයෙහි පවත්නා සිත හෝ (මේ ස්ථානොපචාරය) **රූපාවචර** නම් වේ. රූපාවචර සිත් මුළුල්ල 15 කි.

3. (අ) අරූප තෘෂ්ණාව අරමුණු කිරීම් වශයෙන් හැසිරෙන-පවතින සිත හෝ (ආ) ආකාසානඤ්චායතනාදී චතුර්විධ, අරූප භවයෙහි හැසිරෙන-පවතින සිත හෝ (ඉ) අරූපාවචරයෙහි පවත්නා සිත හෝ (මේ ස්ථානොපචාරය) **අරූපාවචර** නම් වේ. අරූපාවචර සිත් මුළුල්ල 12 කි.

4. මෙහි ලොක නම් - රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන උපාදාන ස්කන්ධ පඤ්චකය යි. ඒ පඤ්චුපාදනක්ඛන්ධ ලෝකයෙන් එතර වන්නා වූ ද, එතර වූ ද චිත්තය **ලොකුත්තර** නම් වේ. මෙයින් සෝවාන් ආදි මාර්ග සිත් සතර හා ඵල සිත් සතර කී නියා

දතයුතු. ලෝකයෙන් උත්තරය අධිකය ලොකුත්තරයයි කිවහොත් **නිර්වාණය** ද ගතයුතු වේ.

ප්‍රශ්න

1. චිත්තය කී වැදෑරුම්ද? ඔහු කවරහු ද?
2. කාමාවචර සිත් කෙතෙක් ද? ඔවුන්ට කවර කවර අර්ථවලින් කාමාවචරය යි කියනු ලැබේ ද?
3. රූපාවචර යනු කිම? ඒ සිත් කෙතෙක්ද?
4. අරූපාවචර යනු කිම? ඒ සිත් කෙතෙක් ද?
5. ලෝකුත්තර යනු කිම? ඒ සිත් කෙතෙක් ද?

# 4. චාතුර්භූමක සිත්

කාමාවචර, රූපාවචර, අරූපාවචර, ලෝකොත්තර යන යට දැක්වුණු සිත් සතර කොටස එක් වූ කල චාතුර්භූමක චිත්ත යයි කියනු ලැබේ. එසේ ම කාමාවචර, රූපාවචර, අරූපාවචර යන සිත් තුන් කොටස එක් වූ කල **ත්‍රෛභූමක** චිත්ත යයිද, **වට්ට** චිත්ත යයිද, ලෞකික චිත්ත යයිද කියනු ලැබේ. **ලෝකොත්තර** සිත් **විවට්ට** චිත්ත යයිද කියනු ලැබේ. රූපාවචර, අරූපාවචර සිත් **මහග්ගත** නම් වේ. කාමාවචර සිත් **පරිත්ත** නම් වේ.

යථොක්ත සූපණස් (54) කාමාවචර සිත් කොටස් වශයෙන් බෙදූ කල මෙසේ ය-

| | |
|---|---|
| අකුසල් සිත් | 12 |
| අකුසල් විපාක සිත් | 7 |
| කුසල සිත් | 8 |
| කුසල අහේතුක විපාක සිත් | 8 |
| කුසල සහේතුක විපාක සිත් | 8 |
| අහේතුක ක්‍රියා සිත් | 3 |
| සහේතුක ක්‍රියා සිත් | 8 |
| මුළු ගණන | 54 |

පසළොස් (15) රූපාවචර සිත් බෙදූ කල මෙසේය:-

| | |
|---|---|
| රූපාවචර කුසල් සිත් | 5 |
| එම විපාක සිත් | 5 |
| එම ක්‍රියා සිත් | 5 |
| මුළු ගණන | 15 |

දොළොස් (12) අරූපාවචර සිත් බෙදූ කල මෙසේ යː-

| | |
|---|---|
| අරූපාවචර කුසල් සිත් | 4 |
| එම විපාක සිත් | 4 |
| එම ක්‍රියා සිත් | 4 |
| මුළු ගණන | 12 |

අට වැදෑරුම් ලෝකෝත්තර සිත් බෙදූ කල මෙසේ ය.

| | |
|---|---|
| මාර්ග සිත් | 4 |
| ඵල සිත් | 4 |
| මුළු ගණන | 8 |

මේ සිව් කොටස ම එක් කළ කල්හි චාතුර්භූමක සිත් 89 ක් වේ. ඒ මෙසේය:-

| | |
|---|---|
| කාමාවචර සිත් | 54 |
| රූපාවචර සිත් | 15 |
| අරූපාවචර සිත් | 12 |
| ලෝකෝත්තර සිත් | 8 |
| මුළු ගණන | 89 |

තථාගතයන් වහන්සේ අභිධර්ම දේශනාවෙහි: "**කුසලා ධම්මා අකුසලා ධම්මා අව්‍යාකතා ධම්මා**"යි පළමුකොට කුසල ධර්ම දේශනා කළ සේක. අභිධර්මය සංග්‍රහ කළ අනුරුද්ධාචාර්‍ය්‍යපාදයන් විසින් ආධුනිකයන්ගේ සුඛාවබෝධය සඳහා පළමු කොට අකුසල දක්වන ලදි. අපි ද **අභිධර්මාර්ථ සංග්‍රහය** හා එහි **ටීකාව** ඇසුරුකොට මේ ග්‍රන්ථය සම්පාදනය කරන බැවින් මීළඟ පාඩමෙන් අකුසල සිත් 12 දක්වන්නෙමු.

### ප්‍රශ්න

1. චාතුර්භූමක ත්‍රෛභූමක යනු කිම? ඒ එක් එක් කොටසෙහි ඇතුලත් සිත් කෙතෙක් ද?
2. වට්ට-විවට්ට යනු කවර ද?
3. මහග්ගතයෝ කවරහු ද?
4. කාමාවචර සිත් 54 කොටස් වශයෙන් බෙදා පෙන්වනු.
5. රූපාවචර, අරූපාවචර, ලෝකෝත්තර සිත් කොටස් වශයෙන් බෙදනු.
6. අභිධර්ම දේශනාවෙහි ආරම්භය කෙසේ ද? එය සංග්‍රහ කළේ කවරෙක් ද?

## 5. දෙළොස් අකුසල් සිත්

**"අට්ඨධා ලොභ මූලානි - දෙස මූලානි ච ද්විධා,**
**මොහ මූලානි ච වෙති - ද්වාදසා'කුසලා සියුං."**

ලෝභමූලික සිත් 8 ක, දෝසමූලික සිත් 2 ක, මෝහ මූලික සිත් 2 කැ යි අකුසල් සිත් සියල්ල දොළොසෙක් වේ. ලෝභ, දෝස, මෝහ යනු අකුසල් හේතු ය. එයින් ලෝභය මුල්කොට ඇත්තෝ ලෝභ මූලිකය හ. ද්වේෂය මුල්කොට ඇත්තෝ දෝස මූලිකය ය. මෝහය පමණක් මුල්කොට ඇත්තෝ මෝහ මූලිකය හ. ලෝභ මූලික, දෝස මූලික සිත්වල ද මෝහය ඇති බැව් සැලකිය යුතු, එයින්:-

**ලෝභ මූලික සිත්** අට (8) මෙසේ ය.

1. සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත අසංඛාරික චිත්තය
2. සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත සසංඛාරික චිත්තය,
3. සෝමනස්ස සහගත දිට්ඨිගත විප්පයුත්තත අසංඛාරික චිත්තය
4. සෝමනස්ස සහගත දිට්ඨිගත විප්පයුත්තත සසංඛාරික චිත්තය,
5. උපේක්ඛා සහගත දිට්ඨිගත සම්පයුත්ත අසංඛාරික චිත්තය
6. උපේක්ඛා සහගත දිට්ඨිගත සම්පයුත්ත සසංඛාරික චිත්තය,
7. උපේක්ඛා සහගත දිට්ඨිගත විප්පයුත්ත අසංඛාරික චිත්තය
8. උපේක්ඛා සහගත දිට්ඨිගත විප්පයුත්ත සසංඛාරික චිත්තය

1, **සොමනස්සසහගත** නම් සන්තෝෂයෙන් යුක්ත බව ය. **දිට්ඨිගත සම්පයුත්ත** නම් කර්ම-ඵල නො ඇදහීම් සංඛ්‍යාත මිථ්‍යාදෘෂ්ටියෙන් යුක්ත බව ය. **අසංඛාරික** නම් තමා විසින් හෝ අනුන් විසින් කරනු ලබන පූර්ව ප්‍රයෝගයක් අනුබලදීමක් නැති වැ ස්වභාවයෙන් ම තියුණු වූ සිතින් කරනු ලබන බව ය. මෙසේ යමෙකු කාමමිථ්‍යාචාරාදී පාපයක් කරන්නේ සන්තෝෂයෙන් යුක්ත වැ "මෙයින් මතු විපාක නොලැබේ" යන මිථ්‍යාදෘෂ්ටියෙන් ද යුක්ත වැ අනුන් විසින් නොමෙහෙයන ලදු වැ ස්වභාව තීක්‍ෂණ වූ ම සිතින් ඒ පාපය කෙරේ ද ඔහුට **සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත අසංඛාරික** නම් පළමුවන අකුශල චිත්තය ලැබෙන්නේ ය.

2. දෙවන චිත්තයෙහි **සෝමනස්ස සහගත** බව හා **දිට්ඨිගත සම්පයුත්ත** බව යට කී සේ ම ය. **සසංඛාරික** නම් තමා විසින් හෝ අනුන් විසින් හෝ කරනු ලබන පූර්ව ප්‍රයෝග සහිත බව ය - හෙවත් අනුන්ගේ මෙහෙයීමෙන් හෝ තමා ම පසු බැසීමෙන් හෝ කරනු ලබන බව ය. මෙසේ යමෙකු කාමමිථ්‍යාචාරාදියක් කරන්නේ සන්තෝෂයෙන් හා "මෙයින් මතු විපාක නොලැබේ" යන මිථ්‍යාදෘෂ්ටියෙන් යුක්ත වැ අනුන් විසින් මෙහෙයන ලදු වැ හෝ තෙමේ ම පසු බැස ඒ පාපය කෙරේ ද ඔහුට **සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත සසංඛාරික** නම් දෙවන අකුශල චිත්තය ලැබෙන්නේ ය.

3. තුන්වන චිත්තයෙහි **සොමනස්සසහගත** බව යට කී සේ ම ය. දිට්ඨිගත විප්පයුත්ත නම් "මෙයින් මතු විපාක නොලැබේ" යනාදී මිථ්‍යාදෘෂ්ටියක් නැති බව ය. **අසංඛාරික** ලක්‍ෂණය පෙර කී සේ ම ය. මෙසේ යමෙකු කාමමිථ්‍යාචාරාදියක් කරන්නේ සන්තෝෂයෙන් යුක්ත වැ මිථ්‍යාදෘෂ්ටික නොවැ යට කී සේ පූර්ව ප්‍රයෝගයකු දු නැති වැ ඒ පාපය කෙරේ නම් ඔහුට **සෝමනස්ස සහගත දිට්ඨිගත විප්පයුත්ත අසංඛාරික** නම් තෙවන අකුශල චිත්තය ලැබෙන්නේ ය.

4. සතරවන චිත්තයෙහි **සෝමනස්ස සහගත** බව ද **දිට්ඨිගත විප්පයුත්ත** බව ද, **සසංඛාරික** බව ද පෙර කී සේ ම ය. මෙසේ යමෙකු කාමමිථ්‍යාචාරාදී පාපයක් කරන්නේ සන්තෝෂයෙන් යුක්ත වැ මිථ්‍යාදෘෂ්ටි නැති වැ අනුන්ගේ නියෝගයෙන් හෝ තමාගේ ම පසුබැසීමෙන් හෝ ඒ පාපය කෙරේ නම් ඔහුට **සොමනස්ස සහගත දිට්ඨිගත විප්පයුත්ත සසංඛාරික** නම් සතරවන අකුශල චිත්තය ලැබෙන්නේ ය.

5. පස්වන චිත්තයෙහි **උපෙක්ඛා සහගත** නම් සොම්නසුත් නො වැ දොම්නසුත් නො වැ මධ්‍යස්ථ වේදනායෙන් යුක්ත බව ය, **දිට්ඨිගත සම්පයුත්ත අසංඛාරික** ලක්‍ෂණ පෙර කී සේ ම ය. මෙසේ යමෙකු කාමමිථ්‍යාචාරාදි පාපයක් කරන්නේ උපේක්‍ෂායෙන් යුක්ත වැ මිථ්‍යා දෘෂ්ටික වැ ලා හෙළා ඒ පාපය කෙරේ ද ඔහුට **උපෙක්ඛා සහගත දිට්ඨිගත සම්පයුත්ත අසංඛාරික** නම් පස්වන අකුශල චිත්තය ලැබෙන්නේ ය.

6. සවන චිත්තයෙහි **උපෙක්ඛා සහගත දිට්ඨිගත සම්පයුත්ත සසංඛාරික** යන ලක්‍ෂණ තුන පෙර කී සේ ය. එසේ යමෙකු උපේක්‍ෂායෙන් යුක්ත වැ මිථ්‍යාදෘෂ්ටික ව තමා විසින් හෝ අනුන් විසින් මෙහෙයන ලදු වැ කාම මිථ්‍යාචාරාදි පාපයක් කෙරේ ද ඔහුට **උපෙක්ඛා සහගත දිට්ඨිගත සම්පයුත්ත සසංඛාරික** නම් සවන අකුශල චිත්තය ලැබෙන්නේ ය.

7. සත්වන චිත්තයෙහි **උපෙක්ඛා සහගත - දිට්ඨිගත විප්පයුත්ත අසංඛාරික** යන ලක්‍ෂණ තුන ම පෙර කී සේ ය. එසේ යමෙකු උපෙක්ඛායෙන් යුක්ත වැ මිථ්‍යාදෘෂ්ටික නො වැ උත්සාහවත් වැ පාප කර්මයන් කෙරේ ද ඔහුට **උපෙක්ඛා සහගත දිට්ඨිගත විප්පයුත්ත අසංඛාරික** යන සත්වන අකුශල චිත්තය ලැබෙන්නේ ය.

8. අටවන චිත්තයෙහි ද **උපෙක්ඛා සහගත දිට්ඨිගත විප්පයුත්ත සසංඛාරික** යන ලක්‍ෂණ තුන පෙර කී සේ ය. යමෙකු කාමමිථ්‍යාචාරාදී පාපයක් කරන්නේ උපේක්‍ෂායෙන් යුක්ත වැ මිථ්‍යාදෘෂ්ටික නො වැ අනුන් විසින් මෙහෙයන ලදු වැ හෝ තෙමේ ම පසුබැස ඒ පාපය කෙරේ ද ඔහුට **උපෙක්ඛා සහගත දිට්ඨිගත විප්පයුත්ත සසංඛාරික** යන අටවන අකුශල චිත්තය ලැබෙන්නේ ය.

**වෙදනා - දිට්ඨි - සංඛාර** යන අඞ්ග තුනින් මේ සිත් අට ආකාරයකට බෙදී ගිය බැව් දත යුතු,

## ප්‍රශ්න

1. අකුසල් සිත් දොළස කොටස් වශයෙන් බෙදනු.
2. ලෝභ මූලික සිත් අට කවරේ ද?
3. එයින් අසංඛාරික සිත් කෙතෙක්ද? ඒවිහු කවරහු ද?
4. සෝමනස්ස සහගත-දිට්ඨිගත සම්පයුත්ත-අසංඛාරික යන අඞ්ග තුන විස්තර කරනු.
5. උපෙක්ඛා යනු කිම?

6. අටවන සිත ලැබිය හැකි ආකාරය දක්වනු.
7. මේ සිත් අෂ්ටවිධ වැ කුමකින් බෙදී ගියේ ද?

## 6. දෙස මූලික සිත් (2) දෙක

1. දෝමනස්ස සහගත පටිඝ සම්පයුත්ත අසංඛාරික චිත්තය,
2. දෝමනස්ස සහගත පටිඝ සම්පයුත්ත සසංඛාරික චිත්තය.

1. මෙහි **දෝමනස්ස සහගත** නම් දොම්නසින් හෙවත් මානසික දුඃඛ වේදනායෙන් යුක්ත බව ය. පටිඝ සම්පයුත්ත නම් ද්වේෂයෙන් යුක්ත බව ය. අරමුණෙහි නො ඇලී එහි විරුද්ධ වැ හැපී යන බැවින් ද්වේෂය පටිඝය යි කියනු ලැබේ. දෝමනස්ස අනිෂ්ට අරමුණු අනුභව කිරීම ලක්‍ෂණ කොට ඇති වේදනාස්කන්‍ධයට අයත් ධර්මයෙක. පටිඝය චණ්ඩකම ස්වභාවකොට ඇති සංස්කාරස්ඛන්‍ධයට අයත් ධර්මයෙක. මේ දෙදෙන එකතුව ම මුත් වෙන් වැ නූපදිත්. අසංඛාර ලක්‍ෂණය පෙර කී සේ ම ය. මෙසේ යමෙකු ප්‍රාණඝාතාදියක් කරන්නේ දොම්නසින් හා පටිඝයෙන් යුක්ත වැ අනුන්ගේ හෝ තමන්ගේ මෙහෙයීමකුදු නැති වැ සැහැසි ව ම කෙරේ ද එවිට ඔහුට **දෝමනස්ස සහගත පටිඝ සම්පයුත්ත අසංඛාරික** යන ද්වේෂමූලික පළමුවන සිත ලැබෙන බව දතයුතුයි.

2. දෙවන චිත්තයෙහි **දෝමනස්ස - පටිඝ - සසංඛාර** යන මොවුන්ගේ ලක්‍ෂණය පෙර කී සේ ම ය. යමෙකු දොම්නසින් හා පටිඝයෙන් යුක්ත වැ අනුන්ගේ මෙහෙයීමෙන් හෝ තමාගේ ම පසුබැසීමෙන් හෝ ප්‍රාණඝාතාදී පාපයක් කෙරේ ද ඔහුට **දෝමනස්ස සහගත පටිඝ සම්පයුත්ත සසංඛාරික** යන දෝස මූලික දෙවන චිත්තය ලැබෙන්නේ ය.

**ප්‍රශ්න**

1. දෝස මූලික සිත් දෙක කෙසේද?
2. දෝමනස්ස - පටිඝ යන දෙක්හි වෙනස කිම?
3. ළමයෙක් සිනාසෙමින් කුරුල්ලකු මැරුවේ ය. ඔහුට උපන් අකුසල් සිත කුමක් ද?
4. ස්වාමියාගේ නියෝගයෙන් සේවකයෙක් කුකුළකු මැරුවේ ය. ඔහුට උපන් අකුසල සිත කිමෙක් ද?

## 7. මෝහමූලික සිත් (2) දෙක

1. උපෙක්ඛා සහගත විචිකිච්ඡා සම්පයුත්ත චිත්තය,
2. උපෙක්ඛා සහගත උද්ධච්ච සම්පයුත්ත චිත්තය

1. උපෙක්ඛාසහගත බව පෙර කී සේ ම ය. විචිකිච්ඡා සම්පයුත්ත නම් බුද්ධාදී අටතැන උපදනා සැකයෙන් යුක්ත බවය. යමෙක් වනාහි උපේක්ෂායෙන් හා විචිකිච්ඡායෙන් යුක්ත වූයේ නම් ඔහුට **උපෙක්ඛා සහගත විචිකිච්ඡා සම්පයුත්ත** යන මේ මෝහමූලික අකුශල චිත්තය ලැබෙන්නේ ය.

2. දෙවන චිත්තයෙහිදු **උපෙක්ඛා** ලක්‍ෂණය නම් පෙර කී සේ ම ය. **උද්ධච්ච** නම් චිත්ත වික්‍ෂෙපය-චිත්තයාගේ නො සන්සුන්කම ය. එයින් යුක්තවූයේ **උද්ධච්ච සම්පයුත්තය.** යමෙක් උපේක්ෂායෙන් හා උද්ධච්චයෙන් යුක්ත වූයේ ද ඔහුට **උපෙක්ඛා සහගත උද්ධච්ච සම්පයුත්ත** යන දෙවන මොහමූලික අකුශල චිත්තය ලැබෙන්නේ ය. උද්ධච්චය සර්වාකුශල සාධාරණ චෛතසිකයක් වුවද එය මේ චිත්තයෙහි ම බලවත් වැ යෙදෙන බැවින් ඒ නමින් මැ ව්‍යවහාර කරන ලදී.

මේ සිත් දෙක එකම මෝහ හේතුක බැවින් ද, ස්වභාව චංචල බැවින් ද සොම්නස් දොම්නස් වේදනා භේද නොලබයි, එසේ ම විශේෂ තීක්‍ෂණ බවක් හෝ අතීක්‍ෂණ බවක් හෝ නැති හෙයින් සංඛාර භේදය ද නො ලබයි.

ප්‍රශ්න

1. මෝහ මූලික සිත් දෙක කෙසේ ද?
2. විචිකිච්ඡා උද්ධච්ච විස්තර කරනු.
3. මෝහ මූලික සිත් දෙක්හි සංඛාර භේදය නැත්තේ කිම?
4. අකුශල සිත් දොළොසෙහි ම යෙදෙන උද්ධච්චය අන්තිම සිතෙහි පමණක් කුමක් හෙයින් යොදා දක්වන ලද්දේද?

## 8. අටළොස් (18) අහෙතුක සිත්

“සත්තාකුසලපාකානි - පුඤ්ඤපාකානි අට්ඨධා
ක්‍රියාචිත්තානි තීනීති - අට්ඨාරස අහෙතුකා”

අකුසල් විපාක සිත් සතෙක, කුසල අහේතුක විපාක සිත් අටෙක, අහේතුක ක්‍රියා සිත් තුනෙකැයි අහේතුක සිත් අටළොස් වැදැරුම් වේ. වෘක්‍ෂයෙක ස්ථිර පැවැත්මට මුල් ආධාර වන්නා සේ කුශලා’කුශලාදි චිත්තයක ස්ථිර පැවැත්මට හේතුහු ආධාර වෙති. හේතු නම් අකුශල පක්‍ෂයෙහි ලෝභ, දෝස, මෝහ යන අකුශල චෛතසික තුන්දෙන හා කුශල පක්‍ෂයෙහි අලෝභ, අදෝස, අමෝහ යන කුශල චෛතසික තුන් දෙන ය. මේ සවැදෑරුම් හේතු අතුරෙන් එක හේතුවකුදු යම් සිතෙක නො යෙදුණේ නම් ඒ සිත අහේතුක චිත්තය නමි. එබඳු සිත් අටළොසෙකි. ඔවුන් අතුරෙන් අකුශල විපාක සිත් සත මෙසේ ය.

1. **උපෙක්ඛා සහගත චක්ඛුවිඤ්ඤාණය,**

2. **උපෙක්ඛා සහගත සොත විඤ්ඤාණය**
3. **උපෙක්ඛා සහගත ඝාණවිඤ්ඤාණය**
4. **උපෙක්ඛා සහගත ජිව්හාවිඤ්ඤාණය**
5. **දුක්ඛ සහගත කායවිඤ්ඤාණය**
6. **උපෙක්ඛා සහගත සම්පටිච්ඡන විඤ්ඤාණය**
7. **උපෙක්ඛා සහගත සන්තිරණ විඤ්ඤාණය**

1. චක්‍ෂු නම් චක්ඛු ප්‍රශාදය හෙවත් පූර්වජාතියෙහි රූප දකිනු කැමැත්ත නිදාන කොට ඇති කර්මයෙන් හටගත් ඇස ය කියනු ලබන මස්ගඩුව නිසා පවත්නා පෙනීමේ ශක්තිය යි. ඒ චක්‍ෂුඃ ප්‍රසාදය රූපය හා ගැටුණු විට ඒ ඇසුරු කොට උපදනා චිත්තය චක්ඛුවිඤ්ඤාණය යි කියනු ලැබේ. ඒ ගැටුණු රූපය ඉදින් අනිෂ්ට වී නම් එවිට එය අකුසල විපාක චක්ඛුවිඤ්ඤාණය වෙයි, මෙහි රූපය යි කියනු ලබන වර්ණ මාත්‍රයේ හා චක්‍ෂුඃ ප්‍රසාදයේ ගැටීම් පුලුන් පිඩක් හා පුළුන් පිඩක ගැටීම මෙන් ඉතා දුර්වල ය. එ හෙයින් එහි සොම්නස් හෝ දොම්නස් වේදනා නො ලැබැ උපේක්‍ෂා වේදනා ම ලැබේ. එවිට ඒ චිත්තය අකුසල විපාක **උපෙක්ඛා සහගත චක්ඛු විඤ්ඤාණය** යි සම්පූර්ණ වශයෙන් කියනු ලැබේ. සෙස්සෙහි ද ක්‍රමය මෙසේ ය.

2. සොත නම් ශ්‍රොත්‍ර ප්‍රශාදය-හෙවත් පූර්ව ජාතියෙහි ශබ්ද අසනු කැමැත්ත නිදානකොට ඇති කර්මයෙන් හටගත් කන නිසා පවත්නා ඇසීමේ ශක්තිය යි. එය අනිෂ්ට ශබ්දයක් හා ගැටුණුවිට ඒ ඇසුරුකොට උපදනා චිත්තය අකුසල විපාක **උපෙක්ඛා සහගත සෝත විඤ්ඤාණය** යි කියනු ලැබේ.

3. ඝාණ නම් ඝ්‍රාණ ප්‍රශාදය-හෙවත් පූර්ව ජාතියෙහි ආඝ්‍රාණය කරනු කැමැත්ත නිදානකොට ඇති කර්මයෙන් හටගත් නැහැය නිසා පවත්නා ආඝ්‍රාණය කිරීමේ ශක්තිය යි. ඒ ඝ්‍රාණ ප්‍රසාදය අනිෂ්ට ගන්ධයක් හා ගැටුණුවිට ඒ ඇසුරු කොට පවත්නා චිත්තය අකුසල විපාක **උපෙක්ඛා සහගත ඝ්‍රාණ විඤ්ඤාණය** යි.

4. ජිව්හා නම් ජිහ්වා ප්‍රශාදය - හෙවත් පූර්වජාතියෙහි රස විඳගනු කැමැත්ත නිදානකොට ඇති කර්මයෙන් හටගත් දිව නිසා පවත්නා රස විඳගැනීමේ ශක්තිය යි. ඒ ජිහ්වා ප්‍රශාදය අනිෂ්ට රසයක් හා ගැටුණුවිට එය ඇසුරුකොට උපදනා චිත්තය අකුසල විපාක **උපෙක්ඛා සහගත ජිව්හා විඤ්ඤාණය** යි කියනු ලැබේ. මේ තුන් තන්හිම උපෙක්ඛා වීමේ හේතුව චක්ඛුවිඤ්ඤාණයට කී පරිදි ම ය යි දතයුතු.

5. කාය නම් කාය ප්‍රශාදය-හෙවත් පූර්ව ජාතියෙහි ස්පර්ශ විඳගැන්ම නිදානකොට ඇති කර්මයෙන් හටගත් කය නිසා පවත්නා ස්පර්ශ විඳගැනීමේ ශක්තිය යි. ඒ කාය ප්‍රශාදය අනිෂ්ට ස්ප්‍රෂ්ටව්‍යයක් හා ගැටුණු විට අකුසල විපාක **දුක්ඛ සහගත කායවිඤ්ඤාණය** ලැබේ. එය දුක්ඛ සහගතවීමේ හේතු කිම යත්? ස්ප්‍රෂ්ටව්‍ය නම්; පඨවි, තෙජො වායු යන භූත රූප තුන යි. ඒ භූත රූපාත්මක වූ ස්ප්‍රෂ්ටව්‍යය කාය ප්‍රශාදයේ හැපෙන විට ඒ කාය ප්‍රශාදය ඉක්ම ඒ නිසා පවත්නා භූත රූපයන්හි ද හැපෙයි. එවිට කිණිහිරක් උඩ පුලුන් පෙඳක් තබා කුළකින් පහරන කල්හි කුළ පුලුන් පෙඳ ඉක්ම කිණිහිරෙහි ද හැපෙන්නා

සේ හැපීම බලවත් වෙයි. එබැවින් ඉෂ්ටස්ප්‍රෂ්ටව්‍යයක් හැපිණි නම් සුඛ වේදනා උපදී, අනිෂ්ටස්ප්‍රෂ්ටව්‍යයක් හැපිණි නම් දුක්ඛ වේදනා උපදී. මෙය අකුශල විපාක ප්‍රස්තාව හෙයින් දුක්ඛ වේදනා සහගත වූ බව දතයුතු යි.

6. චක්ඛු විඤ්ඤාණාදී පඤ්ච විඤ්ඤාණයන් විසින් ගත් අනිෂ්ට අරමුණ පිළිගන්නාක් මෙන්න උපදනා සිත අකුසල විපාක **උපෙක්ඛා සහගත සම්පටිච්ඡන** චිත්තය යි.

7. ඒ අනිෂ්ට අරමුණ ම තීරණය කරන්නාක් මෙන් උපදනා සිත අකුසල විපාක **උපෙක්ඛා සහගත සන්තීරණ** චිත්තය යි.

මොවුන්ට අහේතුක අකුසල විපාක ය යි නො කිය යුතු. සහේතුක අකුසල විපාක ඒකාන්තයෙන්ම නැති හෙයිනි. විශේෂණයක් වුවමනා කරන්නේ ව්‍යභිචාරයක් (-අනියම් හැසිරීමක්) ඇති තැනකට ය.

මේ අකුසල් විපාක සත යට කී දොළොස් අකුසලයන්ගේ විපාක බව දත යුතුයි.

ප්‍රශ්න

1. අහේතුක සිත් කෙතෙක් ද? කොටස් වශයෙන් දක්වනු.
2. කුමක් හෙයින් ඔහු අහේතුක සිත් යයි කියනු ලබත් ද?
3. අකුසල් විපාක කීය ද? කවරහු ද?
4. චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, විඤ්ඤාණ කුමක් හෙයින් උපෙක්ඛා සහගත වී ද?
5. කාය විඤ්ඤාණය කුමක් හෙයින් දුක්ඛ සහගත වී ද?

## 9. කුසල අහෙතුක විපාක සිත් (8) අට.

1. **උපෙක්ඛා සහගත චක්ඛු විඤ්ඤාණය,**
2. **උපෙක්ඛා සහගත සොත විඤ්ඤාණය,**
3. **උපෙක්ඛා සහගත ඝාණ විඤ්ඤාණය,**
4. **උපෙක්ඛා සහගත ජිව්හා විඤ්ඤාණය,**
5. **සුඛ සහගත කාය විඤ්ඤාණය,**
6. **උපෙක්ඛා සහගත සම්පටිච්ඡන චිත්තය,**
7. **සොමනස්ස සහගත සන්තීරණ චිත්තය,**
8. **උපෙක්ඛා සහගත සන්තීරණ චිත්තය,**

යන මේ අට කුසල අහේතුක විපාක සිත් නම් වේ.

කාමාවචර කුසලයන්ගේ විප කයෝ සොළොස් (16) දෙනෙක් වෙති. එයින් අටක් සහේතුක ය. අටක් අහේතුක ය. අහේතුක සිත් කාණ්ඩය දක්වා නිම කරන සඳහා කුසල

සිත් දක්වන්නටත් පළමු ඒ කුසලයන්ගේ දෙවැදෑරුම් විපාකයන් අතුරෙන් අහේතුක විපාක සිත් කොටස මෙහි දැක්වූ බව දතයුතු.

එහි:-
1. ඉෂ්ට රූපයක් චක්ෂුඃ ප්‍රශාදයේ හැපුණු කල හෙවත් ප්‍රිය රූපයක් ඇසින් දුටු කල කුසල විපාක **උපෙක්ඛා සහගත චක්ඛු විඤ්ඤාණය** ලැබේ.

2. ඉෂ්ට ශබ්දයක් ශ්‍රොත්‍ර ප්‍රශාදයේ හැපුණු කල හෙවත් ප්‍රිය හඬක් ඇසුණු කල කුසල විපාක **උපෙක්ඛා සහගත සොත විඤ්ඤාණය** ලැබේ.

3. ඉෂ්ට ගන්ධයක් ඝ්‍රාණ ප්‍රශාදයේ හැපුණු කල හෙවත් මිහිරි සුවඳක් නැහැයට දැනුණු කල කුසල විපාක **උපෙක්ඛා සහගත ඝාණ විඤ්ඤාණය** ලැබේ.

4. ඉෂ්ට රසයක් ජිහ්වා ප්‍රසාදයට හැපුණු කල හෙවත් දිවට ප්‍රිය රසයක් දැනුණු කල කුසල විපාක උපෙක්ඛා සහගත ජිව්හා විඤ්ඤාණය ලැබේ. මේ සිව් තැන ම උපෙක්ඛා සහගත වීමේ හේතුව අකුසල චිත්තයන්ට කී නියාම ය යි දතයුතු.

5. ඉෂ්ට ස්ප්‍රෂ්ටව්‍යයක් කාය ප්‍රශාදයේ හැපුණු කල හෙවත් පිය පහසක් ඇඟට දැනුණු කල කුසල විපාක **සුඛ සහගත කාය විඤ්ඤාණය** ලැබේ. මෙහිදු සුඛ සහගතවීමේ හේතුව යට කී නයින් දතයුතු.

6. පඤ්ච විඤ්ඤාණයන් විසින් ගන්නා ලද ඉෂ්ටාරම්මණය පිළිගන්නාක් මෙන් උපදින සිත කුසල විපාක **උපෙක්ඛාසහගත සම්පටිච්ඡන චිත්තය** යි.

7. එම අති ඉෂ්ටාරම්මණයක් තීරණය කරන්නාක් මෙන් උපදින සිත කුසල විපාක **සොමනස්ස සහගත සන්තීරණ චිත්තය** යි.

8. එම ඉෂ්ට මධ්‍යස්ථාරම්මණයක් තීරණය කරන්නාක් මෙන් උපදින සිත කුසල විපාක **උපෙක්ඛා සහගත සන්තීරණ චිත්තය** යි කියනු ලැබේ. මේ චිත්තයන්ගේ විශේෂ විභාගය මතු පහළ වන්නේ ය. මෙහිදී සාමාන්‍ය වශයෙන් අවබෝධ කරගත යුතු ය.

### ප්‍රශ්න

1. කාමාවචර කුසල විපාක කෙතෙක් ද?
2. එයින් අහේතුක විපාක අට දක්වනු.
3. කුසල දක්වන්නටත් පළමු කුමක් හෙයින් එහි විපාක දක්වන ලද්දේ ද?
4. සන්තීරණ සිත් දෙකේ වෙනස දක්වනු.
5. මේ සිත් අට පැහැදිලි කරනු.

## 10. අහේතුක ක්‍රියා සිත් (3) තුන.

1. **උපෙක්ඛා සහගත පඤ්චද්වාරාවජ්ජන චිත්තය,**
2. **උපෙක්ඛා සහගත මනොද්වාරාවජ්ජන චිත්තය,**
3. **සොමනස්ස සහගත හසිතුප්පාද චිත්තය,**

ක්‍රියා සිත් නම් කුසලාකුසලුත් නොවන විපාකත් නොවන චිත්තයෝ ය. ඔව්හු ද සහේතුක ය. අහේතුක ය යි දෙවැදෑරුම් වෙති. අහේතුක ක්‍රියා සිත් නම් යට කී හේතු වලින් එක හේතුවකුදු නොයෙදෙන චිත්තයෝ ය. ඔව්හු තුන් දෙනෙකි.

1. චක්ෂුරාදි ද්වාරවලින් අරමුණු නොලැබැ නිදියෙන කලක් මෙන් නිශ්චල වැ පවත්නා සිත භවාංග චිත්තය යි කියනු ලැබේ. නොයෙක් දිගට නූල් ඇදගෙන ඒ මැදට වී නිසල වැ සිටිනා මකුළුවකු මෙනි.

පංචද්වාරයන් අතුරෙන් යම් ද්වාරයෙක අරමුණක් හැපුණු විට ඒ භවාඞ්ග සන්තතිය සෙලවී සිඳී පස්දොරන අතුරෙන් කවර දොරකින් මේ අරමුණ ආයේ දැ යි බලන්නාක් මෙන් උපදින සිත පඤ්චද්වාරාවජ්ජන චිත්තය යි. මකුළු නූලේ සතකු රැඳුණු කල තමා සෙලවුම් කැයෙන් කවර නූලකින් ඒ සතා රැඳුණේ දැයි පරීක්‍ෂා කොට බලන මකුළුවා මෙනි. එ ද සොම්නස් හෝ දොම්නස් වන්නට ශක්ති මඳ හෙයින් උපේක්‍ෂා සහගත ම වේ. මේ **උපෙක්ඛා සහගත පඤ්චද්වාරාවජ්ජන චිත්තය** පූර්ව කුසලාකුසලයෙක විපාක නොවේ. එසේ ම ඊට මතු විපාක නො ලැබෙන හෙයින් කුශලාකුශල කර්මයක් ද නොවේ. හුදෙක් ක්‍රියා මාත්‍රයෙකැ යි දතයුතු.

2. මනොද්වාරයෙහි වැටුණු අරමුණ ආවර්ජනය කරන චිත්තය මනොද්වාරාවජ්ජන චිත්තය යි. එ ද උපෙක්ඛා සහගත ම හෙයින් **උපෙක්ඛා සහගත මනොද්වාරාවජ්ජන චිත්තය** යි කියනු ලැබේ. මනොද්වාරය නම් ආවර්ජනයට නැමුණු භවාඞ්ග චිත්තය යි. මෙය ම පංචද්වාරික චිත්ත වීථීන්හි දී "වොඤපන චිත්තය"යි කියනු ලැබේ. මෙ ද කර්මයක් හෝ විපාකයක් නො වන ක්‍රියා මාත්‍රයෙකි.

3. හසිතුප්පාද නම් සිනා ඉපැදවීම ය. රහතන් වහන්සේට අනෞදාරිකාරම්මණයෙහි (-සුළු අරමුණුවලදී සිනා උපදවන සිත "**සොමනස්ස සහගත හසිතුප්පාද චිත්තය**" යි. මේ ද, ක්‍රියාවෙක, කර්ම හෝ විපාක නොවේ. මේ අටළොස් චිත්තයන්ගේ විශේෂ විභාග මතු පැහැදිලි වන බව දතයුතු යි.

**"පාපාහෙතුක මුත්තානි සොභනානීති වුච්චරෙ,**
**එකූනසට්ඨිචිත්තානි අථෙකනවුතිපි වා"**

අකුසල සිත් 12 හා මේ අහේතුක සිත් 18 හැර මතු කියනු ලබන සිත් 59 හෝ 91 සෝභන සිත් නම් වේ.

### ප්‍රශ්න

1. අහේතුක ක්‍රියා සිත් කෙතෙක් ද? කවරහු ද?
2. පංචද්වාරාවජ්ජනය යනු කිම?
3. හසිතුප්පාද චිත්තය කවරකුහට කුමක් නිසා උපදී ද?
4. මනොද්වාරාවර්ජන චිත්තය උපදින සැටි දක්වනු.
5. සෝභන යන නාමය නො ලැබෙන සිත් කවරේ ද?

## 11. කාමාවචර කුසල සිත් (8) අට

1. **සොමනස්ස සහගත ඤාණසම්පයුත්ත අසංඛාර චිත්තය**
2. **සොමනස්ස සහගත ඤාණසම්පයුත්ත සසංඛාර චිත්තය**
3. **සොමනස්ස සහගත ඤාණවිප්පයුත්ත අසංඛාර චිත්තය**
4. **සොමනස්ස සහගත ඤාණවිප්පයුත්ත සසංඛාර චිත්තය**
5. **උපෙක්ඛා සහගත ඤාණසම්පයුත්ත අසංඛාර චිත්තය,**
6. **උපෙක්ඛා සහගත ඤාණසම්පයුත්ත සසංඛාර චිත්තය,**
7. **උපෙක්ඛා සහගත ඤාණවිප්පයුත්ත අසංඛාර චිත්තය,**
8. **උපෙක්ඛා සහගත ඤාණවිප්පයුත්ත සසංඛාර චිත්තය**

1. මෙහි පළමුවන චිත්තයෙහි සොමනස්ස, ඤාණ, අසංඛාර යන අඞ්ග තුනෙක් ඇත්තේ ය. සොමනස්ස සහගත නම් සුඛ වේදනායෙන් - සෞම්නසින් - සතුටින් යුක්ත බව ය. **බලවත් ශ්‍රද්ධාව හා දර්ශන සම්පත්, ප්‍රත්‍යය සම්පත්, ප්‍රතිග්‍රාහක සම්පත්, ප්‍රදේශ සම්පත්, කාල සම්පත්** ලැබීම ඒ සෝමනස්ස සහගත වීමේ හේතු ය. **ඤාණසම්පයුත්ත** නම් යථා ස්වභාවය දැන්මෙන් හෙවත් දානාදී කුසලයන්ගෙන් ඉෂ්ටවිපාක ලැබෙන්නේ ය. යනාදිය දැන්මෙන් යුක්ත බව ය. **ප්‍රඥව ලැබීමට හේතු කර්මය, බඹලොව ඉපද සිටීම ය, ඉඳුරන් බිහිකිරීම ය, ක්ලේශයන්ගෙන් දුරුව සිටීම** ය යන මොව්හු ඥානසම්ප්‍රයුක්ත වීමේ හේතු වෙති. අසංඛාර නම් පූර්වප්‍රයෝග රහිත බව ය. හෙවත් අනුන්ගේ නියෝගය නිසාත් නො වැ තමාගේ ම පසුබැසීමෙනුත් නො වැ ස්වභාව තීක්‍ෂණ (=ඉබේ ම තියුණු) වූ සිතින් යුක්ත බව ය. **ආවාස සප්පාය ඍතු සප්පාය භොජන සප්පාය ලැබීම, දන්දී පුරුදු බව** යනාදිය අසංඛාර වීමේ හේතු යි.

මෙසේ යමෙක් දානවස්තු ප්‍රතිග්‍රාහක සම්පත් ආදිය ලැබීමෙන් තුටුපහටු වූයේ මෙයින් මතු ආනිසංස ලැබේ ය යන සම්‍යග්දෘෂ්ටිය පෙරටුකොටැ ගෙනැ තමා ම උත්සාහවත් වූ සිතින් දානාදී කුශලකර්මයක් කෙරේ ද, එවිට ඔහුට **සෝමනස්ස සහගත ඤාණ සම්පයුත්ත** අසංඛාර යන පළමු වන කාමාවචර කුසල චිත්තය ලැබෙන්නේ ය.

2. දෙවන චිත්තයෙහි සෝමනස්ස සහගත බව හා ඤාණසම්පයුත්ත බව කී සේ ම ය. සසංඛාර නම් පූර්වප්‍රයෝග සහිත බව ය. හෙවත් අනුන්ගේ නියෝගයෙන් හෝ තමාගේ

ම පසුබැසීමෙන් යුක්ත බව ය. මෙසේ යමෙක් ප්‍රත්‍යය ප්‍රතිග්‍රාහකාදි සම්පත් ලැබීමෙන් කම්පල අදහා ගෙනැ අනුන්ගේ නියෝගයෙන් හෝ තමාගේ ම පසු බැසීමෙන් හෝ දානාදී කුශල කර්මයක් කෙරේ ද එවිට ඔහුට **සෝමනස්ස සහගත ඤාණසම්පයුත්ත සසංඛාර** යන දෙවන කාමාවචර කුසල චිත්තය ලැබෙන්නේ ය. මෙහි ආවාස සප්පායාදිය නො ලැබීම හා දන් දී නුපුරුදු බව සසංඛාරිකවීමේ හේතු යයි සැලකිය යුතු.

3. තුන්වන චිත්තයෙහි සෝමනස්ස සහගත බව හා අසංඛාරික බව කී සේ ම ය. ඤාණවිප්පයුත්ත නම් යට දැක්වූ ඥානයෙන් විප්‍රයුත්ත බව ය. හෙවත් ඥානය නොයෙදෙන බව ය. ඤාණසම්පයුත්ත වීමට වුවමනා යට කී කරුණු නො ලැබීම ඤාණසම්පයුත්තවීමට හේතු ය. මෙසේ මව්පිය ආදීන්ගේ වැඳුම් පිදුම් ආදී ප්‍රතිපත්ති දැකීමෙන් හටගත් පල පුරුදු කම් ඇති බාල දරුවෙක් භික්ෂූන් දැක සතුටින් පිණ පිණා තමා අත තුබූ දෙය වහා දෙයි ද එවිට ඔහුට **සෝමනස්ස සහගත ඤාණවිප්පයුත්ත අසංඛාරික** යන තුන්වන කුසල චිත්තය ලැබෙන්නේ ය. තමා බාල බැවින් මෙහි ඤාණය නොයෙදුණේ යි.

4. සතරවන චිත්තයෙහි සෝමනස්ස සහගත බව ද ඤාණවිප්පයුත්ත බව ද සසංඛාරික බව ද පෙර කී සේ ම ය. “මෙසේ දෙව” යි මවුපියන් විසින් අණ කරනු ලැබූ බාල දරුවෙක් තමා අත තුබූ දෙය සොම්නසින් දෙයි ද එවිට ඔහුට **සෝමනස්ස සහගත ඤාණවිප්පයුත්ත සසංඛාරික** යන සතරවන කාමාවචර කුසල චිත්තය ලැබෙන්නේ ය. තමා බාල බැවින් මෙහි ඤාණය නොයෙදුණේ ය. තමාගේ ම කැමැත්තෙන් නො වැ මව්පියන්ගේ නියෝගයෙන් දුන් හෙයින් සසංඛාරික විය.

5. පස්වන චිත්තයෙහි උපෙක්ඛා සහගත නම් සොම්නසුත් නො වැ දොම්නසුත් නො වැ මධ්‍යස්ථ භාවයෙන් යුක්ත බවය. සොම්නස් වන්නට වුවමනා හේතු නො ලැබීම උපේක්‍ෂා සහගත වීමට හේතු වන බව සැලකිය යුතුයි. ඤාණසම්පයුත්ත බව හා අසංඛාරික බව කී සේ ම ය. මෙසේ යමෙක් දාන වස්තු ප්‍රතිග්‍රාහක සම්පත් ආදිය රිසි සේ නො ලැබීම කරණ කොටැගෙනැ උපේක්‍ෂායෙන් යුක්තවැ කම්පල ඇදහීම් සංඛ්‍යාත සම්‍යග්දෘෂ්ටි ඇතිවැ ස්වභාව තීක්‍ෂණ වූ සිතින් ම දානාදී කුශල කර්මයක් කෙරේ ද, එවිට ඔහුට **උපෙක්ඛාසහගත ඤාණසම්පයුත්ත අසංඛාරික** යන පස්වන කුසල චිත්තය ලැබෙන්නේ ය.

6. සවන චිත්තයෙහි **උපෙක්ඛා** සහගත බව ද, ඤාණ සම්පයුත්ත බව ද, **සසංඛාරික** බව ද කී සේ ම ය. මෙසේ යමෙක් උපේක්‍ෂායෙන් යුක්ත වැ කම්පල අදහා ගෙන අනුන්ගේ නියෝගයෙන් හෝ තමාගේ ම පසුබැසීමෙන් දානාදී කුශලකර්මයක් කෙරේ ද, එවිට ඔහුට **උපෙක්ඛා සහගත ඤාණසම්පයුත්ත සසංඛාරික** යන සවන කුසල චිත්තය ලැබෙන්නේ ය.

7. සත්වන චිත්තයෙහි උපෙක්ඛා සහගත බව ද ඤාණවිප්පයුත්ත බව ද අසංඛාරික බව ද කී සේ ම ය. යට කී පරිදි බාල දරුවෙක් සිනා නැතිව - උපේක්‍ෂාවත් වැ අතතුබූ දෙයක් සිය කැමැත්තෙන්ම භික්ෂු ආදීන්ට දෙයි ද එවිට ඔහුට **උපෙක්ඛා සහගත ඤාණවිප්පයුත්ත අසංඛාරික** යන සත්වන කුසල චිත්තය ලැබෙන්නේ ය. සොම්නස්

වන්නට හේතු නැත්තෙන් උපෙක්ඛා සහගත විය. බාල භාවයෙන් ඥාන විප්‍රයුක්ත විය. සිය කැමැත්තෙන් දුන් හෙයින් අසංඛාරික විය.

8. අට වන චිත්තයෙහි ද උපෙක්ඛා සහගත බව ඤාණවිප්පයුත්ත බව, සසංඛාරික බව කී සේ ම ය. යම් බාල දරුවෙක් සිනා නැති වැ උපේක්‍ෂාවත් වැ මව්පියන්ගේ නියෝගයෙන් තමා අත තුබූවක් භික්‍ෂු ආදීන්ට දෙයි ද එවිට ඔහුට **උපෙක්ඛා සහගත ඤාණවිප්පයුත්ත සසංඛාරික** යන අටවන කුසල චිත්තය ලැබෙන්නේ ය.

### ප්‍රශ්න

1. කාමාවචර කුසල සිත් අට කෙසේ ද?
2. සොමනස්ස සහගත ඤාණසම්පයුත්ත යනු කිම?
3. කුසලයක් සසංඛාර අසංඛාර වීමේ හේතු කවරේ ද?
4. සත් නව කාමාවචර කුසල චිත්තය ලැබෙන පරිදි දක්වනු.
5. ළදරුවෙක් විහාරයට ගොස් මෑණියන්ගේ නියෝගයෙන් සතුටින් බුදුන් වැන්දේය. ඔහුට ලැබුණු කුසල චිත්තය කුමක් ද?

## 12. කාමාවචර සහේතුක විපාක සිත් (8) අට.

යට දක්වන ලද කාමාවචර කුසලයන්ගේ විපාක වනාහි අහේතුක විපාක, සහේතුක විපාක ය යි දෙවැදෑරුම් වේ. එයින් අහේතුක විපාක අට නව වන පාඩමෙන් දක්වන ලද්දේ ය. සහේතුක විපාක සිත් අට මෙසේ ය.

1. සොමනස්ස සහගත ඤාණසම්පයුත්ත අසංඛාර චිත්තය,
2. සොමනස්ස සහගත ඤාණසම්පයුත්ත සසංඛාර චිත්තය
3. සොමනස්ස සහගත ඤාණවිප්පයුත්ත අසංඛාර චිත්තය,
4. සොමනස්ස සහගත ඤාණවිප්පයුත්ත සසංඛාර චිත්තය,
5. උපෙක්ඛා සහගත ඤාණසම්පයුත්ත අසංඛාර චිත්තය,
6. උපෙක්ඛා සහගත ඤාණසම්පයුත්ත සසංඛාර චිත්තය,
7. උපෙක්ඛා සහගත ඤාණ විප්පයුත්ත අසංඛාර චිත්තය,
8. උපෙක්ඛා සහගත ඤාණ විප්පයුත්ත සසංඛාර චිත්තය,

මේ විපාක සිත් සාමාන්‍යයෙන් යට දැක්වූ කුසල සිත් බඳු ය. රූපයකින් හටගන්නා සෙවනැල්ල බොහෝ සෙයින් ඒ රූපාකාරයෙන් මැ පවත්නා මෙනි, විශේෂ සැකෙවින් මෙහි දක්වනු ලැබේ.

මොව්හු සත්ත්වයන් පිළිබඳ වැ ප්‍රතිසන්ධි වශයෙන් ද, භවාඞ්ග වශයෙන් ද, තදලම්බන වශයෙන් ද, චුති වශයෙන් ද යි සතර ආකාරයකින් පවතිත්. ප්‍රතිසන්ධි වශයෙන් පවත්නා කල්හි ප්‍රතිසන්ධිවිපාකය යි කියනු ලැබේ. භවාඞ්ග තදලම්බන චුති වශයෙන් පවත්නා කල්හි ප්‍රවෘත්ති විපාක යයි කියනු ලැබේ. ප්‍රතිසන්ධි නම් අභිනව භවයෙක පිළිසිඳ ගැන්ම ය - හෙවත් භවයකින් භවයක් ගැළපීම ය. භවාඞ්ග නම් චක්‍ෂුරාදී ද්වාරවලින් අරමුණු නො ගෙන සිත තැන්පත් ව මෙන් තිබීම ය. තදලම්බන නම් චිත්ත වීථීන්හි දී ජවනය විසින් ගන්නා ලද අරමුණු ගැනීම ය. චුති නම් ඒ භවයෙන් ගිලිහීම යි.

මේ විපාක සිත් අතුරෙහි, 1, 2, 3, 4 වන සිත් සෝමනස්ස සහගත ය. විපාක සිත් සොම්න්ස සහගතවීමේ හේතුව ඉෂ්ටාරම්මණ ලැබීම යි. 5, 6, 7, 8 යන සිත් උපේක්‍ෂා සහගත ය. විපාක සිත් උපේක්‍ෂා සහගතවීමේ හේතුව ඉෂ්ට මධ්‍යස්ථාරම්මණ ලැබීම යි.

එසේ ම මොවුන් අතුරෙහි, 1, 2, 5, 6 වන සිත් ඥාන සම්ප්‍රයුක්ත ය. මේ විපාක සිත් ඥාන සම්ප්‍රයුක්තවීමේ හේතු ක්‍රම දෙකෙකි. ඔව්හු ප්‍රතිසන්ධි භවාඞ්ග, චුති වශයෙන් පවත්නා කල්හි කර්මයාගේ බලවත් භාවයෙන් ඥාන සම්ප්‍රයුක්ත වෙති. ත්‍රිහේතුක උත්කෘෂ්ට කුශලකර්මයෙන් ලැබෙන ප්‍රතිසන්ධි ඥාන සම්ප්‍රයුක්ත වන බැවිනි, භවාඞ්ග සිත් හා චුති සිත් ඒ භවයාගේ ප්‍රතිසන්ධි චිත්ත හා සමාන බැවින් ඒ භවාඞ්ග චුති චිත්තයන්ගේ ඥාන සම්ප්‍රයුක්තවීමේ හේතුව ද මේ කර්මයාගේ බලවත් භාවය යි හෙවත් පුරාකෘත කර්මය ත්‍රිහේතුක උත්කෘෂ්ට කුශලයක් වීම යි. අනෙක් හේතුව නම් ඔවුන් තදාලම්බන වශයෙන් පවත්නා කල්හි ජවනානුරූපත්වයෙන් (ජවනයන්ට අනුවැ පැවැත්මෙන්) ඥාන සම්ප්‍රයුක්තවීම ය. ඥාන සම්ප්‍රයුක්ත ජවනයට අනතුරුව උපදනා තදාලම්බන ද ඥාන සම්ප්‍රයුක්ත වන බැවිනි. මෙහි ත්‍රිහේතුක කුශල නම් අලෝභ-අදෝස-අමෝහ යන හේතුත්‍රිකය හා යෙදුණු නව වන පාඩමේ දක්වන ලද 1, 2, 5, 6 වන කුසල චිත්තයෝ ය. ඔවුන්ගේ පිරිවර සිත් හෙවත් පූර්ව අපර වශයෙන් උපදනා සිත් ද එබඳුම වී නම් එවිට ත්‍රිහේතුක උත්කෘෂ්ට කුසලය යි කියනු ලැබේ.

එසේ ම මේ විපාක සිත් අතුරෙහි, 3, 4, 7, 8 වන චිත්තයෝ ඥාන විප්‍රයුක්තයහ. කර්මයාගේ දුබල භාවය ද, ජවනානුරූපත්‍වයද යි (ජවනයන්ට අනු ව පැවැත්ම ද යි) ඒ විපාක සිත් ඥාන විප්‍රයුක්ත වීමේ ද හේතු ක්‍රම දෙකෙකි. ඔව්හු ප්‍රතිසන්ධි භවාඞ්ග චුති වශයෙන් පවත්නා කල්හි කර්මයාගේ දුබල භාවයෙන් ඥානවිප්‍රයුක්ත වෙති. ත්‍රිහේතුක ඔමක කර්මයෙන් හා ද්විහේතුක උත්කෘෂ්ට කර්මයෙන් ලැබෙන ප්‍රතිසන්ධි භවාඞ්ග චුති ඥාන විප්‍රයුක්ත වන බැවිනි. ඔව්හු තදාලම්බන වශයෙන් පවත්නා කල්හි ජවනානුරූප වැ ඥාන විප්‍රයුක්ත වෙත්. ඥාන විප්‍රයුක්ත ජවනයන්ට අනතුරු වැ උපදනා තදාලම්බන බොහෝසෙයින් ඥාන විප්‍රයුක්ත වන බැවිනි.

මේ විපාක සිත් අතුරෙහි 1, 3, 5, 7 වන චිත්තයෝ අසංඛාරයහ. පූර්ව ප්‍රයෝගයෙන් වෙන් වැ එළඹ සිටි කර්ම, කර්මනිමිති, ගතිනිමිති, හේතුයෙන් හා සප්පාය සෘතු භෝජනාදිය ලැබීම් හේතුවෙන් ඔව්හු අසංඛාර වෙති.

2, 4, 6, 8 චිත්තයෝ සසංඛාරයහ. පූර්ව නියෝග හේතුවෙන් එළඹ **සිටි කර්ම, කර්මනිමිති, ගතිනිමිති** කරණකොට ගෙන හා අසප්පාය ඍතු භෝජනාදිය කරණකොට ගෙන ඔව්හු සසංඛාර වෙත්.

මේ ස්ථානය ගැඹුරුය. විශේෂ විස්තර මතු දැක්වේ.

ප්‍රශ්න

1. කාමාවචර කුශල විපාක කෙතෙක් ද? එහි අහේතුක කීය ද? සහේතුක කීය ද? ඔව්හු කවරහු ද?
2. සත්ත්වයකුට මේ සහේතුක විපාක සිත් කී ආකාරයකින් ලැබේ ද? ඔව්හු කවරහු ද?
3. මොවුන් සෝමනස්ස හා උපෙක්ඛා සහගත වීමේ හේතු කවරේ ද?
4. මොවුන් ඥාන සම්ප්‍රයුක්ත වීමේ හේතු කිම?
5. මොවුන් අසංඛාර සසංඛාර වීමේ හේතු කිම?

# 13. කාමාවචර සහේතුක ක්‍රියා සිත් අට

කාමාවචර ක්‍රියා සිත්-අහේතුක ක්‍රියා සිත් ය. සහේතුක ක්‍රියා සිත් ය යි දෙවැදැරුම් වේ. එයින් අහේතුක ක්‍රියා සිත් දස වන පාඩමෙහි දක්වන ලදි. සහේතුක ක්‍රියා අට මෙසේ ය.

1. සෝමනස්ස සහගත ඤාණ සම්පයුත්ත අසංඛාර චිත්තය,
2. සෝමනස්ස සහගත ඤාණ සම්පයුත්ත සසංඛාර චිත්තය,
3. සෝමනස්ස සහගත ඤාණ විප්පයුත්ත අසංඛාර චිත්තය,
4. සෝමනස්ස සහගත ඤාණ විප්පයුත්ත සසංඛාර චිත්තය,
5. උපෙක්ඛා සහගත ඤාණ සම්පයුත්ත අසංඛාර චිත්තය,
6. උපෙක්ඛා සහගත ඤාණ සම්පයුත්ත සසංඛාර චිත්තය,
7. උපෙක්ඛා සහගත ඤාණ සම්පයුත්ත අසංඛාර චිත්තය,
8. උපෙක්ඛා සහගත ඤාණ සම්පයුත්ත සසංඛාර චිත්තය,

මේ සිත්වල ලක්‍ෂණ යට දැක්වූ කාමාවචර කුසල සිත්වලට කී ලක්‍ෂණ බඳු ය. විශේෂය නම් රහතන් වහන්සේට පමණක් මේ සිත් උපදින බවයි.

ඒ එසේ මැයි. පෘථග්ජනයෙක් හෝ ශෛක්‍ෂ පුද්ගලයෙක් හෝ සොම්නසින් හා නුවණින් යුක්තවැ තමාගේ ම ඕනෑකමින් කුශල කර්මයක් කෙළේ නම්, එවිට ඔහුට **සෝමනස්ස සහගත ඤාණ සම්පයුත්ත අසංඛාර** යන පළමු වන කාමාවචර කුසල චිත්තය ලැබෙන්නේ ය. එ බඳු වූ ම ස්ථානයෙහි **ක්‍ෂීණාශ්‍රව** රහතන් වහන්සේට **සෝමනස්ස සහගත ඤාණ සම්පයුත්ත අසංඛාර** යන පළමු වන කාමාවචර ක්‍රියා චිත්තය ලැබෙන්නේ ය. සෙසු සිත් සතෙහි ද ක්‍රමය මෙසේ ය. මේ සිත් මතු විපාක නොලබන හෙයින් කුශල නොවේ. පෙර

කළ කර්මයකට විපාක නො වන හෙයින් විපාකත් නොවේ. එබැවින් මොව්හු ක්‍රියා චිත්තයෝ යි කියනු ලැබෙත්.

ක්‍රියා සිත් සොම්නස් උපේක්‍ෂා සහගත වීමේ ද ඤාණ සම්පයුත්ත විප්පයුත්ත වීමේ ද අසංඛාර සසංඛාර වීමේ ද විශේෂ හේතු ඇතත් මෙහි නො දක්වන ලදි.

ප්‍රශ්න

1. සහේතුක කාමාවචර ක්‍රියා සිත් කෙතෙක් ද? ඔහු කවරහු ද?
2. මේ ක්‍රියා සිත් කවරකුහට උපදී ද?
3. පළමු වන ක්‍රියා සිතෙහි ආකාර කෙසේ ද?

**"වෙදනා ඤාණ සංඛාර භෙදෙන චතුවීසති,**
**සහෙතුකාමාවචර පුඤ්ඤපාක ක්‍රියා මතා"**

කාමාවචර කුසල ය, සහේතුක කාමාවචර විපාකය, සහේතුක කාමාවචර ක්‍රියා ය යන සිත් වේදනා, ඤාණ සංඛාර භේදයෙන් සූවිස්සෙක.

**කාමාවචර සිත් 54 නිමි.**

## 14. රූපාවචර කුසල සිත් (5) පස

1. විතක්ක, විචාර, පීති, සුඛ, එකග්ගතා, සහිත පඨමජ්ඣාන කුසල චිත්තය,
2. විචාර, පීති, සුඛ, එකග්ගතා සහිත දුතියජ්ඣාන කුසල චිත්තය,
3. පීති, සුඛ, එකග්ගතා සහිත තතියජ්ඣාන කුසල චිත්තය,
4. සුඛ, එකග්ගතා සහිත චතුත්‍ථජ්ඣාන කුසල චිත්තය,
5. උපෙක්ඛා, එකග්ගතා සහිත පඤ්චමජ්ඣාන කුසල චිත්තය

යන මේ සිත් පස රූපාවචර කුසල සිත් නම් වේ.

1. චෛතසිකයින්ගෙන් වෙන් වැ සිතක් නො පවත්නා බව යට කියන ලදි. රූපාවචර චිත්තයන්හි යෙදෙන **ඵස්ස වෙදනා** ආදී පන්තිස් (35) චෛතසිකයන් අතුරෙහි පසක් පමණක් මෙහි විශේෂකොට දක්වන ලද්දේ ය. ඔවුන් ම ධ්‍යාන නම් වන බැවිනි. නිම්වළලු ඇවී ආදි සමුදායට රථ චක්‍ර යන නාමය ව්‍යවහාර කරන්නා **සේ විතක්ක, විචාර, පීති, සුඛ, එකග්ගතා** යන චෛතසික සමුදායට ධ්‍යාන යන නාමය ව්‍යවහාර කරනු ලැබේ. **"ඣානන්ති විතක්කො විචාරො පීති සුඛං චිත්තස්සෙකග්ගතා"** යි - විභංගයෙහි වදාළේ ය. ආරම්මණ උපනිජ්ඣානය කරන්නේ (-අරමුණ බලන්නේ) හෝ විරුද්ධ ක්ලේශයන්

ඣාපනය කරන්නේ (-දවාලන්නේ) ධ්‍යාන ය යි කියනු ලැබේ. ආරම්මණ උපනිජ්ඣානය (-අරමුණ බැලීම) ධ්‍යානයාගේ එක කෘත්‍යයෙක. ඒ එසේමැ යි. විතර්කය තෙම අරමුණට සිත නගන්නේ ය. විචාරය සිත අරමුණෙහි හසුරුවන්නේ ය. ප්‍රීතිය අරමුණෙන් සිත පිනවන්නේ ය. සුඛය සිතට ආරම්මණ රසය අනුභව කරවන්නේ ය. එකග්ගතාව නොයෙක් අරමුණුවල සිත විසිර යා නො දී එක අරමුණෙක යොදා තබන්නේ ය.

විරුද්ධ කෙලෙස් දවාලීම ද ධ්‍යානයාගේ එක් කෘත්‍යයෙක ඒ එසේ මැයි. **විතර්කය** තෙම ථිනමිද්ධ නීවරණය දවාලන්නේ ය. **විචාරය** විචිකිච්ඡා නීවරණය දවා ලන්නේ ය. **ප්‍රීතිය** ව්‍යාපාද නීවරණය දවාලන්නේ ය. **සුඛය** උද්ධච්ච කුක්කුච්ච නීවරණය දවාලන්නේ ය. **එකග්ගතාව** කාමච්ඡන්ද නීවරණය දවාලන්නේ ය. මෙසේ මේ පංචාඞ්ගයෙන් යුක්ත වූ ධ්‍යාන කුශල චිත්තය **පඨමජ්ඣාන කුසල චිත්තය** යි කියනු ලැබේ.

ඒ පඨමජ්ඣාන කුසල චිත්තය ලැබෙන ආකාරය ඉතා සැකෙවින් මෙසේ දතයුතු.

දේවලෝකයෙහි හෝ මනුෂ්‍ය ලෝකයෙහි පවත්නා කාමසුඛය ලාමක කොට සලකා මේ ලෙව්හි සමාධි සුඛය හා පරලෙව්හි බ්‍රහ්ම සුඛය විඳගන්නා කැමැති ත්‍රිහේතුක ප්‍රතිසන්ධියෙන් යුත් යෝගාවචරයා **පඨවි කසිණ** ආදී කර්මස්ථානයන් අතුරෙහි ස්වකීය චරිතයට අනුකූල වූ කර්මස්ථානයක් ලබාගෙන පරිශුද්ධ ශීලයෙහි පිහිටා විවේක ස්ථානයක හිඳ භාවනාවට බැසගන්නේ ය. ඉදින් හෙතෙම පඨවි කසිණය අරමුණු කරන්නේ නම් අරුණුවන් මැටියෙන් නියමිත පරිදි සකස් කරගන්නා ලද කසිණ මණ්ඩලය ඉදිරියෙහි තබාගෙනැ ඒ දෙස ම බලා ගනිමින් "පඨවි පඨවි" යි සිය දහස් වරකුදු භාවනා කරන්නේ ය. එවිට ඔහුගේ කසිණාරම්මණයට **පරිකර්ම නිමිත්ත** ය යි ද, භාවනාවට **පරිකර්ම භාවනාව** ය යි ද කියනු ලැබේ. මෙසේ කලක් භාවනා කරන්නහුට ඒ කසිණාරම්මණය ඇසට නො වැ සිතට ම අරමුණු වන්නේය. ඇස පියාලා බැලුවත් අන්‍ය දිශාවෙක බැලුවත් ඒ ආරම්මණයට සමාන වූ ම ආරම්මණයක් පෙනෙන්නට පටන් ගන්නේ ය. එවිට ඒ ආරම්මණයට **උග්ගහ නිමිත්ත** යයි ද භාවනාවට **පරිකර්ම භාවනාව** ය යි ද කියනු ලැබේ. මෙසේ ඒ උග්ගහ නිමිත්ත අරමුණු කොට ගෙන පරිකර්ම භාවනායෙන් භාවනා කරන කල්හි සඳ පළා නැගි ආලෝකයක් සේ **උග්ගහ නිමිත්ත** පළාගෙන මෙන් අතිපරිශුද්ධ ආලෝකයෙක් පහළ වන්නේ ය. එවිට ඒ ආරම්මණයට **පටිභාග නිමිත්ත** ය යි ද භාවනාවට **උපචාර භාවනාව** ය යි ද කියනු ලැබේ. මෙසේ උපචාර භාවනායෙන් පටිභාග නිමිත්ත වඩන කල්හි කාමච්ඡන්දාදී පංචවිධ නීවරණයන් මැඩලන්නාවූ ද ආරම්මණය විශේෂ කොට බලන්නා වූ **විතර්ක, විචාර, ප්‍රීති, සුඛ, එකාග්‍රතා** යන ධ්‍යානාඞ්ගයන් උද්දීප්ත කොට ඇති **පඨමජ්ඣාන** කුසල චිත්තය පහළ වන්නේ ය.

2. ප්‍රථමධ්‍යානය ලබාගත් යෝගාවචරයා එහි ඇතුළත් වූ විතර්කය ඕලාරිකය යි සලකා එය දුරු කැරගන්නා පිණිස පෙර සේ යළිදු භාවනා කරන්නේ විතර්ක රහිත වූ **විචාර, පීති, සුඛ, එකග්ගතා** යන සතරින් යුත් **ද්විතීය ධ්‍යාන කුශල චිත්තය** ලබන්නේ ය.

ද්විතීය ධ්‍යානය ලබාගත්තේ එහි ඇතුළත් වූ විචාරය ඔලාරිකය යි සලකා එය දුරු කැරැ ගන්නා පිණිස පෙර සේ යළිදු භාවනාකරන්නේ විචාර රහිත වූ පීති, සුඛ, එකග්ගතා යන අඞ්ගත්‍රිකයෙන් යුක්ත වූ **තෘතීය ධ්‍යානය** ලබන්නේ ය.

4. තෘතීය ධ්‍යානය ලබාගත්තේ එහි ඇතුළත් වූ ප්‍රීතිය ඔලාරිකය යි සලකා එය දුරු කැරැ ගන්නා පිණිස පෙර සේ යළිදු භාවනා කරන්නේ ප්‍රීති රහිත වූ **සුඛ එකග්ගතා** යන අඞ්ගද්වයයෙන් යුක්ත වූ **චතුර්ථ ධ්‍යානය** ලබන්නේ ය.

5. චතුර්ථ ධ්‍යානය ලබාගත්තේ එහි ඇතුළත් වූ සුඛය ඔලාරික වශයෙන් සලකා එය දුරු කැරැගන්නා පිණිස පෙර සේ යළි දු භාවනා කරන්නේ සුඛ රහිත වූ **උපෙක්ඛා එකග්ගතා** යන අඞ්ගද්වයයෙන් යුක්ත වූ **පඤ්චම ධ්‍යානය** ලබන්නේ ය, උපේක්‍ෂාව ශාන්ත පැවතුම් ඇති බැවින් සුඛයෙහි ම ඇතුළත් බව දතයුතු.

### ප්‍රශ්න

1. රූපාවචර කුසල සිත් පස කෙසේ ද?
2. ධ්‍යාන යනු කවරේ ද?
3. කවර අර්ථයන් කරණ කොට ගෙනැ විතර්කාදීන්ට ඣාන යන නාමය ලැබේ ද?
4. ප්‍රථම ධ්‍යාන කුශල චිත්තය ලැබෙන ආකාරය සැකෙවින් දක්වනු.
5. චතුර්ථ ධ්‍යාන කුශල චිත්තයෙහි හා පඤ්චම ධ්‍යාන කුශල චිත්තයෙහි වෙනස දක්වනු.

## 15. රූපාවචර විපාක සිත් පස

1. විතක්ක, විචාර, පීති, සුඛ, එකග්ගතා සහිත පඨමජ්ඣාන විපාක චිත්තය,
2. විචාර, පීති, සුඛ, එකග්ගතා සහිත දුතියජ්ඣාන විපාක චිත්තය,
3. පීති, සුඛ, එකග්ගතා සහිත තතියජ්ඣාන විපාක චිත්තය,
4. සුඛ, එකග්ගතා සහිත චතුත්ථජ්ඣාන විපාක චිත්තය,
5. උපෙක්ඛා, එකග්ගතා සහිත පඤ්චමජ්ඣාන විපාක චිත්තය,

යන මේ පස රූපාවචර විපාක සිත් නම් වේ. මේ විපාක සිත් වනාහි සාමාන්‍යයෙන් යට දක්වන ලද රූපාවචර කුසල සිත් බඳු ය. කැටපතෙහි දක්නා ලැබෙන ඡායාරූපය බලන්නහුගේ ම රූපය සමාන වන්නාක් මෙනි.

යට කී රූපාවචර කුසල සිත් උපදවා ගත්තවුන්ට මේ විපාක චිත්තයෝ ප්‍රතිසන්ධි වශයෙන් ද, භවාඞ්ග වශයෙන් ද, චුති වශයෙන් දැයි තුන් ආකාරයෙකින් උපදිත්.

ඒ එසේ මැයි. යමෙක් මේ ජන්මයෙහි කසිණාදී භාවනාවක් කොට ප්‍රථමධ්‍යාන කුශල චිත්තය ලබාගත්තේ නම් එය ද පරිත්ත වශයෙන් වැඩුයේ නම් හෙතෙම ඒ ධ්‍යානයෙන් නො පිරිහී කාලක්‍රියා කෙළේ නම් **බ්‍රහ්මපාරිසජ්ජ** නම් බඹලොව උපදනේ ය. එසේ ඉපදීම් වශයෙන් එහි පළමු කොටම පහළ වන චිත්තය **ප්‍රතිසන්ධි චිත්තය** යි ද එසේ උපන් තෙක් පටන් ඒ භවයෙහි වසනා තාක් චක්ෂුරාදීන් අරමුණු නො ගෙනැ සිටින කල්හි උපදින සිත් **භවාඞ්ග සිත්** ය යි ද ඒ භවයෙන් ගිලිහීම් වශයෙන් අවසන්හි උපදින චිත්තය **චුතිචිත්තය** යි ද කියනු ලැබේ. ඒ ප්‍රතිසන්ධි භවාඞ්ග චුති චිත්තයෝ මේ ජන්මයේ උපදවා ගන්නා ලද පඨමජ්ඣාන කුසලයට විපාක වහයෙන් උපදනා හෙයින් විපාක සිත් ය යි කියනු ලැබෙත්. ඔවුහු ම මෙහි **විතක්ක, විචාර, පීති, සුඛ, එකග්ගතා සහිත පඨමජ්ඣාන විපාක චිත්තය** යනාදී වශයෙන් දැක්වෙති.

මේ පඨමජ්ඣාන කුසල චිත්තය ම මධ්‍යම වශයෙන් වැඩුයේ නම් **බ්‍රහ්මපුරෝහිත** නම් බඹලොව ද එය ම ප්‍රණීත වශයෙන් වැඩුයේ නම් **මහාබ්‍රහ්ම** නම් බඹලොව ද උපදනේය. මේ තුන පඨමජ්ඣාන භූමි ය.

ද්විතීය ධ්‍යානය හා තෘතීය ධ්‍යානය පරිත්ත වශයෙන් වැඩුයේ නම් **පරිත්තාභ** නම් බඹ ලොව ද මධ්‍යම වශයෙන් වැඩුයේ නම් **අප්පමාණාභ** නම් බඹ ලොව ද ප්‍රණීත වශයෙන් වැඩුයේ නම්, **ආභස්සර** නම් බඹ ලොව ද උපදනේ ය. මේ දුතියජ්ඣාන භූමි ය.

චතුර්ථ ධ්‍යානය පරිත්ත වශයෙන් වැඩුයේ නම් **පරිත්ත සුභ** නම් බඹ ලොව ද මධ්‍යම වශයෙන් වැඩුයේ නම් **අප්පමාණ සුභ** නම් බඹ ලොව ද ප්‍රණීත වශයෙන් වැඩුයේ නම් **සුභකිණ්හ** නම් බඹලොව ද උපදනේ ය. මේ තතියජ්ඣාන භූමි ය.

පඤ්චමධ්‍යානය වැඩුයේ නම් **වෙහප්ඵලයෙහි** ද එය ම සිත නැති කරන සේ වැඩුයේ නම් **අසඤ්ඤසත්තයෙහි** ද අනාගාමී වැ ශුද්ධාවාසයන්හි ද උපදනේ ය. මේ චතුත්ථජ්ඣාන භූමි ය. (ධ්‍යානය ලැබගත් මාත්‍රය-වසග නො කිරීම් පරිත්තය, මධ්‍යම වශයෙන් වසඟකර ගැන්ම මධ්‍යම ය. අතිශයින් වසඟකර ගැන්ම ප්‍රණීත යි.) මේ සියලු තන්හි ම ප්‍රතිසන්ධි භවාඞ්ග චුති වශයෙන් ඒ ඒ විපාකයන්ගේ පහළවීම ප්‍රථමධ්‍යාන විපාක චිත්තයට කී පරිදි දතයුතු ය.

විශේෂ වශයෙන් බලත හොත්:

1. **පඨමජ්ඣාන විපාකය** චිත්තය ප්‍රථම ධ්‍යාන භූමියෙහි ප්‍රතිසන්ධි භවාඞ්ග චුති වශයෙන් ලැබෙන්නේ ය.

2-3. **දුතියජ්ඣාන** විපාක චිත්තය හා **තතියජ්ඣාන** විපාක චිත්තය දුතියජ්ඣාන විපාක භූමියෙහි **ප්‍රතිසන්ධි** භවාඞ්ග චුති වශයෙන් ලැබෙන්නේ ය.

4. **චතුත්ථජ්ඣාන** විපාක චිත්තය තතියජ්ඣාන භූමියෙහි ප්‍රතිසන්ධි භවාඞ්ග චුති වශයෙන් ලැබෙන්නේ ය.

5. **පඤ්චමජ්ඣාන** විපාක චිත්තය චතුත්ථජ්ඣාන භූමියෙහි ප්‍රතිසන්ධි භවාඞ්ග චුති වශයෙන් ලැබෙන්නේ ය.

### ප්‍රශ්න

1. රූපාවචර විපාක සිත් පස කවරේ ද?
2. මොවුහු විපාක වශයෙන් කවර කවර ලෝකයන්හි උපදිත් ද?
3. ප්‍රථමධ්‍යාන විපාක චිත්තය ලැබෙන පරිදි විස්තර කරනු.
4. පරිත්ත, මධ්‍යම, ප්‍රණීත යනු කිම?
5. චතුත්ථජ්ඣාන භූමිය කිමෙක් ද?

## 16. රූපාවචර ක්‍රියා සිත් පස.

1. විතක්ක, විචාර, පීති, සුඛ, එකග්ගතා සහිත පඨමජ්ඣාන ක්‍රියා චිත්තය,
2. විචාර, පීති, සුඛ, එකග්ගතා සහිත දුතියජ්ඣාන ක්‍රියා චිත්තය,
3. පීති, සුඛ, එකග්ගතා සහිත තතියජ්ඣාන ක්‍රියා චිත්තය,
4. සුඛ, එකග්ගතා සහිත චතුත්ථජ්ඣාන ක්‍රියා චිත්තය,
5. උපෙක්ඛා, එකග්ගතා සහිත පඤ්චමජ්ඣාන ක්‍රියා චිත්තය,

යන මේ පස රූපාවචර ක්‍රියා සිත් නම් වේ. පුථුජ්ජනයෙක් හෝ ශෛක්‍ෂයෙක් හෝ කසිණාදි භාවනාවක් වඩා විතර්කාදි අඞ්ග පංචකයෙන් යුත් ප්‍රථමධ්‍යානය ලැබුයේ නම් එය ප්‍රථමධ්‍යාන කුශල චිත්තය යි කියනු ලැබේ. අශෛක්‍ෂ සංඛ්‍යාත රහතන් වහන්සේ එබඳු වූ ම ප්‍රථමධ්‍යානය ලැබුයේ නම් එය ප්‍රථමධ්‍යාන ක්‍රියා චිත්තය යි කියනු ලැබේ. සෙස්සෙහි ද මෙසේය. රහතන් වහන්සේ කෙනෙකුන් විසින් මේ ධ්‍යාන සිත් ලැබීම ක්‍රියා සිත් වීමේ හේතුය. ක්‍රියා සිත් යන්නෙහි අදහස යට කියන ලද්දේ ය.

**"පඤ්චධා ඣාන භෙදෙන රූපාවචර මානසං,**
**පුඤ්ඤපාක ක්‍රියා භෙද තං පඤ්චදසධාභවෙ"**

රූපාවචර සිත ඣාන භේදයෙන් පඤ්චවිධ ය. යළි කුශල විපාක ක්‍රියා භේදයෙන් පසළොස් වැදෑරුම්.

**ප්‍රශ්න**

1. රූපාවචර ක්‍රියා සිත් පස කෙසේ ද?
2. මේ සිත් කවුරුන්හට උපදිත් ද?
3. ක්‍රියා සිත් යනුවෙහි අදහස කිමෙක් ද?

## 17. අරූපාවචර කුසල සිත් සතර.

1. ආකාසානඤ්චායතන කුසල චිත්තය,
2. විඤ්ඤාණඤ්චායතන කුසල චිත්තය,
3. ආකිඤ්චඤ්ඤායතන කුසල චිත්තය,
4. නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසල චිත්තය,

යන මේ සතර අරූපාවචර කුසල සිත් නම් වේ.

1. ආකාසානන්ත කියයුතු තන්හි සුඛොච්චාරණය සඳහා ආකාසානඤ්ච යි කියන ලද්දේ ය. අනන්ත ආකාසය යනු එහි අර්ථ ය. **අනන්තාකාසය නම් උප්පාදන්ත වයන්ත නැති කසිණුග්ඝාටිමාකාසය** යි = හෙවත් කිසුණු ඉගුළු අහස යි. කිසුණු ඉගුළු අහස අරමුණු කොට ගෙන භාවනා කරන යෝගාවචරයාට අනුක්‍රමයෙන් උපදින ධ්‍යාන චිත්තය **ආකාසානඤ්චායතන කුශල චිත්තය** යි කියනු ලැබේ.

එය ලැබගන්නා ක්‍රමය මෙසේ ය.

යට දැක්වූ පරිදි රූපාවචර ධ්‍යාන ලැබූයේ රූපය කලහ විග්‍රහ විවාදාදියට හා නානාවිධ රොගශතයන්ට හේතුවන්නේ ය යි රූපයෙහි ආදීනව සලකා රූපය දුරු කැරැ ගන්නා කැමැත්තෙන් පළමුකොට ආකාස කසිණය හැරැ පඨවි කසිණාදී වූ නව කසිණයන් අතුරෙන් එක්තරා කසිණයක් අරමුණු කොට ගෙනැ පඤ්චමධ්‍යානය උපදවන්නේ ය. ඉක්බිති ඒ පඤ්චමධ්‍යානයෙන් නැගී පඤ්චමධ්‍යානයට අරමුණු වූ කසිණාරම්මණය තමා කැමැති තාක් ප්‍රදේශයක පතුරුවන්නේ ය. ඒ පැතිරී ගිය කසිණාරම්මණය මෙනෙහි නො කරන කල්හි එහි ආකාශ මාත්‍රය පැනෙයි. කසිණුග්ඝාටිමාකාසය හෙවත් කිසුණු ඉගුළු අහස නම් ඒ කසිණාරම්මණයෙන් ස්පෘෂ්ට වූ ශුද්ධ අවකාශය යි. ඒ කිසුණු ඉගුළු අහස අරමුණු කොටගෙන "ආකාසො, ආකාසො" යි හෝ "අනන්තො, ආකාසො, අනන්තො ආකාසො" යි හෝ කියමින් භාවනා කරන්නහුට නීවරණ සන්සිඳීමෙන් යථාවිධින් **ආකාසානඤ්චායතන කුසලචිත්තය** ලැබෙන්නේ ය.

2. මෙහි දු විඤ්ඤාණානන්ත කියයුතු තන්හි විඤ්ඤාණඤ්චය යි කියන ලද්දේ ය, අනන්ත වූ විඤ්ඤාණය යනු එහි අර්ථය, අනන්ත විඤ්ඤාණ නම් තමා විසින් ම කලින් උපදවාගත් ආකාසානඤ්චායතන චිත්තය යි. එය අරමුණු කොට ගෙන භාවනා කරන්නහුට යථාවිධීන් ලැබෙන ධ්‍යාන චිත්තය **විඤ්ඤණඤ්චායතන කුසල චිත්තය** යි කියනු ලැබේ.

එය ලැබැ ගන්නා ක්‍රමය මෙසේ ය.

**ආකාසානඤ්චායතනය** වසඟ කරගත් යෝගාවචරයා සර්පයාට බිය වූ පුරුෂයා සර්ප සමාන රැහැන් කැබැල්ලට ද බිය වන්නා සේ රූප සම්බන්ධයෙන් උපදවාගත් ආකාසානඤ්චායතන ධ්‍යානයට ද කලකිරී එය දුරු කැරැ ගන්නා පිණිස භාවනා කරන්නේ ඒ ආකාසානඤ්චායතන චිත්තය ම අරමුණු කොට ගෙනැ “විඤ්ඤාණං, විඤ්ඤාණං” කියා හෝ “අනන්තං විඤ්ඤාණං, අනන්තං විඤ්ඤාණං” කියා හෝ භාවනා කරන්නේ ය. එසේ භාවනා කරන්නහුට යථාක්‍රමයෙන් විඤ්ඤාණඤ්චායතන කුසල චිත්තය ලැබෙන්නේ ය.

3. කිසිවක් නැත්තේ ය යන අර්ථයෙහි අකිංචන ය යි කියනු ලැබේ. අකිඤ්චන භාවය හෙවත් කිසිවක් නැති බව ආකිඤ්චඤ්ඤ නම්. ආකාසානඤ්චායතනය උපදවා ගත් යෝගාවචරයා විඤ්ඤාණඤ්චායතනය උපදවා ගත් කල්හි ඔහුගේ ආකාසානඤ්චායතන චිත්තය අභාවයට යන්නේ ය. ඒ අභාව මාත්‍රය ම මෙහි ආකිඤ්චඤ්ඤ ශබ්දයෙන් කියනු ලැබේ. ඒ අරමුණු කොට උපදවන ධ්‍යාන චිත්තය **ආකිඤ්චඤ්ඤයතන කුසල චිත්තය** යි කියනු ලැබේ.

එය ලැබැ ගන්නා ක්‍රමය මෙසේ ය.

විඤ්ඤාණඤ්චායතනය උපදවාගත් යෝගාවචරයා පස් ආකාරයෙකින් එය වසඟකොට ගෙන ඉක්බිති එහි ආදීනව හා ආකිඤ්චඤ්ඤායතනයෙහි ආනිසංස සලකා විඤ්ඤාණඤ්චායතනය ඉක් මැ ආකිඤ්චඤ්ඤායතනය ලැබැ ගනු සඳහා පළමු තමාට පැවැති ආකාසානඤ්චායතන චිත්තයාගේ ම අභාව මාත්‍රය අරමුණු කොට ගෙනැ ‘නත්‍ථි කිඤ්චි, නත්‍ථි කිඤ්චි’ යි කියමින් භාවනා කරන්නේ ය. එසේ ම භාවනා කරන්නහුට යථා විධීන් ආකිඤ්චඤ්ඤායතන ධ්‍යාන කුශල චිත්තය පහළ වන්නේ ය.

4. යම් සමාපත්ති චිත්තයෙක්හි ඖලාරික වශයෙන් සංඥාව නැත්තේ ද සූක්‍ෂම වශයෙන් සංඥා මාත්‍රයෙක් ඇත්තේ ද ඒ සමාපත්ති චිත්තය **නෙවසඤ්ඤනාසඤ්ඤයතන කුසල චිත්තය** යි කියනු ලැබේ. තෙල් නැතැයි ද ඇතැයි ද නොකිය හැකි තෙල් ගෑවුණු භාජනය මෙනි.

ආකිඤ්චඤ්ඤායතනය පස් ආකාරයකින් වසඟ කැර ගත් යෝගාවචරයා එහි ආදීනව හා මෙහි ආනිසංස සලකා තමා විසින් ම උපදවා ගත් ඒ ආකිඤ්චඤ්ඤායතන චිත්තය ම අරමුණු කොට ගෙන "සන්තමෙතං, පණීතමෙතං' යි භාවනා කරන්නේ අනුක්‍රමයෙන් **නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසල චිත්තය** ලබන්නේ ය.

ප්‍රශ්න

1. අරූපාවචර කුසල සිත් සතර කවරේ ද?
2. එක එක සිතට ලැබෙන අරමුණු දක්වනු.
3. විඤ්ඤාණඤ්චායතන යන්නෙහි තේරුම කිම?
4. අරූපාවචර කුසල සිත් ලැබිය හැක්කේ කවර කසිණයන් වැඩූ අයට ද?
5. නේවසඤ්ඤා නාසඤ්ඤායතනය ලැබිය හැකි අන්දම විස්තර කරනු.

## 18. අරූපාවචර විපාක සිත් සතර.

1. ආකාසානඤ්චායතන විපාක චිත්තය,
2. විඤ්ඤාණඤ්චායතන විපාක චිත්තය,
3. ආකිඤ්චඤ්ඤායතන විපාක චිත්තය,
4. නෙවසඤ්ඤානාසඤ්ඤායතන විපාක චිත්තය,

යන මේ සතර අරූපාවචර විපාක සිත් නම් වේ.

1. මේ චිත්තයාගේ ආකාරය සාමාන්‍යයෙන් ආකාසානඤ්චායතන කුසල චිත්තයට කී නියාම ය. එය කුසලය වීම හා මෙය විපාකය වීම පමණක් වෙනසි. සෙස්සෙහි දු මෙසේ මැ යි.

ආකාසානඤ්චායතන සමාපත්තිය ලැබ එයින් නොපිරිහී කාලක්‍රියා කෙළේ කල්ප විසිදහසකට ආයු ඇති ආකාසානඤ්චායතන නම් අරූප බ්‍රහ්ම ලෝකයෙහි උපදනේ ය. එසේ උපදීම් වශයෙන් එහි ප්‍රථම වැ පහළ වන ප්‍රතිසන්ධි චිත්තය ද එහි වසන තාක් ඇතිවන භවාඞ්ග චිත්තයද අවසානයෙහි එයින් චුතවීම් වශයෙන් ඇති වන චුති චිත්තය ද මේ **ආකාසානඤ්චායතන විපාක චිත්තය** වන්නේය.

2. විඤ්ඤාණඤ්චායතන සමාපත්තිය ලබා එයින් නො පිරිහී කාලක්‍රියා කෙළේ කල්ප සතළිස් දහසකට ආයු ඇති විඤ්ඤාණඤ්චායතන නම් අරූප බ්‍රහ්ම ලෝකයෙහි උපදනේ ය. එසේ උපදීම් වශයෙන් එහි ප්‍රථමවැ පහළ වන ප්‍රතිසන්ධි. චිත්තය ද එහි වසන තාක් ඇති වන භවාඞ්ග චිත්තය ද එයින් චුතවීම් වශයෙන් ඇතිවන චුති චිත්තය ද මේ **විඤ්ඤාණඤ්චායතන විපාක චිත්තය** වන්නේය.

3. ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය ලබා එයින් නො පිරිහී කාලක්‍රියා කෙළේ කල්ප සැට දහසකට ආයු ඇති ආකිඤ්චඤ්ඤායතන නම් අරූප බ්‍රහ්ම ලෝකයෙහි උපදනේ ය. එසේ උපදීම් වශයෙන් පහළ වන ප්‍රතිසන්ධි චිත්තය ද, එහි වසන තාක් ඇතිවන භවාඞ්ග සිත් ද අවසානයෙහි ඇති වන චුති චිත්තයද **ආකිඤ්චඤ්ඤායතන විපාක චිත්තය** වන්නේ ය.

4. නේවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිය ලබා එයින් නොපිරිහී කාලක්‍රියා කෙළේ කල්ප සුවාසු දහසකට ආයු ඇති නේවසඤ්ඤා නාසඤ්ඤායතන නම් අරූප බ්‍රහ්ම ලෝකයෙහි උපදනේ ය. එසේ උපදීම් වශයෙන් එහි ප්‍රථම කොට පහළ වන ප්‍රතිසන්ධි චිත්තය ද එහි වසන තාක් ඇති වන භවාඞ්ග සිත් ද අවසානයෙහි ඇති වන චුති චිත්තය ද මේ **නේවසඤ්ඤා නාසඤ්ඤායතන** නම් විපාක චිත්තය වන්නේ ය.

### ප්‍රශ්න

1. අරූපාවචර විපාක සිත් සතර කවරේ ද?
2. මේ විපාක සිත් කවුරුන්ට කෙසේ ලැබේ ද?
3. අරූප බ්‍රහ්මලෝකයන්හි ආයුපරිච්ඡේදය දක්වනු.

## 19. අරූපාවචර ක්‍රියා සිත් (4) සතර.

1. ආකාසානඤ්චායතන ක්‍රියා චිත්තය,
2. විඤ්ඤාණඤ්චායතන ක්‍රියා චිත්තය,
3. ආකිඤ්චඤ්ඤායතන ක්‍රියා චිත්තය,
4. නේවසඤ්ඤානාසඤ්ඤායතන ක්‍රියා චිත්තය,

යන මේ සිත් සතර අරූපාවචර ක්‍රියා සිත් නම් වේ.

මේ චතුර්විධ චිත්තයන්ගේ ආකාරය සාමාන්‍යයෙන් අරූපාවචර කුසල චිත්තයන්ට කී නියා ය. හුදෙක් ඒ කුශල චිත්තය පුහුදුනට හා ශෛක්‍ෂයන්ට උපදී. මේ ක්‍රියා චිත්තයෝ අශෛක්‍ෂ සංඛ්‍යාත රහතන් වහන්සේට පමණක් උපදිත්.

ඒ එසේමැයි. රහතන් වහන්සේ ආකාසානඤ්චායතන සමාපත්තිය ඉපදවූ කල්හි එය **ආකාසානඤ්චායතන ක්‍රියා චිත්තය** යි කියනු ලැබේ. සෙස්සෙහි ද මෙසේ ය.

**"ආලම්බනප්පභෙදෙන චතුධාරූප්පමානසං**
**පුඤ්ඤපාක ක්‍රියා භෙද පුන ද්වාදසධා ඨිතං"**

අරූපාවචර සිත ආලම්බන භේදයෙන් චතුර්විධ ය. කුශල විපාක ක්‍රියා භේදයෙන් යළි දොළොස් වැදැරුම්.

**ප්‍රශ්න**

1. අරූපාවචර ක්‍රියා සිත් කවරේ ද?
2. මේ ක්‍රියා සිත් කවුරුන්ට උපදී ද?
3. අරූපාවචර සිත් දොළොස ලැබෙන සැටි ගාථාවකින් දක්වනු.

## 20. ලෝකෝත්තර කුසල සිත් (4) සතර

1. සොතාපත්ති මග්ග චිත්තය,
2. සකදාගාමි මග්ග චිත්තය,
3. අනාගාමි මග්ග චිත්තය,
4. අරහත්ත මග්ග චිත්තය,

යන මේ සතර ලෝකෝත්තර කුසල සිත් නම් වේ.

1. සොත නම් දිය වතුර-හෙවත් ජල ප්‍රවාහය, නිර්වාණ නමැති මහා සාගරය කරා පමුණුවන හෙයින් ආර්ය අෂ්ටාංගික මාර්ගය මෙහි සොත ය යි කියනු ලැබේ. ඒ සෝත සංඛ්‍යාත ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයට පළමු වර පැමිණීම සෝතාපත්ති නම්. ඒ සෝතාපත්ති වශයෙන් ලබන ලද මාර්ග චිත්තය සෝතාපත්ති මාර්ග චිත්තය යි. නොහොත් සෝත සංඛ්‍යාත ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයට පළමුවර පැමිණි පුද්ගලයා සෝතාපත්ති නම්. ඔහුගේ මාර්ග චිත්තය සෝතාපත්ති මාර්ග චිත්තය යි. මාර්ග චිත්ත නම් කෙලෙස් මරණ සිත්.

මේ මාර්ග චිත්තය ලබන්නේ අන්ධකාර ගෘහයෙක තුබූ දීප්තිමත් ස්වර්ණ භාජනයක් විදුලි එළියෙන් දක්නා සේ නිර්වාණය දකින්නේ ය. ඒ දැක්ම හා සමග ම ඔහුගේ චිත්ත සන්තානයෙහි පැවැති **සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස** යන සංයෝජන තුන සම්පූර්ණයෙන් විනාශ වන්නේ ය. එසේ ම සෙසු සියලු අකුශලයන්ගේ අපායාගමී ශක්තියද විනාශ වන්නේ ය. හෙනපහරින් අතුපතර කඩා ගිය වෘක්ෂයෙක් කලක් පවතින්නට අභව්‍ය සේ ඉදින් හෙතෙම ඒ ජන්මයෙහි රහත් නුවූයේ නම් සත්වන ජන්මයෙහි හෝ එයින් මොබ ජන්මයෙක හෝ රහත් වන්නේ ය. එයින් දෙවන ජන්මයෙහි රහත් වී නම් **එකබීජ** ය යි ද, සත්වන ජන්මයෙහි රහත් වී නම් **සත්තක්ඛත්තු පරම** ය යි ද මෙදැතුරේ රහත් වී නම් **කොලංකොල** ය යි ද කියනු ලැබේ.

2. ‘සකිං-ආගාමි, - සකදාගාමි’ වරක් හැරී එන්නේ සකදාගාමී නම් වේ. ඔහුගේ (වරක් හැරී එන්නහු ගේ) මාර්ග චිත්තය සකදාගාමි මාර්ග චිත්තය යි. මේ මාර්ග චිත්තය ලැබූ පුද්ගලයා අන්ධකාරයෙහි තුබූ ස්වර්ණ භාජනය පහන් එළියෙන් දුටුවා සේ නිර්වාණය දක්නේ ය. ඒ හා සමගම ඔහුගේ චිත්ත සන්තානයෙහි පැවැති **කාමරාග, ව්‍යාපාද** යන සංයෝජන දෙක තුනී වන්නේ ය.

1. මෙහි දී සකෘදාගාමි මාර්ගය ලබා මෙහිදී ම රහත්වැ පිරිනිවෙන්නා ය, 2. මෙහි දී සකෘදාගාමි මාර්ගය ලබා මිය අන්‍ය භවයෙක ඉපිද එහි දී රහත් වැ පිරිනිවෙන්නා ය, 3. අන්‍ය භවයෙක දී සකෘදාගාමි මාර්ගය ලබා එහිදී ම රහත්වැ පිරිනිවෙන්නා ය; 4. අන්‍ය භවයෙක දී සකෘදාගාමි මාර්ගය ලබා එයින් මිය මෙහි ඉපිද රහත් වැ පිරිනිවෙන්නා ය, 5. මෙහි දී සකෘදාගාමි මාර්ගය ලබා අන්‍ය භවයෙක ඉපිද එයින් මිය නැවත මෙහි ඉපිද රහත්වැ පිරිනිවෙන්නා ය යි සකෘදාගාමි පුද්ගලයා පස් ආකාරයකට බෙදේ. පස්වැනියාගේ වශයෙන් මේ සකෘදාගාමි (-වරක් එන්නා) යන නාමය ලබන ලදී. මෙය එලස්ථයා සඳහා ම කිවයුතු වුව ද පුද්ගල භේදය දැනගන්නා පිණිස මෙසේ කියන ලදැයි දතයුතු.

2. ‘න ආගාමි-අනාගාමි’ ප්‍රතිසන්ධි වශයෙන් නැවත මේ කාමලෝකයට නො එන්නේ අනාගාමි නම් වේ. ඔහුගේ මාර්ග චිත්තය අනාගාමි මාර්ග චිත්තය යි. චන්ද්‍රාලෝකයෙන් යථෝක්ත ස්වර්ණ භාජනය දුටුවා සේ හෙතෙම නිර්වාණය දක්නේ ය. ඒ හා සමගම ඔහුගේ චිත්ත සන්තානයෙහි පැවැති කාමරාග, ව්‍යාපාද යන තුනීවූ සංයෝජන දෙක මුලොච්ඡින්න වන්නේ ය. හෙතෙම ඉදින් මේ ජන්මයෙහිදී ම රහත් නුවූයේ නම් ශුද්ධාවාස බ්‍රහ්මලෝකයෙක ඉපිද එහිදී රහත්වන්නේ ය. නැවත කිසිකලෙක උත්පත්ති වශයෙන් මේ ලෝකයට නො එන්නේ ය.

3. අග්‍රදක්ෂිණාර්හ හෙයින් පූජාවන් ලබන්නට අර්හ (-සුදුසු වූයේ හෝ සංසාර චක්‍රයෙහි කෙලෙස් අර කැපූ හෙයින් හෝ රහසින් වත් පව් නොකරන හෙයින් හෝ අර්හත් නම් වේ. ඔහුගේ මාර්ග චිත්තය අර්හත් මාර්ග චිත්තය යි. මේ චිත්තය ලැබූයේ මධ්‍යාහ්න සූර්යාලෝකයෙන් යථෝක්ත ස්වර්ණ භාජනය දුටුවා සේ නිර්වාණය දක්නේ ය. ඒ හා සමග ම උන්වහන්සේ ගේ චිත්ත සන්තානයෙහි පැවැති සෙසු සියලු ක්ලේශයෝ විනාශයට යන්නාහ. උන්වහන්සේ මරණයෙන් පසු පුනර්භවයෙක නො ඉපිද නිරුපධිශේෂ නිර්වාණධාතු බවට පැමිණෙන සේක.

### ප්‍රශ්න

1. ලෝකෝත්තර මාර්ග සිත් සතර කවරේද?
2. සෝතාපත්ති, සකෘදාගාමි, අනාගාමි, අරහන්ත යන පද විස්තර කරනු.
3. ඒ ඒ මාර්ග සිත්වලින් කවර කෙසේ සිඳෙන්නේ ද?
4. සකෘදාගාමි පුද්ගලයන් පස්දෙනා දක්වනු.
5. රහතන් වහන්සේට මරණයෙන් පසු කුමක් වන්නේ ද?

## 21. ලෝකෝත්තර විපාක සිත් (4) සතර

1. සෝතාපත්ති ඵල චිත්තය,
2. සකදාගාමි ඵල චිත්තය,
3. අනාගාමි ඵල චිත්තය,
4. අරහත්ත ඵල චිත්තය,

යන මේ සතර ලෝකෝත්තර විපාක නම් වේ.

1. සෝතාපත්ති ආදි නාමයන්ගේ අර්ථ යට කී නියා මැ යි. ඵල නම් විපාක ය. සෝතාපත්ති මාර්ග චිත්තය ලැබූ පුද්ගලයාට එයට අනතුරුවැ ම උපදින චිත්තය සෝතාපත්ති ඵල චිත්තය යි. මාර්ග චිත්ත කුසල් ය. ඵල චිත්ත එහි විපාක ය යි දතයුතු. කාමාවචරාදි කුශලයන් ගේ විපාක ඒ ජන්මයෙහි හෝ ජන්මාන්තරයෙක හෝ ප්‍රමාද වැ ලැබෙන්නේ ය. මේ ලෝකෝත්තර කුශලයන්ගේ විපාක වනාහි එවිට ම ලැබෙන්නේ ය. "අකාලිකො" යි එහෙයින් වදාළේ ය.

2. සකෘදාගාමි මාර්ග චිත්තයට අනතුරු වැ ලැබෙන චිත්තය අනාගාමි ඵල චිත්තය යි. මෙහි දූ මාර්ග චිත්තය කුසල්ය. ඵල චිත්තය විපාක.

3. අනාගාමි මාර්ග චිත්තයට අනතුරු වැ ලැබෙන චිත්තය අනාගාමි ඵල චිත්තය. මෙහිදු මාර්ග චිත්තය කුසල් ය. ඵල චිත්තය විපාක ය.

4. අර්හත් මාර්ගයට අනතුරු වැ ලැබෙන චිත්තය අර්හත් ඵල චිත්තය. මෙහිදු මාර්ග සිත් කුසල් ය. ඵල සිත් විපාකය යි දතයුතු. මේ ලෝකෝත්තර කුසල් සිත් එක් වරෙක විනා දෙවරෙක කිසිවිටෙක නූපදනා බැවින් ලෝකෝත්තර ක්‍රියා නම් සිත් වර්ගයෙක් කැලැම නැත්තේ ය.

**"චතුමග්ගප්පභෙදෙන චතුධා කුසලං තථා,**
**පාකංතස්සඵලත්තානි අට්ඨධානුත්තරං මතං"**

ලෝකෝත්තර සිත් සතර මාර්ග භේදයෙන් චතුර්විධ ය. විපාක වනාහි ඔහුගේ ම ඵල බැවින් හෙද චතුර්විධ ය. මෙසේ ලෝකෝත්තර සිත් ද අෂ්ටවිධ යි.

### ප්‍රශ්න

1. ලෝකෝත්තර විපාක සිත් කවරේ ද?

2. මේ විපාක සිත් කවරෙකුට කවදා උපන්නේ ද?
3. “අකාලිකො” යන්නෙහි තේරුම කිම?
4. ලෝකෝත්තර ක්‍රියා සිත් නැත්තේ මන්ද?

**සිත් (89) නිමි.**

## 22. සංග්‍රහ ගීතිකා

1. අටෙක සිත් ලොබ මුල්
දෙදෙනෙක සිත්හු දොස මුල්
දෙකෙක සිත් මොහ මුල්
මෙසේ දොළොසෙක සියලු අකුසල්

ලෝභ මූලික සිත් අටෙක, දෝස මූලික සිත් දෙකෙක, මෝහ මූලික සිත් දෙකෙකැ යි අකුසල සිත් මුළුල්ල 12 ක් වන්නේ ය.

2. අකුසල් විවා සත්
කුසල් අහේ විවා අට,
අහේ කිරිය සිත් තුනෙක්
ඉති අටළොස් අහේ සිත්.

අකුසල විපාක සිත් සතෙක, කුසල අහේතුක විපාක සිත් අටෙක, අහේතුක ක්‍රියා සිත් තුනෙකැ යි අහේතුක සිත් 18 ක් වන්නේ ය.

3. අකුසල් අහේ සිත්
හැරැ සෙසු සිත් එකුන් සැට
සොබන සිත් නම් වන්නේ
ඔහු එක් අනූ විද හෝ.

අකුසල අහේතුක සිත් 30 හැර සෙසු සිත් 59 සෝභන සිත් නම් වේ. ඔව්හු 91 ආකාර හෝ වෙත්.

4. වෙයින් නැණ සකර
බෙයින් සූවිසි වැදැරුම්
සහේ කම්වැදැරි
කුසල් - විවා - කිරිය සිත්.

කාමාවචර කුසල් ය, සහේතුක කාමාවචර විපාක ය, සහේතුක කාමාවචර ක්‍රියා ය යන මේ චිත්තයෝ වේදනා ඤාණ සංඛාර භේදයෙන් සූවිසි වැදෑරුම් වෙත්.

5. කුසල් අට අකුසල්
දොළොස් තෙවිසි විවා සිත්
එකොළොස් කිරිය සිත් යී
සූ පණස් කම් වැදෑරි

කුසල් සිත් අටෙක, අකුසල් සිත් දෙළොසෙක, විපාක සිත් තෙවිස්සෙ (23) ක, ක්‍රියා සිත් එකොළොසෙකැ යි කාමාවචර සිත් මුළුල්ල 54 ක් ය.

6. රුවැදෑරි මනස
දැහැන් බෙයින් පස්විදි,
කුසල් - විවා - කිරීයනෙන්
යළි පසළොස් වැදෑරුම්.

රූපාවචර චිත්තය ධ්‍යානාඞ්ග භේදයෙන් පංචවිධ වේ. නැවත කුසල විපාක ක්‍රියා භේදයෙන් පසළොස් වැදෑරුම් වේ.

7. අරූ වැදෑරි සිත
අරමුණු බෙයින් සිව්විදි,
කුසල් - විවා - කිරිය නෙන්
යළි එ දොළොස් වැදෑරුම්.

අරූපාවචර චිත්තය ආරම්මණ භේදයෙන් චතුර්විධ වේ. යළි එය කුසල විපාක ක්‍රියා භේදයෙන් දොළොස් වැදෑරුම් වේ.

8. සිව් මහ බෙයින් සිව්
වැදෑරුම් ලොව්තුරු සිත,
පල සිත් විසින් ගත් කල,
ඒ වේ අට වැදෑරුම්

ලෝකෝත්තර චිත්තය සෝවාන් ආදී සතර මාර්ග භේදයෙන් සතර වැදෑරුම් වෙයි. එය ඵල සිත් වශයෙන් ගත් කල්හි අට වැදෑරුම් වේ.

9. අකුසල් සිත් දොළොස්
කුසල් සිත් එක්විස්සෙක්,
සතිස් විවා කිරිය සිත්
විස්සෙකැ යි මුළු දන්නේ.

අකුසල් සිත් 12 ක, කුසල් සිත් 21 ක, විපාක සිත් 36 ක, ක්‍රියා සිත් 20 කැයි සියලු සිත් ප්‍රභේද වශයෙන් දතයුතු.

10. සූපණසි කම්වැදැරී
රූවැදැරි සිත් පසළොසි,
අරූවැදැරි දොළොසෙකි
ලොව්තුරු සිත් අටෙක් වේ.

කාමාවචර සිත් 54 ක, රූපාවචර සිත් 15 ක, අරූපාවචර සිත් 12 ක. ලෝකෝත්තර සිත් 8 කැ යි භූමිභෙද වශයෙන් සිත් 89 දතයුතු.

11. මෙලෙස සිව් බිම්හි
මුළු සිත් අසූ නවයෙකි,
වැළි දු ඒ එක්සිය
එක්විසි වැදැරුම් වේ.

උක්ත ප්‍රකාරයෙන් කාමාවචරාදි චාතුර්භූමික සිත් සියල්ල 89 ක් වන්නේ ය. වැළි එය 121 ආකාරයට ද බෙදනු ලැබේ.

### ප්‍රශ්න

1. කුසල සිත් කෙතෙක් ද? ඒ කවරහු ද?
2. විපාක සිත් කෙතෙක් ද? ඒ කවරහු ද?
3. ක්‍රියා සිත් කෙතෙක් ද? ඒ කවරහු ද?
4. කාමාවචර සිත් කෙතෙක් ද? කොටස් වශයෙන් බෙදනු.
5. රූපාවචර අරූපාවචර ලෝකෝත්තර සිත් කවරහු ද?
6. සිත් 89 බෙදා දක්වනු.

## 23. ලෝකෝත්තර සිත් (40) සතළිස

යට දක්වන ලද ලෝකෝත්තර සිත් අට ධ්‍යාන පංචකය වශයෙන් ගිණූ කල ලෝකෝත්තර සිත් සම සතළිසෙක් වන්නේය.

ඒ මෙසේයි:-

1. විතක්ක, විචාර, පීති, සුඛ, එකග්ගතා සහිත පඨමජ්ඣාන සෝතාපත්ති මග්ග චිත්තය,

2. විචාර, පීති, සුඛ, එකග්ගතා සහිත දුතියජ්ඣාන සෝතාපත්ති මග්ග චිත්තය,
3. පීති, සුඛ, එකග්ගතා සහිත තතියජ්ඣාන සෝතාපත්ති මග්ග චිත්තය,
4. සුඛ, එකග්ගතා සහිත චතුත්‍ථජ්ඣාන සෝතාපත්ති මග්ග චිත්තය,
5. උපෙක්ඛා, එකග්ගතා සහිත පඤ්චමජ්ඣාන සෝතාපත්ති මග්ග චිත්තය,

යි සෝතාපත්ති මග්ග චිත්ත පසෙක් වේ. මෙසේ ම පඨමජ්ඣාන සකදාගාමි මග්ග චිත්තාදි වශයෙන් සකෘදාගාමි මාර්ග චිත්ත ද පසෙක් වේ. පඨමජ්ඣාන අනාගාමි මග්ග චිත්තාදි වශයෙන් අනාගාමි මාර්ග චිත්ත ද පසෙක් වේ. පඨමජ්ඣාන අරහත්ත මග්ග චිත්තාදි වශයෙන් අර්හත් මාර්ග චිත්ත ද පසෙක් වේ. මෙසේ මාර්ග සිත් විස්සෙකි. ඵල සිත් ද මෙසේ ම විස්සෙකැ යි ලෝකෝත්තර සිත් මුළුල්ල සතළිසෙක් වන්නේ ය.

1. පාදකජ්ඣානය. 2. සම්මසිතජ්ඣානය, 3. පුග්ගලජ්ඣාසයජ්ඣානය යි ලෝකෝත්තර සිත් ධ්‍යාන වශයෙන් ගණිනු ලැබීමේ ක්‍රම තුනෙකි.

1. ධ්‍යානලාභී පුද්ගලයෙක් පළමුකොට ප්‍රථම ධ්‍යානයට සමවැද එයින් නැගී සංස්කාර ධර්මයන් අනිත්‍යාදී වශයෙන් සම්මර්ශනය කොට සෝවාන් මාර්ගය ලැබූයේ නම් ඔහුගේ ඒ සෝවාන්මාර්ග චිත්තය **පඨමජ්ඣාන සෝතාපත්ති මග්ග චිත්තය** යි කියනු ලැබේ. ඵල චිත්තය **පඨමජ්ඣාන සෝතාපත්ති ඵල චිත්තය** යි කියනු ලැබේ. **දුතියජ්ඣාන සෝතාපත්ති** මග්ග චිත්තාදියෙහි හා පඨමජ්ඣාන සකදාගාමි මග්ග චිත්තාදියෙහි භේදය ද මේ නයින් සැලකිය යුතු. මේ පාදකජ්ඣාන වශයෙනි.

2. යමෙක් මෙසේ ප්‍රථම ධ්‍යානය පාදක කොට නො ගෙන හුදෙක් ප්‍රථම ධ්‍යානයෙහි පවත්නා විතර්කාදි අඞ්ගයන් අනිත්‍යාදි වශයෙන් සම්මර්ශනය කොට සෝවාන් මාර්ග චිත්තය ලැබුයේ නම් ඔහුගේ ඒ සෝවාන් මාර්ග චිත්ත ද **පඨමජ්ඣාන සෝතාපත්ති මග්ග චිත්තය** යි කියනු ලැබේ. ඵල චිත්තය **පඨමජ්ඣාන සෝතාපත්ති ඵල චිත්තය** යි කියනු ලැබේ. සෙස්සෙහි දු ක්‍රමය මෙසේ ය. මේ **සම්මසිතජ්ඣාන** වශයෙනි.

3. ධ්‍යානලාභී වූ යමෙක් ප්‍රථම ධ්‍යානය පාදක කොට ගෙන හෙවත් ප්‍රථම ධ්‍යානයට සමවැද එයින් නැගී දුතියජ්ඣානාදී වූ අනික් ධ්‍යානයෙක අඞ්ගයන් අනිත්‍යාදී වශයෙන් සම්මර්ශනය කෙළේ නම් ඔහුට ස්වකීය අදහස් පරිදි මාර්ග චිත්තය ලැබෙන්නේ ය.

ඒ මෙසේ ය. ඉදින් හෙතෙම "පාදක කැරැ ගත් ප්‍රථම ධ්‍යානය පරිදි මාර්ග චිත්තය ලබමි" යි සිතුයේ නම් එසේ ලබන්නේ ය, නැතහොත් "සම්මර්ශනය කරන ලද අඞ්ග ඇති ධ්‍යානය පරිදි මාර්ග චිත්තය ලබමි"යි සිතුයේ නම් එසේ ලබන්නේ ය, සෙස්සෙහිදු මේ ක්‍රමය යි. මේ **පුග්ගලජ්ඣාසය** වශයෙනි.

මේ නයින් බලන කල්හි අරූපාවචර සිත් ද පංචම ධ්‍යානයෙහි ඇතුළත් වේ. අඞ්ග සම හෙයිනි. පංචමධ්‍යානයෙහි ඇත්තේ උපෙක්ඛා එකග්ගතා යන අංග දෙක ය. අරූපාවචර සිත්හි ඇත්තේත් ඒ අංග දෙක මැ යි.

මෙසේ ලෞකික වශයෙන් තුනෙක, ලෝකෝත්තර වශයෙන් අටෙකැ යි ප්‍රථම ධ්‍යාන සිත් 11 ක් වේ. ද්‍රතියජ්ඣාන සිත් ද එසේම 11 කි. තතියජ්ඣාන සිත් ද 11 කි. චතුත්ථජ්ඣාන සිත් ද 11 කි. පංචමජ්ඣාන සිත් වනාහි (අරූපාවචර සිත් දොළොස ද මෙහි ම ගැනෙන හෙයින්) ලෞකික වහයෙන් 15 ක් ද, ලෝකෝත්තර වශයෙන් 8 ක් දැයි 23 ක් වේ.

මේ නයින් කුසල් සිත් මුළුල්ල 37 කි. (කාමාවචර 8, රූපාවචර 5, අරූපාවචර 4, ලෝකෝත්තර 20) විපාක සිත් 52 කි. (කාමාවචර අහේතුක 15, සහේතුක 8, රූපාවචර 5, අරූපාවචර 4, ලෝකෝත්තර 20) ක්‍රියා සිත් පෙර කී සේ 20 මැයි.

මෙසේ:-

| | |
|---|---|
| අකුසල සිත් | 12 |
| කුසල සිත් | 37 |
| විපාක සිත් | 52 |
| ක්‍රියා සිත් | 20 |
| මුළුල්ල | 121 |

සිත් වන්නේ යි.

## ප්‍රශ්න

1. ලෝකෝත්තර සිත් 40 කෙසේ ද?
2. අරූපාවචර වශයෙන් ලෝකෝත්තර සිත් නො බෙදන ලද්දේ මන්ද?
3. මේ නයින් කුසල සිත් කෙතෙක්ද? ඒ කවරහු ද?
4. විපාක සිත් කෙතෙක් ද? ඒ කවරහු ද? සිත් 121 බෙදා දක්වනු.
5. ලෝකෝත්තර සිත් 8 කුමක් හෙයින් ධ්‍යාන වශයෙන් ගණන ලද්දේ ද? විස්තර කරනු.

**චිත්ත පාදය නිමි.**

# දෙවන චෛතසික පාදය.
**නමෝ භගවතො සම්බුද්ධස්ස**

## 1. දෙපණස් චෛතසික.

**"එකුප්පාදනිරොධා ච - එකාලම්බන වත්‍ථුකා**
**චෙතොයුත්තා විපඤ්ඤාස - ධම්මා චෙතසිකා මතා"**

සිත සමග ම ඉපිදැ
සිත සමග ම නැති වැ යන
සිත ගත් අරමුණ ම ගෙනැ
සිත සිටි තැන ම සිටිනා
සිත හා යෙදුණු දෙපණස්
දහම් සිතැසි නම් වේ.

සියලු අභිධර්මාර්ථ චිත්ත, චෛතසික, රූප, නිර්වාණය යි පරමාර්ථ වශයෙන් සතර වැදැරුම් බව යට කියන ලද්දේ ය. එයින් චිත්ත පරමාර්ථය පිළිබඳ විස්තරය **චිත්තපාදයෙහි** දක්වන ලදි. මෙහි චෛතසික පිළිබඳ විස්තරය දක්වනු ලැබේ.

චෛතසිකයෝ නම් සිතෙහි යෙදෙන්නෝ ය. නොහොත් සිත හා සමග යෙදෙන්නෝ ය. "චෙතසි යුත්තා, චෙතසා වා යුත්තා චෙතසිකා" ඔවුන් ගේ ලක්‍ෂණ සතරෙකි.

1. සිත සමග ම ඉපදීම
2. සිත සමග ම නිරුද්ධ වීම
3. සිත ගන්නා අරමුණ ම ගැනීම
4. සිත පවත්නා වස්තුයෙහි ම පැවතීම.

.

1. සිත උපදින විට ඒ හා සමග ම චෛතසික ද උපදින්නේ ය.
2. සිත නිරුද්ධ වනවිට ඒ හා සමග ම චෛතසික ද නිරුද්ධ වන්නේ ය.
3. සිත යම් අරමුණක් ගන්නේ නම් චෛතසික ද ඒ අරමුණ ම ගන්නේ ය.
4. චක්‍ෂුරාදි යම් වස්තුවෙක සිත පවත්නේ නම් චෛතසික ද ඒ වස්තුයෙහි ම පවත්නේ ය.

මෙසේ හෙයින් සිත සමග ම උපදින, සිත සමග ම නිරුද්ධ වන, සිත ගත් අරමුණම ගන්නා, සිත පිහිටි වස්තුයෙහි ම පවත්නා, සිත හා යෙදෙන ධර්ම චෛතසික ය යි දතයුතු. මෙයින් ගාථායෙහි දැක්වෙන එකුප්පාද, එකනිරෝධ, එකාලම්බන, එකවත්‍ථුක, චෙතො යුත්ත යන පද තේරුම් යා යුතු යි.

කකාරා ගත් කෂායයෙක ජලය සිත වැන්න. බෙහෙත් රස චෛතසික වැන්න. ජලය හා බෙහෙත් රස වෙන් නො කළ හැකි සේ සිත හා චෛතසික වෙන් නො කළ හැකි ය. ජලයේ හා බෙහෙත් රසවල ගුණය නානාවිධ සේ චිත්තයාගේ හා චෛතසිකයන්ගේ ගුණ ද නානාවිධ ය. ජලය නැතහොත් බෙහෙත් රස ද නැති බැවින් ජලය ප්‍රධානය යි කිය යුතු ය. චිත්තය නැතහොත් චෛතසික ද නැති බැවින් චිත්තය ප්‍රධාන ය. "**මනොපුබ්බඞ්ගමා ධම්මා මනොසෙට්ඨා මනොමයා**" යි වදාළේ එහෙයිනි. ධර්මයෝ හෙවත් චෛතසිකයෝ සිත පූර්වඞ්ගම කොටැ ඇත්තෝ ය. සිත ශ්‍රේෂ්ඨ කොටැ ඇත්තෝ ය. සිත්මුවාහ, යනු එහි අර්ථ යි. මෙහි "**ධම්මා**" යි වදාළේ චෛතසික යි.

සිත නැති වැ චෛතසික නූපදනා සේ චෛතසික නැති වැ සිත ද නූපදනේ ය. එහෙත් එක සිතෙක එකවර සියලු චෛතසික උපදිති'යි නො සිතනු. ඒ ඒ අරමුණුවලට සුදුසු පරිදි චිත්තය හා චෛතසිකයන්ගේ සහයෝගය වේ. එහෙයින් ම චිත්තය "චිත්ත පාද" යෙහි දැක්වුණු පරිදි 89 ආකාර හෝ 121 ආකාර විය.

චෛතසික සියල්ල දෙපණසෙ (52) කි. කොටස් වශයෙන් බෙදූකල මෙසේ යː-

| | | | |
|---|---|---|---|
| සබ්බචිත්ත සාධාරණ චෛතසික | 7 | අඤ්ඤසමාන | 13 |
| පකිණ්ණක | 6 | | |
| අකුසල | 14 | | |
| සොභන සාධාරණ | 19 | සොභන | 25 |
| විරති | 3 | | |
| අප්පමඤ්ඤා | 2 | | |
| පඤ්ඤා | 1 | | |
| | 52 | | |

මොවුන් අතුරෙහි සබ්බචිත්ත සාධාරණ, පකිණ්ණක යන තෙළෙස (13) **අඤ්ඤසමාන** යයි කියනු ලැබේ.

සොභන සාධාරණ, විරති, අප්පමඤ්ඤා, පඤ්ඤා යන පස්විස්ස (25) **ශොභන** යයි කියනු ලැබේ.

## ප්‍රශ්න

1. චෛතසික නම් කිම? උදාහරණයෙකින් පැහැදිලි කරනු.
2. ඔහු කෙතෙක් ද? කොටස් වශයෙන් බෙදා දක්වනු.
3. සිත නැති වැ චෛතසික හෝ චෛතසික නැති වැ සිත හෝ එකසිතෙක සියලු චෛතසික හෝ උපදී ද?
4. අඤ්ඤසමාන චෛතසික කවරේ ද?

5. සොභන කවරේ ද? අකුසල චෛතසික කවරේ ද?

## 2. සබ්බචිත්ත සාධාරණ චෛතසික සත.

1. **ඵස්ස**
2. **වේදනා**
3. **සඤ්ඤා**
4. **චේතනා**
5. **එකග්ගතා**
6. **ජීවිතින්‍ද්‍රිය**
7. **මනසිකාර**

යන සත **සබ්බචිත්ත සාධාරණ චෛතසික** නම් වේ.

**1-ඵස්ස** නම් :- චක්‍ෂුරාදි සදොරින් යම්කිසි ද්වාරයකට රූපාදී අරමුණක් හමු වූ කල ඒ හමු වූ අරමුණෙහි එල්බැ උපදනා සිත හා එක් වැ යෙදී එකවට ම උපදිමිනුත් ඒ සිතත් ඒ හා යෙදුණු අනෙක් චෛතසිකත් ඒ හමු වූ අරමුණෙහි හැපෙන්නාක් මෙන් පවත්නා ස්වභාවය යි.

ඇඹුල් කනුවන් දුටු සෙස්සන් මුවෙහි ඇඹුල් නැති වැ ද කෙළ ඉඳෙන්නා සේ මෙය නාම ධර්මයක් වතු දු සහජාත වූ චිත්ත චෛතසිකයන් සමග අරමුණෙහි හැපෙන්නාක් මෙන් පහළ වේ.

සූර්යරශ්මිය භිත්ති ආදියෙහි හැපීම මෙන් මේ හැපීම ඉතා සියුම් බව දත යුතු.

ඒ ඒ චිත්තයන්ගේ නාම වශයෙන් ඒ ඒ සිත්හි යෙදෙන ඵස්සය ද විශේෂ නාම ලබන්නේ ය. ඒ එසේ මැ යි. චක්ඛු විඤ්ඤාණ සිත්හි පවත්නා ඵස්සය චක්ඛු සම්ඵස්සය යි ද, සොත විඤ්ඤාණ - ඝාණ විඤ්ඤාණ - ජිව්හා විඤ්ඤාණ - කාය විඤ්ඤාණ සිත්හි පවත්නා ඵස්ස මනො සම්ඵස්සය යි ද කියනු ලැබේ. මෙසේ මේ ඵස්සය සියලු සිත්හි සාධාරණ වැ යෙදෙන බැවින් **සර්වචිත්ත සාධාරණ** නම් වේ.

**2-වෙදනා නම්:-** සිතෙහි පවත්නා, අරමුණු රස විඳ ගන්නා ස්වභාව යි. සිතින් කළ හැක්කේ අරමුණ සිතීම පමණෙකි. අරමුණේ ප්‍රිය-අප්‍රිය-මධ්‍යස්ථතායේ සැටියෙන් සිතෙහි සුඛ-දුඃඛ-උපේක්‍ෂා ඇති වන බව අපට ප්‍රත්‍යක්‍ෂ ය.

එසේ ප්‍රිය හෝ අප්‍රිය හෝ මධ්‍යස්ථ හෝ අරමුණු රස විඳගැනීම් වශයෙන් සිතෙහි පවත්නා ස්වභාව **වේදනා චෛතසික** ය යි. එහෙයින් ම වේදනාව සුඛ වේදනා, දුක්ඛ වේදනා, උපෙක්ඛා වේදනා වශයෙන් ත්‍රිවිධ වන්නේ ය.

සෙසු චෛතසිකයන්ගේ ද අරමුණු රස විඳැ ගැන්මේ එකදෙශ මාත්‍රයක් ඇත ද මේ වේදනාව ම ඊශ්වරත්‍වයෙන් අරමුණු රස විඳ ගන්නේ ය. අරක්කැමියාත් භෝජන රසය විමසනු පිණිස දිවගා බලා, එහෙත් රජ ම ඊශ්වරත්‍වයෙන් භෝජන රසය ආස්වාදනය කෙරේ. එහෙයින් වේදනාව භෝජන රස අනුභව කරන රජකු වැන්නැ යි කියනු ලැබේ.

මෙ ද සියලු 89 සිත්හි සාධාරණ වැ යෙදෙන බැවින් **සර්වචිත්ත සාධාරණ** නම් වේ.

**සඤ්ඤ** නම්:- සිතෙහි පවත්නා, අරමුණ හැඳින ගන්නා ස්වභාව යි. හෙවත් අරමුණ ලකුණු කර ගන්නා ස්වභාව යි. වඩුවා ඇලි නූලින් ලීය ඉරිය යුතු තැන හඳුනා ගන්නා මෙනි. හෙවත් ලකුණු කර ගන්නා මෙනි.

සිත අරමුණ සිතයි. සිතෙහි පවත්නා සඤ්ඤාව අරමුණ හැඳින ගනී. ඉදින් සිතෙහි සඤ්ඤාව නැත්නම් සිතට සිතීම ම මුත් අරමුණ හැඳිනීම කළ හැකි නො වේ. යම් හෙයකින් සිතෙහි සඤ්ඤාව ඇත්තේ ද එහෙයින් ම සිත අරමුණු හඳුනා ද ගන්නේය. මෙසේ හෙයින් සිතෙහි පවත්නා අරමුණ හඳුනා ගන්නා හෙවත් ලකුණු කොට ගන්නා ස්වභාව සඤ්ඤා චෛතසික නම් වූ බව දතයුතු. මේ වනාහි අරමුණ එක්වරක් හමු වූ විට එක ලකුණක් ගන්නේ ය. නැවත වරක් හමු වූ විට නැවත ලකුණක් ගන්නේ ය. මෙසේ නිතර හමුවන ආරම්මණයන්ගේ හැඳිනීමේ අධිකත්‍වය වේ.

පඤ්චස්කන්ධ අතුරෙහි වේදනා ස්කන්ධ, සංඥා ස්කන්ධ නාමයෙන් දක්වන ලද්දේ මේ වේදනා, සඤ්ඤා චෛතසික දෙකයි. මෙ ද සියලු සිත්හි යෙදෙන බැවින් **සර්වචිත්ත සාධාරණ** නම් වේ.

**4-චේතනා නම්:** සිතෙහි පවත්නා යම් ධර්මස්වභාවයක් තමා ද චේතනය කිරීම් වශයෙන් (පිළියෙල වීම් වශයෙන්) අරමුණෙහි යෙදෙමින් තමා හා සම්ප්‍රයුක්ත වූ සෙසු චෛතසික ද ස්පර්ශාදී ඒ ඒ කෘත්‍යයෙහි යොදා ලයි ද ඒ ධර්මස්වභාවය චේතනා චෛතසිකය යි කියනු ලැබේ. ශිෂ්‍යගුරු තමා ද ඉගෙනීමෙහි යෙදෙමින් සෙසු ශිෂ්‍යයන් ද ඔවුනට අයත් ඒ ඒ පාඩම් ඉගෙනීමෙහි යොදා ලන්නා මෙනි. ප්‍රධාන වඩුවා තමා ද වඩුකම් කරමින් සෙසු වඩුවන් ද ඔවුනට අයත් ඒ ඒ කම්හි යොදා ලන්නා මෙනි.

යම් සේ කෙත් හිමියා පිරිවර සමග ගොයම් කපන්නට ගොස් සෙස්සන්ට වඩා උත්සාහවත් වැ ගොයම් කපා ද එසේ මේ චේතනාව සෙසු චෛතසිකයන්ට වඩා විශේෂ උත්සාහවත් වැ චේතනය කිරීම් වශයෙන් අරමුණෙහි යෙදෙමින් සෙසු චෛතසිකයන් ද ඔවුන්ට අයත් ඒ ඒ කෘත්‍යයෙහි යොදා ලන්නේ ය.

කුශල අකුශල චිත්තයන්හි යෙදෙන මේ චේතනාව ම කර්ම යයි කියනු ලැබේ. සංවිධාන කරන (පිළියෙල කරන) ආයූහනය (රැස්) කරන ශක්තිය එහි ම ඇති බැවිනි.

මෙ ද සියලු සිත්හි යෙදෙන බැවින් **සර්වචිත්ත සාධාරණ** නම් වේ.

**5-එකග්ගතා** නම් : සිතක් පාසා පවත්නා ඒ ඒ සිත හා සම්ප්‍රයුක්ත වූ චෛතසික ධර්මයන් හා ඒ ඒ සිතත් නොයෙක් අරමුණෙහි විසිර යා නො දී ඒ ඒ ගත් අරමුණෙහිම එකඟ කොටැ තබන ස්වභාවය යි. 'පවනින් විසිරැ යා හැකි සුණු රැසක් විසිරැ යා නොදී එක්කොට බඳනා ජලය මෙනි.'

සිත හා චෛතසික එක අරමුණක් ම එල්බ ගෙනැ සිටිය යුතු ය. සිතෙහි එකග්ගතාව නැත් නම් සිතට හා සෙසු චෛතසිකයනට එසේ එක අරමුණක් ම එල්බගෙන සිටිය නො හැකි ය. යම් හෙයකින් සිතෙහි එකග්ගතාව ඇත්තේ ද එහෙයින් ම සිත හා චෛතසික එක අරමුණක් ම එල්බ ගෙනැ සිටින්නේ ය. ඒ ඒ අරමුණෙහි චිත්ත චෛතසිකයන්ගේ අනුකූලයෝගය මෙයින් සැලසේ. ඇතැම් තන්හි **සමාධි** නාමයෙන් දක්වනු ලබන්නේත් මේ එකග්ගතාව බව දත යුතු. මෙ ද සියලු සිත්හි යෙදෙන බැවින් සර්වචිත්ත සාධාරණ නම් වේ.

**6-ජීවිතින්ද්‍රිය** නම්:- සිතෙහි පවත්නා යම් ධර්මස්වභාවයෙක් තමා හා සම්ප්‍රයුක්ත වූ චිත්ත චෛතසිකයන් අභාවයට (-මැරෙන්නට) යා නො දී ජීවත් කරන්නාක් මෙන් පවතී ද ඒ ධර්මස්වභාවය ජීවිතින්ද්‍රිය යි කියනු ලැබේ. උපුල් ආදිය රක්නා ජලය මෙනි. චිත්ත චෛතසිකයන්ගේ ජීවනය මෙය වේ.

ඉදින් සිතෙහි ජීවිතින්ද්‍රිය නැත්නම් සිත හා චෛතසික නො පවත්නේ ය-මැරෙන්නේ ය. යම් හෙයකින් සිතෙහි ජීවිතින්ද්‍රිය ඇත්තේ ද එහෙයින් ම සිත හා චෛතසික ජීවත් වැ පවත්නේ ය. කිසිවිටෙක සිතින් ජීවිතින්ද්‍රිය බැහැර කළ නො හැකි ය. සියලු තන්හි ජීවිතින්ද්‍රිය ඇත්තේ ය. එ හෙයින් මෙ ද **සර්වචිත්ත සාධාරණ** නම් වේ. මේ කියන ලද්දේ නාම ජීවිතින්ද්‍රිය බව දතයුතු. රූප ජීවිතින්ද්‍රිය **රූප පාදයෙහි** දක්වනු ලැබේ.

**7-මනසිකාර** නම්:- හැම සිතක් පාසා පවත්නා - ඒ ඒ චිත්තචෛතසිකයන් ආපාතගත වූ අරමුණෙහි යොමුකරන ස්වභාවය යි. හෙවත් තෙමේත් අරමුණෙහි යොමු වෙමින් තමා හා එක්ව යෙදුණා වූ සම්ප්‍රයුක්ත ධර්මයන් ද අරමුණට මෙහෙයන ස්වභාවය යි. අශ්වයන් මෙහෙයන - යා යුතු මඟෙහි යොමු කරන සාරථියක්හු මෙනි. මෙ ද සියලු සිත්හි යෙදෙන බැවින් **සර්වචිත්ත සාධාරණ** නම් වේ.

සඤ්ඤා-චේතනා-මනසිකාර-විතක්ක යන චෛතසිකයන්ගේ භේදය ඉතා සියුම්. ඇතැම් තැනෙක පඤ්චද්වාරාවර්ජන මනොද්වාරාවර්ජන සිත් ද මනසිකාර නාමයෙන් දක්වන ලදි.

චිත්තපාදයෙහි දැක්වුණු එක එක චිත්තයක් පාසා මේ ඵස්සාදි සත යෙදෙන බැවින් මොවුනට **සබ්බ චිත්ත සාධාරණ** යන නම තබන ලද බව දත යුතු යි.

## ප්‍රශ්න

1. සබ්බචිත්ත සාධාරණ චෛතසික කෙතෙක් ද? ඔහු කවර හු ද? කුමක් හෙයින් ඔහු එනම් වූ ද?
2. ඵස්ස වේදනා පැහැදිලි කරනු. ඔවුන්ගේ භේද කෙසේ ද?
3. සඤ්ඤා, චේතනා විස්තර කරනු. චේතනා කර්ම වන්නේ කොතැන්හි ද?
4. එකග්ගතා, ජීවිතින්ද්‍රිය, මනසිකාර විස්තර කරනු.
5. ඇතැම් තැන මනසිකාර නාමයෙන් දැක්වෙන සිත් කවරේ ද?

# 3. පකිණ්ණක චෛතසික සය.

1. **විතක්ක**
2. **විචාර**
3. **අධිමොක්ඛ**
4. **විරිය**
5. **පීති**
6. **ඡන්ද**

**යන මේ සය පකිණ්ණක චෛතසික** නම් වේ.

1-**විතර්ක:**- සිතෙහි පවත්නා යම් ධර්මස්වභාවයෙකින් සම්ප්‍රයුක්ත වූ සිත අරමුණට නැගේද ඒ ධර්මස්වභාවය විතර්ක ය යි කියනු ලැබේ. රාජ වල්ලභයා පිරිසර මිනිසකු රජමැදුරට පමුණුවන්නා මෙනි. මෙහි විතර්කය රාජ වල්ලභයා වැන්න. සිත පිරිසර මිනිසා වැන්න. අරමුණ රජමැදුර වැන්න. ඉදින් සිතෙහි විතර්කය නැත්නම් සිත අරමුණට නොනගින්නේ ය. සිතෙහි විතර්කය ඇති හෙයින් ම සිත අරමුණට නගින්නේ ය. මෙසේ හෙයින් සිතෙහි පවත්නා සිත අරමුණට නගන-අරමුණ තර්කනය කරන ස්වභාවය **විතර්කය** යි දතයුතු.

පුරුදු වූ කල්හි රාජවල්ලභයා නැත ද පිරිසරයා රජ මැදුරට වදනා සේ පෙර දී විතර්කය විසින් පුරුදු කරන ලද සිත විතර්කය නැතත් අරමුණට නගින්නේ ය. ද්විතීය ධ්‍යානාදී සිත්හි මෙනි.

ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයෙහි **සම්මාසඞ්කප්ප** නාමයෙන් දක්වනු ලබන්නේත් සෝවාන් ආදි ලොවුතුරා සිත්හි ලැබෙන විතර්ක චෛතසිකය යි. එය පූර්වභාග මාර්ග වශයෙන් විදර්ශනා සිත්හි යෙදුණේ ද සම්මාසඞ්කප්ප නාමය ලබයි.

**විතර්කය** වනාහි දෙපස් විඤ්ඤාණ හැර සෙසු සිව්සාළිස් (44) කාමාවචර සිත් ය. ප්‍රථමධ්‍යාන සිත් එකොළොස (11) ය යන පස්පණස් (55) සිත්හි යෙදෙන්නේ ය. දෙපස්

විඤ්ඤාණ සිත් දස (10) ය, ද්විතීයධ්‍යාන සිත් එකොළොස (11) ය, තෘතීය ධ්‍යාන සිත් එකොළොස (11) ය, චතුර්ථධ්‍යාන සිත් එකොළොස (11) ය, පංචමධ්‍යාන සිත් තෙවිස්ස (23) ය යන සසැට (66) සිත්හි නො යෙදෙන්නේ ය.

ධ්‍යානාඞ්ග මධ්‍යම පුඩු වශයෙන් ගිණිය යුතු. මධ්‍යම පුඩු නම් **චිත්තපාදයෙහි 23 වන පාඩමෙන් දැක්වූ පරිදි** සිත් 121 වන සේ ගිණූ ක්‍රමය යි. විතර්කය ධ්‍යානාඞ්ගයෙකි. (එහි 14 වන පාඩම බලනු) දෙපස් විඤ්ඤාණ 8 වන පාඩම්හි බලනු.

**2-විචාර:-** විතර්කය විසින් අරමුණට නගනලද සිත ඒ සිතෙහි ම පවත්නා යම් ධර්මස්වභාවයෙක් අරමුණෙහි හසුරුවයි ද ඒ ධර්මස්වභාවය විචාරය යි කියනු ලැබේ. ඒ වනාහි සහජාත චිත්ත-චෛතසිකයන් අරමුණෙහි හැසිරවීම ස්වභාව කොටැ ඇත්තේ ය. විතර්ක විචාර එක්වට ම සිතෙහි යෙදෙන නමුත් විතර්කය ඖළාරිකය. ඝණ්ටාවට ගසන පළමු පහර මෙනි, විචාරය සියුම්ය. ඒ ගැසීමෙන් නැගෙන අනුරාවය මෙනි. තවද විතර්කය අහසට නගිනු කැමැති පක්ෂියෙකුගේ පියාපත් විදහීම මෙනැ යි ද, විචාරය ඒ පක්ෂියාගේ ගමනෙහි පියාපත් පැහැරීම මෙනැයි ද, විතර්කය මීමැස්සෙකු මල කරා යාම මෙනැයි ද, විචාරය ඌ ඒ මල සිසාරා පරිභ්‍රමණය කිරීම මෙනැ යි ද කියන ලදී.

විචාරය වනාහි විතර්කය යෙදෙන පස්පණස් (55) චිත්තය ධ්‍යාන සිත් එකොළොස (11) ය යන සසැට (66) සිත්හි යෙදෙන්නේ ය. දෙපස් විඤ්ඤාණ සිත් දස (10) ය, තෘතීය ධ්‍යාන සිත් එකොළොස (11) ය, චතුර්ථධ්‍යාන සිත් එකොළොස (11) ය, පංචමධ්‍යාන සිත් තෙවිස්ස (23) ය, යන පස්පණස් (55) සිත්හි නො යෙදෙන්නේ ය. මෙ ද ධ්‍යානාඞ්ගයක් බැවින් මධ්‍යම පුඩු වශයෙන් ගිණුහ.

**3-අධිමොක්ඛය:-** අධිමොක්ඛ නම් ස්ථිරත්‍වයෙන් ඉන්‍ද්‍රකීලයක් මෙන් සිතෙහි පවත්නා ආලම්බන විෂයක නිශ්චය ස්වභාවය යි. යම් සිතෙක අධිමොක්ෂය නැත්නම් ඒ සිත අරමුණෙහි නිශ්චිත නො වන්නේ ය. චංචල වන්නේ ය. අධිමොක්ෂය ඇති කල්හි ම සිත අරමුණෙහි නිශ්චල වන්නේ ය. එහෙයින් සිතෙහි පවත්නා නිශ්චය කරන ස්වභාව **අධිමොක්ඛය** යි දතයුතු.

මේ වනාහි දෙපස් විඤ්ඤාණ සිත් 10 ය, විචිකිච්ඡා සිතය යන 11 සිත් හැරැ සෙසු 78 සිත්හි යෙදෙන්නේ ය. දෙපස් විඤ්ඤාණ සිත් 10 ය. විචිකිච්ඡා සිතය යන 11 සිත්හි නො යෙදෙන්නේ ය. අධිමොක්ෂය ධ්‍යානාඞ්ගයක් නො වන බැවින් සංක්ෂිප්ත පුඩු වශයෙන් ගැණිනි. සංක්ෂිප්ත පුඩු නම් සිත් 89 වන සේ ගිණූ ක්‍රමය යි.

**4-වීරිය:-** විරිය නම් දිරාගිය ගෙයකට රුකුල් දීම මෙන් සිතෙහි පවත්නා, සහජාත ධර්මයන් උත්සාහවත් කරන (-ඒ ඒ කටයුත්තෙහි උනන්දු කරන) ස්වභාවය යි. යම් සිතෙක වීර්යය නො යෙදිණි නම් ඒ සිත හැකිළීම් ස්වභාවයට පත් වේ. සිතෙහි ඇති විට සිත අනලස් ව නැගී සිටී. එහෙයින් සිතෙහි පවත්නා උපස්ථම්භක ස්වභාවය විරිය චෛතසිකය යි දතයුතු.

මේ වනාහි පංචද්වාරාවර්ජනය, දෙපස් විඤ්ඤාණ දස (10) ය, සම්පටිච්ඡනයුගලය, සන්තීරණත්‍රිකය යන සොළොස් චිත්තයන් හැර සෙසු තෙසැත්තෑවක් (73) සිත්හි ලැබෙන්නේ ය.

**5-පීති:-** පීති නම් සිතෙහි පවත්නා, තමා හා සම්ප්‍රයුක්ත ධර්මයන් පිනවන ස්වභාවය යි. පස්පියුමින් සැදුම්ලත් නිල්වන් දිය පිරුණු විලක් දුටු මගියකු මෙනි. ඉදින් සිතෙහි පීති නැත්නම් ඒ ඒ අරමුණු ලැබීමෙන් සිත පිනා නොයන්නේ ය. සිතෙහි පීති ඇතිවිට ම සිත ඒ ඒ අරමුණු ලැබීමෙන් පිනා යන්නේ ය. ඒ වනාහි ඛුද්දක පීති, ඛණික පීති, ඔක්කන්තික පීති, උබ්බෙග පීති, ඵරණ පීති ය යි පඤ්චවිධ වේ. ඛුද්දක පීති නම් ශරීරයෙහි ලොමුදහගැන්වීම් මාත්‍රයක් කරන කුඩා ප්‍රීති ය. ඛණික පීති නම් විදුලිය ලෙලදීමක් මෙන් කෙණෙහි කෙණෙහි උපදනා ප්‍රීතිය. ඔක්කන්තික පීති නම් රළ පෙළින් මුහුදු වෙරළ සේ ශරීරය මැඩගන්නා ප්‍රීති ය. උබ්බෙග පීති නම් සුළඟින් පුළුන් පෙඳක් සේ ශරීරය අහසින් පවා ගෙන යන මහා ප්‍රීති ය. ඵරණ පීති නම් රළ පතරින් සමුද්‍ර පර්වතයක් සේ සිරුර පතුරුවා නැගෙන ප්‍රීතිය යි.

මේ වනාහි දොම්නස් සහගත අකුසල් සිත් දෙක ය. උපෙක්ඛා සහගත සිත් පස් පණස (55) ය. කායවිඤ්ඤාණ සිත් දෙකය. චතුර්ථධ්‍යාන සිත් එකොළොස (11) ය යන සමසැත්තෑ (70) සිත් හැර සෙසු එක් පණස් (51) සිත්හි යෙදෙන්නේ ය. මෙ ද ධ්‍යානාඞ්ගයක් බැවින් මධ්‍යම පුඩු වශයෙන් ගිණූ බව දත යුතු යි.

**6-ඡන්දය:-** ඡන්ද නම් සිතෙහි පවත්නා අරමුණ ගැන්මෙහි අත දිගු කරන්නාක් වැනි ස්වභාවය යි. ලෝභය නොවේ. කරනු කැමති බැව් පමණෙකි.

මෙ ද වනාහි මොමූහ සිත් දෙක ය, අහේතුක සිත් අටළොසය (18) යන සිත් විස්ස (20) හැර සෙසු එකුන් සැත්තෑවක් (69) ක් සිත්හි යෙදෙන්නේ ය.

විතර්කාදී වූ මේ චෛතසික සය සෝභන සිත්හි මෙන් ම අහේතුක සිත්හි ද අහේතුක සිත්හි මෙන් සෝභන සිත්හි ද ලැබෙන හෙයින් **ප්‍රකීර්ණක චෛතසික** ය යි කියනු ලැබේ. ප්‍රකීර්ණක නම් මිශ්‍ර.

එසේ ම දෙවෙනි පාඩමේ දැක්වූ **සර්වචිත්ත සාධාරණ** සත ද මේ ප්‍රකීර්ණක සය ද යන තෙළෙස් (13) චෛතසික **අන්‍යසමානය** යි කියනු ලැබේ.

**ඡසට්ඨී පඤ්චපඤ්ඤාස එකාදස ච සොළස,**
**සත්තති වීසති චෙ ව පකිණ්ණක විවජ්ජිතා**
.
**පඤ්ච පඤ්ඤාස ඡසට්ඨීට්ඨසත්තති තිසත්තති**
**එක පඤ්ඤාසචෙකූන සත්තති සපකිණ්ණකා**

### ප්‍රශ්න

1. ප්‍රකීර්ණක චෛතසික කෙතෙක් ද?
2. ඔවුන්ට කුමක් හෙයින් ප්‍රකීර්ණක යයි කියනු ලැබේ ද?
3. අන්‍යසමාන යනු කවරහු ද?
4. ප්‍රකීර්ණක චෛතසිකයන්ගේ ස්වභාව හා ප්‍රභේද දක්වනු.
5. ඔව්හු කවර සිත්හි යෙදෙත් ද? කවර සිත්හි නො යෙදෙත් ද?

## 4. තුදුස් අකුසල චෛතසික.

1. **මෝහ**
2. **අහිරික**
3. **අනොත්තප්ප**
4. **උද්ධච්ච**
5. **ලෝභ**
6. **දිට්ඨි**
7. **මාන**
8. **දෝස**
9. **ඉස්සා**
10. **මච්ඡරිය**
11. **කුක්කුච්ච**
12. **ථීන**
13. **මිද්ධ**
14. **විචිකිච්ඡා**

යන මේ තුදුස අකුසල චෛතසික නම් වේ.

1-**මෝහය:-** මෝහ නම් සිතෙහි යෙදෙන, ආලම්බන තත්ත්වය මුවහ කරන ස්වභාවය යි. ඇසෙහි පටලය මෙනි. සිතෙහි මෝහය නොයෙදිණි නම් සිත ආලම්බන ස්වභාවය ම සිතන්නේ ය. සිතෙහි මෝහය යෙදුණු විට සිතට ආලම්බන මුවහ වන්නේ ය. ඇසට නිල් කණ්ණාඩිය මෙනි. මේ වනාහි බලවත් අකුසලයෙකි. අකුසල මූලයෙහි පටිච්චසමුප්පාදයෙහි "අවිජ්ජා" යන්නෙන් වදාළේ මේ මෝහය යි.

මෝහය වනාහි දොළොස් අකුසල් සිත්හි අවිශේෂයෙන් යෙදෙන්නේ ය. අනෙක් කිසි සිතෙක නොයෙදෙන්නේ ය.

**2-අහිරිකය:-** අහිරික නම් සිතෙහි යෙදෙන. පව් කිරීමෙහි ලජ්ජා නැති ස්වභාවය යි. අසූචියෙහි ඌරා මෙනි. ඉදින් සිතෙහි අහිරිකය නො යෙදිණි නම් සිත පව් කිරීමට නො සිතයි. සිතෙහි අහිරිකය නො යෙදිණි නම් සිත පව් කිරීමට නො සිතයි. සිතෙහි අහිරිකය ඇති විටම සිත පව් කිරීමට සිතයි. අහිරිකය පවට ලජ්ජා නැති ස්වභාවය හෙයිනි.

මෙ ද දොළොස් අකුසල් සිත්හි අවිශේෂයෙන් යෙදෙන්නේ ය. අනෙක් කිසි සිතෙක නො යෙදෙන්නේ ය.

**3-අනොත්තප්පය:-** අනොත්තප්ප නම් සිතෙහි යෙදෙන පව් කිරීමෙහි භය නැති ස්වභාවය යි. පලඟැටියා ගින්නෙහි මෙනි. ඉදින් සිතෙහි අනොත්තප්පය නො යෙදිණි නම් සිත පවට බිය වන්නේ ය. සිතෙහි අනොත්තප්පය යෙදුණු විටම සිත පවට බිය නො වන්නේ ය. අනොත්තප්පය පවට භය නැති ස්වභාවය හෙයිනි.

මෙ ද දොළොස් අකුසල් සිත්හි අවිශේෂයෙන් යෙදෙනේනේ ය. අන් කිසි සිතෙක නො යෙදෙන්නේ ය.

**4-උද්ධච්චය:-** උද්ධච්ච නම් සිතෙහි යෙදෙන අව්‍යුපසම (-නො සන්සුන්) ස්වභාවය යි. ගල් පහර ලත් අලුගොඩ මෙනි. සුළං ගත් ධ්වජය මෙනි. ඉදින් සිතෙහි උද්ධච්චය නො යෙදිණි නම්, සිත අචංචල වන්නේ ය. සිතෙහි උද්ධච්චය යෙදුණු කල සිත චංචල වන්නේ ය. නැත්පත් නො වන්නේ ය.

මෙ ද දොළොස් අකුසල් සිත්හි අවිශේෂයෙන් ලැබේ. අන් කිසි සිතෙක නො ලැබේ.

කිය යුත්තෙක් ඇති. ඵස්සාදි සෙසු චෛතසිකයන් ඇතත් මේ උද්ධච්ච චෛතසිකය බලවත් වැ ම යෙදෙන හෙයින් "**උපෙක්ඛාසහගත උද්ධච්ච සම්පයුත්ත චිත්තය**" යි අකුසල චිත්තයෙක් දොළොස් අකුසල සිත් අතර විශේෂයෙන් දක්වන ලද්දේ ය.

තව ද මෝහ, අහිරික, අනොත්තප්ප, උද්ධච්ච යන මේ සතර සියලු අකුසල සිත්හි නිරතුරු වැ යෙදෙන බැවින් "**සබ්බා කුසල සාධාරණ**" ය යි කියනු ලැබේ.

**5-ලෝභය:-** ලෝභ නම් සිතෙහි යෙදෙන, ආරම්මණයෙහි ඇලෙන ස්වභාවය යි. ඇලි තෙල වස්ත්‍රාදියෙහි මෙනි. අළුත් මස් වැදැල්ල නැවුම් භාජනයෙහි මෙනි. ඉදින් සිතෙහි ලෝභය නො යෙදිණි නම් සිත ආරම්මණයෙහි නො ඇලෙන්නේ ය. සිතෙහි ලෝභය ඇති විට ම සිත ආරම්මණයෙහි ඇලෙන්නේ ය. මේ වනාහි බලවත් අකුසලයෙකි. අකුසල මූලයෙකි. චතුස්සත්‍යයෙහි සමුදය නමින් වදාළේ මේ ලෝභය යි.

ලෝභය ලෝභමූලික අකුසල් සිත් අටෙහි යෙදේ. අන් කිසි සිතෙක නො යෙදේ.

**6-දිට්ඨිය:-** දිට්ඨි නම් සිතෙහි යෙදෙන, අරමුණ වරදවා දක්වන ස්වභාවය. මිරිඟුව ජලය යි දක්නා මෙනි. මෙය අහේතුක, අකිරිය, නාස්තික වශයෙන් ඇති වුවහොත් අතිශය බලවත් වේ. දොළොස් අකුසල් සිත් අතුරෙන් **ලෝභමූලික දිට්ඨිසම්පයුත්ත සිත් සතරෙහි** යෙදේ. අන් කිසි සිතෙක නො යෙදේ.

**7-මානය:-** මාන නම් "මම් උසස්මි" යනාදි වශයෙන් සිතෙහි යෙදෙන උඩඟු ස්වභාවය යි. එය නවවිධ වේ. ඉදින් සිතෙහි මානය නො යෙදිණි නම් සිත තමා සෙයාා, සදිස, හීන වශයෙන් නො සිතන්නේ ය. සිතෙහි මානය ඇතිවිට ම සිත සෙයාා, සදිස, හීන වශයෙන් සිතන්නේ ය. කිය යුත්තෙක් ඇති. කේශර සිංහයන් දෙදෙනෙකු එක ගුහායෙහි නො වසන්නා සේ දිට්ඨිය හා මානය කිසි විටෙක එක සිතෙක නො යෙදෙන්නේ ය. සමානත්වය ඇති බැවිනි.

මේ වනාහි දොළොස් අකුසල් සිත් අතුරෙන් **දිට්ඨිවිප්පයුත්ත** සිත් සතරෙහි යෙදේ. යෙදෙන්නේත් මානය ඇති විටෙකය. අනියත යෝගී බැවිනි.

**8-දෝසය:-** දෝස නම් සිතෙහි යෙදෙන චණ්ඩ ස්වභාවය යි. ඒ වනාහි දඬුපහර ලත් නයකු මෙන් අනිෂ්ටාලම්බන ප්‍රතිලාභයෙන් සිත දූෂණය කරන්නේ ය. මෙ ද අකුසලයෙකි. අකුසල මූලයෙකි. පටිඝ - කොධාදී නම්වලින් දක්වනු ලබන්නේත් මේ මැයි.

දෝසය දොළොස් අකුසල් සිත් අතරෙන් **දෝස මූලික පටිඝ සම්පයුත්ත සිත් දෙකෙහි** පමණක් යෙදේ. අනි කිසි සිතෙක නො යෙදේ.

**9-ඉස්සා:-** ඉස්සා නම් සිතෙහි යෙදෙන, පර සම්පත් නො ඉවසන ස්වභාවය යි.

**10-මච්ඡරිය:-** මච්ඡරිය නම් සිතෙහි යෙදෙන, සිය සම්පත් සඟවන ස්වභාවය. මේ ලෝභය නොවේ. මච්ඡරිය සිතෙහි යෙදුණු කල්හි සිත සිය සැපත අනුන්ට දෙනු තබා අන්‍යයන් එය දැක්මවත් නො රුස්නේ ය. සිය සැපත අනුන් හා සාධාරණ වනු නො ඉවසන්නේ ය.

**11-කුක්කුච්චය:-** කුක්කුච්ච නම් සිතෙහි යෙදෙන කල දුසිරිත් ගැනැ හා නො කළ සුසිරිත් ගැනැ පසුතැවිලි වන ස්වභාවය යි. වරද කොටැ වාල් කමට අසුවූවකු මෙනි. කිය යුත්තෙක් ඇති.

මේ ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච යන චෛතසික තුන දොළොස් අකුසල් සිත් අතුරෙන් **දෝසමූලික පටිඝ සිත් දෙකෙහි** පමණක් යෙදේ. යෙදෙන්නේත් අනියත වශයෙනි. නියත වශයෙන් නොවේ. අනියත වශයෙන් යෙදීම නම් ඊර්ෂ්‍යා, මාත්සර්ය කුක්කුච්ච ඇති විට ම යෙදෙන බවය. එබන්දක් නැති විට නො යෙදෙන බවය. එබන්දක් ඇති විටත් එක වර එක සිතෙක එකක් ම මුත් දෙකක් හෝ තුන ම හෝ නො යෙදේ. ඒ එසේ මැ යි.

ඊර්ෂ්‍යාව ඇත්නම් ඉස්සාව යෙදේ. මච්ඡරිය, කුක්කුච්ච නො යෙදේ. මාත්සර්ය ඇත්නම් මච්ඡරිය යෙදේ. ඉස්සා, කුක්කුච්ච නො යෙදේ. කෞකෘත්‍යය ඇත්නම් කුක්කුච්චය යෙදේ. ඉස්සා, මච්ඡරිය නො යෙදේ. මෙයින් එකකුදු නැත්නම් එකකුදු නො යෙදේ. එහෙයින් මේ චෛතසික තුන අනියත යෝගී නම් වේ.

12-ථීනයː- ථීන නම් චිත්තයාගේ පසුබස්නා ස්වභාවයයි.

13-මිද්ධයː- මිද්ධ නම් චෛතසිකයන්ගේ පසුබස්නා ස්වභාවය ය යි. මේ ථීන-මිද්ධ දෙක **සසංඛාරික අකුසල් සිත් පසෙහි** යෙදේ. යෙදෙන්නේ එකට ම ය. වෙන් වැ නො වේ. එ ද චිත්ත-චෛතසිකයන්ගේ පසුබැස්මක් ඇති කල්හි ම යෙදෙන්නේ ය. නැති කල්හි නො යෙදෙන්නේ ය. එහෙයින් මොහු දෙදෙන ද අනියත යෝගීහු යි.

14-විචිකිච්ඡාවː- විචිකිච්ඡා නම් සිතෙහි යෙදෙන බුද්ධාදීන් කෙරෙහි ඇති ස්වභාවය යි. දෙමංසන්ධියකට පත් පුරුෂයකු මෙනි. මේ වනාහි උපෙක්ඛා සහගත විචිකිච්ඡා **සම්පයුත්ත චිත්තයෙහි** පමණක් යෙදෙනේනේ ය. අන් කිසි සිතෙක නො යෙදෙන්නේ යි.

**සබ්බාපුඤ්ඤෙසු චත්තාරො ලොභමූලෙ තයො ගතා**
**දෙසමූලෙසු චත්තාරො සසංඛාරෙ ද්වයං තථා.**
**විචිකිච්ඡා විචිකිච්ඡා චිත්තෙචාති චතුද්දස**
**චුද්දසාකුසලෙස්වෙව සම්පයුජ්ජන්ති පඤ්චධා,**

ප්‍රශ්න

1. අකුසල චෛතසික කෙතෙක් ද? කවරහු ද?
2. එක් එක් අකුසල චෛතසිකයෙක ආකාර හා ඒ ඒ අකුසල චෛතසිකය මේ මේ සිත්හි යෙදෙන්නේ යයි පැහැදිලි කොටැ දක්වනු.
3. අනියතයෝගී, නියතයෝගී, සහයෝගී අකුසල චෛතසික කවරේ ද?
4. සර්වාකුසල සාධාරණ චෛතසික කවරේ ද?
5. සිත සසංඛාර අසංඛාර කරන චෛතසික ඇද්ද?

## 5. පස්විසි (25) සෝභන චෛතසික

**1-සද්ධා 2-සති 3-හිරි 4-ඔත්තප්ප 5-අලෝභ 6-අදෝස 7-තත්‍රමජ්ඣත්තතා 8-කායපස්සද්ධි 9-චිත්තපස්සද්ධි 10-කායලහුතා 11-චිත්තලහුතා 12-කායමුදුතා 13-චිත්තමුදුතා 14-කායකම්මඤ්ඤතා 15-චිත්තකම්මඤ්ඤතා 16-කායපාගුඤ්ඤතා 17-චිත්තපාගුඤ්ඤතා 18-කායුජ්ජුකතා 19-චිත්තුජ්ජුකතා යන මේ එකුන්විසි (19) චෛතසික සෝභන සාධාරණ නම් වේ.**

**1-සම්මාවාචා 2-සම්මාකම්මන්ත 3-සම්මාආජීව යන තුන විරති නම් වේ.**

**1-කරුණා 2-මුදිතා යන දෙක අප්පමඤ්ඤා නම් වේ. මේ සූවිස්ස (24) හා පඤ්ඤාව සෝභන නම් වේ.**

| | |
|---|---|
| සෝභන සාධාරණ | 19 |
| විරති | 3 |
| අප්පමඤ්ඤා | 2 |
| පඤ්ඤා | 1 |
| සෝභන චෛතසික | 25 |

**ප්‍රශ්න.**

1. සෝභන චෛතසික කෙතෙක් ද? කවරහු ද?
2. සෝභන සාධාරණ කෙතෙක් ද?
3. විරති කෙතෙක් ද? කවරහු ද?
4. අප්පමඤ්ඤා කෙතෙක් ද? කවරහු ද?
5. පඤ්ඤා කවර කොටසට අයත් ද?

## 6. එකුන් විසි සෝභන සාධාරණ.

යට දැක්වුණු පස්විසි සෝභන අතුරෙන් එකුන් විසි සෝභනයන්ගේ ආකාර මෙහි දක්වනු ලැබේ.

**1. සද්ධා:-** නම් සිතෙහි යෙදෙන, බුද්ධාදීන් අරමුණු කොට සම්ප්‍රයුක්ත ධර්මයන් පහදවන ස්වභාවය යි. සම්පසාදන, සම්පක්ඛන්‍දනය යි එහි ලක්‍ෂණ දෙකෙකි. සක්විති රජහුගේ උදක ප්‍රසාදක මාණික්‍ය රත්නය කැලැත් ජලයෙහි ලූ කල මඩ සෙවෙල් පහ වැ ජලය ප්‍රසන්න වන්නා සේ සද්ධාව ඇති කල සිතෙහි කෙලෙස් බැසැ සිත ප්‍රසන්න වන්නේ ය. මේ සද්ධායෙහි සම්පසාදන ලක්‍ෂණය යි. ඈතිමුවරුන්ගෙන් ගැවසීගත් ගංදෙබඩ දියට බස්නා බියෙන් මිනිසුන් රැස් වැ සිටිනකල වීරපුරුෂයෙක් තියුණු කඩුවක් ගෙනැ දියට බැසැ මුවරුන් මරමින් මිනිසුන් එතර කරන්නා සේ සද්ධාව පෙරටු වැ සිතෙහි පාප ධර්මයන් නසමින් සිත කුසලයට නංවන්නේ ය. මේ සද්ධායෙහි සම්පක්ඛන්‍දන ලක්‍ෂණය යි. සද්ධාව ඇති කල්හි ම මනුෂ්‍යයෝ දානාදි කුසල ධර්මයෙහි යෙදෙති. නැති කල්හි නොයෙදෙත්. සද්ධින්‍ද්‍රිය සද්ධාබල නාමයෙන් දක්වනු ලබන්නේත්

මේ සද්ධා චෛතසිකය මැයි. මේ වනාහි එකුන් සැට 59 සෝභන සිත්හි අවිශේෂ වැ මැ යෙදෙන්නේ ය. සෙස්ස ද මෙසේ මැ යි.

**2-සති:** සති නම් සිතෙහි යෙදෙන සම්ප්‍රයුක්ත ධර්මයන් සිහි කරවන ස්වභාවය යි. අපිලාපලන, උපග්ගණ්හනය යි එහි දු ලක්‍ෂණ දෙකෙකි. රජහුගේ භාණ්ඩාගාරික ඇමති රජහට සම්පත් මේ මේ ය යි සිහි කරවන්නා සේ සතිය කුසල් මේ ය යි සිහි කරවන්නේ ය. මේ අපිලාපන ලක්‍ෂණය යි. රජහුගේ පරිනායකරත්නය රජහට හිත අහිතයන් මේ මේ ය යි දැනැ අහිතයන් දුරු කොටැ හිතයන් එළවන්නා සේ සතිය කුසල් අකුසල් මේ මේ යයි දැනැ අකුසල් දුරුකොටැ කුසල් එළවන්නේ ය. මේ උපග්ගණ්හන ලක්‍ෂණයයි. **සතිපට්ඨාන, සතින්‍ද්‍රිය, සතිබල, සතිසම්බොජ්ඣඞ්ග, සම්මාසති** වශයෙන් දක්වන්නේත් මේ මැ යි.

**3-හිරි:** හිරි නම් සිතෙහි යෙදෙන, කායදුශ්චරිතාදියෙන් ලජ්ජාවන ස්වභාවය යි. කුලකාන්තාවක් මෙනි.

**4-ඔත්තප්ප:** ඔත්තප්ප නම් සිතෙහි යෙදෙන කාය දුශ්චරිතාදියෙන් බිය වන ස්වභාවය යි. වෙසගනක් මෙනි.

මේ හිරි ඔත්තප්ප අතුරෙන් හිරිය ඇතුළතින් ම උපදින්නේ ය. ඔත්තප්පය පිටතින් උපදින්නේ ය. හිරියට තමා ම අධිපතිය. ඔත්තප්පයට ලෝකයා අධිපතිය. හිරියෙහි ස්වභාවය ලජ්ජාවය. ඔත්තප්පයෙහි ස්වභාවය භය යි. හිරිය කීකරු වීම ලක්‍ෂණ කොටැ ඇත්තේ ය. ඔත්තප්පය බිය වීම ලක්‍ෂණ කොට ඇත්තේය. **ලෝකපාලක ධර්ම, දේව ධර්ම** යනුත් මොහු මැ යි.

**5-අලෝභ:** අලෝභ නම් සිතෙහි යෙදෙන අරමුණෙහි නොලැගෙන ස්වභාවය යි. පියුම් පතෙහි දිය මෙනි. මේ බලවත් කුශලයෙකි. කුශල මූලයෙකි. කුශල හේතුවෙකි.

**6-අදෝස:** අදෝස නම් සිතෙහි යෙදෙන, අරමුණෙහි දූෂ්‍ය නො වන ස්වභාවය යි. අනුකූල මිත්‍රයකු මෙනි. මෙ ද බලවත් කුශලයෙකි. කුශල මූලයෙකි. **මෛත්‍රී** යනුදු මේ ය. මේ අලෝභ අදෝෂයන් අතුරෙන් අලෝභය මසුරු මලයට ද අදෝසය දුශ්ශීල මලයට ද ප්‍රතිපක්‍ෂය. අලෝභය දානයට හේතු ය. අදෝෂය ශීලයට හේතු ය. ලෝභය දොස් මුවහ කරන හෙයින් අලෝභයෙන් ඇති දෝෂය දෝෂ වශයෙන් ම දක්නේ ය. ද්වේෂය ගුණ මකන හෙයින් අදෝසය ඇති ගුණය ගුණ වශයෙන් ම දක්නේ ය. අලෝභයෙන් ප්‍රිය විප්‍රයෝග දුඃඛය ද අදෝසයෙන් අප්‍රිය සම්ප්‍රයෝග දුඃඛය ද අලෝභයෙන් ජාති දුක ද අදෝෂයෙන් ජරා දුක ද නැති වන්නේ ය. තව ද අදෝසයෙන් **මෛත්‍රිය** ගැනෙන බව දතයුතු.

**7-තත්‍රමජ්ඣත්තතා:** තත්‍රමජ්ඣත්තතා නම් සිතෙහි යෙදෙන, ආරම්මණයන් පිළිබඳ සම්ප්‍රයුක්ත ධර්මයන් මධ්‍යස්ථ කරවන ස්වභාවය යි. අසුන් සම වැ යන කල්හි මධ්‍යස්ථ වන සාරථියකු මෙනි. **උපේක්‍ෂා** යනු දු මේ ය. වේදනෝපේක්‍ෂාව ද අනෙකෙකි.

**8-කායපස්සද්ධි:** මෙහි කාය නම් වේදනාදි ස්කන්ධත්‍රය හෙවත් චෛතසික. පස්සද්ධි නම් සන්සිඳුම. චෛතසිකයන්ගේ සන්සිඳුම කායපස්සද්ධි ය යි. එය චෛතසික දරථ ව්‍යපශමය ලක්‍ෂණ කොට ඇත්තේ ය. චෛතසිකයන් කලඹන උද්ධච්චාදි ක්ලේශයන්ට ප්‍රතිපක්‍ෂ යි.

**9-චිත්තපස්සද්ධි:** චිත්ත නම් විඥානස්කන්ධය හෙවත් සිත. සිතෙහි සන්සිඳුම චිත්තපස්සද්ධිය යි. එය චිත්ත දරථ ව්‍යපශමය ලක්‍ෂණ කොට ඇත්තේ ය. චිත්තය කළඹන උද්ධච්චාදි ක්ලේශයන්ට ප්‍රතිපක්‍ෂ යි.

**10-කායලහුතා: 11-චිත්තලහුතා:** කාය චිත්ත පෙර කී සැටි මැයි. චෛතසිකයන්ගේ සැහැල්ලු බව කාය ලහුතාය. චිත්තයාගේ සැහැල්ලු බව චිත්තලහුතා ය. මොහු වනාහි චෛතසිකයන්ගේ හා චිත්තයාගේ ගුරු බව සන්සිඳුවීම ලක්‍ෂණ කොටැ ඇත්තාහ. ඔවුන්ගේ ම බර බැව් කරන ථීනමිද්ධාදී ක්ලේශයන්ට ප්‍රතිපක්‍ෂ යි.

**12-කායමුදුතා: 13-චිත්තමුදුතා:** චෛතසිකයන්ගේ මෘදු බව කායමුදුතාය. චිත්තයාගේ මෘදු බව චිත්තමුදුතාය. ඔව්හු වනාහි චෛතසික චිත්තයන්ගේ තද බව සන්සිඳුවීම් ලක්‍ෂණ කොටැ ඇත්තාහ. ඔවුන්ගේ ම තද බැව් කරන දිට්ඨිමානාදි ක්ලේශයන්ට ප්‍රතිපක්‍ෂ යි.

**14-කායකම්මඤ්ඤතා 15-චිත්ත කම්මඤ්ඤතා:** චෛතසිකයන්ගේ කර්මන්‍යභාවය - ක්‍රියායෙහි යෝග්‍යත්වය කායකම්මඤ්ඤතාය. චිත්තයාගේ කර්මන්‍යභාවය චිත්ත කම්මඤ්ඤතාය. ඔව්හු වනාහි කායචිත්තයන්ගේ අකර්මන්‍ය භාවය සන්සිඳුවීම් ලක්‍ෂණ කොටැ ඇත්තාහ. ඔවුන්ගේ ම අකර්මන්‍ය භාවය කරන කාමච්ඡන්දාදි නීවරණයන්ට ප්‍රතිපක්‍ෂ යි.

**16-කායාපගුඤ්ඤතා: 17-චිත්තපාගුඤ්ඤතා:** චෛතසිකයන්ගේ ප්‍රගුණත්වය කායපාගුඤ්ඤතාය. චිත්තයාගේ ප්‍රගුණත්වය චිත්තපාගුඤ්ඤතාය. ඔහු වනාහි කාය චිත්තයන්ගේ ගිලන් බව සන්සිඳුවීම ලක්‍ෂණ කොට ඇත්තාහ. ඔවුන්ගේ ගිලන් බව කරන අස්සද්ධියාදියට ප්‍රතිපක්‍ෂ යි.

**18-කායජ්ජුකතාඥ 19-චිත්තුජ්ජුකතා:** චෛතසිකයන්ගේ ඍජුභාවය කායජ්ජුකතාය. චිත්තයාගේ ඍජු භාවය චිත්තුජ්ජුකතාය. ඔව්හු ද වනාහි කායචිත්තයන්ගේ ඍජුභාවය ලක්‍ෂණ කොටැ ඇත්තාහ. ඔවුන්ගේ ම කුටිල භාවය කරන මායාසාඨෙයාදි පාපධර්මයන්ට ප්‍රතිපක්‍ෂ යි.

මේ කායපස්සද්ධි ආදි චෛතසික ම යුගල යුගල වැ ප්‍රතිපක්‍ෂ ධර්මයන් නසාලයි. සෙස්සන්ගේ එසේ ප්‍රතිපක්‍ෂ ධර්ම නසාලීමෙක් නැත. එහෙයින් මොවුන්ගේ ම යුගලත්‍වය දක්වන ලදී. තව ද කායපස්සද්ධි ආදි තන්හි කායශබ්දයෙන් රූපකායයාගේ ද සන්සිඳුම් ආදිය වේ ය යි ගන්නේ ය.

සද්ධාදි මේ චෛතසික එකුන්විස්ස (19) සෝභන සිත්හි පමණක් යෙදේ. (සෝභන සිත් පාඩමේ බලනු.)

**ප්‍රශ්න.**

1. සද්ධා සති දෙකෙහි ස්වභාව හා භේද දක්වනු.
2. හිරි ඔත්තප්ප විස්තර කරනු.
3. අලෝභ අදෝසයන්ට ප්‍රතිපක්‍ෂාදිය දක්වනු.
4. පස්සද්ධි ආදිය ම කාය චිත්ත වශයෙන් ද්විවිධ කොටැ දැක්වූයේ කිම?
5. මේ සද්ධාදි එකුන්විසි සෝභන සාධාරණ කවර කවර සිත්හි යෙදේ ද? කවර කවර සිත්හි නො යෙදේ ද?

## 7. විරති තුන

1-**සම්මාවාචා** 2-**සම්මාකම්මන්ත** 3-**සම්මාආජීව** යන තුන විරති චෛතසිකය යි යට දක්වන ලදී. ඔවුන්ගේ ආකාර මෙසේ ය.

1-**සම්මාවාචා:** සම්මාවාචා යනු යහපත් වචනය. එනම් මිථ්‍යා වචනයෙන් වැළකීමය. ඒ වනාහි මුසාවාදයෙන් වැළකීමය, පිසුණ වචනයෙන් වැළකීමය, ඵරුෂ වචනයෙන් වැළකීමය, සම්ඵප්පලාපයෙන් වැළකීමය යි චතුර්විධ වේ.

2-**සම්මාකම්මන්ත:** සම්මාකම්මන්ත යනු යහපත් ක්‍රියාය. එ නම් මිථ්‍යා ක්‍රියාවන්ගෙන් වැළකීම ය. ඒ වනාහි ප්‍රාණඝාතයෙන් වැළකීමය, අදින්නාදානයෙන් වැළකීමය, කාමමිථ්‍යාචාරයෙන් වැළකීමය යි ත්‍රිවිධ වේ.

3-**සම්මාආජීව:** සම්මාආජීව යනු යහපත් දිවි පැවැත්ම ය. එනම් මිථ්‍යා ආජීවයෙන් වැළකීමය. ඒ වනාහි ආජීවය උදෙසා මුසාවාදයෙන් වැළකීමය, පිසුණ වචනයෙන් වැළකීමය, ඵරුස වචනයෙන් වැළකීමය, සම්ඵප්පලාපයෙන් වැළකීමය, ප්‍රාණඝාතයෙන් වැළකීමය, අදින්නාදානයෙන් වැළකීමය, කාමමිථ්‍යාචාරයෙන් වැළකීම ය යි සප්තවිධ වේ. කුහල ලපනාදියෙන් වැළකීම් වශයෙන් අනෙක විධ ද වේ.

මේ විරති වනාහි සම්පත්ත වශයෙන් ද සමාදාන වශයෙන් ද සමුච්ඡේද වශයෙන් ද යි තුන් ආකාරයකින් ලැබේ. සමාදානයක් හෝ සමුච්ඡේදයන් හෝ නැති ව හුදෙක් ප්‍රාස්තාවික වශයෙන් මුසාවාදාදියෙන් වැළකීමෙහි දී සම්පත්ත විරතිය වේ. පන්සිල් සමාදන්වීම් ආදි වශයෙන් වැළකීමෙහි සමාදාන විරතිය වේ. සෝවාන් ආදි මාර්ගයන්ගේ වශයෙන් සහමුලින් වැළකීමෙහි සමුච්ඡේද විරතිය වේ.

එබැවින් මේ විරති ලෝකෝත්තර සිත්හි නියත වශයෙන් එකවිට තුන ම ලැබෙන බව ද ලෞකික සිත් අතුරෙන් කාමාවචර කුශල සිත් අටෙහි පමණක් වෙන් වෙන් ව ඒ ඒ අවස්ථාවන්හි ලැබෙන බව ද දතයුතු. ඒ එසේ මැ යි. සෝතාපත්ති මග්ගාදි ලෝකෝත්තර සිත් අටෙහි විරති තුන එක විට ම යෙදේ. යෙදෙන්නේත් සියලු අවස්ථාවන්හි මැ යෙදේ. කාමාවචර කුසල සිත් අටෙහි වාග්දුශ්චරිත සඞ්ඛ්‍යාත මුසාවාදාදියෙන් වැළකෙන අවස්ථාවෙහි **සම්මාවාචාව** යෙදේ. සම්මාකම්මන්ත, සම්මාආජීව නොයෙදේ. කායදුශ්චරිත සඞ්ඛ්‍යාත ප්‍රාණඝාතාදියෙන් වැළකෙන අවස්ථායෙහි **සම්මාකම්මන්තය** යෙදේ. සම්මාවාචා සම්මාආජීව නො යෙදේ. මිථ්‍යා ආජීව සඞ්ඛ්‍යාත ජීවිතය සඳහා බොරුකීම් ආදියෙන් වැළකෙන අවස්ථාවන්හි **සම්මාආජීවය** යෙදේ. සම්මාවාචා සම්මාකම්මන්ත නො යෙදේ. එබැවින් මොව්හු අනියත යෝගී නම් වෙත්.

තව ද “ශීල” යයි දක්වනු ලබන්නේ බොහෝ සෙයින් මේ විරති බව දත යුතු. විරති චෛතසික කුසල් වුවත් මහග්ගත සිත්හි කැලැ ම නො යෙදෙන්නේ ය.

**ප්‍රශ්න.**

1. විරති කවරේ ද? එකක් පාසා විස්තර කරනු.
2. මොව්හු කවර සිත්හි යෙදේ ද? කවර සිත්හි නොයෙදේ ද?
3. කුමක් හෙයින් මොව්හු අනියතයෝගී ය යි කියනු ලැබෙත් ද?
4. සම්පත්ත, සමාදාන, සමුච්ඡේද, විරති විස්තර කරනු.
5. කාමාවචර කුසල් සිතෙක සම්මාආජීවය යෙදෙන සැටි දක්වනු.

## 8. අප්පමඤ්ඤා-පඤ්ඤා

**කරුණා, මුදිතා** යන **චෛතසික** දෙක අප්පමඤ්ඤා නමැ යි යට දක්වන ලද්දේ ය. ඔවුන්ගේ ආකාර මෙසේ යි.

1-**කරුණා**: කරුණා නම් දුක් විඳින්නකු දුටු විට සිතේ උපදින අනුකම්පා ස්වභාවය. එය අනුන්ගේ දුක් දුරු කරනු කැමැත්ත ලක්‍ෂණ කොට ඇත්තේ ය. එයින් අනුන් දුක් දුරු කළා හෝ නො කළා හෝ කාරණයෙක් නොවේ. කරුණාවට නිමිත්ත දුක් විඳින සත්ත්වයෝ ය.

**2-මුදිතා:** මුදිතා නම් සුව විඳින්නකු දුටු විට සිතේ උපදින මොදන ස්වභාවය යි. එය මෙරමා ගේ සම්පත් අනුමෝදන් වනු ලක්‍ෂණ කොටැ ඇත්තේ ය. මුදිතාවට නිමිත්ත සුඛිත සත්ත්වයෝ යි.

අප්‍රමාණ සත්ත්වයන් අරමුණු කොටැ පවත්නා බැවින් මේ චෛතසික දෙක අප්පමඤ්ඤා යයි කියනු ලැබේ. මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා යයි අප්පමඤ්ඤා සතරෙකි. ඔවුන් අතුරෙන් මෙත්තාව “අදෝස” නාමයෙන් ද උපෙක්ඛාව “තත්‍ර මජ්ඣත්තතා” නාමයෙන් ද යට දක්වන ලදි.

මේ අප්පමඤ්ඤා චෛතසික දෙක වනාහි පඨමජ්ඣාන, දුතියජ්ඣාන, තතියජ්ඣාන, චතුත්‍ථජ්ඣාන කුසල විපාක ක්‍රියා සිත් දොළොස ය, කාමාවචර කුසල සිත් අට ය, සහේතුක කාමාවචර ක්‍රියා සිත් අට ය යන අටවිසි (28) සිත්හි යෙදෙන්නේත් එබඳු අනුකම්පාවක් හෝ මොදනයක් ඇති විටෙක ය. එසේත් එකක් මුත් දෙකම එක විට නො යෙදෙන්නේ ය. ඒ එසේ මැයි. කරුණාව ඇති විට මුදිතාව ද, මුදිතාව ඇති විට කරුණාව ද නො යෙදේ. එ බැවින් මොහු දෙදෙන ද අනියතයෝගී නම් වෙත්. කරුණා, මුදිතා දෙක උපෙක්ඛා සසහගත සිත්හි නො යෙදේ යයි සමහරු කියත්.

සෝභන පස්විස්සෙන් එකුන්විස්ස (19) ක් **සෝභන සාධාරණය** යි ද, තුනක් **විරති** යයි ද, දෙකක් **අප්පමඤ්ඤ** ය යි ද, විශේෂ නම් කොටැ දැක්වූහ. සෙසු **පඤ්ඤව** මෙහි ම දක්වනු ලැබේ.

**පඤ්ඤ:** අනිත්‍යාදි ප්‍රකාරයෙන් දැනගන්නේ ප්‍රඥා ය. මෙය බලසම්පන්න කුශලයෙකි. කුශල මූලයෙකි. මෙහිලා සඤ්ඤා, විඤ්ඤාණ, පඤ්ඤා යන තුනෙහි වෙනස දත යුතු වේ. සඤ්ඤාව නීලාදි වශයෙන් අරමුණ හැඳිනීම් මාත්‍රයක් කරයි. ලක්‍ෂණාවබෝධයක් නො කරයි ළදරුවා කහවණුව මෙනි. විඤ්ඤාණය අරමුණ හැඳිනීම ද ලක්‍ෂණාවබෝධය ද කරයි. මාර්ගයට පැමිණවීම නො කරයි. පිටිසරයා කහවණුව මෙනි. ප්‍රඥාව ඒ සියල්ලම කරයි. රන්කරුවනා කහවණුව මෙනි. **විමංසිද්ධිපාද, පඤ්ඤින්ද්‍රිය, පඤ්ඤබල, ධම්මවිචයසම්බොජ්ඣඞ්ග, සම්මාදිට්ඨි** යන නම්වලින් දක්වනු ලබන්නේත් මේ ප්‍රඥා මැ යි. එය සර්වඥතාඥානය දක්වා තියුණු වේ.

පඤ්ඤාව වනාහි ඥානසම්ප්‍රයුක්ත කාමාවචර සිත් 12 ය. මහග්ගත - ලෝකෝත්තර සිත් 35 යන සත්සාළිස් (47) සිත්හි යෙදෙන්නේ ය.

මෙසේ දෙපනස් චෛතසික හා ඔවුන්ගේ ස්වභාව උද්දෙස-නිද්දෙස වශයෙන් ද ඔවුන් යෙදෙන සිත් සම්ප්‍රයෝග වශයෙන් ද දක්වා ඉක්බිති මේ මේ සිත්වල මේ මේ චෛතසික යෙදෙන්නේ ය යි මතු පාඩම් වලින් චෛතසිකයන්ගේ සංග්‍රහනය දක්වනු ලැබේ.

**ප්‍රශ්න.**

1. අප්පමඤ්ඤා දෙක විස්තර කරනු.
2. කුමක් හෙයින් ඔවුනට "අප්පමඤ්ඤා" ය යි කියනු ලැබේ ද?
3. ඔව්හු කවර කවර සිත්හි යෙදෙද් ද? කවර කවර සිත්හි නො යෙදෙද් ද?
4. පඤ්ඤාව පැහැදිලි කොටැ එහි නාමාන්තර දක්වනු. පඤ්ඤාව කවර කවර සිත්හි යෙදේ ද? කවර කවර සිත්හි නො යෙදේ ද?

## 9. ලොකොත්තර සිත්හි යෙදෙන චෛතසික.

සංක්ෂේප වශයෙන් ලෝකෝත්තර සිත් අටක් ද විස්තර වශයෙන් 40 ක් ද ලැබෙන ක්‍රමය **චිත්ත පාදයෙහි 20 වන 21 වන, 28 වන පාඩම්වලින්** දක්වන ලද්දේය. එහි සංක්‍ෂිප්ත ක්‍රමය ශුෂ්ක විදර්ශකයාගේ ද විස්තර ක්‍රමය සමථයානිකයාගේ ද වශයෙන් ය. ශුෂ්ක විදර්ශකයාගේ වුවත් ලෝකෝත්තර සිත් ප්‍රථමධ්‍යානික ලෝකෝත්තර සිත් හා සමාන වැ මැ උපදනේ ය.

එබැවින් විස්තර ක්‍රමයේ සිත්වල චෛතසික දැක්වූ කල්හි සංක්‍ෂිප්ත ක්‍රමයේ සිත්වල ද චෛතසික දැක්වුණා නම් වේ. එබැවින් මෙහි විස්තර ක්‍රමයේ ම දක්වමු.

1. ප්‍රථමධ්‍යාන ලෝකෝත්තර සිත් අටෙකි. (**චිත්ත පාද 23 වන පාඩම බලනු.**) එහි අන්‍යසමාන චෛතසික 13 ද අප්පමඤ්ඤා දෙක හැරැ සෝභන 23 ද යන සතිස් (36) චෛතසික යෙදේ. මාර්ග සිතට අරමුණ නිර්වාණය. අප්පමඤ්ඤාවන්ට අරමුණ දුඃඛිත සුඛිත සත්ත්වයෝ ය. එබැවින් සත්ත්වාරම්මණික අප්පමඤ්ඤා දෙක නිර්වාණාරම්මණික මාර්ග සිත්හි නොයෙදෙන බව දත යුතු.

2. ද්‍රුතියජ්ඣාන ලෝකෝත්තර සිත් අටෙකි. එහි විතර්කය හැරැ සෙසු අඤ්ඤසමාන 12 ද ප්‍රථමධ්‍යානයට කී සෝභන 23 ද වන පන්තිස් (35) චෛතසික යෙදේ. ද්‍රුතියජ්ඣානයෙහි විතර්කය නො ලැබෙන පරිදි (**චිත්තපාද 14 වන පාඩමේ**) විස්තර කරන ලද්දේ ය.

3. තතියජ්ඣාන ලෝකෝත්තර සිත් අටෙකි. එහි විතර්ක විචාර හැරැ සෙසු අඤ්ඤසමාන 11 ද ප්‍රථම ධ්‍යානයට කී සෝභන 23 ද යන සතිස් (34) චෛතසික යෙදේ. තතියජ්ඣානයෙහි විතර්ක, විචාර නො යෙදෙන පරිදි ද යට දක්වන ලදි.

4. චතුත්ථජ්ඣාන ලෝකෝත්තර සිත් අටෙකි. එහි විතර්ක, විචාර, ප්‍රීති යන චෛතසික තුන හැරැ සෙසු අඤ්ඤසමාන 10 ද ප්‍රථමධ්‍යානයට කී සෝභන 23 ද යන තෙතිස් (33) චෛතසික යෙදේ. චතුත්ථජ්ඣානයෙහි විතර්ක, විචාර, ප්‍රීති නො යෙදෙන සැටි ද යට දක්වන ලදී.

පඤ්චමජ්ඣාන ලෝකෝත්තර සිත් ද අටෙකි. එය විතර්ක, විචාර, ප්‍රීති චෛතසික තුන හැර සුඛ වෙනුවට උපෙක්‍ෂාව ගෙනැ සෙසු අඤ්ඤසමාන 10 ද ප්‍රථමධ්‍යානයට කී සෝභන 23 දැයි චෛතසික තෙතිසක් (33) යෙදේ. සුඛ වෙනුවට උපෙක්‍ෂා ගැනුමේ හේතු ද යට දැක්විණි.

පඤ්චකනය, චතුෂ්කනය යයි ධ්‍යාන ක්‍රම දෙකෙකි. එයින් පඤ්චකනය මන්දප්‍රාඥයාගේ වශයෙන් ද චතුෂ්කනය තීක්‍ෂණ ප්‍රාඥයාගේ වශයෙන් ද වදාළේ ය. චිත්තපාදයේ හා මෙහි හා පඤ්චකනය දැක්විණි. විතර්ක, විචාර දෙකම එක විට දුරු කරන්නේ චතුෂ්කනයෙන් ධ්‍යානලාභී වේ. එවිට "විතක්ක විචාර පීති සුඛෙකග්ගතා සහිතං පඨමජ්ඣානං, පීති සුඛෙකග්ගතා සහිතං දුතියජ්ඣානං, සුඛෙකග්ගතා සහිතං තතියජ්ඣංනා උපෙක්ඛකග්ගතා සහිතං චතුත්ථජ්ඣානං"යි ගත යුතු යි. සූත්‍ර පිටකයෙහි මේ චතුෂ්කනය ආයේ යැ.

**ඡත්තිංස පඤ්චතිංසා ච චතුත්තිංස යථාක්කමං**
**තෙත්තිංසද්වයමිච්චෙවං පඤ්චධානුත්තරෙඨිතා.**

ප්‍රශ්න.

1. ප්‍රථමධ්‍යාන ලෝකෝත්තර සිත් අටෙහි චෛතසික කෙතෙක් යෙදෙද් ද? ඔහු කවරහු ද?
2. දුතියජ්ඣාන ලෝකෝත්තර සිත් අටෙහි කෙතෙක් යෙදෙද් ද? ඔහු කවරහු ද?
3. තතියජ්ඣාන ලෝකෝත්තර සිත් අටෙහි කොතෙක් ද? කවරහු ද?
4. චතුත්ථජ්ඣාන ලෝකෝත්තර සිත් අටෙහි කොතෙක් ද? කවරහු ද?
5. පඤ්චමජ්ඣාන ලෝකෝත්තර සිත් අටෙහි කෙතෙක් ද? කවරහු ද?
6. ධ්‍යාන සම්බන්ධ නව ලෝකෝත්තර සිත් අටෙහි චෛතසික කෙතෙක් යෙදෙද් ද? කවරහු ද?
7. ධ්‍යාන චතුෂ්ක නය, පංචක නය විස්තර කරනු.

## 10. මහග්ගත සිත්හි යෙදෙන චෛතසික.

රූපාවචර, අරූපාවචර සිත් මහග්ගත නම්. (චිත්තපාද 4 වන පාඩම බලනු.) ඒ සියල්ල 27 ක් වුවත් මෙහි කොටස් පසකට බෙදනු ලැබේ. පඨමජ්ඣාන සිත්, දුතියජ්ඣාන සිත්, තතියජ්ඣාන සිත්, චතුත්ථජ්ඣාන සිත්, පංචමජ්ඣාන සිත් යන වශයෙනි.

1. පඨමජ්ඣාන සිත් කුසල, විපාක, ක්‍රියා වශයෙන් තුනෙකි. එහි අඤ්ඤසමාන 13 ය, විරති තුන හැර සෝශන 22 ය යන පන්තිස් (35) චෛතසික සංග්‍රහ වේ. සුවිසුද්ධ සීල, සම්පන්නයකුගේ චිත්ත සමාධිය පිණිස මහග්ගත වඩනු ලැබේ. කාය දුශ්චරිත වාග්

දුශ්චරිත මිථ්‍යා ආජීවයන්ගේ විසෝධනය පිණිස හෝ ඔවුන්ගේම සමුච්ඡේද පටිප්පස්සම්භන පිණිස නො වඩනු ලැබේ. එබැවින් මහග්ගත සිත්හි විරති තුන නො යෙදෙන බැව් දත යුතු.

තව ද මෙහි අප්පමඤ්ඤා දෙකින් එකක් මුත් දෙක ම එක වර නො යෙදේ. **(8 වන පාඩම** බලනු.)

2. දුතියජ්ඣාන සිත් කුසල, විපාක, ක්‍රියා වශයෙන් තුනෙකි. එහි ප්‍රථමධ්‍යාන ත්‍රිකයට කී චෛතසිකවලින් විතර්කය හැර සෙසු සූතිස් (34) චෛතසික සංග්‍රහ වේ. දුතියජ්ඣාන විතර්ක රහිත වැ මැ උපදනේ ය.

3. තතියජ්ඣාන සිත් කුසල, විපාක, ක්‍රියා වශයෙන් තුනෙකි. එහි ප්‍රථමධ්‍යානයට කී චෛතසිකවලින් විතර්ක විචාර දෙක හැර සෙසු තෙතිස් (33) චෛතසික සංග්‍රහ වේ. තතියජ්ඣාන විතර්ක, විචාර රහිත වැ මැ උපදනේ ය.

4. චතුත්‍ථජ්ඣාන සිත් කුසල, විපාක, ක්‍රියා වශයෙන් තුනෙකි. එහි ප්‍රථමධ්‍යානයට කී චෛතසිකවලින් විතර්ක, විචාර, ප්‍රීති හැර සෙසු දෙතිස් (32) චෛතසික සංග්‍රහ වේ. චතුත්‍ථජ්ඣානය විතර්ක, විචාර, ප්‍රීති රහිත වැ මැ උපදනේ ය.

5. පංචමජ්ඣාන සිත් පසළොසෙ (15) කි. පංචමජ්ඣාන කුසල, විපාක, ක්‍රියා තුන හා අඞ්ගසමත්‍වයෙන් එහි මැ ඇතුළත් කරන ලද අරූපාවචර සිත් 12 වශයෙන් ය. පංචමජ්ඣානයෙහි ඇත්තේ උපෙක්ඛා, එකග්ගතා යන අඞ්ග දෙක යි. අරූපාවචර සිත්හි දු එදෙක මැ යි. (**චිත්තපාද 23 වන පාඩම** බලනු.) ඒ පංචමජ්ඣාන සිත් පසළොසෙහි චතුත්‍ථජ්ඣානයට කී චෛතසික වලින් අප්පමඤ්ඤා දෙක හැර සෙසු සමතිස් (30) චෛතසික සංග්‍රහ වේ. මෙහි සුඛ වෙනුවට උපෙක්‍ෂා ගත යුතුයි.

මෙසේ සත්විසි (27) මහග්ගත සිත්හි ධ්‍යාන පංචක වශයෙන් පස් ආකාරයෙකින් චෛතසික සංග්‍රහ වූයේ ය.

**පඤ්චතිංස චතුත්තිංස තෙත්තිංස ච යථාක්කමං,**
**බත්තිංසචෙව තිංසෙති පඤ්චධාව මහග්ගතෙ.**

## ප්‍රශ්න.

1. ධ්‍යාන පංචකයෙහි යෙදෙන චෛතසික පිළිවෙලින් දක්වනු.
2. පංචමධ්‍යානයට සිත් කීයක් ඇතුළත් ද? ඒ කවරේ ද?
3. මහග්ගත සිත්හි කුමක් හෙයින් විරති නො යෙදේ ද?
4. එහි අප්පමඤ්ඤා යෙදෙන ක්‍රමය දක්වනු.
5. උඩත්පිරිසෙයින් සියල්ල සංග්‍රහ ගාථාවක් දක්වනු.

## 11. කාමාවචර සොභන සිත්හි යෙදෙන චෛතසික.

කාමාවචර සොභන නම් කාමාවචර කුසල සිත් 8 ය, කාමාවචර සහේතුක විපාක සිත් 8 ය, කාමාවචර සහේතුක ක්‍රියා සිත් 8 යන සූවිසි (24) චිත්තයෝ ය. (**චිත්තපාද 11 වන, 12 වන, 13 වන පාඩම් බලනු.**)

1-2 ඔවුන් අතුරෙන් සෝමනස්ස සහගත ඤාණ සම්පයුත්ත අසංඛාර, සසංඛාර යන පළමුවන දෙවන කුසල් සිත් යුවලෙහි අඤ්ඤසමාන 14 ය, සොභන 25 ය, යන අටතිස් (38) චෛතසික සංග්‍රහ වේ. එහිදු විරති, අප්පමඤ්ඤා පසින් එකවර එකක්ම මුත් දෙකක් හෝ කීපයක් හෝ නො යෙදේ.

ඒ එසේ මැ යි. විරති යෙදුනොත් අප්පමඤ්ඤා නො යෙදේ. අප්පමඤ්ඤා යෙදුනොත් විරති නො යෙදේ. ඔවුන් අතුරෙනු දු එකක් යෙදුණොත් අතික නො යෙදෙන බව දතයුතු. විරති ව්‍යතික්‍රමණය කළයුතු වස්තු අරමුණු කොටැ ඇත්තේ ය. අප්පමඤ්ඤා සත්ත්වයන් අරමුණු කොට ඇත්තේ ය. මේ ඔවුන් එකවට නො යෙදීමේ හෙතු යි.

3-4 සෝමනස්ස සහගත ඤාණවිප්පයුත්ත අසංඛාර සසංඛාර යන තුන්වන සතරවන කුසල් සිත් යුවලෙහි පඤ්ඤා චෛතසිකය හැරැ සෙසු සත්තිස (37) යෙදේ. ඤාණ විප්පයුත්ත හෙයින් මෙහි පඤ්ඤාව නැති.

5-6. උපෙක්ඛා සහගත ඤාණසම්පයුත්ත අසංඛාර සසංඛාර යන පස්වන සවන කුසල් සත් යුවලෙහි පඤ්ඤාව යෙදේ. පීතිය නො යෙදේ. එබැවින් එහි චෛතසික සත්තිසෙ (37) කි. ඤාණ සම්පයුත්ත හෙයින් ප්‍රඥා යෙදිණි. උපෙක්ඛා සහගත හෙයින් ප්‍රීති නො යෙදිණි.

7-8. උපෙක්ඛා සහගත ඤාණවිප්පයුත්ත අසංඛාර-සසංඛාර යන සත්වන අටවන කුසල් සිත් යුවලෙහි පඤ්ඤා පීති දෙක ම හැරැ සෙසු සතිස් (36) චෛතසික යෙදේ. ඤාණ විප්පයුත්ත හෙයින් පඤ්ඤා නැති. උපෙක්ඛා සහගත බැවින් ප්‍රීති ද නැති. මේ සියලු සිත්හි විරති, අප්පමඤ්ඤාවන්ගෙන් එකක් එකක් ම යෙදෙන බව පෙර කී සේ මැ යි.

**මේ කාමාවචර කුසල සිත් අටෙහි චෛතසික යෙදෙන ක්‍රමය යි.**

සහේතුක කාමාවචර ක්‍රියා සිත් අටෙහි (**චිත්තපාද 13 පාඩම බලනු**) යට දැක්වුණු චෛතසික ම විරති රහිත වැ පිළිවෙලින් යෙදේ. මේ ක්‍රියා සිත් උපදනේ රහතන්ට ම ය. විරති නියතයෙන් කුසල් ය. රහතන්ට කුසල් සිත් නූපදනා ක්‍රියා සිත්හි විරති නො යෙදෙන්නේ ය.

**මේ සහේතුක කාමාවචර ක්‍රියා සිත් අටෙහි චෛතසික යෙදෙන ක්‍රමය යි.**

සහේතුක කාමාවචර විපාක සිත් අටෙහි කාමාවචර කුසල චිත්තයන්ට දැක්වූ චෛතසික මැ විරති, අප්පමඤ්ඤා රහිත වැ යෙදේ. විපාක සිත්වල විරති හා අප්පමඤ්ඤා නොයෙදෙන බව දතයුතු.

**මේ සහේතුක කාමාවචර විපාක සිත් අටෙහි චෛතසික යෙදෙන ක්‍රමය යි.**

සිත් අසංඛාර, සසංඛාර වීමෙහි ලා චෛතසිකයන්ගේ ඌනාතිරික්තභාවයෙක් හේතු නො වන්නේ ය.

**අට්ඨතිංස සත්තතිංසද්වයං ඡත්තිංසකං සුභෙ**
**පඤ්චතිංස චතුත්තිංසද්වයං තෙත්තිංසකා ක්‍රියෙ.**
.
**තෙත්තිංස පාකෙ ඛත්තිංස ද්වයෙකත්තිංසකං භමෙ,**
**සහෙතුකාමාවචර පුඤ්ඤ පාකක්‍රියාමනෙ.**

ප්‍රශ්න.

1. සෝමනස්ස සහගත ඤාණ සම්පයුත්ත අසංඛාර කුසල චිත්තයෙහි යෙදෙන චෛතසික කවරේ ද? එක වරෙක යෙදෙන්නේ කෙතෙක් ද?
2. සෙසු කුසල සිත් සතෙහි ද චෛතසික යෙදෙන ක්‍රමය දක්වනු.
3. සහේතුක කාමාවචර විපාක ක්‍රියා සිත්වල චෛතසික යෙදෙන සැටි ක්‍රමයෙන් දක්වනු.
4. විපාක සිත්හි අප්පමඤ්ඤා විරති නො යෙදෙන්නේ කිම?
5. ක්‍රියා සිත්හි විරති නො යෙදෙන්නේ කිම?
6. චිත්තයන්ගේ අසංඛාර සසංඛාර භාවයට චෛතසිකයන්ගේ යෙදීම හෝ නො යෙදීම හේතු වේ ද? පැහැදිලි කරනු.

## 12. අකුසල සිත්හි යෙදෙන චෛතසික.

1. අකුසල සිත් දොළොසෙකි. එයින් පළමුවන අසංඛාරික (සෝමනස්ස සහගත දිට්ඨිගතසම්පයුත්ත අසංඛාරික සිතෙහි අන්‍යසමාන 13 ය, (මෝහ, අහිරික, අනොත්තප්ප, උද්ධච්ච යන) අකුසල සාධාරණ 4 ය, ලෝභ, දිට්ඨි 2 යන එකුන්විසි (19) චෛතසික සංග්‍රහ වේ.

3. දෙවන අසංඛාරික (සෝමනස්ස සහගත දිට්ඨිගත විප්පයුත්ත අසංඛාර) සිතෙහි අන්‍යසමාන 13 ය, අකුසල සාධාරණ 4 ය, ලෝභ, මාන දෙකය, යන එකුන්විසි (19) චෛතසික සංග්‍රහ වේ.

5. තෙවන අසංඛාරික (උපෙක්ඛා සහගත දිට්ඨිගත සම්පයුත්ත අසංඛාරික) සිතෙහි ප්‍රීතිය හැර සෙසු අන්‍ය සමාන 12 ය, අකුශල සාධාරණ 4 ය, ලෝභ, දිට්ඨි දෙක ය යන අටළොස් (18) චෛතසික සංග්‍රහ වේ.

7. සතරවන අසංඛාරික (උපෙක්ඛා සහගත දිට්ඨිගත විප්පයුත්ත අසංඛාරික) සිතෙහි ප්‍රීතිය හැර සෙසු අන්‍ය සමාන 12 ය, අකුසල සාධාරණ 4 ය, ලෝභ, මාන දෙක ය යන අටළොස් (18) චෛතසික සංග්‍රහ වේ.

9. පස්වන අසංඛාරික (දෝමනස්ස සහගත පටිඝ සම්පයුත්ත අසංඛාර) සිතෙහි ප්‍රීතිය හැර සෙසු අන්‍ය සමාන 12 ය, අකුසල සාධාරණ 4 ය, දෝස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච 4 ය යන සම විසි (20) චෛතසික සංග්‍රහ වේ. ඉස්සා, මච්ඡෙර, කුක්කුච්ච, අනියතයෝගී බව යට කියන ලදී. එබැවින් ඔවුන් යෙදෙත් හොත් එක වර එකක් ම මුත් දෙකක් හෝ තුනම හෝ නො යෙදෙන බව දතයුතු.

2-4-6-8-10 සසඞ්ඛාරික සිත් පසෙහි යට දැක්වූ චෛතසික ම පිළිවෙලින් ථීන මිද්ධය හා සමග යෙදේ. එවිට දෙවන, සතර වන සිත් දෙකෙහි චෛතසික 21 බැගින් ද, සවන, අටවන සිත් දෙකෙහි විස්ස (20) බැගින් ද, දසවන සිතෙහි දෙවිස්ස බැගින් (22) ද ඇත.

11. එකොළොස් වන (උද්ධච්ච සහගත) සිතෙහි ඡන්ද, පීති දෙක හැර සෙසු අන්‍යසමාන 11 ය, අකුසල සාධාරණ 4 ය යන පසළොස් (15) චෛතසික සංග්‍රහ වේ.

12. දොළොස්වන (විචිකිච්ඡා සහගත) චිත්තයෙහි සර්ව චිත්ත සාධාරණ 7 ය, ඡන්ද, පීති, අධිමොක්ඛ හැර ප්‍රකීර්ණක 3 ය, අකුසල සාධාරණ 4 ය, විචිකිච්ඡාය යන පසළොස් (15) චෛතසික සංග්‍රහ වේ. නිශ්චය කිරීම් ලක්‍ෂණ වූ අධිමොක්‍ෂය විචිකිච්ඡා චිත්තයෙහි නූපදනේ ය.

මෙසේ අකුසල සිත් දොළොසෙහි වෙන් වෙන් ගණන් වශයෙන් සත් ආකාරයෙකින් චෛතසික සංග්‍රහ වෙයි. පරීක්‍ෂායෙන් යොදා බලනු.

**එකූනවීසට්ඨාරස වීසෙකවීස වීසති**
**ද්වෙවීස පණ්ණරසෙති සත්තධා කුසලෙ ඨිතා**
**සාධාරණා ච චත්තාරො සමානා ච දසාපරෙ**
**චුද්දසෙතෙ පවුච්චන්ති සබ්බාකුසලයොගිනො.**

**ප්‍රශ්න.**

1. සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත අසංඛාර චිත්තයෙහි චෛතසික කෙතෙක් යෙදේ ද? ඔහු කවරහු ද?
2. සෙසු අකුසල් සිත් එකොළොසෙහි යෙදෙන චෛතසික ද වෙන් වෙන් වශයෙන් පැහැදිලිව දක්වනු.
3. අනියතයෝගී චෛතසික යෙදෙන සිත් දක්වනු.
4. සර්වාකුසලයෝගී චෛතසික කෙතෙක් ද? කවරහු ද?
5. අධිමොක්ෂය නො යෙදෙන සිත කිමෙක් ද? හේතු කිම?
6. වෙන් වෙන් ගණන් වශයෙන් බලත් හොත් අකුසල සිත් දොළොසෙහි චෛතසික කී ආකාරයෙකින් යෙදේ ද?

## 13. අහේතුක සිත්හි යෙදෙන චෛතසික

අහේතුක සිත් අටළොසෙකි. (**චිත්තපාද 8 වන, 9 වන, 10 වන පාඩම්** බලනු). එහි යෙදෙන චෛතසික පහසු පිළිවෙලින් මෙහි දක්වනු ලැබේ.

18. සෝමනස්ස සහගත හසිතුප්පාද චිත්තයෙහි (**චිත්තපාද 10 වන පාඩම** බලනු.) ඡන්දය හැර සෙසු අන්‍යසමාන දොළොස් (12) චෛතසික සංග්‍රහ වේ.

17. වොට්ඨපන හෙවත් උපෙක්ඛා සහගත මනොද්වාරාවර්ජන චිත්තයෙහි ඡන්ද, පීති දෙක හැර සෙසු අන්‍ය සමාන චෛතසික එකොළොස (11) සංග්‍රහ වේ.

14. සෝමනස්ස සහගත සන්තීරණ චිත්තයෙහි (**චිත්තපාද 9 වන පාඩම** බලනු.) ඡන්ද, විරිය හැර සෙසු එකොළොස් (11) අන්‍යසමාන චෛතසික සංග්‍රහ වේ.

18-6-13-7-15 මනෝධාතු ත්‍රිකයෙහි හා අහේතුක පටිසන්ධි යුගලයෙහි ඡන්ද, පීති, විරිය හැර සෙසු අන්‍ය සමාන චෛතසික දසය සංග්‍රහ වේ. **මනොධාතු ත්‍රිකය** නම්, පඤ්චද්වාරාවර්ජනය ද අකුසල විපාක උපෙක්ඛා සහගත සම්පටිච්ඡනය ද, කුසල විපාක උපෙක්ඛා සහගත සම්පටිච්ඡනය ද යන සිත් තුනය. මනො විඤ්ඤාණ ධාතු මෙන් විශිෂ්ට වූ මනන කෘත්‍ය නැති බැවින් මේ සිත් තුන **මනොධාතු** යයි කියනු ලැබේ. සිත් 89 ය සත්ත විඤ්ඤාණ ධාතු වශයෙන් බෙදත් හොත් චක්ඛුවිඤ්ඤාණද්වය චක්ඛුවිඤ්ඤාණ ධාතුය සොතවිඤ්ඤාණද්වය සොතවිඤ්ඤාණ ධාතුය ඝාණවිඤ්ඤාණද්වය ඝාණවිඤ්ඤාණ ධාතුය. ජිව්හාවිඤ්ඤාණද්වය ජිව්හාවිඤ්ඤාණ ධාතුය. කායවිඤ්ඤාණද්වය කාය විඤ්ඤාණ ධාතුය. පඤ්චද්වාරාවර්ජනය හා සම්පටිච්ඡන යුගලය මනො ධාතුය. සෙසු සිත් මනොවිඤ්ඤාණ ධාතු යි.

අහේතුක පටිසන්ධි යුගලය නම් අකුසල විපාක උපෙක්ඛා සහගත සන්තීරණය කුසල විපාක උපෙක්ඛා සහගත සන්තීරණය යන සිත් දෙකයි.

1-2-3-4-5-8-9-10-11-12. දෙපස් විඤ්ඤාණයන්හි සර්වචිත්ත සාධාරණ චෛතසික සිත පමණක් මැ සංග්‍රහ වේ. **දෙපස් විඤ්ඤාණ නම්**, අකුසල විපාක කුසල විපාක වශයෙන් දැක්වූ චක්ඛුවිඤ්ඤාණ දෙක ය. සොතවිඤ්ඤාණ දෙක ය, ඝාණ විඤ්ඤාණ දෙක ය. ජිව්හාවිඤ්ඤාණ දෙක ය, කායවිඤ්ඤාණ දෙක ය යන සිත් දසය යි.

**ද්වාදසෙකාදස දස සත්තචාති චතුබ්බිධො**
**අට්ඨාරසා හෙතුකෙසු චිත්තුප්පාදෙසු සඞ්ගහො.**

මෙසේ අටළොස් අහේතුක සිත්හි වෙන් වෙන් ගණන් වශයෙන් සතර පරිද්දෙකින් චෛතසික සංග්‍රහය වන්නේ ය. සියලු සංග්‍රහ විධි එකතු කොට බලත් හොත් ලෝකෝත්තර සිත්හි පස් පරිදිය. මහග්ගත සිත්හි පස් පරිදි ය. කාමාවචර සෝභන සිත්හි දොළොස් පරිදි ය, අකුසල සිත්හි සත් පරිදි ය. අහේතුක සිත්හි සතර පරිදි ය යි තෙතිස් (33) ආකාර වේ.

**ප්‍රශ්න.**

1. හසිතුප්පාද චිත්තයෙහි චෛතසික කෙතෙක් යෙදේද් ද? ඔහු කවරහු ද?
2. පඤ්චද්වාරාවර්ජන මනොද්වාරාවර්ජන සිත්හි යෙදෙන චෛතසික දක්වනු.
3. සත්තවිඤ්ඤාණ ධාතු වෙන් කොට දක්වා චක්ඛුවිඤ්ඤාණ ධාතුයෙහි යෙදෙන චෛතසික දක්වනු.
4. අහේතුක පටිසන්ධියුගලය කිමෙක් ද? එහි කවර චෛතසික යෙදේද් ද?
5. චෛතසිකයන්ගේ තෙතිස් සංග්‍රහ දක්වනු.

**මෙතෙකින් දෙපණස් චෛතසික** ද, ඔවුන්ගේ **ස්වභාවයද**, ඔවුන්ගේ **සංප්‍රයොග නය හා සංග්‍රහ නය** ද දක්වා නිමියේ ය. සම්ප්‍රයොග නය නම් එස්සාදි එක් එක් චෛතසිකය මේ මේ සිත්හි යෙදෙන්නේ ය යි දැක්වූ ක්‍රම ය. සංග්‍රහ නය නම් සොතාපත්තිමග්ග චිත්තාදි එක් එක් සිතෙහි මේ මේ චෛතසික යෙදෙන්නේ ය යි දැක්වූ ක්‍රමයයි. මෙහි චෛතසිකයන්ගේ ආකාර දැක්වූ තන්හි දී ම සම්ප්‍රයොග නය දක්වන ලද බැව් දත යුතු යි.

**චෛතසික පාදය නිමි.**

## 14. සංග්‍රහ ගීතිකා.

1. එක උපත ද නිරොද
එක අරමුණු වතුදු ඇති
මෙ සිව් ලකුණෙන් සිත හා
යුතු දෙපනස සිතැයි නම්

සිත සමග ඉපිද ඒ සමගම නැතිවන සිත ගත් අරමුණ ම ගෙන සිත පැවති තන්හිම පවත්නා දෙපනස චෛතසික නම්.

2. සසැට, පස්පණස
එකොළොස, සොළොස, සැත්තෑ
විසියයි සිත් පිළිවෙලින්
විතක් ඈ සය නො යෙදේ.

විතර්කාදි ප්‍රකීර්ණක සය නො යෙදෙන සිත් පිළිවෙලින් සසැටෙක (66) පස්පණසෙක (55) එකොළොසෙක (11) සොළොසෙක (16) සැත්තෑවෙක (70) විස්සෙක් ද (20) වේ.

3. පස්පණස, සසැට
අටසැත්තෑ දෙසැත්තෑ
එක් පණසෙකුත් සැත්තෑ
සිත්හි මේ සය යෙදෙනේ.

මේ සය යෙදෙන සිත් පිළිවෙලින් පස්පණසෙක (55) සසැටෙක (66) අටසැත්තෑවෙක (78) තෙසැත්තෑවෙක (73) එක් පණසෙක (51) එකුන්සැත්තෑවෙක් (69) ද වේ.

4. හැම අකුසල්හි සිව්-
-දෙනෙකි ලොබ මුලැ'තිදෙනෙකි
දොස මුලැ සතරෙකි එසේ
දෙකෙකි සසකර සිත්හි

සතරෙක් සියලු අකුසල් සිත්හි යෙදේ. ලෝභ මූලික සිත්හි තුනෙක් ද, දෝස මූලික සිත්හි සතරෙක් ද වේ. සසඞ්කාරික සිත්හි දෙකෙක් ද වේ.

5. විසිකිස විසිකිසින්
යුතු සිතෙහි ඇ යි මෙතුදුස
දොළොස් අකුසල් සිත්හි මැ
යෙදෙන්නේ පස් අයුරෙකින්

විචිකිච්ඡාව විචිකිච්ඡා සම්ප්‍රයුක්ත සිතෙහි යෙදේ. මෙසේ මේ තුදුස (14) දොළොස් අකුසල් සිත්හි මේ පස් ආකාරයෙන් යෙදේ.

6. සොබන සාධාරණ
එකුන්විසි, තුන්විරති
අපමන් දෙකෙකි, පැණ සහ
මෙ පස්විසි වේ සෝබන

සෝබන සාධාරණ එකුන් විස්සෙක (19) විරති තුනෙක (3) අප්පමඤ්ඤ දෙකෙක (2) ප්‍රඥාවයැ යි මේ සෝබන චෛතසික පස්විස්ස (25) ය.

7. එකුන්විසි සෝබන
සාධාරණ සිතැසි මේ
එකුන් සැට සෝබන
සිත්හි නියතින් වනුයේ

මේ සෝබන සාධාරණ එකුන් විස්ස (19) එකුන් සැට (59) සෝබන සිත්හි නියතයෙන් වන්නේ ය.

8. විරති තුන ලොව්තුරු
සිත්හි එකවිට නියතින්
කම්වැදැරී කුසල් අටැ
වෙන වෙන යෙදේ කිසිදා

විරති තුන ලොව්තුරු සිත්හි එකවිට නියතයෙන් යෙදේ. කාමාවචර කුසල් සිත් අටෙහි වෙන් වෙන්වම අනියමින් යෙදේ.

9. සතිසෙක්, පන්තිසෙක්
සූතිසෙක්, තෙතිසෙක් යලි
තෙතිසෙක් යි පස්දැහැන්,
කෙමෙන් ලොව්තුරු සිතැ වෙත්

ලොව්තුරු සිත්හි සතිසෙක (36) පන්තිසෙක (35) සූතිසෙක (34) තෙතිසෙක (33) නැවත තෙතිසෙකැ යි පිළිවෙලින් පස් අයුරකින් වේ.

10. පන්තිසෙක්, සූතිසෙක්
තෙතිසක්, දෙතිසෙක් තිසෙක්
මාර්ගය සිත්හි සිතැසි
යෙදෙන්නේ පස් පරිද්දෙන්

මහග්ගත සිත්හි පන්තිසෙක (35) සූතිසෙක (34) තෙතිසෙක (33) දෙතිසෙක (32) තිසෙකැ යි පිළිවෙලින් පස් අයුරකින් යෙදේ.

11. අටතිස් සත්තිස්
සත්තිස් සතිස් යුවළවැ
කම්වැදැරී කුසල් සිත්
අටෙහි වනුයේ නිසිලෙස්

කාමාවචර කුසල් සිත් අටෙහි පිළිවෙලින් අටතිස් (38) දෙකෙක සත්තිස් (37) දෙක දෙක ය. සතිස් (36) දෙකෙකැයි තුන් පරිද්දෙකින් යෙදේ.

12. පන්තිස් සූතිස්
සූතිස් තෙතිස් යුවළවැ
සහේ කම් වැදැරි
කිරිය සිත් අටවනුයේ

සහේතුක කාමාවචර ක්‍රියා සිත් අටෙහි පිළිවෙලින් පන්තිසෙක, (35) දෙකෙක, තෙතිසෙ (33) කැයි සිත් දෙක දෙකෙහි තුන් පරිද්දෙකින් වේ.

13. තෙතිස් දෙතිස් දෙතිස්
එක්තිස් සිතැසි යුවළ වැ
සහේ කම් වැදැරී
විවා සිත් අට වනුයේ

සහේතුක කාමාවචර සිත් අටෙහි පිළිවෙලින් - තෙතිසෙක දෙතිස් දෙකෙක, එක් තිසෙකැයි දෙක දෙකහි තුන් පරිද්දෙකින් වේ.

14. එකුන් විසි අටළොස්
විසි එක් විසි විසි දෙවිසි
පසළොස් යි සිත් විදි
දොළොස් අකුසල් සිත් ලදි

දොළොස් අකුසල් සිත්හි ක්‍රමයෙන් එකුන් විස්සෙක, අටළොසෙක, විස්සෙක, එක් විස්සෙක, දෙවිස්සෙක, පසළොසකැයි සත් පරිද්දෙකින් වේ.

15. අන් සමන් දස හා
සාධාරණ සතර යන
තුදුස් සිතැසී සියලුම
අකුසල් සිත්හි යෙදෙනේ

සියලු අකුසල් සිත්හි (ඡන්ද - පීති - අධිමොක්ෂ හැර) අන්‍ය සමාන දසයෙක් ද - අකුසල සාධාරණ සතරෙක් දැ යි තුදුස් චෛතසික වෙති.

16. දොළොස් එකොළොස් දස
සත් යයි අහේ සිත්වල
සිතැසී සිව් පරිද්දෙන්
යෙදෙන සැටි මේ පැවැසී

අටළොස් අහේතුක සිත්හි පිළිවෙලින් දොළොසෙක, එකොළොසෙක, දසයෙක, සතෙකැයි, සිව් අයුරෙකින් වේ.

# තුන්වන ප්‍රකීර්ණක පාදය.

**නමො භගවතො සම්බුද්ධස්ස.**

## 1. තෙපණස් සම්ප්‍රයුක්ත ධර්ම

1. චිත්තපාදයෙහි සිත් එකුන් අනූ (89) වෙක් හෝ එක්සිය එක් විස්සෙ (121) ක් දක්වන ලද්දේය. එසේ දැක්වුණේ හුදු සිතම එතෙක් ප්‍රභෙදයට ගිය නිසා නොවැ චිත්ත චෛතසිකයන්ගේ සම්බන්‍ධය නිසා ය. හුදු සිත වශයෙන් ගත් කල ඒ සියල්ලෙහි ම ඇතුළත් වූයේ ආරම්මණ විජානන (අරමුණ දැනගැනීම) ලක්‍ෂණයෙන් එක සිතෙක් ම ය. ජලය කෂාය සමූහයෙක යෙදුණේ නමුදු ජලය වශයෙන් ගන්නා කල එකක්ම වන්නාක් මෙනි. (**චිත්තපාද 2 වන පාඩමේ 1** බලනු.)

2. චෛතසික පාදයෙහි චෛතසික දෙපණසෙක් දක්වන ලද්දේය. එහි දු ඵස්සය එකුන් අනූ (89) සිත්හි යෙදෙන බැවින් එකුන් අනූ (89) වෙකැයි නොකිය යුතු. කොයි යෙදුණ ද ඵස්සය අරමුණුස්පර්ශ කිරීම් ලක්‍ෂණයෙන් එකෙක් ම ය. කොතඹුරු (කොත්තමල්ලි) කොයි කෂායයෙක යෙදුණද එක ම යි. වෙදනාදිය ද මෙසේය. මෝහය අකුසල සිත් දොළසෙහි (12) ම යෙදුනු දු අරමුණෙහි මුළාවන ලක්‍ෂණයෙන් එක ම ය. අහිරිකාදිය ද මෙසේ ය. සද්ධා ව එකුන්සැට (59) සොභන සිත්හි යෙදෙතු දු සද්දහන (ඇදහීම්) ලක්‍ෂණයෙන් එක ම ය. සති ආදිය ද මෙසේ යි.

3. මෙසේ අසූනව (89) යක් (සසම්ප්‍රයුක්ත) සිත්හි යෙදෙන සිත ස්වභාව ලක්‍ෂණ වශයෙන් එකෙක. එ පමණ ම (සසම්ප්‍රයුක්ත) සිත්හි යෙදෙන ඵස්සය ස්වභාව ලක්‍ෂණ වශයෙන් එකෙක. එසේ ම වේදනා ද එකෙකැ යි යනාදි වශයෙන් සම්ප්‍රයුක්ත ධර්මයෝ ස්වභාව වශයෙන් තෙපණස් (53) දෙනෙක් වෙත්. මෙහි සම්ප්‍රයුක්ත ධර්ම නම් එක් වැ යෙදෙන චිත්ත චෛතසිකයෝ ය. ඔව්හු චිත්ත පාදයෙහි දැක්වූ චිත්යන්ගේ වශයෙන් 1-**වෙදනා සංග්‍රහය, 2-හෙතු සංග්‍රහය, 3-කෘත්‍ය සංග්‍රහය, 4-ද්වාර සංග්‍රහය, 5-ආරම්මණ සංග්‍රහය, 6-වස්තු සංග්‍රහය** යි සංග්‍රහ සයකට බෙදා මතු දක්වනු ලැබෙත්.

### ප්‍රශ්න.

1. චිත්ත චෛතසික මුළුල්ල ස්වබාව වශයෙන් ගත් කල කෙතෙක් ද? කවරහු ද?
2. අසූනව (89) සිත් හා දෙපණස් චෛතසික තෙපණසෙ (53) ක වැටෙන සැටි දක්වනු.
3. සම්ප්‍රයුක්ත ධර්ම යනු කවරේ ද?
4. ඔව්හු කී ආකාරයකින් මෙහි දැක්වෙත් ද?
5. සංග්‍රහ සය දක්වනු.

## 2. වේදනා සංග්‍රහය.

1. වේදනාව චෛතසිකයක් බව යට දක්වන ලද්දේය. (**චෛතසික පාද 2 වන පාඩමේ 2** බලනු.) අරමුණ විඳ ගැනීම් ලක්‍ෂණයෙන් එය එකෙක් ම වුව ද විඳ ගැනීමේ ආකාර වශයෙන් **සුඛ වේදනාය. දුක්ඛ වේදනාය. අදුක්ඛමසුඛ වේදනාය** යි ත්‍රිවිධ වේ.

2. අරමුණ ඉෂ්ට වී නම් එය ගන්නා සිතෙහි යෙදෙන වේදනාව සුඛ වේ. අරමුණ අනිෂ්ට වී නම් ඒ ගන්නා සිතෙහි යෙදෙන වේදනාව දුක්ඛ වේ. අරමුණ මධ්‍යස්ථ වී නම් ඒ ගන්නා සිතෙහි යෙදෙන වේදනාව අදුක්ඛමසුඛ වේ. අදුක්ඛමසුඛ නම්, සුඛත් නො වන දුක්ඛත් නො වන බව යි. ආරම්මණයෙහි ඉෂ්ටානිෂ්ට මධ්‍යස්ථභාවය ස්වභාව වශයෙන් ද විය හැක. ස්වභාව ආරම්මණය පිළිබඳ ය. පරිකල්පය අරමුණ ගන්නා පිළිබඳ යි.

3. **සුඛ වේදනාය, දුක්ඛ වේදනාය, සෝමනස්ස වේදනාය, දෝමනස්ස වේදනාය, උපෙක්‍ෂා වේදනාය** යි වේදනාව පඤ්චවිධ ද වේ. මෙහි ලා සුඛ හා දුක්ඛ කායික වශයෙන් ද, සෝමනස්ස හා දෝමනස්ස මානසික වශයෙන් ද, උපෙක්‍ෂා උභය වශයෙන් ද, ගන්නා ලදි. මතු දැක්වෙන චිත්තවිභාග ක්‍රමයෙන් ඒ බැව් පැහැදිලි වේ.

මේ පංචවිධ වේදනා අතුරෙන් අසවල් අසවල් වේදනාව අසවල් අසවල් සිත්හි යෙදෙන්නේ ය යනු ඉක්බිති දක්වනු ලැබේ.

4. සුඛ වේදනාව එක ම සිතෙක-එ නම් සුඛ සහගත කුසල විපාක කායවිඤ්ඤාණ සිතෙහි යෙදෙන්නේ ය. (**චිත්තපාද 9 වන පාඩමේ 5** බලනු.)

5. දුක්ඛ වේදනාව ද එක ම සිතෙක- එ නම් දුක්ඛ සහගත අකුශල විපාක කාය විඤ්ඤාණ සිතෙහි යෙදේ. සුඛ දුක්ඛ කායික වශයෙන් ගන්නා ලදැ යි කීයේ මේ නිසා ය. සෙසු චක්‍ෂුරාදි විපාක විඤ්ඤාණ අටෙහි මෙන් මෙහි වේදනාව උපෙක්‍ෂා නොව සුඛ දුක්ඛ වීමේ හේතු යට දැක්විණි.

6. සෝමනස්ස වේදනාව සිත් දෙසැට (62) ක යෙදේ. එ නම් සෝමනස්ස සහගත ලෝභමූලික සතරය. (**චිත්තපාද 5 වන පාඩම** බලනු.) සෝමනස්ස සහගත සන්තීරණය, (**චිත්තපාද 9 වන පාඩමේ 7** බලනු.) සෝමනස්ස සහගත හසිතුප්පාය (**චිත්තපාද 10 වන පාඩමේ 3** බලනු.) සෝමනස්ස සහගත කාමාවචර සෝභන දොළොස ය (**චිත්තපාද 11, 12, 13 පාඩම්** බලනු.) මහග්ගත හා ලොකුත්තර වූ පඨමජ්ඣාන සිත් 11 ය, දුතියජ්ඣාන සිත් 11 ය, තතියජ්ඣාන සිත් 11 ය, චතුත්ථජ්ඣාන සිත් 11 ය යන මොහු යි. වේදනාව ධ්‍යානාඞ්ගයක් බැවින් සිත් මධ්‍යම පුඩු වශයෙන් ගිණූ බව සලකනු.

7. දෝමනස්ස වේදනාව සිත් දෙකෙක-එ නම් දෝමනස්ස සහගත පටිඝසම්පයුත්ත අකුසල සිත් දෙකෙහි යෙදෙන්නේ ය. (**චිත්තපාද 6 වන පාඩම** බලනු.)

8. උපෙක්‍ෂා වෙදනාව සිත් පස් පණසෙ (55) ක යෙදේ. එ නම්-උපෙක්‍ෂා සහගත අකුසල සය (6), (**චිත්තපාද 5, 7, පාඩම්**) උපෙක්‍ෂා සහගත අහේතුක තුදුස (14) ය, (**චිත්තපාද 8, 9, 10 පාඩම්** බලනු.) උපෙක්‍ෂා සහගත කාමාවචර සෝහන දොළොස ය. (**චිත්තපාද 11, 12, 13 පාඩම්** බලනු.) මහග්ගත හා ලොකුත්තර වූ පඤ්චමජ්ඣානික විසිතුනය. (**චිත්තපාද 23 වන පාඩම** බලනු.) යනු මොහුයි.

9. මේ දක්වන ලද්දේ වේදනා පඤ්චක ක්‍රමයට ය. ත්‍රික ක්‍රමයෙහි වනාහි සුඛය සෝමනස්සයට ද, දුක්ඛය දෝමනස්සයට ද ඇතුළත් කරනු. ත්‍රික ක්‍රමය **ධම්මසඞ්ගණියෙහි** ද, පඤ්චක ක්‍රමය **විභඞ්ග ඉන්ද්‍රියවිභඞ්ගයෙහි** ද ආයේ යි.

10. ඇතැම් තැනෙක සුඛ වේදනාය, දුක්ඛ වේදනාය යි වේදනාව විවිධ කොට ද දැක්විණි. එවිට උපෙක්ෂාව සුඛයෙහි ඇතුළත් වේ. "**උපෙක්‍ෂා පන සන්තත්තා සුඛ මිච්චෙව භාසිතා**" – "උපෙක්ෂාව ශාන්ත බැවින් සුඛ මැයි කියන ලදී" යනු එහි භාව යි. නැතහොත් නිරවද්‍ය උපෙක්ෂාව සුඛයෙහි ද, සාවද්‍ය උපෙක්ෂාව දුක්ඛයෙහි ද ඇතුළත් වේ.

11. සංස්කාරයන්ගේ අනිත්‍යතාවය සලකා සියලු වේදනා දුක්ඛ ය යි ද ඇතැම් තැනෙක වදාළහ. "**යංකිඤ්චි වෙදයිත මිදමෙත්‍ථ දුක්ඛස්ස**" – "යම් විඳගන්නා සුලු බවෙක් වේ නම් ඒ මෙහිලා දුක්ඛ සම්බන්ධ මැ යි" යනු එහි භාව යි.

***"සුඛං දුක්ඛමුපෙක්ඛාති තිවිධා තත්‍ථ වෙදනා**
**සොමනස්සං දෙමනස්ස මිති භෙදෙන පඤ්චධා.**
**සුඛමෙකත්‍ථ දුක්ඛං ච දෝමනස්සං ද්වයෙ ඨිතං**
**ද්වාසට්ඨීසු සොමනස්සං පඤ්චපණ්ණාසකෙතරා."**

සුඛය, දුක්ඛය, උපෙක්ෂාය යි වේදනාව ත්‍රිවිධ වේ. සුඛය දුක්ඛය, උපෙක්ෂාය, සෝමනස්සය, දෝමනස්සය යන භේදයෙන් පංචවිධ වේ. සුඛය එක් සිතෙක ය. දුක්ඛය ද එක් සිතෙක ය, දෝමනස්සය සිත් දෙකක ය, සෝමනස්සය සිත් දෙසැටක ය, උපෙක්ෂාව සිත් පස් පණසෙකැ යි දතයුතු. (විස්තර යට දැක්වුණු නියායෙන් දතහැකි.)

## ප්‍රශ්න.

1. වේදනාව කී වැදැරුම් ද? ඇති තාක් භෙද දක්වනු.

---

* සුව දුක් උවේ යන-බෙයින් වෙයින් වේ තෙ බේ
සොම්නස් දොම්නස් විසින්-වැළි ඒ පස් වැදැරුම්.
සුව දුක් එකෙකැ සිතැ-දොම්නස් සිත් දෙකෙකැ වේ.
සොම්නස දෙසැට සිත්හි-උවේ වේ පස්පණසෙකැ.

2. මෙහි සිත් බෙදුණේ කවර ප්‍රභේදයක ද?
3. සුඛවේදනා හා දුක්ඛවේදනා යෙදෙන සිත් දක්වනු.
4. සෝමනස්ස හා දෝමනස්ස වේදනා යෙදෙන සිත් දක්වනු.
5. උපෙක්‍ෂා වේදනා යෙදෙන සිත් කීය ද? කවරහු ද?

## 3. හෙතු සංග්‍රහය

1. හෙතු නම් ලෝභ, දෝස, මෝහ, අලෝභ, අදෝස, අමෝහ යන චෛතසික සය ය. අයහපත් වූ හෝ යහපත් වූ හෝ සිත යමෙකින් ස්ථිර වැ පිහිටා ගනී ද එය හේතුය යි කියනු ලැබේ. "**හිනොති-පතිට්ඨාති එතෙනාති හෙතු**" එතෙන, මේ කරණකොටගෙන; හිනොති, සේයි; පතිට්ඨාතී ති, පිහිටානුයි හෙතු-හෙතු නම් යනු එහි විග්‍රහ හා අර්ථ යි. වෘක්‍ෂයෙක ස්ථිර පැවැත්මට කාරණ වන්නේ මුල් ය. එමෙන් අකුසල කුසලාදි චිත්තයන්ගේ ස්ථිර පැවැත්මට කාරණ වන්නේ මේ චෛතසික සය ය. හේතු නැති හෙවත් අහේතුක සිත් ජල තලයෙහි සෙවෙල් මෙන් අස්ථිර ය. හේතු ඇති හෙවත් සහේතුක සිත් මුල් සහිත වෘක්‍ෂ මෙන් ස්ථිර ය. එසේත් එක හේතුවක් ඇති සිත එක මුලක් ඇති වෘක්‍ෂයක් මෙන් ද, හේතු දෙකක් ඇති හෙවත් ද්විහේතුක සිත මුල් දෙකක් ඇති වෘක්‍ෂය මෙන් ද ස්ථිර ය. හේතු තුනක් ඇති හෙවත් ත්‍රිහේතුක සිත මුල් තුනක් ඇති වෘක්‍ෂය මෙන් සුස්ථිර ය. සර්වාකාර සම්පූර්ණය යි දතයුතු.

2. මේ හේතු සය අතුරෙන් ලෝභ, දෝස, මෝහ අකුසල හේතු ය. මොව්හු අකුසල් සිත්හි විධි වූ පරිදි යෙදෙමින් ඒ අකුසල් ස්ථිර බවට පමුණුවති. අලෝභ, අදෝස, අමෝහ කුසල අව්‍යාකෘත හේතු ය. මොව්හු කුසලාදි සිත්හි යෙදෙමින් ඒ සිත් ස්ථිර බවට පමුණුවත්. (මොවුන්ගේ ආකාර **චෛතසික පාදයෙහි 4 වන, 5 වන පාඩම්වල බලනු.**) අකුසල හේතු කුසල අව්‍යාකෘත සිත්හි ද කුසල අව්‍යාකෘත හේතු අකුසල සිත්හි ද කිසිවිටෙක නො යෙදෙත්. අව්‍යාකෘත නම් මෙහි විපාක සිත් හා ක්‍රියා සිත් ය.

3. මොවුන් අතුරෙන් අසවල් අසවල් හේතු අසවල් අසවල් සිත්හි යෙදෙති යි ඉක්බිති දක්වනු ලැබේ. (**චිත්තපාදයෙහි සිත් 89 සිහි කරනු.**)

4. අකුසල විපාක සිත් සත ය. කුසල අහේතුක විපාක සිත් අට ය, අහේතුක ක්‍රියා සිත් තුන ය යන අටළොස් සිත්හි මේ එක හේතුවකු දු නො යෙදේ. එ හෙයින් ඔව්හු අහේතුක නම් වෙත්. **චිත්තපාද 8, 9, 10 වන පාඩම් ද, චෛතසික පාද 13 වන පාඩම ද බලනු.**)

5. මේ අහේතුක සිත් අටළොස හැර සෙසු එක් සැත්තෑ (71) සිත් සහේතුකයෝ ය. එක හේතුවකුදු යෙදීම සිත් සහේතුක වීමට පමණි. එහෙත් ඔවුන් අතුරෙන් ඇතැම් සිත්හි එක

හේතුවක් ද, ඇතැම් සිත්හි හේතු දෙකක් ද ඇතැම් සිත්හි හේතු තුනක් ද යෙදෙන බව දතයුතු. එහි විස්තරය මෙසේයි.

6. මොමූහ සිත් දෙක එකහේතුක ය. මොමූහ සිත් දෙක නම් දොළොස් අකුසල් අතුරෙන් අවසානයෙහි දැක්වූ විචිකිච්ඡා සම්පයුත්ත, උද්ධච්ච සම්පයුක්ත සිත් දෙකයි. (චිත්තපාද 7 වන පාඩම බලනු.) ඒ සිත් යුවළෙහි මෝහය පමණක් ඇත්තේ ය. ලෝභ, දෝස නැත්තේ ය. එහෙයින් එකහෙතුකත්වය යි.

7. සෙසු අකුසල සිත් දසය ද, ඥානවිප්‍රයුක්ත වූ කාමාවචර සෝභන සිත් දොළොස ද යන දෙවිසි සිත් ද්විහේතුකයෝ ය. සෙසු අකුසල සිත් දසය නම් ලෝභ මූලික අට හා දෝස මූලික දෙකය. ඔවුන් අතුරෙන් ලෝභ මූලික සිත් ලෝභ, මොහ ද, දෝස මූලික සිත් දෙකෙහි දෝස, මෝහ ද යෙදේ. (**චිත්තපාදයෙහි 5 වන 6 වන පාඩම් ද, චෛසිකපාදයෙහි 12 වන පාඩම ද** බලනු.) එහෙයින් මොව්හු අකුසල ද්විහේතුකයහ. ලෝභ, දෝස, මෝහ යන අකුසල් හේතු තුන ම එකවිට යෙදෙන සිත් හෙවත් ත්‍රිහේතුක අකුසල සිත් නැත් මැ යි.

ඥානවිප්‍රයුක්ත කාමාවචර සෝභන සිත් දොළොස නම් (**චිත්තපාදයෙහි 11 වන, 12 වන, 13 වන පාඩම්හි 3, 4, 7, 8 යන** අංකවලින්) දැක්වුණු සිත් ය. එහි අමෝහය හෙවත් ඥානය නො යෙදේ. අලෝභ, අදෝස, දෙක පමණක් යෙදේ. එහෙයින් ඔහු ද ද්විහේතුකයෝ ය. එසේත් කුසල ද්විහේතුක යෝ යි.

8. අහේතුක අටළොසය, එකහෙතුක දෙකය ද්විහෙතුක දෙවිස්සය යන දෙසාළිස හැර සෙසු සත්සාළිස (47) ත්‍රිහේතුකයෝ ය. ඔහු නම් ඥානසම්ප්‍රයුක්ත කාමාවචර කුසල විපාක ක්‍රියා දොළොසය, රූපාවචර පසළොසය, අරූපාවචර අටය යන මොහුයි. මේ සත්සාළිස් සිත්හි අලෝභ, අදෝස, අමෝහ යන හේතු ත්‍රිකය නිතොර වැ යෙදේ. එහෙයින් ඔහු ත්‍රිහේතුකයෝ යි. එහි දු කුසල සිත් කුසල ත්‍රිහේතුකයෝ ය. විපාක හා ක්‍රියා අව්‍යාකෘත ත්‍රිහේතුකයෝ යි.

9. මේ හේතු මැ **පට්ඨානයෙහි** සූවිසි ප්‍රත්‍යයන් අතුරෙන් හේතු ප්‍රත්‍යය වශයෙන් වදාළේය. "**හෙතුහෙතුසම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානං ච රූපානං හෙතු පච්චයෙන පච්චයො**" යි.

10. කුසල් අකුසල් ආදි සිත් කුසලාකුසලාදි වශයෙන් ස්ථිර වීමට මේ හේතු, හේතු වනු විනා කුසලාකුසලාදිවීමට හේතු නො වන බව දතයුතුයි.

***"ලොභො දොසො ච මොහො ච හෙතු අකුසලා තයො**

---

*ලොබ දොස් මෝ යයි-අකුසල් හේ තුනෙක් වේ.
අලොබ අදොස් අමෝ යයි-කුසල'වියත් ද තුනෙකි.

අහේ සිත් අටළොස්-එක් හේ සිත් දෙකෙක් වේ.

අලොභාදොසාමොහා ච කුසලාබ්‍යාකතා තථා.

.

අහෙතුකට්ඨාරසෙක හෙතුකා ද්වෙ දුවීසති.
ද්විහෙතුකා මතා සත්ත චත්තාලීස තිහෙතුකා”

ලෝභය, දෝසය, මෝහය යි අකුසල හේතු තුනෙකි. අලෝභය, අදෝසය, අමෝහය යි කුසල අව්‍යාකෘත හේතු ද තුනෙකි.

අහේතුක අටළොසෙකි. එකහේතුක දෙකෙකි. ද්විහේතුක දෙවිස්සෙකි. ත්‍රිහේතුක සත්සාළිසෙකි. (විස්තර යට දක්වන ලදී.)

**ප්‍රශ්න.**

1. හේතු කෙතෙක් ද? කවරහු ද? අර්ථ කිම?
2. හේතු රහිත සිත් කවරහු ද?
3. එකහේතුක ද්විහේතුක සිත් දක්වනු.
4. ත්‍රිහේතුක සිත් කෙතෙක් ද? කවරහු ද?
5. හේතු උපමාවකින් පැහැදිලි කරනු.

## 4. කෘත්‍ය සංග්‍රහය (පළමුවන කොටස)

චිත්ත පාදයෙහි දැක්වුණු සිත් එකුන් අනූ (89) වෙන් කෙරෙන කෘත්‍ය (වැඩ) තුදුසෙ (14) කි. එනම්, 1-ප්‍රතිසන්ධි කෘත්‍යය, 2-භවාඞ්ග කෘත්‍යය, 3-ආවර්ජන කෘත්‍යය, 4-දර්ශන කෘත්‍යය, 5-ශ්‍රවණ කෘත්‍යය, 6-ආඝ්‍රායණ කෘත්‍යය, 7-සායන කෘත්‍යය, 8-ඵුසන කෘත්‍යය, 9-සම්පටිච්ඡන කෘත්‍යය, 10-සන්තීරණ කෘත්‍යය, 11-වොත්ථපන කෘත්‍යය, 12-ජවන කෘත්‍යය, 13-තදාරම්මණ කෘත්‍යය, 14-චුති කෘත්‍යය යන මොහු යි.

කර්මාන්ත ශාලායෙක කම්කරුවන් 89 දෙනෙකුගෙන් කෙරෙන කර්මාන්ත 14 වන්නාක් මෙනි. කම්කරුවන් කීප දෙනෙකුගෙන් එක කර්මාන්තය කෙරෙත හැකි සේම සිත් කීපයකින් එක කෘත්‍යය ද කෙරෙත හැකිය. කරන කර්මාන්තයේ නම කම්කරුවාට ව්‍යවහාර කරන සේම කෙරෙන කෘත්‍යයේ නම ම ඇතැම් විට සිතට ද ව්‍යවහාර කරන්නේය. ප්‍රතිසන්ධිය කෙරෙන සිත්වලට ප්‍රතිසන්ධි සිත් යයි කියති. ප්‍රතිසන්ධි සිත් යයි සිත් කොටසෙක් **චිත්ත පාදයෙහි** නොදක්වන ලදී. එහි දැක්වුණු ඇතැම් සිත්වලින් ප්‍රතිසන්ධි කෘත්‍යය කෙරෙයි. ඔවුනට එබැවින් ප්‍රතිසන්ධි සිත් යයි කියත්. සෙස්ස ද මෙසේ යි.

---

දුහේ සිත් යළි දෙවිසි-තිහේ සිත් සත්සාළිස්.

1. භවයෙන් භවය ගැළපීම ප්‍රතිසන්ධි කෘත්‍යය. "**භවතො භවස්ස පටිසන්ධානං පටිසන්ධි කිච්චං**" යනු එහෙයින් කියන ලදි. එක් එක් සත්ත්වයකු පිළිබඳ වූ ම චිත්තසන්තතිය අනාදිමත් ය. එක් සිතක් ඉපිද-තිබී-නැති වීම සමග ම තවත් සිතක් ඉපිද-තිබී-නැතිවීම චිත්තසන්තතියේ ස්වභාව යි. සිත නැතිවීමේ හා ඉපදීමේ ක්‍රමය ඉතා සූක්‍ෂම බැවින් එහි වෙනස දත නොහැකි වේ. ගිණි පෙණෙල්ල වේගයෙන් භ්‍රමණය කරන විට අතර නො දත හැකි මෙනි. මෙසේ ක්‍ෂණ ක්‍ෂණයෙහි ඇති වැ නැති වැ යන චිත්තසන්තතිය එක් භවයෙක සම්බන්‍ධය සිඳී දෙවන භවයෙක සම්බන්‍ධය ගැන්ම විශේෂ වෙනසෙකි. එහි ලා දෙවන භවය පිළිබඳ වැ පළමුව ඇතිවන සිත ප්‍රතිසන්ධි සිත යි. එය ප්‍රථම භවය හා දෙවන භවය ගළපන හෙයින් එ නමින් ව්‍යවහාර කරනු ලැබේ. ඒ සිතෙන් කෙරෙන කෘත්‍යය ප්‍රතිසන්ධි කෘත්‍යය යි. **ප්‍රතිසන්ධි කෘත්‍යය කෙරෙන සිත් එකුන් විස්සෙ (19) ක් ය.** (ඒ හා අවශේෂ කෘත්‍ය කෙරෙන සිත් ද සවන පාඩමේ දක්වනු ලැබේ.)

2. චිත්තසන්තතිය නො සිඳී පැවැත්මට හේතු වශයෙන් භවයට අඞ්ග වීම භවාඞ්ග කෘත්‍යය. "**අවිච්ඡේදප්ප වත්තිහෙතු භාවෙන භවස්ස අඞ්ගභාවො භවඞ්ගකිච්චං**" යනු එහයින් කියන ලදි. සිතට අරමුණු නගන ද්වාර සයෙකි. චක්‍ෂුරාදි ඒ ද්වාර සයෙන් සිත යම් විටෙක අරමුණු නොගෙන පවත්නේ ද එවිට සිත භවාඞ්ග කෘත්‍ය කෙරේ යයි කියනු ලැබේ. නොයකේ දිගට නූල් ඇදගෙන මකුළුවා මැදට වී නිසල වැ සිටින්නේ ය. නූලක සතකු රැඳුණු කල ඌ වහා ඒ කරා දුවයි. නූලක සතකු නො රැඳුන හොත් ඌ එහි මැ නිසල වැ සිටින්නේ ය. මෙ ද එබඳු යයි සැලකිය යුතු. භවාඞ්ග සිතට ද අරමුණු ඇත්තේ ය. එහෙත් ඒ ද්වාර විමුක්ත යි. **භවාඞ්ග කෘත්‍යය කෙරෙන සිත් ද එකුන් විස්සෙ (19) කි.**

3. ආවර්ජන කෘත්‍යය නම්, ආභොග කිරීම ය හෙවත් පරීක්‍ෂා කොට බැල්ම ය. නූලක සතකු රැඳුනු කල මකුළුවා සෙලවුම් කයි. එවිට ඌ මේ කවර දිගකින් වී දැයි පරීක්‍ෂා කොට බලයි. මේ එබඳු ය යි දතයුතු. **ආවර්ජන කෘත්‍යය කෙරෙන සිත් දෙකෙකි.**

4. දර්ශන කෘත්‍යය නම්, රූපාරම්මණය දැකීම ය. **දර්ශන කෘත්‍යය කෙරෙන සිත් දෙකෙකි.**

5. ශ්‍රවණ කෘත්‍යය නම්, ශබ්දාරම්මණය ඇසීම ය. **ශ්‍රවණ කෘත්‍යය කෙරෙන සිත් දෙකෙකි.**

6. ඝායන කෘත්‍යය නම්, ගන්‍ධාරම්මණ ආඝ්‍රාණය කිරීම ය. **ඝායන කෘත්‍යය කෙරෙන සිත් දෙකෙකි.**

7. සායන කෘත්‍යය නම්, රසාරම්මණ ආස්වාදන කිරීම ය. **සායන කෘත්‍යය කෙරෙන සිත් දෙකෙකි.**

8. ඵුසන කෘත්‍යය නම්, ඵොට්ඨබ්බාරම්මණ ස්පර්ශ කිරීම ය. **ඵුසන කෘත්‍යය කෙරෙන සිත් දෙකෙකි.**

9. සම්පටිච්ඡන කෘත්‍යය නම්, රූපාරම්මණාදීන් පිළිගැන්ම ය. **සම්පටිච්ඡන කෘත්‍යය කෙරෙන සිත් ද දෙකෙකි.**

10. සන්තීරණ කෘත්‍යය නම්, රූපාරම්මණාදීන් තීරණය කිරීම ය. **සන්තීරණ කෘත්‍යය කෙරෙන සිත් තුනෙකි.**

11. වොත්ථපන කෘත්‍යය නම්, රූපාරම්මණාදීන් ව්‍යවස්ථා කිරීම ය. (මෙය ආවර්ජන විශේෂයකි.) **වොත්ථපන කෘත්‍යය කෙරෙන සිත් එකෙකි.**

12. ජවන කෘත්‍යය නම්, කුශලාකුශලාදී වූ ඒ ඒ කෘත්‍ය සිද්ධ කිරීම් වශයෙන් සිත ආරම්මණයෙහි නොයෙක් වර දිවැ දිවැ මෙන් පැවැත්ම ය. **ජවන කෘත්‍යය කෙරෙන සිත් පස් පණසෙ (55) කි.**

13. තදාරම්මණ කෘත්‍යය නම්, ජවන විසින් ගත් අරමුණ ම ගෙන සිටීමය. **තදාරම්මණ කෘත්‍යය කෙරෙන සිත් එකොළොස (11) කි.**

14. චුති කෘත්‍යය නම් එක් භවයක් සම්බන්‍ධ චිත්ත සන්තතිය ගිලිහී යාමය. **චුති කෘත්‍යය කෙරෙන සිත් ද එකුන් විස්සෙ (19) කි.**

ප්‍රතිසන්‍ධි, භවාඞ්ග, ච්‍යුති කෘත්‍ය කෙරෙන්නේ එක ම සිත් වලිනි. යම් සිතකින් ප්‍රතිසන්‍ධි විණි නම් එය ම සදොරින් අරමුණු නො ගන්නා කල භවාඞ්ග වශයෙන් පැවැත අවසන්හි ච්‍යුති වේ.

**ප්‍රශ්න.**

1. සිත්වලින් කෙරෙන කෘත්‍ය කෙතෙක් ද? කවරහු ද?
2. ප්‍රතිසන්‍ධි, භවාඞ්ග, ච්‍යුති පැහැදිලි කරනු. ඒ කෘත්‍ය කෙරෙන සිත් කෙතෙක් ද?
3. ආවර්ජන, වොත්ථපන කෘත්‍ය ලක්‍ෂණ දක්වනු.
4. දස්සන, සවණ, ඝායන, සායන, ඵුසන කෘත්‍ය පැහැදිලි කරනු.
5. ජවන, තදාරම්මණ යනු කිම? ඒ කෘත්‍ය කෙරෙන සිත් කෙතෙක් ද?

## 5. කෘත්‍ය සංග්‍රහය (දෙවන කොටස)

ප්‍රතිසන්ධ්‍යාදි කෘත්‍යයන් ප්‍රකට වශයෙන් දැනගැන්ම සඳහා ඔවුන් පිළිබඳ ස්ථාන ද මෙවිට ම දක්වනු ලැබේ. දෙපස ඉම් දැක්වීමෙන් මධ්‍යය අවබෝධ කරගැන්ම පහසුය. ස්ථාන වනාහි 1-ප්‍රතිසන්ධි ස්ථානය, 2-භවාඞ්ග ස්ථානය, 3-ආවර්ජන ස්ථානය, 4-

පඤ්චවිඤ්ඤාණස්ථානය, 5-සම්පටිච්ඡන ස්ථානය, 6-සන්තීරණ ස්ථානය, 7-වොට්ඨපන ස්ථානය, 8-ජවන ස්ථානය, 9-තදාරම්මණ ස්ථානය, 10-චුති ස්ථානය යි දශවිධ වේ.

ස්ථාන නම්, ඒ ඒ සිත් පිහිටීමට තැන් ය. ස්ථානය යි කීමෙන් ඒ ඒ කෘත්‍ය කෙරෙන සිත් අනිකෙක, ස්ථාන අනිකෙකැ යි නො සිතිය යුතු ය. පෙතැල්ලේ බෝනික්කාගේ රූපය යි කී කල පෙතැල්ල අනිකෙක, රූපය අනිකෙකැ යි නොගන්නා මෙනි. අවබෝධයෙහි පහසුව සඳහා මෙසේ දක්වනු ලැබේ.

1. ප්‍රතිසන්ධි ස්ථාන නම්, ප්‍රතිසන්ධි වන සිත් පිහිටීමට තැන් ය. ඒ වනාහි චුතියට ද භවාඞ්ගයට ද අතර වේ. ප්‍රතිසන්‍ධියට මුලින් ඇත්තේ චුති ය. ප්‍රතිසන්ධියට අනතුරුව ඇත්තේ භවාඞ්ග ය. එබැවින් චුති භවාඞ්ග දෙකට අතර ප්‍රතිසන්ධි ස්ථාන යි. ප්‍රතිසන්ධියට අනතුරු වැ භවාඞ්ග සිත් කීපයක් ඇතිවීම ස්වභාවයෙකි.

2. භවාඞ්ග ස්ථාන නම්, භවාඞ්ග වන සිත් පිහිටීමට තැන් ය. ඒ වනාහි ප්‍රතිසන්ධි, ආවර්ජන දෙකට අතර ද, ජවන, ආවර්ජන දෙකට අතර ද, තදාරම්මණ, ආවර්ජන දෙකට අතර ද, වොට්ඨපන, ආවර්ජන දෙකට අතර ද කිසි විටෙක ජවන, චුති දෙකට අතර ද තදාරම්මණ, චුති දෙකට අතර ද වේ. ප්‍රතිසන්ධියට අනතුරුවැ භවාඞ්ගය ද, භවාඞ්ගයට අනතුරු වැ ආවර්ජන දෙකින් එකක් ද වේ. එ බැවින් ප්‍රතිසන්‍ධි, ආවර්ජන දෙකට අතර භවාඞ්ගස්ථාන යි. සෙසු ස්ථාන වනාහි වීථි පාදයෙහි ද පැහැදිලි වන්නේ ය. මෙහි දැක්වුව ද දුර්බොධ යි.

3. ආවර්ජන ස්ථාන නම්, ආවර්ජන සිත් පිහිටීමට තැන් ය. ආවර්ජන සිත් පඤ්චද්වාරාවර්ජනය, මනොද්වාරා වර්ජනයයි විවිධ වේ. භවාඞ්ග පඤ්චවිඤ්ඤාණයන්ට අතර පඤ්ච ද්වාරාවර්ජන ස්ථාන ය. භවාං ්ග ජවනයන්ට අතර මනෝද්වාරාවර්ජන ස්ථාන යි.

4. පඤ්ච විඤ්ඤාණ ස්ථාන නම්, චක්ඛුවිඤ්ඤාණ සිත් දෙක ද, සොතවිඤ්ඤාණ සිත් දෙක ද, ඝාණවිඤ්ඤාණ සිත් දෙක ද, ජිව්හාවිඤ්ඤාණ සිත් දෙක ද, කාය විඤ්ඤාණ සිත් දෙක ද පිහිටන තැන් ය. ඒ වනාහි ඒ ඒ චිත්ත වීථීන්හි පඤ්චද්වාරාවර්ජන සම්පටිච්ඡන සිත් දෙකට අතර ද වේ.

5. සම්පටිච්ඡන ස්ථාන නම්, සම්පටිච්ඡන සිත් දෙක පිහිටීමට තැන් ය. ඒ වනාහි පඤ්චවිඤ්ඤාණ, සන්තීරණ සිත්වලට අතර වේ. පඤ්ච විඤ්ඤාණයන්ට අනතුරු වැ සම්පටිච්ඡනය ද, සම්පටිච්ඡනයට අනතුරු වැ සන්තීරණය ද උපදී. එබැවින් පඤ්ච විඤ්ඤාණ, සන්තීරණයන්ට අතර සම්පටිච්ඡන යි.

6. සන්තීරණ ස්ථාන නම්, සන්තීරණ සිත් පිහිටීමට තැන් ය. ඒ වනාහි සම්පටිච්ඡන, වොට්ඨපන සිත්වලට අතර වේ. සම්පටිච්ඡනයට අනතුරු වැ සන්තීරණය ද සන්තීරණයට අනතුරු වැ වොට්ඨපනය ද පඤ්චද්වාරික වීථීන් හි උපදින බැවිනි.

7. වොත්ථපන ස්ථාන නම්, වොත්ථපන සිත පිහිටීමට තැන් ය (මනොද්වාරාවර්ජනය ම පඤ්චද්වාරයෙහි වොත්ථපන කෘත්‍යය සිද්ධ කරන බව දතයුතු.) ඒ වනාහි සන්තීරණ ජවනයන්ට ද, සන්තීරණ භවාඞ්ගයන්ට ද අතර වේ. **වීථි පාදයෙහි** දී සුබොධ වන්නේය.

8. ජවන ස්ථාන නම්, **ජවන කෘත්‍යය කෙරෙන සිත් පස් පණස (55) පිහිටීමට තැන් ය.** ඒ වනාහි වොත්ථපන තදාරම්මණයන්ට ද, වොත්ථපන භවාඞ්ගයන්ට ද, වොත්ථපන චුතීන්ට ද, මනොද්වාරාවර්ජන තදාරම්මණයන්ට ද, මනොද්වාරාවර්ජන භවාඞ්ගයන්ට ද, මනොද්වාරාවර්ජන චුතීන්ට ද අතර වේ. විස්තර **වීථි පාදයෙහිය.**

9. **තදරම්මණ** ස්ථාන නම්, **තදරම්මණ කෘත්‍යය කෙරෙන සිත් එකොළොස පිහිටීමට තැන්ය.** ඒ වනාහි ජවන භවාඞ්ගයන්ටද, ජවන චුතීන්ට ද අතර වේ. ජවනයන්ට අනතුරු වැ තදාරම්මණ ද, තදාරම්මණයන්ට අනතුරු වැ භවාඞ්ග ද වේ. එබැවින් ජවන භවාඞ්ග අතර තදාරම්මණ යි. එසේ ම ඇතැම් විට ජවනයන්ට අනතුරු වැ තදාරම්මණ ද තදාරම්මණයන්ට අනතුරු වැ චුති ද වේ. එවිට ජවන චුතීන්ට අතර තදාරම්මණ යි.

10. **චුති ස්ථාන නම්, ච්‍යුති කෘත්‍යය කෙරෙන සිත් එකුන් විස්ස (19) පිහිටන තැන් ය.** ඒ වනාහි ජවන ප්‍රතිසන්ධීන්ට ද, තදාරම්මණ ප්‍රතිසන්ධීන්ට ද, භවාඞ්ග ප්‍රතිසන්ධීන්ට ද අතර වේ. ඇතැම්විට ජවනයට අනතුරු වැ චුති වේ. ඇතැම් විට තදාරම්මණයන්ට අනතුරු වැ චුති වේ. ඇතැම් විට භවාඞ්ග ද වී චුති වේ. මේ ක්‍රම **වීථි පාදයෙහි** පැහැදිලි වන්නේයි.

**ප්‍රශ්න.**

1. ස්ථාන කෙතෙක් ද? කවරහු ද?
2. අසවල් අසවල් සිත් අසවල් අසවල් සිත්වලට අතර ය යි දක්වනු.
3. ප්‍රතිසන්ධිචිත්තය, ප්‍රතිසන්ධි කෘත්‍යය, ප්‍රතිසන්ධිස්ථානය යන මොවුන්ගේ භේදය හෝ අභේදය දක්වනු.
4. පඤ්චවිඤ්ඤාණ ස්ථාන නමින් කෙතෙක් ගැනෙත් ද? කවරහු ද?
5. ස්ථාන පැහැදිලි වශයෙන් දතහැක්කේ කො තැන්හි ද?

## 6. කෘත්‍ය සංග්‍රහය. (තෙවන කොටස)

ප්‍රතිසන්ධ්‍යාදි කෘත්‍යයන්ගේ ආකාර ද, මෙතෙක් මෙතෙක් සිත් ප්‍රතිසන්ධ්‍යාදි කෘත්‍ය කෙරෙතී ද යට දක්වන ලදී. ඒ ප්‍රතිසන්ධ්‍යාදි කෘත්‍ය කෙරෙන සිත් මේ මේ යයි චිත්තයන්ගේ නම් වශයෙන් ම මෙහි දක්වනු ලැබේ.

1. ප්‍රතිසන්ධි කෘත්‍යය කෙරෙන සිත් එකුන්විස්සෙ (19) කි. ඵ නම්, උපෙක්ඛා සහගත සන්තීරණ දෙකය, මහා විපාක අටය, රූපාවචර විපාක පසය. අරූපාවචර විපාක සතරය යන මොහු යි.

උපෙක්ඛා සහගත සන්තීරණ දෙක නම්, අකුසල විපාක උපෙක්ඛා සහගත සන්තීරණය (චිත්තපාද 8 වන පාඩමේ 7 බලනු.) හා කුසල අහේතුක විපාක උපෙක්ඛා සහගත සන්තීරණ ය යි. (චිත්තපාද 9 වන පාඩමේ 8 බලනු.)

2. දොළොස් අකුසල් සිත් අතුරෙන් උපෙක්ඛා සහගත උද්ධච්ච සිත හැර අවශේෂ අකුසල සිත් එකොළොසට ප්‍රතිසන්ධි විපාක ලැබේ. එසේ ප්‍රතිසන්ධි විපාක වශයෙන් නරක, තිරිසන්, ප්‍රේත, අසුර යන සතර අපාය අතුරෙන් යම් අපායෙක ඒ භවයෙහි චුතියට අනතුරු වැ ලැබෙන්නේ මේ උපෙක්ඛා සහගත සන්තීරණ සිත යි. එයින් ප්‍රතිසන්ධි කෘත්‍ය කෙරේ යනු දු මේ මැයි. දෙවියෙකුගේ හෝ බ්‍රහ්මයෙකුගේ කිසි මෙහෙයීමක් නැති වැ හුදු අකුශල චිත්තශක්තියෙන් ම ඒ අකුශලය කළ පුද්ගලයා අපායට පැමිණේ යනු මෙහි නිශ්චය යි. සෙසු තන්හි දු මෙසේයි.

3. කාමාවචර කුසල් අට අතුරෙහි ද්විහේතුක ඕමක (=ලාමක) කුසල්වල ප්‍රතිසන්ධි විපාක නම්, කුශල විපාක උපෙක්ඛා සහගත සන්තීරණය යි. එය මනුෂ්‍ය ලෝකයෙහි ජාත්‍යන්ධ ජාතිබධිරාදීන්ගේ වශයෙන් පහළ වේ. ද්විහේතුක ඕමක කුසල් නම්, පූර්ව මුඤ්චන අපර එක සේ නො ලැබෙන සෝමනස්ස සහගත ඥානවිප්පයුත්ත අසංඛාර සසංකාර සිත් දෙක හා උපෙක්ඛා සහගත ඤාණවිප්පයුත්ත අසංඛාර සසංඛාර සිත් දෙක ද යන කුසල සිත් සතර යි.

4. මහාවිපාක අට නම්, (චිත්තපාද 12 වන පාඩමේ දැක්වුණු) කාමාවචර සහේතුක විපාක සිත් අටය. ඔව්හු ප්‍රතිසන්ධි වශයෙන් ලැබෙන ක්‍රමය සැකෙවින් මෙසේ දත යුතු ය. ත්‍රිහේතුක උත්කෘෂ්ට කුශලයන්ට ත්‍රිහේතුක විපාක සිත් සතර ප්‍රතිසන්ධි වශයෙන් දක්නට ලැබේ. ත්‍රිහේතුකවැ උත්කෘෂ්ට වීම නම්, ඥාන සම්ප්‍රයුක්ත කාමාවචර කුසල සිත් සතර පූර්ව මුඤ්චන අපර වශයෙන් එක සේ ලැබීම ය. ත්‍රිහේතුක විපාක සිත් සතර නම් යට කී ඥාන සම්ප්‍රයුක්ත කාමාවචර විපාක සතර යි.

5. ත්‍රිහේතුක ඕමක කුශලයන්ට හා ද්වි හේතුක උත්කෘෂ්ට කුශලයන්ට ද්විහේතුක විපාක සිත් සතර ප්‍රතිසන්ධි වශයෙන් ලැබේ. ත්‍රිහේතුක වැ ඕමක වීම නම්, යට දැක්වුණු ඤාණ සම්ප්‍රයුක්ත කුසල සිත් සතර මුඤ්චන වශයෙන් පැවැත පූර්ව අපර වශයෙන් නො පැවැතීමයි. හෙවත් කුශලය කරන මොහෙතෙහි ඥාන සම්ප්‍රයුක්ත වැ පූර්ව අපරයෙහි ඥාන විප්‍රයුක්ත වීමයි. ද්විහේතුක විපාක නම්, යට දැක්වුණු විපාක අට අතුරෙන් ඤාණ විප්පයුත් විපාක සිත් සතර යි.

6. ද්විහේතුක ඕමක කුශලයන්ට අහේතුක විපාකය ලැබෙන සැටි යට දක්වන ලද්දේ යි.

7. රූපාවචර කුසල සිත් පසට රූපාවචර විපාක පස යථා ක්‍රමයෙන් විපාක වශයෙන් ලැබේ.

8. රූපාවචර කුසල සිත් සතරට අරූපාවචර විපාක සිත් සතර යථාක්‍රමයෙන් ලැබේ. මේ පිළිබඳ විශේෂ විස්තර මතු ප්‍රකාශ වන බැව් දත යුතු යි.

9. **භවාඞ්ග කෘත්‍යය කෙරෙන සිත් ද එකුන් විස්සෙකි.** යම් සිතකින් ප්‍රතිසන්ධි විණි නම් ඒ සිත ම සදොරින් අරමුණු නො ගන්නා ලද භවාඞ්ග වේ. එබැවින් ප්‍රතිසන්ධි කෘත්‍යය කෙරෙන සිත් එකුන් විස්සෙන් (19) ම භවාඞ්ග කෘත්‍යය ද කෙරෙන බැව් දත යුතු යි.

ප්‍රශ්න.

1. ප්‍රතිසන්ධි කෘත්‍යය කෙරෙන සිත් 19 දක්වනු.
2. භවාඞ්ග කෘත්‍යය කෙරෙන සිත් 19 දක්වනු.
3. අසවල් අසවල් සිත්වලට අසවල් අසවල් සිත් ප්‍රතිසන්ධි වශයෙන් ලැබේ යයි පැහැදිලි කරනු.
4. කුශල-ත්‍රිහේතුක උත්කෘෂ්ට හා ත්‍රිහේතුක ඔමක වන සැටි කෙසේ ද?
5. ප්‍රතිසන්ධි, භවාඞ්ග කර්ම ද? විපාක ද? උත්තරයට හේතු දක්වා පැහැදිලි කරනු.

## 7. කෘත්‍ය සංග්‍රහය. (සතරවන කොටස)

10. **ආවර්ජන කෘත්‍යය කෙරෙන සිත් දෙකෙකි.** එ නම් පඤ්චද්වාරාවර්ජනය හා මනොද්වාරාවර්ජනය යි.

සිත සදොරින් අරමුණු නොගන්නා කල භවාඞ්ගය යි කියන ලදි. එවිට සිත නොයෙක් දිගට නූල් ඇදගෙන ඒ මැදට වී නිසල වැ සිටිනා මකුළුවකු මෙනි. චක්‍ෂුරාදී පංචද්වාර අතුරෙන් යම් ද්වාරයෙක අරමුණක් හැපුණු විට ඒ භවාඞ්ගය චලන වේ. එවිට ම භවාඞ්ග උපච්ඡේද ද වේ. නූලක සතකු රැඳුණු විට මකුළුවා සැලෙන්නාක් මෙනි. ඌ අවදි වූවක් මෙනි. ඒ ඇසිල්ලෙහි ම මේ කවර දොරකින් අරමුණ හැපුණේ දෝ හෝයි පිරික්සා බලන සිතෙක් උපදී. එය **පඤ්චද්වාරාවර්ජන** චිත්තය යි. මකුළුවා කවර නූලෙක සතා රැඳුණේ දැයි පිරික්සා බලන්නාක් මෙනි.

ධම්මාරම්මණයක් සිතට අරමුණු වූ විට පෙර සේම භවාඞ්ග සන්තතිය සැලී සිඳී මනෝද්වාරාවර්ජන චිත්තය උපදී. (පංචද්වාරාවර්ජන වීථියෙහි මේ ම වොත්ථපන නාමයෙන් ප්‍රකාශ වන බැව් දත යුතු යි.)

11. **දර්ශන කෘත්‍යය කෙරෙන සිත් දෙකෙකි.** එනම් අකුසල විපාක චක්ඛු විඤ්ඤාණය හා කුසල අහේතුක විපාක චක්ඛු විඤ්ඤාණය යි. අනිෂ්ට රූපයක් චක්ෂුඃ ප්‍රාසාදයෙහි ගැටුණු විට භවාඞ්ග සන්තතිය සැලී සිඳී පඤ්චද්වාරා වර්ජනයට ඉක්බිති වැ අකුසල විපාක චක්ඛු විඤ්ඤාණය උපදී. එයින් දර්ශන කෘත්‍යය කෙරෙන්නේය. එසේ ම ඉෂ්ට රූපයක් චක්ෂුඃ ප්‍රසාදයෙහි ගැටුණු විට භවාඞ්ග සන්තතිය සැලී සිඳී පඤ්චද්වාරාවර්ජනයට අනතුරු වැ කුසල විපාක චක්ඛු විඤ්ඤාණය උපදී. එයින් ද දර්ශන කෘත්‍යය කෙරෙන්නේ යි.

12. **ශ්‍රවණ කෘත්‍යය කෙරෙන සිත් දෙකෙකි.** එනම්, අකුසල විපාක සොතවිඤ්ඤාණය හා කුසල අහේතුක විපාක සොතවිඤ්ඤාණය යි. අනිෂ්ට ශබ්දයක් ශ්‍රොත්‍ර ප්‍රසාදයෙහි ගැටුණු විට භවාඞ්ග සන්තතිය සැලී සිඳී පඤ්චද්වාරා වර්ජනය ඉපිද ඉක්බිති අකුසල විපාක සොතවිඤ්ඤාණය උපදී. එයින් ශ්‍රවණ කෘත්‍යය කෙරෙන්නේය. එසේ ම ඉෂ්ට ශබ්දයක් ශ්‍රොත්‍ර ප්‍රසාදයෙහි ගැටුණු විට භවාඞ්ග සන්තතිය සැලී සිඳී පඤ්චද්වාරාවර්ජනය ඉපිද ඉක්බිති කුසල විපාක සොත විඤ්ඤාණය උපදී. එයින් ද ශ්‍රවණ කෘත්‍යය කෙරෙන්නේ යි.

13. **ආඝ්‍රාණ කෘත්‍යය කෙරෙන සිත් දෙකෙකි.** එනම්, අකුසල විපාක ඝාණවිඤ්ඤාණය හා කුසල හේතුක විපාක ඝාණවිඤ්ඤාණය යි. අනිෂ්ට ගන්ධයක් ඝ්‍රාණ ප්‍රසාදයෙහි ගැටුණු විට භවාඞ්ග සන්තතිය ඇලී සිඳී පඤ්චද්වාරාවර්ජනය ඉපිද ඉක්බිති අකුසල විපාක ඝාණවිඤ්ඤාණය උපදී. එයින් ආඝ්‍රාණ කෘත්‍ය කෙරේ. එසේම ඉෂ්ට ගන්ධයක් ඝ්‍රාණ ප්‍රසාදයෙහි ගැටුණු විට භවාඞ්ග සන්තතිය සැලී සිඳී පඤ්චද්වාරාවර්ජන වැ ඉක්බිති කුසල විපාක ඝාණවිඤ්ඤාණය උපදී, එයින් ද ආඝ්‍රාණ කෘත්‍යය කෙරෙයි.

14. **සායන කෘත්‍යය කෙරෙන සිත් දෙකෙකි.** අනිෂ්ට හා ඉෂ්ට රසාරම්මණ ජිහ්වා ප්‍රසාදයෙහි ගැටුණු විට පෙර සේම භවාඞ්ග සන්තතිය සැලී සිඳී පඤ්චද්වාරාවර්ජන වැ අකුසල විපාක හා කුසල විපාක ජිව්හාවිඤ්ඤාණ සිත් දෙක උපදී. එයින් සායන කෘත්‍යය කෙරෙයි.

15. **ඵුසන කෘත්‍යය කෙරෙන සිත් දෙකෙකි.** එනම්, අකුසල විපාක කාය විඤ්ඤාණය හා කුසල විපාක කාය විඤ්ඤාණය යි. අනිෂ්ට හා ඉෂ්ට ස්ප්‍රෂ්ටව්‍ය කාය ප්‍රසාදයෙහි ගැටුණු විට භවාඞ්ග සන්තතිය සැලී සිඳී පඤ්චද්වාරාවර්ජන වැ අකුසල විපාක දුක්ඛ සහගත කාය විඤ්ඤාණය හා කුසල විපාක සුඛ සහගත කාය විඤ්ඤාණය උපදී. එයින් ස්පර්ශ කෘත්‍යය කෙරෙ යි.

16. **සම්පටිච්ඡන කෘත්‍යය කෙරෙන සිත් දෙකෙකි.** එනම්, අකුසල විපාක උපෙක්ඛා සහගත සම්පටිච්ඡන චිත්තය හා කුසල අහේතුක විපාක උපෙක්ඛා සහගත සම්පටිච්ඡන චිත්තය යි. ඒ චිත්ත වීථීන්හි චක්ඛුවිඤ්ඤාණ සෝතවිඤ්ඤාණාදි සිත්වලට අනතුරු වැ මේ සිත් දෙක උපදී. එයින් සම්පටිච්ඡන කෘත්‍යය කෙරෙයි.

17. **සන්තීරණ කෘත්‍යය කෙරෙන සිත් තුනෙකි.** එනම්, අකුසල විපාක උපෙක්ඛා සහගත සන්තීරණය ද කුසල අහේතුක විපාක සෝමනස්ස සහගත සන්තීරණය හා උපෙක්ඛා

සහගත සන්තීරණය යන මොහු යි. ඒ ඒ චිත්ත වීථීන්හි සම්පටිච්ඡනයට අනතුරු වැ මේ සිත් උපදී. ඔවුන්ගෙන් සන්තීරණ කෘත්‍යය කෙරෙයි. කුසල විපාකාවස්ථායෙහි දී අනිෂ්ටාරම්මණයෙහි සන්තීරණය සෝමනස්ස වන සැටි ද ඉෂ්ට මධ්‍යස්ථාරම්මණයෙහි උපෙක්ෂා සහගත වන සැටි ද යට කියන ලද මැයි.

18. **වොඤපන කෘත්‍යය කෙරෙන සිත් එකෙකි.** එ නම්, මනොද්වාරාවර්ජනය යි. මෙය පංචද්වාරයෙහි ලා වොඤපන නමින් ද, මනොද්වාරයෙහි ලා මනොද්වාරාවර්ජන නමින් ද පළ වේ. පඤ්චද්වාරයෙහි සන්තීරණයට අනතුරු වැ ද මනොද්වාරයෙහි භවාඞ්ගයට අනතුරු වැ ද උපදී.

19. **ජවන කෘත්‍යය කෙරෙන සිත් පස්පණසෙ (55) කි.** එනම් අකුසල සිත් 12 ය, සෝමනස්ස සහගත හසිතුප්පාදය, කාමාවචර කුසල් අට හා එම සහේතුක ක්‍රියා අටය, රූපාවචර කුසල පස හා එම ක්‍රියා පසය, අරූපාවචර කුසල සතර හා එම ක්‍රියා සතරය, ලෝකොත්තර කුසල සතර හා එම ඵල සතරය යන මොහු යි. පඤ්චද්වාරයෙහි වොඤපනයට අනතුරු වැ ද මනොද්වාරයෙහි මනොද්වාරාවර්ජනයට අනතුරු වැ ද මේ සිත් පහළ වේ. සියලු අකුසල් ද සියලු කුසල් ද ආවර්ජන දෙක හැර සෙසු සියලු ක්‍රියා ද ඵල සතර ද ජවන කෘත්‍ය කරන්නේය යි දතයුතු, විස්තර මතු පළ වේ.

20. **තදරම්මණ කෘත්‍යය කෙරෙන සිත් එකොළොසෙකි.** එනම් සන්තීරණත්‍රය හා කාමාවචර මහා විපාක අටය. මොව්හු අතිමහත්තාලම්බන චිත්ත වීථියෙහි ජවනයන්ට අනතුරු ව උපදිත්. විස්තර මතු පළ වේ.

21. **ච්‍යුති කෘත්‍යය කෙරෙන සිත් එකුන් විස්සෙ (19) කි.** යම් සිතකින් ප්‍රතිසන්ධි කෘත්‍යය විණි නම් ඒ සිතින් ම භවාඞ්ග කෘත්‍යය ද වන්නේ ය යි යට කියන ලදි. ඒ සිතින් ම චුති කෘත්‍යය ද වන බව මෙහි දී දත යුතු යි. එබැවින් ප්‍රතිසන්ධි කෘත්‍යය කෙරෙන සිත් එකුන් විස්සෙන් ම ච්‍යුති කෘත්‍යය ද කෙරෙන්නේ ය. ඒ සිතින් ම ය යි කී කල ඒ සමාන සිත් ගත යුතුයි. ඒ බෙහෙත ම දෙව යි කී කල ඒ සමාන බෙහෙත් ගන්නාක් මෙනි.

**වීථි පාදය** ඉගෙනීමෙන් මේ කෘත්‍ය පිළිබඳ විශේෂ අවබෝධයක් ලැබෙන බව සැලකිය යුතු යි.

### ප්‍රශ්න.

1. ආවර්ජන කෘත්‍ය කෙරෙන සිත් දෙක දක්වනු.
2. දස්සන, සවණ, ඝායන, සායන, ඵුසන, කෘත්‍ය කෙරෙන සිත් දක්වනු.
3. සන්තීරණ වොඤපන කෘත්‍ය කෙරෙන සිත් කවරහු ද?
4. ජවන සිත් 55 දක්වනු.
5. තදාලම්බන සිත් කීයද? කවරහු ද?

## 8. කෘත්‍ය සංග්‍රහය. (පස්වන කොටස)

එකුන් අනූ (89) සිත් වලින් තුදුස් කෘත්‍ය කෙරෙන සැටි යට දක්වන ලදි. ඔවුන් අතුරෙන් ඇතැම් සිත්වලින්/කෘත්‍ය **පසෙක්** ද, ඇතැම් සිත්වලින් කෘත්‍ය **සතරෙක්** ද? ඇතැම් සිත් වලින් කෘත්‍ය **තුනෙක්** ද, ඇතැම් සිත්වලින් කෘත්‍ය **දෙකෙක්** ද, ඇතැම් සිත්වලින් **එක එක** කෘත්‍යය ද සිද්ධ වේ. ඒ බැව් යට දක්වන නමු දු පැහැදිලි වශයෙන් මෙහි දු දක්වනු ලැබේ.

**1. උපෙක්ඛා සහගත සන්තීරණ සිත් දෙකින් ප්‍රතිසන්ධිය, භවාඞ්ගය, චුතිය, තදාරම්මණය, සන්තීරණය, යන කෘත්‍ය පසෙක් වන්නේ ය.**

ඒ එසේ මැ යි. මේ සිත් දෙකින් අකුසල් වලට හා ද්විහේතුක ඔමක කුසල්වලට ප්‍රතිසන්ධි විපාක වශයෙන් පවත්නා කල්හි ප්‍රතිසන්ධි කෘත්‍යය ද, ඒ පිළිසිඳ ගත් තැන් පටන් සදොරින් අරමුණු නො ගෙන චිත්ත සන්තතියේ අවිච්ඡේද ප්‍රවෘත්ති වශයෙන් පවත්නා කල්හි භවාඞ්ග කෘත්‍ය ද, අවසානයෙහි මරණ වශයෙන් පවත්නා කල්හි ච්‍යුති කෘත්‍යය ද, ඇතැම් තැනෙක ජවන විසින් ගත් අරමුණ ගන්නා කල්හි තදාලම්බන කෘත්‍ය ද පඤ්චද්වාරයෙහි සම්පටිච්ඡනයට අනතුරු වැ අරමුණ තීරණය කිරීම් වශයෙන් පවත්නා කල්හි සන්තීරණ කෘත්‍ය ද සිද්ධවන්නේ ය. මෙහි විශේෂ විභාග මතු පළ වේ.

**2. කාමාවචර සහේතුක විපාක සිත් අටෙන් ප්‍රතිසන්ධිය, භවාඞ්ගය, චුතිය, තදාරම්මණය යන කෘත්‍ය සතරෙක් වන්නේ ය.**

ඒ එසේ මැයි. කාමාවචර ත්‍රිහේතුක උත්කෘෂ්ටවූද ත්‍රිහේතුක ඔමක හා ද්විහේතුක උත්කෘෂ්ට වූ ද කුශලයන්ට ප්‍රතිසන්ධි විපාක වශයෙන් පවත්නා කල්හි ප්‍රතිසන්ධි කෘත්‍ය ද, ඒ භවයෙහි සදොරින් අරමුණු නොගන්නා කල්හි භවාඞ්ග කෘත්‍ය ද, අවසානයෙහි මරණ වශයෙන් පවත්නා කල්හි ච්‍යුති කෘත්‍ය ද, ජවන විසින් ගත් අරමුණ ම ගෙන සිටින කල්හි තදාරම්මණ කෘත්‍ය ද වන්නේ යි.

**3. මහග්ගත විපාක හෙවත් රූපාවචර අරූපාවචර විපාක සිත් නවයෙන් ප්‍රතිසන්ධි, භවාඞ්ග, චුති යන කෘත්‍ය තුනෙක් වන්නේ ය.** ඒ එසේ මැයි. ඔවුන්ගෙන් ඒ ඒ රූපාවචර අරූපාවචර භවයන්හි ප්‍රතිසන්ධි වශයෙන් පවත්නා කල්හි ප්‍රතිසන්ධි කෘත්‍ය ද, ද්වාරවලින් අරමුණු නොගෙන චිත්ත සන්තතියේ අවිච්ඡේද ප්‍රවෘත්ති වශයෙන් පවත්නා කල්හි භවාඞ්ග කෘත්‍ය ද අවසානයෙහි ච්‍යුති කෘත්‍ය ද වන්නේ යි.

**4. සෝමනස්ස සහගත සන්තීරණ චිත්තයෙන් සන්තීරණ, තදාලම්බන යන කෘත්‍ය දෙකෙක් වන්නේ ය.**

ඒ එසේ මැ යි එයින් පඤ්චද්වාරය පිළිබඳ අති ඉෂ්ටාලම්බනයෙහි සම්පටිච්ඡනයට අනතුරු ව ඒ අරමුණ ම තීරණය කිරීම් වශයෙන් පවත්නා කල්හි සන්තීරණ කෘත්‍යය

සිද්ධ වේ. ජවනාවසානයෙහි ජවන විසින් ගත් අරමුණ ගැනීම් වශයෙන් පවත්නා කල්හි තදාලම්බන කෘත්‍යය සිද්ධ වේ.

**5. මනොද්වාරාවර්ජන චිත්තයෙන් වොත්‍ථපනය, ආවර්ජනය යන කෘත්‍ය දෙකෙක් වන්නේ ය.**

පඤ්චද්වාරික වීථියෙහි සන්තීරණයට අනතුරු ව ඒ අරමුණ ම ව්‍යවස්ථා කිරීම් වශයෙන් වොත්‍ථපන කෘත්‍යය වේ. මනොද්වාරික වීථියෙහි භවාඞ්ග උපච්ඡේදයට අනතුරු වැ ආවර්ජන කෘත්‍ය වෙ යි.

6. සෙසු පස්පණස් (55) ජවන සිත්වලින් ද, මනොධාතුත්‍රික සඞ්ඛ්‍යාත වූ පඤ්චද්වාරාවර්ජන සම්පටිච්ඡන යුගල යන සිත් තුනින් ද, දෙපස් විඤ්ඤාණ සංඛ්‍යාත චක්ඛු විඤ්ඤාණ සිත් දෙකය, සොත විඤ්ඤාණ සිත් දෙකය, ඝාණ විඤ්ඤාණ සිත් දෙකය, ජිව්හා විඤ්ඤාණ සිත් දෙකය, කාය විඤ්ඤාණ සිත් දෙකය යන සිත් දසයෙන් ද එක එක කෘත්‍යය ම වන්නේ ය. ඒ එසේ මැ යි. ජවන සිත් පස් පණසින් ජවන කෘත්‍යය ම කෙරේ. පඤ්චද්වාරාවර්ජන චිත්තයෙන් ආවර්ජන කෘත්‍යය ම කෙරේ. සම්පටිච්ඡන සිත් දෙකින් සම්පටිච්ඡන කෘත්‍යය ම කෙරේ. චක්ඛු විඤ්ඤාණ සිත් දෙකින් දර්ශන කෘත්‍යය ම කෙරේ. සෝත විඤ්ඤාණ සිත් දෙකින් ශ්‍රවණ කෘත්‍යය ම කෙරේ. ඝාණ විඤ්ඤාණ සිත් දෙකින් ආඝ්‍රායන කෘත්‍යයම කෙරේ. ජිව්හා විඤ්ඤාණ සිත් දෙකින් ආස්වාදන කෘත්‍යය ම කෙරේ. කාය විඤ්ඤාණ සිත් දෙකින් ස්පර්ශ කෘත්‍යය ම කෙරේ.

***" පටිසන්ධාදයො නාම කිච්චභෙදෙන චුද්දස,**
**දසධා ඨාන භෙදෙන චිත්තුප්පාද පකාසිතා.**
**අට්ඨසට්ඨී තථා ද්වෙ ච නවාට්ඨ ද්වෙ යථාක්කමං,**
**එක ද්වි ති චතු පඤ්ච කිච්චට්ඨානානි නිද්දිසෙ".**

ප්‍රතිසන්ධ්‍යාදි වූ චිත්තොත්පාදයෝ කෘත්‍ය භේදයෙන් තුදුස් (14) විධ වන්නාහ. ස්ථාන භේදයෙන් දස (10) විධ වන්නාහ. එහි දු එක කෘත්‍ය කෙරෙන සිත් අටසැටෙ (68) ක. ද්වි කෘත්‍ය කෙරෙන සිත් දෙකෙක. ත්‍රි කෘත්‍ය කෙරෙන සිත් නවයෙක. චතු කෘත්‍ය කෙරෙන සිත් අටෙක. පංච කෘත්‍ය කෙරෙන සිත් දෙකෙක. යට දැක්වුණු ලෙසින් ගණන් බලා ගත යුතු යි.

## ප්‍රශ්න.

1. එක කෘත්‍යය කෙරෙන සිත් කෙතෙක් ද? කවරහු ද?
2. කෘත්‍ය දෙකක් කෙරෙන සිත් කෙතෙක් ද? කවරහු ද?

---

*පිළිසිඳ ඈ බෙයින් - තුදුස් විදි වේ සිත් කිසි,
දස විදි බෙයින් එහි - ගණන් පිළිවෙල මෙලෙසේ.
එක් කිසි අටසැට දෙ කිසි දෙ, තුන් කිසි නව,
සිව් කිසි අටෙක, පස් කිසි, නවයෙකැ යි මුළු දන්නේ.

3. කෘත්‍ය තුනක් කෙරෙන සිත් කෙතෙක් ද? කවරහු ද?
4. කෘත්‍ය සතරක් කෙරෙන සිත් කෙතෙක් ද? කවරහු ද?
5. කෘත්‍ය පසක් කෙරෙන සිත් කෙතෙක් ද? කවරහු ද?

## 9. ද්වාර සංග්‍රහය. (පළමුවන කොටස)

ද්වාර නම්, ඇතුළුවීමට හා පිටවීමට අවකාශ ඇති තැන් ය. මනොද්වාරාවර්ජනාදී වූ චිත්තයන්ගේ පැවැත්මට අවකාශ ඇති තැන් මෙහි ද්වාර යයි කියනු ලැබේ. ද්වාර වනාහි චක්ඛුද්වාරය, සොතද්වාරය, ඝාණද්වාරය, ජිව්හාද්වාරය, කායද්වාරය, මනොද්වාරය යි සවැදෑරුම් වේ.

1. **චක්ඛු** නම්, චක්ෂුඃප්‍රසාදය-හෙවත් ඇස් ගඩුව නිසා පවත්නා රූප දර්ශනයෙහි ශක්ති ඇති ස්ථානය. චක්ඛුව ම ද්වාර වූයේ චක්ඛුද්වාර යි.

2. **සොත** නම්, ශ්‍රොත්‍ර ප්‍රසාදය-හෙවත් කන්බිල තුළ රෝම කූපයක් නිසා පවත්නා ශබ්ද ශ්‍රවණයෙහි ශක්ති ඇති ස්ථානය. සොතය ම ද්වාර වූයේ සොතද්වාර යි.

3. **ඝාණ** නම්, ඝ්‍රාණ ප්‍රසාදය-හෙවත් නාසිකාව තුළ එළුකුර සටහනක් බඳු වූ ගැන්මේ ශක්ති ඇති ස්ථානය. ඝාණය ම ද්වාර වූයේ ඝාණද්වාර යි.

4. **ජිව්හා** නම්, ජිව්හා ප්‍රසාදය හෙවත්-දිව ඇසුරු කොට පවත්නා රස විඳ ගැන්මේ ශක්ති ඇති ස්ථානය. ජිව්හා ම ද්වාර වූයේ ජිව්හාද්වාර යි.

5. **කාය** නම්, කායද්වාරය-හෙවත් කෙස් ලොම් නිය අග් හා වියළී ගිය සම් කැබලි ආදි තැන් හැර, මුළු ශරීරය ඇසුරු කොටැ පවත්නා ස්පර්ශ විඳ ගැන්මේ ශක්ති ඇති ස්ථානය. කාය ම ද්වාර වූයේ කායද්වාර යි.

6. **මන** නම්, මෙහි භවාඞ්ග චිත්තය යි. හෙ ද සාමාන්‍ය භවාඞ්ගය ම නොවැ ආවර්ජනයට නැමීගත් භවාඞ්ගය යි. "**සාවජ්ජනං භවඞ්ගං තු මනොද්වාරංති වුච්චති**" යනු එහෙයින් කියන ලදි. මන ම ද්වාර වූයේ මනොද්වාර යි.

මේ එක් එක් ද්වාරයක් ඇසුරු කොටැ උපදනා සිත් මෙසේ දත යුතුයි.

7. පඤ්චද්වාරාවර්ජනය, චක්ඛු විඤ්ඤාණ ද්විකය, සම්පටිච්ඡන යුගලය, සන්තීරණ ත්‍රිකය, වොත්ථපනය, කාමාවචර ජවන එකුන්තිස (29) ය, තදාලම්බන අටය යන මේ සසාළිස් (46) සිත් චක්ඛුද්වාරයෙහි උපදනේ ය.

**පඤ්චද්වාරාවර්ජන නම්** චිත්තපාද 10 වන පාඩමේ දැක්වුණු පඤ්චද්වාරාවර්ජන සිතය. **චක්ඛුවිඤ්ඤාණ ද්වික නම්,** එහි 8 වන පාඩම්හි දැක්වුණු අකුශල විපාක හා කුශල අහේතුක විපාක චක්ඛු විඤ්ඤාණ සිත් දෙකය. **සම්පටිච්ඡන යුගල නම්,** එහි ම දැක්වුණු අකුශල විපාක හා කුශල අහේතුක විපාක සම්පටිච්ඡන යුවල ය. **සන්තීරණත්‍රික නම්,** එහි ම දැක්වුණු අකුසල විපාක උපෙක්ඛා සහගත සන්තීරණය හා කුසල අහේතුක විපාක සෝමනස්ස සහගත හා උපෙක්ඛා සහගත සන්තීරණ ද්විකය යන සන්තීරණ සිත් තුනය. **වොත්ථපන නම්,** අහේතුක ක්‍රියා සිතක් වූ මනොද්වාරාවර්ජනයයි. **කාමාවචර ජවන් එකුන්තිස (29) නම්,** අකුසල සිත් 12 ය. හසිතුප්පාදය, කාමාවචර කුසල් අට ය. එම සහේතුක ක්‍රියා අටය යන මොහු ය. තදාලම්බන (8) නම්, කාමාවචර සහේතුක විපාක සිත් අටය. සන්තීරණ ත්‍රිකය තදාලම්බන වතු දු එය සන්තීරණ වශයෙන් දැක්වුණු බැවින් මෙහි නොගන්නා ලදි. අගහිත ගහණ වශයෙන් ය. **අගහිත ගහණ නම්,** කලින් නොගත් දේ ම ගැන්ම යි. චක්ෂුඃ ප්‍රසාදයෙහි රූප ගැටුණු විට ඒ ඒ අවස්ථානුරූප වශයෙන් මේ සිත් සසාළිස (46) උපදින්නේ ය යි දත යුතු. **වීථි පාදය** උගත් කල ම ඒ බැව් පැහැදිලි වන්නේ යි.

8. පඤ්චද්වාරාවර්ජනය, සොතවිඤ්ඤාණ ද්විකය, සම්පටිච්ඡන යුගලය, සන්තීරණ ත්‍රිකය, වොත්ථපනය, කාමාවචර ජවන එකුන්තිස (29) ය, තදාලම්බන අටය යන සසාළිස් සිත් සොතද්වාරයෙහි උපදනේ ය. විශේෂය නම්, චක්ඛුවිඤ්ඤාණ ද්විකය වෙනුවට සොත විඤ්ඤාණ දෙසිත ඉපැද්ම පමණෙකි.

9. මෙසේ ම පඤ්චද්වාරාවර්ජනය, ඝාණවිඤ්ඤාණ ද්විකය, සම්පටිච්ඡන යුගලය, සන්තීරණ ත්‍රිකය, වොත්ථපනය, කාමාවචර ජවන එකුන්තිස (29) ය, තදාලම්බන අටය යන සසාළිස් සිත් ඝාණද්වාරයෙහි උපදනේ ය.

10. පඤ්චද්වාරාවර්ජනය, ජිව්හාවිඤ්ඤාණ ද්විකය, සම්පටිච්ඡන යුගලය, සන්තීරණ ත්‍රිකය, වොත්ථපනය, කාමාවචර ජවන එකුන්තිස (29) ය, තදාලම්බන අටය යන සසාළිස ජිව්හාද්වාරයෙහි උපදනේ ය.

11. පඤ්චද්වාරාවර්ජනය, කායවිඤ්ඤාණ ද්විකය. සම්පටිච්ඡන යුගලය, සන්තීරණ ත්‍රිකය, වොත්ථපනය, කාමාවචර ජවන එකුන්තිස (29) ය, තදාලම්බන අටය යන සසාළිස කායද්වාරයෙහි උපදනේ යි.

අගහිත ගහණ වශයෙන් ගත් කල පඤ්චද්වාරයෙහි උපදින සියලු සිත් සූපණසෙකැ (54) යි දත යුතුයි.

12. මනොද්වාරයෙහි වනාහි මනොද්වාරාවර්ජනය, පස් පණස් (55) ජවන් ය. තදාලම්බන එකොළොස (11) ය යන සිත් සත්සැට (67) උපදනේ ය. ජවන් පස්පණස (55) යට දක්වන ලදි. මෙහි සන්තීරණ ත්‍රිකය ද ලැබෙන බැවින් තදාලම්බන 11 ම ගැනිණි.

13. ප්‍රතිසන්ධි, භවාඞ්ග, ච්‍යුති සිත් එකුන්විස්ස (19) මේ එක ද්වාරයෙක ද නූපදනේ ය. එබැවින් ඔව්හු (ද්වාර) විමුක්ත නම් වෙත්. ප්‍රතිසන්ධි සිත් ම භවාඞ්ග ච්‍යුති වන සැටි යට දක්වන ලදී. මනොද්වාරය වන්නේ ආවර්ජනය නැමුණු භවාඞ්ගය යි. මොවුන් (ප්‍රතිසන්ධ්‍යාදි සිත්) චක්ෂුරාදිද්වාරයන්හි නූපදින බව යට දැක්වුණු ක්‍රමවලින් අවබෝධ කරගත හැකි යි.

ප්‍රශ්න.

1. ද්වාර නම් කිම? ඔහු කී වැදෑරුම් ද? කවරහු ද?
2. චක්ෂුද්වාරයෙහි උපදින සිත් කවරහු ද?
3. පඤ්චද්වාරයෙහි උපදින සිත් අගහිත ගහණ වශයෙන් දක්වනු.
4. මනොද්වාරයෙහි සිත් කෙතෙක් උපදිත් ද? කවරහු ද?
5. ද්වාරවිමුක්ත සිත් කෙතෙක් ද? කවරහු ද? ද්වාරවිමුක්ත නම් කිම?

## 10. ද්වාර සංග්‍රහය. (දෙවන කොටස)

ෂඩ්ද්වාර ද, ෂඩ්ද්වාරික සිත් ද, ද්වාරවිමුක්ත සිත් ද යට දක්වන ලද්දේ ය. ඔවුන් අතුරෙන් එක් එක් ද්වාරයෙහි වෙන් වෙන් වැ උපදින සිත් ද, ද්වාර පසෙක උපදින සිත් ද, ද්වාර සයෙහි ම උපදින සිත් ද, වරෙක ද්වාර සයෙහි උපදිමින් වරෙක ද්වාර විමුක්ත වන සිත් ද මේ කොටසෙහි දක්වනු ලැබේ.

1. පඤ්චවිඤ්ඤාණ සිත් දසය ද, මහග්ගත ජවන අටළොස (18) ද, ලොකුත්තර ජවන අට ද යන සතිස් (36) සිත් එක් එක් ද්වාරයෙහි ම උපදනේ ය.

ඒ එසේ මැයි. චක්ඛු විඤ්ඤාණ සිත් දෙක චක්ෂුර්ද්වාරයෙහි උපදී. අන් කිසි ද්වාරයෙක නූපදී. සෝත විඤ්ඤාණ සිත් දෙක සොතද්වාරයෙහි උපදී, ඝාණ විඤ්ඤාණ සිත් දෙක ඝාණද්වාරයෙහි උපදී. ජිව්හා විඤ්ඤාණ සිත් දෙක ජිව්හාද්වාරයෙහි උපදී. කාය විඤ්ඤාණ සිත් දෙක කායද්වාරයෙහි උපදී. අන් කිසි ද්වාරයෙක නූපදී. මේ පඤ්ච විඤ්ඤාණ සිත් දසය එකද්වාරික වන ආකාර යි.

**මහග්ගත ජවන අටළොස** (18) නම්, රූපාවචර කුසල සිත් පසය, එම ක්‍රියා සිත් පසය, අරූපාවචර කුසල සිත් සතරය, එම ක්‍රියා සිත් සතරය යන මොහු යි. මොහු මනොද්වාරයෙහි ම උපදිති. චක්ෂුරාදි පඤ්චද්වාරයෙහි නූපදිත්.

**ලොකුත්තර ජවන** අට නම්, මාර්ග සිත් සතර හා ඵලසිත් සතර යි. මොහු මනොද්වාරයෙහි ම උපදිති. අන්‍යද්වාරයෙක නූපදිත්. මෙසේ මේ සිත් සතිස (36) එක් එක් ද්වාරයෙහි ම උපදින බැවින් එකද්වාරික චිත්තයෝ ය යි කියනු ලැබෙත්.

2. **මනොධාතු ත්‍රිකය** පඤ්චද්වාරයෙහි ම උපදනේ ය. මනොධාතු ත්‍රික නම් පඤ්චද්වාරාවර්ජනය හා සම්පටිච්ඡන යුගලය යි.

ඇසට රූපයක් ආපාථගත වූ කල්හි භවාඞ්ගසන්තතිය සැලී සිඳී පඤ්චද්වාරාවර්ජනය ඉපිද චක්ඛුවිඤ්ඤාණයට අනතුරු වැ සම්පටිච්ඡන සිත් දෙකින් එකක් ආරම්මණානු රූප වැ ඉපදිය යුතු. එහෙයින් මොව්හු චක්ඛුද්වාරයෙහි උපදිත්. එ සේ ම කනට ශබ්දයක් ඇසුණු කල්හි දු ඝාණයට ගඳ සුවඳක් ගැටුණු කල්හි දු දිවට රසයක් වැදුණු කල්හි දු ශරීරයට ස්ප්‍රෂ්ටව්‍යයක් හැපුණු කල්හි දු භවාඞ්ග සන්තතිය සැලී සිඳී පඤ්චද්වාරාවර්ජනය ඉපිද සොත විඤ්ඤාණාදීන්ට අනතුරු වැ ආරම්මණානු රූප වැ සම්පටිච්ඡන දෙකින් එකක් ඉපදිය යුතුය. එහෙයින් මොව්හු සොතද්වාරයෙහි ද, ඝාණද්වාරයෙහි ද, ජිව්හාද්වාරයෙහි ද, කායද්වාරයෙහි ද උපදිති. එබැවින් ම මේ සිත් තුන පඤ්චද්වාරිකයි.

3. සෝමනස්ස සහගත සන්තීරණය ද, වොඨපන සඞ්ඛ්‍යාත මනොද්වාරාවර්ජනය ද (අකුසල දොළොසය, හසිතුප්පාදය, කාමාවචර කුසල අටය, එම සහේතුක ක්‍රියා අටය යන) කාමාවචර ජවන එකුන්තිස (29) ද යන එක්තිස් (31) සිත් ෂඞ්ද්වාරයෙහි උපදනේ ය. ඒ එසේ මැයි.

**සෝමනස්ස සහගත සන්තීරණය** පඤ්චද්වාරයෙහි සන්තීරණ තදාලම්බන වශයෙන් ද, මනොද්වාරයෙහි තදාලම්බන වශයෙන් ද උපදී.

**මනොද්වාරාවර්ජනය** පඤ්චද්වාරයෙහි වොඨපන වශයෙන් ද, මනොද්වාරයෙහි මනොද්වාරාවර්ජන වශයෙන් ද උපදී.

**කාමාවචර ජවන් එකුන්තිස** (29) ඒ ඒ අවස්ථා පුද්ගලානුරූප වැ ෂඞ්ද්වාරයෙහි ම උපදී. එබැවින් මේ එක්තිස් චිත්තයෝ ෂඞ්ද්වාරිකයෝ යි.

4. **උපෙක්ඛා සහගත සන්තීරණ සිත්** දෙක හා මහා විපාක සිත් අට ෂඞ්ද්වාරයෙහි ද උපදනේ ය. ද්වාරවිමුක්ත ද වන්නේ යි. ඒ එසේ මැයි.

**උපෙක්ඛා සහගතසන්තීරණ දෙක** පඤ්චද්වාරයෙහි සන්තීරණ තදාලම්බන වශයෙන් ද මනොද්වාරයෙහි තදාලම්බන වශයෙන් ද පවත්නා කල ෂඞ්ද්වාරික වේ. ඔහු දෙදෙන පටිසන්ධි භවඞ්ග චුති වශයෙන් පවත්නා කල ද්වාර විමුක්ත වෙත්.

**මහාවිපාක අට නම්**, කාමාවචර සහේතුක විපාක සිත් අට ය. ඔව්හු තදාලම්බන වශයෙන් පවත්නා කල ෂඞ්ද්වාරික වෙති. ප්‍රතිසන්ධි භවඞ්ග ච්‍යුති වශයෙන් පවත්නා කල ද්වාර විමුක්ත වෙත්.

5. මහග්ගත විපාකයෝ ද්වාරවිමුක්ත ම වෙත්. මහග්ගත විපාක නම්, රූපාවචර අරූපාවචර විපාක සිත් නවය යි. ඔව්හු පටිසන්ධි භවඞ්ග චුති වශයෙන් ම පවතිති. තදාලම්බනාදි වශයෙන් නො පවතිත්. එහෙයින් ද්වාරවිමුක්ත මැයි.

***එකද්වාරික චිත්තානි පඤ්ච ඡද්වාරිකානි ච,**
**ඡද්වාරික විමුත්තානි විමුත්තානි ච සබ්බථා.**

**ඡත්තිංසති තථා තීණි එකතිංස යථාක්කමං,**
**දසධා නවධා චෙති පංචධා පරිදීපයෙ."**

එකද්වාරික සිත් සතිසෙ (36)කි. පඤ්චද්වාරික සිත් තුනෙකි. ෂඩ්ද්වාරික සිත් එක්තිසෙ (31) කි. ෂඩ්ද්වාරික හා ද්වාරවිමුක්ත සිත් දසයෙකි. ද්වාර විමුක්ත සිත් නවයෙකි. මෙසේ ද්වාර සංග්‍රහය පංචවිධ වශයෙන් දක්වන්නේ යි.

ප්‍රශ්න.

1. එකද්වාරික සිත් කෙතෙක් ද? කවරහු ද? වෙන් වශයෙන් දක්වනු.
2. පඤ්චද්වාරික සිත් කෙතෙක් ද? කවරහු ද?
3. ෂඩ්ද්වාරික සිත් එක්තිස (31) දක්වනු.
4. ෂඩ්ද්වාරික හා ද්වාරවිමුක්ත සිත් දක්වනු.
5. ද්වාරවිමුක්ත සිත් කවරහු ද? ඔව්හු කුමක් හෙයින් ද්වාර විමුක්ත වූ ද?

## 11. ආලම්බන සංග්‍රහය. (පළමුවන කොටස)

සිත වනාහි දුර්බල පුරුෂයකු වැනිය. දුර්බල පුරුෂයකුට යම් කිසිවක එල්බ මිස නො එල්බ සිටිය නො හැකි. සිතට ද යමක එල්බ මිස නො එල්බ සිටිය නො හැකි. සිත් විසින් එල්බ ගනු ලබන්නට ආලම්බනය යි කියනු ලැබේ. ඒ ආලම්බන ම චක්ඛුරාදියෙහි පවත්නා චිත්තයෝ මෙහි රමණය කරත්ය යන අර්ථයෙන් ආරම්මණය යි ද කියනු ලැබේ. ආලම්බන වනාහි රූපාලම්බනය, ශබ්දාලම්බනය, ගන්ධාලම්බනය, රසාලම්බනය, ඵොට්ඨබ්බාලම්බනය, ධර්මාලම්බනය යි සවැදෑරුම්.

1. මෙහි රූප නම්, අටවිසි රූප අතුරෙන් විෂය රූපයන්ට අයත් වර්ණායතනය හෙවත් පැහැය. රූපය ම ආලම්බන වූයේ රූපාලම්බන යි. රූපාලම්බනය හෙවත් වර්ණායතනය චක්ඛුද්වාරික සිත්වලට අරමුණු වේ. එසේ අරමුණු වන්නේත් වර්තමාන රූපාලම්බන ම

---

*එක් දොර සිත් සතිස්-පස්දොර සිත් තුනෙක් වේ.
සදොර සිත් එක්තිස්-යළි සදොර දොරමුත් දස.

වැළි දු දොරමුත් සිත්-නවයෙකි මෙලෙස සිත් මුළු,
දොර සඟරා විසින් පස්-වැදෑරුම් බව දන්නේ.

ය. අතීත හෝ අනාගත රූපාලම්බන චක්‍ෂුර්ද්වාරික සිත්වලට ගෝචර නොවේ. චක්‍ෂුර්ද්වාරික සිත් සසාළිස (46) යට දක්වන ලද්දේය. ඇසට පෙනෙන්නේ කොයි දෙයක වුවත් පැහැය පමණකි. එහි ආකාර සලකා ගැන්ම මනොද්වාරයෙන් කෙරෙන බව දත යුතු යි.

2. ශබ්ද නම්, අටවිසි රූප අතුරෙන් විෂය රූපයන්ට අයත් කනට ගෝචර වන දෙය ය. ශබ්ද ම ආලම්බන වූයේ ශබ්දාලම්බන යි. ශබ්දාලම්බන වනාහි සොතද්වාරික සිත්වලට අරමුණු වේ. එසේ අරමුණු වන්නේත් වර්තමාන ශබ්දාලම්බනය යි. අතීත හෝ අනාගත ශබ්දාලම්බන සොත ද්වාරිකයන්ට ගෝචර නොවේ. සොතද්වාරික සිත් සසාළිස (46) යට දක්වන ලද්දේ ය.

3. ගන්‍ධ නම්, අටවිසි රූප අතුරෙන් විෂය රූපයන්ට අයත් නැහැයට ගෝචර වන ගඳ සුවඳ ය. ගන්‍ධ ම ආලම්බන වූයේ ගන්‍ධාලම්බනය යි. ගන්‍ධාලම්බන වනාහි ඝාණද්වාරික සිත්වලට අරමුණු වේ. එසේ අරමුණු වන්නේත් වර්තමාන ගන්‍ධාලම්බනය යි. අතීත හෝ අනාගත ගන්‍ධාලම්බන ඝාණද්වාරික සිත්වලට ගෝචර නොවේ. ඝාණද්වාරික සිත් 46 යට දක්වන ලද්දේය.

4. රස නම්, අටවිසි රූප අතුරෙන් විෂය රූපයන්ට අයත් දිවට ගෝචර වන රස ය. රස ම ආලම්බන වූයේ රසාලම්බන යි. රසාලම්බන වනාහි ජිව්හාද්වාරික සිත්වලට අරමුණු වේ. එසේ අරමුණු වන්නේත් වර්තමාන රසාලම්බනය යි. අතීත හෝ අනාගත රසාලම්බන ජිව්හාද්වාරික සිත්වලට ගෝචර නො වේ. ජිව්හාද්වාරික සිත් 46 යට දක්වන ලද්දේ ය.

5. ඵොට්ඨබ්බ නම්, අටවිසි රූප අතුරෙන් විෂයරූපයන්ට අයත් කයට ගෝචර වන ස්ප්‍රෂ්ටව්‍ය ය. හේ වනාහි පඨවි, තෙජ, වායු යනු භූත රූප තුන මැ යි. ආපොධාතුව ස්පර්ශය කළ හැකි නො වේ. ඵොට්ඨබ්බය ම ආලම්බන වූයේ ඵොට්ඨබ්බාලම්බන යි. ඵොට්ඨබ්බාලම්බන වනාහි කායද්වාරික සිත්වලට අරමුණු වේ. එසේ අරමුණු වන්නේත් වර්තමාන ස්ප්‍රෂ්ටව්‍යාරම්මණය යි. අතීත හෝ අනාගත ස්ප්‍රෂ්ටව්‍ය කායද්වාරික සිත්වලට ගෝචර නොවේ. කායද්වාරික සිත් 46 ද යට දක්වන ලද්දේ ය.

6. ධර්ම වනාහි ප්‍රසාද රූප ය, සූක්‍ෂම රූප ය, චිත්තය, චෛතසික ය, නිර්වාණ ය, ප්‍රඥප්ති යයි ෂඩ්විධ වේ. ධර්ම ම ආලම්බන වූයේ ධර්මාලම්බන යි.

ප්‍රසාද රූප නම්, චක්ඛු සොත ඝාණ ජිව්හා කාය යන පඤ්ච ප්‍රසාදයෝ ය. සූක්‍ෂම රූප නම් ආපො ධාතු ය. ස්ත්‍රීභාව-පුරුෂ භාව යන භාව රූප දෙක ය, හෘදය වස්තු ය, ජීවිතෙන්‍ද්‍රිය, ආහාර හෙවත් ඔජා රූප ය, ආකාශ හෙවත් පරිච්ඡෙද රූප ය, කාය විඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති යන විඤ්ඤත්ති රූප දෙක ය, ලහුතා මුදුතා කම්මඤ්ඤතා යන විකාර රූප තුන ය, උපචය සන්තති අනිච්චතා ජරතා යන ලක්‍ෂණ රූප සතර ය යන මොහු යි. මොවුන්ගේ ආකාර රූපපාදයෙහි දැක්වේ. චිත්ත නම්, චිත්ත පාදයෙහි දැක්වුණු 89 ක් හෝ 121 ක් සිත් ය. චෛතසික නම්, චෛතසිකපාදයෙහි දැක්වුණු

ඵස්සාදි දෙපණස් චෛතසිකයෝය. **නිර්වාණ** නම්, මාර්ග ඵලයන්ට අරමුණු වන අසංඛත ධාතු ය. **පඤ්ඤත්ති** නම්, ලොක ව්‍යවහාර වශයෙන් සම්මත වූ භූමි, පර්වත, රථ සකට කසිණාදිහු යි.

7. මොවුන් අතුරෙන් නිර්වාණ හා ප්‍රඥප්ති කාල විමුක්ත ය. විනාශ නොවන බැවින් හා කාලභෙද නැති බැවිනි. සෙසු රූපාදිය ත්‍රෛකාලික යි. තුන් කාලයෙහි පවත්නා බැවිනි.

8. මනොද්වාරික චිත්තයන්ට වනාහි අතීත වූ හෝ වර්තමාන වූ හෝ අනාගත වූ හෝ රූපාදි පඤ්චාලම්බන ද, එසේ ම ප්‍රසාද රූප ද, සූක්ෂම රූප ද, චිත්ත චෛතසික ද, කාලවිමුක්ත වූ නිර්වාණය හා ප්‍රඥප්ති ද, සුදුසු පරිදි අරමුණු වේ. මනොද්වාරික සිත් සත්සැට (67) යට දක්වන ලදි. **සුදුසු පරිදි** නම්, කාමාවචර ජවන, අභිඥා ජවන, සෙසු මහග්ගතාදි ජවනයන්ට සුදුසු පරිදි යි. ඒ එසේ මැ යි. හසිතුප්පාදය හැර සෙසු කාමාවචර ජවනයන්ට ත්‍රෛකාලික වූ රූපාදි අරමුණු සය ද, කාලවිමුක්ත වූ නිර්වාණ හා ප්‍රඥප්ති ද අරමුණු වේ. හසිතුප්පාදයට වනාහි ත්‍රෛකාලික වූ රූපාදිය අරමුණු වේ. එය කාමාවචරාලම්බනික ම බැවිනි. දිව්‍ය චක්ෂුරාදි වශයෙන් පැවැති අභිඥා ජවනයන්ට ත්‍රෛකාලික වූ රූපාදිය ද, කාලවිමුක්ත වූ නිර්වාණ ප්‍රඥප්තිය ද සුදුසු පරිදි අරමුණු වේ. මෙහි සුදුසු පරිදි මෙසේ ය. දිව්‍ය චක්ෂුවට වර්තමාන රූපය ම අරමුණු ය. දිව්‍යශ්‍රෝතයට වර්තමාන ශබ්දය ම අරමුණු ය. ඍද්ධිවිධ ඥානයට ත්‍රෛකාලික රූපාදි ෂඩාලම්බන අරමුණු ය. චෙතොපරිය ඤාණයට අතීත හා අනාගත වූ ධර්මාරම්මණ අරමුණු ය. පූර්වෙනිවාසානුස්මෘති ඥානයට අතීත වූ ම රූපාදි ෂඩාලම්බන ද කාලවිමුක්ත ද අරමුණු යි.

9. ප්‍රතිසන්‍ධි භවාඞ්ග ච්‍යුති සංඛ්‍යාත ද්වාරවිමුක්ත සිත්වලට වනාහි රූපාදි සවැදෑරුම් වූ-ඒ ඒ භූමි ආදි වශයෙන් ලැබෙන ලැබෙන පරිදි බොහෝ සෙයින් ඉකුත් වූ භවයෙහි මරණාසන්න කාලයෙහි පැවැති ෂඩ්ද්වාරික ජවනයන් විසින් ගන්නා ලද වර්තමාන වූ හෝ අතීත වූ හෝ කසිණාදි ප්‍රඥප්ති වූ හෝ කර්ම කර්ම නිමිති ගති නිමිති යි සම්මත වූ එක්තරා එකක් අරමුණු වන්නේ ය.

මෙහි **කර්ම** නම්, ප්‍රතිසන්ධි උපදවන කුසලාකුසල චේතනා ය. **කර්මනිමිත්ත** නම්, කුශල පක්ෂයෙහි දානාදීන්ට උපකරණ වූ මල් වස්ත්‍රාදිය හා අකුශල පක්ෂයෙහි වධ ආදීන්ට උපකරණ වූ කඩු තුවක්කු ආදිය යි. **ගතිනිමිත්ත** නම්, උපදින භවය සුගතියක් නම් එහි පැනෙන කප්රුක් මල්මාලාදිය හා උපදින භවය දුර්ගතියක් නම් එහි පැනෙන යමපලු ගිනි ආදිය යි.

මේ ස්ථානය ද ගම්භීරය. මතු වීථිපාදයෙහි විස්තර කරනු ලැබේ.

**ප්‍රශ්න.**

1. ආලම්බන කෙතෙක් ද? කවරහු ද? කුමක් හෙයින් ආලම්බන ය යි කියනු ලැබේ ද?

2. රූපාදි පඤ්චාලම්බන හා විශේෂයෙන් ධර්මාලම්බනය පැහැදිලි කරනු.
3. පඤ්චද්වාරික සිත්වලට ලැබෙන අරමුණු වෙන වෙන ම දක්වනු.
4. මනොද්වාරික සිත්වලට අරමුණු දක්වනු.
5. ද්වාරවිමුක්ත සිත්වලට කුමක් අරමුණු වේ ද?

## 12. ආලම්බන සංග්‍රහය. (දෙවන කොටස)

ආලම්බන සය ද අසවල් අසවල් සිත් අසවල් අසවල් ආලම්බන ගන්නේය යි ද යට දක්වන ලද්දේ ය. කවර කවර සිත් කෙතෙක් කෙතෙක් ආලම්බනික ද යනු මෙහි දක්වනු ලැබේ.

1. චක්ඛුවිඤ්ඤාණ සිත් දෙක එකාලම්බනික ය. රූපය පමණක් ආලම්බනය කරන බැවිනි.

2. සොතවිඤ්ඤාණ, ඝාණවිඤ්ඤාණ, ජිව්හාවිඤ්ඤාණ, කායවිඤ්ඤාණ සිත් ද එකෙකාලම්බනික ය. ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බයන්ම පිළිවෙලින් ආලම්බනය කරන බැවිනි.

3. **මනොධාතුත්‍රිකය පඤ්චාලම්බනිකය.** මනොධාතු ත්‍රික නම්, පඤ්චද්වාරාවර්ජනය හා සම්පටිච්ඡන යුගලය යි. මේ සිත් තුන ඒ ඒ චිත්තවීථීන්හි දී රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ යන පස ම ආලම්බනය කරන්නේ ය.

4. **සෙසු කාමාවචර විපාක හා හසිතුප්පාදය සර්වප්‍රකාරයෙන් ම කාමාවචරාලම්බනික ය.** අකුසල විපාක සත (7) ය, කුසල අහේතුක විපාක අට (8) ය, සහේතුක විපාක අට (8) යයි කාමාවචර විපාක මුළුල්ල තෙවිස්සෙ (23) කි. එයින් එකෙකාලම්බනික වශයෙන් දසයෙක් ද පඤ්චාලම්බනික වශයෙන් දෙකෙක් ද යට දැක්විණි. සෙසු නම්, සන්තීරණ තුන හා මහාවිපාක අට යි. මෙයින් සන්තීරණ තුන සන්තීරණ කෘත්‍ය වශයෙන් කාමාවචර පංචාලම්බනික ය. තදාරම්මණ කෘත්‍ය වශයෙන් කාමාවචර ෂඩාලම්බනික ය. මහාවිපාක අට ද, තදාරම්මණ වශයෙන් කාමාවචර ෂඩාලම්බනික ය. සන්තීරණද්වය හා මහාවිපාක අට ප්‍රතිසන්ධි භවාඞ්ග ච්‍යුති වශයෙන් ද්වාරවිමුක්ත වැ පවත්නා කල්හි ද කාමාවචර ෂඩාලම්බනික ය. **හසන චිත්තය ද කාමාවචර ෂඩාලම්බනිකය.** ඒ එසේ ම ය; හසන චිත්තතය වනාහි රහතුන්ට ප්‍රධන් වීර්යයට සුදුසු තැන් දැක සතුටු වන විට රූපාලම්බනිකව ද, බඩු බෙදන තැන භික්ෂූන්ගේ කලකල ශබ්දය අසා “මගේ මෙ බඳු වැ පැවැති ලොලුප්ප තණ්හාව නැති වුණේ නො වේදැ”යි සතුටු වන විට ශබ්දාලම්බනික වැ ද සුවඳ ආදියෙන් සෑ පුදමින් සතුටු වන විට ගන්ධාලම්බනික වැ ද රසවත් පිණ්ඩපාතය සබ්රම්සරුන්ට ද බෙදා වළඳමින් සතුටු වන විට රසාලම්බනික වැ ද ආභිසමාචාරිකවත් පුරමින් සතුටු වන විට ඵොට්ඨබ්බාරම්මණික වැ ද පූර්වේනිවාසාදි ඥානයෙන් ගත් කාමාවචරධර්ම අරහයා සතුටු වන විට ධර්මාලම්බනික වැ ද උපදනේ යි.

**6. අකුසල සිත් දෙළොස හා ඥානවිප්‍රයුක්ත කාමාවචර ජවන් අට ලෝකෝත්තර ධර්ම හැර සෙසු ත්‍රෛභූමක වූ සියල්ල අරමුණු කරන්නේ ය.**

මෙයින් දිට්ඨිසම්පයුත්ත අකුසල සිත් සතර කාමාවචර වූ රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ ධර්මයන් දිට්ඨි වශයෙන් පරාමසන, ආස්වාදන අභිනන්දනය කාලයෙහි කාමාවචරාරම්මණය ය. සත්විසි රූපාවචර අරූපාවචර ධර්මයන් දිට්ඨි වශයෙන් පරාමසන, ආස්වාදන, අභිනන්‍දන කාලයෙහි මහග්ගතාරම්මණ ය. එසේ ම සම්මුති ධර්ම පරාමසන, ආස්වාදන, අභිනන්‍දන කාලයෙහි පඤ්ඤත්තාරම්මණ ය. දිට්ඨිවිප්පයුත්ත සිත් සතර දෘෂ්ටි රහිත වැ ආස්වාදන, අභිනන්‍දන කාලයෙහි එසේ ම පරිත්ත මහග්ගත පඤ්ඤත්ත ආරම්මණ ය. පටිඝ සම්පයුත්ත සිත් දෙක ඒ පරිත්තාදි ධර්මයන් දූස්සන විප්පටිසාර වශයෙන් ගන්නා කල ද විචිකිච්ඡා සහගත සිත ඒ පරිත්තාදි ධර්මයන් විචිකිච්ඡා වශයෙන් ගන්නා කල ද උද්ධච්ච සහගත සිත ඒ පරිත්තාදි ධර්මයන් වික්ෂිප්ත වශයෙන් ගන්නා කල ද පරිත්ත මහග්ගත සඤ්ඤත්තාරම්මණ වේ.

**6. ඤාණවිප්පයුත්ත කාමාවචර ජවන් අට නම්, කාමාවචර ඤාණ විප්පයුත්ත කුසල් සතර හා ක්‍රියා සතර යි.**

පුහුදුන්ගේ හා ශෛක්‍ෂයන්ගේ ඤාණවිප්පයුත්ත කුසල සතර ද රහතන්ගේ එබඳු වූ ම ක්‍රියා සතර ද නො සකස් කොටැ දුන් දාන ප්‍රත්‍යවේක්‍ෂා ධර්ම ශ්‍රවණාදි කාමාවචර ධර්ම අරමුණු කරන කල්හි කාමාවචරාලම්බනික ය. ඉතා ප්‍රගුණ වූ ධ්‍යාන ප්‍රත්‍යවේක්‍ෂා කරන කල්හි මහග්ගතාරම්මණික ය. කසිණ නිමිත්තාදීන් පරිකර්ම කරන කාලයෙහි පඤ්ඤත්තාරම්මණික ය.

මොවුන්ගේ හීනභාවය හේතුකොට ගෙන මොව්හු කිසි කලෙක ලොකොත්තරාලම්බනික නො වෙත්.

**7. ඤාණසම්පයුත්ත කාමාවචර කුසල සිත් සතර හා පඤ්චමධ්‍යාන සංඛ්‍යාත වූ අභිඥ කුසල සිත් අර්හත් මාර්ග ඵල හැර සෙසු සියල්ල අරමුණු කරන්නේ ය.**

මේ සිත් පස පහළ වන්නේ පුහුදුනට හා ශෛක්‍ෂයනට පමණෙකි. ශෛක්‍ෂයනට වුව ද රහතන්ගේ ලෞකික චිත්තය විනා අර්හත් මාර්ග ඵල සිත් අරමුණු කළ හැකි නො වේ. පුහුදුනට ශෛක්‍ෂයන්ගේ මාර්ග ඵල සිත් අරමුණු කළ හැකි නො වේ. ශෛක්‍ෂයන් අතුරෙනු දු යට යට ශෛක්‍ෂයනට මතු මතු ශෛක්‍ෂයන්ගේ මාර්ග ඵල අරමුණු කළ හැකි නො වේ.

**8. ඤාණ සම්පයුත්ත කාමාවචර ක්‍රියා සිත් සතර ද, ක්‍රියා අභිඥ සිත ද, මනොද්වාරාවර්ජන සිත ද පරිත්ත මහග්ගත ලොකුත්තර පඤ්ඤත්ති යන සියල්ල අරමුණු කරන්නේ ය.**

සර්වඥතාඥානය වසයෙන් පවත්නේ කාමාවචර ඥාණ සම්පයුත්ත ක්‍රියා ජවන් සතර යි. එහෙයින් එය සියල්ල අරමුණු කරන්නේ ය. මනොද්වාරාවර්ජනය ද ඒ ඒ සිත්වලට පූර්ව වැ උපදින බැවින් සර්වාලම්බනික යි.

**9. ද්විතීය චතුර්ථ අරූප චිත්තයෝ මහග්ගතාලම්බනිකයහ.** විඥ්ඥාණඥ්චායතනයට අරමුණු වන්නේ ආකාසානඤ්චායතන චිත්ත ය යි. නෙවසඤ්ඤා නාසඤ්ඤායතනයට අරමුණු වන්නේ ආකිඤ්චඤ්ඤායතන චිත්තය යි. එහෙයින් ඔහු දෙදෙන මහග්ගතාලම්බනිකයෝ යි.

**10. සෙසු එක්විසි මහග්ගත චිත්තයෝ පඤ්ඤත්තාලම්බනිකයහ. කසිණාදි පඤ්ඤත්ති ම අරමුණු කරන බැවිනි. ලොකොත්තර සිත් නිර්වාණාලම්බනික ය. නිර්වාණය ම අරමුණු කරන බැවිනි.**

***පඤ්චවීස පරිත්තම්හි ඡ චිත්තානි මහග්ගතෙ,**
**එකවීසති වොහාරෙ අට්ඨ නිබ්බාණ ගොචරෙ.**

**වීසානුත්තරමුත්තම්හි අග්ගමග්ගඵලුජ්ඣිතෙ,**
**පඤ්ච සබ්බත්‍ථ ඡච්චෙති සත්තධා තත්‍ථ සඞ්ගහො"**

කාමාවචර විපාක තෙවිස්ස (23) ය, පංචද්වාරාවර්ජනය, හසිතුප්පාදය යන සිත් පස්විස්ස (25) පරිත්ත අරමුණෙහි ම පවත්නේ ය. **පරිත්ත නම්, කාමාවචර ය.**

විඥ්ඥාණඥ්චායතන කුසල විපාක ක්‍රියා 3 ය, නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසල විපාක ක්‍රියා 3 ය යන මේ සිත් සය මහග්ගත අරමුණෙහි ම පවත්නේ ය. **මහග්ගත නම්** රූපාවචර අරූපාවචර ය.

රූපාවචර සිත් 15 ය, අරූපාවචරවලින් ප්‍රථම තෘතීයා රූප සය ය යන සිත් 21 පඤ්ඤත්තාරම්මණයෙහි ම පවත්නේ ය. **පඤ්ඤත්ත** නම්, කසිණාදි ය.

ලොකොත්තර සිත් අට නිර්වාණාරම්මණයෙහි ම පවත්නේ ය.

අකුසල් 12 ය, ඥාණවිප්පයුත්ත කාමාවචර කුසල ක්‍රියා 8 ය යන සිත් 20 ලෝකෝත්තර හැර අන් සියලු අරමුණෙහි පවත්නේ ය.

---

*පස්විස්සෙකි පිරිත්-අරමුණැ, සසිත් මාගිය
පැණවුමෙ'ක් විස්සෙකි-සත'ටෙකි නිවන් අරමුණැ
නිවන'රමුණින් මුත්-වීසි සිත්, පස'ගපලමුත්
සසිත් සියල් අරමුණැයි-සත්විදි එහි සඟරා

ඥාණසම්පයුත්ත කාමාවචර කුසල සතර ය, අභිඥා කුශලය යන සිත් පස අර්හත් මාර්ග ඵල හැර සෙසු සියලු අරමුණෙහි පවත්නේ ය. **අභිඥා කුශල** නම්, අභිඥා භාව ප්‍රාප්ත පංචමධ්‍යාන කුශලය යි.

ඥාණ සම්පයුත්ත කාමාවචර ක්‍රියා 4 ය, අභිඥා ක්‍රියා සිතය. මනොද්වාරාවර්ජනය යන සිත් සය සර්වාලම්බනයෙහි පවත්නේ යි. **අභිඥා ක්‍රියා** නම්, රහතන්ගේ අභිඥා ප්‍රාප්ත පංචමධ්‍යාන ක්‍රියා සිතයි.

**ප්‍රශ්න.**

1. ඵකාලම්බනික හා පංචාලම්බනික සිත් වෙන් වෙන් වැ දක්වනු.
2. පරිත්තාලම්බන මහග්ගතාලම්බන සිත් දක්වා පැහැදිලි කරනු.
3. ලෝකෝත්තර ධර්ම අරමුණු නොකරන සිත් හා අර්හත් මාර්ග ඵල පමණක් අරමුණු නො කරන සිත් කවරහු ද?
4. සියල්ල ම අරමුණු කරන සිත් කෙතෙක් ද? කවරහු ද?
5. පඤ්ඤත්තාලම්බන සිත් දක්වනු.

## 13. වස්තු සංග්‍රහය.

1. **චක්ඛු වස්තුය, සොත වස්තුය, ඝාණ වස්තුය, ජිව්හා වස්තුය, කාය වස්තුය, හෘදය වස්තුය** යි වස්තුහු සවැදෑරුම් වෙති. **වස්තු** නම්, චිත්ත චෛතසික වසන තැන්ය. ඇතැම් විටෙක සිත් චක්‍ෂුරාදියෙහි වසන්නේ ය. ඒ එසේ ම ය. චක්‍ෂු ප්‍රසාදයෙහි රූපාරම්මණයක් ගැටුණු විට හෘදය වස්තුවෙහි පැවති සිත සැලී සිඳී පංචද්වාරාවර්ජනයට ඉක්බිති ව චක්‍ෂුසෙහි පවත්නේ චක්ඛු විඤ්ඤාණය යි කියනු ලැබේ. චක්ඛුවිඤ්ඤාණ සිත චක්ඛුවෙහි වසන බැවින් චක්ඛුව **චක්ඛුවත්‍ථු** වේ. සොත වත්‍ථු ආදිය ද මෙසේ ම ය. **හෘදය වස්තු** නම්, මනො ධාතු මනො විඤ්ඤාණ ධාතූන්ට නිඃශ්‍රය වූ පපුවෙහි කුලුඳුලක් පමණ වූ ලෙය ඇසුරු කොටැ පවත්නා කර්මජ රූපයෙකි.

2. **කාම ලෝකයෙහි** සම්පූර්ණ ඉන්‍ද්‍රිය ඇත්තන්ට මේ වස්තු සය ම පවත්නේ ය. ඇතැම් විට ජාත්‍යන්ධාදීන්ගේ වශයෙන් මෙයින් කීපයක් අඩුවිය ද හැකි ය.

3. **රූප ලෝකයෙහි** ඝාණ, ජිව්හා, කාය වස්තු නැත. ගන්ධ රස, ස්ප්‍රෂ්ටව්‍ය විශේෂයෙන් කාමපාක්‍ෂික ය. බඹලොව උපදනු කැමැත්තෝ කාමය තුච්ඡ කොට එහි උපදිති. එවිට ඔවුනට ඒ ගන්ධාදිය ගන්නා ඝාණාදි ප්‍රසාද රූපද නැත්තේය. බුද්ධ දර්ශන ධර්මශ්‍රවණාදිය සඳහා චක්ඛු සොත ඇත් මැ යි.

4. **අරූපලෝකයෙහි** මේ චක්‍ෂුරාදි එක වස්තුවකු දු නැත. එහි රූප ඒකාන්තයෙන් ම නැති බැවිනි.

5. මේ එක් එක් වස්තුවෙක අසවල් අසවල් සිත් උපදනේ ය යි දක්වනු සඳහා සිත් මුළුල්ල **සත්ත විඤ්ඤාණ ධාතු** වශයෙන් බෙදනු ලැබේ.

6. චක්ඛු විඤ්ඤාණ සිත් දෙක **චක්ඛු විඤ්ඤාණ ධාතු** නම් වේ. එසේ ම සොත විඤ්ඤාණ සිත් දෙක **සොත විඤ්ඤාණ ධාතු** නමි. ඝාණ විඤ්ඤාණ සිත් දෙක **ඝාණ විඤ්ඤාණ ධාතු** නමි. ජිව්හා විඤ්ඤාණ සිත් දෙක **ජිව්හා විඤ්ඤාණ ධාතු** නමි. කාය විඤ්ඤාණ සිත් දෙක **කාය විඤ්ඤාණ ධාතු** නමි. පඤ්චද්වාරාවර්ජනය හා සම්පටිච්ඡන යුගලය **මනො ධාතු** නමි. සෙසු සියල්ල **මනොවිඤ්ඤාණ ධාතු** නම් වේ.

7. මෙයින් චක්ඛුවිඤ්ඤාණ ධාතු චක්ඛු වස්තුව නිසා පවත්නේ ය. සොත, ඝාණ, ජිව්හා, කාය විඤ්ඤාණ ධාතු සොත, ඝාණ, ජිව්හා, කාය වස්තු නිසා පවත්නේ ය.

8. මනො ධාතුව හෘදය වස්තුව නිසා ම පවත්නේ ය. පංචාලම්බන නිසා පඤ්චද්වාරාවර්ජන සම්පටිච්ඡන වන බැවිනි.

9. මනො විඤ්ඤාණ ධාතුවට අයත් සිත් අතුරෙන් සන්තීරණ තුන ය, මහාවිපාක අට ය, (අකුසල අතුරෙන්) පටිඝ දෙක ය, සෝවාන් මාර්ගය, හසිතුප්පාදය, රූපාවචර පසළොස ය යන සමතිස් (30) සිත් හෘදය වස්තුව නිසා පවත්නේ ය.

සන්තීරණ තුන හා මහාවිපාක අට අරූප ලෝකයෙහි නැත. ද්වාර ප්‍රතිසන්ධි හා කෘත්‍යාදියත් එහි නැති බැවිනි. පටිඝ සිත් දෙක රූපී බ්‍රහ්ම ලෝකයෙහි දු නැත. බ්‍රහ්මයනට කෝප නැති බැවිනි. ශ්‍රාවකයන් සෝවාන් මාර්ග සිත පරතොඝොෂ ප්‍රත්‍යයෙන් ලැබිය යුතු වේ. අරූපයෙහි ශ්‍රොත්‍ර ප්‍රසාදය නැති බැවින් ඔවුන්ට ධර්මදේශනා නො ඇසිය හැකි ය. **පරතොඝොෂ ප්‍රත්‍යය නම්**, මෙරමාගෙන් චතුස්සත්‍යාත්මක ධර්මයක් ඇසීම ය. උපතිස්ස මානවක අස්සජි තෙරුන්ගෙන් "**යෙ ධම්මා හෙතුප්පභවා**" යනාදි ගාථාව ඇසුවා මෙනි. අරූපීනට රූප නැති බැවින් රහත් වුව ද සිනාසිය නො හැකි. රූපාවචර සිත් අරූපයෙහි නො ලැබේ.

10. කාමාවචර කුසල 8 ය, අරූපාවචර කුසල 4 ය යන දොළොස් කුසල සිත් ද පටිඝ දෙක හැර සෙසු දස අකුසල් සිත ද, පඤ්චද්වාරාවර්ජන හසන රූපාවචර ක්‍රියා හැර සෙසු මනොද්වාරා වර්ජනය, කාමාවචර සහේතුක ක්‍රියා අට ය, අරූපාවචර ක්‍රියා 4 ය යන තෙළෙස් ක්‍රියා සිත් ද, සෝවාන් මාර්ගය හැර සෙසු ලෝකෝත්තර සත් සිත් ද යන මේ දෙසාළිස් (42) සිත් හෘදය වස්තුව ඇසුරු කොට ද ඇසුරු නො කොට ද පවත්නේ ය. මේ සිත් කාම ලෝකයෙහි ද, රූප ලෝකයෙහි ද, අරූප ලෝකයෙහි ද සත්ත්වයනට සුදුසු පරිදි උපදිත හැකි සේ යි.

11. අරූපාවචර විපාක සිත් සතර හෘදය වස්තුව ඇසුරු නො කොට ම පවත්නේ ය. ඒ සිත් කාම භවයෙහි ද, රූප භවයෙහි ද නො ලැබේ මැ යි.

. *"ඡවත්‍ථු නිස්සිතාකාමෙ සත්තරූපෙ චතුබ්බිධා,
තිවත්‍ථුනිස්සිතාරුප්පෙ ධාත්‍වෙකා නිස්සිතාමතා,
තෙ චත්තාලීස නිස්සාය ද්වෙ චත්තාලීස ජායරෙ,
නිස්සාය ච අනිස්සාය පාකාරුප්පා අනිස්සිතා."

කාම ලෝකයෙහි සත්තවිඥාන ධාතුහු චක්‍ෂුරාදි ෂඩ්වස්තු නිසා පවතිති. රූප ලෝකයෙහි චක්ඛුවිඤ්ඤාණ ධාතු, සොත විඤ්ඤාණ ධාතු, මනො ධාතු, මනොවිඤ්ඤාණ ධාතු යන සතර ධාතුහු චක්ඛු සොත හදය යන වස්තු තුන නිසා පවතිති. අරූප ලෝකයෙහි එකම මනො විඤ්ඤාණ ධාතු ෂඩ්වස්තු නොනිසා ම (=නැති වැ ම) පවතී.

තෙසාළිස් සිත් කෙනෙක් ෂඩ්වස්තු නිසා ම පවතිති. (එනම් කාමාවචර විපාක තෙවිස්ස (23) ය, පඤ්චද්වාරා වර්ජනය, හසිතුප්පාදය, පටිඝ චිත්තද්වය, රූපාවචර පසළොස ය, ප්‍රථම මාර්ග චිත්තය යන මොහු යි.) දෙසාළිස් සිත් කෙනෙක් හෘදය වස්තුව නිසා ද නො නිසා ද පවතිති. පංච වොකාර භව වහයෙන් නිසා ය. චතුවොකාර භව වශයෙන් නො නිසා ය. **පංචවොකාර භව** නම්, රූප, වෙදනා, සඤ්ඤා, සංඛාරා, විඤ්ඤාණ යන පඤ්චස්කන්‍ධය ම ඇති කාම රූප ලෝක යි. අසඤ්ඤසත්තය **එකවොකාර භව** ය. රූපය පමණක් ම ඇති බැවිනි. **චතුවොකාර භව** නම්, වෙදනා, සඤ්ඤා, සංඛාරා, විඤ්ඤාණ යන ස්කන්‍ධ සතර ඇති අරූපාලෝකය යි. **වොකාර** නම්, ස්කන්‍ධ ය. යට දැක්වූ විභාගයෙන් මෙය අවබෝධ කරගත හැකියි.

### ප්‍රශ්න.

1. වස්තු කෙතෙක් ද? කවරහු ද?
2. සත්තවිඤ්ඤාණ ධාතු වෙන් කොටැ දක්වනු.
3. කවර කවර වස්තුවල කවර කවර විඤ්ඤාණ ධාතුහු වෙත් ද? පැහැදිලි කරනු.
4. චතුවොකාර, පංචවොකාර එකවොකාර භව දක්වනු.
5. හෘදය වස්තුව නිසා ද, නොනිසා ද පවත්නා සිත් දක්වා හේතු පෙන්වනු.

**පණ්ඩිත මාතර ශ්‍රී ධර්මවංශ ස්ථවිර ප්‍රණීත අභිධර්මචන්‍ද්‍රිකාවේ ප්‍රකීර්ණක පාදයයි.**

---

*සවත් ඇසුරින් කම් භී-සතෙකි රූභී සතරෙකි
තිවතැ'සුරින් අරූභී-එකෙකි සවත් නැතිවැ මැ
තෙ සාළිස් සිත් සවත්-නිසාපවති දෙසා ළිස්
නිසා හා නොනිසා-විවාරූ නොනිසා මැයි.

# සතරවන වීථි පාදය.

**නමො භගවතො සම්බුද්ධස්ස.**

## 1. ෂට්ක සය.

**චිත්ත පාදයෙහි** සිත් 89 හෝ 121 දක්වන ලද්දේය. **චෛතසික පාදයෙහි** චෛතසික 52 ද, එක් එක් චෛතසිකය මෙතෙක් මෙතෙක් සිත්හි යෙදෙන්නේය යන සම්ප්‍රයෝග නය හා එක් එක් සිතෙහි මෙතෙක් මෙතෙක් චෛතසික ඇත්තේය යන සඞ්ග්‍රහ නය ද දක්වන ලද්දේය. **ප්‍රකීර්ණක පාදයෙහි** ඒ චිත්ත චෛතසිකයන් පිළිබඳ වේදනා, හේතු, කෘත්‍ය, ද්වාර, ආලම්බන, වස්තු වශයෙන් සවැදෑරුම් මිශ්‍රක නය දක්වන ලද්දේය. මෙහි වනාහි **චිත්ත පාදයෙහි** දැක්වුණු චිත්තයන් පිළිබඳ ප්‍රවෘත්ති සඞ්ග්‍රහය දක්වනු ලැබේ.

ප්‍රවෘත්ති සඞ්ග්‍රහ නම් කාම, රූප, අරූප ලෝකයන්හි අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පුද්ගලයන් පිළිබඳ වැ මේ සිත මේ සිත්වලට අනතුරු වැ උපදින්නේ ය. මේ සිතට අනතුරු වැ මේ සිත් උපදින්නේය යි චිත්තයන්ගේ පූර්වාපර නියමය සඞ්ග්‍රහ කොට දැක්වීම ය. හෙවත් සත්ත්වයා පිළිබඳ සිත් පැවැතීගෙන යාමේ පිළිවෙල දැක්වීම යි.

ඒ ප්‍රවෘත්ති සඞ්ග්‍රහය ද වනාහි වීථි චිත්ත ප්‍රවෘත්ති සඞ්ග්‍රහය, වීථි මුක්ත චිත්ත ප්‍රවෘත්ති සඞ්ග්‍රහය යි දෙවැදෑරුම් වේ. වීථි සිත් පැවැතීගෙන යන පිළිවෙල සඞ්ග්‍රහ කොටැ දැක්වීම වීථි චිත්ත ප්‍රවෘත්ති සංග්‍රහ යයි. වීථි සිත් නම් රූපාදි එක අරමුණක් නිසා පවතින චිත්ත පරම්පරාවෙකි. වීථිමුක්ත චිත්ත ප්‍රවෘත්ති සංග්‍රහ නම් වීථි වශයෙන් නො පැවතෙන සිත් පිළිබඳ ක්‍රමය දැක්වීමය. වීථි වශයෙන් නො පැවතෙන සිත් නම් කර්ම, කර්ම නිමිති, ගති නිමිති අරමුණු කොට ඇති ප්‍රතිසන්ධි භවාඞ්ග ච්‍යුති කෘත්‍ය කරන සිත් එකුන්විස්ස (19) ය. (එක ගෘහයක් වූ පමණින් මාර්ගය වීථිය නො වන්නා සේ එක සිතක් වූ පමණින් චිත්ත ද වීථියෙක් නො වේ. මේ දෙවැදෑරුම් ප්‍රවෘත්ති සඞ්ග්‍රහයන් අතුරෙන් මෙහි වීථි චිත්ත ප්‍රවෘත්ති සංග්‍රහය **වීතිපාදය** යන නමින් දැක්වෙන බව සැලකිය යුතුයි.

වීතිචිත්ත ප්‍රවෘත්ති දැන ගැන්ම සඳහා පළමු කොට වස්තු සය, ද්වාර සය, ආලම්බන සය, විඤ්ඤාණ සය, වීථි සය විෂය ප්‍රවෘත්ති සය යන ෂට්ක සය උගත යුතුය.

1. **වස්තු** සය නම් චක්ඛු වස්තුය, සොත වස්තුය ඝාණ වස්තුය, ජිව්හා වස්තුය, කාය වස්තුය, හෘදය වස්තුය යන මොහු ය. මොවුන්ගේ ආකාර හා මොවුන් නිසා උපදින සිත් ගණන් **ප්‍රකීර්ණ පාදයෙහි 13 වන පාඩමේ** දක්වන ලද්දේය.

2. ද්වාර සය නම් චක්ඛු ද්වාරය, සොත ද්වාරය, ඝාණ ද්වාරය, ජිව්හා ද්වාරය, කාය ද්වාරය, මනො ද්වාරය යන මොහුය. මොවුන්ගේ ආකාර ද ඒ ඒ ද්වාරයන්හි උපදින සිත් ද එහි ම 9 වන පාඩමේ දක්වන ලද්දේය.

3. ආලම්බන සය නම් රූපාලම්බනය, සද්දාලම්බනය, ගන්ධාලම්බනය, රසාලම්බනය, ඵොට්ඨබ්බාලම්බනය, ධම්මාලම්බනය යන මොහු ය. මොවුන්ගේ ආකාර හා ඒ ඒ අරමුණු ගෙන පවත්නා සිත් එහි ම (ආලම්බන සංග්‍රහයෙහි) දක්වන ලද්දේය. (ප්‍රකීර්ණක පාද 11 වන පාඩම බලනු.)

4. විඤ්ඤණ සය නම් චක්ඛු විඤ්ඤාණය, සොත විඤ්ඤාණය, ඝාණ විඤ්ඤාණය, ජිව්හා විඤ්ඤාණය, කාය විඤ්ඤාණය, මනො විඤ්ඤාණය යන මොහුය. චක්ඛු විඤ්ඤාණ නම් චක්ඛු විඤ්ඤාණ සිත් දෙක ය. සොත විඤ්ඤාණ නම් සොත විඤ්ඤාණ සිත් දෙක ය. ඝාණ විඤ්ඤාණ නම් ඝාණ විඤ්ඤාණ සිත් දෙක ය. ජිව්හා විඤ්ඤාණ නම් ජිව්හා විඤ්ඤාණ සිත් දෙක ය. කාය විඤ්ඤාණ නම් කාය විඤ්ඤාණ සිත් දෙක ය. මනො විඤ්ඤාණ නම් මේ චක්ඛු විඤ්ඤාණාදි සිත් දසය හැර සෙසු එකුන් අසූව (79) ක් සිත් ය.

5. වීථි සය නම් ද්වාර වශයෙන් නම් ලත් චක්ඛුද්වාර වීථිය, සොතද්වාර වීථිය, ඝාණද්වාර වීථිය, ජිව්හා ද්වාර වීථිය, කායද්වාර වීථිය, මනොද්වාර වීථිය යන මොහු ය. චක්ඛුද්වාර වීථි නම් රූප අරමුණු කොට ගෙන චක්ඛු ද්වාරයෙහි පවත්නා චිත්ත පරම්පරාව ය. සෙසු වීථි ද මෙසේ ය. මේ වීථි සය ම විඤ්ඤාණ වශයෙන් නම් ගත් කල චක්ඛු විඤ්ඤාණ වීථිය, සොත විඤ්ඤාණ වීථිය, ඝාණ විඤ්ඤාණ වීථිය, ජිව්හා විඤ්ඤාණ වීථිය, කාය විඤ්ඤාණ වීථිය, මනො විඤ්ඤාණ වීථිය යි ද කියනු ලැබේ. චක්ඛු විඤ්ඤාණ, සම්බන්ධයෙන් පවත්නා චිත්ත පරම්පරාව චක්ඛු විඤ්ඤාණ වීථිය යි. සෙස්ස ද මෙසේ ය.

6. විෂය ප්‍රවෘත්ති සය නම් පඤ්චද්වාරය පිළිබඳ වැ පවත්නා අතිමහන්ත, මහන්ත, පරිත්ත, අතිපරිත්ත යන සතර හා මනොද්වාරය පිළිබඳ වැ පවත්නා විභූත, අවිභූත යන දෙක යි. විෂය නම් අරමුණ ය, ප්‍රවෘත්ති නම් පැවැත්ම ය. අරමුණු පිළිබඳ පැවැත්ම විෂය ප්‍රවෘත්ති යි.

අරමුණු වනාහි රූපාදි වශයෙන් සවැදෑරුම් බව යට කියන ලදි. ඔවුන් අතුරෙන් රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ යන අරමුණු පස චිත්තක්‍ෂණ සතළොස (17) සතළොස ආයු ඇත්තේ ය. මේ පස පමණක් නො වේ. අටවිසි රූප අතුරෙන් විඤ්ඤත්ති රූප දෙක ය. ලක්‍ෂණ රූප සතර ය යන රූප සය හැර සෙසු දෙවිසි රූප ම, චිත්තක්‍ෂණ සතළොස බැගින් ආයු ඇත්තේය. "**තංසත්තරස චිත්තායු විනා විඤ්ඤත්ති ලක්ඛණා**" යනු එහෙයින් කියන ලදී.

එක් චිත්තක්‍ෂණයක් ඉක්මැ චිත්තක්‍ෂණ සොළොසක් ආයු ඇති වැ ආපාතගත වන (-හමු වන) අරමුණ **අති මහන්තය**. චිත්තක්‍ෂණ දෙකක් හෝ තුනක් ඉක්මැ පසළොස් හෝ තුදුස් චිත්තක්‍ෂණ ආයු ඇතිවැ ආපාතගත වන අරමුණ **මහන්තය**. චිත්තක්‍ෂණ සතර පටන් නවය දක්වා ඉක්මැ තෙළස (13) පටන් අට දක්වා ආයු ඇති වැ ආපාතගත වන අරමුණ **පරිත්තය**. චිත්තක්‍ෂණ දසයේ පටන් පසළොස දක්වා ඉක්මැ චිත්තක්‍ෂණ සතේ පටන් දෙක දක්වා ආයු ඇති වැ ආපාතගතවන අරමුණ **අතිපරිත්ත** යි. මෙය මතු ද පැහැදිලි වන්නේ ය.

ධම්මාරම්මණයෙහි අතිමහන්තාදි භේද නැත. එහි ඇත්තේ විභූත අවිභූත භේදය යි. විභූත නම් අරමුණේ ප්‍රකට භාවයයි. අවිභූත නම් අරමුණේ අප්‍රකට භාවය යි. මෙතෙකින් ෂට්ක සය සැකෙවින් දක්වන ලදි.

**ප්‍රශ්න.**

1. ප්‍රවෘත්ති සංග්‍රහය යනු කිම? එය කී ආකාරයකට බෙදෙන්නේ ද? මෙහි දැක්වෙනුයේ කවර ප්‍රවෘත්ති සංග්‍රහයෙක් ද?
2. ෂට්ක සය දක්වනු.
3. වස්තු, ද්වාර, ආරම්මණ, විඤ්ඤාණ, සය හා ඔවුන් පිළිබඳ සිත් දක්වනු.
4. වීථි සය කෙසේද? චක්ඛුවාර වීථි, චක්‍ෂුර්විඥාන වීථි දෙකේ වෙනස කිම?
5. විෂය ප්‍රවෘත්ති සය දක්වනු. අතිමහන්ත, මහන්ත, පරිත්ත, අතිපරිත්ත විෂය ප්‍රවෘත්ති පිළිබඳ රූපයන්ගේ ආයුෂ කෙතෙක් කෙතෙක් ද? විභූත, අවිභූත පැහැදිලි කරනු.

## 2. චක්ඛුද්වාරික අතිමහන්තාරම්මණ චිත්ත වීථිය.

රූපාරම්මණය චිත්තක්ෂණ සතළොසක් ආයු ඇති බව යට කියන ලදි. ඒ කීයේ මහා චිත්තක්ෂණ සඳහා ය. එක් මහා චිත්තක්ෂණයෙක උත්පාද, ස්ථිති, භඞ්ග යන කුඩා චිත්තක්ෂණ තුනෙක් ඇත්තේය. සිතෙක උපදින ඇසිල්ල උත්පාද ය. පවතින ඇසිල්ල ස්ථිති ය. බිඳෙන ඇසිල්ල භඞ්ග යි. එවිට රූපාරම්මණය කුඩා චිත්තක්ෂණ එක්පණසෙක (51) ආයු ඇති බව දත යුතු. එහෙත් මතු රූපායුෂ ගණිනු ලබන්නේ මහාචිත්තක්‍ෂණයන්ගේ වශයෙන් ය.

රූප ද ඉපිද තිබී නැති වන්නේය. සිත් ද ඉපිද තිබී නැති වන්නේය. රූප ගරු පරිණාම ය. සිත් ලඝු පරිණාම යි. එක් වරක් උපන් රූපය සිත සතළොස් වරක් ඉපිද තිබී නැති වන තාක් පැවත සතළොස් වන චිත්තයාගේ භඞ්ගක්‍ෂණය සමගම නැති වන්නේ ය. රූපයට මහාචිත්තක්‍ෂණ සතළොසක් හෝ කුඩා චිත්තක්‍ෂණ එක් පණසක් ආයු ඇතැ යි කීයේ මේ නිසාය.

සතළොස් චිත්තක්ෂණයක් ආයු ඇති රූපයාගේ ප්‍රථම චිත්තක්ෂණාවස්ථාව චක්‍ෂුර්ද්වාරයට අරමුණු නොවේ. එක් චිත්තක්ෂණයක් හෝ චිත්තක්ෂණ බොහෝ ගණනක් හෝ ඉක්මැ ගිය ස්ථිති අවස්ථාව ම අරමුණු වේ. මෙහි දී වනාහි එක් චිත්තක්ෂණයක් ඉක්මැ ගිය රූපය චක්‍ෂුර්ද්වාරයට අරමුණු වූයේ ය යි සලකනු. අරමුණු වීම එක් ක්‍රමයෙක හැපීමෙකි. රූපය චක්‍ෂුඃප්‍රසාදයෙහි හැපෙත් ම හෘදය වස්තුව නිසා පැවැති භවඞ්ග සන්තතිය චලනය වන්නේය. ඒ සමග ම භවඞ්ග සන්තතිය සිඳී ද යන්නේය. මෙහි චලනයට **භවඞ්ග චලනය** යි ද, සිඳීමට **භවඞ්ගුපච්ඡේදයයි** ද කියති. සැලුණාත් සිඳුණාත් ඔව්හු භවඞ්ගයෝ ම ය. ඔවුන්ගේ අරමුණ පූර්ව වූ කර්ම හෝ කර්මනිමිති හෝ ගති නිමිති ය. මේ රූපය නො වේ. කියයුත්තෙක් ඇති. රූපය ඇසේ හැපුණාම හෘදයවස්තුව නිසා පවත්නා සිත සෙලවී සිඳෙන්නට හේතු කිම? ඔවුන්ගේ ඒකාබද්ධ බව ය. බෙරේ එක් තලයෙක තිබෙන හකුරු කැබැල්ලේ වසා සිටින මැස්සා අනික් තලයට ගැසූ කල ඉගිලී යන්නේ එහි ඒකාබද්ධ බව නිසාය. එමෙන් රූපය චක්ෂුඃ ප්‍රසාදයේ හැපුණු කළ ඒ ප්‍රසාදය ඇසුරු කොටැ පවත්නා භූත රූප ද සැලෙන්නේ ක්‍රමයෙන් හෘදය වස්තු රූපය ද සැලෙන්නේය. එවිට එහි පවත්නා භවඞ්ග සන්තතිය ද සැලී සිඳී යන්නේය.

මධ්‍යයෙහි විශාල වීදුරු ටැඹක් හා අවට වීදුරු ටැම් පසක් ඇති ශාලායෙකි. අවට වීදුරු ටැඹෙහි වැද ගන්නා රූපච්ඡායාව මැද වීදුරු ටැඹෙහි ද වැද ගන්නාසේ චක්‍ෂුරාදි ද්වාරයන්හි වැද ගන්නා අරමුණ මනො ද්වාරයෙහි ද වැද ගන්නේය යනු මෙහිලා ඇතැම් මතයෙකි.

භවඞ්ග සන්තතිය චලනය කරන අරමුණු ගන්නා ද්වාර පසෙකි. එයින් කවර ද්වාරයෙකින් මේ චලනය වී දැ යි ආවර්ජනය කරන **පංචද්වාරාවර්ජන චිත්තය** ඉක්බිති වැ ඉපිද නිරුද්ධ වන්නේය. (මෙය අහේතුක ක්‍රියා චිත්තයෙකි.) තදනන්තරවැ ඒ රූපය දර්ශනය කරන **චක්ඛුවිඤ්ඤාණ චිත්තය** ද, ඒ රූපය ම පිළිගන්නා **සම්පටිච්ඡන චිත්තයද**, ඒ රූපය ම තීරණය කරන සන්තීරණ චිත්තය ද, එය ම ව්‍යවස්ථා කරන **වොත්‍ථපන චිත්තය** ද පිළිවෙලින් ඉපිද නිරුද්ධ වන්නේය.

මෙහි දු කිය යුත්තෙක් ඇත. ඒ අරමුණු වූ රූපය ඉෂ්ට එකක් නම් යථොක්ත **චක්ඛුවිඤ්ඤාණ, සම්පටිච්ඡන සන්තීරණ** කුශල විපාකය ය. එහි දු අති ඉෂ්ට නම් සන්තීරණය සෝමනස්ස සහගත ද වේ. ඒ අරමුණ අනිෂ්ට එකක් නම් යථොක්ත චක්ඛුවිඤ්ඤාණ, සම්පටිච්ඡන, සන්තීරණ අකුශල විපාකයි. වොත්‍ථපනය වනාහි ඉෂ්ට අනිෂ්ට දෙතන්හිම පඤ්චද්වාරාවර්ජනය මෙන්ම ක්‍රියා සිතෙකි. (**චිත්ත පාදයේ අහේතුක සිත් බලනු.**)

වොත්‍ථපනයට අනතුරු වැ ඒ රූපය ම අරමුණු කොට ගෙන එකුන්තිස් කාමාවචර ජවන් අතුරෙන් යම් කිසි ජවනයෙක් සත්වරෙක ඉපිද නිරුද්ධ වන්නේය. ඒ එසේ මැ යි. ඒ රූපය අයොනිසො මනසිකාරයෙන් ලෝභාදී වශයෙන් ගත්තු නම් අකුශල ජවන් දොළොසින් යම් කිසි ජවනයෙක් ද, යෝනිසො මනසිකාරයෙන් අලෝභාදී වශයෙන්

ගත්තු නම් කාමාවචර කුශල ජවන අටින් යම් කිසි ජවනයෙක් ද, රහතන්ට නම් එහි ම ක්‍රියා ජවන නවය අතුරෙන් යම් කිසි ජවනයෙක් ද දිවේ.

ජවන් සිත ඉපිද නිරුද්ධ වූ කල්හි දු ඒ රූපය පිළිබඳ තව චිත්තක්ෂණ දෙක ආයුෂ ශේෂය. ඒ අරමුණු කොට ගෙන එකොළොස් තදාලම්බන අතුරෙන් එකක් දෙ වරෙක ඉපිද නිරුද්ධ වේ. එවිට ම රූපය ද නිරුද්ධ වේ. චිත්තය භවඞ්ග සන්තතියට බස්නේය. තදාලම්බන ද විපාක සිත් බව දත යුතුයි. ඒ පිළිබඳ නියමයෙක් මතු පාඩමෙක දැක්වේ.

මෙසේ චක්‍ෂුඃප්‍රසාදයේ හැපෙන්නට පළමු ඉකුත් වූ 1-චිත්තක්ෂණය, 2-භවඞ්ග චලන, 3-භවඞ්ගුපච්ඡේද පිළිබඳ ක්‍ෂණ දෙකය, 4-පඤ්චද්වාරාවර්ජන ක්‍ෂණය, 5-චක්ඛුවිඤ්ඤාණ ක්‍ෂණය, 6-සම්පටිච්ඡන ක්‍ෂණය, 7-සන්තීරණ ක්‍ෂණය, 8-වොත්ථපන ක්‍ෂණය, 9-10-11-12-13-14-15-ජවනක්‍ෂණ සතය, 16-17-තදාලම්බන ක්‍ෂණ දෙක ය යි රූපය පිළිබඳ ක්‍ෂණ සතළොස දත යුතුයි.

මේ චිත්ත වීථිය පැහැදිලි වැ අවබෝධ වනු සඳහා අම්බොපමාව දක්වනු ලැබේ.

එක් මිනිසෙක් එල දරන අඹ ගසක් යට හිස වසා පෙරවැ ගෙන නිදන්නේය. ආසනයෙහි අඹයෙක් වැටිණි. මිනිසා ඒ හඬින් පිබිද හිස වැසූ පොරෝනය ඉවත් කොටැ ඇස දල්වා බලා අඹය දැකැ එය ගෙන ඔබා සිඹැ පැසුණු බව දැනැ වළඳන්නේය. වළඳා අත්තයෙහි තලු ද මරා ගිලැ යලි දු හිස පෙරවැ නිදන්නේය. මිනිසා හිස වසා පෙරවැ ගෙන නිදන කාලය මෙනි භවඞ්ග කාලය. අඹය වැටුණු කාලය මෙනි රූපය චක්‍ෂුඃප්‍රසාදයේ හැපුණු කාලය. එයින් පිබිදි කාලය මෙනි පඤ්චද්වාරාවර්ජන කාලය. ඇස දල්වා බැලූ කාලය මෙනි සම්පටිච්ඡන කාලය. ඔබා බැලූ කාලය මෙනි සන්තීරණ කාලය. සිඹැ බැලූ කාලය මෙනි වොත්ථපන කාලය. වළඳන කාලය මෙනි ජවන කාලය. තලු මරා ගිලින කාලය මෙනි තදාරම්මණ කාලය. නැවැත හිස වසා පෙරවැ නිදන කාලය මෙනි යලි දු භවඞ්ග කාලය.

මේ ම තවත් පැහැදිලි වනු සඳහා වින්‍යාසයෙක් (සටහනෙක්) ද දක්වනු ලැබේ.

## 1. චක්ඛුද්වාරික අතිමහත්තාරමම්ණ චිත්ත වීථිය

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... |
| භ | ල | ඡෙ | ප | ච | සං | තී | වො | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | ත | ත | භ | භ |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | | |

මෙහි මුදුනේ රේඛාව රූපාරම්මණය දක්වනු සඳහා ය. තිත් තුන තුන එක මහා චිත්තක්‍ෂණයෙක පවත්නා උප්පාද, ඨිති, භඞ්ග යන කුඩා චිත්තක්‍ෂණ තුන සඳහා ය. තිත් පෙළ එකට ම ගෙන යායුතු වුව ද අවබෝධයට පහසු වනු පිණිස වෙන් කරන ලදි. භ-භවාඞ්ගය. (හෙද මෙහි අතීත භවඞ්ග යි) ල-භවඞ්ග චලනය. ඡෙ-භවඞ්ගුපච්ඡේදය. ප-

පඤ්චද්වාරාවර්ජනය. ච-චක්ඛුවිඤ්ඤාණය. සං-සම්පටිච්ඡනය. තී-සන්තීරණය. වො-වොත්ථපනය, ජ-ජවන. ත-තදාලම්බන. භ-යළි දු භවඞ්ගය.

භවඞ්ග, භවඞ්ග චලනය, භවඞ්ගුපච්ඡේදයන්ට මේ රූපය නො වැ පූර්ව වූ කර්ම, කර්මනිමිති, ගතිනිමිති අතුරෙන් එකක් අරමුණු වන බව දත යුතු. දෙ පස යට කුඩා ඉරි කැබලි දෙක එය දක්වනු සඳහායි. තදාලම්බන තෙක් ම සිත් ඉපදීමට ආයුෂ ඇති බැවින් මෙය **අතිමහන්තාරම්මණ චිත්ත වීථිය** නම් විය. එ හෙයින් ම මෙයට තදාලම්බන වාරය යි ද කියනු ලැබේ.

සොතද්වාරික, ඝාණද්වාරික, ජිව්හද්වාරික, කායද්වාරික අතිමහන්තාරම්මණ චිත්ත වීථී ද මෙසේ ය. ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ අරමුණු කොට ගෙන මෙහි චක්ඛු විඤ්ඤාණය වෙනුවට සොතවිඤ්ඤාණ, ඝාණවිඤ්ඤාණ, ජිව්හාවිඤ්ඤාණ, කායවිඤ්ඤාණ ඉපදීම ම වෙනසි.

**ප්‍රශ්න.**

1. රූපයක ආයුෂ කෙතෙක් ද? මහාචිත්තක්ෂණ වශයෙන් හා කුඩා චිත්තක්ෂණ වශයෙන් දක්වනු.
2. චක්ෂුඃප්‍රසාදයේ රූපය හැපුණු විට හෘදය වස්තුවේ පැවැති සිත කෙසේ චලනය වේ ද? උදාහරණයෙකින් පැහැදිලි කරනු.
3. අතිමහන්තාරම්මණ චිත්ත වීථියේ සටහනක් අඳිනු.
4. අතිමහන්තාරම්මණ චිත්ත වීථිය පැවතෙන පිළිවෙල උදාහරණයෙකින් දක්වනු.
5. අතිමහන්තාරම්මණ චිත්ත වීථියේ සිත් කර්ම විපාක ක්‍රියා වශයෙන් වෙන් කරනු.

## 3. චක්ඛුද්වාරික මහන්තාරම්මණ චිත්ත වීථි.

එක් චිත්තක්ෂණයක් ඉක්ම ගිය රූපය චක්ෂුසට අරමුණු වීමෙන් "අතිමහන්තාරම්මණ චිත්ත වීථිය" ලැබුණු සැටි යට දක්වන ලද්දේය. මෙහි වනාහි චිත්තක්ෂණ දෙකක් තුනක් ඉක්ම යාමෙන් "**මහන්තාරම්මණ චිත්ත වීථි**" ලැබෙන සැටි දක්වනු ලැබේ.

1. චිත්තක්ෂණ දෙකක් ඉක්මැ ගිය පසළොස් චිත්තක්ෂණායුෂ්ක රූපයක් චක්ෂුර්ද්වාරයට ආපාතගත වූයේ යයි සලකනු. එවිට තුන්වන, සතර වන චිත්තක්ෂණාවස්ථායෙහි **භවඞ්ගචලන භවඞ්ගුපච්ඡේද** වේ. ඔවුනුදු භවාඞ්ග ම බැවින් ඔවුනට අරමුණු වන්නේ මේ රූපය නොව පූර්වකර්ම, කර්මනිමිති, ගතිනිමිති අතුරෙන් එකක් බව සැලකිය යුතු. පස් වන, සවන, සත් වන, අට වන, නව වන චිත්තක්ෂණාවස්ථායෙහි පඤ්චද්වාරාවර්ජන, **චක්ඛුවිඤ්ඤාණ, සම්පටිච්ඡන, සන්තීරණ, වොත්ථපන** උපදී. ඔවුන්ට අරමුණ මේ රූපය මැ

යි. එහි දු පඤ්චද්වාරාවර්ජනය ක්‍රියා සිතෙකි. චක්ඛුවිඤ්ඤාණ, සම්පටිච්ඡන, සන්තීරණ විපාක ය. එහි දු රූපය ඉෂ්ටනම් කුශල විපාක ය. අති ඉෂ්ට නම් සන්තීරණය සෝමනස්ස සහගත වේ. රූපය අනිෂ්ට නම් අකුශල විපාක යි. වොට්ඨපනය ක්‍රියා මාත්‍රයෙකි.

දස වන, එකොළොස් වන, දොළොස් වන, තෙළෙස් වන, තුදුස් වන, පසළොස් වන, සොළොස් වන චිත්තක්ෂණාවස්ථානයෙහි ඒ ම අරමුණු කරමින් ජවන් සත උපදී. මෙහි ජවන් ප්‍රත්‍යය ලත් පරිදි අකුශල හෝ කාමාවචර කුශල හෝ රහතනට ක්‍රියා හෝ වන බව දත යුතු.

තව ඇත්තේ රූපය පිළිබඳ එක් චිත්තක්ෂණ මාත්‍රයෙකි. එය අරමුණු කොට උපදිතොත් එක තදාලම්බනයක් උපදිත හැකිය. එහෙත් දෙකම උපදින්නට අරමුණ නො පොහොනේ නම් එකකු දු නො ඉපදීම තදාලම්බනයන්ගේ ධර්මතායෙකි. එබැවින් මෙහි තදාලම්බන එකකු දු නො ඉපිද සිත භවාඞ්ගයට බස්නේ ය. භවාඞ්ගයට අරමුණු වන්නේ මේ රූප ශේෂය නොව යට කී ලෙස කර්මාදීන් අතුරෙන් එකක් බව මෙහිදී ද සැලකිය යුතුයි.

තදාලම්බන නො ඉපිද ජවනවලින් අවසන් වූ බැවින් **මෙය චක්ඛුද්වාරික මහන්තාරම්මණ චිත්ත වීථිය** යි කියනු ලැබේ. එහෙයින් ම මෙයට **ජවන වාරය** යි ද කියත්.

අවසානයෙහි තලු මරා ගිලීම හැර සෙසු සියල්ල අම්බොපමායෙහි දැක්වුණු පරිදි යි. එහි වින්‍යාසය මෙසේය.

### චක්ඛුද්වාරික මහන්තාරම්මණ චිත්ත වීථිය-1

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... |
| භ | භ | ල | ඡෙ | පා | ච | සං | තී | වො | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | භ | භ |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | |

අවසානයෙහි තදාලම්බන එකක් උපදින්නට රූපයේ ආයුෂ ඇතිවත් එය නො ඉපිදැ භවඞ්ග වූ සැටි මෙයින් දත හැකිය. යටින් කුඩා ඉරි කැබැලි භවඞ්ගයන් ගේ අරමුණු දක්වනු සඳහා ය. සෙස්ස යට කී සේ යි.

2. චිත්තක්ෂණ තුනක් ඉක්ම තුදුස් (14) චිත්තක්ෂණායුෂ්කරූපයක් චක්ෂුර් ද්වාරයට ආපාතගත වූයේ යයි සලකනු. එවිට සතර වන, පස් වන චිත්තක්ෂණාවස්ථායෙහි භවඞ්ග චලන භවඞ්ගුපච්ඡේද වේ. සවන, සත් වන, අට වන, නව වන, දස වන, චිත්තක්ෂණාවස්ථායෙහි **පඤ්චද්වාරාවර්ජන, චක්ඛුවිඤ්ඤාණ, සම්පටිච්ඡන, සන්තීරණ, වොට්ඨපන** උපදී. එකොළොස් වන, දොළොස් වන, තෙළෙස් වන, තුදුස් වන, පසළොස් වන, සොළොස් වන, සතළොස් වන චිත්තක්ෂණාවස්ථායෙහි **ජවන්** සත උපදී.

චිත්තක්ෂණ සතළොස ඉක්මුණු හෙයින් රූපය නිරුද්ධ විය. තදාලම්බන උපදින්නට කැලම අවකාශ නැත්තෙන් සිත භවඞ්ග විය.

ජවනයෙන් අවසන් වූ බැවින් මෙ ද චක්ඛුද්වාරික මහන්තාරම්මණ චිත්ත වීථිය යි කියනු ලැබේ. එසේ ම ජවන ද්වාරය යි ද කිය යුතු. එහි වින්‍යාසය මෙසේ ය.

### චක්ඛුද්වාරික මහන්තාරම්මණ චිත්ත වීථිය-2

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... |
| භ | භ | භ | ල | ඡෙ | පං | ච | සං | තී | වො | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | භ | භ |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | | |

චිත්තක්ෂණ තුනක ආයු කාලය ඉක්ම ගිය රූපය චක්ෂුර්ද්වාරයෙහි හැපුණු බැවින් ජවන්වලින් ඔබ තදාලම්බන උපදින්නට අවකාශ නැති වූයෙන් සිත භවඞ්ගයට බැස්ස සැටි මෙයින් දත හැකිය. සෙස්ස යට කී සේයි.

විවිධ මහන්තාරම්මණ පිළිබඳ සොතද්වාරික, ඝාණද්වාරික, ජිව්හද්වාරික, කායද්වාරික චිත්ත වීථි අට ද මේ නයින් ම සැලකිය යුතු ය. ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ අරමුණු වූ කල්හි සොතවිඤ්ඤාණ, ඝාණවිඤ්ඤාණ, ජිව්හාවිඤ්ඤාණ, කාය විඤ්ඤාණ සිත් උපදීම ම වෙනසි.

### ප්‍රශ්න.

1. මහන්තාරම්මණය වන්නේ ප්‍රසාදයෙහි හැපෙන විට කෙතෙක් ආයු ඉක්මුණු කෙතෙක් ආයු ශේෂ රූප ද?
2. මහන්තාරම්මණ චිත්ත වීථි කී ආකාර ද? රූපය පිළිබඳ කොටැ වින්‍යාසයෙන් පැහැදිලි කරනු.
3. මහන්තාරම්මණයෙහි තදාලම්බන නූපදනේ කිම?
4. මහන්තාරම්මණ වීථියෙහි කර්ම විපාක ක්‍රියා වෙන් කරනු.
5. මෙයට නාමාන්තරයක් දක්වනු.

## 4. චක්ඛුද්වාරික පරිත්තාරම්මණ චිත්ත වීථි.

චිත්තක්ෂණ දෙකක් හෝ තුනක් ඉක්ම ගිය රූප චක්ෂුසට ආපාතගත වීමෙන් මහන්තාරම්මණ චිත්ත වීථි ලැබුණු සැටි යට දක්වන ලදී. චිත්තක්ෂණ සතරේ පටන් නවය

දක්වා ඉක්ම ගිය රූප චක්‍ෂුසට ආපාතගත වීමෙන් **පරිත්තාරම්මණ චිත්ත වීථි** ලැබෙන සැටි මෙහි දැක්වේ.

1. චිත්තක්‍ෂණ සතරක් ඉක්ම ගිය තෙළෙස් චිත්තක්‍ෂණායුෂ්ක රූපයක් චක්ෂුඃප්‍රසාදයේ හැපුණේය යි සලකනු. එවිට පස් වන, සවන චිත්තක්‍ෂණාවස්ථායෙහි **භවඞ්ගචලන, භවඞ්ගුපච්ඡෙද** වේ. සත් වන, අට වන, නව වන, දස වන, එකොළොස් වන චිත්තක්‍ෂණාවස්ථායෙහි **පඤ්චද්වාරාවර්ජන, චක්ඛුවිඤ්ඤාණ, සම්පටිච්ඡන, සන්තීරණ, වොත්ථපන** උපදී. තව චිත්තක්‍ෂණ සයෙක කාලය රූපයෙහි ශේෂ ය. එහි උපදුත් හොත් **ජවන** සයක් උපදිත හැකිය. ජවන සතම උපදින්නට රූපයේ ආයුෂ නැත්නම් එක ජවනයකු දු නො උපදීම ජවනයන්ගේ ධර්මතාව යි. එබැවින් මෙහි ලා එක ජවනයකු දු නො ඉපිද යට දැක්වුණු වොත්ථපනය ම දෙ තුන් වරක් ඉපිද සිත භවඞ්ගයට බසී. මෙහිදු භවඞ්ගයට අරමුණු වන්නේ ඒ රූප ශේෂය නොවැ පූර්ව වූ කර්මාදීන් අතුරෙන් එකක් බැව් සැලකිය යුතුයි. එහි වින්‍යාසය මෙසේ ය.

### චක්ඛුද්වාරික පරිත්තාරම්මණ චිත්ත වීථිය-1

| ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | භ | භ | භ | ල | ඡේ | පං | ච | සං | තී | වො | වො | වො | භ | භ | භ | භ |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 |

මෙහි වොත්ථපනයට අනතුරු වැ උපදිතොත් ජවන සයක් උපදින්නට රූපයේ ආයුෂ තිබේ. එහෙත් එක ජවනයකු දු නො ඉපිද වොත්ථපනය තුන් වරක් ඉපිද භවාඞ්ග වූ සැටි බලනු. මෙහි මුල සිත් සයට හා අග සිත් සතරට අරමුණු වූයේ මේ රූපය නො වැ පූර්ව වූ කර්මාදිය යි. යට ඉරි කැබලි දෙක එය පෙන්වන සඳහාය. මෙය ද ජවන් නූපන් බැවින් පරිත්තාරම්මණ චිත්ත වීථිය යි ද වොත්ථපනයෙන් අවසන් වූ බැවින් **වොත්ථපනවාරය** යි ද කියනු ලැබේ.

2. චිත්තක්‍ෂණ පසක් ඉක්ම ගිය දොළොස් චිත්තක්‍ෂණයට ආයු ඇති රූපයක් ආපාතගත වූ කල්හි දු ක්‍රමය මෙසේ ය. මේ වින්‍යාසය යි.

### චක්ඛුද්වාරික පරිත්තාරම්මණ චිත්ත වීථිය-2

| ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | භ | භ | භ | භ | ල | ඡේ | පං | ච | සං | තී | වො | වො | වො | භ | භ | භ |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 |

මෙහි දු වොත්ථපනයට අනතුරු වැ ජවන පසක් නම් උපදින්නට ආයුෂ තිබිණි. එහෙත් සත ම උපදින්නට රූපායුෂ මඳ බැවින් එකකු දු නො ඉපිද තුන් වරක් වොත්ථපනය ඉපිද

භවඞ්ගපාත වූ සැටි සලකනු. මෙ ද ජවන නූපන් බැවින් **පරිත්තාරම්මණ චිත්තවීථිය** යි ද **වොත්ථපනයෙන්** අවසන් වූ බැවින් **වොත්ථපනද්වාරයයි** ද කියනු ලැබේ.

3. චිත්තක්ෂණ සයක් ඉක්ම ගිය එකොළොස් චිත්තක්ෂණයකට ආයු ඇති රූපයක් ආපාතගත වූ කල්හි දු ක්‍රමය මෙසේ ය. මේ වින්‍යාසයයි.

### චක්ඛුද්වාරික පරිත්තාරම්මණ චිත්ත වීථිය-3

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... |
| භ | භ | භ | භ | භ | භ | ල | ජෙ | පං | ච | සං | තී | වො | වො | වො | භ | භ |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 |

මෙහි දු වොත්ථපනයට අනතුරු වැ ජවන සතරක් නම් උපදින්නට ආයුෂ තිබිණි. එහෙත් එකකු දු නො ඉපිද තෙවරක් වොත්ථපනය ම ඉපිද භවාඞ්ග වූ සැටි සලකනු. මෙ ද ජවන නූපන් බැවින් **පරිත්තාරම්මණ චිත්ත වීථිය** විය. වොත්ථපනයෙන් අවසන් වූ බැවින් **වොත්ථපන ද්වාරය** විය.

4. චිත්තක්ෂණ සතක් ඉක්මැ ගිය දස චිත්තක්ෂණයකට ආයු ඇති රූපයක් ආපාතගත වූ කල්හි දු මේ ක්‍රමය මැ යි. වින්‍යාසය මෙසේ යි.

### චක්ඛුද්වාරික පරිත්තාරම්මණ චිත්ත වීථිය-4.

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... |
| භ | භ | භ | භ | භ | භ | භ | ල | ජෙ | පං | ච | සං | තී | වො | වො | වො | භ |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 |

මෙහි දු වොත්ථපනයට අනතුරු වැ ජවන තුනක් නම් උපදින්නට ආයු ඇත. එහෙත් එකකුදු නො ඉපිද තුන් වරක් වොත්ථපනය වැ භවාඞ්ග විය. මෙ ද ජවන නූපන් බැවින් **පරිත්තාරම්මණ චිත්ත වීථිය** ය. වොත්ථපනයෙන් අවසන් වූ බැවින් **වොත්ථපනවාරය** යි.

5. චිත්තක්ෂණ අටක් ඉක්ම ගිය නවචිත්තක්ෂණායුෂ්ක රූපයක් ආපාතගත වූයේ ය යි සලකනු. එවිට ද මේ ක්‍රමය මැයි. වින්‍යාසය මෙසේ ය.

### චක්ඛුද්වාරික පරිත්තාරම්මණ චිත්ත වීථිය-5.

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... |
| භ | භ | භ | භ | භ | භ | භ | භ | ල | ජෙ | පං | ච | සං | තී | වො | වො | වො | භ |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | |

මෙහි දු වොත්‍ථපනයට අනතුරු වැ ජවන දෙකක් උපදින්නට රූපයේ ආයුෂ ඇත. එහෙත් එකකු දු නො ඉපිද වොත්‍ථපනය තුන් වරක් ඉපිද භවාඞ්ග විය. මෙ ද යට දැක්වුණු සේ **පරිත්තාරම්මණ චිත්ත වීථියයි. වොත්‍ථපන ද්වාරය** යි.

6. චිත්තක්‍ෂණ නවයක් ඉක්ම අෂ්ටචිත්තක්‍ෂණායුෂ්ක රූපයක් ආපාතගත වූ කල්හි දු මේ ක්‍රමය මැ යි. වින්‍යාසය මෙසේ ය.

### චක්ඛුද්වාරික පරිත්තාරම්මණ චිත්ත වීථිය-6.

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... |
| භ | භ | භ | භ | භ | භ | භ | භ | භ | ල | ඡේ | පං | ච | සං | තී | වො | වො | භ |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | |

මෙහි වොත්‍ථපනයට අනතුරු වැ එක ජවනයක් උපදින්නට ආයු ඇතත් එය නො ඉපිද තව වරක් වොත්‍ථපනය වැ භවාඞ්ග විය. මෙය **පරිත්තාරම්මණ චිත්ත වීථිය** ය. **වොත්‍ථපන වාරය** යි.

වොත්‍ථපනය දෙ වරක් උපදින්නට රූපයේ ආයු මඳ නම් එක වොත්‍ථපනයකු දු නො ඉපිද භවාඞ්ග චලනය පමණක් වැ නැවත භවාඞ්ගයට ම බස්නේය. එහි පිළිවෙල මතු පාඩ මෙන් දක්වනු ලැබේ. සොතද්වාරිකාදි පරිත්තාරම්මණ වීථී ද මෙසේ ය.

### ප්‍රශ්න.

1. පරිත්තාරම්මණ චිත්ත වීථී කෙතෙක් ද?
2. පරිත්තාරම්මණ වන්නේ කෙතෙක් ආයු ශේෂ රූප චක්ෂුඃප්‍රසාදයේ හැපීමෙන් ද?
3. චිත්තක්‍ෂණ සයක් ඉක්ම ගිය රූපය ප්‍රසාදයේ හැපුණු විට ලැබෙන චිත්ත වීථියෙක වින්‍යාසය අඳිනු.
4. පරිත්තාරම්මණ චිත්ත වීථියෙහි කර්ම විපාක ක්‍රියා ලැබෙන පමණින් වෙන් කොට දක්වනු.
5. චිත්තක්‍ෂණ සතක් ශේෂ රූපයෙක පරිත්තාරම්මණ නො ලැබෙන්නේ කිම?

## 5. චක්ඛුද්වාරික අතිපරිත්තාරම්මණ චිත්ත වීථි.

චිත්තක්‍ෂණ සතරේ පටන් නවය දක්වා ආයු ඉක්මැ ගිය රූප ආපාතගත වීමෙන් **පරිත්තාරම්මණ චිත්ත වීථී** ලැබුණු සැටි යට දක්වන ලදී, චිත්තක්‍ෂණ දසයේ පටන්

පසළොස දක්වා ඉක්ම ගිය රූප ආපාතගත වීමෙන් ලැබෙන අතිපරිත්තාරම්මණ චිත්ත වීථි මෙහි දක්වනු ලැබේ.

1. චිත්තක්ෂණ දසයක් ඉක්ම ගිය සප්ත චිත්තක්ෂණායුෂ්ක රූපයෙක් චක්ෂුර්ද්වාරයට ආපාතගත වූයේයයි සලකනු. එවිට එකොළොස් වන චිත්තක්ෂණාවස්ථායෙහි භවාඞ්ග චලන වේ. මතු වොත්ථපන දෙකක් වත්න උපදින තෙක් රූපය නො පවතින බැවින් ඉන් ඔබ භවඞ්ගු පච්ඡේදාදි කිසි වෙනසකට නො පැමිණැ යළි දු සිත භවාඞ්ගයට ම බස්නේ ය. එහි වින්‍යාසය මෙසේ යි.

## චක්ඛුද්වාරික අතිපරිත්තාරම්මණ චිත්ත වීථිය-1.

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ... | .... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... |
| භ | භ | භ | භ | භ | භ | භ | භ | භ | භ | න | භ | භ | භ | භ | භ | භ |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 |

මෙහි එකොළොස් වැන්න භවඞ්ග චලන වූ සැටි ද, සෙස්ස භවඞ්ග ම වූ සැටි ද බලනු. රූපය ඇසේ හැපුණා විනා ඒ අරමුණ කොට එක වීථි සිතෙක් වත් නූපන්නේ ය. භවඞ්ග චලන ද භවඞ්ග ම බැවින් ඒ සියල්ලට අරමුණු වූයේ පූර්ව කර්මාදීන් අතුරෙන් එකකි. මේ රූපය නො වේ. එය දක්වනු පිණිස යට රේඛාව සම්පූර්ණ කොට යොදන ලදි. මෙයට වීථි යන නාමය ලැබෙන්නේ අමුඛ්‍ය වශයෙනි. එක වීථි සිතකුදු නූපන් බැවිනි. එහෙයින් ම මෙයට මොඝ ද්වාරය යි කියනු ලැබේ.

2. චිත්තක්ෂණ එකොළොසක් ඉක්ම ගිය ෂට් චිත්තක්ෂණායුෂ්ක රූපයක් ආපාතගත වූ කල්හි දු ක්‍රමය මෙසේ ය. මේ වින්‍යාසය යි.

## චක්ඛුද්වාරික අතිපරිත්තාරම්මණ චිත්ත වීථිය-2.

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... |
| භ | භ | භ | භ | භ | භ | භ | භ | භ | භ | භ | න | භ | භ | භ | භ | භ |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 |

මෙහි දොළොස් වැන්න භවඞ්ග චලනය විය. සෙස්ස යට කී සේ යි.

3. චිත්තක්ෂණ දොළොසක් ඉක්ම ගිය පඤ්ච චිත්තක්ෂණායුෂ්ක රූපයක් ආපාතගත වූ කල්හි දු මේ ක්‍රමය මැ යි. වින්‍යාසය මෙසේ ය.

## චක්ඛුද්වාරික අතිපරිත්තාරම්මණ චිත්ත වීථිය-3.

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... |

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | භ | භ | භ | භ | භ | භ | භ | භ | භ | භ | භ | න | භ | භ | භ | භ |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 |

මෙහි තෙළෙස් වැන්න භවඞ්ග චලනය විය. සෙස්ස යට කී සේ යි.

4. චිත්තක්‍ෂණ තෙළෙසක් ඉක්ම ගිය චතුශ් චිත්තක්‍ෂණායුෂ්ක රූපයක් ආපාතගත වූ කල්හි දු මේ ක්‍රමය මැ යි. වින්‍යාසය මෙසේ ය.

## චක්ඛුද්වාරික අතිපරිත්තාරම්මණ චිත්ත වීථිය-4.

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... |
| භ | භ | භ | භ | භ | භ | භ | භ | භ | භ | භ | භ | භ | න | භ | භ | භ |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 |

මෙහි තුදුස් වැන්න භවඞ්ග චලනය විය. සෙස්ස යට කී සේ යි.

5. චිත්තක්‍ෂණ තුදුසක් ඉක්ම ගිය ත්‍රිද්වීත්තක්‍ෂණායුෂ්ක රූපයක් ආපාතගත වූ කල්හි දු මේ ක්‍රමය මැ යි. වින්‍යාසය මෙසේය.

## චක්ඛුද්වාරික අතිපරිත්තාරම්මණ චිත්ත වීථිය-5.

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... |
| භ | භ | භ | භ | භ | භ | භ | භ | භ | භ | භ | භ | භ | භ | න | භ | භ |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 |

මෙහි පසළොස් වැන්න භවඞ්ග චලනය විය. සෙස්ස යට කී සේ යි.

6. චිත්තක්‍ෂණ පසළොසක් ඉක්ම ගිය ද්විචිත්තක්‍ෂණායුෂ්ක රූපයක් ආපාතගත වූ කල්හි දු මේ ක්‍රමය මැ යි. වින්‍යාසය මෙසේ යි.

## චක්ඛුද්වාරික අතිපරිත්තාරම්මණ චිත්ත වීථිය-6.

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... |
| භ | භ | භ | භ | භ | භ | භ | භ | භ | භ | භ | භ | භ | භ | භ | න | භ |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 |

මෙහි දොළොස් වැන්න භවාඞ්ග චලනය විය. සෙස්ස යට දැක්වුණු පරිදි මැ යි.

චිත්තක්‍ෂණ සොළොසක් ඉක්ම ගිය එක චිත්තක්‍ෂණික රූපයෙක් චක්‍ෂුර්ද්වාරයට ආපාතගත නො වේ. රූපයාගේ භඞ්ගාවස්ථාව බැවිනි. සතළොස් චිත්තක්‍ෂණ ඉක්මැ ගිය රූපය කිසිසේත් චක්‍ෂුර්ද්වාරයට ආපාතගත නො වේ. රූපය ම නැති බැවිනි.

සොතද්වාරිකාදී අතිපරිත්තාරම්මණ චිත්ත වීථීන්ගේ පැවැත්ම ද මෙසේ මැ යි.

යට දැක්වුණු චිත්ත වීථීන්හි සාමාන්‍ය වශයෙන් බලත් හොත් ඒ ඒ අවස්ථානුරූප වැ ඇත්තේ; 1-පඤ්ච ද්වාරාවර්ජනය. 2-චක්ඛුවිඤ්ඤාණය, 3-සම්පටිච්ඡනය, 4-සන්තීරණය, 5-වොත්‍ථපනය, 6-ජවනය, 7-තදාලම්බනයයි වීථි සිත් සතෙකි. විශේෂ වශයෙන් බලත් හොත් 1-පඤ්චද්වාරාවර්ජනය, 2-චක්ඛු විඤ්ඤාණය, 3-සම්පටිච්ඡනය, 4-සන්තීරණය, 5-වොත්‍ථපනය, 6-7-8-9-10-11-12-ජවන් සත ය. 13-14-තදාලම්බන දෙක යයි වීථි සිත් තුදුසෙකි. විස්තර වශයෙන් බලත් හොත් පඤ්චද්වාරාවර්ජනය චක්ඛුවිඤ්ඤාණාදි දසය, සම්පටිච්ඡන යුගලය, සන්තීරණ ත්‍රිකය, වොත්‍ථපන සඞ්ඛ්‍යාත මනොද්වාරාවර්ජනය, අකුසල් දොළොස කාමාවචර කුසල අට එම සහේතුක ක්‍රියා අට සහ හසිතුප්පාද යන එකුන් විසි ජවනය, සහේතුක විපාක වූ තදාලම්බන අට ය යන කාමාවචර සිත් සූපණස (54) යි. සෙසු තදාලම්බන තුන සන්තීරණ ත්‍රිකයට ඇතුළත් වූ බව දත යුතු යි.

**"වීථිචිත්තානි සත්තෙව චිත්තුප්පාද චතුද්දස**
**චතුපඤ්ඤසවිත්‍ථාරා පඤ්චද්වාරෙ යථාරහං."**

පඤ්චද්වාරයෙහි සුදුසු පරිදි වීථි සිත් සතෙකි. විශේෂයෙන් තුදුසෙකි. විස්තර වශයෙන් සූපණසෙකි.

ප්‍රශ්න.

1. අතිපරිත්තාරම්මණ චිත්ත වීථි කෙතෙක් ද? වෙන් වශයෙන් පැහැදිලි කර දක්වනු.
2. චිත්තක්‍ෂණ තෙළෙසක් ඉක්ම ගිය රූපාරම්මණයක් පිළිබඳ චිත්ත වීථියක් අඳිනු. එහි කර්ම ඇත් ද?
3. මෙහි සාමාන්‍ය වීථි සිත් කෙතෙක් ද? කවරහු ද?
4. විශේෂයෙන් බලත් හොත් පඤ්චද්වාරය පිළිබඳ වීථි සිත් කෙතෙක් ද? කවරහු ද?
5. හසිතුප්පාදය ජවන වන සැටියෙන් අතිමහන්තාරම්මණ වීථියක් ඇඳ එහි විපාක දක්වනු.

# 6. පරිත්ත මනොද්වාරික චිත්ත වීථි.

මනොද්වාරික චිත්ත වීථි වනාහි **පරිත්ත චිත්ත වීථිය, අර්පණා චිත්ත වීථිය** යි දෙ වැදැරුම් වේ. **පරිත්ත චිත්ත වීථි** නම් කාමාවචර චිත්ත වීථි ය. **අර්පණා චිත්ත වීථි** නම් රූපාවචර

අරූපාවචර ලෝකෝත්තර චිත්ත වීථි යි. ඔවුන් අතුරෙන් මෙහි කාමාවචර මනොද්වාරික චිත්ත වීථි දක්වනු ලැබේ. පඤ්චද්වාරික චිත්ත වීථි මුළුල්ල පරිත්ත ම බැවින් මේ භේදය එහි නො දැක්වුණු බව දත යුතු යි.

මනොද්වාරයෙහි අරමුණ ධර්මාරම්මණය යි. එය අතීත අනාගත කාලවිමුත්තාදි වශයෙන් ද පවත්නා බැවින් රූපාදියෙහි මෙන් එකචිත්තක්ෂණාතීත ද්විචිත්තක්ෂණාතීතකාදි භේද එහි නැත්තේය. ඇත්තේ **විභූත අවිභූත** භේදයයි. **විභූත** නම් තමහට ප්‍රකට වූ අරමුණය. **අවිභූත** නම් අප්‍රකට වූ අරමුණ යි.

1. විභූතාරම්මණයක් මනොද්වාරයට ආපාතගත වූයේ ය යි සලකනු. එවිට ම භවඞ්ග සන්තතිය සැලී සිඳෙන්නේය. සැලීමට පෙර සේ භවඞ්ග චලනය යි ද සිඳීමට භවඞ්ගුපච්ඡේදය යි ද කියති. (ඔවුන්ගේ අරමුණ කර්මාදීන් අතුරෙන් එකෙකි.) එවිට ම ඒ විභූතාරම්මණය අරමුණු කරමින් **මනොද්වාරාවර්ජනය** ඉපිද නිරුද්ධ වන්නේය. ඉක්බිති එම අරමුණු කරමින් **ජවන් සත** ඉපිද නිරුද්ධ වූ පසු **තදාලම්බන** දෙක උපදින්නේ ය. දෙවන තදාලම්බනයාගේ භඞ්ගක්ෂණය සමග ආරම්මණය නිරුද්ධ වේ. චිත්තය ද භවාඞ්ගයට බස්නේ යි. එහි වින්‍යාසය මෙසේ ය.

### 1. පරිත්ත මනොද්වාරික විභූතාලම්බන චිත්ත වීථිය

| ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | ල | ඡෙ | ම | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | ත | ත | භ | භ | භ | භ |

භ-භවඞ්ගය. එය ද මෙහි අතීත භවඞ්ග යි. ල-භවඞ්ග චලනය. ඡෙ-භවඞ්ගුපච්ඡෙදය. ම-මනොද්වාරා වර්ජනය. ජ-ජවන. ත-තදාලම්බන.

යට වීථිවල පඤ්චද්වාරාවර්ජන ස්ථානයෙහි මනොද්වාරය යෙදී තිබෙන සැටි ද චක්ඛුවිඤ්ඤාණන සම්පටිච්ඡනාදිය නැති වැ ජවන යෙදී තිබෙන සැටි ද සලකනු. එසේ ම මනෝද්වාරාවර්ජනය ම වොත්ථපන කෘත්‍යය සිද්ධ කෙරේ ය යි කී බැව් ද සිහිකරනු.

මනොද්වාරයට අරමුණු ලැබීම පිළිබඳ ටීකානුගත මතයෙක් මෙහි දක්වනු ලැබේ. මනොද්වාර වනාහි මිශ්‍ර **මනොද්වාරය. ශුද්ධමනොද්වාරය** යි ද්විවිධ වේ. චක්‍ෂුරාදියෙහි ගැටෙන අරමුණ සිතට ද අරමුණු වේ. එවිට ඒ සිත **මිශ්‍රමනොද්වාරය** යි. චක්‍ෂුරාදියෙහි ගැටීමෙන් තොර වැ සිත ම අරමුණු ගන්නාවිට ඒ සිත **ශුද්ධ මනොද්වාරය** යි. ඒ ශුද්ධමනොද්වාරය ද **පඤ්චද්වාරානුබන්‍ධය විසුංසිද්ධය** යි ද්විවිධ වේ. වර්තමාන රූපාදියක් අරමුණු කොට චක්‍ෂුර්ද්වාරිකාදි චිත්ත වීථි උපන් කල්හි ඒ රූපය ධම්මාරම්මණය වෙමින් නැවත සිය දහස් වර මනොද්වාරික චිත්ත වීථි නැවත පහළ වේ. ඝණ්ටාවට ගැසීමෙන් ලැබෙන ශබ්දයට අනුවැ නොයෙක් වර අනු රව සන්තතිය පවත්නා මෙනි. එය **පඤ්චද්වාරානුබන්‍ධ මනොද්වාර** යි. එසේ පඤ්චද්වාරානුබන්‍ධ නොවැ අරමුණු ලබන මනොද්වාරය විසු **සිද්ධ මනොද්වාරය** යි.

විසුංසිද්ධ මනොද්වාරය අරමුණු ලබන ආකාර කීපයෙකි. එනම් පෙර පඤ්චද්වාරයෙන් ගන්නා ලද අරමුණු වශයෙන් ඒ සමාන අරමුණු ලැබීම් වශයෙන්, අන්‍යයන්ගේ වචන ඇසීම් වශයෙන්, එසේ ඇසූ දෙයට සමාන දෙයක් වශයෙන් ඇදහීම් වශයෙන්, සිය කැමැති වශයෙන්, ආකාර පරිවිතර්ක වශයෙන්, දෘෂ්ටි වශයෙන්, නානා කර්මබල වශයෙන්, ඍද්ධිබල වශයෙන්, ධාතුක්‍ෂොභ වශයෙන්, දෙවතොපසංහාර වශයෙන්, අනුබොධ වශයෙන්, ප්‍රතිවෙධ වශයෙන් යනාදිය යි.

2. අවිභූතාලම්බනයෙක් මනොද්වාරයට ආපාතගත වූයේය යි සලකනු. එවිට ම භවඞ්ගචලන භවඞ්ගුපච්ඡෙද වැ ඒ අවිභූතාරම්මණය අරමුණු කරමින් මනොද්වාරාවර්ජන ජවන ඉපිද ඉක්බිති භවඞ්ග වේ. ආරම්මණය අවිභූත බැවින් තදාරම්මණ තාක් නො පවත්නේ ය. එහි වින්‍යාසය මෙසේය.

## 2. පරිත්ත මනොද්වාරික අවිභූතාලම්බන චිත්ත වීථිය.

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ... | .... | ... | ... | .... | ... | ... | .... | ... | ... | .... | ... | ... | .... | ... | ... | .... |
| භ | ල | ඡෙ | ම | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | භ | භ | භ | භ | භ | භ |

මෙහි ජවනාවසානයෙහි තදාලම්බන නො ඉපිදැ භවඞ්ග වූ සැටි බලනු.

මෙසේ පරිත්තමනොද්වාරික චිත්ත වීථීන්හි මනොද්වාරාවර්ජන, ජවන, තදාලම්බනය යි සාමාන්‍යයෙන් වීථි සිත් තුනෙකි. විශේෂයෙන් මනොද්වාරාවර්ජනය, ජවන් සතය, තදාලම්බන දෙකය යි වීථි සිත් දශයෙකි. විස්තර වශයෙන් බලත් හොත් පඤ්චද්වාරික වීථිවලට අයත් පඤ්චද්වාරාවර්ජන, දෙ පස් විඤ්ඤාණ සම්පටිච්ඡන යුගල යන සිත් තෙළෙස හැරැ සෙසු කාමාවචර සිත් එක සාළිස (41) ලැබේ. කියන ලද මැ යි:

**"වීථි චිත්තානි තීණෙව චිත්තුප්පාද දසෙරිතා**
**විත්‍ථාරෙන පනෙත්‍ථෙක චත්තාලිස විභාවයෙ"**

මෙහි වීථි සිත් තුනෙක් ද, චිත්තොත්පාද දසයෙක්ද කියන ලදි. විස්තර වශයෙන් එක් සාළිසක් කියන්නේ ය යනු භාව යි.

ඇතැම්හු පඤ්චද්වාරයෙහි මෙන් මනොද්වාරයෙහි ද තදාලම්බන වාර, ජවන වාර, වොත්‍ථපන වාර, මොඝ වාර ඇතැයි කියත්.

## ප්‍රශ්න.

1. මනොද්වාරික චිත්ත වීථි කී ආකාර ද? කවරහු ද?
2. මනොද්වාරික විභූත චිත්ත වීථියෙක වින්‍යාසය දක්වනු.

3. අවිභූත චිත්ත වීථියක් දක්වා එහි ජවන කෘත්‍යය විය හැකි සිත් මේ මේ ය යි දක්වනු.
4. මනොද්වාරයට අරමුණු ලැබීමේ පිළිවෙල දක්වනු.
5. පරිත්ත මනොද්වාරික වීථියෙක සාමාන්‍යයෙන් ද, විශේෂයෙන් ද, විස්තර වශයෙන් ද ඇතුළත් වන සිත් දක්වනු.

## 7. අර්පණා චිත්ත වීථි

පරිත්ත වීථි, අර්පණා වීථි වශයෙන් දෙ වැදෑරුම් වූ මනොද්වාරික චිත්ත වීථි අතුරෙන් පරිත්ත වීථියට දක්වන ලදි. මෙහි අර්පණා වීථි දක්වනු ලැබේ. අර්පණා වීථි නම් මහග්ගත ලෝකොත්තර චිත්ත වීථි යි. එ ද වනාහි අර්පණා වීථි, සමාපත්ති වීථි ය යි දෙවැදෑරුම් වේ. ආදි කාර්මිකයාගේ මහග්ගත ලෝකොත්තර චිත්ත වීථි අර්පණා වීථි ය. එහි දූ ඔහු ලබන මහග්ගත ලෝකොත්තර සිත් අර්පණා නම් වේ. ආදි කාර්මිකයා නම් පළමු වරට ධ්‍යාන, මාර්ග උපදවන්නා ය. එසේ ඉපදවූවෙක් නැවැත නැවැත ඒ ධ්‍යාන ඵලයන්ට සමවදින්නේ ද, එවිට ඒ සමාපත්ති වීථිය යි කියනු ලැබේ. මේ දෙ ආකාරය ම මතු දැක්වෙන බව සැලකිය යුතු යි.

මහග්ගත ලෝකොත්තර අර්පණා අතුරෙන් රූපාවචර කුශල ක්‍රියාවන්ගේ ද අරූපාවචර ප්‍රථම, තෘතීය කුශල ක්‍රියාවන්ගේ ද අරමුණ කසිණාදී පඤ්ඤත්තාලම්බනය. අරූපාවචර ද්විතීය, චතුර්ථ කුශල ක්‍රියාවන්ගේ අරමුණ මහග්ගතය. ලෝකොත්තරන මාර්ග ඵලයන්ගේ අරමුණ නිර්වාණය යි. (**ප්‍රකීර්ණක** පාදයේ ආලම්බන විභාගය බලනු.)

මේ අර්පණා ජවන ද්වාරයෙහි අරමුණ පිළිබඳ විභූත අවිභූත භේදයක් නැත. අරමුණ විභූත (-ප්‍රකට) ම බැවිනි. අප්‍රකට අරමුණෙහි අර්පණා ජවන නූපදනේය. ප්‍රකට අරමුණෙහි ම උපදනේය. අරමුණ විභූත වුව ද පරිත්ත මනොද්වාරික චිත්ත වීථියෙහි මෙන් තදාලම්බන නූපදනේය. තදාලම්බන උපදනේ කාමලෝකයෙහි කාමාවචර සත්ත්වයනට කාමාවචර අතිමහන්ත විභූත අරමුණෙහි මැ යි.

දැන් ප්‍රථමධ්‍යානය අර්පණා වන චිත්ත වීථියක් සඳහා කසිණාදි පඤ්ඤත්තාලම්බනයෙක් මනොද්වාරයට ආපාතගත වූයේය යි සලකනු. එවිට ම භවඞ්ග චලන භවඞ්ගුපච්ඡෙද වැ මනොද්වාරාවර්ජනය උපදනේය. මනොද්වාරාවර්ජනයට අනතුරු වැ එම අරමුණු කරමින් ඥාන සම්ප්‍රයුක්ත කාමාවචර ජවන අට (මෙය මතු පැහැදිලි වේ.) අතුරෙන් එකක් සතර වරක් උපදනේය. ඉන් පළමු වන ජවනය **පරිකර්මය** යි ද, දෙ වන ජවනය **උපචාරය** යි ද, තුන් වන ජවනය **අනුලෝමය** යි ද, සතර වන ජවනය **ගෝත්‍රභූය** යි ද කියනු ලැබේ. ගොත්‍රභූ ජවනය නිරුද්ධ වත් ම පස්වන ජවනය වශයෙන් ඒ පඤ්ඤත්තාලම්බනය ම අරමුණු කරමින් පුහුදුනෙකුට නම් පඨමජ්ඣාන කුසල චිත්තය උපදනේය. අර්පණා නම් එය යි. ඒ අර්පණාවසානයෙහි තව ජවන හෝ ආරම්මණය විභූත වුව ද තදාලම්බන හෝ ඉපිද සිත භවඞ්ග වන්නේය. එහි වින්‍යාසය මෙසේය.

## මන්ද පඤ්ඤයාගේ පඨමජ්ඣාන අප්පණා චිත්ත වීථිය.

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ... | ... | ... | ... | .... | ... | ... | .... | ... | ... | .... | ... | ... | .... | ... | ... | .... |
| භ | ල | ඡෙ | ම | ප | උ | අ | ගො | ඣා | භ | භ | භ | භ | භ | භ | භ | භ |

භ-භවඞ්ග. ල-භවඞ්ග චලන. ඡෙ-භවඞ්ගුපච්ඡෙද ම-මනොද්වාරාවර්ජන. ප-පරිකර්ම උ-උපචාර අ-අනුලොම. ගො-ගොත්‍රභූ ඣ-ඣාන. හෙද මෙහි පඨමජ්ඣාන යි.

**පරිකර්ම** නම් ඉන්‍ද්‍රිය සමතාදියෙන් අර්පණාව පිළියෙල කිරීමය. මේ ප්‍රථම ජවනය එසේ අර්පණාව පිළියලෙ කරන බැවින් එයට පරිකර්මය යි කියනු ලැබේ.

**උපචාර** නම් ඉතා ආසන්නත් නොවැ ඉතා දුරත් නොවැ සමීපයෙහි හැසිරීම ය. දෙවන ජවනය එසේ හැසිරෙමින් ඇසිල්ලෙකින් අර්පණාව ගෙන දෙන බැවින් උපචාරය යි කියනු ලැබේ.

**අනුලෝම** නම් අනුකූලව පැවැත්ම ය. තුන්වන ජවනය එසේ පවතිමින් අර්පණා උපදීමට විරුද්ධ ධර්ම නැති කරන බැවින් අනුලොමය යි කියනු ලැබේ. ඉන් ඔබ්බෙහි අර්පණා ලාභය නියතයි.

**ගොත්‍රභූ** නම් පරිත්ත හෝ පෘථග්ජන ගොත්‍ර මැඩීමය. නැතහොත් මහග්ගත හෝ ආර්ය ගොත්‍ර වැඩීම ය. මෙහි සතර වන ජවනය එබන්දක් බැවින් එයට ගොත්‍රභූය යි කියනු ලැබේ. ගොත්‍රභූ ළඟට ධ්‍යාන හෝ මාර්ග සිත් මැ යි. ආදි කාර්මිකයා නිසා ඣානයට අනතුරු වැ භවඞ්ග ඉපිද තිබෙන සැටි බලනු.

මේ පරිකර්මාදි සතරට ම ඇතැම් විටෙක පරිකර්මය යි ද උපචාරය යි ද, අනුලොමය යි ද කියනු ලැබේ. ගොත්‍රභූ නාමය එයට ම පමණකි.

තව ද මෙහි කිය යුත්තෙක් ඇත. මේ පරිකර්ම උපචාර, අනුලෝම, ගොත්‍රභූ නමින් උපදින ජවන් පුහුදුනට හා ශෛක්‍ෂයනට ඥානසම්ප්‍රයුක්ත කාමාවචර කුසල සිත් සතරින් එකෙක. රහත්නට ඤාණසම්පයුත්ත ක්‍රියා සිත් සතරින් එකෙකි. (මෙය මතු ද පැහැදිලි කරනු ලැබේ.)

මේ දැක්වුණේ මන්‍දපඤ්ඤයාගේ පඨමජ්ඣාන අප්පණා වීථිය යි. මන්‍දපඤ්ඤයා නම් තීක්‍ෂණ ඥාන තැනැත්තාය. ඔහුට පරිකර්ම නැති වැ ධ්‍යානය නො ලද හැකියි. එහෙයින් මේ චිත්ත වීථියේ පස්වන ජවනය ඣාන විය. පස්වන ජවනයෙන් ඔබ ජවනයෙක් කිසි විටෙක ඣාන නොවේ. භවාඞ්ගපාතයට ආසන්න බැවිනි.

තීක්‍ෂණ ප්‍රාඥහට වනාහි පරිකර්ම වුවමනා නැත. ඔහුට ඣාන චිත්ත වීථිය උපචාරයෙන් ම ආරම්භ කළ හැකිය. එවිට වින්‍යාසය මෙසේය.

### තික්ඛපඤ්ඤයාගේ පඨමජ්ඣාන අප්පණා චිත්ත වීථිය.

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ... | .... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... |
| භ | ල | ජේ | ම | උ | අ | ගො | ඣා | භ | භ | භ | භ | භ | භ | භ | භ | භ |

මෙහි මනොද්වාරාවර්ජනයට අනතුරු වැ පරිකර්ම නැති වැ මැ උපචාර යෙදී තිබෙන සැටි බලනු. එසේ ම සතර වන ජවනය ඣාන වූ සැටි ද සලකනු.

යට දැක්වුණේ මන්‍ද ප්‍රාඥ තීක්‍ෂණ ප්‍රාඥ පුද්ගලයන් දෙදෙනා පිළිබඳ අර්පණා වීථි යි. එසේ අර්පණා ප්‍රාප්ත පුද්ගලයා හෙවත් ප්‍රථමධ්‍යානය ලැබගත් පුද්ගලයා ඉදින් නැවත ඒ ප්‍රථමධ්‍යානයට සමවදිනු කැමැත්තේ නම් එසේ කළ හැකිය. එවිට ඒ පිළිබඳ උපදනා චිත්ත වීථිය **සමාපත්ති වීථිය** යි කියනු ලැබේ. හෙද ධ්‍යාන සම්බන්ධ බැවින් **ධ්‍යාන සමාපත්ති වීථිය** යි කියයුතු. සමාපත්ති වීථියෙහි දී අර්පණා වීථියෙහි දී මෙන් ඣානයට අනතුරු වැ සිත භවඞ්ග නො වැ දිගට මැ ඣාන වැ ම පවත්නේ ය. එසේ ඔහුට අතර භවඞ්ගයෙහි නො වැටී අහොරාත්‍රය (-රෑ දාවල් දෙක) ක් ඒ ධ්‍යාන චිත්ත පරම්පරාව පිට ම සිටිත හැකිය. එහි වින්‍යාස මෙසේය.

### මන්දපඤ්ඤයාගේ පඨමජ්ඣාන සමාපත්ති වීථිය

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... |
| භ | ල | ජේ | ම | ප | උ | අ | ගො | ඣා | ඣා | ඣා | ඣා | ඣා | ඣා | ඣ | ඣා | ඣා |

මන්දපඤ්ඤ බැවින් පරිකර්ම ලැබිණි. සමාපත්ති වීථිය බැවින් භවඞ්ග නො වැ දිගට ම ඣාන ලැබිණි.

### තික්ඛපඤ්ඤයාගේ පඨමජ්ඣාන සමාපත්ති වීථිය.

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... |
| භ | ල | ජේ | ම | උ | අ | ගො | ඣා | ඣා | ඣා | ඣා | ඣා | ඣා | ඣා | ඣා | ඣා | ඣා |

තික්ඛපඤ්ඤ බැවින් පරිකර්ම නැති වැ උපචාරයෙන් ම ආරම්භ විය. සමාපත්ති වීථිය බැවින් භවඞ්ග නො වැ ධ්‍යාන සිත් පරම්පරාව ම ලැබිණි.

මන්දපඤ්ඤ හෝ තික්ඛ පඤ්ඤ වූ දුතියජ්ඣානික තතියජ්ඣානික චතුත්ථජ්ඣානික පඤ්චමජ්ඣානික ආකාසානඤ්චායතනික විඤ්ඤාණඤ්චායතනික ආකිඤ්චඤ්ඤායතනික නෙවසඤ්ඤානාසඤ්ඤායතනික පුද්ගලයන් පිළිබඳ අර්පණා වීථි සමාපත්ති වීථි ද මෙබඳු මැයි.

සංස්කාර ධර්මයන් විදර්ශනා කිරීමෙන් සෝතාපත්ති මග්ග චිත්තය ලැබීමේ පිළිවෙල ද මෙසේ ය. එය ලෝකොත්තර වීම වෙනසි. වින්‍යාසය මෙසේ ය.

## මන්දපඤ්ඤයාගේ සෝතාපත්ති මග්ග වීථිය.

| ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | ල | ඡේ | ම | ප | උ | අ | ගො | ම | ඵ | ඵ | භ | භ | භ | භ | භ | භ |

භ-භවඞ්ග ල-භවඞ්ග චලන ඡේ-භවඞ්ගුපච්ඡෙද ම-මනොද්වාරාවර්ජන ප-පරිකර්ම. උ-උපචාර අ-අනුලොම ගො-ගොත්‍රභූ ම-මග්ග ඵ-ඵල. භ-භවඞ්ග,

භවඞ්ග භවඞ්ග චලන භවඞ්ගුපච්ඡේදයන්ට අරමුණ කර්ම කර්මනිමිත්ත ගතිනිමිති අතුරෙන් එකෙකි. ම, ප, උ අනුලෝමයන්ට අරමුණ සංස්කාර ධර්මයි. ගොත්‍රභූ, මග්ග; ඵලයන්ට අරමුණ නිර්වාණය යි. භවඞ්ගයන්ට අරමුණ කර්මාදිය යි.

මෙහි ගොත්‍රභූ චිත්තයට අනතුරුව මග්ග සිත උපනි. එය ද මෙහි සෝතාපත්ති මග්ග යි. මග්ග සිතට අනතුරු වැ ඵල සිත් දෙකක් ඉපදීම ධර්මතා යි. ඉන් ඔබ භවඞ්ග වේ. මෙහි අර්පණා වන්නේ මග්ග සිත යි.

## තික්ඛපඤ්ඤයාගේ සෝතාපත්ති මග්ග වීථිය.

| ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | ල | ඡේ | ම | උ | අ | ගො | ම | ඵ | ඵ | ඵ | භ | භ | භ | භ | භ | භ |

මෙහි පරිකර්ම නො වැ උපචාරයෙන්ම පටන් ගැන්ම වෙනසි.

සෝතාපත්ති මග්ග සිත වරක් උපදවා ගත්තහුට එය නැවත කිසිකලෙක නූපදනේය. එයින් සිඳ ලූ කෙලෙස් සෙනපහරින් නසා ලූ වෘක්ෂ ශාඛා මෙන් ඒ සන්තානයෙහි නැවත කිසි කලෙක නූපදනා බැවිනි. එහෙත් ඵල සිත් නම් කෙතෙක් වත් උපදවත හැකිය. එසේ උපදවත් හොත් ධ්‍යානයන්ට කී පරිද්දෙන් එය ඵල **සමාපත්ති වීථිය** යි කියනු ලැබේ. එහි වින්‍යාසය මෙසේයි.

## මන්දපඤ්ඤ සෝතාපන්නයාගේ ඵලසමාපත්ති වීථිය.

| ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | ල | ඡේ | ම | ප | උ | අ | ගො | ඵ | ඵ | ඵ | ඵ | ඵ | ඵ | ඵ | ඵ | ඵ |

මෙහි ගොත්‍රභූවට අනතුරු වැ මග්ග නො ඉපිද දිගට ම ඵල සිත් ඉපිදැ තිබෙන සැටි බලනු. මෙසේ අහොරාත්‍රයක් මුළුල්ලේ නිවන් අරමුණු කොටැ ඵල සිත් පිට ම විසිය හැකිය. මේ දැක්වුණේ මන්‍දපඤ්ඤ සෝතාපන්නයාගේ ඵලසමාපත්ති වීථිය යි.

### තික්ඛපඤ්ඤ සෝතාපන්නයාගේ ඵලසමාපත්ති වීථිය.

| ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| හි | ල | ජෙ | ම | උ | අ | ගො | ඵ | ඵ | ඵ | ඵ | ඵ | ඵ | ඵ | ඵ | ඵ | ඵ |

මෙහි පරිකර්ම නැති වැ උපචාරයෙන්ම ආරම්භ විය.

සකදාගාමි අනාගාමි අර්හත් මන්‍දපඤ්ඤ තික්ඛපඤ්ඤයන්ගේ අර්පණා වීථි හා ඵලසමාපත්ති වීථිද මෙබඳු මැයි වෙනසෙක් නම එහි ගොත්‍රභූ සිත වොදාන නමින් ව්‍යවහාර කරන බවයි. සෝවාන් වීමෙන් පෘථග්ජන ගොත්‍රය සිඳලූ බැවින් එය මෙහි වොදන නම් වේ. වොදාන නම් පිරිසිදු යි. ඒ පිළිබඳ වින්‍යාසයෙක් ද මෙසේය.

### මන්දපඤ්ඤයාගේ සකදාගාමී මග්ග වීථිය.

| ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... | ... |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | ල | ජෙ | ම | ප | උ | අ | වො | ම | ඵ | ඵ | භ | භ | භ | භ | භ | භ |

මෙහි වො-වොදානය. ම-සකදාගාමි මග්ගය ඵ-සකදාගාමිඵලය.

සෙසු වීථි ද මෙසේ දත යුතු යි.

### ප්‍රශ්න.

1. අර්පණා වීථි සමාපත්ති වීථීන්ගේ වෙනස දක්වනු.
2. පරිකර්ම උපචාර, අනුලෝම ගොත්‍රභූ සිත් පැහැදිලි කරනු. මේ නම් ලබන්නේ කවර සිත් කොටසක්ද?
3. මන්දපඤ්ඤයාගේ පඨමජ්ඣාන අප්පණා චිත්තවීථියේ සටහනක් අඳිනු.
4. තික්ඛපඤ්ඤයාගේ පඨමජ්ඣාන සමාපත්ති වීථිය පැහැදිලි කරනු.
5. වොදාන නම් කිම? එය කවර චිත්ත වීථියෙක කවර ස්ථානයෙක ලැබේද? තික්ඛපඤ්ඤ අරහන්ත අප්පණා වීථිය සටහනකින් දක්වනු.

## 8. අර්පණා නියමය.

යට දැක්වුණු පාඩමේ පරිකර්ම උපචාර අනුලෝම ගොත්‍රභූ නමින් කියවුණේ ඥාණසම්පයුත්ත කාමාවචර ජවන අට ය. අර්පණා නමින් කියවුණේ සවිසි මහග්ගත ලෝකොත්තර ජවන් ය. ඔවුන් අතුරෙන් කවර කවර කාමාවචර ජවනයකට අනතුරු වැ

කවර කවර අර්පණා ජවන් උපදින්නේ දැ යි අවශ්‍යයෙන් දත යුතුය. ඒ පිළිබඳ විභාගය මෙහි දක්වනු ලැබේ.

1. **සොම්නස් සහගත ජවනයන්ට අනතුරු වැ සොම්නස් සහගත වූ ම අර්පණා උපදනේය.**

මෙහි සොම්නස් සහගත ජවන නම් “සොමනස්ස සහගත ඤාණ සම්පයුත්ත අසංඛාර සසංඛාර” කුසල සිත් දෙක හා එබඳු වු ම ක්‍රියා සිත් දෙකයි. සොම්නස් සහගත අර්පණා නම් පඨම, දුතිය, තතිය, චතුත්ථ ඣාන කුසල සිත් සතරය. එබඳු වූ ම ක්‍රියා සිත් සතරය, ඒ ධ්‍යාන සතර සම්බන්ධ වූ ම ලෝකොත්තර සිත් 32 ය යන මොහු යි. සොම්නස් කාමාවචර ජවනයකට අනතුරු වැ උපෙක්‍ෂා අර්පණා නො ලැබේ. එක ජවන සන්තතියෙහි අනන්තර වෙදනා සමාන විය යුතු බැවිනි.

2. **උපෙක්‍ෂා සහගත ජවනයන්ට අනතුරු වැ උපෙක්‍ෂා සහගත වූ ම අර්පණා උපදනේ ය.**

උපෙක්‍ෂා සහගත ජවන නම් “උපෙක්‍ෂා සහගත ඤාණ සම්පයුත්ත අසංඛාර සසංඛාර” කුසල සිත් දෙක හා එබඳු වු ම ක්‍රියා සිත් දෙකයි. උපෙක්‍ෂා සහගත අර්පණා නම් රූපාවචර පංචමජ්ඣාන කුශලය හා එම ක්‍රියාය, අරූපාවචර කුශල ක්‍රියා අටය, ලෝකොත්තර පඤ්චමජ්ඣාන සිත් අටය යන මොහුයි. උපෙක්‍ෂා ජවනයන්ට අනතුරු වැ සොම්නස් අර්පණා නො ලැබේ. යට කී සේම අනන්තර ජවන සමාන වේදනා විය යුතු බැවිනි.

ඔවුන් අතුරෙහි මේ දැක්වෙන වෙනස ද සැලකිය යුතුයි.

3. **කුශල ජවනයන්ට අනතුරු වැ කුශල ජවනද, සෝතාපත්ති, සකදාගාමි අනාගාමි යන ඵල තුනද අර්පණා වශයෙන් උපදනේය.**

මෙහි කුශල ජවන නම් සෝමනස්ස සහගත ඤාණසම්පයුත්ත අසංඛාර, සසංඛාර කුසල සිත් දෙක හා උපෙක්ඛා සහගත ඤාණසම්පයුත්ත අසංඛාර, සසංඛාර වශයෙන් ලැබෙන සිත් දෙකය. කුශල ජවන නම් රූපාවචර කුසල සිත් පස අරූපාවචර කුසල් සිත් සතර, ලෝකෝත්තර කුසල විස්ස යන මොහු යි. ඵල තුන ලැබෙන්නේ සමාපත්ති වීථියෙහි දී ය. මෙහි ක්‍රියා ජවන් අර්පණා නො වන්නේ භින්න සන්තාන බැවිනි.

4. **ක්‍රියා ජවනයන්ට අනතුරු වැ ක්‍රියා ජවනද, අර්හත් ඵලයද, අර්පණා වශයෙන් ලැබෙන්නේය.**

මෙහි ක්‍රියා ජවන නම් සෝමනස්ස හා උපෙක්ඛා සහගත ඤාණසම්පයුත්ත අසංඛාර, සසංඛාර ක්‍රියා ජවන සතර යි. අර්පණා වශයෙන් ලැබෙන ක්‍රියා ජවන නම් රූපාවචර ක්‍රියා පස හා අරූපාවචර ක්‍රියා සතර යි. අර්හත් මාර්ග සිතට අනතුරු වැ ඵල සිත උපදිතත් මේ පූර්වාපර නියමය පරිකර්ම සඳහා බැවින් එය මෙහි නො ගන්නා ලදි.

මේ පිළිබඳ වූ ම ගණන පරිච්ඡේදයක් ද මෙහි දක්වනු ලැබේ.

**1. සෝමනස්ස සහගත ඤාණසම්පයුත්ත අසංඛාර සසංඛාර යන කුසල සිත් දෙකට අනතුරු වැ ලැබෙන අර්පණා සිත් දෙතිසෙකි.**

එනම් රූපාවචර ප්‍රථමධ්‍යාන, ද්විතීයධ්‍යාන, තෘතීය ධ්‍යාන, චතුර්ථ ධ්‍යාන කුසල සිත් සතරය. ඔවුන් පිළිබඳ වූ ම සෝතාපත්ති මග්ග සතරය, ඵල සතරය, සකදාගාමි මග්ග සතරය, ඵල සතරය, අනාගාමි මග්ග සතරය, ඵලසතරය, අර්හත් මාර්ග සතරය යන මොහු ය. වේදනා භේදය හා ක්‍රියා භේදය නිසා සෙසු අර්පණා නො ලැබේ.

**2. උපෙක්ඛා සහගත ඤාණසම්පයුත්ත අසංඛාර සසංඛාර කුසල සිත් දෙකට අනතුරු වැ අර්පණා සිත් දොළොසෙක් ලැබේ.**

එනම් පඤ්චමජ්ඣාන කුසල චිත්තය, අරූපාවචර කුසල සිත් සතර පඤ්චමජ්ඣාන සෝවාන් ආදී මාර්ග සිත් සතර, ඵල සිත් තුන යන මොහුයි.

**3. සෝමනස්ස සහගත ඤාණසම්පයුත්ත අසංඛාර සසංඛාර ක්‍රියා සිත් දෙකට අනතුරු වැ අර්පණා සිත් අටෙක් ලැබේ.**

එනම් පඨමජ්ඣාන, දුතියජ්ඣාන, තතියජ්ඣාන, චතුත්ථජ්ඣාන ක්‍රියා සිත් සතර හා ඔවුන් පිළිබඳ වු ම අර්හත් ඵල සිත් සතරයි.

**4. උපෙක්ඛා සහගත ඤාණසම්පයුත්ත අසංඛාර සසංඛාර ක්‍රියා සිත් දෙකට අනතුරු වැ අර්පණා සිත් සයෙක් ලැබේ.**

එනම් පඤ්චමජ්ඣාන ක්‍රියා සිත, අරූපාවචර ක්‍රියා සිත් සතර, පඤ්චමජ්ඣාන සහගත අර්හත් ඵල සිත යන මොහු යි.

මේ අර්පණා ම පෘථග්ජන ශෛක්‍ෂ අශෛක්‍ෂයන්ගේ වශයෙන් යෙදෙන පිළිවෙල මෙසේ ය.

1. පෘථග්ජනයන්ට හා ශෛක්‍ෂයන්ට අර්පණා ලැබෙන්නේ කාමාවචර ත්‍රිහේතුක කුසල සිත් සතරට අනතුරු වැ ය. ඒ සියල්ල සිව් සාළිසෙ (44) කි.

2. අශෛක්‍ෂයන්ට අර්පණා ලැබෙන්නේ කාමාවචර ත්‍රිහේතුක ක්‍රියා සිත් සතරට අනතුරු වැ ය. ඒ සියල්ල තුදුසෙන (14) කි.

මේ පිළිබඳ අභිධර්මාර්ථ සංග්‍රහයෙහි දැක්වුණු ගාථා මෙසේය.

**"ද්වත්තිංස සුඛපුඤ්ඤම්හා - ද්වාදසොපෙක්ඛකො පරං,**

**සුඛිතක්‍රියතො අට්ඨ - ඡ සම්භොන්ති උපෙක්ඛකා.**
**පුථුජ්ජනානං සෙක්ඛානං - කාමපුඤ්ඤ තිහෙතුතො,**
**තිහෙතු කාමක්‍රියාතො - වීතරාගානමප්පණා**

(ගුරු මුඛයකින් නො අසා මෙහි අදහස ප්‍රකාශ කළහොත් සුදු ඇතකු ත්‍යාග කරන බව බුරුම රජකු විසින් ප්‍රසිද්ධ කර තුබුණු හෙයින් මෙයට “සෙතහත්‍ථි ගාථා” ය යි එරට ව්‍යවහාර කෙරෙත්ලු.)

සුඛපුඤ්ඤම්හා පරං-සොමනස්ස සහගත ත්‍රිහේතුක කුසල සිත් දෙකින් පරවැ; ද්වත්තිංස-දෙතිස් අර්පණා සිත් කෙනෙක්; සම්භොන්ති-ලැබෙති. උපෙක්ඛකා පරං-උපෙක්‍ෂා සහගත ත්‍රිහේතුක කුසල සිත් දෙකින් පර වැ; ද්වාදස- දොළොස් අර්පණා සිත් කෙනෙක් ලැබෙති; සුඛිත ක්‍රියතො-සොමනස්ස සහගත ත්‍රිහේතුක ක්‍රියා සිත් දෙකින් පර වැ; අට්ඨ සම්භොන්ති-අර්පණා සිත් අට දෙනෙක් ලැබෙති; උපෙක්ඛකා පරං-උපෙක්‍ෂා සහගත ත්‍රිහේතුක ක්‍රියා සිත් දෙකින් පර වැ; ඡ සම්භොන්ති-අර්පණා සිත් ස දෙනෙක් ලැබෙත්.

පුථුජ්ජනානං-පෘථග්ජනයන්ට ද; සෙක්ඛානං-ශෛක්‍ෂයන්ට ද; තිහෙතුතො කාමපුඤ්ඤා-ත්‍රිහෙතුක කාමාවචර කුශල චිත්තයන් කෙරෙන්; අප්පණා-අර්පණා වන්නේය. වීතරාගානං-අර්හත් ඵලස්ථයන්ට; තිහෙතු කාමක්‍රියතො-ත්‍රිහේතුක කාමාවචර ක්‍රියා සිත් කෙරෙන් පර වැ; අප්පණා-අර්පණා වන්නේය.

**ප්‍රශ්න.**

1. පරිකර්ම උපචාර අනුලෝම ගොත්‍රභූ නමින් හා අර්පණා නමින් දැක්වුණු සිත් මේ මේ යයි පැහැදිලි කරනු.
2. පරිකර්මාදි සතර සෝමනස්ස සහගත විණි නම් එයට අනතුරු වැ ලැබෙන අර්පණා කවරහු ද?
3. පරිකර්මාදි සතර උපෙක්‍ෂා සහගත නම් එයට අනතුරු වැ ලැබෙන අර්පණා කවරහු ද?
4. පරිකර්මාදි සතර කුශල වූ විට හා ක්‍රියා වූ විට අනතුරු වැ ලැබෙන අර්පණා මේ මේ යයි දක්වනු.
5. “**ද්වත්තිංස සුඛ පුඤ්ඤම්හා**” යනාදි ගාථා දෙකේ භාවය පැහැදිලි කරනු.

## 9. තදාලම්බන නියමය

යට දැක්වුණු චිත්තවීථීන්හි ඇතුලත් සිත් විපාක ක්‍රියා කර්ම වශයෙන් තුන් කොටසකට බෙදෙන්නේය. ඒ බව ඒ ඒ ප්‍රස්තාවයෙහි දැක්වුණු නමුදු විශේෂාවබෝධය සඳහා මෙහි යළිත් දක්වනු ලැබේ. එසේම තදාලම්බන පිළිබඳ නියමය විශේෂයෙන් දක්වනු ලැබේ.

චිත්ත වීථීන්හි ආදියෙහි පැනෙන භවඞ්ග භවඞ්ග චලන භවඞ්ගුපච්ඡේද ඒ චිත්ත වීථීන්ට අයත් නොවේ. ඔව්හු වීථි මුක්තයෝ ය. වීථි සිත් උපදීමට මුලදී පවත්නා සිත් දක්වනු පිණිස ඔව්හු යොදනු ලබති. ඔව්හු විපාකයෝ ය. ඔවුන් පිළිබඳ විභාගය **වීථිමුක්ත** පාදයෙහි පැහැදිලි වේ.

පඤ්චද්වාරාවර්ජන හා මනොද්වාරාවර්ජන ක්‍රියා සිත් ය. වොට්ඨපන කෘත්‍යය සිද්ධ කරන්නේ මනොද්වාරාවර්ජනය යි. එබැවින් වොට්ඨපනය ද ක්‍රියා සිතෙකි.

චක්ඛුවිඤ්ඤාණාදි දෙපස් විඤ්ඤාණ ද, සම්පටිච්ඡන සන්තීරණ තදාලම්බන ද විපාකයෝ ය. එහිදු අනිෂ්ටාලම්බනයෙහි ලැබෙන චක්ඛුවිඤ්ඤාණාදි පසද, සම්පටිච්ඡන සන්තීරණ ද, ජවනාවසානයෙහි ලැබෙන තදාලම්බන ද අකුශල විපාකයෝ ය. ඉෂ්ට මධ්‍යස්ථ අනිෂ්ටාරම්මණයන්හි ලැබෙන ඔව්හු කුශල විපාකයෝය. එහිදු අතිෂ්ටාරම්මණයෙහි සන්තීරණ හා තදාලම්බන සෝමනස්ස සහගත වන බව දත යුතුයි. අතිෂ්ටාරම්මණයන්හි දී චක්ඛු සෝත ඝාණ ජිව්හා විඤ්ඤාණ උපෙක්ඛා සහගත වන සැටි ද කායවිඤ්ඤාණ දුක්ඛ සහගත සුඛ සහගත වන සැටි ද, සම්පටිච්ඡන සන්තීරණ උපෙක්ඛා සහගත වන සැටි ද, **චිත්තපාදයෙහි** දක්වන ලදි.

මෙසේ ආරම්මණානුරූප වැ වේදනා නියමය වන්නේ විපාක සිත්වලට ය. මුහුණේ ඇති සැටිය ම කැටපතෙහි පැනෙන්නාක් මෙන් කර්මානුභාවයෙන් ලැබෙන විපාක සිත් ආරම්මණානුරූප වැ ම ලැබිය යුතු බැවිනි. එහෙත් ජවනයන්ට මේ නියමය නො ලැබෙන බැව් දත යුතුය. සක්ලේශ සත්ත්වයන්ගේ ජවන් සිත් අනිෂ්ටාරම්මණයෙහි දු බුද්ධ දර්ශනයෙහි අශ්‍රද්ධාවතුන්ට මෙන් ඇතැම් විට උපෙක්‍ෂා සහගත වේ. බුද්ධදර්ශනයෙහි තීර්ථකයන්ට මෙන් ඇතැම් විට දෝමනස්ස සහගත ද වේ. ගම්භීර ප්‍රකෘතිකයන්ට අනිෂ්ටාරම්මණයෙහි දු දොම්නස් ජවන් නො වැ උපෙක්‍ෂා ජවන් දුවන්නේ ය.

විපාක සිත්වල වේදනා නියමය ආරම්මණානුරූප වැ වන්නේය යි යට කියන ලදි. එහෙත් තදාලම්බන පිළිබඳ වැ මේ නියමය ඒකාන්ත නො වේ. එහි විශේෂ ඇති බැවිනි. තදාලම්බන උපදිතොත් උපදින්නේ ජවනයන්ට අනතුරු වැ ය. ජවන කෘත්‍ය කරන සිත් පස්පණසෙ (55) කි. තදාලම්බන කෘත්‍ය කරන සිත් එකොළොසෙකි. ජවනයන්හි පවත්නා වේදනා තදාරම්මණයන්හි දී ඇතැම් විට වෙනස් වේ. එබැවින් කවර ජවනයන්ගේ අවසානයෙහි කවර තදාලම්බන උපදී දැ යි දැක්විය යුතුය. ඒ මෙසේ යි.

1. **සෝමනස්ස සහගත ක්‍රියා ජවනාවසානයෙහි සෝමනස්ස සහගත වූ තදලම්බන ලැබේ.**

සෝමනස්ස සහගත ක්‍රියා ජවන නම් හසිතුප්පාදය හා සෝමනස්ස සහගත මහා ක්‍රියා සතරයි. සෝමනස්ස සහගත තදාලම්බන නම් සෝමනස්ස සන්තීරණය හා සෝමනස්ස මහා විපාක සතර යි. රහතන්ගේ චිත්ත විපර්යාස නැති බැවින් මෙය මෙසේ වන බව දත යුතුයි.

**2. උපෙක්ඛා සහගත ක්‍රියා ජවනාවසානයෙහි උපෙක්ඛා සහගත වූ ම තදලම්බන ලැබේ.**

උපෙක්ඛා සහගත ක්‍රියා ජවන නම් උපෙක්ඛා සහගත මහා ක්‍රියා සතරය. උපෙක්ඛා සහගත තදාලම්බන නම් උපෙක්ඛා සහගත සන්තීරණද්වය හා එබඳු වූ මහා විපාක සතර යි. මෙහි දු හේතුව යට කියන ලද්ද මැ යි.

**දෝමනස්ස සහගත ජවනාවසානයෙහි උපෙක්ඛා සහගත වූ ම තදලම්බන ලැබේ.**

දොම්නස් තදාලම්බන නැති බැවින් හා වේදනා වශයෙන් අන්‍යොන්‍ය විරුද්ධ ස්වභාව හෙයින් සෝමනස්ස තදාලම්බන නො ලැබෙන බැවිනි. දෝමනස්ස ජවනාවසානයෙහි තදාලම්බන නො ඉපිදැ ඉදින් භවඞ්ග උපදින්නේ නම් ඒ භවඞ්ග ද උපෙක්‍ෂා සහගත විය යුතු යි. මේ හේතුයෙන් සෝමනස්ස ප්‍රතිසන්ධිකයන්ට දෝමනස්ස ජවන් දිවූ කල ඉදින් තදාලම්බන නො ලැබේ නම් යම් කිසි පුරුදු අරමුණක් ගෙනැ උපෙක්‍ෂා සහගත සන්තීරණයක් ඉපිද, ඉක්බිති සෝමනස්ස භවඞ්ග වන්නේය යි කියනු ලැබේ. ආවර්ජනයක් නැති වැ සන්තීරණයයෙක් මේ අතර කෙසේ උපදී දැයි නොසිතිය යුතුය. නිරෝධ සමාපත්තියට අනතුරු වැ ආවර්ජන නැති වැ ම ඵල සිත උපදින්නාක් මෙන් මෙය ධර්මතා වශයෙන් සිද්ධ විය හැකි බැවිනි. තව ද මේ සන්තීරණයෙන් වන්නේ භවඞ්ග කෘත්‍යය යි දත යුතු.

4. සෙසු දශ අකුශල ජවනයන් කෙරෙන් ද, අෂ්ටවිධ කාමකුශල ජවනයන් කෙරෙන් ද, ආරම්මණානුරූප වැ තදාලම්බන උපදින්නේය. එහි ද අකුශල ජවනයන්ට අනතුරු වැ අහේතුක තදාරම්මණ ද ද්විහේතුක ජවනයන්ට අනතුරු වැ ද්විහේතුක තදාරම්මණ ද, ත්‍රිහේතුක ජවනයන්ට අනතුරු වැ ත්‍රිහේතුක තදාරම්මණ ද බොහෝ සෙයින් ලැබෙන බව දත යුතුයි.

5. මේ තදාරම්මණ ප්‍රතිසන්ධි ජනක කර්මයට විපාක වශයෙන් ලැබුණත් නොයෙක් වීථිවල නොයෙක් ආකාර වේ. ප්‍රවෘත්ති විපාක දෙන කර්මයෙන් උපදින කල කිය යුත්තෙක් ම නැත.

6. එසේ ම තදාරම්මණ ලැබෙතොත් ලැබෙන්නේ කාමාවචර ජවනාවසානයෙහි ම ය. මහග්ගත ලෝකෝත්තර ජවනාවසානයෙහි නො ලැබේ. කාමාවචර ජවන් සවිප්ඵන්‍දන බැවින් හා මහග්ගත ලෝකෝත්තර ජවන් අවිප්ඵන්‍දන බැවිනි. විප්ඵන්‍දන නම් චලත්‍වයයි.

7. එසේ ම තදාලම්බන උපදුතොත් උපදින්නේ කාමාවචර සත්ත්‍වයන්ට ම ය. රූපාවචර අරූපාවචර සත්ත්‍වයන්ට තදාරම්මණ නූපදනේ ය. රූපාවචර අරූපාවචර සත්ත්‍වයන්ට තදාරම්මණ උපනිඃශ්‍රය කොට ඇති කාම භවඞ්ග නැති බැවින් හා ශාන්ත වූ මහග්ගත ජවනයන්ට අනතුරු වැ තදාලම්බන නො ලැබෙන බැවින් ය.

8. එසේ ම තදාරම්මණ උපදින්නේ කාමාවචර ධර්ම අරමුණු වූ කල්හි ම ය. මහග්ගත ලෝකෝත්තර ධර්ම අරමුණු වූ කල්හි නූපදින්නේ ය. තදාරම්මණ ඒකාන්ත පරිත්තාරම්මණ බැවිනි.

මේ පිළිබඳ ගාථාවක් මෙසේ යː-

**"කාමෙ ජවන සත්තාලම්බනානං නියමෙ සති,**
**විභූතෙ'ති මහන්තෙ ච තදලම්බනමීරිතං."**

කාමභවයෙහි ජවන සත්ත්ව ආලම්බන යන මොවුන්ගේ නියමය ඇති කල්හි විභූතාරම්මණයෙහි ද අතිමහන්තාරම්මණයෙහි ද තදාලම්බන කියන ලදී යනු භාව යි.

තදාලම්බන ලැබෙන හෙයින් ම ආරම්මණ විභූත හෝ අතිමහන්ත වන්නේ නො වේ. තදාලම්බන නැත ද බ්‍රහ්මයන්ගේ ආරම්මණ විභූත හා අතිමහන්ත විය හැකි බැවිනි.

තත්+ආලම්බන-තදාලම්බනː ඒ ජවනයන් විසින් ගන්නා ලද ආලම්බනය යම් සිතකට ඇත්තේ ද ඒ සිත තදාලම්බන යි. තදාරම්මණ යනු දු මේ මැ යි.

තදාලම්බන පිළිබඳ මේ දැක්වුණු විභාගය සියුම් ය. සංක්ෂිප්තය. ගුරු මුඛයෙන් හා ග්‍රන්ථාන්තරයෙන් විශේෂ දත යුතුයි.

**ප්‍රශ්න.**

1. තදාලම්බන යනු කිම? කර්ම විපාක ක්‍රියා අතුරෙන් ඔව්හු කුමකට අයත් ද?
2. කවර භවයෙක කවර සත්ත්වයනට කුමක් අරමුණු කොටැ තදාලම්බන උපදී ද?
3. මහග්ගත ලෝකෝත්තර චිත්තවීථිවල තදාලම්බන නො ලැබෙන්නේ කිම?
4. තදාලම්බන උපෙක්‍ෂා හෝ සෝමනස්ස සහගත වීමේ යුක්ති පැහැදිලි කරනු.
5. සෝමනස්ස පටිසන්‍ධිකයකුට දොම්නස් ජවන් දිවූ කල තදාලම්බන නො ලැබෙතොත් භවඞ්ග එක වරට ම සෝමනස්ස සහගත විය හැකි ද? එහි නියමය දක්වනු.

## 10. ජවන නියමය.

චිත්තවීථි අවසානයෙහි ලැබෙන තදාලම්බන පිළිබඳ නියමය යට දක්වන ලදි. මෙහි ජවන පිළිබඳ නියමය දක්වනු ලැබේ. ජවන කෘත්‍යය කරන සිත් 55 කි. එනම් අකුශල දොළොස, කාමාවචර කුශල අට හා මහාක්‍රියා අට, හසිතුප්පාදය රූපාවචර කුශල පස හා ක්‍රියා පස අරූපාවචර කුශල සතර හා ක්‍රියා සතර, ලෝකොත්තර මාර්ග සතර හා ඵල සතර යන මොවුන්ගේ වසයෙනි. ජවන නම් අසනිපාතයක් මෙන් චිත්තයාගේ වේගවත්

අවස්ථාව ය. අම්බොපමායෙහි ජවන අඹපලය වළඳන කාලය මෙනැ යි කියන ලදි. ජවන-ජව-වෙග යනු එකාර්ථයි. මේ අර්ථය ම සලකා මොවුන්ට දුවන සිත් යයි කියති. මොවුන් පරිත්ත මහග්ගත ලෝකොත්තර චිත්ත වීථිවල යෙදෙන පරිදි ඒ ඒ වීථි වින්‍යාසයෙහි දක්වන ලදි. එය ම පැහැදිලි කරනු සඳහා යළි දු විශේෂ සහිත වැ මෙහි දක්වනු ලැබේ.

1. පරිත්ත වීථිවල කාමාවචර ජවන දිවෙතොත් සත් සත්වරෙක් දිවෙන්නේය. යට පරිත්ත වීථි බලනු. එහි දු ඉදින් ආරම්මණය දුර්බල නම් කිසි විටෙක සවරක් ද දිවෙත හැකිය. වස්තු දුර්බලත්‍වය මෙයට කාරණ වේ. මෙහි වස්තු නම් හෘදය වස්තුවයි.

2. මරණාසන්න කාලයෙහි හෘදය වස්තුව දුර්බල බැවින් ජවන් පසෙක් ම දිවෙන්නේය. මරණාසන්න කාලය නම් චුතිචිත්තුප්පාදයට ආසන්න කාලය යි. මෙසේ ම මූර්ච්ඡා කාලයෙහි ද විසංඥ කාලයෙහි ද ඉතා ළදරු කාලයෙහි ද ජවන් පසෙක් හෝ සයෙක් දිවෙන්නේ ය. මූර්ච්ඡ කාලය නම් නො ඉවසිය හැකි දුඃඛයෙන් ශරීරය වෙහෙසට පත් කාලය යි. විසංඥ කාලය නම් ප්‍රීති වේගයෙන් හෝ අමනුෂ්‍ය උපද්‍රවයෙන් හෝ සුරාමදාදියෙන් හෝ ප්‍රකෘති සංඥාව නැති වැ ගිය කාලය යි. ඉතා ළදරු කාලය නම් ගර්භවාස කාලය හෝ උපන් ඇසිල්ලයි.

3. බුදුරජාණන් වහන්සේ යමක ප්‍රාතිහාර්ය දක්වන කල්හි උන්වහන්සේට ප්‍රත්‍යවේක්‍ෂා ජවන සතරෙක් හෝ පසෙක් දිවෙන්නේ ය. එ ද ශීඝ්‍ර වැ පවත්නා අවස්ථායෙහි ය. එහි දු ශීඝ්‍රත්‍වයෙහි පස ද අති ශීඝ්‍රත්‍වයෙහි සතර ද කිය යුතු. ශීඝ්‍ර වැ නො පවත්නා කල්හි උන්වහන්සේට ද සය හෝ සත යි.

යමක ප්‍රාතිහාර්ය නම් බුදුරජාණන් වහන්සේ ස්වකීය ශරීරයෙන් ගිනිකඳ හා දියකඳ නිකුත් කිරීම් වශයෙන් යුගල යුගල කොට දක්වනු ලබන පෙළහර වෙසෙසකි. ඒ පෙළහර දක්වන බුදුරජාණන් වහන්සේ පළමු කොටැ තෙජොකසිණයෙහි පාදකධ්‍යානයට සමවැද එයින් නැගී ඒ ධ්‍යානාංග ප්‍රත්‍යවේක්‍ෂා කරති. ඉක්බිති උපරිකායයෙන් ගිනිකඳ නික්මේවා යි අධිෂ්ඨාන කරති. ඉක්බිති එම කසිණයෙහි ම අභිඥාවට සමවදින සේක. ඒ අභිඥා වශයෙන් උපරිකායයෙන් ගිනිකඳ නික්මෙයි. නැවැත එසේ ම ආපොකසිණයෙහි පාදකධ්‍යානයට සමවැද එයින් නැඟී ධ්‍යානාඞ්ග ප්‍රත්‍යවේක්‍ෂා කරති. ඉක්බිති අධඃකායයෙන් දියකඳ නික්මේවා යි අධිෂ්ඨාන කරති. ඉක්බිති ඒ කසිණයෙහි ම අභිඥාවට සමවදින සේක. අභිඥා වශයෙන් යට කයෙන් දියකඳ නික්මෙයි. මෙසේ ශීඝ්‍ර ප්‍රවෘත්තිය ඇති විට යට කී ප්‍රත්‍යවේක්‍ෂා ජවන සතරින් පසින් ඔබ්බට නො ගොස් භවඞ්ග වේ. භවඞ්ග ද දෙකින් ඔබ්බට නො ගොස් පළමු කී සේ ම නැවත පාදකධ්‍යානයට සම වදිති. බලා සිටින්නවුන්ට උන්වහන්සේගේ ශරීරයෙන් එකවිට ම ගිනිකඳ දියකඳ නික්මෙන සේ පැනෙයි. මහ මුගලන්හිමි ආදි සෙසු ඍද්ධිමත්නට ද එබඳු කාලයෙහි ප්‍රත්‍යවේක්‍ෂා ජවන සතර පස ම කිය යුතුයි. ඇතැම් ආචාර්යවරයෝ බුදුරජාණන් වහන්සේට සතර ද සෙස්සන්ට පස ද විය යුතුය යි කියත්.

4. ආදිකර්මිකයාගේ අර්පණා ප්‍රාප්තියෙහි මහග්ගත ජවන එක්වරෙක් ම උපදනේය. ඒ මහග්ගත ජවන ආසෙවන නොලබන බැවින් දුර්බල යි. යට දැක්වුණු ආදිකම්මික මහග්ගත චිත්තවීථි බලනු.

5. එසේ ම අභිඥා ජවන ද ආදිකම්මික කාලයෙහි හා වශීභූත කාලයෙහි එක වරක් ම උපදනේය. අභිඥා ජවන උපදවන්නේ ඍද්ධිප්‍රාතිහාර්ය සඳහාය. ඍද්ධිදර්ශනයෙන් පසු කළ යුතු දේ නැති බැවින් එය එකවරක් ම පමණි.

6. සෝතාපත්ති ආදි මාර්ග ජවන් ද උපදනේ එක් එක් වර ම ය. (ලෝකොත්තර චිත්ත වීථි බලනු.) තම තමන් විසින් නසාලිය යුතු කෙලෙස් නසා ලූ කල්හි නැවත කළ යුතු දේ නැති බැවිනි. මාර්ගයෙන් පසු ඵල ජවන දෙකක් හෝ තුනක් ඉපිදැ ඉක්බිති භවාඞ්ග වන්නේය. එහි විභාගය යට දක්වන ලදි.

7. අනාගාමීහු ද රහත්හු ද අභිමත විට නිරොධ සමාපත්තියට සමවදිති. **නිරොධසමාපත්ති** නම් චිත්ත ප්‍රවෘත්ති නවතාලීමයි. කාමරාග සහිත හෙයින් සෝවාන් සෙදගැමින්ට චිත්ත නිරෝධය කළ හැකි නොවේ. නිරෝධසමාපත්තියට සමවැදුණවුන්ට ජවන හෝ අන් කිසි සිතෙක් හෝ නැත. එවිට ඔවුහු අචිත්තකයෝය යි කිය යුතු. නිරෝධ සමාපත්තියෙහි විස්තර මතු දැක්වේ.

8. සමාපත්ති වීථිවල ද භවාඞ්ග ප්‍රවෘත්තියෙහි මෙන් ජවන ප්‍රවෘත්තියෙහි නියම නැති. ආරම්භ කාලයෙහි ජවන එකින් දෙකින් ගොස් වශප්‍රාප්ත කාලයෙහි සියදහස් ගණන් ද දුවත හැකිය. සමාපත්ති වනාහි ඣානසමාපත්ති ඵලසමාපත්ති වශයෙන් දෙ ආකාර බවද ඔවුන් පැවතෙන සැටි ද යට දක්වන ලදි. සමාපත්ති වීථි බලනු.

**"සත්තක්ඛත්තුං පරිත්තානි මග්ගාභිඤ්ඤා සකිං මතා,**
**අවසෙසානි ලබ්භන්ති ජවනානි බහූන්‍යපි"**

පරිත්ත ජවනයෝ උත්කෘෂ්ට වශයෙන් සත් වරක් දිවෙති. මාර්ග අභිඥා ජවන් එක් වරකි. සෙසු මහග්ගත ලෝකොත්තර ජවනයෝ බොහෝ ද ලැබෙත්. විස්තර යට කී සේ යි.

**ප්‍රශ්න.**

1. ජවන යනු කිම? ජවන සිත් කෙතෙක් ද? කවරහු ද?
2. කාමාවචර ජවන කී කී වර උපදී ද? ස්ථාන දක්වා පැහැදිලි කරනු.
3. මහග්ගත ජවන ප්‍රවෘත්ති දක්වනු.
4. නිරෝධසමාපත්ති ඵල සමාපත්ති පැහැදිලි කොට ඔවුන් පිළිබඳ ජවන නියමය දක්වනු.
5. නිරෝධසමාපත්තියට සමවදිත හැකි කවරකු හට ද? සෙස්සන්ට කුමක් හෙයින් නො හැකි ද?

## 11. පුද්ගල භේදය.

චිත්ත වීථි පිළිබඳ ජවන විනිශ්චය යට දක්වන ලදී. පුද්ගලභේදය හා පුද්ගලයන් පිළිබඳ වීථි චිත්ත විභාගය මෙහි දක්වනු ලැබේ.

පුද්ගලයෝ වනාහි පෘථග්ජනයෝය, ආර්යයෝය යි ද්විවිධ වෙති. සෝවාන් ආදි මාර්ග ඵලස්ථයෝ ආර්යයෝ ය. සෙස්සෝ පෘථග්ජනයෝය. ඔවුන් අතුරෙන් පෘථග්ජනයෝ අහේතුකයෝය, ද්විහේතුකයෝය, ත්‍රිහේතුකයෝය යි යළි ත්‍රිවිධයහ. **අහේතුකයෝ** නම්-ප්‍රතිසන්ධි චිත්තයෙහි ෂඩ්විධ හේතු අතුරෙන් එක හේතුවකුදු නො යෙදුණ සත්ත්වයෝය. ඔව්හු දුගති **අහේතුක, සුගති අහේතුක** යි යලි දු ද්විවිධ වෙත්. **දුගති අහේතුක** නම්-අකුශල විපාක උපෙක්ඛා සහගත සන්තීරණ සිතින් පිළිසිඳ ලත් සතර අපායිකයෝය. **සුගති අහේතුක** නම්-කුශල විපාක උපෙක්ඛා සහගත සන්තීරණ සිතින් පිළිසිඳ ලත් ජාත්‍යන්ධ ජාතිබධිරාදීහුය. **ද්විහේතුකයෝ** නම්-ප්‍රතිසන්ධි චිත්තයෙහි අලෝභ අදෝස යන හේතු දෙකන පමණක් යෙදුණු ඤාණවිප්පයුත්ත මහාවිපාක සතරින් උපන්නෝ ය. **ත්‍රිහේතුකයෝ** නම්-ප්‍රතිසන්ධි චිත්තයෙහි අලෝභ, අදෝස, අමෝහ යන හේතු ත්‍රිකය යෙදුණු පුද්ගලයෝය. එනම් ඤාණසම්පයුත්ත මහාවිපාක සතරින් හා මහග්ගත විපාකවලින් උපන්නෝයි. (**ආර්යයෝ** වනාහි ඒකාන්තයෙන් ත්‍රිහේතුකයෝය. ඔවුහු ද සෝතාපන්නාදි වශයෙන් අෂ්ටවිධ වෙති. ඔවුන් අතුරෙන් මුල් සත්දෙන ශෛක්‍ෂයෝය. අර්හත් ඵලස්ථයා අශෛක්‍ෂ යි.)

1. මොවුන් අතුරෙන් අහේතුකයන්ට හා ද්විහේතුකයන්ට අර්පණා ජවන හෝ ක්‍රියා ජවන නූපදියි. **අර්පණා ජවන** නම්-ප්‍රථමධ්‍යානාදිය යි. ක්‍රියාජවන නම්-රහතුන්ට ම ආවෙනික වූ හසිතුප්පාද, මහා ක්‍රියා හා මහග්ගත ක්‍රියා යි. අහේතුක ද්විහේතුක ප්‍රතිසන්ධි **විපාකාවරණය** යි කියනු ලැබේ. එබැවින් ඔවුන්ට ඒ අත්බැව්හි ධ්‍යාන මාර්ග ඵල නො ලද හැකිය යි සේයි. මාර්ග ඵල නැතියනට ක්‍රියා ජවන නැත යනු කිය යුතු ද නොවේ.

2. එසේ ම ද්විහේතුකයන්ට හා සුගති අහේතුකයන්ට ඤාණසම්පයුත්ත විපාක නො ලැබේ. **ඤාණසම්පයුත්ත විපාක** නම්-මෙහි තදාලම්බන වන ඤාණසම්පයුත්ත විපාක සතර යි.

3. දුගති අහේතුකයන්ට වනාහි ඥානවිප්‍රයුක්ත වූ ද මහාවිපාක නො ලැබේ. එවිට ඔවුන්ට තදාලම්බන වශයෙන් ලැබෙන්නේ අහේතුක සන්තීරණ ත්‍රිකය පමණෙකි. මෙහි ලා ධර්මධරයන්ගේ මතභේදයක් ඇති බව දත යුතුයි.

4. ත්‍රිහේතුකයන් අතුරෙන් රහතන්ට අකුශල හෝ කුශල ජවන නූපදී. සිත කුශල හෝ අකුශල වන්නේ අවිද්‍යාව ඇති හෙයිනි. අවිද්‍යා ක්‍ෂය කළ රහතන්ට කිසි සිතෙක් අකුශල හෝ කුශල නොවේ. වනුයේ ක්‍රියා යි.

5. එසේ ම ත්‍රිහේතුකයන් අතුරෙන් ශෛක්‍ෂයන්ට හා පෘථග්ජනයන්ට ක්‍රියා ජවන නො ලැබේ. ක්‍රියාජවන ලැබෙන්නේ අර්හත් ඵලස්ථයන්ට පමණෛකි. අහේතුක ද්විහේතුකයන්ට ක්‍රියාජවන නො ලැබෙන බව යට කියන ලදි.

6. එසේ ම ශෛක්‍ෂයන්ට දිට්ඨිසම්පයුත්ත ජවන හා විචිකිච්ඡා ජවන නො ලැබේ. සෝවාන් ආදීන් සක්කායදිට්ඨි විචිකිච්ඡා, සීලබ්බතපරාමාස යන සංයෝජනත්‍රය මුල්සිඳැ ලූ බැවිනි.

7. ශෛක්‍ෂයන් අතුරෙන් අනාගාමීන්ට පටිස ජවන ද නොලැබේ. (**පටිසජවන නම්-** ද්වේෂමූලික අකුසල් දෙකය.) කාමරාග පටිස අනාගාමි මගින් ක්‍ෂය කළ බැවිනි.

8. ලෝකොත්තර ජවන ආර්ය පුද්ගලයන්ට ම සුදුසු පරිදි ලැබෙන්නේය.

මෙසේ බලන කල්හි අශෛක්‍ෂ සංඛ්‍යාත අර්හත් ඵලස්ථයන්ට කාමාවචර විපාක 23 ද, ක්‍රියා සිත් 20 ද අර්හත් ඵලය ද යන සුසාලිස් (44) සිත් උපදින්නේය, අකුශල 12 ද, කුසල් 21 ද, සෝවාන් සකෘදාගාමි අනාගාමි ඵල 3 ද, මහග්ගත විපාක 9 ද යන පන්සාලිස (45) නූපදින්නේය.

**ශෛක්‍ෂයන්ට** කාමාවචර විපාක 23 ද, ආවර්ජන 2 ද කුසල් 21 ද, අකුසල් 7 ද, සෝවාන් ආදී ඵල 3 ද යන සපණස් (56) සිත් උපදින්නේය. (එයිනුදු සෝවාන් සකෘදාගාමීන්ට 51 කි. අනාගාමීන්ට 49 කි.) ක්‍රියාජවන 18 ද, දිට්ඨිගත අකුශල සතර හා විචිකිච්ඡා සම්පයුත්ත චිත්තය ද අර්හත් ඵලය ද මහග්ගත විපාක 9 ද යන තෙතිස (33) නූපදින්නේය.

**පෘථග්ජනයන්ට** වනාහි කාමාවචර විපාක 23 ද, ආවර්ජන 2 ද, කාමාවචර-රූපාවචර-අරූපාවචර කුශල 17 ද, අකුශල 12 ද, යන සූපණස (54) උපදින්නේය. විශේෂයෙන් බලත් හොත් මේ සූපණස උපදින්නේ ත්‍රිහේතුක පෘථග්ජනයන්ට ය. ද්විහේතුකයන්ට හා සුගති අහේතුකයන්ට ඤාණසම්පයුත්ත විපාකද, අර්පණා ජවන ද හැරැ සෙසු එක්සාලිස (41) ය. දුගති අහේතුකයන්ට එයිනුදු ද්විහේතුක විපාක සතර හැරැ සෙසු සත්තිස (37) යි. ක්‍රියාජවන 18 ද, ලෝකුත්තර 8 ද, මහග්ගත විපාක 9 ද යන පන්තිස (35) පෘථග්ජනයන්ට නූපදින්නේය.

**"අසෙක්ඛානං චතුචත්තාලීස සෙක්ඛානමුද්දිසෙ,**
**ඡප්පඤ්ඤාසාවසෙසානං චතුප්පඤ්ඤාස සම්භවා."**

අශෛක්‍ෂයන්ට සිත් සූසාළිසක් (44) ද, ශෛක්‍ෂයන්ට සපණසක් (56) ද, සෙස්සන්ට (=පුහුදුනට) සූපණසක් ද සුදුසු පරිදි කියන්නේය යනු භාවයි.

**ප්‍රශ්න.**

1. පුද්ගල භේදය දක්වා ඔවුන්ගේ ආකාර විස්තර කරනු.
2. අහේතුකයන්ට හා ද්විහේතුකයන්ට කවර සිත් උපදී ද?
3. රහතන්ට උපදින සිත් කවරේ ද?
4. ශෛක්‍ෂයන්ට නූපදින සිත් දක්වනු.
5. පෘථග්ජන ත්‍රිහේතුකයන්ට උපදින සිත් කවරේ ද?

## 12. භූමි විභාගය.

පුද්ගලයන් පිළිබඳ වීථිචිත්ත විභාගය යට දක්වන ලදී. භූමි පිළිබඳ වීථිචිත්ත විභාගය මෙහි දක්වනු ලැබේ.

භූමි වනාහි කාමභූමි, රූප භූමි, අරූප භූමි ය යි ත්‍රිවිධ වේ. සතර අපාය මිනිස් ලොව සදෙව් ලොව යන එකොළොස **කාම භූමි** ය. බ්‍රහ්මපාරිසජ්ජාදි සොළොස **රූපභූමි** ය. ආකාසානඤ්චායතනාදි සතර **අරූප භූමි යි.**

1. මේ ත්‍රිවිධ භූමින් අතුරෙන් **කාම භූමියෙහි** මහග්ගත විපාක සිත් නවය හැර සෙසු සිත් 80 ම ලැබෙන්නේය. එසේ ලැබීම් ඒ ඒ පුද්ගලයන්ට අනුරූප පරිදිය යි දතයුතු.

2. **රූප භූමියෙහි** ආවර්ජන දෙක ද, කුශලාකුශල අහේතුක විපාක වූ චක්ඛුවිඤ්ඤාණද්වය සොතවිඤ්ඤාණද්වය සම්පටිච්ඡන යුගල සන්තීරණත්‍රික යන සිත් නවය ද, දෝසමූලික සිත් හැර සෙසු තෙපණස් (53) ජවන ද යන සූසැටක් සිත් උපදනේය. ඔවුන්ට ඝාණජිව්හා කාය ප්‍රසාද නැති බැවින් ඝාණවිඤ්ඤාණද්වය ද, ජිව්හා විඤ්ඤාණද්වය ද, කායවිඤ්ඤාණද්වය ද නැත. එසේම ඔවුන්ට පටිසඳ්වය ද, තදාලම්බන අට ද වීථිමුත්තක ද නැත. එවිට එහි සිත් 25 ක් නො ලැබෙන්නේ ය. **අසඤ්ඤසත්තය** රූපභූමියට ඇතුලත් වුව ද එහි එක් සිතෙකු දු නූපදී. එය ස්වභාවයෙන් ම අචිත්තක බැවිනි.

3. **අරූපභූමියෙහි** හසිතුප්පාදය හා පටිසඳ්වය හැර සෙසු සවිසි (26) පරිත්ත ජවන ද, අරූපාවචර ජවන අට ද, සෝවාන් මාර්ගය හැර සෙසු ලෝකෝත්තර ජවන සත ද, මනොද්වාරාවර්ජනය ද යන දෙසාළිස උපදනේය. සෙසු සත්සාළිස (47) නූපදනේය.

යම් භූමියෙක්හි ස්වභාවයෙන් යම් යම් ප්‍රසාදයෙක් නැත් ද ඒ භූමියෙහි ඒ ඒ ද්වාරික සිත් නො ලැබෙන්නේ ය.

**සඞ්ග්‍රහ ගාථාව**

**"අසීති වීථිචිත්තානි කාමෙ රූපෙ යථාරහං**
**චතුසට්ඨී=තථාරූප්පෙබ ද්වෙචත්තාළීස ලබ්භරෙ."**

කාමභූමියෙහි වීථී සිත් 80 ක් ද, රූප භූමියෙහි 64 ක් ද, අරූප භූමියෙහි 42 ක් ද යෙදෙන පරිදි ලැබෙන්නේ යි. විස්තර යට දැක්විණි.

## ප්‍රශ්න

1. භූමි කෙතෙක් ද? කවරහු ද?
2. කාමභූමියෙහි උපදින සිත් දක්වනු.
3. රූපභූමියෙහි නූපදින සිත් දක්වනු.
4. අරූපභූමියෙහි උපදින සිත් ද, නූපදින සිත් ද වෙන් වෙන් කොටැ දක්වනු.
5. අසඤ්ඤ සත්තාය කවර භූමියකට අයත් ද? එහි සිත් නැත්තේ කිම?

මෙසේ ඒ ඒ භවයෙහි ඒ ඒ පුද්ගලයන් පිළිබඳ වැ ද්වාර හා ආරම්මණ ලැබෙන ලැබෙන පරිදි ප්‍රතිසන්ධියෙන් පසු භවනිකන්ති වශයෙන් පවත්නා මනොද්වාරික චිත්ත වීථියෙහි පටන් චුතිචිත්තය දක්වා භවඞ්ගයන්ගෙන් අන්තරිත වැ යට දැක්වුණු ෂට්ද්වාරික චිත්තප්‍රවෘත්තිය නොසිඳී පවත්නේ ය. සිඳීමක් වත්හොත් නිරෝධ සමාපත්තියෙන් ය. අසඤ්ඤසත්තයෙහි චිත්තප්‍රවෘත්තිය මැ නැති බැව් යට කියන ලදි.

**පූජ්‍ය පණ්ඩිත මාතර ශ්‍රී ධර්මවංශ ස්වාමීන් කළ අභිධර්මචන්ද්‍රිකාවෙහි වීථිචිත්තපාදය යි.**

# පස්වන වීථිමුක්ත පාදය.

**නමො භගවතො සම්බුද්ධස්ස.**

## 1. චතුෂ්ක සතර.

වීථිචිත්ත ප්‍රවෘත්ති සඞ්ග්‍රහය, වීථිමුක්තචිත්ත ප්‍රවෘත්ති සඞ්ග්‍රහය'යි ප්‍රවෘත්ති සඞ්ග්‍රහ දෙ වැදෑරුම් බව යට කියන ලදි. එයින් ප්‍රවෘත්ති කාලයෙහි වීථි සිත් පැවතෙන පිළිවෙල **"වීථි පාදය"** යන නමින් යට දැක්වුණේය. ප්‍රතිසන්ධි කාලයෙහි වීථිමුක්ත සිත් පැවතෙන පිළිවෙල **"වීථිමුක්ත පාදය"** යන නමින් මෙහි දක්වනු ලැබේ. ප්‍රතිසන්ධි කාලයෙහි වීථිමුක්ත සිත් පැවතෙන පිළිවෙල දැක්වීමේනම භවඞ්ග-චුතිකාලයෙහි ද වීථිමුක්ත සිත් පැවතෙන පිළිවෙල දැක්වුණා වෙයි. ඒ තුන් සිත් ම එක සමාන බැවිනි.

එසේ ඔවුන්ගේ දැනැ ගැන්ම සඳහා **චතුර්විධ භූමි, චතුර්විධ ප්‍රතිසන්ධි, චතුර්විධ කර්ම, චතුර්විධ මරණොත්පත්ති** යන චතුෂ්ක සතර උගත යුතු වේ.

චතුර්විධ භූමි නම් **අපාය භූමි, කාමසුගති භූමි, රූපාවචර භූමි, අරූපාවචර භූමි** යන සතරයි.

චතුර්විධ ප්‍රතිසන්ධි නම් **අපාය ප්‍රතිසන්ධි, කාමසුගති ප්‍රතිසන්ධි, රූපාවචර ප්‍රතිසන්ධි, අරූපාවචර ප්‍රතිසන්ධි** යන සතරයි.

චතුර්විධ කර්ම නම් කෘත්‍ය වශයෙන් **ජනක උපත්ථම්භක, උපපීළක, උපඝාතක** යන සතරය. විපාක දෙන ක්‍රම වශයෙන් **ගරුක, ආසන්න, ආචිණ්ණ, කටත්තාකම්ම** යන සතරය. විපාක කාල වශයෙන් **දිට්ඨ ධම්ම වෙදනීය, උපපජ්ජ වෙදනීය, අපරාපරිය වෙදනීය, අහොසි** යන සතරය. විපාකස්ථාන වශයෙන් **අකුසල, කාමාවචර කුසල, රූපාවචර කුසල, අරූපාවචර කුසල** යන සතරයි.

චතුර්විධ මරණුප්පත්ති නම් **ආයුක්ඛය, කම්මක්ඛය, උභයක්ඛය, උපච්ඡෙදක** යන සතරයි.

වීථිමුක්ත සිත් නම් කර්ම කර්මනිමිති ගතිනිමිති අරමුණු කොට ප්‍රතිසන්ධි භවාඞ්ග ච්‍යුති කෘත්‍ය කරන අකුසල විපාක උපෙක්ඛා සහගත සන්තීරණ චිත්ත, කුසල අහේතුක විපාක උපෙක්ඛා සහගත සන්තීරණ චිත්ත, මහා විපාක සිත් අට, රූපාවචර විපාක සිත් පස, අරූපාවචර විපාක සිත් සතර යන එකුන් විස්ස (19) යි.

මේ සියල්ල පිළිබඳ විශේෂ විභාග මතු පාඩම්වලින් පැහැදිලි කරනු ලැබේ.

**ප්‍රශ්න.**

1. වීථිමුක්ත පාදයෙහි දැක්වෙන්නේ කොතැනක කවර සිත් පිළිබඳ විස්තරයෙක් ද?
2. වීථිමුක්ත සිත් කෙතෙක් ද?
3. වීථිමුක්ත සිත් දැන ගනු සඳහා කුමක් උගත යුතු ද?
4. භූමි සතර ද ප්‍රතිසන්ධි සතර හා මරණුප්පත්ති සතර ද දක්වනු.
5. කර්ම පිළිබඳ භෙද චතුෂ්කය දක්වනු.

## 2. චතුර්විධ භූමි

සත්ත්වයෝ යම් තැනෙක වෙත් ද එ තැන භූමි ය යි කියනු ලැබේ. ඒ භූමි වනාහි 1 අපාය භූමි 2 කාමසුගතිභූමි 3 රූපාවචර භූමි 4 අරූපාවචර භූමි ය යි සතර වැදෑරුම් වේ.

1. අය නම් සැපය. අයයෙන්-සැපයෙන් අපගත වූවන් වසන භූමි අපාය භූමි ය. එ ද වනාහි (අ) නිරය (ආ) තිරච්ඡානයොනි (ඉ) පෙත්තිවිසය (ඊ) අසුරකාය ය යි චතුර්විධ වේ.

(අ) අය-සැප නැති තැන නිරය යි. එයින් සඤ්ජීව කාලසූත්‍ර සංඝාත රෞරව මහා රෞරව තාප ප්‍රතාප අවීචි යන අටමහනිරය හා ඒ එක් එක් නිරයට පිරිවර වශයෙන් පිහිටි සොළොස් සොළොස් ඔසුපත් ද ගනු ලැබේ. එවිට ඒ සියල්ල 136 කි. මේ සියලු නිරය පෘථිවි ගර්භයෙහි පිහිටියේ යයි සලකනු ලැබේ.

(ආ) මනුෂ්‍යයන් මෙන් කෙළින් නොගොස් හරස් වැ යන්නෝ **තිරච්ඡානයෝ** ය. ඔවුන් පිළිබද ජාතිය තිරච්ඡාන යොනිය යි. එහි ස්ථාන නියමයෙක් නොදක්වන ලදි. ඔවුන් වසන කොතැන වුවත් තිරච්ඡානයොනිය යි.

(ඉ) සැපයෙන් දුරු වූවෝ ප්‍රේතයෝ ය. ඔහු **වනාහි උතුපජීවි ඛුප්පිපාසික නිජ්ඣාමතණ්හික පරදත්තූපජීවි** යයි චතුර්විධ වෙත්. ප්‍රේතයන්ගේ සමූහය පෙත්තිය. ඒ පිළිබඳ විෂය-ප්‍රවෘත්තිදේශය-පෙත්ති විසය යි. ප්‍රේතයෝ යම් තැනෙක වෙසෙත් ද ඒ කොතැන වුව ද ප්‍රේත අපාය යි කිය යුතු. **"එවමෙව ඉතො දින්නං පෙතානං උපකප්පති"** යනාදි තන්හි මැරී දෙව්ලොව උපන්නෝ ද ප්‍රේතයෝය යි කියනු ලැබෙත්. මෙහි අපාය ම ගත යුතු.

(ඊ) සුර නො වන්නෝ අසුරයෝ ය. ඔහු ද වනාහි දෙවාසුර විනිපාතිකාසුර වෙමානිකාසුර ලොකන්තරිකාසුර පෙත සුරය යි පඤ්චවිධ වෙත්. වෙපචිත්ති ආදී ද්වෙශත්‍රෑහු දෙවාසුරයෝ ය. පියඞ්කරමාතු උත්තරමාතු ආදීහු විනිපාතිකාසුරයෝය. යම රාජාදීහු වෙමානිකාසුරයෝය. සක්වළ තුනකට අතර වූ ලෝකාන්තරිකයෙහි වසන්නෝ ලෝකාන්තරිකාසුරයෝ ය. කාලකඤ්ජාදීහු පෙතාසුරයෝය. මෙහි පෙතාසුරයෝ

අසුරයෝය යි කියනු ලැබෙත්. ඔවුන්ගේ සමූහය අසුරකාය ය. ඔවුන් වසන කොතැන වුව ද අසුර අපාය යි.

මේ අසුරයෝ ප්‍රේත විශේෂයෙකැයි දත යුතු. "**දිබ්බාවත හො කායා පරිහායිස්සන්ති පරිපූයිස්සන්ති අසුරාකායා**" යන තන්හි අසුර යන්නෙන් සතර අපායිකයෝ ම ගැනෙති. පළමු දැක්වුණු අසුරයන් අතුරෙන් දෙවාසුරයෝ තව්තිසා දෙවියන් කෙරෙහි ද විනිපාතික හා වෙමානික අසුරයෝ චාතුම්මහාරාජික දෙවියන් කෙරෙහි ද ලෝකාන්තරිකාසුරයෝ නිරයවාසීන් කෙරෙහි ද සඞ්ග්‍රහ වෙත්.

2. **කාමසුගති භූමි** නම් (අ) මනුෂ්‍ය (ආ) චාතුම්මහාරාජික (ඉ) තාවතිංස (ඊ) යාම (උ) තුසිත (ඌ) නිම්මාණරති (එ) පරනිර්මිත වසවර්ති යන සප්තවිධ කාම ස්වර්ගයි.

(අ) ස්මෘති, ශූරත්‍ව, බ්‍රහ්මචර්යා යන මෙයින් සෙස්සනට වඩා මන-සිත උත්සන්න වූවෝ **මනුෂ්‍යයෝ** ය. මෙයින් දඹදිව වැස්සෝ ම මනුෂ්‍යයෝ ය යි කිව යුතු. ඔවුන් ම යථොක්ත ගුණයෙන් උත්සන්න බැවිනි. රූප වහයෙන් ඒ සමාන බැවින් **පූර්වවිදෙහ, අපරගොයාන, උත්තරකුරුකයෝ** ද මනුෂ්‍යයෝ ය. මනු නම් ආදිකල්පික මහා සම්මත රජහුගේ පුත්‍ර පෞත්‍රයෝ ද තන්නීතියෙහි පිහිටියෝ ද මනුෂ්‍ය නම් වෙති යි ඇතැම්හු කියත්. මනුෂ්‍යයෝ යම් තැනෙක වෙසෙත් ද එය මනුෂ්‍ය භූමිය යි.

(ආ) **ධෘතරාෂ්ට්‍ර විරූඪ විරූපාක්ෂ වෛශ්‍රවණ** යන සතර වරම් රජදරුවන් කෙරෙහි භක්ති ඇත්තෝ චාතුම්මහාරාජිකයෝ ය. එනම් **ගන්ධබ්බ, කුම්භණ්ඩ, නාග, යක්ෂ** යන මොහුයි. ගන්ධ වෘක්ෂයන්හි අධිගෘහිත වූවෝ ගන්ධබ්බයෝ ය යි ද භයානක ඇකුම් ඇති රාක්ෂස විශේෂයෙක් කුම්භාණ්ඩයෝ යි ද කියනු ලැබෙත්. චාතුම්මහාරාජිකයෝ යම් තැනෙක වෙසෙද් ද එය චාතුම්මහාරාජික භූමිය යි.

(ඉ) මඝ මානවකාදි තෙතිස් දෙන යම් තැනෙක උපන්නෝ ද එය තාවතිංසය යි. මෙර මුදුනෙහි පිහිටි ශක්‍රාධිප දිව්‍යලෝකය යි.

(ඊ) **යාම** යනු තෘතීය දිව්‍යලෝකයෙහි අධිපති දේවයාගේ නාමය යි. ඒ දිව්‍යලෝකය ද එ නමින් ම ව්‍යවහෘත විය.

(උ) මහත් ශ්‍රී සම්පත්තියෙන් තුටු පහටු දෙවියන් වසන තැන **තුසිත** යි. සතර වන දිව්‍යලෝකය යි.

(ඌ) අභිමත සම්පත් නිර්මිත කොට ගෙන එහි ඇලෙන දෙවියන් වසන තැන **නිම්මානරතිය** යි. පස්වන දිව්‍යලෝකය යි.

(එ) ස්වකීය කැමැත්ත දැන අන්‍යයන් මැවූ සම්පත්හි ඇලෙන දෙවියන් වසන තැන **පරනිම්මිත වසවත්තිය** යි සවන දිව්‍යලෝකය යි.

මේ සප්තකාම ස්වර්ග ද යට දැක්වුණු සතර අපාය ද යන එකොළොස් තැන් එක්කොටැ **කාමාවචර භූමිය** යි කියනු ලැබේ.

ප්‍රශ්න

1. භූමි කෙතෙක් ද? කවරහු ද?
2. අපාය භූමි දක්වා එහි විශේෂ ද සඳහන් කරනු.
3. සප්තකාම ස්වර්ග දක්වනු.
4. මනුෂ්‍ය චාතුම්මහාරාජික විස්තර කරනු.
5. කාමාවචර භූමි කවරහු ද?

## 3. රූප භූමි හා අරූප භූමි.

චතුර්විධ භූමි අතුරෙන් අපාය භූමි හා කාමසුගති භූමි යට දක්වන ලදි. රූප භූමි හා අරූප භූමි මෙහි දක්වනු ලැබේ. රූප භූමි වනාහි 1 පඨමජ්ඣාන භූමි 2 දුතියජ්ඣාන භූමි 3 තතියජ්ඣාන භූමි 4 චතුත්ථජ්ඣාන භූමි යි චතුර්විධ වේ.

1 (අ) **බ්‍රහ්මපාරිසජ්ජ (ආ) බ්‍රහ්මපුරෝහිත (ඉ) මහාබ්‍රහ්ම** යන බඹලෝ තුන පඨමජ්ඣාන භූමි යි.

(අ) මහාබ්‍රහ්මයන්ගේ පිරිස වූ පරිවාරක බ්‍රහ්මයෝ බ්‍රහ්ම පාරිසජ්ජයෝය. (ආ) මහාබ්‍රහ්මයන්ගේ ඇමතියන් බඳු පුරෝහිත බ්‍රහ්මයෝ බ්‍රහ්ම පුරෝහිතයෝය. (ඉ) **සහස්සබ්‍රහ්ම ද්විසහස්ස බ්‍රහ්මාදි** මහත් වූ බ්‍රහ්මයෝ මහා බ්‍රහ්මයෝය. සක්වළ දහසකට අධිපති බ්‍රහ්ම සහස්ස බ්‍රහ්ම යි. සක්වළ දෙදහසකට අධිපති බ්‍රහ්ම ද්විසහස්ස බ්‍රහ්ම යි. මොවුන් අතුරෙන් බ්‍රහ්මපාරිසජ්ජයෝ හීන ය. බ්‍රහ්මපුරෝහිතයෝ මධ්‍යම ය. මහා බ්‍රහ්මයෝ ශ්‍රේෂ්ඨය. බ්‍රහ්මපාරිසජ්ජයන්ට ප්‍රකෘති බ්‍රහ්මපුරෝහිතයන් හෝ මහා බ්‍රහ්මයන් හෝ දැක්ක නො හැකිය. බ්‍රහ්මපුරෝහිතයන්ට ප්‍රකෘති මහාබ්‍රහ්මයන් දැක්ක නොහැකිය. ඔවුන්ගේ නිර්මිත රූප නම් දැක්ක හැකිය. ජ්වලිත ආලෝකයක් පහළ වීමෙන් මහාබ්‍රහ්ම පහළවූයේ ය යි සෙසු බ්‍රහ්මයන් දැනැ ගන්නා බව දක්වා තිබේ. ඔවුන් වසන භූමි ද එ නමින් ම දන්නා ලදි. මේ බඹලෝ තුන සම තලයෙහි පිහිටියේ ය.

2. **පරිත්තාභ, අප්පමාණාභ, ආභස්සර** යන බඹලෝ තුන දුතියජ්ඣාන භූමි යි.

පරිත්ත නම් ස්වල්ප, ආභා නම් ආලෝක. පරිත්ත ආභා ඇති බ්‍රහ්මයෝ පරිත්තාභයෝය. අප්‍රමාණ ආභා ඇති බ්‍රහ්මයෝ අප්පමාණාභයෝය. විහිදෙන ආභා ඇති බ්‍රහ්මයෝ ආභස්සරයෝය. මෙහි දු ආභස්සරයෝ අධිපතියෝය. පරිත්තාභයෝ හා අප්පමාණාභයෝ

ඔවුන්ගේ පරිචාරිකයෝ ද පුරෝහිතයෝ ද වෙත්. ඔවුන්ගේ වාසභූමි ද එ නමින් කියන ලදි. මේ බඹලෝ තුන ද සම තලයෙහි පිහිටියේය.

3. **පරිත්තසුභ, අප්පමාණසුභ, සුභකිණ්හ** යන බඹලෝ තුන තතියජ්ඣාන භූමි යි.

පරිත්ත නම් ස්වල්ප. සුභා නම් එකඝන වූ නිශ්චල ආලෝක. පරිත්ත සුභා ඇති බ්‍රහ්මයෝ පරිත්ත සුභයෝය, අප්‍රමාණ සුභා ඇති බ්‍රහ්මයෝ අප්‍රමාණ සුභයෝය. සුභායෙන් ආකීර්ණ වූ බ්‍රහ්මයෝ සුභකිණ්හයෝය. මෙහි දු සුභකිණ්හයෝ අධිපතියෝය, පරිත්තසුභ හා අප්පමාණ සුභ ඔවුන්ගේ පරිචාරකයෝ ද පුරෝහිතයෝ ද වෙත්. ඔවුන් වස තැන් ද එ නමින් කියන ලදි. මේ තුන ද සම තලයෙහි පිහිටියේය.

4. (අ) **වෙහප්ඵල**, (ආ) **අසඤ්ඤසත්ත** හා (ඉ) **සුද්ධාවාස** චතුත්ථජ්ඣාන භූමි යි.

(අ) වෘහත්-මහත් ඵල ඇති බ්‍රහ්මයෝ **වෙහප්ඵලයෝය**. ධ්‍යාන ප්‍රභාවයෙන් නිපන් විපුල ඵල ඔවුනට ඇති බැවිනි. (ආ) මෙහි සඤ්ඤා නම්, වෙදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාණ යන නාම ස්කන්ධ සතරය. එය නැති සත්ත්වයෝ අසඤ්ඤසත්තයෝය. අසඤ්ඤසත්ත බ්‍රහ්මයන්ට ඇත්තේ රූපස්කන්ධය පමණෙකි. මේ බ්‍රහ්මයන් වසන තැන් ද එ නමින් කියන ලදි. වෙහප්ඵලය හා අසඤ්ඤසත්තය සම තලයෙහි පිහිටියේය.

(ඉ) කාමරාග - පටිඝ රහිතයෝ සුද්ධයෝ ය. එනම් අනාගාමී හා රහත්හු යි. ඔවුන්ගේ ආවාස-භූමි **සුද්ධාවාස** යි සුද්ධාවාසයෙහි අනාගාමී හා අරහන්ත බ්‍රහ්මරාජයෝ ම වෙසෙත්. සුද්ධාවාස වනාහි **අවිහ, අතප්ප, සුදස්සී, අකනිට්ඨය** යි පසෙකි. ඒ තල වසයෙන්ද පසෙක්මය. මද කලෙකින් ස්වකීය ස්ථාන නොහරින්නෝ යන අර්ථයෙන් **අවිහය** යි ද කිසි තැවුලියක් නැත්තෝ යන අර්ථයෙන් **අතප්පය** යි ද පිරිසිදු ප්‍රසාද, දිව්‍ය, ධර්ම, ප්‍රඥා චක්‍ෂුසින් බලන්නෝ යන අර්ථයෙන් **සුදස්සය** යි ද එයිනුදු අධික වැ බලන්නෝ යන අර්ථයෙන් **සුදස්සිය** යි ද රූපීන් වශයෙන් තමන් කිසිවෙකුට කනිෂ්ඨ-බාලනොවන්නෝ යන අර්ථයෙන් අකනිට්ඨකය යි ද කියනු ලැබෙත්. ඔවුන් වසන තැන් ද එ නමින් ම ව්‍යවහෘත ය.

මෙහි රූපාවචර භූමි සොළොස දක්වන ලද බව දත යුතුයි.

4. **අරූපාවචරභූමි ද වනාහි ආකාසානඤ්චායතන, විඤ්ඤණඤ්චායතන, ආකිඤ්චඤ්ඤායතන, නේවසඤ්ඤනාසඤ්ඤායතන යි චතුර්විධ වේ.**

ආකාසානඤ්චායතනය යි කියනු ලබන ස්කන්ධ සතර යම් ආකාශ ප්‍රදේශයක පැතිර පවත්නේ ද ඒ ස්කන්ධ සහිත වූ ආකාශ ප්‍රදේශය ආකාසනඤ්චායතනය යි. සෙස්ස ද මෙසේ යි. මෙයින් අරූප භූමි සතර කියන ලදි.

මෙසේ සියලු භූමි එකතු කළ කල්හි 31 කි.

| | |
|---|---|
| අපාය භූමි | 4 |
| කාමසුගති භූමි | 7 |
| රූපාවචර භූමි | 16 |
| අරූපාවචර භූමි | 4 |
| සියල්ල | 31 |

මේ භූමි අතුරෙන් පඤ්චසුද්ධාවාසයෙහි පුථුජ්ජනයෝ ද සෝතාපන්න සකදාගාමිහු ද නැති එහි අනාගාමි හා අරහන්තයෝ වෙත්, සතර අපායෙහි ද අසඤ්ඤතලයෙහි ද ආර්යයෝ නැති. සෙසු භූමින්හි ආර්යයෝ ද පෘථග්ජනයෝ ද වෙත්.

**"පුථුජ්ජනා න ලබ්භන්ති සුද්ධාවාසෙසු සබ්බථා**
**සොතාපන්නා ච සකදගාමිනො වා පි පුග්ගලා,**
**අරියානොපලබ්භන්ති අසඤ්ඤාපාය භූමිසු**
**සෙසට්ඨානෙසු ලබ්භන්ති අරියා'නරියාපි ච"**

සුද්ධාවාස භූමින්හි පෘථග්ජනයෝ ද සෝවාන් සකෘදාගාමි පුද්ගලයෝ ද නොලැබෙති. අසංඥතලයෙහි හා අපායභූමින්හි ආර්යයෝ නො ලැබෙති. සෙසු තන්හි ආර්යයෝ ද අනාර්යයෝ ද ලැබෙත්.

**ප්‍රශ්න.**

1. භූමි කෙතෙක් ද? කවරහු ද?
2. අපාය භූමි පිළිබඳ විස්තරයක් දක්වනු.
3. කාමසුගති භූමි කෙතෙක් ද? කවරහුද?
4. රූපාවචර භූමි සොළොස හා ඒ පිළිබඳ විස්තරය දක්වනු.
5. අරූපාවචර භූමි දක්වා සියලු භූමිවල වසන සත්ත්වයන් පිළිබඳ විවේචනයක් කරනු.

# 4. චතුර්විධ ප්‍රතිසන්ධි

දෙවන තුන් වන පාඩම් වලින් භූමි පිළිබඳ විභාගය දක්වන ලදි. මෙහි ඒ භූමින්හි හටගන්නා ප්‍රතිසන්ධි සම්බන්ධ විනිශ්චය දක්වනු ලැබේ.

ප්‍රතිසන්ධි වනාහි 1 **අපාය ප්‍රතිසන්ධි,** 2 **කාමසුගති ප්‍රතිසන්ධි** 3 **රූපාවචර ප්‍රතිසන්ධි,** 4 **අරූපාවචර ප්‍රතිසන්ධි** ය යි චතුර්විධ වේ. ප්‍රකීර්ණක පාදයෙහි දැක්වුණු ප්‍රතිසන්ධි කෘත්‍ය කරන සිත් 19 බලනු. ප්‍රතිසන්ධි කෘත්‍ය කරන සිත් ම භවංග චුති කෘත්‍ය කරන බව සලකනු.

1 යට දැක්වුණු සතර අපාය භූමින්හි පිළිසිඳ ගන්නා සිත අපාය ප්‍රතිසන්ධි යි. ඒ වනාහි එකෙක්ම ය. එනම් **අකුසල විපාක උපෙක්ඛා සහගත සන්තීරණය** යි. සතර අපායෙහි උපදින්නෝ මේ සිතින්ම උපදිති. අන්‍ය සිතකින් නූපදිති. එහි භවඞ්ග වන්නේත් අවසානයෙහි චුති වන්නේත් මේමැ යි.

2. යට දැක්වුණු සප්ත කාමස්වර්ගයෙහි පිළිසිඳ ගන්නා සිත් කාම සුගති ප්‍රතිසන්ධියි. ඔවුහු වනාහි නවයෙකි. එනම් **කුසල විපාක උපෙක්ඛා සහගත සන්තීරණය හා මහා විපාක** අට ය.

මෙයින් මුල දැක්වූ කුසල විපාක උපෙක්ඛා සහගත සන්තීරණ සිතින් මනුෂ්‍යයන් සම්බන්ධ ජාත්‍යන්ධ ජාතිබධිර ජාත්‍යඝ්‍රාණ ජාතිමූග ජාතිඑළ ජාත්‍යුන්මත්ත පණ්ඩක උභතො බ්‍යඤ්ජනක නපුංසක මම්මනාදීන්ගේ ද භූමාටු දෙවියන් සම්බන්ධ ඇතැම් විනිපාතික අසුරයන්ගේ ද ප්‍රතිසන්ධිය වන්නේය.

චක්ෂුඃ ප්‍රශාදය උපදවන්නට අසමර්ථ කර්මයකින් පිළිසිඳ ගන්නෝ ජාත්‍යන්ධයෝය. එබඳු කර්මයකින් පිළිසිඳ ගත්තවුන්ට ප්‍රශාදරූප පහළ විය යුතු කාලයෙහි අන්‍ය කර්මයකින් හෝ චක්ෂුඃප්‍රසාද රූපය පහළ නො වේ. උත්පත්තියෙන් ම අන්ධයෝ යයි කී සේයි. එසේම උත්පත්තියෙන්ම බිහිරෝ ජාති බධිරයෝ ය. උත්පත්තියෙන් ම නාසිකාව නැත්තෝ ජාත්‍යඝ්‍රාණයෝ ය. උත්පත්තියෙන්ම ගොළුවෝ ජාති මූගයෝය. දිශා විදිශා ව්‍යවහාර මාත්‍රය පවා නොදන්නෝ ජාතිඑළයෝය. හැම කල්හිම උමතුවෝ ජාත්‍යුන්මත්තකයෝය. කාම හේතුයෙන් ආසිත්තාදි වශයෙන් විප්‍රකාර ක්‍රියා කරන්නෝ පණ්ඩකයෝය. ස්ත්‍රී පුරුෂ බ්‍යඤ්ජන ද්වයයෙන් ම යුක්ත වූවෝ උභතො බ්‍යඤ්ජනකයෝය. ඒ දෙකින් ම විරහිත වූවෝ නපුංසකයෝය. එක වචනය ගලමින් දෙතුන් වර කියන වික්කලුවෝ මම්මනයෝ ය. මොවුන්ගේ මනුෂ්‍යත්වය කුශලයෙන් වුව ද අඞ්ග විකලත්වය අහේතුක භාවයෙන් සිද්ධ යි.

භූමාටු දෙවියන් සම්බන්ධ ඇතැම් විනිපාතික අසුරයෝ නම් ආලවක සාතාගිර **හේමවතාදීන්** මෙන් වෘක්ෂ පර්වත නිශ්‍රිත විමානයන්හි අධිගෘහිත වැ වසන බලසම්පන්න යක්ෂයන්ගේ පරිවාරක වූ දුක සේ දිවි පවත්වන අමනුෂ්‍යයෝය. ඔවුහු බොහෝ සෙයින් ගම්හි හෝ ගම් අසල වෘක්ෂ ගුම්බ ලෙන් ගුහා සොහොන් ආදියෙහි වසමින් මිනිසුන් දමන බත් කැවුම් මස් ආදිය සොයා කමින් ළදරුවන් හා ගිලනුන් පෙළමින් සෙසු දුර්බල මිනිසුන් හෝ බියගන්වමින් දිවි පවත්වති. මොවුන් අතර ඇතැම් විට **ප්‍රියඞ්කර මාතෘ උත්තර මාතෘ** ආදීන් මෙන් ත්‍රිහේතුකයෝ ද වෙති. මෙහිලා ඇතැම් දුර්වල යක්ෂයෝ ද රාක්ෂසයෝ ද විමාන ප්‍රේතයෝ ද පරදත්තූප ජීවිහු ද ගත යුතු මොවුන්ගේ දෙවත්වය කුශලයෙන් වුව ද නීචත්වය අහේතුක භාවයෙන් සිද්ධ ය. ප්‍රතිසන්ධියෙන් ලැබෙන භවඞ්ග ද අවසානයෙහි ලැබෙන චුතිය ද පෙර කී න්‍යායෙන්ම දතයුතු.

මහා විපාක අටින් සප්තකාම ස්වර්ගයෙහි ම ප්‍රතිසන්ධි වන්නේය. එයින් සතරෙක් ද්විහේතුකය. සතරෙක් ත්‍රිහේතුක ද්විහේතුකයෝ රූපයෙන් හා ධනයෙන් යුක්ත වුව ද ඥානයෙන් දුබල වෙති. ත්‍රිහේතුකයෝ සර්වසම්පූර්ණ වෙත්.

මුල දැක්වුණු අකුශල විපාක ප්‍රතිසන්ධිය ද මෙහි දැක්වුණු නව ප්‍රතිසන්ධිය ද එක් කොටැ කාමාවචර ප්‍රතිසන්ධි දශයෙකැයි දත යුතු. සියල්ල කාමලෝකයෙහි ඇතුළත් බැවිනි.

මේ කාමාවචර භූමින්හි පිළිසිඳ ගන්නා සත්ත්වයන්ගේ ආයු විභාගය මෙසේ දත යුතු.

සතර අපායික සත්ත්වයන්ගේ ද මනුෂ්‍යයන්ගේ හා විනිපාතික අසුරයන්ගේ ද ආයුඃ ප්‍රමාණය මෙතෙකැ යි භූමිවශයෙන් නියම නැත. ඔවුන් කර්ම වශයෙන්ම ජීවත් වන බැවිනි. ඒ එසේ මැ යි. ඇතැම්හු අපායෙන් සතියකින් චුත වෙති. ඇතැම්හු කල්පයක් පමන වෙසෙති. නිරය පිළිබඳ අබ්බුද නිරබ්බුදාදි වශයෙන් වදාළ නියමය කර්ම වශයෙන් සිද්ධය යි දත යුතු. මනුෂ්‍යයන්ගේ ද ආයුෂ භූමි වශයෙන් නියම නැත. හෙද දඹදිව්වැසි මනුෂ්‍යයන්ගේ ය. උතුරුකුරු දිවයින් වැසියන්ට අවුරුදු දහයෙක් ද සෙසු දිවයින් දෙකට පන්සියය පන්සියය ද නියම ය. දඹදිව වැස්සන්ගේ ආයුෂ කලෙක දස අවුරුද්දට බසියි. කලෙක අසංඛයට නගියි. ඔවුන්ගේ සම විසම පැවතුම් ඇති බැවිනි. **"යාචිරංජීවති සොවස්සසතං ජීවති අප්පංවාභීයො දුතියං වස්සසතං න පාපුනාති"** යමෙක් බොහෝ කල් ජීවත් වන්නේ නම් සියක් වසක් හෝ ඉන් ස්වල්පයක් වැඩිය හෝ ජීවත් වන්නේ ය. දෙසිය වසට නො පැමිණෙන්නේය යි වදාළේ වර්තමාන කාලය සඳහාය යි දතයුතු.

අල්පේශාක්‍ය වූ හෝ මහේශාක්‍ය වූ හෝ බූමාටු දෙවියන්ගේ හා විමාන ප්‍රේතාදීන්ගේ ද ආයුෂ මෙතෙකැ යි නියම නැති. ඔවුන් අතුරෙනු දු ඇතැම්හු මඳ කලකින් මියති. ඇතැම්හු දීර්ඝ කාලයක් ජීවත් වෙත්.

**චාතුර්මහාරාජික** දෙවියන්ට දිව්‍ය වර්ෂ පන්සියයෙක් භූමි වශයෙන්ම ආයුෂ වේ. ඒ මෙසේ යි. මනුෂ්‍ය වර්ෂ පනසෙක් එහි එක අහොරාත්‍රයෙකි. එබදු අහොරත්‍ර තිසෙක් මාසායෙකි. ඒ මාස දොළොසෙක් වර්ෂයෙකි. එබඳු වර්ෂ පන්සියෙක් එහි ආයුෂයි. මෙය මිනිස් ගණනින් හව්රුදු නවලක්‍ෂයෙකි.

**තාවතිංසාදීන්ට** මෙය දෙ ආකාරයකින් දියුණු වේ. ඒ මෙසේ ය. මිනිස් වර්ෂ සියයෙක් තාවතිංස දෙවියන්ට එක අහොරාත්‍රයෙකි. එබඳු අහොරාත්‍ර තිසෙක් මසෙකි. එබඳු මාස දොළොසෙක් වර්ෂයෙකි. එබදු වර්ෂ දහසෙක් තාවතිංස දෙවියන්ට ආයුෂ යි. මෙය මිනිස් ගණනින් තුන්කෙළ සැටලක්‍ෂයෙකි.

**යාම** දෙවියන්ට මිනිස් වර්ෂ දෙසියයෙක් එක අහොරාත්‍රයෙකි. එබඳු අහොරාත්‍ර තිසෙක් මසෙකි. එබඳු මාස දොළොසෙක් වර්ෂයෙකි. එබඳු වර්ෂ දෙදහසෙක් එහි ආයුෂයි.

**තුසිත** දෙවියන්ට මිනිස් වර්ෂ සාරසියයෙක් එක අහොරාත්‍රයෙකි. එබඳු අහොරාත්‍ර තිසෙක් මසකි. එබඳු මාස දොළොසෙක් වර්ෂයෙකි. එබඳු වර්ෂ සාරදහසෙක් එහි ආයුෂ යි.

**නිම්මාණරති** දෙවියන්ට මිනිස් වර්ෂ අටසියයෙක් එක අහොරාත්‍රයෙකි. එබඳු අහොරාත්‍ර තිසෙක් මසෙකි. එබඳු මාස දොළොසෙක් වර්ෂයෙකි. එබඳු වර්ෂ අටදහසෙක් එහි ආයුෂ යි.

**පරනිම්මිත වසවත්ති** දෙවියන්ට මිනිස් වර්ෂ එක් දහස් හයසියයෙක් එක අහොරාත්‍රයෙකි. එබඳු අහොරාත්‍ර තිසෙක් මසෙකි. එබඳු මාස දොළොසෙක් වර්ෂයෙකි. එබඳු වර්ෂ සොළොස් දහසෙක් එහි ආයුෂ යි. මෙය මිනිස් ගණනින් අවුරුදු නවසිය විසිඑක් කෝටි හැට ලක්‍ෂය යි.

**ප්‍රශ්න.**

1. ප්‍රතිසන්ධි කී වැදෑරුම් ද? කවරහුද?
2. සතර අපායෙහි පිළිසිඳ ගන්නෝ කවර සිතකින් පිළිසිඳ ගනිත් ද?
3. කාමසුගති ප්‍රතිසන්ධි නවය දක්වනු.
4. කුසල විපාක උපෙක්ඛා සහගත සන්තීරණයෙන් කොහි කෙබඳු වැ උපදිත් ද?
5. කාම භූමිවල ආයු නියමය දක්වනු.

## 5. රූපාවචර අරූපාවචර ප්‍රතිසන්ධි

අපාය ප්‍රතිසන්ධි හා කාමසුගති ප්‍රතිසන්ධි යට පාඩම්හි දක්වන ලදි. මෙහි රූපාවචර අරූපාවචර ප්‍රතිසන්ධි දක්වනු ලැබේ.

පඨමජ්ඣාන විපාක චිත්තය ප්‍රථමධ්‍යාන භූමියෙහි ප්‍රතිසන්ධි වන්නේය. පසු වැ භවඞ්ග වශයෙන් පැවැත අවසානයෙහි චුති වන්නේය. ප්‍රථම ධ්‍යාන භූමි නම් **බ්‍රහ්ම පාරිසජ්ජ, බ්‍රහ්ම පුරොහිත, මහාබ්‍රහ්ම** යි.

දුතියජ්ඣාන විපාක චිත්තය හා තතියජ්ඣාන විපාක චිත්තය ද්විතීය ධ්‍යාන භූමියෙහි ප්‍රතිසන්ධි වැ පසු වැ භවඞ්ග වශයෙන් පැවැත අවසානයෙහි චුති වන්නේය. ඖදාරික වූ විතර්කය නැති බැවින් ද්විතීයධ්‍යාන විපාක චිත්තය ප්‍රථමධ්‍යාන විපාක චිත්තයට වඩා බලවත්ය. තෘතීයධ්‍යානයට වඩා අති දුර්බල ද නොවේ. එබැවින් ඒ උභය විපාක ම දුතියජ්ඣාන භූමියෙහි ප්‍රතිසන්ධි වේ. මෙහි විපාක පඤ්චකනය වශයෙන් ද භූමි චතුෂ්කනය වශයෙන්ද දක්වන ලද බව සැලකිය යුතුයි. ද්විතීයධ්‍යාන භූමි නම් **පරිත්තාභ අප්පමාණාභ ආභස්සර** යි.

චතුත්ථජ්ඣාන විපාක චිත්තය තෘතීය ධ්‍යාන භූමියෙහි ප්‍රතිසන්ධි භවඞ්ග චුති වන්නේය. තෘතීය ධ්‍යාන භූමි නම් **පරිත්තසුභ, අප්පමාණ සුභ, සුභකිණ්ණක** යි.

පඤ්චමජ්ඣාන විපාක චිත්තය චතුර්ථ ධ්‍යාන භූමියෙහි ප්‍රතිසන්ධි භවඞ්ග චුති වන්නේය. චතුර්ථධ්‍යාන භූමි නම් වෙහප්ඵල අසඤ්ඤසත්ත සුද්ධාවාස යි. මෙයින් අසඤ්ඤසත්ත බඹුනට ප්‍රතිසන්ධි වන්නේ රූපය පමණෙකි. එබැවින් ඔවුන්ට ප්‍රවෘත්ති කාලයෙහි ද චුති කාලයෙහි ද රූපය ම පැවැත නිරුද්ධ වන්නේය. එවිට රූපාවචර ප්‍රතිසන්ධි සයෙකි.

මේ රූපී බ්‍රහ්මයන්ගේ ආයු පරිච්ඡේදය ද මෙසේ දතයුතු යි.

බ්‍රහ්මපාරිසජ්ජයන්ගේ පරමායුෂය කල්පයෙන් තුනින් කොටසෙකි. එ ද අසංඛ්‍ය කල්පයෙනි.

කල්ප වනාහි මහාකල්ප අසඞ්ඛ්‍යකල්ප අන්තරකල්ප ආයුඃකල්ප යයි චතුර්විධ වේ. මහාකල්ප නම් අසඞ්ඛ්‍යකල්ප සතරෙකි. අසඞ්ඛ්‍යකල්පය සංවට්ට සංවට්ටට්ඨායි විවට්ට විවට්ටට්ඨාය යි සතර වැදැරුම් වේ. ලෝකය විනාශ වෙමින් පවත්නා කාලය සංවට්ට අසංඛ්‍ය කල්පයයි. විනාශ වැ පවත්නා කාලය සංවට්ටාට්ඨායි අසඞ්ඛ්‍ය කල්පය යි. ලෝකය වැඩෙමින් පවත්නා කාලය විවට්ට අසංඛ්‍ය කල්පයයි. වැඩී පවත්නා කාලය විවට්ටට්ඨායි අසංඛ්‍ය කල්පය යි. විවට්ටට්ඨායි අසඞ්ඛ්‍ය කල්පයෙහි වර්ෂ අසංඛ්‍යයේ පටන් දසය දක්වා පිරිහී නැවත දසයේ පටන් අසඞ්ඛ්‍ය දක්වා වැඩෙන කාලය අන්තර කල්පයෙකි. මෙය චූල කල්පය යි ද කියනු ලැබේ. එබඳු අන්තර කල්ප සූසැටෙක් එක අසංඛ්‍ය කල්පයෙකි. අසූවෙකැයි ඇතැම්හු කියත්. වෛදිකයෝ අන්තර කල්ප තුදුසෙක් එක් අසංඛ්‍ය කල්පයෙකැ යි කියති. එක් එක් සත්ත්වයෙකුට නියත ආයු කාලය ආයුෂ්කල්පය යි.

මේ කල්ප විනාශ වීමේ දී පිළිවෙලින් සත් වරක් ගින්නෙන් විනාශ වැ අටවන වර ජලයෙන් විනාශ වේ. නැවත සත්වරක් ගින්නෙන් විනාශ වැ අටවන වර ජලයෙන් විනාශ වේ. මෙසේ සැටසතර පිරිහීමෙහි දී වාතයෙන් විනාශ වන්නේය.

ගින්නෙන් වන කල්ප විනාශය ආභස්සර බඹලොවින් යටද, ජලයෙන් වන විනාශය සුභකිණ්ණ බඹලොවින් යට ද, වාතයෙන් වන විනාශය වෙහප්ඵල බඹලොවින් යට ද වේ.

කියන ලද මැයිඃ-
"සත්ත'සත්තඟ්ගිනා ද්වාරා අට්ඨමෙ අට්ඨමෙ දකා
චතුසට්ඨී යද පුණ්ණා එකො වායුවරො සියා
අග්ගිනාභස්සරා හෙට්ඨා ආපෙන සුභකිණ්ණතො
වෙහප්ඵලතො වාතෙන එවං ලොකො විනස්සති"

අර්ථ සුගම යි.

බ්‍රහ්මපුරොහිතයන්ගේ ආයුෂ අසංඛ්‍යකල්පයෙන් අර්ධයෙකි. මහාබ්‍රහ්මයන්ගේ ආයුෂ එක් අසඞ්ඛ්‍යකල්පයෙකි. **පරිත්තාභ** බඹුන්ට මහාකල්ප දෙකෙකි. **අප්පමාණාභයන්ට** සතරෙකි. **ආභස්සරයන්ට** අටෙකි. **පරිත්තසුභයන්ට** සොළොසෙකි. **අප්පමාණසුභයන්ට** දෙතිසෙකි. **සුභකිණ්ණයන්ට** සූසැටෙකි. **වෙහප්ඵලයන්ට** හා **අසඤ්ඤසත්තයන්ට** මහාකල්ප පන්සියෙකි. **අවිහයන්ට** දහසෙකි. **අතප්පයන්ට** දෙදහසෙකි. **සුදස්සයන්ට** සාරදහසෙකි. **සුදස්සීන්ට** අටදහසෙකි. **අකනිට්ඨකයන්ට** සොළොස් දහසෙකි.

**ආකාසානඤ්චායතන** විපාක චිත්තය ආකාසානඤ්චායතන භූමියෙහි ද, **විඤ්ඤණඤ්චායතන** විපාකචිත්තය විඤ්ඤාණඤ්චායතන භූමියෙහි ද, **ආකිඤ්චඤ්ඤයතන** විපාක චිත්තය ආකිඤ්ඤයතන භූමියෙහිද, **නේවසඤ්ඤනාසඤ්ඤයතන** විපාක චිත්තය, නේවසඤ්ඤානාසඤ්ඤායතන භූමියෙහි ද ප්‍රතිසන්ධි භවඞ්ග චුතිවශයෙන් පවත්නේය.

එහිදු ආකාසානඤ්චායතන බඹුන්ට මහාකල්ප විසිදහසෙක් ද, **විඤ්ඤණඤ්චායතන** බඹුන්ට සතළිස් දහසෙක් ද **ආකිඤ්චඤ්ඤයතන** බඹුන්ට සැටදහසෙක් ද, **නේවසඤ්ඤනාසඤ්ඤයතන** බඹුන්ට සුවාසූ දහසෙක් ද ආයුෂ වන්නේ ය.

**"පටිසන්ධිභවඞ්ගඤ්ච තථා වචනමානසං**
**එකමෙව තථෛවෙක විසයං චෙකජාතියං"**

ප්‍රතිසන්ධි සිත ද භවඞ්ග සිත ද චුති සිත ද එක ජාතියෙහි කර්ම කර්මනිමිති ගතිනිමිතීන් අතුරෙන් එකකම අරමුණු කොට ඇති එක ම සිතෙකි. එ බෙහෙත ම දෙවයි වෙදා කී කල්හි දුන් බෙහෙත ම නො වැ ඒ සමාන ම බෙහෙතක් දෙන්නා සේ එක ම සිත යයි කී කල්හි ඒ සමානම සිතක් බව ගන්නේය.

**ප්‍රශ්න.**

1. පඨමජ්ඣාන විපාකය කො තැන්හි ප්‍රතිසන්ධි වන්නේද?
2. ද්විතීයධ්‍යාන භූමියෙහි ප්‍රතිසන්ධි කිමෙක් ද එයට හේතු දක්වනු.
3. රූපප්‍රතිසන්ධි කොහි ලැබේ ද?
4. රූපාරූපභූමින්හි ආයු නියමය දක්වනු.
5. කල්ප පිළිබඳ විස්තරයක් දෙනු.

## 6. චතුර්විධ කර්ම

මෙහි දෙ වන තුන් වන පාඩම්වලින් භූමි භෙදද සතරවන පස් වන පාඩම්වලින් ඒ භූමින්හි හටගන්නා ප්‍රතිසන්ධි ද දක්වන ලදි. ප්‍රතිසන්ධි නම් විපාකයි. විපාක දෙන්නේ

කර්මය. එබැවින් ඒ ප්‍රතිසන්ධි දෙන කර්ම පිළිබඳ භෙද මෙහි දැක්විය යුතුය. යට ද තන්හි තන්හි එය දැක්වූ නමුදු ඒ සම්බන්ධ විශේෂ විනිශ්චයෙක් මෙහි දක්වනු ලැබේ.

කර්ම වනාහි ඇතැම් විට තෙමේ ම විපාක උපදවයි. ඇතැම් විට අන්‍යකර්මයන්ට අනුබල දෙයි. ඇතැම් විට අන්‍ය කර්මයන්ගේ ශක්තිය දුර්බල කරයි. ඇතැම් විට අන්‍ය කර්මයන්ගේ ශක්තිය සිඳලයි. මෙසේ කර්ම ජනන උපත්ථම්භන-උපපීළන-උපඝාත යයි කෘත්‍ය සතරක් කරන්නේය. එබැවින් **කර්මය ජනකකර්මය උපත්ථම්භක කර්මය, උපඝාතක කර්මය** යි කෘත්‍ය වශයෙන් චතුර්විධ වේ. එක කර්මයට මේ චතුර්විධ කෘත්‍ය ම සිද්ධ කළ හැකි බැව් ද කියනු ලැබේ.

**ජනක කර්මය** නම් ප්‍රතිසන්ධි වශයෙන් හා ප්‍රවෘත්ති වශයෙන් විපාක ස්කන්ධ ද කටත්තාරූප ද උපදවන කුශලාකුශල චෙතනා යි. යට දැක්වුණු එකුන්විසි ප්‍රතිසන්ධි සිත් විපාක ස්කන්ධ යි. කර්මජ රූප කටත්තාරූප යි. එහි දු ප්‍රතිසන්ධි උපදවන්නේ කර්මපථ බවට පැමිණි කර්මය මැ යි. වරක් ප්‍රතිසන්ධි දුන් කර්මය නැවත ප්‍රතිසන්ධි දීමෙහි අසමර්ථ ය. එහි ප්‍රතිසන්ධි දායක ශක්තිය පිරිහුණු බැවිනි. කර්මපථ බවට පැමිණි හෝ නොපැමිණි යටත් පිරිසෙයින් සිහිනෙන් කළ කුශලාකුශල කර්ම ද ප්‍රවෘත්ති විපාක දෙන්නේය. එක කර්මය සියදහස් ජාතියෙහි දු ප්‍රවෘත්ති විපාක දීමට සමර්ථ ය.

**උපත්ථම්භක කර්මය** නම් ජනක කර්මයට හෝ ජනක කර්මයෙන් නිපන් ස්කන්ධ සන්තානයට අනුබල දෙන කුශලාකුශල චේතනා යි. ජනක කර්මයට අනුබල දීම නම් දුර්බල ජනක කර්මය බලසම්පන්න කිරීම ය. අකුශල කර්මයෙන් ඔසුපත් නිරයෙහි උපදිය යුත්තෙක් උපත්ථම්භක කර්මයෙන් වහල් ලැබූ කල මහා නිරයෙහි උපදින්නේය. කුශල කර්මයෙන් අල්පේශාක්‍ය කුලයෙක උපදිය යුත්තෙක් උපත්ථම්භක කර්මයෙන් වහල් ලැබූ කල මහේශාක්‍ය කුලයෙහි උපදින්නේය. යට දෙව්ලොව උපදිය යුත්තෙක් උඩ දෙව්ලොව උපදින්නේය. ජනක කර්මයෙහි නිපන් ස්කන්ධ සන්තානයට අනුබල දීම නම් ජනක කර්මානුරූප වැ ප්‍රතිසන්ධි ලත් කල ප්‍රවෘත්ති විපාක දැඩි කිරීම ය. අකුශලකර්මයෙන් තදනුරූප අපායෙක උපන් කල උපත්ථම්භක කර්මය එහි දුක් දැඩි කරන්නේය. කුශල කර්මයෙන් තදනුරූප සුගතියෙක උපන් කල එහි සැප වැඩි කරන්නේය.

**උපපීළක කර්මය** නම් ජනක කර්මය හෝ ජනක කර්මයෙන් නිපන් ස්කන්ධ සන්තානය දුර්බල කරන කුශලාකුශල චේතනාය. ජනක කර්මය දුර්බල කිරීම නම් කුශල චේවා අකුශල චේවා කර්මයෙහි නියම ශක්තිය අඩු කිරීමය. ජනක කර්මයෙන් මහානිරයෙහි උපදිය යුත්තෙක් උපපීළක කර්මයෙන් බාධා ලත් කල ඔසුපත් නිරයෙහි උපදින්නේය. මහේශාක්‍ය කුලයෙහි උපදිය යුත්තෙක් අල්පේශාක්‍ය කුලයෙහි ද උඩ දෙව්ලොව උපදිය යුත්තෙක් යට දෙව්ලොව ද උපදින්නේ ය. ජනක කර්මයෙන් නිපන් ස්කන්ධ සන්තානය දුර්බල කිරීම නම් ප්‍රවෘත්ති විපාක දුර්බල කිරීම ය. අකුශල කර්මයෙන් තිරිසන් යෝනියෙහි උපන් කල උපපීළක කර්මය එහි දුක් අඩු කොටැ සුව සලසන්නේ ය. කුශල කර්මයෙන් රාජකුලයෙහි උපන් කල උපපීළක කර්මය නා නා ව්‍යාධි ඇති කොටැ ද හිත

මිතුරන්ට විපත් කොටැ ද දුක් සලසන්නේ ය. කර්මඵල වනාහි විපාකඵල නිස්සන්‍දඵලය යි ද්විවිධ වේ. විපාක ඵල තමහට ම ය. නිස්සන්‍දඵල ආශ්‍රිතයන්ට ද වැටේ.

**උපඝාතක කර්මය** නම් ජනක කර්මය හෝ ජනක කර්මයෙන් නිපන් ස්කන්‍ධ සන්තානය හෝ සිඳලන කුශලාකුශල චේතනා ය. ජනක කර්මය සිඳලීම නම් ජනක කර්ම ශක්තිය සහමුලින් නසා ලීම ය. එක් ජනක කර්මයකින් ප්‍රතිසන්‍ධි ලැබිය යුතු අවස්ථාවෙහි උපඝාතක කර්මය එය සිඳ හෙළා අන්‍යජනක කර්මයකට අවකාශ දෙන්නේය. ජනක කර්මයෙන් නිපන් ස්කන්‍ධ සන්තානය සිඳලීම නම් ප්‍රවෘත්ති විපාක නසා ජීවිතයෙන් වියෝග කිරීම ය. ජනක කර්මයෙන් සුගතියෙක හෝ දුගතියෙක උපන් කල එහි ආයුෂ තාක් ජීවත් වන්නට අවකාශ නොදී උපඝාතක කර්මය ඔහු එයින් චුත කරන්නේ ය. අකාල මරණය යනු මෙය යි. උපඝාතකයට උපච්ඡේදකය යි ද කියනු ලැබේ.

ප්‍රශ්න

1. කෘත්‍ය වශයෙන් කර්ම කී වැදෑරුම් ද?
2. ජනක කර්මය යනු කිමෙක්ද? පැහැදිලි කැරැ දක්වනු.
3. උපත්ථම්භක උපපීළක කර්මයන්ගේ වෙනස දක්වනු.
4. උපඝාතක කර්මය කිම?
5. යට දැක්වුණු දිට්ඨධම්මවෙදනියාදීන්ගේ හා මොවුන්ගේ සාම්‍යයෙක් ඇත්නම් දක්වනු.

## 7. චතුර්විධ කර්ම (ගරුකාදි සතර)

කර්මය කෘත්‍ය වශයෙන් චතුර්විධ වූ සැටි යට දැක්විණි. විපාක දාන ක්‍රමයෙන් චතුර්විධ වන සැටි මෙහි දක්වනු ලැබේ.

එක සත්ත්වයකු විසින් කරනු ලබන කුශලාකුශලකර්මයන්ගේ ප්‍රමාණයෙක් නැත. ඔවුන් අතුරෙන් කවර කර්මයෙක් පළමුකොට ප්‍රතිසන්‍ධි දෙන්නේ ද යනු දැනැ ගත යුතු ය. ගරු වශයෙන් ද ආසන්න වශයෙන් ද ආචීර්ණ වශයෙන් ද අනියමයෙන් දැයි එසේ කර්ම විපාක දෙන ක්‍රම සතරෙකි. එහෙයින් ම කර්මය **ගරුක ආසන්න ආචීර්ණ කටත්තා** ය යි විපාක දාන ක්‍රමයෙන් චතුර්විධ වේ. **ගරුක කර්මය නම්** අන්‍ය කර්මයකින් විපාක වැළකිය නොහැකි බැරෑරුම් කුශලාකුශල චේතනායි. එය අකුශල පක්‍ෂයෙන් නියත මිථ්‍යාදෘෂ්ටි හා පඤ්චානන්තරිය ද කුසල පක්‍ෂයෙන් මහග්ගත ද වේ. මවුන් මැරීම, පියන් මැරීම, රහතන් මැරීම, බුද්ධශරීරයෙන් ලේ සෙලවීම, සඞ්ඝයා භේද කිරීම යන පස පඤ්චානන්තරිය යි. කර්ම නැත විපාක නැත පරලෝ නැත යනාදීන් ඇදහීම නියත මිථ්‍යාදෘෂ්ටිය යි. මෙයින් එකකිනු දු ලැබෙන කර්මය දෙ නව අත්බැව අපායයෙහි ප්‍රතිසන්‍ධි දෙයි. එය අන්‍ය කිසි කර්මයෙකින් වැළකිය හැකි නොවේ. පඤ්චානන්තරිය ම හෝ එයින් කීපයක් හෝ කළහොත් එයිනු දු ගරුකර්මය ආනන්තරිය වේ. මහග්ගත නම්

රූපාවචර අරූපාවචර කුසලි. ධ්‍යානලාභීහු එයින් නො පිරිහී කාලක්‍රියා කළෝනම් අනතුරු අත්බැව බඹලොව උපදිති. එය අන්‍ය කිසි කර්මයකින් වැළකිය නොහැක.

**ආසන්න කර්මය** නම් පූර්වයෙහි කොටැ මරණාසන්නයෙහි සිහිකරන ලද හෝ මරණාසන්නයෙහි ම කරන ලද හෝ කුශලාකුශල චේතනාව යි. ආචීර්ණ කර්මය නම් කලක් මුළුල්ලෙහි නිරතුරු වැ කරන ලද හෝ වරක් කොටැ පසුවැ නැවත නැවත සිහි කරන ලද හෝ කුශලාකුශල චේතනා යි. යබ්බහුල යනු දු මේ යි.

**කටත්තාකර්මය** නම් මේ තුන් ආකාරයට ම අයත් නො වූ කළ හෙයින් කර්ම යැයි කිය යුතු කුශලාකුශල චේතනා යි. එනම් පූර්වජාතීන්හි කරන ලද අපරාපරිය වේදනිය කර්ම යි. යට දැක්වූ ගරුකාදි තුන් ආකාරයට අයත් නොවන මේ ජන්මයෙහි කළ කර්ම ද කටත්තාකර්මය යි ඇතැම්හු කියත්.

ගරුකර්මය පළමු කොටැ ප්‍රතිසන්‍ධි දෙන්නේ ය. ගරුකර්ම නැති කල්හි ආසන්න කර්ම ද ආසන්න කර්ම නැති කල්හි ආචීර්ණ කර්ම ද ආචීර්ණ කර්ම නැති කල්හි කටත්තාකර්ම ද පළමු කොටැ ප්‍රතිසන්‍ධි දෙන්නේ ය.

විපාක දෙන ආකාර වශයෙන් මෙන් ම විපාක දෙන කාල වශයෙන් ද කර්ම චතුර්විධ වේ. ඇතැම් කර්ම මේ අත් බැව්හි ම විපාක දෙන්නේ ය. ඇතැම් කර්ම දෙ වන අත් බැව්හි විපාක දෙන්නේ ය. ඇතැම් කර්ම සසර කවර හෝ අත්බැවෙක විපාක දෙන්නේ ය. ඇතැම් කර්ම කැල ම විපාක නො දෙන්නේ ය. මෙසේ බැවින් කර්ම **දිට්ඨධම්මවෙදනීය උපපජ්ජ වෙදනීය අපරාපරියවෙදනීය අහොසිය** යි විපාක දාන කාල වශයෙන් ද චතුර්විධ වේ.

**දිට්ඨධම්මවෙදනීය කර්ම** නම් මේ අත්බැව්හි ම විපාක උපදවන කුශලාකුශල චේතනා යි. එනම් කුශලාකුශල ජවන් සත අතුරෙන් ප්‍රථම ජවනය යි. එය වනාහි ආසෙවන ප්‍රත්‍යය නො ලබන බැවින් සර්වදුර්බල ය. මරණයෙන් ඔබ විපාක දීමෙහි අසමර්ථ ය. ප්‍රත්‍යය ලදහොත් මේ අත්බැව්හි ප්‍රවෘත්ති මාත්‍රයක් දෙයි. නොලදහොත් අහොසි වේ.

**උපපජ්ජවෙදනීය කර්ම** නම් දෙවන අත්බැව්හි ප්‍රතිසන්‍ධි උපදවන කුශලාකුශල චේතනා ය. එනම් කුශලාකුශල ජවන් සත අතුරෙන් සත් වන ජවනය යි. එය වනාහි ආසෙවන ප්‍රත්‍යය ලැබුවත් වැටෙන්නට ආසන්න බැවින් මධ්‍ය ජවන් මෙන් බලසම්පන්න නො වූයේ ප්‍රත්‍යය ලදහොත් දෙ වන අත් බැව්හි විපාක දෙයි. ප්‍රත්‍යය නො ලද හොත් අහෝසි වේ.

**අපරාපරියවෙදනීය කර්ම** නම් දෙ වන අත්බැවින් මතු කවර අත්බැවෙක හෝ ප්‍රතිසන්‍ධි උපදවන කුශලාකුශල චේතනා යි. එනම් කුශලාකුශල ජවන් සත අතුරෙන් මධ්‍ය ජවන් පස ය. එය වනාහි ආසෙවන ප්‍රත්‍යය ලත් හෙයින් බලවත් වූයේ ජාති පසෙක ප්‍රතිසන්‍ධි දී කල්ප සිය දහසෙක් හි දු ප්‍රවෘත්ති විපාක දෙන්නේ ය.

**අහොසි කර්ම නම්** කැලම විපාක නො දෙන කර්ම යි. ප්‍රථම ජවනය මේ අත්බැව්හි විපාක නුදුන හොත් අහෝසි වේ. සප්තම ජවනය දෙ වන අත්බැව්හි විපාක නුදුනහොත් අහෝසි වේ. මධ්‍ය පඤ්ච ජවන සසර කොතැනක දී හෝ විපාක නුදුනහොත් ස්කන්ධ පරිනිර්වාණයෙන් අහෝසි වේ.

ප්‍රශ්න.

1. විපාක දීමේ ක්‍රමයෙන් කර්ම කී වැදෑරුම් ද? ඔහු කවරහු ද?
2. ගරුක, ආසන්න, ආචීර්ණ, කටත්තා යන කර්මයන්ගේ ස්වරූප දක්වනු.
3. විපාක දෙන කාල වශයෙන් කර්ම කී වැදෑරුම් ද? ඔහු කවරහු ද?
4. දිට්ඨධම්මවෙදනීයාදි චතුර්විධ කර්ම පහදා දෙනු.
5. මේ කර්ම දෙ කොටස එක් කොටැ දැක්විය හැකි ක්‍රමයෙක් ඇත්නම් පැහැදිලි කැරැ දක්වනු.

## 8. චතුර්විධ කර්ම (අකුශල)

විපාක දෙන ආකාර වශයෙන් ද විපාක දෙන කාල වශයෙන් ද කර්ම චතුර්විධ වූ සැටි යට දැක්විණි. විපාක දෙන ස්ථාන වහයෙන් චතුර්විධ වන සැටි මෙහි දක්වනු ලැබේ.

ඇතැම් කර්ම අපාය භූමියෙහි ද ඇතැම් කර්ම කාමසුගති භූමියෙහි ද ඇතැම් කර්ම රූපාවචර භූමියෙහි ද ඇතැම් කර්ම අරූපාවචර භූමියෙහි ද විපාක දෙන්නේ ය. එබැවින් කර්ම වනාහි **අකුශලකර්ම, කාමාවචර කුශලකර්ම, රූපාවචර කර්ම, අරූපාවචර කර්මය** යි විපාක දෙන ස්ථාන වශයෙන් චතුර්විධ වේ.

ඔවුන් අතුරෙන් අකුශල කර්ම වනාහි **කායකර්ම, වාක් කර්ම, මනඃකර්මය** යි කර්මද්වාර වශයෙන් ත්‍රිවිධ වේ. කායද්වාරයෙහි පැවැතියේ කායකර්මය. වාග්ද්වාරයෙහි පැවැතියේ වාක්කර්මය. මනොද්වාරයෙහි පැවැතියේ මනඃ කර්ම යි.

**පාණාතිපාත, අදින්නාදන, කාමමිථ්‍යාචාර** යන තුන බොහෝ සෙයින් කායද්වාරයෙහි පවත්නා බැවින් කාය කර්ම යි. බොහෝ සෙයිනැයි කීයේ පාණාතිපාත, අදින්නාදාන ඇතැම් විට වාග්ද්වාරයෙහි ද සිද්ධ විය හැකි බැවිනි.

ප්‍රාණ යනු සම්මති වශයෙන් සත්ත්ව වේ. පරමාර්ථ වශයෙන් ජීවිතෙන්ද්‍රිය යි. සත්ත්වයකුගේ ස්වාභාවික පතනය වළකා අතිපතනය-ප්‍රයෝග බලයෙන් හෙළාලීම-මැරීම ප්‍රාණාතිපාතය. එහිලා උපදන චේතනා ප්‍රාණාතිපාත අකුශලකර්මය යි දත යුතු. සතකු වන බව, සතකු බව දන්නා බව, මරණ සිත, උපක්‍රම කිරීම, මැරීම එහි අඞ්ගයි. උපක්‍රම සම්බන්ධයෙන් සාහත්ථික ආණත්තික නිස්සග්ගිය ථාවර ඍද්ධිමය විද්‍යාමය ය යි ප්‍රයොග සයෙකි. තමා විසින්ම මැරීම සාහත්ථිකය. අනුන් ලවා මැරවීම ආණත්තිකය. පොලු ආදිය

දමා ගැසීමෙන් වෙඩිතිබීම් ආදියෙන් මැරීම නිස්සග්ගිය බොරු වළවල් කැණීම් ආදියෙන් මැරීම ථාවරය. ඍද්ධිබලයෙන් මැරීම ඍද්ධිමය ය. මන්ත්‍ර පිරුවීම් ආදියෙන් මැරීම විද්‍යාමය ය. මේ කවර ප්‍රයෝගයකින් හෝ සතකු මරන්නහුට ප්‍රාණාතිපාත කර්මපථය වේ. ආණත්තික වශයෙන් සිද්ධවන බැවින් වාග්ද්වාරයෙහි ද ඇතුළත් වන්නේ ය.

අදින්න යනු නුදුන් දෙය. ආදාන යනු ගැන්ම. හිමියන් විසින් තමන් වෙත නුදුන් දෙය ගැන්ම හෙවත් සොරකම් කිරීම අදින්නාදානය යි. එහි ලා උපදින චේතනාව අදින්නාදාන අකුශල කර්මය යි දත යුතු. අන්සතු දෙයක් වීම, අන්සතු බව දැනීම, සොරසිත, උපක්‍රම කිරීම, ගැනීම එහි අඞ්ගයි. එහිදු උපක්‍රම වනාහි ආදියන හරණ අවහරණාදි වශයෙන් නානාවිධ ය. ඒ කවර විධියකින් හෝ අන්සතු දෙය සොරා ගන්නහුට අදින්නාදාන කර්මපථය වේ. මේ ද ආණත්තික වශයෙන් සිද්ධ වන බැවින් වාග්ද්වාරයෙහි ද ඇතුළත් වන්නේ ය.

කාම යනු මෙහි ස්ත්‍රීපුරුෂයි. මිච්ඡාචාර නම් වරදවා හැසිරීම යි. පුරුෂයන්ට පරස්ත්‍රී සෙවනයෙහි ද ස්ත්‍රීන්ට පර පුරුෂ සේවනයෙහි ද උපදින ආස්වාද චේතනාව කාමමිථ්‍යාචාර අකුසලකර්මය යි. පර ස්ත්‍රියක් හෝ පරපුරුෂයකු වීමය. සෙවන චිත්තය, උපක්‍රමය, අධිවාසනය යි මෙහි අඞ්ග සතරෙකි. පර ස්ත්‍රීහු නම් ස්වකීය භාර්යාව හැර මාතුරක්ඛිතා පිතුරක්ඛිතා මාතාපිතුරක්ඛිතා භගිනිරක්ඛිතා භාතුරක්ඛිතා ඤාතිරක්ඛිතා ගොත්තරක්ඛිතා ධම්මරක්ඛිතා සාරක්ඛාසපරි දණ්ඩා යන දසදෙන ද, ධනක්කීතා ඡන්දවාසිනී භොගවාසිනී පටවාසිනී ඕදපත්තකිනි ඕහතචුම්බටා දාසිභරියා කම්මකාරිභරියා ධජාහටා මුහුත්තිකා යන දසදෙන ද යන විසි ස්ත්‍රීහු යි. මොවුන් අතුරෙන් කවර ස්ත්‍රියක සමග හෝ මෙවුන්දම් සෙව්නා පුරුෂහට කාමමිථ්‍යාචාර අකුශලකර්ම පථය වේ. මාතුරක්ඛිතාදි අට දෙනහට පර පුරුෂ සේවනයෙහි කර්මපථය නොවේ. ඔවුන්ගේ ස්පර්ශ පිළිබඳ ස්වාමීන් නැති බැවිනි. මව විසින් රක්නා ලද්දි මාතුරක්ඛිතාය. පියා විසින් රක්නා ලද්දී පිතුරක්ඛිතාය, සහෝදරිය විසින් රක්නා ලද්දී භගිනි රක්ඛිතාය, සහෝදරයා විසින් රක්නා ලද්දී භාතුරක්ඛිතාය, නෑයන් විසින් රක්නා ලද්දී ඤාතිරක්ඛිතාය, සගොත්‍රයන් විසින් රක්නා ලද්දී ගොත්ත රක්ඛිතාය, සහධාර්මිකයන් විසින් රක්නා ලද්දී ධම්මරක්ඛිතාය. ගැබ සිටිය දී හෝ වේවා මෝ මාගේය යි ආරක්‍ෂා කරන ලද්දී සාරක්ඛාය, අසවල් ස්ත්‍රිය කරා ගිය හොත් මෙ තෙක් දඩයයි නියම ලද්දී සපරිදණ්ඩාය, ධනය දී ගන්නා ලද්දී ධනක්කිතාය, සිය කැමැත්තෙන් ප්‍රිය වූ පුරුෂයා ළඟ වසන්නී ඡන්දවාසිනීය, වස්ත්‍රය මාත්‍රයෙන් භාර්යා බවට එළඹෙන්නී පටවාසිනීය, පැන් තලියෙහි අත් බහා මේ ජලය මෙන් එක්වැ වසමුය යි එක්වූවා ඕදපත්තකිනීය, දර දිය අදින්නීය, හිසින් සුඹුළුව බිම බහා බිරින්ද බවට ගත්තී ඕහතචුම්බටාය, දාසි වැ භාර්යා වූවා දාසිභරියාය, බැළමෙහෙ කරන්නී වැ භාර්යාවූවා කම්මකාරී භරියාය, යුද සෙනග පිරිවරා ගොස් පරවිෂයයෙන් ගෙන එන ලද්දී ධජාහටාය, ඇසිල්ලකට බිරින්ද බවට ගත්තී මුහුත්තිකාය, මේ කායද්වාරික මැ යි සුරාමේරය පානය ද කාමමිථ්‍යාචාරයෙහි අන්තර්ගත බැව් කියන ලදි.

මුසාවාද පිසුණාවාචා ඵරුසවාචා සම්ඵප්පලාප යන සතර බොහෝ සෙයින් වාග්ද්වාරයෙහි පවත්නා බැවින් වාක් කර්ම යි. බොහෝ සෙයිනැ යි කීයේ ඇතැම්විට කායද්වාරයෙහි ද සිද්ධවිය හැකි බැවිනි.

මුසා නම් අසත්‍ය-බොරු, වාද නම් කීම. නුදුටු දේ දිටිමි යි ද දුටු දේ නො දිටිමියි ද, ඇසූ දේ නො ඇසිමි යි ද නො ඇසූ දේ ඇසීමි යි ද, දත් දේ නො දත්මි යි ද නො දත් දේ දත්මි යි ද විසංවාදන පෙරටු වැ කියන්නාහු පිළිබඳ උපදින අකුශල චේතනා මුසාවාද යි. අභූත වස්තුය, විංසවාදන සිතය, ව්‍යායාමය, අන්‍යයන් එය දැනැ ගැන්ම ය යි මෙහි අඞ්ග සතරෙකි. අන්‍යයන්ගේ අර්ථභඤ්ජකත්‍වයෙන් මෙය කර්මපථ වේ. නො එසේවුව කර්ම මැ යි. කර්මපථ නම් ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති යන උභය විපාක ම දෙන බව ය. කර්ම වනාහි ප්‍රවෘත්ති විපාක පමණක් දෙන්නේ ය. ලිවීම් හස්තමුද්‍රා ආදි වශයෙන් මෙය කායද්වාරයෙහි ද සිද්ධවිය හැකි ය.

පිසුණාවාචා නම් ප්‍රියභාවය ශූන්‍ය කරන කථාය, සමගියෙන් සිටින්නවුන්ගේ සමගිය බිඳුවන අටියෙන් ඔවුනොවුන්ට කේලාම් කීම පිළිබඳ වැ උපදින චේතනා පිසුණාවාචා අකුශලය යි. ඔවුනොවුන් බිඳුන කල්හි කර්මපථ වේ. නො එසේ වුව කර්ම යි. බින්ද යුතු අන්‍යයන් වීමය. භේදයෙහි කැමැත්තය, උපක්‍රමය, අන්‍යයන් තමා බස් ඇදහීමය යි මෙහි දු අඞ්ග සතරෙකි.

ඵරුස යනු අසන්නවුන්ගේ හෘදය පෙළන කථාය. වාචා යනු කීමය. අන්‍යයන්ගේ මර්මච්ඡේකදර කථා කියන්නහුට ඒ පිළිබඳ වැ උපදින චේතනා පරුෂවාචා අකුශලයයි. ආක්‍රොශ කරනු ලබන අන්‍යයෙකු වීමය, කෝපය, ආක්‍රෝශ කිරීමය යි මෙහි අඞ්ග තුනෙකි. සම්මුඛයෙහි ආක්‍රෝශයෙන් කර්මපථය ද, අසම්මුඛයෙහි ආක්‍රෝශයෙන් කර්මයද වන්නේ ය යි ඇතැම්හු කියත්.

සම්ඵ යනු හිත සුව විනාශ කරන කථා ය. පලාප යනු දෙඩීම ය. අසන්නවුන්ගේ හිත සැප විනාශ කරන කථා කරන්නහුට ඒ පිළිබඳ වැ උපදින චේතනා සම්ඵප්පලාප අකුශලයි. නිරර්ථක කථා වන බවය, කීමය යි මෙහි අඞ්ග දෙකෙකි. අන්‍යයන් ඒ නිරර්ථක කථා සත්‍ය වශයෙන් ගත් කල්හි කර්මපථ වේ. නො ගත් කල්හි කර්ම මැ යි. අර්ථ ධර්ම විනය නිශ්‍රිත කොට කථාකරන්නහුට අකුශල නැති.

පිසුණාවාචා ඵරුසාවාචා සම්ඵප්පලාප ලිවීම ආදියෙන් සිද්ධ විය හැකි බැවින් කායද්වාරයෙහි ද වන්නේ ය.

අභිධ්‍යා ව්‍යාපාද මිථ්‍යාදෘෂ්ටි සිත්හි ම උපදනා බැවින් මනඃකර්ම යි.

ආස්වාද මාත්‍රයෙහි නො සිටැ පරසතු දේ තමහට පිරිනමා ගැන්ම සඳහා සිතන්නහුට ඒ පිළිබඳ වැ උපදින චේතනා අභිධ්‍යා යි. පර සතු දෙයක් වීමය, ඒ මට වේවායි සිතීමය යි මෙහි අඞ්ග දෙකෙකි. පරසතු භාණ්ඩ තමහට නතු කැරැ ගැන්ම සඳහා සිතීම කර්මපථ ය. පරසතු භාණ්ඩයෙහි ආස්වාද මාත්‍රය කර්ම යි.

මැසි මදුරු ආදී සතුන් උදෙසා හෝ ඔවුහු නැසෙත්වා වැනසෙත්වා යනාදීන් සිතන්නහුට ඒ පිළිබඳ වැ උපදින චේතනා **ව්‍යාපාදයි.** සත්ත්වයකු වන බවය, ඔහුගේ විනාශය රිසිවන බවය යි මෙහි අඞ්ග දෙකෙකි. නැසෙත්වා යනාදීන් සිතීම කර්මපථ ය. කෝපවීම් මාත්‍රය කර්ම යි.

**මිච්ඡාදිට්ඨි** නම් වරදවා ගන්නා ලබ්ධිය යි. දීමෙහි විපාක ඇත්තේ ය. යනාදි සත්පුරුෂ ධර්මය බිඳැ, දීමෙහි විපාක නැත්තේය. යනාදීන් එයට විපරීත වශයෙන් සිතන්නහුට ඒ පිළිබඳ වැ උපදින චේතනා මිච්ඡාදිට්ඨි යි. වැරදි ලබ්ධිය, එය එසේ ගැන්මය යි මෙහිදු අඞ්ග දෙකෙකි. අහේතුක අකිරිය. නාස්තික දෘෂ්ටි කර්මපථ යි. සක්කායදිට්ඨි ආදිය කර්ම ය.

ලෝභ දෝස මෝහ යයි අකුසල් සිත් ඉපදීමේ මුල් තුනෙකි. එයින් මෝහය සර්වාකුශල සාධාරණය. සියලු අකුසල් ඉපදීමට මුල් වන්නේය. දෝස ලෝභ වනාහි සමහර අකුසලයන්ට මුල්වේ. එබැවින් යට දැක්වුණු දශ අකුශලයන්ගේ ඒ විශේෂ මූල භේදය ද දත යුතු ය. ඒ මෙසේයි.

පාණාතිපාතා ඵරුසාවාචා ව්‍යාපාද ද්වේෂ මූලයෙන්ම වන්නේ ය. සිනා සෙමින් හෝ ‘අසවලා මරව’යි අණකරන්නහුට ද්වේෂය මුල්වේ. පරුෂ වචනයෙහි හා ව්‍යාපාදයෙහි ද්වේෂමූලකත්වය ප්‍රකට මැ යි.

කාමමිථ්‍යාචාර අභිධ්‍යා මිථ්‍යාදෘෂ්ටි ලෝභ මූලයෙන් වන්නේය.

අදින්නාදානා, මුසාවාද, පිසුණාවාචා, සම්ඵප්පලාප යන සෙසු සතර ද්විමූලයෙන් වන්නේය. ලෝභ සිතින් මෙරමා බඩු සොරකම් කැරැ ගන්නා කල ලෝභ මූලික ය. ක්‍රෝධයෙන් පලිගන්නා සිතින් පැහැරැ ගන්නාකල ද්වේෂ මූලිකය, සෙස්ස ද මෙසේ යි.

චිත්තොත්පාද වශයෙන් බලත් හොත් මේ දස අකුශල “**සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත**” යනාදි වශයෙන් දොළොස් ආකාර වේ. එහි විස්තර මුල කියන ලදි.

**ප්‍රශ්න.**

1. විපාක දෙන ස්ථාන වශයෙන් කර්ම කී වැදෑරුම් ද? ඔහු කවරහු ද?
2. ද්වාර භේදයෙන් අකුශල කී වැදෑරුම් ද? කවරහු ද?
3. ත්‍රිවිධ ද්වාරයෙහි සිදුවන අකුශල දක්වා ඔවුන් පිළිබඳ විස්තරයක් දෙනු.
4. කර්ම-කර්මපථ යන දෙක්හි විශේෂය දක්වනු.
5. ත්‍රිමූලික අකුසල් ඇත්තේ ද? අකුශල පිළිබඳ මූල භේදය දක්වනු. එය සිත් වශයෙන් කෙසේ ද?

## 9. චතුර්විධ කර්ම. (කුශල)

විපාක දෙන ස්ථාන වශයෙන් චතුර්විධ වූ කර්ම අතුරෙන් අපාය භූමියෙහි විපාක උපදවන අකුශල කර්ම යට දක්වන ලදි. කාමසුගති ආදියෙහි විපාක උපදවන කුශල කර්ම මෙහි දක්වනු ලැබේ.

කුශල කර්ම අතුරෙන් කාමාවචර කුශල ද වනාහි කාය කර්ම වාක් කර්ම මනඃ කර්මය යි ත්‍රිවිධ වේ. කායද්වාරයෙහි පැවැතියේ කායකර්ම ය. වාග්ද්වාරයෙහි පැවැතියේ වාක් කර්මය. මනොද්වාරයෙහි පැවැතියේ මනඃකර්ම යි. කුශලකායාදී ද්වාරත්‍රයයෙහි පැවැතීමේ ක්‍රම දෙකෙකි. කවර කුශලයක් හෝ කයින් කරන කල කාය කර්මය. වචනයෙන් කියන කල වාක් කර්ම ය. සිතින් සිතන කල මනඃ කර්මයි. ඒ එසේමැයි. දන්දීම කයින් දෙන කල කායකර්මය. වචනයෙන් දෙන කල වාක් කර්මය. සිතින් දෙන කල මනඃකර්මයි. සෙස්ස ද මෙසේය. අනෙක් ක්‍රමය නම් කාය දුශ්චරිතයෙන් වෙන් වන කල කායකර්ම කුශලය ද, වාග් දුශ්චරිතයෙන් වෙන් වන කල වාක් කර්ම කුශලය ද, මනෝ දුශ්චරිතයෙන් වෙන් වන කල මනඃකර්ම කුශලය ද වන බවයි. මෙහි මුල් දෙකෙහි කාය වාක් චොපන නැත ද කාය වාක් සංවර බැවින් කාය වාක් කුශලය යි කියනු ලැබේ.

තවද මේ කුශල වනාහි **දන සීල භාවනා වශයෙන් ත්‍රිවිධ වේ. සෝමනස්ස සහගත ඥනසම්පයුත්ත අසංඛාරික සසංඛාරිකාදි වශයෙන් අෂ්ටවිධ වේ**. එය යට විස්තර කරන ලදි.

**දන සීල භාවනා අපචායන වෙයාාවච්ච පත්තිදනපත්තානුමෝදන ධම්මසවණ ධම්මදේසනා දිට්ඨුජුකම්ම වශයෙන් දශවිධ වේ.**

**දනය.** වස්තු පරිත්‍යාග චේතනාව දානමය කුශලය යි. එය වනාහි අනුසය සහිත සත්ත්වයන් විසින් තමාස තු වස්තු පූජාකාමිත්‍වයෙන් හෝ අනුග්‍රහකාමිත්‍වයෙන් අන්‍යයන්ට දීමෙහි ඇතිවන්නේය. එය **පූර්වචෙතනා මුඤ්චන චෙතනා අපරචෙතනා වශයෙන් ත්‍රිවිධය**. දීම පිණිස වස්තු සම්පාදනාදියෙහි ඇතිවන චේතනා පූර්වචෙතනා ය. දෙන අවස්ථාවෙහි ඇතිවන චේතනා **මුඤ්චනචෙතනාය**. දී අවසන්හි සතුටු සිතින් එය සිහි කිරීමෙහි ඇති වන චේතනා අපරචෙතනාය. එසේම **හීන මධ්‍යම ප්‍රණීත වශයෙන් ද ත්‍රිවිධ ය**. හීන වූ ඡන්දයෙන් චිත්තයෙන් වීර්යයෙන් විමංසායෙන් දෙන කල හීන ය. මධ්‍යම වූ ඡන්දයෙන් චිත්තයෙන් වීර්යයෙන් විමංසායෙන් දෙන කල මධ්‍යම ය. ප්‍රණීත වූ ඡන්දාදියෙන් දෙන කල ප්‍රණීත යි. තව ද කීර්තිකාමිත්‍වයෙන් හෝ අත්තුක්කංසන පරවම්භනාදියෙන් කිලිටි සිතින් හෝ කාමතෘෂ්ණා වශයෙන් භවභෝග සම්පත් ලබන පිණිස හෝ දෙන කල හීන ය. පුණ්‍යඵල කාමිත්‍වයෙන් හෝ අත්තුක්කංසන පරවම්භනාදියෙන් නොකිලිටි සිතින් ලෞකික සුඛ කාමිත්‍වයෙන් හෝ තමන්ගේ ම විමෝක්ෂය පිණිස හෝ දෙන කල මධ්‍යම ය. ආර්ය භාවය සඳහා හෝ මාර්ග ඵල සුඛ සඳහා හෝ සකල සත්ත්වයන්ගේ විමෝක්ෂ පිණිස පාරමී වශයෙන් දෙන කල ප්‍රණීත යි. මේ භෙද සීලාදියෙහි ද යෙදෙන බව සැලකිය යුතු යි.

**සීලය.** කාය වාක් ද්වාරයන්ගේ සාවද්‍යතාවය වලකා නිරවද්‍යත්වයෙහි පිහිටීමෙහි දී ඒ පිළිබඳ වැ උපදනා චේතනා ශීලය යි. ඒ වනාහි **භික්ඛුසීල භික්ඛුනිසීල සාමණේර සීල ගෘහස්ථ ශීල** ය යි චතුර්විධ වේ. **භික්ඛුසීල භික්ඛුනී සීලයන්ගේ** සමාදානය කර්මවාක්‍යයෙන් සිද්ධ ය. බිඳීම පාරාජික වීමෙන් හෝ ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානයෙන් හෝ සිද්ධ ය. ශීලය බිඳුණු කල භික්ඛුභාවය හෝ භික්ඛුනී භාවය හෝ නොහැරැ සිටින්නේ **දුශ්ශීල** වේ. පාරාජික නො වැ සෙසු ශික්ෂා පද ව්‍යාතික්‍රමයෙන් සංවර භේදය වූ කල එයට සුදුසු ප්‍රතිකාර කිරීමෙන් ආයති සංවරයෙහි පිහිටිය හැකි ය. එසේ ආයති සංවරයෙහි නො පිහිටා සිටින්නේ ද, දැනැ දැනැ ශික්ෂාපද ව්‍යතික්‍රමණය කරන්නේ ද **අලජ්ජී** වේ. **සාමණේර ශීලයාගේ** පිහිටීම උභතොසුද්ධික සරණාගමන සමාදානයෙනි. බිඳීම පාරාජික වීම මනි. පාරාජික වැ සාමණේරභාවය නො හැර සිටිනේනේ දුශ්ශීල වේ. සෙසු ශික්ෂාපද භේදයෙන් ආයති සංවරයෙහි නොපිහිටා සිටින්නේ ද දැන දැනැ ශික්ෂාපද බිඳින්නේ ද අලජ්ජී වේ. **ගෘහස්ථයාට** සාමාන්‍යයෙන් පඤ්චශීලය ද උපොසථාඞ්ග වශයෙන් අෂ්ටාඞ්ගශීලය ද උත්සාහ ඇති කළ දශ ශීලය ද සමාදන් වැ රැක්ක හැකි ය. සමාදන් වුව ද සම්පත්තිවිරති වශයෙන් ඇති විය හැකි ය. ශික්ෂාපද සියල්ල එකට ම සමාදන් වැ ගත හොත් එකක් බිඳුණු කල සියල්ල බිඳුනේ වේ. වෙන් වෙන් ව ගතහොත් බිඳුණු ශික්ෂාපදය සමාදන් වුව ද ප්‍රමාණ ය. ශික්ෂාපද භේදයෙන් ගිහියා ද දුශ්ශීල වන්නේ ය.

**භාවනාව.** සමසතළිස් කමටහන් වශයෙන් හෝ ත්‍රිලක්ෂණ වශයෙන් හෝ යම් කිසි අරමුණක් ගෙනැ නැවත නැවත වැඩීමෙහිදී අර්පණාප්‍රාප්තියට පළමු ගොත්‍රභූඥානය දක්වා උපදනා චේතනා **භාවනාමය කුශලයි.** ධර්ම විනය උගෙනීමෙහිද නිරවද්‍යකර්මාන්ත ශිල්පවිද්‍යා ප්‍රගුණ කිරීමෙහිද උපදනා චේතනා ද මෙහි ම ඇතුළත් ය.

**අපචායන.** රත්නත්‍රය කෙරෙහි මව්පියන් කෙරෙහි කුල දෙටුවන් කෙරෙහි ආචාර්ය උපාධ්‍යායයන් කෙරෙහි ධාර්මික ශ්‍රමණ බ්‍රාහ්මණාදීන් කෙරෙහි ලාභාපෙක්ෂාරහිත වැ අන්‍ය වූ හෝ කිලිටි අදහසින් තොර වැ දැක හුනස්නෙන් නැගී සිටීම් වඳන මානන අඤ්ජලිකරණාදීන් කරන්නවුන්ට ඒ පිළිබඳ වැ උපදන චේතනාන **අපචායන කුශල** යි.

**වෙය්‍යාවච්චය.** යට දැක්වුණුවන්ට හෝ ආගන්තුකගමික අද්ධිකයන්ට හෝ ගිලනුන් මහල්ලන් ආදීන්ට හෝ පිරිසිදු සිතින් වත් පිළිවෙත් කිරීමෙහි, සබ්රම්සරුන්ගේ සිව්රු ගෙත්තම් කිරීම්, අන්‍යයන්ගේ පුණ්‍යකර්ම කිරීම් ආදියෙහි පිරිසිදු සිතින් අනුබල දීමෙහි උපදින චේතනා **වෙය්‍යාවච්ච කුශල** යි.

**පත්තිදානය.** ස්වසන්තානයෙහි උපන් කුශලය අන්‍යයන් හා සාධාරණ බව අපේක්ෂා කිරීමෙහි උපදින චේතනා **පත්තිදාන** යි.

**පත්තානුමෝදනය.** අන්‍යයන් විසින් දෙන ලද කුශලය අනුමෝදන් වීම පත්තානුමෝදනය යි. පත්ති වනාහි උද්දිසික අනුද්දිසික වශයෙන් ද්විවිධ වේ. උද්දිසික නම් යම් කිසිවෙකු උදෙසා දීම ය. අනුද්දිසික නම් සාමාන්‍යයෙන් දීම ය. උද්දිසිකපත්තානුමෝදනය දිට්ඨධම්ම වේදනීය වේ. දෙවියන් හෝ පරදත්තූපජීවින් හෝ උදෙසා දෙන ලද කුශලය ඒ

ඇසිල්ලෙහි ම ඔවුන්ට සුව පිණිස වන්නේය. පත්තිදානය පත්තානුමෝදනය බොහෝ සෙයින් දාන පිළිබඳය යි කියනු ලැබේ.

**ධම්මසවණය.** මේ ධර්මය අසා ඒ ආකාරයෙන් පිළිපැද ලොවී ලොවුතුරා ගුණ හෝ ලබමි. බහුශ්‍රැත වැ අන්‍යයන්ට දේශනා හෝ කරමි යි පිරිසිදු සිතින් හිත උපදේශ ඇසීම ධම්මසවණ ය යි. නිරවද්‍ය විද්‍යාශ්‍රවණය ද මෙහි ම අන්තර්ගත යි.

**ධම්මදේශනාව** ලාභ සත්කාරාදි අපේක්‍ෂා රහිත වැ පිරිසිදු සිතින් හිත උපදේශ දේශනා කිරීම ධම්මදේශනා ය. නිරවද්‍ය විද්‍යා උගැන්වීම ද මෙහිම ඇතුළති.

**දිට්ඨුජුකම්මය.** දශවස්තුක මිථ්‍යාදෘෂ්ටියෙන් හෝ ඉස්සර නිම්මාණාදි දෘෂ්ටිවලින් හෝ දිට්ඨමඞ්ගලිකාදි දෘෂ්ටිවලින් හෝ යුක්ත නො වැ සම්‍යක් දෘෂ්ටියෙහි ඍජු වැ පිහිටීමෙහි උපදනා චේතනා **දිට්ඨුජුකම්ම** යි.

මේ දශකුශල යට දැක්වූ ත්‍රිවිධ කුශලයෙහි ඇතුළත් කල හැකිය. ඒ මෙසේ ය. ඊර්ෂ්‍යා මාත්සර්යයන්ට ප්‍රතිපක්‍ෂ බැවින් පත්තිදානය හා පත්තානුමෝදනය දානයෙහි ඇතුළති. චාරිත්ත සීල බැවින් අපචායන වෙය්‍යාවච්ච සීලයෙහි ඇතුළති. කුශල ධර්මාසේවන බැවින් දේසනා සවණ දිට්ඨුජුකම්ම භාවනායෙහි ඇතුළති. ඇතැම්හු දේශනාවදානයෙහි ද දිට්ඨුජුකම්මය ත්‍රිවිධ කුශලයෙහි ම ද ඇතුළත් කරත්.

චිත්ත වශයෙන් අෂ්ටවිධ වන්නේ ත් මේ මැ යි. ඒ කුශල සිත් අට හා යට දැක්වූ අකුසල් සිත් දොළොස කාමාවචර බැවින් කාමාවචර කර්ම විස්සෙකැ යි කිය යුතු ය.

**රූපාවචර කුශල** වනාහි හිතෙහි ම සිද්ධ බැවින් මනඃ කර්ම යි. කිසිවිටෙක කායකර්ම හෝ වාක් කර්ම නොවේ. එසේම එය භාවනාමය යි. දානමයාදි නොවේ. භෙද අර්පණාප්‍රාප්ත ම බව දත යුතු යි. ඉන් මොබ කාමාවචර බැවිනි. ප්‍රතිපදාදින වශයෙන් එහි නොයෙක් භෙද ඇත ද විතර්කාදි අඞ්ග සමතික්‍රමයෙන් ප්‍රථමධ්‍යානාදි වශයෙන් පඤ්චවිධ වේ. එහි විභාග **චිත්තපාදයෙහි** දක්වන ලද්දේය.

එසේම අරූපාවචර කුශල ද මනඃකර්ම ය. භාවනාමය ය. භෙ ද අර්පණාප්‍රාප්තය ම ගත යුතු. ඒ වනාහි කසිනුග්ඝාටි මාකාසාදි ආලම්බන වශයෙන් චතුර්විධ වේ. එහි විභාග ද යට දැක්විණි.

### ප්‍රශ්න.

1. විපාක දෙන ස්ථාන වශයෙන් කුශල කර්ම කී වැදැරුම් ද?
2. කාමාවචර කුශල කී ආකාරයට බෙදිණි ද?
3. දශ කුශල විස්තර කරනු.
4. දශ කුශල ත්‍රිවිධ කුශලයන්ට හා සිත් අටට බෙදෙන සැටි දක්වනු.
5. රූපාවචර අරූපාවචර කුශල පිළිබඳ විස්තරයක් දෙනු.

## 10. චතුර්විධ කර්මයන්ගේ විපාක ස්ථාන

විපාක දෙන ස්ථාන වශයෙන් කර්ම චතුර්විධ වන සැටි 8 වන 9 වන පාඩම්වලින් දක්වන ලදි. ඒ විපාක ස්ථාන ම මෙහි දක්වනු ලැබේ.

1. දොළොස් අකුසල් අතුරෙන් උපෙක්ඛා සහගත උද්ධච්චය හැර අවශේෂ එකොළොස සතර අපායෙහි ප්‍රතිසන්ධි විපාක දෙන්නේ ය. මේ ප්‍රතිසන්ධි විපාකය නම් අකුශල විපාක උපෙක්ඛා සහගත සන්තීරණය බව දතයුතු. උද්ධච්ච චිත්තය ප්‍රතිසන්ධි විපාක නොදෙන්නේ එහි ප්‍රතිසන්ධි දායක ශක්තිය නැති බැවිනි. ඒ උද්ධච්ච චිත්තය සමග දොළොස් අකුසල් ම කාමලෝක රූපලෝක යන සියලු තන්හි සුදුසු පරිදි ප්‍රවෘත්ති විපාක දෙන්නේය. මේ ප්‍රවෘත්ති විපාක නම් අකුසල් විපාක සිත් සත බව දත යුතු. සතර අපායෙහි වේවා සප්ත කාම ස්වර්ගයෙහි වේවා රූපලෝකයෙහි වේවා අනිෂ්ටා රම්මණයෙන් උපදින චක්ඛු විඤ්ඤාණාදීහු අකුශල විපාක මැයි. යම් සත්ත්වයකුට යම් ප්‍රසාද රූපයෙක් නොපිහිටියේ නම් ඒ වශයෙන් මේ විපාක සිත් නොලැබෙන බැවින් "සුදුසු පරිදියි." කීයේ ය.

2. **කාමාවචර කුසල් අට සප්තකාම ස්වර්ගයෙහි නවවිධ ප්‍රතිසන්ධි ද එහිම ප්‍රවෘත්ති වශයෙන් මහා විපාක අට ද කාම ලෝක රූප ලෝක යන සියලු තන්හි අහේතුක විපාක අට ද සුදුසු පරිදි උපදවන්නේ ය.**

කාමාවචර කුශල අටට විපාක සොළසෙකි. එයින් නවයෙක් ප්‍රතිසන්ධි වශයෙන් ද සොළස ම ප්‍රවෘත්ති වශයෙන් ද ලැබේ. ප්‍රවෘත්ති විපාක සොළසින් අටෙක් සහේතුකය. අටෙක් අහේතුකය. (මේ යට විස්තර කරන ලදි.) සහේතුක අට මෙහි මහා විපාකය යි දැක්විණි. ප්‍රතිසන්ධි විපාක වශයෙන් ලැබෙන නවයද ප්‍රවෘත්ති විපාක වශයෙන් ලැබෙන සහේතුක අට ද සප්ත කාම ස්වර්ගයෙහි මුත් අපායයෙහි හෝ බ්‍රහ්මලෝකයෙහි නොලැබෙන බව ද ප්‍රවෘත්ති වශයෙන් ලැබෙන අහේතුක විපාක අට සප්ත කාම ස්වර්ගයෙහි මෙන්ම සතර අපායයෙහි හා රූපාවචරයෙහි ලැබෙන බව ද මෙයින් කී නියා දතයුතු.

කවර සත්ත්වයකුට හෝ ඉෂ්ටාරම්මණයෙන් ලැබෙන චක්ඛු විඤ්ඤාණාදීහු කුශල විපාකයෝ ය. ඒ එසේ මැ යි. නිරය වාසීන්ට මහ මුගලන් ස්ථවිරාදීන් දැකීම් වශයෙන් ද, නාග සුපර්ණාදීන්ට මහා සම්පත් ලැබීම් වශයෙන් ද, හස්ති සුනඛාදීන්ට ප්‍රිය භෝජනාදිය ලැබීම් වශයෙන් ද උපදින චක්ඛු විඤ්ඤාණාදීහු කුශල විපාකය. ඔවුන් එහි උපදවාලූ අකුශල කර්ම ඉෂ්ට විපාක දීමෙහි අසමර්ථ බැවිනි. අකුශලයන්ට ඉෂ්ට සුඛ විපාක කැලම නැත්තේය. සප්තකාම ස්වර්ගයෙහි මනුෂ්‍යයන්ට හා දෙවියන්ට ඉෂ්ටාරම්මණයෙන් ලැබෙන චක්ඛු විඤ්ඤාණාදීන්ගේ කුශල විපාකත්වයෙහි කිය යුතු ම නැති. රූපී බ්‍රහ්මයන්ට ඉෂ්ට රූප ශබ්ද ලැබේ. එයින් උපදින චක්ඛු විඤ්ඤාණ

සොතවිඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ කාමාවචර කුශල විපාකය. රූපාවචර කර්මයන්ට රූපාවචර විපාක ම මුත් චක්ඛු විඤ්ඤාණාදී අන්‍ය භූමික විපාකයන්ගේ සම්භවයෙක් නැත.

මෙසේ විපාක දෙන කාමාවචර කුශල කර්ම අට (1) ෂොඩශක ක්‍රමය (2) ද්වාදශක ක්‍රමය (3) අෂ්ටක ක්‍රමය යන තුන් ආකාරයකින් විපාක දෙන්නේය.

(1) **ත්‍රිහේතුක උත්කෘෂ්ට කුශල ත්‍රිහේතුක ප්‍රතිසන්ධි දී ප්‍රවෘත්ති වශයෙන් සොළොස් විපාක ම දෙන්නේය.**

ත්‍රිහේතුක කුශල නම් ඥාන සම්ප්‍රයුක්ත සතරය. කර්ම කර්මඵල දැනැ අදහා කෙළේ ඥානසම්ප්‍රයුක්තය. ඒ වැළිත් උත්කෘෂ්ටය, ඕමකය යි ද්විවිධ වේ. යම් ඥාන සම්ප්‍රයුක්තයෙක් එයට මුලින් හා අගින් ඥාන සම්ප්‍රයුක්තයන් ගෙන් ම පිරිවරන ලද්දේ නම් හෙවත් මුඤ්චන චේතනාව සේ ම පූර්වාපර චේතනා ද ඥානසම්ප්‍රයුක්ත විණි නම් එය උත්කෘෂ්ට යි. තව ද යම් ඥාන සම්ප්‍රයුක්ත කුශලයෙක් නීවරණයන්ගෙන් හෝ අත්තුක්කංසනාදියෙන් කිලිටි නො වැ සුද්ධ වැ කරන ලද්දේ ද එ ද උත්කෘෂ්ට යි.

ත්‍රිහේතුක ප්‍රතිසන්ධි නම් ඥාන සම්ප්‍රයුක්ත විපාක සතර ය. මෙහි දු එක කර්මය එක ම ප්‍රතිසන්ධියක් දෙන බව දතයුතු. එක කර්මයකට ප්‍රතිසන්ධි දෙකක් හෝ කීපයක් හෝ නොලැබේ. එක කර්මයකට ප්‍රවෘත්ති විපාක නම් සිය දහස් ජාතියෙහි දු ලැබෙන්නේ ය.

**"එකපුප්ඵං චජිත්වාන සහස්ස කප්පකොටියො,**
**දෙවෙසු ච මනුස්සෙසු-සෙසෙන පරිනිබ්බුතො"**

එක මලක් පිදීමෙන් කප් කෙළ දහසක් දෙව්ලොව මිනිස් ලොව උපන්නෙමි. ශේෂයෙන් පිරිනිවියෙමි" කීයේ පූර්වාපර චේතනා වශයෙනි. පූර්වාපර චේතනා ද ප්‍රතිසන්ධි විපාක දෙන්නේ ය.

ප්‍රවෘත්ති වශයෙන් දෙන සොළොස් විපාක නම් සහේතුක හා අහේතුක කාමාවචර විපාක සොළසය. එය ඉෂ්ටාරම්මණයෙහි චක්ඛු විඤ්ඤාණාදිය හා තදාලම්බන යි. අතිෂ්ටාරම්මණයෙහි සන්තීරණය සෝමනස්ස සහගත වේ. එහි විස්තර යට දක්වන ලදි.

(2) **ත්‍රිහේතුක ඕමකය හා ද්විහේතුක උත්කෘෂ්ටය ද්විහේතුක ප්‍රතිසන්ධි දී ප්‍රවෘත්ති සමයෙහි ඥන සම්ප්‍රයුක්ත හැරැ සෙසු දෙළොස් විපාක දෙන්නේය.**

යම් ත්‍රිහේතුක කුශලයෙක් මුලින් අගින් එබඳු වූ ම කුශල චිත්තයන් විසින් නොපිරිවරන ලද්දේ නම් හෙවත් ත්‍රිහේතුක කුශලයක් කොට පසු වැ ඒ සැලකීමෙන් "මම නිශ්ඵල දෙයක් කෙළෙමි" යනාදීන් විපිළිසර විණි නම් එය ත්‍රිහේතුක ඕමකය වේ. නීවරණයන්ගෙන් හෝ අත්තුක්කංසනාදියෙන් කිලිටි වූ ත්‍රිහේතුකය ද ත්‍රිහේතුක ඕමකයි. ද්විහේතුක නම් ඥාන විප්‍රයුක්ත සතරය. එ ද පූර්වාපර ද්විහේතුකයන්ගෙන්ම පිරිවරන

ලද ද්විහේතුක උත්කෘෂ්ට ය. ද්විහේතුක ප්‍රතිසන්ධි නම් ඥාන විප්‍රයුක්ත විපාක සතර ය. ත්‍රිහේතුකය වුව ද ඕමක වූ කල මන්‍දශක්තික ය. එහෙයින් එය ත්‍රිහේතුක ප්‍රතිසන්ධි දීමෙහි අසමර්ථ ය. ඥාන සහගත බැවින් අහේතුක ප්‍රතිසන්ධි ද නොදෙන්නේ ය. ප්‍රවෘත්ති සමයයෙහි ලැබෙන දොළොස් විපාක නම් ඥාන විප්‍රයුක්ත සතර හා අහේතුක විපාක අට ය. එ ද තදාලම්බන වශයෙන් ද චක්ඛු විඤ්ඤාණාදි වශයෙන් ද ලැබේ. අනිෂ්ටාරම්මණයෙහි සන්තීරණය සෝමනස්ස යි.

(3) **ද්විහේතුක ඕමක කුශලය අහේතුක ප්‍රතිසන්ධිය දෙන්නේ ම ය. ප්‍රවෘත්ති සමයෙහි අහේතුක විපාක ම උපදවන්නේ ය.**

ද්විහේතුකය ඕමක වන්නේ එබඳු කුශල කර්මයක් කොට “මම නිශ්ඵලයක් කෙළෙමි.” යනාදීන් විපිළිසර වීමෙන් ය. නීවරණයන්ගෙන් හෝ අත්තුක්කංසනාදියෙන් හෝ කිලිටි වීමෙන් ද ද්විහේතුකය ඕමක වේ. ඊට දෙන ප්‍රතිසන්ධිය අහේතුක මැ යි. එය නම් උපෙක්ඛා සහගත සන්තීරණ කුශල විපාකය යි. එයින් උපදින්නන් ජාත්‍යන්ධාදීන් වන බව යට කියන ලදි. එයට ලැබෙන ප්‍රවෘත්ති විපාක අහේතුක අට ය.

කාමාවචර කුශල අටට සොළොස් විපාක දීමේ අන්‍ය ක්‍රමයක් ද ඇතැම්හු දක්වති. විපාකයන්ගේ අසංඛාරික සසංඛාරික භාවය කර්මයන්ගෙන් අසංඛාරික සසංඛාරික භාවයෙන් වන්නේය යනු ඔවුන්ගේ මතය යි. කැටපතින් මුහුණ බලන කල මුහුණ නොසැලී තිබෙන තාක් කැටපතේ ඡායාව ද නොසැලී තිබෙයි. මුහුණ සැලෙන කල ඡායාව ද සැලෙයි. එමෙන් අසංඛාරික කුසලයන්ගේ විපාක අසංඛාරිකය, සසංඛාරික කුසලයන්ගේ විපාක සසංඛාරිකය. අහේතුක විපාක වනාහි දුර්බල බැවින් දෙපක්ෂයට ම අයත් වේ යනු එහි තාත්පර්යාර්ථය යි.

**“අසංඛාර සසංඛාර විපාකානි නපච්චති,**
**සසංඛාර මසංඛාර විපාකානිති කෙචන.”**

යනු එහෙයින් කියන ලදි. අසංඛාර කුශල සසංඛාර විපාක නූපදවයි. සසංඛාර කුසල අසංඛාර විපාක නූපදවයි යනු ඇතැම්හු කියත් යනු එහි භාව යි.

මේ මතයෙහි ත්‍රිහේතුක උත්කෘෂ්ට අසංඛාරික දෙකට ප්‍රතිසන්‍ධි විපාක දෙකෙකි. ප්‍රවෘත්ති විපාක දොළොසෙකි. ත්‍රිහේතුක උත්කෘෂ්ට සසංඛාරික දෙකට ද ප්‍රතිසන්‍ධි විපාක දෙකෙකි. ප්‍රවෘත්ති විපාක දොළොසෙකි. ත්‍රිහේතුක ඕමක හා ද්විහේතුක උත්කෘෂ්ට අසංඛාරික සතරට ප්‍රතිසන්‍ධි විපාක දෙකෙකි. ප්‍රවෘත්ති විපාක දශයෙකි. ත්‍රිහේතුක ඕමක හා ද්විහේතුක උත්කෘෂ්ට සසංඛාරික සතරට ප්‍රතිසන්‍ධි විපාක දෙකෙකි ප්‍රවෘත්ති විපාක දශයෙකි. ද්විහේතුක ඕමක අසංඛාරික දෙකට හා ද්විහේතුක ඕමක සසංඛාරික දෙකට ප්‍රතිසන්ධි විපාක එකෙකි. ප්‍රවෘත්ති විපාක අටෙකි.

මෙයින් ප්‍රථම මතය ත්‍රිපිටක චුල්ලනාග ස්ථවිරයන්ගේ ය. ද්විතීය මතය මොරවැවේ මහාදත්ත ස්ථවිරයන්ගේ ය. අනුරුද්ධ ස්වාමි ද්විතීය මතය “කෙචි වාදය” කෙළේ ය.

3. රූපාවචර-ප්‍රථම ධ්‍යානය පරිත්ත වැ වැඩීමෙන් බ්‍රහ්ම පාරිසජ්ජයෙහි ද, මධ්‍යම වැ වැඩීමෙන් බ්‍රහ්මපුරොහිතයෙහි ද, ප්‍රණීත වැ වැඩීමෙන් මහා බ්‍රහ්මයෙහි ද උපදින්නේ ය.

ධ්‍යාන වනාහි පරිත්ත මධ්‍යම ප්‍රණීතය යි ත්‍රිවිධ වේ. එසේ වීමේ හේතු ක්‍රම දෙකෙකි. ප්‍රණීත ඡන්‍දාදියෙන් යුක්ත වූ ද යම් ධ්‍යානයෙන් අභාවිත ද-ලබ්ධ මාත්‍ර ද එය මතු ධ්‍යාන සඳහා ප්‍රත්‍යය වන්නට අසමර්ථ බැවින් පරිත්ත ය. එසේ ම යම් ධ්‍යානයෙක් නාති සුභාවිත ද - නාති ප්‍රගුණ ද එය මධ්‍යම ය. එසේම යම් ධ්‍යානයෙක් අති සුභාවිත ද - අති ප්‍රගුණ ද එය ප්‍රණීත ය. මේ එක් ක්‍රමයෙකි. අති සුභාවිත වූ ද යම් ධ්‍යානයෙක් හීන වූ ඡන්‍ද විරිය චිත්ත විමංසායෙන් යුක්ත ද එය පරිත්ත ය. මධ්‍යම වූ ඡන්‍දාදියෙන් යුක්ත ද එය මධ්‍යම ය. ප්‍රණීත වූ ඡන්‍දාදියෙන් යුක්ත ද එය ප්‍රණීත යි මේ අනෙක් ක්‍රමය යි.

මෙයින් හීන වූ ඡන්‍දාදියෙන් යුක්ත ප්‍රථම ධ්‍යානය පරිත්ත බැවින් බ්‍රහ්මපාරිසජ්ජයෙහි ද, මධ්‍යම වූ ඡන්‍දාදියෙන් යුක්ත ප්‍රථම ධ්‍යානය මධ්‍යම බැවින් බ්‍රහ්මපුරෝහිතයෙහි ද, ප්‍රණීත වූ ඡන්‍දාදියෙන් යුක්ත ප්‍රථම ධ්‍යානය ප්‍රණීත බැවින් මහාබ්‍රහ්මයෙහි ද ප්‍රතිසන්‍ධි දෙන්නේය යි දතයුතු. සෙස්සෙහිදු මෙසේ ය.

ද්විතීය ධ්‍යානය හා තෘතීය ධ්‍යානය පරිත්ත වැ වැඩීමෙන් පරිත්තාභයෙහි ද, මධ්‍යම වැ වැඩීමෙන් අප්පමාණාභයෙහි ද ප්‍රණීත වැ වැඩීමෙන් ආභස්සරයෙහි ද උපදින්නේ ය.

චතුර්ථධ්‍යාන පරිත්ත වැ වැඩීමෙන් පරිත්ත සුභයෙහි ද, මධ්‍යම වැ වැඩීමෙන් අප්පමාණසුභයෙහි ද, ප්‍රණීත වැ වැඩීමෙන් සුභකිණ්හයෙහි ද උපදින්නේ ය.

පඤ්චමධ්‍යානය පරිත්ත වැ හෝ මධ්‍යම වැ හෝ ප්‍රණීත වැ හෝ වැඩීමෙන් වෙහප්ඵලයෙහි ද එම සංඥාවිරාග වැ වැඩීමෙන් අසඤ්ඤසත්තයෙහි ද උපදින්නේ ය. සඤ්ඤාවිරාග වැ වැඩීම නම් "සිත ඇති හෙයින් ඇලීම් කිපීම් මුලාවීම් වේ. සිත නැති කල ඒ කිසිවක් නොවේ. දිට්ඨධම්ම නිබ්බානයට පැමිණියේ වන්නේ" ය යි වායුකසිණය හෝ ආකාශ කසිණය හෝ අරමුණු කොටැ "ධී චිත්තං ධි වතිදං චිත්තං" යි සංඥා විරාග වැ භාවනා කිරීම ය. එසේ මේ ධ්‍යානය ලද්දේ යම් ඉරියව්වකින් මෙහි දී මියයන්නේ ද එම ඉරියව්වෙන් එහි රූප ප්‍රතිසන්‍ධිය ලබන්නේ ය. කර්ම ක්‍රියාවාදී තීර්ථකයෝ මෙය වඩත්.

පඤ්චම ධ්‍යානලාභී අනාගාමීහු වනාහි ශුද්ධාවාසයන්හි උපදිති. අන් කිසි කෙනෙක් එහි නූපදිති. මෙයින් අනාගාමීන්ට අභිමත නම් අන්‍ය බ්‍රහ්මලෝකයෙක උපදීමෙහි ප්‍රතිෂේධ නැති. අනාගාමීන් අතුරෙනුදු ශ්‍රද්ධාධික අවිහයෙහි ද, වීර්යාධික අතප්පයෙහි ද, සමෘත්‍යධික සුදස්සයෙහි ද, සමාධ්‍යධික සුදස්සියෙහි ද, ප්‍රඥාධික අකනිට්ඨයෙහි ද උපදිත්. ශුෂ්ක විදර්ශන අනාගාමීහු මරණ කාලයෙහි ඒකාන්තයෙන් ධ්‍යාන උපදවති. ඔවුන් සමාධි පරිපූරකාරී බැවිනි. ධ්‍යාන ලාභී ස්ත්‍රීහු බ්‍රහ්ම පාරිසජ්ජයෙහි උපදිති. ඒ ඒ ධ්‍යානලාභී ස්ත්‍රීහු පඨමජ්ඣාන භූමි දුතියජ්ඣානභූමි ආදියෙහි උපදින්නෝ හීනධ්‍යාශය

ඇති බැවින් මහ බ්‍රහ්ම ආභස්සරාදී වැ නො ඉපිදැ ඔවුන්ගේ සේවක වැනි බ්‍රහ්මපාරිසජ්ජ බ්‍රහ්ම පුරෝහිත පරිත්තාභ අප්පමාණාභාදියෙහි උපදිති යි ඇතැම් ආචාර්යවරයෝ කියත්.

අභිඥාභාවයට පැමිණි ධ්‍යාන ප්‍රතිසන්ධි නොදේ. අභිඥායෙන් ප්‍රතිසන්ධි ශක්තිය සිඳෙන බැවිනි.

4. අරූපාවචර ධ්‍යාන වැඩීමෙන් පිළිවෙලින් සතර අරූප ලෝකයන්හි උපදිත්. වෙහප්ඵල අකනිට්ඨ නේවසඤ්ඤානාසඤ්ඤායතන යන තුන් තන්හි උපන් ආර්යයෝ අන් තැනෙක නො උපදිත්. ඒ ස්ථාන ශ්‍රේෂ්ඨ බැවිනි. බ්‍රහ්මලෝකයෙහි උපන් ආර්යයෝ යට යට බ්‍රහ්මලේකයන්හි නූපදිත්.

ප්‍රශ්න.

1. සතර අපායෙහි පිළිසන් දෙන අකුසල් කවරේද? කාම රූප යන සියලු ලෝකයන්හි ප්‍රවෘත්ති විපාක අකුසල් කවරේ ද?
2. කාමාවචර කුසල් කොතැන්හි කොතෙක් ප්‍රතිසන්ධි දේ ද? කොතැන්හි කෙසේ ප්‍රවෘත්ති විපාක දේ ද?
3. ත්‍රිහේතුක ඔමක හා ද්විහේතුක උත්කෘෂ්ට කුශල ලැබෙන පරිදි දක්වනු. එහි විපාක ක්‍රමය කෙසේ ද?
4. විපාක අසංඛාර සසංඛාර වීමේ කරුණ දක්වනු. එහි සංඛ්‍යා කෙසේ ද?
5. ධ්‍යාන පරිත්ත මධ්‍යම ප්‍රණීත වන්නේ කෙසේ ද? එහි විපාකාවස්ථා දක්වනු. ධ්‍යානලාභී ස්ත්‍රීහු කොයි උපදිත් ද? එහි මත භේදය පැහැදිලි කරනු. ශුද්ධාවාසයන්හි කවුරු උපදිත් ද?

## 11. චතුර්විධ මරණොත්පත්ති

චතුර්විධ භූමි ද, ඒ භූමින්හි ලැබෙන චතුර්විධ ප්‍රතිසන්ධි ද, ඒ ප්‍රතිසන්ධි දෙන චතුර්විධ කර්ම ද යට විස්තර කරන ලදි. ප්‍රතිසන්ධි වන්නේ චුතියට අනතුරුව ය. එබැවින් ඒ චුති සිත් උපදින පිළිවෙල හෙවත් මැරෙන සැටි මෙහි දක්වනු ලැබේ.

මරණොත්පත්තිය හෙවත් චුති සිත් උපදීම ආයු ගෙවී යාමෙන් ද, කර්මය ගෙවී යාමෙන් ද, ආයු කර්ම යන දෙක ම එක විට ගෙවී යාමෙන් ද, උපච්ඡේදක වශයෙන් ද යන සතර ආකාරයකින් සිද්ධ වේ. එ බැවින් මරණය 1 **ආයුඃක්‍ෂය මරණය 2 කර්මක්‍ෂය මරණය**, 3. **උභයක්‍ෂය මරණය**, 4. **උපච්ඡේදක මරණය** යි චතුර්විධ වේ.

1. ඒ ඒ ලෝකයට-සත්ත්ව නිකායයට නියම ආයුපරිච්ඡේද ඇත්තේ ය. ප්‍රතිසන්ධි දුන් කර්මය ඔබ්බෙහිදු ජීවිතය පවත්වන්ට සමර්ථ වුව ද ඒ ලෝකයට-සත්ත්වනිකායයට නියම ආයු ගෙවී යාමෙන් මරණය සිදු වේ නම් එය **ආයුඃක්‍ෂය මරණය** යි.

2. ඒ ඒ ලෝකයට-සත්ත්ව නිකායයට නියම ආයුෂය ශේෂ වැ තිබියදී ද දුර්බල වූ කර්මයෙන් ප්‍රතිසන්ධි ලත් සත්ත්වයන්ට ඒ ප්‍රතිසන්ධි දුන් කර්ම ශක්තිය අවසන් වීමෙන් මරණය සිදු වේ නම් එය **කර්මක්‍ෂය මරණය** යි.

3. ඒ ඒ ලෝකයට-සත්ත්ව නිකායයට නියම ආයුෂය හා ප්‍රතිසන්ධි දුන් කර්මයේ ශක්තිය එක විට සිඳී යාමෙන් සිදුවන මරණය **උභයක්‍ෂය මරණය** යි.

4. ඒ ඒ ලෝකයට-සත්ත්ව නිකායයට නියම ආයුෂ ශේෂ වැ තිබිය දීත් ප්‍රතිසන්ධි දුන් කර්මයේ ශක්තිය ශේෂ වැ තිබියදීත් පූර්ව ජන්මයෙහි හෝ මේ ජන්මයෙහි කරන ලද අන්‍ය උපඝාතක කර්මයකින් අතරෙක මරණය සිදුවේ නම් එය **උපච්ඡේදක මරණය** යි. අකාල මරණය යනුදු මේ ය.

කුමකින් වේවා මැරෙන්නවුන්ට මරණාසන්න කාලයෙහි **කර්ම කර්මනිමිති ගතිනිමිති** අතුරෙන් යම් කිසිවක් චක්‍ෂුරාදි ෂඩ්ද්වාරයන් අතුරෙන් එක්තරා ද්වාරයකට සුදුසු පරිදි අරමුණු වන්නේ ය.

**කර්ම** නම් කුශල වේවා අකුශල වේවා යමකු විසින් කරන ලද කර්ම අතුරෙන් යම් කර්මයක් ඔහුට දෙවන ජන්මයෙහි ප්‍රතිසන්ධි දෙන්නේ ද එය යි. ඒ වනාහි අකුශල පක්‍ෂයෙන් අකුශල සිත් එකොළොසින් එකෙකි. (උපෙක්ඛා සහගත උද්ධච්චය ප්‍රතිසන්ධි විපාක නො දෙන බව යට කියන ලදී.) කුශල පක්‍ෂයෙන් කාමාවචර කුශල අටින් එකකි. රූපාවචර අරූපාවචර ලෝකයන්හි උපදින ධ්‍යාන ලාභීන්ට කර්මය අරමුණු නොවේ. ඔවුන්ගේ කර්ම නම් ධ්‍යාන කුසල්, කිසි තැනෙක නූපදින රහතුන්ට ද කර්මය අරමුණු නො වේ. තවද මේ කර්මය මනොද්වාරයට පමණක් අරමුණු වන බව ද චක්‍ෂුරාදි සෙසු ද්වාර පසට අරමුණු නොවන බව ද දතයුතු. එසේ ම එය අතීතය. වර්තමාන හෝ අනාගත නොවේ. අපායයෙහි උපදින පාපකාරීන්ට අකුශල කර්මය ද, සුගතියෙහි උපදින පුණ්‍යකාරීන්ට කුශල කර්මය ද අරමුණු වන බැවින් යැ සුදුසු පරිදි යයි කීයේ.

**කර්ම නිමිත්ත** නම් කුශල හෝ අකුශල හෝ ඒ කර්ම කරණයට අරමුණු වශයෙන් හෝ උපකරණ වශයෙන් නිමිති වන යම් කිසිවකි. අරමුණු වශයෙන් නිමිති වන්නේ අකුශල පක්‍ෂයෙහි ප්‍රාණඝාතයකුට නම් පරප්‍රාණාදිය යි. කුශල පක්‍ෂයෙහි චෛත්‍ය විහාරාදිය යි. උපකරණ වශයෙන් නිමිති වන්නේ අකුශල පක්‍ෂයෙහි ප්‍රාණඝාතකයාට ආයුධ ආදිය යි. කුශල පක්‍ෂයෙහි මල් පහන් ආදිය යි. කර්මය මෙන් කර්ම නිමිත්ත අතීත ම නො වේ. එය අතීත ද වර්තමාන ද වන්නේ ය. එසේ ම එය කර්මය මෙන් මනොද්වාරයට පමණක් අරමුණු වන්නේ ද නොවේ. චක්‍ෂුරාදි ෂඩ්ද්වාරයට ම අරමුණු වන්නේය. ඒ වනාහි වර්තමාන වශයෙන් ෂඩ්ද්වාරයට අරමුණු වන්නේ මරණාසන්නයෙහි දී ලද්දක් වශයෙනි. ඒ එසේ මැයි. මරණාසන්නයෙහි ඉදිරිපත් කළ බුද්ධ ප්‍රතිමාදිය චක්‍ෂුර්ද්වාරයට ද, ධර්මදේශනාදිය ශ්‍රෝතද්වාරයට ද, සුවඳ දුම් මල් සුවඳ ආදිය ඝ්‍රාණද්වාරයට ද, "මෙය පූජා පිණිස දෙමි. සතුටු වන්නැ"යි කියමින් දිව ගෑ රස ජිව්හාද්වාරයට ද, "මෙය පූජාකරන්නට අත ගසන්නැ"යි කියා අත ගැස්වූ වස්ත්‍රාදිය කායද්වාරයට ද, ඒ ඇසිල්ලෙහි

ලත් යම් කිසි අරමුණක් මනොද්වාරයට ද වර්තමාන වශයෙන් අරමුණු වේ. මේ දැක්වූයේ කුශල පක්‍ෂය යි. අකුශල පක්‍ෂය ද නිසි පරිදි දතයුතු යි. අතීත වූ රූපාදි කර්ම නිමිති අරමුණු වන්නේ මනොද්වාරයට මැ යි.

බඹලොව උපදින රූපාවචර ධ්‍යානලාභීන්ට කර්මය අරමුණු නොවෙතත් කර්මනිමිති අරමුණු වේ. ඔවුන්ට කර්මනිමිති වන්නේ කසිණාදි පඤ්ඤත්තාලම්බන යි.

එසේ ම අරූපාවචර ධ්‍යානලාභීන්ට ද කර්ම නිමිති අරමුණු වේ. එයින් ආකාසානඤ්චායතන ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානලාභීන්ට පඤ්ඤත්තාලම්බන ද විඤ්ඤාණඤ්චායතන නේවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානලාභීන්ට මහග්ගත ද අරමුණු වේ.

කිසි තැනෙක නූපදින රහතුන්ට වනාහි කර්ම මෙන් කර්ම නිමිති ද අරමුණු නොවන්නේ ය.

**ගති නිමිත්ත** නම් කුශල හෝ අකුශල හෝ ප්‍රතිසන්ධි ජනක කර්මයෙන් යම් ලෝකයෙක උපදින්නේ ද ඒ ලෝකය පිළිබඳ යම්කිසි නිමිත්තයෙකි. අකුශල කර්මයෙන් නිරයෙහි උපදින්නවුන්ට නිරාගිනි නිරයපාල නිරය සුනඛාදීහු ද, තිරිසන් අපායෙහි උපදින්නවුන්ට පර්වත වනාදිය ද, කුශල කර්මයෙන් මව්කුස උපදින්නවුන්ට මාතෘකුක්ෂි වර්ණ කම්බල යානාදිය ද, දෙව්ලොව උපදින්නවුන්ට දෙවඟන දෙව්රුක් දෙව්විමන් දෙව්රිය මල්මාලාදිය ද, ගතිනිමිත්ත වශයෙන් අරමුණු වේ. ගති නිමිත්ත මනොද්වාරයට පමණක් අරමුණු වන්නකැ යි ඇතැම් ආචාර්යවරයන් කියතත් ඇතැම්හු එය ෂඩ්ද්වාරයට ම අරමුණු වන්නේ ය යි කියති. දෙවියන් තමන් ම දිව්‍යරථාදිය ගෙන ආ කල්හි එය චක්‍ෂුර්ද්වාරයට ද, දිව්‍ය ගීත තූර්යාදිය ගෑ කල්හි ශ්‍රෝතද්වාරයට ද, දිව්‍ය සුවඳ ලූ කල්හි ඝ්‍රාණද්වාරයට ද, දිව්‍ය රස දිව ලූ කල්හි ජිහ්වාද්වාරයට ද, නන්‍දමානවකාදීන්ට මෙන් නිරා ගිනි ඇඟ වැදගත් කල්හි කායද්වාරයට ද, ගතිනිමිත්ත අරමුණු වේය යනු ඔවුන්ගේ මතය යි.

බ්‍රහ්මලෝකයෙහි උපදින රූපාවචර අරූපාවචර ධ්‍යානලාභීන්ට කර්ම මෙන් ම ගතිනිමිති ද අරමුණු නො වේ.

එසේ ම කිසි තැනෙක නූපදින රහතන්ට කර්ම කර්මනිමිති මෙන් ම ගතිනිමිති ද නො ලැබේ. උන්වහන්සේලා අතුරෙන් සුක්ඛවිපස්සක රහතන්ට වනාහි පරිනිර්වාණාසන්නයෙහි යම්කිසි නාම රූපයක් ද එසේ ම සමාපත්තිලාභී වූ ධ්‍යානසමනන්තරයෙහි පිරිනිවෙන්නට කසිණ නිමිත්තාදිය ද පච්චවෙක්ඛණ සමනන්තරයෙහි පිරිනිවෙන්නන්ට ධ්‍යානාඞ්ග ද අභිඤ්ඤාසමනන්තරයෙහි පිරිනිවෙන්නන්ට ස්වකීය කරජරූප ද ජීවිත සමසිසී වූ අග්‍රමාර්ගයෙන් ප්‍රත්‍යවේක්‍ෂා සමනන්තරයෙහි පිරිනිවෙන්නන්ට මාර්ගාඞ්ගාදිය ද අන්තිම ජවනයන්ට අරමුණු වන්නේය යි කියනු ලැබේ. කවුරුන්ගේ වුව ද චුති චිත්තයට අරමුණු වන්නේ ඔවුන්ගේ

ඒ භවයෙහි ප්‍රතිසන්ධි චිත්තයට අරමුණු වූ කර්ම කර්මනිමිති ගතිනිමිති අතුරෙන් එකෙකැ යි දතයුතු.

මරණාසන්නයෙහි මේ කර්ම කර්මනිමිති ගතිනිමිති පහළ වන්නේ ප්‍රතිසන්ධිජනක කර්මයාගේ අනුභාවයෙනි. තව ද ප්‍රකෘතියෙන් පුරුදු කරන ලද්දකින් ද ඒ ඇසිල්ලෙහි කරන ලද්දකින් ද අන්‍යයන් විසින් සිහිකරවන ලද්දකින් ද එය අරමුණු විය හැකි බව ද දතයුතුයි. තවද පළමු දුර්ගති නිමිති පහළ වූ කල්හි කල්‍යාණ මිත්‍රොපකාරයෙන් එය දුරුකොටැ ගෙනැ සෝණ ස්ථවිරයන්ට මෙන් සුගති නිමිති පහළකර ගත හැකි බව ද පළමු සුගති නිමිති පහළ වූ කල්හි යම්කිසි කරුණකින් එය දුරු වැ ගොස් ධර්මාශෝක රජහට මෙන් දුර්ගති නිමිති පහළවිය හැකි බව ද දතයුතුයි. මේ කර්ම කර්මනිමිති ගති නිමිති ඇතැම්විට මරණයට සතියකින් මොබ පටන් ද ලැබෙන්නේ ය.

කෙසේ හෝ වේවා, ඒ කර්මාදීන් අතුරෙන් යමක් එළඹ සිටි කල්හි එතැන් පටන් ඔහුගේ චිත්තසන්තානයට එහි එල්බැ අනතුරු වැ ලැබෙන භවයට සුදුසු පරිදි කුශල වශයෙන් පිරිසිදු වැ හෝ අකුශල වශයෙන් කිලිටි වැ හෝ බොහෝ සෙයින් එයටමැ නැමී පවත්නේ ය. බොහෝ සෙයිනැ යි කීයේ ශීඝ්‍ර වැ මැරෙන්නකුට නිතර එහිමැ නැමී පවතින බවද අශීඝ්‍රව මැරෙන්නකුට දැල්වුණු ඇසට මෙලොව සටහන් හා පියවුණු ඇසට පරලොව සටහන් ද දකිමින් පරලොව පක්‍ෂයට වඩාලාත් නැඹුරුව සිටින බව දක්වනු සඳහා යි. තව ද යම් කුශලයකින් හෝ අකුශලයකින් දෙවන ජන්මයෙහි ප්‍රතිසන්ධි ලබන්නේ ද ඒ කුශලය හෝ අකුශලය ඒ ඇසිල්ලෙහි කරන්නාක් මෙන් ද ඔහුට වැටහෙන්නට පටන් ගන්නේ ය.

මරණය ඉතා ආසන්න වූයේ ය යි සලකනු. කෙතෙක් ආසන්න වූයේ ද තව එක චිත්ත වීථියක් පැවතී-වැඩිවුවොත් එක චිත්තයක් හා භවඞ්ගයක් පවතී. ඒ අවසානයෙහි මරණය වන්නේ ය. එසේ ආසන්නව මරණ ඇත්තහුට ඒ වීථී චිත්තයාගේ හෝ වීථී චිත්තයෙන් පසු වැ උපන් භවඞ්ගයාගේ හෝ අවසානයෙහි වර්තමාන භවයේ අන්තිමය වු චුතිචිත්තය ඉපිදැ නිරුද්ධ වන්නේ ය. එසේ නිරුද්ධ වන්නා හා සමගම ඊට අනතුරු වැ යථෝක්ත වීථී සිත් විසින් ගන්නා ලද්දාවූ කර්මාදි අරමුණෙහි එල්බැ අවිද්‍යානුශය පරික්‍ෂිප්ත තෘෂ්ණානුශය මූලක සංස්කාරයෙන් උපදවනු ලබන ඵස්සාදි සම්ප්‍රයුකත් ධර්මයන්ගෙන් පරිගෘහිත සහජාත ධර්මයන්ට අධිෂ්ඨාන භාවයෙන් පූර්වඞ්ගම වූ ප්‍රතිසන්ධි චිත්තය සවස්තුක වැ හෝ අවස්තුක වැ සුදුසු පරිදි භවාන්තර සන්ධාන වශයෙන් උපදිමින් පවත්නේ ය. තදනන්තර වැ භවඞ්ග වන්නේ ය.

මෙහි විශේෂ විභාගය මෙසේ දත යුතු යි.

ආසන්න වූ මරණය ඇත්තහුට - මෙයින් චුතිචිත්තයට ආසන්න වූ අන්තිම චිත්ත වීථිය සඳහන් කරයි.

වීථිචිත්තයාගේ අවසානයෙහි හෝ-මෙයින් කාමභවයෙන් චුත වැ කාමභවයෙහි උපදින්නවුන්ට ජවන පරියොසාන වූ හෝ තදාරම්මණ පරියොසාන වූ හෝ වීථිචිත්තය ලැබෙන බව ද සෙස්සන්ට ජවන පරියොසාන වූ ම වීථිචිත්තය ලැබෙන බව ද දතයුතුයි.

වීථිචිත්තයෙන් පසු වැ උපන් භවඞ්ගයාගේ අවසානයෙහි හෝ-මෙයින් යථෝක්ත වීථිචිත්තයෙන් පසු පංචවෝකාරයෙහි වස්තුරූපය හෝ චතුවෝකාරයෙහි චිත්තසන්තානය හෝ චිත්තක්‍ෂණ දෙකෙක ආයු ශේෂ වී නම් එවිට ඒ වීථිචිත්තාවසානයෙහි භවාඞ්ගයක් උපදින බව දක්වයි. එහි දු කාමභවයෙන් චුත වැ කාමභවයෙහි උපදින්නවුන්ට ජවනාවසානයෙහි හෝ තදාලම්බනාවසානයෙහි භවඞ්ගය ලැබෙන බව ද සෙස්සන්ට ජවනාවසානයෙහි ම භවඞ්ගය ලැබෙන බව ද සැලකිය යුතුයි.

වර්තමාන භවයාගේ අන්තිමය වූ-මෙයින් චුතිචිත්තය මේ භවය පිළිබඳ අවසාන චිත්තය බව දක්වයි.

චුතිචිත්තය ඉපිද නිරුද්ධ වන්නේය-මෙයින් චුතිචිත්තයාගේ උප්පාද ඨිති දක්වා භවඞ්ගය ද දැක්විණි.

එසේ නිරුද්ධ වන්නා හා සමග ම ඊට අනතුරු වැ-මෙයින් මිථ්‍යාමතයකට පහර දෙයි. ඒ මිථ්‍යාමතය නම් ඇතැම් කෙනෙක් චුති-ප්‍රතිසන්ධි දෙක අතර "අන්තරාභවයෙක්" ඇතැයි ද, එහි සත්ත්වයෝ දිවැස් ඇත්තවුන් මෙන් ඍද්ධිමතුන් මෙන් ඇසිල්ලකින් සිතූතැනට යන්නට සමර්ථයහ යි ද, ඔව්හු මව්පිය සඞ්ගම සොයමින් සතියක් හෝ ඉන් වැඩියක් හෝ වසත්ය යි ද දක්වත් ද එය යි. එබඳු අන්තරාභවයක් නැති බව ද, චුති සිතට අනතුරු වැ ම ප්‍රතිසන්ධිසිත පහළවන බවද මෙයින් දක්වයි.

යථෝක්ත වීථි සිත් විසින් ගන්නා ලද කර්මාදි අරමුණෙහි එල්බැ-මෙයින් මේ භවයෙහි අවසාන චිත්තවීථියිට කර්ම කර්මනිමිති ගතිනිමිති අතුරෙන් යමක් අරමුණු විණි ද එය ම දෙවන භවයෙහි ප්‍රතිසන්ධි සිතට ද අරමුණු වන බව කී නියා දතයුතු. අගලෙක මෙ තෙර සිටියෙක් උඩ ඇදැ තිබූ රැහැණෙක එල්බැ එ තෙරට පනින්නා සේ සත්ත්වයා කර්මාදි නිමිත්තයන්හි එල්බැ දෙවන භවයෙහි පිළිසිඳින්නේ ය.

අවිද්‍යානුශය පරික්ෂිප්ත තෘෂ්ණානුශය මූලක සංස්කාර විසින් උපදවනු ලබන-ප්‍රතිසන්ධි සිත කුමකින් උපදවනු ලබන්නේද සංස්කාර විසින් උපදවනු ලබන්නේය. කෙබඳු සංස්කාර විසින් ද? අවිද්‍යානුශය පරික්ෂිප්ත තෘෂ්ණානුශය මූලක සංස්කාර විසින්. මෙහි සංස්කාර නම් ප්‍රතිසන්ධි ජනක කර්ම සංඛ්‍යාත චේතනාවය. තත් සම්ප්‍රයුක්ත ඵස්සාදිය ද උපනිඃශ්‍රය වශයෙන් එහි ම ලා ගත හැකි ය. තව ද මෙහි සංස්කාර යන්නෙන් මරණාසන්න ජවන විඤ්ඤාණ සහජාත චේතනාව හෝ ගත හැකි ය. උපනිඃශ්‍රය වශයෙන් තත් සම්ප්‍රයුක්ත ඵස්සාදිය ද ගැනේ. නානා ක්‍ෂණික කර්මයෙන් රුකුල් ලද අවසාන ජවන සහගත චේතනාව ප්‍රතිසන්ධි දනේනේ ය. අවිද්‍යානුශය පරික්ෂිප්ත තෘෂ්ණානුශය මූලක-අර්හත් මාර්ග ඥානයෙන් කෙළෙස් ප්‍රහාණය නො කළවුන්ගේ සිත්හි

අවිද්‍යානුශය හා තෘෂ්ණානුශය ඇත්තේම ය. එයින් අකුශල සිත්හි අවිජ්ජා තණ්හා සම්ප්‍රයුක්ත වශයෙන් ම යෙදේ. කුශල සිත්හි අනුශය වශයෙන් යෙදේ. අනුශය නම් කාරණයක් නැති කල්හි සිතෙහි නිදි ගෙන මෙන් සිටින කාරණයක් පැමිණි කල්හි නැගී එන ක්ලේශයෝ ය. ඔව්හු සත් දෙනෙකි. එයින් මේ දෙකෙකි. අවිද්‍යාව විෂයාදීනව මුවා කෙරෙයි. තණ්හාව මුවා කළ ආදීනව ඇති විෂයයෙහි නමාලයි-සංස්කාර එහි තල්ලු දෙන්නාක් මෙන් කරයි.

ඵස්සාදි සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ පරිගෘහිත සහජාත ධර්මයන්ට අධිෂ්ඨාන භාවයෙන් පූර්වඞ්ගම වූ-මෙය ප්‍රතිසන්ධි සිතේ ආකාරය යි. ප්‍රතිසන්ධි සිත හුදෙකලා නොවේ. එය ඵස්ස වෙදනාදි චෛතසිකයන්ගෙන් වටකර ගන්නා ලද්දේ ය. එසේ ම එය අප්‍රධාන ද නො වේ. සහජාත නාමරූපයන්ට ආධාර බැවින් පූර්වඞ්ගම ය. රූප ගත්තේ ප්‍රතිසන්ධි සිත සමග ම කර්මජ රූප පහළ වන තැන් සඳහා ය.

සවස්තුක වැ හෝ අවස්තුක වැ-මෙය ද, ප්‍රතිසන්ධි චිත්තයේ ලක්ෂණයෙකි. පංචවොකාර භවයෙහි ප්‍රතිසන්ධි සිත සවස්තුක ය. හෘදය වස්තු සමග පවත්නා බැවිනි. චතුවොකාර භවයෙහි ප්‍රතිසන්ධි සිත අවස්තුක ය. චතුවොකාර නම් අරූප භූමි යි. එහි රූප කැලම නැත්තේ ය. අසඤ්ඤසත්තයෙහි වනාහි ප්‍රතිසන්ධි වන්නේ ජීවිත නවක රූපය ය. සිතෙක් එහි නැති එහෙයින් එය රූපප්‍රතිසන්ධික ය යි කියනු ලැබේ. අරූපාවචරයෝ අරූප ප්‍රතිසන්ධිකයෝ ය. සෙස්සෝ රූපාරූප ප්‍රතිසන්ධිකයෝ ය.

සුදුසු පරිදි-කුශල අකුශලයන්ට සුදුසු පරිදි-අකුශලයෙන් සතර අපායෙහි, කුශලයෙන් කාමස්වර්ග, රූප, අරූප, භූමින්හි

භවාන්තර සන්‍ධාන වශයෙන් උපදිමින් පවත්නේය-මෙයින් කිසිවක් අන්‍යභවයකට නො යන බව ද, ස්කන්‍ධසන්තතිය අවිච්ඡින්නවැ පවතින බව ද දැක්විණි.

සාමාන්‍යයෙන් ජවන් සිත සත්වරක් උපදින්නේ නමුදු මේ මරණාසන්න වීථියෙහිදී එය පස්වරක් පමණක් උපදින බව දත යුතුයි. කර්මය හෝ හෘදය වස්තුව දුර්බල බැවිනි. එසේ හෙයින් යම් විටෙක ආපාතගත වූ පච්චුප්පන්න නිමිති ධ්‍රියමාන කල්හි ම මරණය වේ ද එවිට ප්‍රතිසන්ධි භවඞ්ගයන්ට ද ප්‍රත්‍යුත්පන්නාරම්මණත්‍වය ලැබෙන්නේ ය.

කෙබඳු චුති චිත්තයකට අනතුරු වැ කෙබඳු ප්‍රතිසන්ධි චිත්තයෙක් වන්නේ ද හෙවත් කවර කවර ලෝකවලින් චුතවූවෝ කවර කවර ලෝකවල උපදිත් ද යනු මෙහි දක්වනු ලැබේ.

අරූපාවචර චුතිචිත්තයන්ට අනුතරු වැ මතු මතු අරූපාවචර ප්‍රතිසන්ධීහු ද කාමත්‍රිහේතුක ප්‍රතිසන්ධිහු ද වෙත්. හෙවත් අරූපාවචර ලෝකයෙන් චුතවන්නෝ යට යට අරූපාවචර ලෝකයන්හි නූපදිති. මතු මතු අරූපාවචර ලෝකයන්හි ම උපදිති. එසේ ම ඔව්හු රූපාවචර ලෝකයන්හි ද නූපදිති. කාමලෝකයන්හි උපදින්නෝ ත්‍රිහේතුකයෝවැ ම

උපදිති. ද්විහේතුකයෝ වැ හෝ අහේතුකයෝ වැ නූපදිත්. උපචාර ධ්‍යාන චේතනායෙහි බලවත් බව මෙයින් දැක්වේ.

රූපාවචර චුතිචිත්තයන්ට අනතුරු වැ අහේතුක ප්‍රතිසන්ධි හැර සෙසු ප්‍රතිසන්ධීහු වෙත්-හෙවත් රූපාවචර ලෝකයෙන් චුතවන්නෝ සතර අපායෙහි නූපදිති. කාම සුගතියෙහි ද ජාත්‍යන්‍ධාදි වූ අහේතුකයෝ වැ නූපදිත්. මෙයින් ඔවුන්ට කාමසුගතියෙහි ද්විහේතුක ත්‍රිහේතුක වැ ද රූපී අරූපී බ්‍රහ්ම වැ ද උපදිය හැකි බව දැක්වේ.

කාමාවචර ත්‍රිහේතුක චුතිචිත්තයන්ට අනතුරු වැ සියලු ම ප්‍රතිසන්ධීහු වෙත්. මෙයින් කාමත්‍රිහේතුකයන්ම මරණයෙන් පසු අපාය කාමසුගති රූපී අරූපී බ්‍රහ්මලෝක යන සියලු තැන්හි උපදිය හැකි බව දැක්විණි.

ද්විහේතුක අහේතුක චුතිචිත්තයන්ට අනතුරු වැ කාම භූමීන්හි ම ත්‍රිහේතුක ද්විහේතුක අහේතුක ප්‍රතිසන්ධීහු වෙත්. ද්විහේතුක අහේතුකයන්ට මරණයෙන් පසු බ්‍රහ්ම ලෝකයන්හි උපදිය නොහැකි බව මෙයින් දැක්වේ.

**"ආරුප්පචුතියා හොන්ති හෙට්ඨිමාරුප්පවජ්ජිතා**
**පරමාරුප්පසන්ධි ච තථා කාමෙ තිහෙතුකා.**
**.**
**රූපාවචර චුතියා අහෙතුරහිතා සියුං**
**සබ්බා කාම තිහෙතුම්හා කාමෙස්වෙව පනෙතරා"**

අදහස සුගමයි.

මේ ච්‍යුති ප්‍රතිසන්ධි ක්‍රමය යි.

මෙසේ පිළිසිඳ ගත්තවුන්ගේ ඒ ප්‍රතිසන්ධි චිත්තය භඞ්ග වන්නා හා සමග මැ ඊට අනතුරු වැ භවඞ්ග චිත්තය උපදින්නේ ය. මේ භවඞ්ග චිත්තය ද ප්‍රතිසන්ධි චිත්තයමැ ය. එයට අරමුණත් ප්‍රතිසන්ධි චිත්තයේ අරමුණ මැ ය. වෙනස නමින් පමණෙකි. භවයාගේ අවිච්ඡේද ප්‍රවෘත්තියට අඞ්ග වන බැවින් මේ අවස්ථායෙහි එයට භවඞ්ගය යි කියනු ලැබේ. ඒ භවඞ්ග චිත්තයත් භඞ්ග වන්නා හා සමග මැ එබඳු වූ ම තවත් භවඞ්ග චිත්තයෙක් වන්නේය. මෙසේ චක්ෂුරාදි ද්වාරයන්ගෙන් ලැබෙන වීථිසිත් නොවන කල්හි මේ භවඞ්ග සන්තතිය නදී ශ්‍රොතයක් මෙන් අවිච්ඡින්න වැ පවත්නේ ය. අවසානයෙහි එය ම චුතිචිත්තය වැ ඉපිද භඞ්ග වන්නේ ය. එයට අනතුරු වැ නැවත ප්‍රතිසන්ධි චිත්තාදිය වන්නේ ය, මෙසේ මේ චිත්ත සන්තතිය රථචක්‍රයක් මෙන් නිරතුරු වැ භ්‍රමණය වන්නේ ය. රහත්වීමෙන් පසු ලැබෙන චුතිචිත්තයෙන් (ස්කන්‍ධ පරිනිර්වාණයෙන්) ඒ භ්‍රමණය නවතින්නේ ය. එවිට ඔහුගේ සංසාරය සිඳුනේ වන්නේ ය. හෙතෙම නිර්වාණයට පැමිණියේ වන්නේ යි.

මේ ගාථා දෙක ද හෘද්ගත කරනු.

**"පටිසන්ධි භවඞ්ග වීථියො චුතිචෙහ තථා භවන්තරෙ**
**පුනසන්ධි භවඞ්ගමිච්චයං පරිවත්තති චිත්තසන්තති**
**.**
**පටිසංඛාය පනෙතමද්ධුවං අධිගන්ත්වා පදමච්චුතං බුධා**
**සුසමුච්ඡින්නසිනෙහ බන්ධනා සමමෙස්සන්ති චිරාය සුබ්බතා"**

මේ භවයෙහි යම් සේ ප්‍රතිසන්ධි භවඞ්ග වීථි චුති වන්නේ ද එසේ ම භවාන්තරයෙහි නැවත ප්‍රතිසන්ධි භවඞ්ගාදිය වන්නේ ය. මෙසේ මේ චිත්තසන්තතිය පරිවර්තනය වෙයි.

ප්‍රාඥයෝ මේ වෘත්තයාගේ පැවැත්ම මෙසේ අස්ථිරය යි නුවණින් සලකා දැනැ බොහෝ කලක් සුන්දර ව්‍රත ඇත්තෝ වැ අමරණීය ස්වභාව වූ නිර්වාණය අවබෝධ කොටැ ගෙන මොනවට සිඳැ පියන ලද ස්නේහබන්ධන ඇති වැ නිරුපධිශේෂ නිර්වාණ ධාතුවට පැමිණෙත් යනු එහි සාමාන්‍ය අදහස යි.

**ප්‍රශ්න.**

1. මරණය සිදුවිය හැකි සතර ආකාරය විස්තර කරනු.
2. මරණාසන්නයෙහි අරමුණු වන කර්ම කර්මනිමිති ගතිනිමිති පැහැදිලි කරනු.
3. කවර කවර සිත්වලට අනතුරු වැ චුතිචිත්තය වන්නේ ද? චුතිචිත්තයේ අරමුණ කුමක් ද?
4. ච්‍යුති ප්‍රතිසන්ධි ක්‍රමය දක්වනු.
5. කවර කවර චුතිචිත්තයන්ට අනතුරු වැ කවර කවර ප්‍රතිසන්ධීහු වෙත් ද?

**පණ්ඩිත මාතර ශ්‍රී ධර්මවංශ ස්ථවිර ස්වාමීන් කළ අභිධර්මචන්ද්‍රිකාවේ වීථිමුක්තපාදය යි.**

# සවන රූප පාදය.

**නමො භගවතො සම්බුද්ධස්ස.**

## 1. රූප සමුද්දේශය.

පරමාර්ථ වශයෙන් **චතුර්විධ** වූ **අභිධර්මාර්ථ** අතුරෙන් **චිත්ත** හා **චෛතසික** යට පරිච්ඡේද පසින් පැහැදිලි කොට දක්වන ලද්දේය. එහි දු **ප්‍රථම** පාදයෙන් **චිත්ත** විභාගයද **දෙවන** පාදයෙන් **චෛතසික** විභාගය ද **තෙවන** පාදයෙන් වෙදනාදි වශයෙන් චිත්ත චෛතසිකයන්ගේ **ප්‍රකීර්ණක** විභාගය ද **සතරවන** පාදයෙන් **ප්‍රවෘත්තිකාලයෙහි** චිත්ත චෛතසික **පවත්නා පිළිවෙල ද පස් වන** පාදයෙන් **ච්‍යුතිප්‍රතිසන්ධි** වශයෙන් චිත්ත චෛතසික පවත්නා **පිළිවෙල** ද දැක්වුණේ ය. දැන් දැක්විය යුත්තේ **රූපය** යි. රූප නම් ශීත උෂ්ණාදි විරුද්ධ ප්‍රත්‍යය ඇති කල්හි විකාරයට පැමිණෙන දේ ය.

**"රුප්පතීති භවෙ රූපං විකාර පච්චයෙ සති'**
**රූපරූපං තථා රූප පරියාපන්නතො පරං."**

ශීත උෂ්ණාදි විරුද්ධ ප්‍රත්‍යය ඇති කල්හි යම් රූපරූපයෙක් විකාරයට පැමිණේ ද ඒ රූපරූප රූප නම් වේ. එයින් අන්‍ය රූප රූපරූපයෙහි ඇතුළත් වන බැවින් රූප නම් වේ යනු එහි අර්ථයි. රූපරූප නම් නිෂ්පන්න රූප ය. අරූපරූප නම් අනිෂ්පන්න රූප යි. විස්තරය මතු ලැබේ.

**1. සමුද්දෙස. 2 විභාග, 3 සමුට්ඨාන, 4 කලාප, 5 ප්‍රවෘත්තික්‍රම** යන පස් ආකාරයෙන් ඒ රූප මතු පැහැදිලි කරනු ලැබේ. 1 **සමුද්දෙස** නම් සංක්‍ෂෙපයෙන් දැක්වීම හෙවත් නාම මාත්‍ර වශයෙන් දැක්වීමය. 2 **විභාග** නම් සමුද්දිෂ්ට රූප බෙදා දැක්වීම ය. 3 **සමුට්ඨාන** නම් රූප උපදවන ප්‍රත්‍යය-හේතු දැක්වීමය. 4 **කලාප** නම් එකට බැඳී පවත්නා රූප සමූහ දැක්වීම ය. 5 **ප්‍රවෘත්ති ක්‍රම** නම් රූප පැවතෙන පිළිවෙල දැක්වීම ය.

**රූප සමුද්දෙසය මෙසේ ය.**

මහා භූතරූප සතර ය. ඔවුන් නිසා පවත්නා උපාදාය රූප සූවිස්සය යි රූප මුළුල්ල අට විස්සෙ (28) කි. මේ අට විසි රූප එකොළොස් ආකාරයෙකින් සංග්‍රහ වේ.

1. පඨවිධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු යන සතර මහා භූතරූප ය.
2. චක්ඛු සොත ඝාණ ජිව්හා කාය යන පස ප්‍රසාද රූප ය.
3. රූප ශබ්ද ගන්ධ රස (ඵොට්ඨබ්බ) යන සතර ගෝචර රූප ය. (මෙහි ඵොට්ඨබ්බ රූපය නම් වශයෙන් ගත් නමුදු අර්ථවශයෙන් පඨවි තේජෝ වායු යන භූත රූපත්‍රය මැ යි.)

4. ස්ත්‍රීභාව පුරුෂභාව යන දෙක භාවරූප ය.
5. හෘදය වස්තුව හෘදය රූපය.
6. ජීවිතේන්ද්‍රිය ජීවිත රූපය.
7. කබලීකාර ආහාරය ආහාර රූපය. මේ අටළොස් රූපයෝ ස්වභාව රූප, සලක්‍ෂණ රූප, නිෂ්පන්න රූප, රූප සම්මර්ශන රූප නම් ද වෙත්.
8. ආකාශ ධාතුව පරිච්ඡේද රූප ය.
9. කාය විඤ්ඤත්ති වචී විඤ්ඤත්ති දෙක විඤ්ඤත්ති රූපය.
10. ලහුතා මුදුතා කම්මඤ්ඤතා යන තුන හා විඤ්ඤත්ති රූප දෙක විකාර රූපය.
11. උපචය සන්තති ජරතා අනිච්චතා යන සතර ලක්ෂණ රූපය. උපචය සන්තති දෙක ජාති රූප යයි ද කියනු ලැබේ.

**"භූතප්පසාද විසයා භාවො හදයමිච්චපි**
**ජීවිතාහාර රූපෙහි අට්ඨාරසවිධං තථා**
**පරිච්ඡෙදෙ ච විඤ්ඤත්ති විකාරො ලක්ඛණංතිච**
**අනිපඵන්නා දසචෙති අට්ඨවීසතිවිධං භවෙ."**

| | | |
|---|---|---|
| භූත රූප | 4 | |
| ප්‍රසාද රූප | 5 | |
| විෂය (ගොචර) රූප | 4 | |
| භාව රූප | 2 | |
| හෘදයවස්තු රූප | 1 | |
| ජීවිතෙන්ද්‍රිය රූප | 1 | |
| ආහාර රූප | 1-18 | ස්වභාවාදි රූප |
| පරිච්ඡෙද රූප | 1 | |
| විඤ්ඤත්ති රූප | 2 | |
| විකාර රූප | 3 | (විඤ්ඤත්ති දෙක සමග 5) |
| ලක්‍ෂණ රූප | 4 | |
| | 28 | රූප මුළුල්ල |

දෙවන පාඩමින් මේ පිළිබඳ විස්තර දෙනු ලැබේ.

**ප්‍රශ්න.**

1. යට දැක්වුණු පරිච්ඡේද පසින් කුමක් දක්වන ලද්දේ ද?
2. රූප යන්නෙහි අර්ථය කිම? ආකාශ ධාතු ආදි දසය කුමක් හෙයින් රූප යන නාම ලබන්නේ ද?
3. අට විසි රූප දක්වනු. ඵොට්ඨබ්බය යි විශේෂ රූපයෙක් ඇත්තේ ද?

4. ස්වභාව රූප, සලක්ෂණ රූප, නිෂ්පන්නරූප, රූපරූප, සම්මර්ශන රූප කෙතෙක් ද? කවරහු ද?
5. රූප සංග්‍රහ කථා ලියා කොටස් වශයෙන් බෙදනු.

## 2. රූප සමුද්දේශය (සතර මහාභූතරූප)

පඨවිධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු යන සතර, මහාභූතරූපයෝ ය යි යට කියන ලදි. මොවුන්ට මහාභූත යන නාමය (අ) මහන්ත පාතුභාව, (ආ) මහාභූත සාමාන්‍ය, (ඉ) මහාපරිහාර (ඊ) මහා විකාර, (උ) මහන්ත භූත යන අර්ථ පඤ්චකය වශයෙන් ලැබේ.

(අ) මහත් වැ පහළ වන්නෝ මහාභූතයෝ ය. අනුපාදින්නක වශයෙන් චක්‍රවාට පර්වත පෘථිවි සන්ධාරක ජල, ජල සන්ධාරක වායු ආදී වැ ද උපාදින්නක වශයෙන් මත්ස්‍ය කච්ඡප දෙව දානවාදී වැ ද මොව්හු මහත් වැ පහළ වෙති. එබැවින් **"මහන්තානි භූත්වා භවන්ති පාතුභවන්තීති මහා භූතානි"** යනු වශයෙන් මහාභූත නම් වෙති.

(අ) මහාභූත බඳු වූවෝ මහා භූතයෝ ය. මායාකාර යක්‍ෂ යක්‍ෂිහු ලොව මහාභූතයෝ ය. මායාකාරයෝ නො රන් ආදිය රන් ආදි කොට දක්වති. එ මෙන් මොව්හු තුමූ නො නිල්වන් ආදිය නිල්වන් ආදි කොට දක්වති. යක්ෂයෝ යමෙකුට ආවේශ වූ නම් ඌ ඔහුගේ ඇතුළ පිට කො තැන ඇත් දැයි සොයා ගත නො හැකි ය. එමෙන් මොව්හු ඔවුනොවුන් පිළිබඳ ඇතුළ පිට කොතැන ඇත් දැයි සොයා ගත නො හැකි ය. යක්‍ෂිහු ස්වකීය බිහිසුණු බව වළහා නානා සිත්කලු වෙසින් මිනිසුන් මුළා කරති. එමෙන් මොව්හු ද ස්වකීය කර්කශත්‍වාදි ගුණ වළහා නානා සිත්කලු ලෙසින් ලොව මුළා කරති. මෙසේ මායාකාර යක්‍ෂ යක්‍ෂී සඞ්ඛ්‍යාත මහාභූතයන් බඳු බැවින් මේ සතර **"මහාභූත සාමඤ්ඤානි මහාභූතානි"** යන වශයෙන් මහා භූත නම් වේ.

(ඉ) මහත් වූ ප්‍රත්‍යයයෙන් පරිහරණය කටයුත්තෝ මහා භූතයෝ ය. මොව්හු දිනපතා යොදනු ලබන සාසච්ඡාදනාදි (කෑම ඇඳීම් ආදී) ප්‍රත්‍යයයෙන් පවත්නෝ ය. එබැවින් **"මහාපරිහාරානි භූතානි මහාභූතානි"** යනු වශයෙන් මහාභූත නම් වෙති.

(ඊ) මහත් වූ විකාර ඇත්තෝ මහාභූතයෝ ය. අනුපාදින්න උපාදින්න සියලු මහාභූතයෝ විකාරයට පත් වෙති. කල්පාන්තයෙහි අනුපාදින්නයන්ගේ ද ධාතුක්‍ෂොභයෙහි උපාදින්නයන්ගේ ද විකාර මහත්ත්වය ප්‍රකට ය. මෙ සේ **"මහා විකාරාති භූතානි මහාභූතානි"** යනු වශයෙන් මහාභූත නම් වෙති.

(උ) මහත් වූ ව්‍යායාමයෙන් පරිග්‍රහණය කළ යුත්තෝ මහාභූතයෝ ය. මොව්හු මහත් ව්‍යායාමයෙන් පරිග්‍රහ කළ යුතු බැවින් **"මහතා වායාමෙන පරිග්ගහෙතබ්බත්තා භූතානි විජ්ජමානත්තා මහා භූතානි"** යනු වශයෙන් මහා භූත නම් වෙත්.

ඔවුන්ගේ ලක්‍ෂණාදිය මෙ සේ දත යුතු.

## 1. පඨවි ධාතු.

පඨවි නම් කවර දෙයක හෝ පවත්නා කැකුලු බවය-තද ගතිය. ධාතු නම් සත්ත්‍ව ජීව නොවූ මූල ස්වභාවය. ඉන්ද්‍රිය අනින්ද්‍රිය ප්‍රතිබද්ධ කො තැන්හි හෝ පවත්නා යම් තද බවෙක් ඇත්නම් එය **පඨවි ධාතු** රූපය යි දත යුතු. මෙය ඇතැම් තැනෙක ලක්ඛණ පඨවි යන නමින් හඳුන්වනු ලැබේ. එ බැවින්ම පඨවි ශබ්දයෙන් සසම්භාර පඨවි ආරම්මණ පඨවි සම්මති පඨවි ලක්ඛණ පඨවී යන අර්ථ සතරක් වාච්‍ය වන බව දත යුතු.

"**පඨවිංඛණෙය්‍ය**" පොළොව සාරානම් යන මෙහි පඨවි ශබ්දයෙන් කියවෙන්නේ සසම්භාර පඨවිය යි. සසම්භාර පඨවි නම් වර්ණාදි සෙසු රූපයන් සමග මිශ්‍ර වූ ගස් වැල් ආදි යට ආධාර වූ මේ මහපොළොව යි. පඨවි කසිණය යි කී කල්හි ගැනෙන්නේ ආරම්මණ පඨවිය යි. මෙහි පඨවි ශබ්දයෙන් කසිණාරම්මණ මාත්‍රය කියැවේ. පඨවි දේවතාය යි කී කල්හි සම්මති පඨවිය කියවේ. පඨවි කසිණය වඩා බඹලොව උපන්නෝ පඨවි දෙවියෝය යි සම්මත බැවිනි. ලක්ඛණ පඨවි නම් යට දැක්වුණු පඨවි ධාතු ම ය.

"**කතමං තං රූපං පඨවි ධාතු? යං කක්ඛලං ඛරිගතං කක්ඛලත්තං කක්ඛලභාවො අජ්ඣත්තං වා බහිද්ධාවා උපාදින්නං වා අනුපාදින්නං වා ඉදං තං රූපං පඨවි ධාතු**" යි සර්වඥයන් වහන්සේ ද මෙය පැහැදිලි කරන සේක. ආධ්‍යාත්මික වූ හෝ බාහිර වූ හෝ කර්මජ වූ හෝ නු වූ හෝ යම් කැකුළු බවෙක් තද බවෙක් වේ නම් එය පඨවි ධාතු රූප නම් වේ යනු එහි අර්ථයි. පඨවි ධාතුයෙහි ලක්‍ෂණය කර්කශ බව ය. "**කක්ඛල ලක්ඛණා පඨවි**" යනු එහෙයින් කීහ. සෙසු ධාතුන්ගේ ලක්‍ෂණය බලා මෙය කක්ඛල ය යි කියන ලදුවත් මෘදුත්‍වය ද මෙහි ඇතුළත් බව සලකනු. මෙහි කෘත්‍යය නම් සෙසු සහජාත රූප පිහිටන බව ය. මෙයට පඨවි යන නම ව්‍යවහෘත වූයේත් ඒ අර්ථය ගෙනැ යැ. **පථතීය ති පඨවි සහජාත රූපානං පතිට්ඨාන භාවෙන පක්ඛායති උපට්ඨාතී ති අත්‍ථො** යනු ටීකා යි. "**පුථු මහන්ති හුත්වා ජායති ති පඨවි**" යනු කී හෙයින් මහත්ව හට ගන්නේය යන අර්ථයෙන් ද පඨවී නම් වේ. "**ගන්‍ධවතීපෘථිවි**" යයි ගන්‍ධවත්භාවය පෘථිවියෙහි ලක්‍ෂණය කොට නෛර්යායිකයෝ දුටහ.

## 2. ආපො ධාතු.

අප් නම් කවර දෙයක හෝ පවත්නා ද්‍රව ස්වභාවය වැගිරෙන ගතිය. ධාතු නම් සත්ත්‍ව ජීව නො වූ මූල ප්‍රකෘතිය. ඉන්ද්‍රියානින්ද්‍රිය ප්‍රතිබද්ධ කො තැනක හෝ පවත්නා ද්‍රව ස්වභාවය-වැගිරෙන ගතිය-ස්නේහත්‍වය අප් ධාතු ය යි දත යුතු. මෙයට ඇතැම් තැනෙක ලක්‍ෂණ අප් ය යි කියවේ. එ බැවින් අප් ශබ්දයෙන් සසම්භාර ආප, ආරම්මණ ආප සම්මති ආප ලක්‍ෂණ ආප යන අර්ථ සතරක් වාච්‍ය වේ. සසම්භාර ආප නම් වර්ණාදියෙන් මිශ්‍රිත ගංගා සමුද්‍රාදියෙහි ජලය යි. ආරම්මණ ආප නම් ආපොකසිණ නිමිත්ත යි. සම්මති ආප නම් ආපො කසිණ වඩා බඹලෝ උපන්නවුන්ට ආපො දෙවියෝ ය යි කියති. එයයි. ලක්‍ෂණ ආප නම් යට දැක්වුණු අප් ධාතුව යි. "**කතමං ත රූපං**

**ආපොධාතු? යං ආපො ආපො ගතං සිනෙහො සිනෙහගතං බන්ධනත්තං රූපස්ස ඉදං තං රූපං ආපොධාතු**" යි සර්වඥයන් වහන්සේ මෙය වර්ණනා කරන සේක. යම් අප් ගතියෙක් ස්නේහ ගතියෙක් රූපයන්ගේ බන්ධන ස්වභාවයෙක් වේ නම් එය අප් ධාතු නම් වේ යනු එහි අර්ථ යි. අප් ධාතුයෙහි ලක්‍ෂණය ද්‍රව බව හෝ වැගිරෙන බව යි. කෘත්‍යය ආබන්ධනය යි. හෙවත් සහජාත රූප එකට බඳනා බවයි. අප් ධාතු නැත්නම් රූප එකට බැඳී නොපවත්නේ ය. විසිර යන්නේ ය. දූවිල්ලට ජලය ඉස බලනු. මෙයට අප් යි ව්‍යවහෘත වූයේ මේ අර්ථය ගෙනැ යැ, "ආපෙති සහජාත රූපානි බ්‍යාපෙත්‍වා තිට්ඨතීති ආපො තානි වා අවිප්පකිණ්ණානි කත්‍වා භුසො ජාති රක්ඛ තී ති ආපො" යනු ටීකා යි. අප් ධාතුව ස්පර්ශ කළ නො හැකි ය. ජලය ඇල්ලීමෙහි දී එහි පවත්නා පඨවි තේජෝ වායු ම ස්පර්ශ වේ. අප් ස්පර්ශ නොවේ. "**ශීත ස්පර්ශවත්‍යආපඃ**" සිහිල් පහස් ඇතියේ අප් ය යන තාර්කික මතය ප්‍රතිෂ්ඨා රහිත ය. ශීත වනාහි තෙජසෙහි ම විශේෂයක් බැවිනි.

## 3. තේජෝ ධාතු

තේජස් නම් කවර දෙයක හෝ පවත්නා උණුසුම් ස්වභාවය - දිලිසෙන ස්වභාවය - තියුණු ගති ය - පරිපාචකත්‍වය යි. ධාතු ශබ්දයෙහි අර්ථ කී සේ ම ය. ඉන්ද්‍රියානින්ද්‍රිය ප්‍රතිබද්ධ කො තැනෙක හෝ පවත්නා උණුසුම් ආදි ස්වභාව තේජෝ ධාතු රූපය යි දත යුතු. මේ ඇතැම් තැනෙක ලක්ඛණ තේජය යි කියනු ලැබේ. තේජ ශබ්දයෙන් ද වහනි සංඛ්‍යාත සසම්භාර තේජ ද තේජෝකසිණ සංඛ්‍යාත ආරම්මණ තේජ ද තේජෝදෙව සංඛ්‍යාත සම්මති තේජ ද තේජෝ ධාතු සංඛ්‍යාත ලක්ඛණ තේජද වාච්‍ය වන බව දත යුතු. "**කතමං තං රූපං තේජෝ ධාතු? යං තේජෝ තේජෝගතං උස්මා උස්මගතං උසුමං උසුමගතං අජ්ඣත්තං වා බහිද්ධා වා උපාදින්නං වා අනුපාදින්නං වා ඉදං තං රූපං තේජෝ ධාතු**" යි ධර්මරාජයාණෝ මෙය විස්තර කරති. ආධ්‍යාත්මික වූ හෝ බාහිර වූ හෝ කර්මජ වූ හෝ කර්මජ නොවූ හෝ තේජෝ ගතියෙක් උස්ම ගතියෙක් වේ නම් එය තේජෝ ධාතුව යි යනු එහි අර්ථ යි. තේජසෙහි ලක්‍ෂණය උෂ්ණත්‍වය යි කෘත්‍යය පරිපාචකත්‍වය යි. හෙවත් පැසවන බව යි. මේ අර්ථය ශීතයෙහි ද ඇති බැවින් ශීතය තේජෝ විශේෂයකැයි දක්වති. "**තේජෝ එව හි සීතං**" තේජස ම ශීතය යි මූල ටීකායෙහි ද "**මන්‍දෙ හි උණ්හත්තෙ සීතබුද්ධි**" උෂ්ණය මද වූ කල ශීතය යන බුද්ධිය වේ යනු විභාවිනියෙහි ද කියන ලදි. "**උෂ්ණස්පර්ශවත් තෙජඃ**" උණු පහස් ඇත්තේ තේජසය යන තාර්කික මතය මෙයින් බිඳී යෙයි. වරෙක ශීත වරෙක උෂ්ණ වශයෙන් ද වරෙක උෂ්ණ වරෙක ශීත වශයෙන් ද වැටහිය හැකි බැවින් බෞද්ධ මතය ස්ථිර වේ. "**සීතභාවො ච දහති පරිපාචෙති තම්භාවං ගමෙති යෙව**" සීත භාවය ද උෂ්ණභාවය මෙන් පරිපාචකමය යි ටීකායෙක දක්වා තිබේ.

## 4. වායො ධාතු.

ඉන්ද්‍රිය අනින්ද්‍රිය ප්‍රතිබද්ධ කො තැනෙක හෝ පවත්නා සැලෙන ස්වභාවය - විත්ථම්භන ගතිය වායොධාතු රූපය යි. වායු ශබ්දයෙන් ද වාත සංඛයාත සසම්භාර වායු ද වායු කසිණ සංඛ්‍යාත ආරම්මණ වායු ද වායුදෙව සංඛ්‍යාත සම්මත වායු ද වායු ධාතු සංඛ්‍යාත ලක්‍ෂණ වායු ද වාච්‍ය වන බව දත යුතු. "**කතමං තං රූපං වායො ධාතු? යං වායො වායො ගතං ථම්භිතත්තං රූපස්ස අජ්ඣත්තං වා බහිද්ධා වා උපාදින්නං වා අනුපාදින්නං වා ඉදං**

**තං රූපං වායො ධාතු"** යම් වායු ගතියෙක් සුළං පිරුණු උප්පල නාලතවාදීන්ගේ මෙන් යම් පිපෙන බවෙක් වේ නම් ආධ්‍යාත්මික වූ හෝ බාහිර වූ හෝ උපාදින්න වූ හෝ අනුපාදින්න වූ හෝ එය වායො ධාතු රූප නමැ යි **බුදුරජාණන් වහන්සේ** වදාළ සේක. වායුයෙහි ලක්‍ෂණය විත්ථම්භනය යි. කෘත්‍යය සැලෙන බව යි. "**වායති සහජාත ධම්මෙ අපතමානෙ කත්වා වහතී ති වායො**" යනුයෙන් සහජාත රූප නො වැටෙන සේ උසුලා සිටින්නේ වායු යි ද කියනු ලැබේ. "**රූප රහිත ස්පර්ශවාන් වායුඃ**" රූප නැති වැ ස්පර්ශ ඇත්තේ වායු ය යනු තාර්කික මත යි.

**ප්‍රශ්න.**

1. මහාභූත රූප සතර දක්වා ඔවුන්ට ඒ නම යෝග්‍ය වන පරිදි විස්තර කරනු.
2. පඨවි ධාතු රූපය ලක්‍ෂණාදි වශයෙන් දක්වනු.
3. අප් ධාතුරූපය පැහැදිලි කරනු. එය කුමක් හෙයින් ස්පර්ශ නොවන්නේ ද?
4. තේජො ධාතු රූපය දර්ශනානන්තර හා සසඳා දක්වනු.
5. වායො ධාතු රූපය බුදුහු කෙසේ පැහැදිලි කළසේක් ද? එහි ලක්‍ෂණ හා කෘත්‍ය දක්වනු.

## 3. රූප සමුද්දේසය (සූවිසි උපාදය රූප. පඤ්චපසාද.)

අට විසි රූප අතුරෙන් මහාභූත රූප සතර හැර සෙසු සූවිස්ස **උපාදය රූප** නමැයි යට කියන ලදි. චිත්තය ඇසුරුකොට පවත්නවුන්ට චෛතසික ය යි ද ද්‍රව්‍ය ඇසුරු කොට පවත්නවුන්ට ගුණ ය යි ද කියන්නා සේ මහාභූත රූප ඇසුරු කොට පවත්නවුන්ට උපාදාය රූපය යි කියනු ලැබේ. ඇඩි ව ගෙන, පවත්නා රූප උපාදාය රූප යි. කුමක් ඇඩිව ගෙන ද? මහාභූත රූප ඇඩි ව ගෙන. ඇසුරු කොට ය යි සේ යි. උපාදාය රූප වනාහි මහාභූත රූපයන් ඇසුරු කොට ම පවත්නේ ය.

සූවිසි උපාදාය රූප අතුරෙන් චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය යන පස ප්‍රසාද රූප නම් වේ. ප්‍රසාද රූප නම් කැටපතෙහි ප්‍රසාද මණ්ඩප හෙවත් ඔපය සේ කර්මයෙන් ජනිත භූත රූපයන්ගේ ප්‍රසාද ගතිය හෙවත් ඔපයයි.

**1. චක්‍ෂුඃ ප්‍රසාදය.**

ප්‍රඥා චක්‍ෂු මාංසචක්‍ෂු ය යි චක්‍ෂු දෙ වැදෑරුම් වේ. ප්‍රඥා චක්‍ෂු නම් නුවණැස ය. හේ වනාහි බුද්ධ චක්ඛු සමන්ත චක්ඛු ඤාණ චක්ඛු, දිබ්බ චක්ඛු, ධම්ම චක්ඛු ය යි පඤ්චවිධ ය. මා ශ චක්‍ෂු නම් මසැස ය. හෙ ද වනාහි සසම්භාර චක්ඛු පසාද චක්ඛු ය යි දෙ වැදෑරුම් වේ. සසම්භාර චක්ඛු නම් ඇස්වළෙහි පිහිටි යට ඇස්වළ ඇටින් ද මතු බැම ඇටින් ද ඇලයේ අක්ෂිකූටයෙන් ද ඇතුළ මත්ථලුඞ්ගයෙන් ද පිටත අක්ෂිලෝමයෙන් ද පරිච්ඡින්න වූ මාංශ පිණ්ඩය යි. එහි සැකෙවින් බලත්හොත් සතරමහාභූත වර්ණ ගන්ධ

රස ඕජා සම්භව සණ්ඨාණ ජීවිත භාව කායප්‍රසාද චක්‍ෂුඃප්‍රසාද යන තුදුස් සම්භාරයෙක් ඇත්තේ ය. විස්තර වශයෙන් බලත්හොත් සසම්භාර සුසාලිසෙක් ඇත්තේ ය. ඒ මෙ සේ යි. සතරමහාභූත වණ්ණ ගන්‍ධ රස ඕජා සණ්ඨාන සම්භව යන දසය කර්ම චිත්ත ඍතු ආහාර වශයෙන් සිව් ආකාරයෙකින් ලැබෙන බැවින් සතළිසෙකි. කර්මජ වූ ජීවිත භාව කායප්‍රසාද චක්‍ෂුඃප්‍රසාද යන සතර සමග සුසාළිස ය. එහි සෙම උත්සන්න විට සුදු ය. පිත උත්සන්න විට කළු ය. ලේ උත්සන්න විට රතු ය. පෘථිවි උත්සන්න විට තද ය. අප් උත්සන්න විට වැගිරේ. තේජස් උත්සන්න විට දැවිල්ල ය. වායු උත්සන්න විට භ්‍රමණය යි.

මේ සසම්භාර චක්‍ෂුව ඇසුරු කොටැ පවත්නා මහාභූතයන්ගේ ප්‍රසාදය ප්‍රසාද චක්‍ෂු ය. චක්‍ෂුඃප්‍රසාද රූපය නම් මේ යි. එය වනාහි සසම්භාර චක්‍ෂුව පිළිබඳ ශ්වේත මණ්ඩලයෙන් පරික්ෂිප්ත වූ කෘෂ්ණ මණ්ඩලය (කළුඉංගිරියාව) මැද පුළුන් පෙති සතක පැතිර සිටින තෙලිත්තක් සේ ඇස් පටල සත පැතිර සිටින්නේ ය. කිරි මවුන් සතර දෙනෙකු විසින් ධැරීම් නැහැවීම් සැරසීම් පවන්සැලීම් යන මෙයින් උවටැන් කරනු ලබන ක්‍ෂත්‍රිය කුමරකු මෙන් පඨවි ආදී සතර මහා භූතයන් විසින් සන්‍ධාරණ බන්‍ධන පරිපාචන සමුදීරණ කෘත්‍යවලින් උවටැන් කරනු ලබන්නේ ය. ඍතු චිත්ත ආහාරයෙන් උපස්ථම්භනය කරනු ලබන්නේ ය. ආයුෂයෙන් පාලනය කරනු ලබන්නේ ය. වර්ණ ගන්‍ධ රසාදීන් විසින් පිරිවරන ලද්දේ ය. ප්‍රමාණයෙන් උකුණු හිසක් පමණ ය. චක්‍ෂුර් විඥානාදි චිත්තයන්ට වස්තු ද ද්වාර ද වන්නේ ය. එහි ලක්‍ෂණය රූප හැපීමට සුදුසු භූතප්‍රසාදය යි, නොහොත් දට්ඨු කාමතා නිදාන කම්ම සමුට්ඨාන භූත ප්‍රසාදය යි. රසය රූපයන් විඳැ ගැන්ම යි. පච්චුපට්ඨාන චක්‍ෂුර්විඥානයට ආධාරභාවය යි. පදට්ඨානය දට්ඨුකාමතා නිදාන කර්මජභූතයි. සෙස්සෙහි ද විස්තරය මෙසේ දත යුතු යි.

## 2. ශොත්‍ර ප්‍රසාදය.

සසම්භාර සොත පසාද සොත ය යි. ශෝත්‍රය දෙ වැදැරුම් වේ. සසම්භාර සෝත නම් කන ය. කන්බිල ඇතුළෙහි ඇඟිලි මුදුවක් බඳු තුනී තඹවන් රෝමයෙකි. එය ඇසුරු කොටැ පඨවි ආදි ධාතුන් විසින් උවටැන් කරන ලද ඍතු ආදීන් විසින් උපස්තම්භ කරන ලද ආයුෂයෙන් පාලනය කරනු ලබන වර්ණාදීන් විසින් පරිවෘත වූ ශ්‍රෝත්‍රප්‍රසාද රූපය පිහිටියේ ය. එය සෝතවිඤ්ඤාණාදී චිත්තයන්ට වස්තු හා ද්වාර වන්නේ ය. එහි ලක්‍ෂණය ශබ්ද හැපීමට සුදුසු භූත ප්‍රසාදය යි. නොහොත් සෝතුකාමතානිදාන කම්මසමුට්ඨාන භූත ප්‍රසාදය යි රූපය ශබ්ද විඳැ ගැන්මයි. පච්චුපට්ඨානය සෝතවිඤ්ඤාණයට ආධාර භාවයයි. පදට්ඨානය සෝතුකම්‍යතා නිදාන කර්මජ භූත යි. **"සුණාති, සුණන්ති එතෙ නාති වා සොතං"** යනු විග්‍රහ හෙයින් ශබ්දය අසන්නේ හෝ මෙයින් ශබ්දය අසත් නු යි හේ සොත නම්.

## 3. ඝ්‍රාණප්‍රසාද.

මෙ ද සසම්භාර ඝ්‍රාණය ප්‍රසාද ඝ්‍රාණය යි ද්විවිධ වේ. සසම්භාර ඝ්‍රාණ නම් නාසිකාව ය. නාසිකා බිලය ඇතුළෙහි එළුකුරයෙක සටහන් ඇති තැනෙකි. එය ඇසුරු කොටැ පඨවි ආදින් විසින් උවටැන් කරන ලද ඍතු ආදීන් විසින් උපස්ථම්භක ආයුෂයෙන් පාලිත වර්ණාදීන් පරිවෘත ඝ්‍රාණ ප්‍රසාද රූපය පිහිටියේ ය. එය ඝාණවිඤ්ඤාණාදි චිත්තයන්ට

වස්තු හා ද්වාර වන්නේ ය. එහි ලක්ෂණය ගන්ධ ස්පර්ශයට සුදුසු භූත ප්‍රසාදය යි හෙවත් සායිතුකාමතා නිදාන කම්ම සමුට්ඨාන භූත ප්‍රසාදය යි. රසය ගඳ සුවඳ විඳගැන්ම යි. පච්චුපට්ඨාන ඝාණ විඤ්ඤාණයට ආධාරභාවය යි. පදට්ඨානය ඝොතු කාමතා නිදාන කර්මජභූතය **"ඝායති ඝායන්ති එතෙනාති වා ඝාණං"** ආඝ්‍රාණය කරන්නේ හෝ මෙයින් ගඳ සුවඳ ආඝ්‍රාණය කරත් නු යි හෝ ඝ්‍රාණ නම්.

### 4. ජිහ්වා ප්‍රසාදය.

මෙ ද සසම්භාර ජිහ්වාය ප්‍රසාද ජිහ්වාය යි ද්විවිධ වේ. සසම්භාර ජිහ්වා නම් දිව ය. ඒ දිව මැද මතුයෙහි උපුල් පෙති අගක් බඳු සටහනෙකි. එහි පඨවි ආදීන් විසින් උවටැන් කරන ලද ඍතු ආදීන් විසින් උපස්ථම්භිත ආයුෂයෙන් පාලිත වර්ණාදීන් පරිවෘත ජිහ්වා ප්‍රසාදය පිහිටියේ ය. එය ජිහ්වා විඤ්ඤාණාදි චිත්තයන්ට වස්තු හා ද්වාර වන්නේ ය. එහි ලක්ෂණය රසාස්වාදයට සුදුසු භූත ප්‍රසාදය යි නො හොත් සායිතුකාමතානිදාන කම්මසමුට්ඨාන භූත ප්‍රසාදය යි. රසය රස විඳ ගැන්ම යි. පච්චුපට්ඨානය ජිහ්වා විඤ්ඤාණයට ආධාරභාවය යි. පදට්ඨානය සායිතුකාමතා නිදාන කර්මජ භූත යි. ජීවිත නිමිත්ත වූ රසය ජීවිත ය යි කියනු ලැබේ. ඒ ජීවිතය අවහානය කරන්නේ කැඳවන්නේ ජිහ්වා යි. **"ජීවිත නිමිත්තං රසො ජීවිතං, තං අව්හතී ති ජිව්හා"** යනු විග්‍රහ යි.

### 5. කායප්‍රසාදය.

හෙ ද සසම්භාරකාය ප්‍රසාදකාය ය යි දෙ වැදැරුම්. සසම්භාර කාය නම් ශරීරය යි. මහත් කපු පුලුන් පටලයෙකැ ඉසි තෙලක් සේ ප්‍රසාදකාය වනාහි පාචක තේජස පිහිට තැන ද කෙස් ලොම් නිය අග හා වියලි සම ද හැර සෙසු සියලු සසම්භාර කායයෙහි පැතිර ඇත්තේ ය. එද පඨවි ආදීන් විසින් උවටැන් කරන ලද්දේ ය. ඍතු ආදීන් විසින් උපස්ථම්භිත ය. ආයුෂ විසින් පාලිත ය. වර්ණාදීන් විසින් පරිවෘත ය. කාය විඤ්ඤාණාදි චිත්තයන්ට වස්තු හා ද්වාර වන්නේ ය. එහි ලක්ෂණය ස්පර්ශයට සුදුසු භූත ප්‍රසාද ය යි. නොහොත් ඵුසිතු කාමතා නිදාන කම්මසමුට්ඨාන භූත ප්‍රසාදය යි. රසය පහස් විඳ ගැන්ම යි. පච්චුපට්ඨානය කාය විඤ්ඤාණයට ආධාරභාවය යි. පදට්ඨානය ඵුසිතු කාමතා නිදාන කර්මජභූත යි. **"කුච්ඡිතානං ආයො කායො"** යනු විග්‍රහ බැවින් ලාමක වූ කෙසාදීන්ට හෝ පාපධර්මයන්ට උත්පත්ති ස්ථාන වූයෝ කාය ය යි දත යුතු.

### ප්‍රශ්න.

1. ප්‍රසාද රූප කෙතෙක් ද? කවරහු ද? එය කොයින් ලැබේ ද?
2. චක්ෂුඃ ප්‍රසාද රූපය පහදා දක්වනු.
3. ශොත්‍ර ඝ්‍රාණ ජිහ්වා ලක්ෂණ දක්වනු.
4. කාය ප්‍රසාදය කිම?
5. ශරීරයෙහි ප්‍රසාද රූප නැති තැන් ඇත්නම් දක්වනු.

## 4. රූප සමුද්දේශය (සූවිසි උපාදය රූප, විසය රූප)

සූවිසි උපාදාය රූප අතුරෙන් ප්‍රසාද රූප යට දක්වන ලද්දේ ය. මෙහි විසය රූප දක්වනු ලැබේ. විසය රූප නම් රූප ශබ්ද ගන්‍ධ රස ස්ප්‍රෂ්ටව්‍ය යි. චක්‍ෂුරාදීන්ට විෂය වන්නේ-ගෝචර වන්නේ විෂය රූප ය. ගෝචර රූප යනු ද මොවුන්ට නමෙකි.

**1. රූප.**

මෙහි රූප නම් සතර මහා භූතයන් නිසා පවත්නා චක්‍ෂුර්විඥානයට ගෝචරවන හෙවත් ඇසින් දැක්ක යුතු වර්ණය හෝ පැහැය යි. "**රූපයති-වණ්ණ විසෙසං ආපජ්ජිත්‍වා හදයඞ්ගතභාවං පකාසෙතීති රූපං**" වර්ණ විශේෂයට පැමිණැ හෘදයගත භාවය රූපනය කරන්නේ-ප්‍රකාශ කරන්නේ රූපය යි එය විග්‍රහ කරන ලදි. "**කතමං තං රූපං රූපායතන? යං රූපං චතුන්නං මහාභූතානං උපාදය වණ්ණනිභා ස නිදස්සනං සප්පටිඝං නීලං පීතකං ලොහිතකං ඕදාතං කාළකං මඤ්ජෙට්ඨිකං හරි හරි වණ්ණං අංකුරවණ්ණං දීඝං රස්සං අනුං ථූලං වට්ටං පරිමණ්ඩලං චතුරස්සං ඡළංසං අට්ඨංසං සොළසංසං නින්නං ථලං ඡායා ආතපො ආලොකො අන්‍ධකාරො අබ්භා මහිකා ධූමො රජො චන්‍දමණ්ඩලස්ස=වණ්ණනිභා සුරිය මණ්ඩලස්ස වණ්ණනිභා තාරකරූපානං වණ්ණනිභා ආදසමණ්ඩලස්සවණ්ණන්භා මනිස බමුත්තාවෙළුරියස්ස වණ්ණනිභා ජාතරූපරජතස්ස වණ්ණනිභා -පෙ- ඉදං තං රූපං රූපායතනං**" යනුවෙන් බුදුරජාණන් වහන්සේ එය පැහැදිලි කළ සේක.

"**චක්‍ෂුර්මාත්‍රග්‍රාහ්‍යොගුණොරූපම්**" ඇසින් ගතයුතු ගුණය රූපය යි තාර්කිකයෝ කියති. ඔවුන්ගේ මතයෙහි ශුක්ල නීල පීත හරිත රක්ත කපිශ චිත්‍ර යන භේදයෙන් එය සප්තවිධ ය. පෘථිවි අප් තේජස්හි පවත්නේ ය. එයිනුදු පෘථිවියෙහි සප්තවිධය ද ජලයෙහි අභාස්වර ශුක්ලය ද තේජසෙහි භාස්වර ශුක්ලය ද පවත්නේය.

රූපයෙහි ලක්‍ෂණය චක්ඛුපටිහනනය හෙවත් ඇසෙහි වැදගැන්ම ය. රසය චක්‍ෂුර්විඥානයට විෂයත්‍වය. පච්චුපට්ඨානය එයට ම ගෝචර වන බවය. පදට්ඨානය සතර මහා භූත යි.

**2. ශබ්ද.**

ශබ්ද නම් සතර මහා භූතයන් නිසා වැටෙන ශ්‍රෝත්‍ර විඥානයට ගෝචර වන හෙවත් කනින් ඇසිය යුතු හඬ ය. "**සප්පති සෝතවිඤ්ඤෙය්‍යභාවං ගච්ඡතී ති සද්දො**" යනු එහි විග්‍රහය. ශෝත්‍රයෙන් දැනැ ගත යුතු බවට පැමිණෙන්නේ ශබ්ද ය යනු අර්ථ යි. "**කතමං තං රූප සද්දයතනං? යො සද්දො චතුන්නං මහාභූතානං උපාදය අනිදස්සනො සප්පටිඝො, භෙරිසද්දො මුතිඞ්ගසද්දො සංඛසද්දො පණවසද්දො ගීතසද්දො වාදිතසද්දො සම්මසද්දො පාණිසද්දො සත්තානං නිග්ඝොසසද්දො ධාතුනං සන්නිඝාතසද්දො වාතසද්දො උදකසද්දො මනුස්සසද්දො අමනුස්සසද්දො යෙ වා පන අඤ්ඤෙපි අත්‍ථි චතුන්නං මහා භූතානං උපාදය අනිදස්සනො සප්පටිඝො -පෙ- ඉදං තං රූපං සද්දෙයතනං**" යනු එහි පාළි යි.

"**ශ්‍රොත්‍රග්‍රාහ්‍යො ගුණං ශබ්දඃ**" ශෝත්‍රයෙන් ගතයුතු ගුණය ශබ්දය යනු තාර්කික මත යි. එය ආකාශයෙහි පමණක් පවත්නා බව ද ධ්‍වන්‍යාත් මකවර්ණාත්මක වශයෙන් ද්විවිධ බව ද එහි දක්වන ලද්දේය. ධ්‍වන්‍යාත්මක නම් අහස් ගිගුරුම් ආදිය යි. වර්ණාත්මක නම් භාෂා

යි. සංයොගජ, විභාගජ ශබ්දජය යි ඉපැද්මේ හේතු වශයෙන් එය ත්‍රිවිධ වේ. කඩිප්පු දවුල් වශයෙන් හෝ හස්ත තල භෙරි ආදි වශයෙන් හෝ නැඟෙන ශබ්ද සංයොගජ ය. උණ බට ආදිය පැළීමෙන් නැඟෙන ශබ්ද විභාගජය. ශබ්ද උපන්තැන් පටන් කන් සිදුර දක්වා, විචිත්‍රඞ්ගන්‍යායයෙන් නිමිත්ත පවනින් ශබ්දධාරා පවත්නේ ය. පූර්ව ශබ්දය උත්තර උත්තර ශබ්දයන්ට කාරණ වන බැවින් උත්තර උත්තර ශබ්ද ශබ්දජ යි. මෙ ද තාර්කික මතැ යි දත යුතු. ශබ්දය අසම්පත්තගග්හාය යනු බෞද්ධ මත යි. සම්පත්තග්ගාහ බව අටුවායෙහි දක්වා තුබුණු නමුත් එය ප්‍රතිෂිද්ධ විය. විස්තරයෙක් මතු ලැබේ.

ශබ්දයෙහි ලක්‍ෂණය සෝතපටිහනනය හෙවත් කනෙහි වැද ගැන්ම ය. රසය ශ්‍රෝත විඥානයට විෂයත්වය. පච්චුපට්ඨානය එයටම ගෝචර වන බව ය. පදට්ඨානය සතර මහා භූත යි.

### 3. ගන්ධ.

ගන්ධ නම් සතර මහා භූතයන් නිසා පවත්නා ඝ්‍රාණවිඥානයට ගෝචර වන හෙවත් නැහැයෙන් ආඝ්‍රාණය කළයුතු ගඳ සුවඳ යි. "**ගන්ධයති අත්තනො වත්‍ථුං සූචයතීති ගන්ධො**" තමා පිළිබඳ වස්තු සූචනය කරන්නේ-ප්‍රකාශ කරන්නේ ගන්ධය යනු එහි විග්‍රහ යි. "**කතමං තං රූපං ගන්ධායතනං? යො ගන්ධො චතුන්නං මහාභූතානං උපාදය අනිදස්සනො සප්පටිඝො මූලගන්ධො සාරගන්ධො තචගන්ධො පත්තගන්ධො පුප්ඵගන්ධො ඵලගන්ධො ආමගන්ධො විස්සගන්ධො සුගන්ධො දුග්ගන්ධො -පෙ- ඉදං තං රූපං ගන්ධායතනං**" යනු ඒ සඳහා වදාළ පෙළ යි. "**ඝ්‍රාණ ග්‍රාහ්‍යො ගුණො ගන්ධඃ**" නැහැයෙන් ගතයුතු ගුණය ගන්ධය බව ද පෘථිවියෙහි පමණක් එය පවත්නා බවද සුවඳ දුගඳ වශයෙන් එය දෙ වැදෑරුම් බව ද තාර්කිකයෝ කියත්.

ගන්ධයෙහි ලක්‍ෂණය නැහැයෙන් වැද ගැන්ම ය. රසය ඝ්‍රාණ විඥානයට විෂයත්‍ව ය පච්චුපට්ඨානය එයට ම ගෝචර වන බව ය. පදට්ඨානය සතර මහා භූත යි.

### 4. රස.

රස නම් සතර මහා භූතයන් නිසා පවත්නා ජිහ්වා විඥානයෙන් ආස්වාදනය කළ යුතු හෙවත් දිවින් විඳගත යුතු මධුරාදිය යි. "**රසියති අස්සාදියතී ති රසො**" යනුවෙන් එයට විග්‍රහ දක්වන ලදි. ආස්වාදනය කරනු ලබන්නේ රසය යනු එහි අර්ථයි. **කතමං තං රූපං රසායතනයං යො රසො චතුන්නං මහාභූතානං උපාදයං අනිදස්සනො සප්පටිඝො මූලරසො ඛන්ධරසො තචරසො පත්තරසො පුප්ඵරසො ඵලරසො අම්බිලං මධුරං තිත්තකං කටුකං ලවණිකං ඛාරිකං ලපිලකං කසාවො සාදු අසාදු -පෙ- ඉදං තං රූපං රසායතනං**" යනු බුදුරජාණන් වහන්සේ එය වදාළ පරිදි යි. "**රසනග්‍රාහ්‍යො ගුණො රසඃ**" දිවින් ගතයුතු ගුණය රසය යි ද එය මධුර අම්ල ලවණ කටු කෂාය තික්ත යන භේදයෙන් ෂඩ්විධ ය යි ද පෘථිවි ජල දෙක්හි පවත්නේ යයිද පෘථිවියෙහි ෂඩ්රසයන් ජලයෙහි මධුර රසයත් ඇතැයි ද තාර්කිකයෝ කියත්.

රසයෙහි ලක්‍ෂණය ජිහ්වාපටිහනනය හෙවත් දිවෙහි වැදැ ගන්නා බවය. රසය ජිහ්වා විඥානයට විෂයත්‍ව ය. පච්චුපට්ඨානය එයට ම ගෝචරවන බව ය. පදට්ඨානය සතර මහා භූත යි.

### 5. ඵොට්ඨබ්බය.

කාය විඥානයෙන් දතයුත්තේ ඵොට්ඨබ්බය යි. එහෙත් ඵොට්ඨබ්බය යි ගතයුතු විශේෂ රූපයෙක් නැත්තේ ය. අබ්ධාතු හැරැ සෙසු පඨවි තේජෝ වායු යන භූත ත්‍රයම ඵොට්ඨබ්බය යි කියනු ලැබේ. බුදුරජාණන් වහන්සේ උපාදාය රූප කොටසෙහි ඵොට්ඨබ්බය කැලම ඇතුළත් කොට නො වදාළ සේක. එය නො උපාදාය රූප වශයෙන් වදාළ සේක. කයෙන් ස්පර්ශ කරනු ලබන්නේ පඨවි තේජෝ වායු යි. අප් ස්පර්ශ කළ හැකි නොවේ. ජලය ස්පර්ශ කරන කල්හි ස්පර්ශ වන්නේ පඨවි තේජෝ වායු යි. ද්‍රව්‍යත්වය ස්පර්ශ වේ යයි සිතීම අවිශේෂඥතායෙනි. එය සුද්ධ මනොද්වාරයෙන් සිදු වන්නකි. "**කතමං තං රූපං ඵොට්ඨබ්බායතනං? පඨවි ධාතු තේජෝධාතු වායෝධාතු කක්ඛලං මුදුකං සණ්හං ඵරුසං සුඛසම්ඵස්සං දුක්ඛසම්ඵස්සං ගරුකං ලහුකං -පෙ- ඉදං තං රූපං ඵොට්ඨබ්බායත** මේ සර්වඥයන් ඵොට්ඨබ්බය වදාළ පරිදි යි.

"**ත්‍වගින්ද්‍රියමාත්‍රග්‍රාහ්‍යො ගුණඃ ස්පර්ශඃ**" යනාදීන් ත්වගින්ද්‍රිය මාත්‍රයෙන් ගත යුතු ගුණය ස්පර්ශය යයි ද එය ශීත උෂ්ණ අනුෂ්ණාශීත භේදයෙන් ත්‍රිවිධය ය යි ද පෘථිවි අප් තේජස්හි පවත්නේ යයි ද එයිනු දු ශීතය ජලයෙහිත් උෂ්ණය තේජස්හිත් අනුෂ්ණාශීතය පෘථිවිවායුහිත් පවත්නේ යයි ද තාර්කිකයෝ දක්වති. ඒ පිළිබඳ බෞද්ධ මතයට ය කියන ලදි.

### ප්‍රශ්න.

1. විෂය රූප කෙතෙක් ද? කවරහුද? එයට නාමාන්තරයක් දක්වනු.
2. රූපය පැහැදිලි කරනු.
3. ශබ්ද ගන්ධ රසයන්ගේ ආකාර මේ මේ යයි දක්වනු.
4. ඵොට්ඨබ්බය පිළිබඳ විස්තරය දක්වනු.
5. විෂය රූපය පිළිබඳ දර්ශනාන්තර කෙසේද?

## 5. රූප සමුද්දේශය (සූවිසි උපාදාය රූප:- භාව හදය ජීවිත ආහාර.)

සූවිසි උපාදාය රූප අතුරෙන් පසාද රූප හා විසය රූප යට දක්වන ලද්දේ ය. මෙහි භාව හදය ජීවිත ආහාර රූප දක්වනු ලැබේ.

### භාව රූප.

මෝ ගැහැණිය මේ පිරිමිය යන ශබ්ද බුද්ධි යම් රූපයක් කරණකොටැ වේ නම් ඒ රූප භාව රූප ය යි කියනු ලැබේ. භාව රූප වනාහි ස්ත්‍රී භාව රූපය පුරුෂ භාව රූප ය යි දෙවැදැරුම් වේ. ස්ත්‍රී නම් අවිශදාකාරයෙන් පිහිටි ස්කන්ධ පඤ්චක ය යි යම් ධර්මයෙක අනුභාවයෙන් ඒ එසේ පිහිටියේ ද ඒ ස්ත්‍රී භාව රූප ය. ස්ත්‍රීන්ද්‍රිය ස්ත්‍රීත්‍වය යනු දු මේ ය. විශදාකාරයෙන් පිහිටි ස්කන්ධ පඤ්චකය පුරුෂ යි. යම් ධර්මයෙක අනුභාවයෙන් ඒ එසේ පිහිටියේ ද ඒ පුරුෂ භාව රූප යි. පුරුෂෙන්ද්‍රිය පුරුෂත්‍ව යනු දු මේ ය.
බුදුරජාණන්වහන්සේ ඒ මෙසේ දක්වන සේක. "**කතමං තං රූපං ඉත්ථින්ද්‍රියං යං ඉත්ථියා ඉත්ථිලිඞ්ගං ඉත්ථිනිමිත්තං ඉත්ථි කුත්තං ඉත්ථාකප්පො ඉත්ථත්තං ඉත්ථිභාවො ඉදං තං රූපං ඉත්ථින්ද්‍රියං** යි. ස්ත්‍රිය පිළිබඳ යම් ලිඞ්ගයෙක් නිමිත්තයෙක් කුත්තයෙක් ආකල්පයෙක් ස්ත්‍රීත්වයෙක් ස්ත්‍රී භාවයෙක් වන්නේ ද එය ස්ත්‍රීන්ද්‍රිය නම් වේ, යනු එහි අර්ථ යි. **ලිඞ්ග** නම් සටහනි. ස්ත්‍රීන්ගේ අත් පා ගිව් උර ආදි සටහන් පිරිමින්ගේ මෙන් නො වේ. ඔවුන්ගේ යට කය විසදය. උඩු කය අවිසදය. අත් පා මුහුණ කුඩාය. "**ලිඞ්ගන්ති පධානඞ්ග භූතං මහාසණ්ඨානං**" යනු ටීකා යි. **නිමිත්ත** නම් හැඳුණුමට නිමිත්ත ය. ඔවුන්ගේ උර මස් අවිසද ය. මුහුණ දළිරැවුලින් තොර ය. කුත්ත නම් ක්‍රියා ය. ඔව්හු ළදැරි කල කුලු මොහොල් ගෙන සෙල්ලම් කරති. ආකල්ප නම් ගමනාදි ආකාරය. ඔව්හු අවිසද වැ ගමන් ආදිය කරති. ස්ත්‍රීත්ව ස්ත්‍රීභාව නම් ස්ත්‍රී ස්වභාවය යි. "**කතමං තං රූප පුරිසින්ද්‍රියං යං පුරිසස්ස පුරිසලිඞ්ගං පුරිසනිමිත්තං පුරිස කුත්තං පුරිසාකප්පො පුරිසත්තං පුරිසභාවො ඉදං තං රූපං පුරිසින්ද්‍රියං**" පුරුෂයා පිළිබඳ යම් ලිඞ්ගයෙක් නිමිත්තයෙක් කුත්තයෙක් ආකල්පයෙක් පුරුෂත්වයෙක් පුරුෂ භාවයෙක් වන්නේ ද එය පුරුෂ ඉන්ද්‍රිය නම් වේ, යනු එහි අර්ථ යි. විස්තරය යට දැක්වුණු සේ දතයුතු. පුරුෂයන්ගේ උඩුකය විසද ය. යට කය අවිසද ය. අත් පා මුහුණු මහත් ය. උරොමංශ සුවිසද ය. දැළි රැවුල් ඇත. ළදරු කල රිය හා නගුල් ගෙන සෙල්ලම් කරති. ගමන් ආදිය විසද ය.

මේ භාව රූප කර්මජ ය. ප්‍රතිසන්ධියෙහි ම පිහිටන්නේ ය. බීජය ඇති කල්හි ගස පැලවී අතු පතර වැඩී යන්නා සේ ප්‍රතිසන්ධියෙහි භාව රූපය ඇති බැවින් ම ලිඞ්ග නිමිත්ත කුත්තාදිය පසු පසු ප්‍රකට වන්නේ ය. ආදි කල්පිකයන්ට භාව රූප වන්නේ ප්‍රවෘත්තියෙහි ය. පසු පසු උපදින්නට ප්‍රතිසන්ධියෙහි පිහිටා ප්‍රවෘත්තියෙහි වෙනස් ද වන්නේ ය. පුරුෂ වැ සිටැ පසු ස්ත්‍රී වූ සැටි ද ස්ත්‍රී වැ සිටැ පසු පුරුෂ වූ සැටි ද පොත්හි පැනේ. උභතො බ්‍යඤ්ජනකයන්ට භාව රූප දෙකම පිහිටන සේ පෙනුණත් ඇත්තේ ප්‍රධාන වශයෙන් එකක් ම බව අටුවාහි දක්වති. පුරුෂ ශක්ත්‍යාධික්‍යයෙන් පිරිමි දරුවන් ලැබෙන බව ද ස්ත්‍රී ශක්ත්‍යාධික්‍යයෙන් ගැහැණු දරුවන් ලැබෙන බව ද උභයසාම්‍යයෙන් නපුංසකයන් ලැබෙන බව ද වෛද්‍ය ශාස්ත්‍රයෙහි උගන්වති.

### හදය වත්‍ථු රූපය.

සත්ත්වයෝ යම් රූපයක් කරණ කොට ගෙනැ අර්ථ හෝ අනර්ථ හදත් ද පුරත් ද එය හදය යි කියනු ලැබේ. චිත්ත චෛතසික එහි වසන බැවින් එයට වත්‍ථු ය යි ද කියනු ලැබේ. හදය වූයේත් එ ම වත්‍ථු වූයේත් එම නු යි. **සමාස** වශයෙන් ගෙනැ හදයවත්‍ථු ය යි කියන ලදි. මනෝ ධාතු මනොවිඤ්ඤාණධාතුන්ට නිශ්‍රය වූ ස්ථාන යයි. එය හෘදය කොෂාභ්‍යන්තරයෙහි අඩ පතක් පමණ ලෙය ඇසුරු කොට පවත්නේ ය යි ආචාර්යවරයෝ දැක්වූහ.

බුදුරජාණන් වහන්සේ මේ රූපය ධම්මසංගණියෙහි නො වදාළ සේක. "**වත්ථු කුසලානං ඛන්ධානං නිස්සය පච්චයෙන පච්චයො. වත්ථු අකුසලානං ඛන්ධානං නිස්සය පච්චය යෙන පච්චයො**" යනාදීන් **පට්ඨානයෙහි** වදාළසේක.

මනොධාතු මනොවිඤ්ඤාණධාතූන්ට නිශ්‍රයස්ථානය හෘදය - පපුව නොවැ මොළය යි. ඇතැම්හු කියති. එස හෘදය (පපුව) ම බව අටුවාහි ස්ථිර සේ දක්වත්.

පර සිත් බලන ඍද්ධිමත්හු මේ වස්තු රූපයේ පැහැය බලා මොහුගේ සිත දැන් රාග සහිතය, මොහුගේ සිත රාග සහිතය, මොහුගේ සිත ද්වේෂ මෝහ විතර්කාදි සහිත ය මොහුගේ සිත ද්වේෂ මෝහ විතර්කාදි රහිත ය යි කියන්නට සමර්ථ වෙත්. ඒ එසේ මැ යි. සිත සොම්නස් කල්හි වත්ථු රූපය පිහිටි ලෙය පැසුණු නුග ඵලයක් සේ රත් පැහැ ය. දොම්නස් කල්හි කළු පැහැ ය. උපෙක්ෂා කල්හි පහන් තල තෙලක් බඳු ය. අරූපාවචරයන්ට වත්ථු රූප නැති බැවින් ඔවුන්ගේ සිත බැලීම විශේෂ ඍද්ධි විෂයෙකැ යි දතයුතු.

## ජීවිතින්ද්‍රිය රූපය.

යම් රූපයක් කරණ කොට ගෙනැ සහජාත ධර්ම ජීවත් වේ ද එය ජීවිත රූපය යි කියනු ලැබේ. එම එහි ලා අධිපති භාවය කරන හෙයින් ඉන්ද්‍රිය වේ. ජීවිත වූයේත් එම ඉන්ද්‍රිය වූයේත් එම නු යි ජීවිතින්ද්‍රිය නම් වේ. සහජාත රූප පාලනය කිරීම ලක්‍ෂණකොට ඇති කර්මජ රූපයෙකි. බීජයෙන් නිපන් උපුල් ආදිය බීජය නැති වැ ගිය කල්හි දු උදකානුපාලිත වැ බොහෝ කල් පවතී ද එමෙන් කර්මයෙන් නිපන් රූප කර්මය නැති වත් ජීවිතෙන්ද්‍රියානුපාලිත වැ වර්ෂ සිය දහස් ගණන් සන්තති වශයෙන් පවතී. ජීවිතේන්ද්‍රිය රූප සහිත වෘක්‍ෂ ලතාදිය ජීවත් වේය යි කීම ලෝක ව්‍යවහාර වශයෙනි. වෘක්‍ෂ ලතාදීන්ට ජීවිතේන්ද්‍රිය තැන්තේ ය. එයට "එකින්ද්‍රියපාණී" යි කීවෝ අබෞද්ධයෝ ය. බුදුරජාණන් වහන්සේ මෙසේ විස්තර කරන සේක. "**කතමං තං රූපං ජීවිතින්ද්‍රියං? යො තෙසං රූපීනං ධම්මානං ආයු ඨිති යපනා යාපනා ඉරියනා වත්තනා පාලනා ජීවිතං ජීවිතින්ද්‍රිය ඉදං තං රූපං ජීවිතින්ද්‍රියං**" ඒ රූපී ධර්මයන්ගේ ආයුෂය - සිටීම - යැපීම - පැවැත්ම - පාලනය - ජීවත්වීම ජීවිතේන්ද්‍රිය රූප නම් වේ. යනු එහි භාව යි. ජීවිතේන්ද්‍රිය රූපයාගේ ලක්‍ෂණය සහජාත රූප පාලනය යි. රසය ඔවුන්ගේ පැවැත්ම ය. පච්චුපට්ඨානය යපනය හෙවත් යැපීම ය - පදට්ඨාන යැපිය යුතු භූත යි. ඒ වනාහි උපාදින්නක සියලු ශරීරයෙහි ව්‍යාප්ත වැ පවත්නේ ය.

## ආහාර රූපය.

කබලීකාරාහාර, ඵස්සාහාර, මනොසඤ්චෙතනාහාර විඤ්ඤාණාහාරය යි. ආහාර චතුර්විධය. එයින් කබලීකාරාහාරය ආහාර රූප ය. සෙසු තුන නාම ධර්මයෝ ය. කබල කරනු ලබන්නේ කබලීකාර ය. අකබල හෝ කබල මෙන් කරනු ලබන්නේ කබලීකාරය. කබල නම් බත් පිඩු ආදිය යි. ආහරණය කරනු ලබන්නේ - ගිලිනු ලබන්නේ ආහාරය ඔජට්ඨමක රූප ගන්නේ හෝ ආහාරය. කබලීකාර වූයේත් එම ආහාර වූයේත් එම නු යි කබලීකාරාහාර නම් වේ. මෙයින් සවස්තුක ඕජාව කියන ලදැ යි දත යුතුයි. වස්තු නම්

ඔදන කුම්මාසාදිය. ඔජා නම් එහි පවත්නා පරම ස්නිග්ධ ස්නේහය, හෙවත් රස ධාතු ය. මේ ඔජාව ම ප්‍රධාන වශයෙන් ආහාර රූප නම් වන බව දත යුතු. කබලීකාර සඞ්ඛ්‍යාත වස්තුයෙහි පවත්නා ඔජා සඞ්ඛ්‍යාත ආහාරය කබලීකාරාහාරය යි ඇතැම් ආචාර්යවරයෝ කියත්. බුදුරජාණන් වහන්සේ ආහාර රූපය මෙසේ දක්වන සේක. **"කතමං තං රූපං කබලීකාරො ආහාරො? ඔදනො කුම්මාසො සත්තු මච්ඡො මංසං ඛීරං දධිං සප්පි නවනීතං තෙලං මධු ඵාණිතං යං වා පනඤ්ඤම්පි අත්‍ථි රූපං යම්හි යම්හි ජනපදෙ තෙසං තෙසං සත්තානං මුඛාසියං දන්තවිඛාදනං ගලජ්ඣොහරණියං කුච්ඡිවිත්‍ථම්භනං යාය ඔජාය සත්තා යාපෙන්ති ඉදං තං රූපං කබලීකාරො ආහාරො"** යි මෙහි ඔදනාදියෙන් වස්තු ද ඔජා යන්නෙන් ඔජාව ද වදාරන ලදි. වස්තු කුමට ද? ඔජාව කුමට ද? යනු අටුවාහි ආ ක්‍රමයයෙන් මෙහි දක්වනු ලැබේ. වස්තු පරිශ්‍රය දුරු කරන්නේ ය. ඕජාව රූප පාලනය කරන්නේය. වස්තුන්ට රූප පාලනය හෝ ඔජාවට පරිශ්‍රය දුරු කිරීම හෝ කළ නො හැකි ය. වස්තු ඔජා දෙක එක් වූ කල්හි පරිශ්‍රය දුරුකරන්ට ද ඔජාව පාලනය කරන්නට ද හැකි ය. පරිශ්‍රයනම් කර්මජ තේජස ය. කුසතුළ ඔදනාදි වස්තු නැති කල කර්මජ තේජස නැඟී උදර පටලය ගන්නේ ය. එවිට බඩගිනි යයි කිය වේ. ඔදනාදියක් එහි වැටුණු කල කර්මජ තේජස උදරපටලය හැර එය ගන්නේ ය. එවිට හේ සැනසිලි ලබයි. ඡායා රාක්‍ෂක ඡායාවට පැමිණියහු අල්වා ගෙනැ දෙව හැකිල්ලෙන් බැඳ තබා ස්වකීය භවනයට වී සිටැ බඩගිනි වූ කල්හි අවුත් ඔහුගේ හිස ඩහන්නේ ය. එවිට ඒ පුරුෂයා හඬතලන්නට පටන් ගනී. රකුසා ඒ හඬ අසා එහි පැමිණියවුන් අල්වා ගෙන කා භවනයට වී සැතපෙන්නේ ය. මේත් ඒ බඳුය යි දත යුතු යි.

මෙහි දු බත් ආදි ඖදාරික වස්තුයෙහි ඔජාව ස්වල්ප ය. ගිතෙල් ආදි සියුම් වස්තුයෙහි බලවත් ය. ස්වල්ප ඔජාව ඇති ආහාර වැළඳූ ඇසිල්ලේ නැවත බඩගිනි උපදී. ගිතෙල් ආදි සියුම් ආහාර වැළඳූ කල දවසකුදු බඩගිනි නො ඇනේ. වස්තුන්ගේ ඖදාරික සූක්‍ෂමභාවය එකින් එක ගෙනැ බැලිය යුත්තෙකි. මොනරුන්ගේ ආහාරයට වඩා කිඹුලුන්ගේ ආහාරය ඖදාරික ය. කිඹුල්ලු ගල් ගිලති. ගල් ඔවුන්ගේ කුසගින්නෙන් දිර යි. මොනරු නයි ගෝනුසු ආදීන් කති. මොනරුන්ගේ ආහාරයට වඩා වලසුන්ගේ ආහාරය සියුම්. වලස්සු තුන් හවුරුදු පැරණි අං ද ඇට ද කති. එය ඔවුන්ගේ කෙළ වැකීමෙන් අල මෙන් ලිහිල් වේ. වලසුන්ගේ ආහාරයට වඩා ඇතුන්ගේ ආහාරය සියුම්. ඇත්තු රුක් ආදිය කා දමති. ඇතුන්ගේ ආහාරයට වඩා ගවයන්ගේ ආහාර සියුම්. ගවයෝ අමු තණ හා පිදුරු කති. ඔවුන්ගේ ආහාරයට වඩා සාවුන්ගේ ආහාරය ද සාවුන්ගේ ආහාරයට වඩා පක්‍ෂීන්ගේ ආහාරය ද පක්‍ෂීන්ගේ ආහාරයට වඩා පිටිසර වැස්සන්ගේ ආහාරය ද ඔවුන්ගේ ආහාරයට වඩා ගම්මුදලියන්ගේ ද ගම්මුදලියන්ගේ ආහාරයට වඩා රාජ රාජ මහාමාත්‍යයන්ගේ ද ඔවුන්ගේ ආහාරයට වඩා සක්විති රජුන්ගේ ද ඔවුන්ගේ ආහාරයට වඩා බූමාටු දෙවියන්ගේ ද ඔවුන්ගේ ආහාරයට වඩා සිවුමහරජ දෙවියන්ගේද ඔවුන්ගේ ආහාරයට වඩා ක්‍රමයෙන් ඉන් උසස් උසස් දෙවියන්ගේ ද ආහාරය සියුම් ය.

කබලීකාරාහාරයෙහි ලක්‍ෂණය ඔජාව ය. රසය රූප ඇනවීම ය. පච්චුපට්ඨාන ය. උපස්තම්භන ය. පදට්ඨානය කබල කටයුතු වස්තු යි.

යට දැක්වුණු භූත පසාද විසය භාව ජීවිත ආහාර යන අටළොස් රූප වනාහි **ස්වභාව** රූප ය යි ද **සලක්‍ෂණ** රූප ය යි ද **නිෂ්පන්න** රූප ය යි ද **රූප** රූප ය යි ද **සම්මර්ශන** රූප ය යි ද කියනු ලැබේ. ඔව්හු කර්කශත්‍වාදී තම තමා පිළිබඳ ස්වභාවයෙන් යුක්ත බැවින් ස්වභාව රූපය උත්පාදාදි අනිත්‍යාදි ලක්‍ෂණයෙන් යුක්ත බැවින් සලක්‍ෂණ රූපය ස්වභාවයෙන් ම කර්මාදි ප්‍රත්‍යයෙන් නිපදවන බැවින් නිෂ්පන්න රූප ය. නිෂ්පර්යාය වශයෙන් ම රුප්පන හෙවත් විනාශ වන ලක්‍ෂණ ඇති බැවින් රූපරූපය ත්‍රි ලක්‍ෂණ වශයෙන් සම්මර්ශනය කරන්නට යෝග්‍ය බැවින් සම්මර්ශන රූප ය.

**ප්‍රශ්න.**

1. භාව රූප විස්තර කරනු.
2. හදය වත්‍ථු රූපය පහදා ඒ පිළිබඳ මත භේද දක්වනු.
3. ජීවිත රූපය විස්තර කරනු.
4. ආහාර රූපය පිළිබඳ වස්තු ඔජාවන්ගේ විශේෂ දක්වනු.
5. අටළොස් රූපයන්ට කුමක් හෙයින් සභාව රූප සලක්‍ෂණ රූප නිෂ්පන්න රූප රූප සම්මර්ශන රූප ය යි කියන ලද්දේ ද?

## 6. රූපසමුද්දේශය (සූවිසි උපාදය රූප, පරිච්ඡේද විඤ්ඤත්ති විකාර ලක්‍ෂණ)

සූවිසි උපාදාය රූප අතුරෙන් භාව රූප හදයවත්‍ථු රූප, ජීවිතින්‍ද්‍රිය රූප හා ආහාර රූප යට පාඩමින් දක්වන ලද්දේ ය. මෙහි **පරිච්ඡේද** විඤ්ඤත්ති **විකාර ලක්‍ෂණ** යන රූප දශය දක්වනු ලැබේ.

**පරිච්ඡෙද රූපය.**

පරිච්ඡේද රූප නම් ආකාශ ධාතු ය. යම් රූපයක් කරණ කොට ගෙනැ රූප කලාප හෝ ද්‍රව්‍ය සම්භාර හෝ වෙන් වෙන් වැ ප්‍රකාශ වේ ද ඒ රූපය ආකාශ ය. එම නිස්සත්ත්ව නිර්ජීව හෙයින් ධාතු ය. ආකාශ වූයේත් එම ධාතු වූයේත් එම නු යි ආකාශ ධාතු නම් වේ. ආකාශ ධාතුව රූප කලාප රූප කලාපාන්තර හා අසම්මිශ්‍ර වන සේ පිරිසිඳින්නේ ය. රූප කලාප විසින් හෝ එය පිරිසිඳිනු ලබන්නේ ය. එ හෙයින් එය පරිච්ඡේද රූප ය යි කියනු ලැබේ. "**කතමං තං රූපං ආකාස ධාතු? යො ආකාසො ආකාසතං අඝතං අඝගතං විවරො විවරගතං අසම්ඵුට්ඨං චතූහි මහාභූතෙහි ඉදං තං රූපං ආකාශ ධාතු**" යනු පාළි යි. ආකාශය - නොගැටෙන බව - විවරය - සතර මහා භූතයන්ගෙන් ස්පර්ශ නො වන බව ආකාශ ධාතු නම් වේ යනු එහි භාව යි. සතර මහා භූතයන්ගෙන් අසම්ඵුට්ඨ නම් අජටාකාශය යි. අටුවාහි දක්වන ලදි. සතර මහා භූතයන්ගේ අන්‍යොන්‍ය අබ්‍යාපිත්තාව - එකත්‍වයට නො පැමිණි බවය යි ටීකායෙහි දක්වත්. එහි ලක්‍ෂණය රූප පරිච්ඡේදයයි. රසය රූප පර්යන්ත ප්‍රකාශ ය යි. පච්චුපට්ඨානය රූප මර්යාදාය. පදට්ඨානය පරිච්ඡින්න

රූප යි. "**ශබ්දගුණ කාමාකාශම්**" ශබ්දය ගුණ කොටැ ඇත්තේ ආකාශය යි නෛර්යානිකයෝ කියත්. නානා කලාපගත භූතයන්ගේ පර්යන්ත සංඛ්‍යාත අන්තරාල ධර්මය ආකාශ ධාතු ය යි දත යුතු යි.

## විඤ්ඤත්ති රූප.

යම් රූපයකින් සත්ත්වයෝ තම අදහස මෙරමා හට දක්වත් ද තුමූ හෝ මෙරමාගේ අදහස දැනගනිත් ද එය විඤ්ඤත්ති රූප ය යි. ඒ වනාහි **කාය** විඤ්ඤත්ති **වචී** විඤ්ඤත්ති ය යි ද්විවිධ වේ. සැලෙන අඞ්ග ප්‍රත්‍යඞ්ග සංඛ්‍යාත කායයෙහි පැවැති විඤ්ඤත්තිය කාය විඤ්ඤත්ති ය යි. උච්චාරණය කරනු ලබන ශබ්ද සංඛ්‍යාත වචනයෙහි පැවැති විඤ්ඤත්තිය වචී විඤ්ඤත්තිය යි. හස්ත මුද්‍රායෙන් හෝ ශීර්ෂාදි චලනයෙන් හෝ සත්ත්වයෝ තමා හෝ තම අදහස හෝ අන්‍යයන්ට දන්වති. එසේ දන්වන කල්හි අත හෝ ශීර්ෂාදිය හෝ නො වැ එහි පවත්නා චිත්තජ වායු ධාතු විකාරය කාය විඤ්ඤත්ති ය යි ද කථාකරන කල්හි ශක්තිය නොවැ එයින් හඟවන අදහස් සංඛ්‍යාත චිත්ත පඨවි ධාතු විකාරය වචී විඤ්ඤත්ති ය යි ද කී නියා යි දතයුතු. රූප බොහෝ සෙයින් චිත්තක්‍ෂණ සතළොසක් ආයු ඇත ද මේ රූපද්වය එක චිත්තක්‍ෂණායුෂ්කය චිත්ත සහභූ යනු මොවුන්ට නමෙකි. කාය විකාරයෙන් හෝ වාග් විකාරයෙන් තම අදහස අන්‍යයන්ට හඟවමි යි සිතෙන කල ඇති වන චිත්ත වීථි හා එයින් අඞ්ග චලන ශබ්ද නැගෙන සැටි මෙහි දැක්විය යුතු වුව ද විස්තර භීතියෙන් නො දක්වන ලදි. එය මතු දක්වනු ලබන බව සැලකිය යුතු. බුදුරජාණන් වහන්සේ මේ රූප දෙක මෙසේ විස්තර කරන සේක. "**කතමං තං රූපං කාය විඤ්ඤත්ති? කුසලචිත්තස්ස වා අකුසලචිත්තස්ස වා අව්‍යාකත චිත්තස්ස වා අභික්කමන්තස්ස වා පටික්කමන්තස්ස වා ආලොකෙන්තස්ස වා විලොකෙන්තස්ස වා සම්මිඤ්ජෙන්තස්ස වා පසාරෙන්තස්ස වා කායස්ස ථම්භනා සන්ථම්භනා සන්ථම්භිතත්තං විඤ්ඤත්ති විඤ්ඤපනා විඤ්ඤපිතත්තං ඉදං රූපං කාය විඤ්ඤත්ති කතමං තං රූපං වචී විඤ්ඤත්ති? යා කුසල චිත්තස්ස වා අකුසල චිත්තස්ස වා අව්‍යාකත චිත්තස්සවා වාචා ගිරා බ්‍යාප්පථො උදීරණං ඝොසො ඝොසකම්මං වාචා වචී භෙදෙ -පෙ- ඉදං තං රූපං වචී විඤ්ඤත්ති.**" අර්ථ සුබොධ යි.

## විකාර රූප.

"විසෙසො කාරො - ආකාරො විකාරො" විශේෂ වූ කාරය - හෙවත් ආකාරය විකාර නම් වේ. ඒ වනාහි රූප පිළිබඳ වැ **ලහුතා මුදුතා කම්මඤ්ඤතා** යි ත්‍රිවිධ වේ. රූපයන්ගේ ලඝු භාවය, සැහැල්ලු බව ලහුතායි. එහි ලක්‍ෂණය නොබර බව යි. රූපයන්ගේ මෘදු භාවය - මොලොක් බව මුදුතා ය. එහි ලක්‍ෂණය නොතද බව යි. රූපයන්ගේ කර්මන්‍යතාව - වැඩෙහි යෙදවිය හැකි බව කම්මඤ්ඤතා ය. එහි ලක්‍ෂණය ක්‍රියානුකූලත්‍වය යි. මේ රූප තුන වෙන් වෙන් වැ නො පවතී. එහෙත් ඔවුන්ගේ විශේෂය සප්පාය අසප්පාය ප්‍රත්‍යය වශයෙන් දතයුතු වේ. ශරීරයෙන් අසප්පාය ඍතු හෝ සිත් හෝ ආහාර හෝ සෙවුන කල ශරීරගත ධාතුහු සියලු ශරීරය හෝ ශරීරයෙහි කොටසක් හෝ බර බවට පමුණුවති. තද බවට පමුණුවති. අකර්මණ්‍ය බවට පමුණුවති. එවිට රූප පිළිබඳ ලහුතා මුදුතා කම්මඤ්ඤතා නො වන්නේ ය. සප්පාය සෙවුන කල සැහැල්ලු බවට මෘදු බවට කර්මණ්‍ය බවට පමුණුවති. එවිට රූප පිළිබඳ ලහුතා මුදුතා කම්මමඤ්ඤතා වන්නේ ය. එහිදු යම් විටෙක නොබර බව වැඩි වේ ද එවිට ලහුතාව අධික වේ. සෙසු දෙක මඳ

වේ. සෙස්ස ද මෙසේ මැ යි. ලහුතාව රෝග සුව වූ කල මෙන් ද මුදුතාව පදම් කළ සම් මෙන් ද කම්මඤ්ඤතාව සකස් කළ රන් මෙන් ද සැලකියයුතු. මෙහි රූප යන්නෙන් චිත්තජ ඍතුජ ආහාරජ යන ත්‍රිජ රූප ගත යුතු ය යි කියන ලදි. **“කතමං තං රූපස්ස ලහුතා? යා රූපස්ස ලහුතා ලහුපරිණාමතා අදන්ධතා අවිත්ථන්තා ඉදං රූපං රූපස්සලහුතා කතමං තං රූපස්ස මුදුතා යා රූපස්ස මුදුතා මද්දවතා අකක්ඛලතා අකඨින්තා ඉදං තං රූපං රූපස්ස මුදුතා, කතමං තං රූපං රූපස්ස කම්මඤ්ඤතා යා රූපස්ස කම්මඤ්ඤතා කම්මඤ්ඤත්තං කම්මඤ්ඤභාවො ඉදං තං රූපං රූපස්ස කම්මඤ්ඤතා”** යනු මේ සඳහා වදාළ පාළි යි. විඤ්ඤත්ති රූප ද විකාර රූපයෙහි ඇතුළති. එවිට විකාර රූප පසෙකි.

## ලක්‍ෂණ රූප.

උත්පාදාදි ලක්‍ෂණයෙන් යුක්ත රූප ලක්‍ෂණ රූප යි. ඒ වනාහි **උපචය සන්තති ජරතා අනිච්චතා** යි චතුර්විධ වේ. ප්‍රථම උපදින්නාවූ හෝ මතු වැඩෙන්නා වූ හෝ රූප **උපචය** රූප යි. ගබ්භසෙය්‍යක සත්ත්වයන්ගේ ප්‍රතිසන්ධි ක්‍ෂණයෙහි උපදින රූප ප්‍රථම උපදින රූප ය. එතැන් පටන් චක්‍ෂුර්දිශාකාදීන්ගේ පහළවීම තාක් වැඩෙන රූප මතු වැඩෙන රූප ය. සංසෙදජ ඕපපාතික සත්ත්වයන්ගේ ප්‍රතිසන්ධි ක්‍ෂණයෙහි උපදින රූප ප්‍රථම උපදින රූඑ බව හා මතු වැඩෙන රූප බව ලබ යි. එ බැවින් ඒ සියල්ල උපචය රූප ය. වෘක්‍ෂලතාදීන්ගේ ද ප්‍රථම ලැබෙන රූප හා වැඩෙන රූප උපචය රූප ය. ගංඉවුරෙක සෑරූ ළිඳෙහි පළමු ලැබෙන ජලය ආචය යි ද පිරෙන ජලය උපචය යි ද පාළි අනුසාරයෙන් අටුවායෙහි කියන ලදි. මෙහි ඒ දෙකම උපචයෙහි ඇතුළත් කරන ලදි.

උපචයෙහි පටන් සවිඤ්ඤාණක සත්ත්වයන්ගේ හෝ අවිඤ්ඤාණක වස්තූන්ගේ අවසානය තාක් පවතින රූප පරම්පරා **සන්තති** රූප නම් වේ. ළිඳෙහි පිරීගිය ජලයාගේ පැවැත්ම මෙනි. වෘක්‍ෂ ලතාවන්හි අඞ්කුර සෑදී වැඩීම උපචය අවස්ථාවට ද වැඩීමේ පටන් අවසාන පැවැත්ම දක්වා සන්තති අවස්ථාවට ද ඇතුළත් බව දත යුතු. ජාති රූප නාමයෙන් දැක්වෙන්නේත් මේ උපචය සන්තති මැ යි. රූපයන්ගේ දිරුම්කඩ ජරතා යි භඞ්ගය **අනිච්චතා** යි. සතළොස් චිත්තක්‍ෂණික රූපයාගේ ප්‍රථම චිත්තක්‍ෂණාවස්ථාව උපචය මෙන් ද දෙවන චිත්තක්‍ෂණාවස්ථායෙහි පටන් පසළොස දක්වා සන්තතිය මෙන් ද සොළොස් වන චිත්තක්‍ෂණාවස්ථාව ජරතාව මෙන් ද සතළොස් වන චිත්තක්‍ෂණාවස්ථාව අනිච්චතාව මෙන් ද සැලකිය යුතු යි.

මේ පාඩමෙහි දැක්වුණු පරිච්ඡේදාදී වූ දශ රූපයන්ට අනිෂ්පන්න රූපයෝ ය යි කියනු ලැබෙත්. යට දැක්වුණු අටළොස ම නිෂ්පන්න බැවිනි. එසේ ම මොව්හු අරූප රූපයෝ ය යි ද කිව යුතු.

## ප්‍රශ්න.

1. අනිෂ්පන්න රූප දශය දක්වනු.
2. පරිච්ඡේද රූප යනු කිමෙක් ද? එහි ආකාර දක්වනු.
3. විකාර රූප කෙතෙක් ද? විඤ්ඤත්ති විභාගය දක්වනු.

4. ලක්‍ෂණ රූප සතර පැහැදිලි කරනු.
5. අට විසි රූප විස්තර කරනු.

## 7. රූප විභාගය.

යට පාඩම්වලින් රූප සමුද්දේශය දක්වන ලද්දේය. මෙහි රූප විභාගය දක්වනු ලැබේ.

**සියලු රූප වනාහි (1) අහේතුක, (2) සප්පච්චය, (3) සාසව, (4) සඞ්ඛත, (5) ලොකිය, (6) කාමාවචර, (7) අනාරම්මණ, (8) අප්‍රහාතව්‍ය යන අර්ථ වශයෙන් එකවිධ ය.**

(1) අහේතුක නම් හේතු රහිත බව ය. හේතුහු ලෝභ දෝස මෝහ අලෝභ අදෝස අමෝහයෝ යි. කිසි රූපයෙක මේ හේතු අතුරෙන් එක හේතුවෙකු දු සම්ප්‍රයුක්ත වසයෙන් නො යෙදේ. එහෙයින් සියලු රූප අහේතුක යි.

(2) සප්පච්චය නම් ප්‍රත්‍යය සහිත බව ය. ප්‍රත්‍යයයෝ නම් කර්ම චිත්ත ඍතු ආහාරයෝ ය. රූපයන්හි සම්ප්‍රයුක්ත හේතු නැතත් ඔව්හු යම්කිසි ප්‍රත්‍යයෙකින් හටගන්නෝ ය. එහෙයින් ඔව්හු සප්පච්චයෝ යි.

(3) සාසව නම් ආශ්‍රව සහිත බවය. ආශ්‍රවයෝ කාමාදී ක්ලේශයෝ ය. රූප තමා ම අරබයා උපන් ආශ්‍රව සහිත ය. එහෙයින් ඒ සාසව යි.

(4) සංඛත නම් ප්‍රත්‍යයෙන් නිපදින්නේ ය. අසංඛත නම් එකම නිර්වාණය. සෙසු සියල්ල සංඛත ය. රූප ද ප්‍රත්‍යයයෙන් සකස් කැරෙන බැවින් සංඛතයි.

(5) උපාදාන ස්කන්ධ සංඛ්‍යාත ලෝකයෙහි ඇතුළත් වන්නේ ලෞකික ය. නවලෝකොත්තර හැර සෙසු සියල්ල ලෞකික ය. රූප ද ලෞකික යි.

(6) කාම භූමියෙහි හැසිරෙන්නේ කාමාවචර ය. රූප බඹලොවැ තුබුණ ද කාමාවචර ය. කාමයෙහි ඇතුළත් බැවිනි. කාම තෘෂ්ණාව එහි හැසිරෙන බැවින් හෝ කාමාවචර යි.

(7) අනාරම්මණ නම් අරමුණු නො ගන්නා බව ය. අරමුණු ගන්නේ සිත් ය. රූප අරමුණු නොගනී. එ බැවින් රූප අනාරම්මණ යි.

(8) අප්‍රහාතව්‍ය නම් ප්‍රහාණය නොකළ යුතු බව ය. තදඞ්ගාදි වශයෙන් ප්‍රහාණය කළ යුත්තෝ ක්ලේශයෝ ය. රූප ප්‍රහාණය කළ යුතු නො වේ. "**රූපං භික්ඛවෙ න තුම්හාකං තං පජහථ**" මහණෙනි, රූපය තොපගේ නො වේ. එය ප්‍රහාණය කරව් යයි වදාළ තන්හි රූප යන්නෙන් වදාළේ රූප රාගය යි. කේවල රූපය නො වේ. "**රූපෙ ඛො රාධ යො**

ඡන්‍දො යො රාගො යා නන්‍දි යා තණ්හා තං පජහථ එවං රූපං පිහීණං භවිස්සති" යනු පෙනෙන බැවිනි. රාධ ය! රූපයෙහි යම් ඡන්‍දයෙක් රාගයෙක් නන්‍දියෙක් තෘෂ්ණාවෙක් වේ නම් එය ප්‍රහාණය කරව්. එවිට රූපය ප්‍රහීණ වූයේ වේ යනු එහි අර්ථ යි.

ධම් සඟුණු පාළියෙහි රූප පිළිබඳ අන්‍යාවූත් බොහෝ එකවිධ භෙද වදාරණ ලද්දේ ය.

(අ) අජ්ඣත්තික රූප බාහිර රූප වශයෙන් (ආ) වස්තු රූප අවස්තු රූප වශයෙන් ද (ඉ) ද්වාර රූප අද්වාර රූප වශයෙන් ද, (ඊ) **ඉන්ද්‍රිය රූප අනින්ද්‍රිය රූප** වශයෙන් ද, (උ) **ඕලාරික රූප සුඛුම රූප - සන්තිකෙ** රූප දූරෙ රූප - **සප්පටිඝ රූප** - අප්පටිඝ රූප වශයෙන් ද, (ඌ) **උපාදින්න රූප අනුපාදින්න** රූප වශයෙන් ද, (එ) **සනිදර්ශන රූප** අනිදර්ශන රූප වශයෙන් ද (ඒ) **ගොචරග්ගාහික** රූප **අගොචරග්ගාහික** රූප වශයෙන් ද, **(ඔ) අවිනිබ්භොග රූප විනිබ්භොග** රූප වශයෙන් ද, ද්විවිධ වේ.

**(අ) අජ්ඣත්තික රූප හා බාහිර රූප.**
චක්ඛු සෝත ඝාණ ජිව්හා කාය යන පඤ්ච ප්‍රසාද රූප අජ්ඣත්තික රූප ය. සෙසු සියල්ල බාහිර රූප යි. අජ්ඣත්ත නම් ඒ ඒ පුද්ගලයන්ගේ ආත්මභාවයට ඇතුළත් ධර්ම සමූහ ය යි. එහි දු යමෙක තෘෂ්ණාව අධික වැ අයත් වැ පවතී ද එය අජ්ඣත්තිකය. චක්‍ෂුරාදි ආයතන සය යි. මෙහි රූප ප්‍රස්තාව හෙයින් මනස හැර සෙසු පස අජ්ඣත්තික ය කියන ලදි. ඇතැම් තැනෙක එයට අජ්ඣත්තය යි ද කියති. ශරීර සම්බන්ධ රූප අතුරෙන් චක්‍ෂුරාදියෙහි ම තෘෂ්ණාව මහති. සෙස්සෙහි එතෙක් මහත් නො වේ. එහෙයින් සෙස්ස බාහිරයි. මේ පසට අජ්ඣත්තිකය යි කියන ලද්දේ රූඪී වශයෙනැයි එක් ටීකාවෙක දක්වයි.

**(ආ) වස්තු රූප හා අවස්තු රූප.**
චක්ඛු සොත ඝාණ ජිව්හා කාය යන ප්‍රසාද රූප පස හා හෘදය වස්තුව වස්තු රූපය. සෙසු දෙවිසිරූප අවස්තුරූප යි. චිත්ත චෛතසික මෙහි වසන බැවින් එයට වස්තු රූපය යි කියන ලද්දේ ය. සෙස්ස ඒ නො වසන බැවින් අවස්තු රූප යි. මොවුන් පිළිබඳ විස්තරයෙක් යට ද දක්වන ලදි.

**(ඉ) ද්වාර රූප හා අද්වාර රූප.**
පඤ්චප්‍රසාද හා කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති යන විඤ්ඤත්ති දෙක ද යන සප්තවිධ රූප ද්වාර රූපය. සෙසු එක් විස්ස අවාර රූප යි. ද්වාර නම් දොරය. වීථි සිත් හා කාය කර්මාදිය මෙහි පවත්නා බැවින් මේ සත ද්වාර රූපයයි කියන ලදි. හෙ ද උප්පත්තිද්වාරය කම්ද්වාරය යි ද්විවිධ වේ. පඤ්ච ප්‍රසාද උප්පත්තිද්වාර ය. විඤ්ඤත්ති දෙක කම්ද්වාර යි.

**(ඊ) ඉන්ද්‍රිය රූප හා අනින්ද්‍රීය රූප.**
පඤ්චප්‍රසාද රූපය, ඉත්ථිභාව පුරිසභාව යන භාව රූප දෙක ය. ජීවිතින්‍ද්‍රිය රූපය යන අෂ්ටවිධ රූප ඉන්ද්‍රිය රූපයි. සෙසු විස්ස අනින්‍ද්‍රිය රූප යි. ඉන්‍ද්‍රිය නම් අධිපතිභාවය යි.

පඤ්චප්‍රසාදය චක්ඛුවිඤ්ඤාණයෙහි අධිපති භාවය කෙරෙයි. පඤ්චප්‍රසාදයන්ගේ පටු මන්‍දාදිභාවයෙන් චක්ඛුවිඤ්ඤාණාදීන්ගේ ද පටු මන්‍දාදි ස්වභාව ඇතිවන බැවිනි. එහෙයින් චක්‍ෂුඃප්‍රසාදය චක්‍ෂුරින්ද්‍රිය නම් වේ. සෙස්ස ද මෙසේ යි. භාව රූපද්වය ස්ත්‍රීලිඞ්ගාදියෙහි අධිපති භාවය කෙරෙ යි. එහෙයින් එය ඉත්‍ථින්‍ද්‍රිය පුරිසින්‍ද්‍රිය නම් වේ. ජීවිත රූපය කර්මජ රූප පරිපාලනයෙහි අධිපති භාවය කෙරෙයි. එහෙයින් එය ජීවිතින්ද්‍රිය නම් වේ. මෙබඳු අධිපති භාවයක් නැති හෙයින් සෙසු රූප අනින්ද්‍රිය රූප යි.

**(උ) ඖදරික රූප හා සූක්‍ෂම රූප.**

පඤ්චප්‍රසාද සප්ත විෂය යන දොළොස් රූප ඖදාරික රූප ය. සෙසු සොළස සූක්‍ෂම රූප යි. සප්ත විෂය නම් රූප ශබ්ද ගන්‍ධ රස ස්ප්‍රෂ්ටව්‍ය සංඛ්‍යාත පඨවි තේජෝ වායු යි. ප්‍රකෘතියෙන් ම ථූල බැවින් හා විෂය විෂයීන්ගේ ඝට්ටනය ඖදාරික බැවින් මොව්හු ඖදාරික රූප නම් වූහ. සෙස්ස සියුම් බැවින් සූක්‍ෂම රූප නම් විය. සූක්‍ෂම රූප නම් ආපො ධාතු භාවද්වය හෘදයවස්තු ජීවිතෙන්ද්‍රිය ආහාර ආකාශ විඤ්ඤත්තිද්වය විකාරත්‍රය ලක්‍ෂණ චතුෂ්කය යන සොළස යි.

මේ ඖදාරික රූප **සන්තිකෙ රූප** නමුදු වේ. දුර පිහිටිය ද වහා ගන්නට හැකි බැවිනි. සෙස්ස **දූරෙ රූප** නමුදු වේ. එසේ ගත නො හැකි බැවින්. සන්තික නම් ආසන්න-ළඟ.

මේ ඖදාරික රූප **සප්පටිඝ රූප** නමුදු වේ. විෂය විෂයින් හැපෙන බැවිනි. සෙස්ස **අප්පටිඝ රූපය**. එසේ හැපුම් නැති බැවිනි. පටිඝ නම් පටිහනනය - එකට හැපීම.

**(ඌ) උපාදින්න රූප හා අනුපාදින්න රූප.**

කර්මජ රූප උපාදින්න රූප ය. සෙස්ස අනුපාදින්න යි. කර්මජ රූප නම් කර්මයෙන් ජනිත රූපයෝ ය. ඔහු වනාහි හදය රූප ඉන්ද්‍රිය රූප අවිනිබ්භෝග රූප ආකාශ ධාතු වශයෙන් අටළොසෙකි. පසාදභාව ජීවිත ඉන්ද්‍රිය රූප යි. පඨවි ආපෝ තේජෝ වායෝ වණ්ණ ගන්‍ධ රස ඕජා අවිනිබ්භෝග රූප යි. ඒ මතු පළ වේ. තෘෂ්ණාදෘෂ්ටි විසින් අත්‍යන්තයෙන් ගන්නා ලද්දේ උපාදින්නය. කර්මජ රූප සත්ත්වසන්තානයෙහි සියලු කල්හි පැවැතීම් වශයෙන් ආදින්න ය. ගෘහීත ය. පරාමෘෂ්ට ය. එසේ නො පවත්නා රූප අනුපාදින්න ය. එ නම් චිත්තජ ඍතුජ ආහාරජයෝ යි. එහි විස්තර මතු පළ වේ.

**(එ) සනිදර්ශන රූප හා අනිදර්ශන රූප.**

රූපායතනය සනිදර්ශන රූපය. සෙසු සත් විස්ස අනිදර්ශන රූප යි. නිදර්ශන සහිත බව සනිදර්ශන ය. නිදර්ශන නම් චක්‍ෂුර්විඥානයෙන් දැක්ක යුතු බව යි. ඇසින් දැක්ක හැක්කේ රූපායතන යි. සෙස්ස ඇසින් දැක්ක නො හැකි බැවින් අනිදර්ශන යි.

**(ඒ) ගෝචරග්ගාහික රූප හා අගෝචරග්ගාහික රූප.**

චක්ඛු සෝත ඝාණ ජිව්හා කාය යන ප්‍රසාද රූප පස ගෝචරග්ගාහික රූප ය. සෙසු තෙවිස්ස අගෝචරග්ගාහික රූප යි. ගෝචරග්ගාහික නම් ගොදුරු රක්නා බව ය. මෙහි ගොදුරු නම් රූප ශබ්ද ගන්‍ධ රස ස්පර්ශයෝ ය. ප්‍රසාද මණ්ඩයෙන් යුත් චක්‍ෂුරාදි පස ම

රූපාදි අරමුණු ගන්නේ ය. එද විඥ්ඥාණාධිට්ඨිත වැ ය. සෙස්ස එබන්දක් නැති බැවින් අරමුණු නො ගන්නේ ය. එහි දු චක්ඛු සෝත දෙක අසම්පත්ත ගෝචරග්ගාහිකය යි ද ඝාණ ජිව්හා කාය සම්පත්ත ගෝචරග්ගාහිකය යි ද කියනු ලැබේ. ගන්ධ රස ඵොට්ඨබ්බයෝ ඝාණ ජිව්හා කායයන්හි හැපුණු කල්හි ම අරමුණු වෙති. නොහැපුණු කල්හි අරමුණු නො වෙති. එහෙයින් ඔවුහු සම්පත්තග්ගාහික ය. රූප ශබ්ද චක්ඛු සොතයන්හි නොහැපී කෙසගක පමණවත් දුර පවත්නා කල්හි අරමුණු වේ. එහෙයින් ඒ දෙක අසම්පත්තග්ගාහික ය. මේ සියල්ල සම්පත්තග්ගාහික ය යනු ඇතැම් ආචාර්ය මත යි රූප දර්ශනයට ආලෝකයද ශබ්ද ශ්‍රවණයට ආකාශය ද අවශ්‍ය බැවින් චක්ඛු සෝත අසම්පත්ත ගෝචරග්ගාහිකය යි මෙහි කියන ලදි.

**(ඖ) අවිනිබ්භෝග රූප හා විනිබ්භෝග රූප.**
පඨවි ආපෝ තේජෝ වායු වණ්ණ ගන්ධ රස ඕජා යන අට අවිනිබ්භෝග රූප ය. මේ රූප අට කිසි විටෙක වෙන් කළ නො හැකි ය. එක කලාපයක් වශයෙන් ම පවතී. එබැවින් එයට අවිනිර්භෝග රූපය යි කියනු ලැබේ. සෙසු විස්ස විනිර්භෝග රූප ය. වෙන් කළ හැකි බැවිනි.

ප්‍රශ්න.

1. රූප එකවිධයයි කෙසේ කිය හැකි ද? අහේතුක සප්පච්චය සංඛත අප්පහාතබ්බ විස්තර කරනු.
2. ද්වාර රූප ඉන්ද්‍රිය රූප මේ ය යි දක්වනු.
3. සොළොස් සූක්‍ෂම රූප දක්වනු.
4. උපාදින්න රූප හා අනුපාදින්න රූප දක්වනු. කුමක් හෙයින් උපාදින්න ය යි කියනු ලැබේ ද?
5. අවිනිර්භෝග රූප දක්වනු.

## 8. රූප සමුට්ඨාන.

යට පාඩමින් රූප විභාගය දක්වන ලද්දේ ය. මෙහි රූප සමුට්ඨානය දක්වනු ලැබේ. රූප සමුට්ඨාන නම් රූප හට ගැන්මේ හේතු ය.

**(අ) කර්ම, (ආ) චිත්ත, (ඉ) ඍතු (ඊ) ආහාරය යි රූප සමුට්ඨාන සතරෙකි. (අ) කර්ම** නම් චේතනා ය. එය වනාහි පට්ඨානයෙන් නා නා ක්‍ෂණික කර්ම ප්‍රත්‍යය යි වදාළේ ය. **"නානාක්ඛණිකා කුසලාකුසල චෙතනා විපාකා නං ඛන්ධානං කටත්තා ච රූපානං කම්මපච්චයෙන පච්චයො"** නානාක්‍ෂණික කුශලාකුශල චේතනා විපාක ස්කන්ධයන්ට ද කර්මජ රූපයන්ට ද කර්ම ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වන්නේ ය. යනු එහි අර්ථ යි. නානාක්‍ෂණික නම් සහජාත නොවන බව යි. පූර්ව ජන්මයෙහි සිද්ධ බව ය.

(අ) රූප උපදවන කර්ම නම් අකුසල දොළොස, කාමාවචර කුසල අට, රූපාවචර කුසල පස යන පස්විස්ස ය. මොව්හු අභිසංස්කරණය කරන ලද්දෝ තමාගේම මතු ජන්ම පිළිබඳ ප්‍රතිසන්ධියෙහි පටන් එක් එක් චිත්තයක් පිළිබඳ උත්පාද ස්ථිති භඞ්ග යන අවස්ථාත්‍රයයෙහි කර්මජ රූප නිපදවති. අභිසංස්කරණය කිරීම නම් මතු විපාක හා රූප ලැබෙන හැටියට පිළියෙල කිරීම ය. කර්මජ රූප මතු දැක්වේ. චිත්තයන්ට විනා රූපයන්ට විපාක ව්‍යවහාරය නො ලැබේ. කර්මයෙන් හටගන්නා රූපයන්ට කර්මජ රූපයයි ද කටත්තා රූපය යි ද කියනු ලැබේ. චිත්තයන්ගේ උත්පාද ක්‍ෂණයෙහි පමණක් කර්මජ රූප උපදිති. ස්ථිති භඞ්ගක්‍ෂණයන්හි නූපදිතියි ඇතැම් ආචාර්යවරයෝ කියත්. අරූපාවචර කුසල රූප නූපදවන්නේ ය. රූප විරාගය පිණිස ම වඩන ලද බැවිනි.

(ආ) චිත්ත නම් සසම්ප්‍රයුක්ත සිත් ය. "**හෙතු හෙතු සම්ප්‍රයුක්තක නං ධම්මානං තං සමුට්ඨානානංච රූපානං හේතු පච්චයෙන පච්චයො**" යනු පට්ඨාන පාළි යි. හේතු හේතු සම්ප්‍රයුක්ත ධර්මයන්ට ද තත් සමුට්ඨාන රූපයන්ට ද හේතු ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ යනු එහි අර්ථ යි. මෙයින් සම්ප්‍රයුක්තයන්ගෙන් ද රූප උපදවන බව දත යුතු ය.

රූප උපදවන චිත්ත නම් අරූප විපාක දෙපස් විඥ්ඥාණ යන තුදුස් සිත් හැර සෙසු පන් සැත්තෑ සිත් ය. ඔව්හු ප්‍රතිසන්ධියට අනතුරු වැ ලැබෙන භවාඞ්ගයෙහි පටන් එක් එක් චිත්තයාගේ උත්පාදක්‍ෂණයෙහි චිත්තජ රූප උපදවන්නේය. චිත්තයෝ ස්ථිති භඞ්ග ක්‍ෂණයන්හි රූප උපදවන්නට අසමර්ථ වෙති. චිත්තජ රූප මතු දැක්වේ. අරූප විපාක සිත් රූප නූපදවන්නේ අරූප භූමි බැවිනි. එතෙක් ද? එහිදී උපදින සසාළිස් සිත් ම රූප නූපදවයි. ප්‍රතිසන්ධියෙහි රූප නැති බැවින් රූප බීජයාගේ ම අවිද්‍යමානත්‍වය ඊට හේතු යි. දෙපස් විඥ්ඥාණ රූප නූපදවන්නේ එහි ධ්‍යානාඞ්ග නො යෙදෙන බැවිනි. ධ්‍යානාඞ්ගයො රූප ඉපදවීමෙහි විශේෂ හේතුහු යි.

තවද පසළොස් කාම රූප ප්‍රතිසන්ධි සිත් ද ක්‍ෂීණාශ්‍රවයන්ගේ චුති සිත ද රූප නූපදවයි. එසේ වුව ද ඔව්හු භවඞ්ග වශයෙන් ද චුති වශයෙන් ද පවත්නා විට රූප උපදවන බැවින් මෙහි නො හැර ගන්නා ලදැයි දත යුතු. ප්‍රතිසන්ධි සිත් රූප නූපදවන්නේ වස්තු දුර්වලත්වයෙනි. ඇතැම්හු සියල්ලන්ගේ ම චුති සිත් රූප නූපදවන්නේ ය යි කියත්.

යට දැක්වුණු පන්සැත්තෑ සිත් අතුරෙන් අභිඥාද්වය හැර සවිසි වැදැරුම් අර්පණා ජවන් රූප උපදවනු පමණක් නොවේ. ඉරියව්වලට ද උපස්ථම්භනය කරන්නේ ය. මෙහි ඉරියව් වශයෙන් ගත යුත්තේ ගමන හැර සෙසු සිටුම්, හිඳුම්, නිදුම්ය යි කියනු ලැබේ. ගමන විඥ්ඥත්තියෙහි ඇතුළත් බැවිනි. අර්පණා ජවන් විඥ්ඥත්ති නූපදවන්නේය.

වොත්ථපන කාමාවචර ජවන අභිඥා යන විඥ්ඥත්ති ද උපදවන්නේ ය. වොත්ථපන නම් මනොද්වාරාවර්ජන යි. කාමාවචර ජවන නම් අකුසල් දොළොස කාමාවචර කුසල අට මහා ක්‍රියා අට හා හසිතුප්පාද යි. අභිඥා නම් පඤ්චමජ්ඣානකුසල හා එම ක්‍රියා යි විඥ්ඥත්ති නම් කාය වචී විඥ්ඥත්ති යි.

සෝමනස්ස ජවන තෙළෙස සිනා ද උපදවන්නේ ය. සෝමනස්ස ජවන් තෙළෙස නම් ලෝභ මූලික සෝමනස්ස සහගත අකුශල සතර ය. සෝමනස්ස සහගත කාමාවචර කුසල සතර ය. එසේ ම මහා ක්‍රියා සතර ය, හසිතුප්පාද ය යන මොහු යි. එයින් කුසලාකුසල අටින් පෘථග්ජනයෝ ද, දිට්ඨිවිප්පයුත්ත අකුසල දෙකින් හා සෝමනස්ස කුසල සතරින් ශෛක්‍ෂයෝ ද ක්‍රියා පසින් රහත්හු ද සිනාසෙති. ඉනිදු හසිතුප්පාදය අනෞදාරිකාරම්මණයෙහි ය.

(ඉ) ඍතු නම් ශීත උෂ්ණ සංඛ්‍යාත තේජෝ ධාතු ය. එය ස්ථිති ප්‍රාප්ත වූයේ අධ්‍යාත්ම බාහිර දෙක්හි ම සුදුසු පරිදි රූප උපදවන්නේ ය. ස්ථිති ප්‍රාප්ත නම් උත්පාද භඞ්ගාවස්ථානයෙහි නො වැ ස්ථිති අවස්ථායෙහි ම තේජෝධාතුව රූප උපදවන බව කී නියා ය. සුදුසු පරිදි නම් ලැබෙන පරිදි අජ්ඣත්තික සන්තානයෙහි උතුජ කලාප සතර ම ලැබේ. බාහිරයෙහි සුද්දට්ඨක සද්දනවක දෙක ලැබේ. උතුර රූප හා උතුජ රූප කලාප මතු දැක්වේ.

(ඊ) ආහාර නම් ඔජා ය. ඒ ඔජා සංඛ්‍යාත ආහාර අනුභව කරන කාලයෙහි තැන්පත් වූයේ ම ආහාර සමුට්ඨාන රූප උපදවන්නේ ය. තැන්පත් වූයේය යි කියන ලද්දේ ස්ථිති අවස්ථාව සඳහා ය.

ඔජා වනාහි කර්මසමුත්‍ථානාදි වශයෙන් චතුර්විධ වූ අධ්‍යාත්මික ඔජා ය, අසිත පීත ඛායිත සායිත වශයෙන් චාතුර්විධ වූ බාහිරගත ඔජාය යි ද්විවිධ වේ. ඒ ද්විවිධ ඔජා ම සංසර්ග වශයෙන් ලබන ලද උපස්ථම්භ ඇත්තේ ම ආහාරජ රූප උපදවන බැවින් අනුභව කරන කාලයෙහි ය යි කියන ලදී. මෙහි අනුභව කරන කාලයෙහි ය යි කියන ලද්දේ බලවත් අවස්ථාව ගෙනැ ය මෑණියන් වැළඳූ ආහාරය ගැබ හුන් දරුවාගේ ශරීරයෙහි පැතිර රූප උපදවන්නේය. එසේ ම ඇඟ ගැල්වූ ආහාර ද රූප උපදවන්නේ ය. ආහාරය මුඛයෙහි තුබූ ඇසිල්ලෙහි ම රූප අටක් උපදවන බව ද සැරීමේ දී එක් එක් බත්තුලකින් රූප අට අට උපදින බව ද කියා තිබේ.

**කර්මජාදි චතුර්විධ රූප සංඛ්‍යාව මෙසේ ය.**

යට දැක්වුණු අටවිසවි රූප අතුරෙන් **හදය ඉන්ද්‍රිය රූපයෝ කර්මජයෝ** මැ ය. හදය නම් හෘදය වස්තු රූපය, ඉන්ද්‍රිය නම් චක්‍ෂුරාදි පංචප්‍රසාද හා ස්ත්‍රීභාව පුරුෂභාව හා ජීවිතින්ද්‍රිය. මේ රූප නවය කර්ම හේතුයෙන් ම හටගන්නේය. චිත්ත ඍතු ආහාර හේතුයෙන් භව නොගන්නේ ය. සිත ප්‍රසන්න කල්හි ඉන්ද්‍රියයන්ගේ ප්‍රසන්නත්‍වය සිද්ධවිය හැකිය. එහෙත් ඉන්ද්‍රිය චිත්තජ නො වේ. කර්මජ රූප උපුල් පියුම් මෙන් ද කර්මය එහි බීජ මෙන් ද චිත්ත ඍතු ආහාර ජල හා මඩ ආදිය මෙන් ද සැලකිය යුතුය. එකක් ප්‍රසන්න කල්හි අන්‍යයන්ගේ ද ප්‍රසන්නත්වය සිද්ධ වේ. සහචරිත බැවිනි.

විඥ්ඥත්ති ද්වය චිත්තජ ම ය. විඥ්ඥත්ති ද්වය නම් කාය විඥ්ඥත්ති හා වචී විඥ්ඥත්ති ය. එය චිත්තයෙන් ම හට ගනී. කර්මයෙන් හෝ ඍතුයෙන් හෝ ආහාරයෙන් හෝ නො හට ගනී.

ශබ්ද චිත්තජ හා ඍතුජ ය. ඉනි දු සවිඥ්ඥාණක ශබ්ද චිත්තයෙන් ද අවිඥ්ඥාණක මෙඝ ශබ්දාදිය ඍතුයෙන් ද හටගන්නේ ය යි දත යුතු යි. නිධිකණ්ඩ සූත්‍රයෙහි **"සුවණ්ණතා සුස්සරතා"** යි දාන ඵල වශයෙන් සුස්වරත්වය වදාළේ ය. එහෙත් එය කර්මජ නොවේ.

**ලහුතා මුදුතා කම්මඤ්ඤතා යන රූපත්‍රය ඍතුයෙන් ද චිත්තයෙන් ද ආහාරයෙන් ද හටගන්නේ ය.** කර්මයෙන් නො හට ගන්නේ ය.

**අවිනිර්භෝග රූප හා ආකාශ ධාතුව කර්මාදි සතරින්ම හටගන්නේ ය.** අවිනිර්භෝග රූප නම් පඨවි, ආපො, තේජො, වායු, වර්ණ, ගන්ධ, රස, ඕජා යන අට යි. මේ රූප නවය චතුජයි.

ලක්‍ෂණ රූප කර්මාදීන් අතුරෙන් කුමකිනුදු නො හට ගන්නේ ය. ලක්‍ෂණ රූප නම් උපචය සන්තති ජරතා අනිච්චතා යි. මෙසේ ගත් කල්හි කර්මජ රූප සියල්ල අට ලොසෙකි. එනම් ඒකාන්ත කර්මජ වූ හදය ඉන්ද්‍රිය රූප නවය හා චතුජ වූ අවිනිර්භෝග ආකාශ යන නවය යි. පෘථිවි, අප්, තේජස්, වායු, වණ්ණ, ගන්ධ, රස, ඕජා, ආකාශ, චක්ඛු, සොත, ඝාණ, ජිව්හා, කාය, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, ජීවිතින්ද්‍රිය, හදයවත්‍ථු යන අටලොස් රූප කර්මජය යි කී නියා යි.

චිත්තජ රූප සියල්ල පසළොසෙකි. එනම් ඒකාන්ත චිත්තජ වූ විඥ්ඥත්තිද්වය හා ශබ්ද, ලහුතාදි තුන, අවිනිර්භෝග ආකාශ යන මොහු යි. පඨවි, ආපො, තේජො, වායු, වණ්ණ, ගන්ධ, රස, ඕජා, ආකාශ, කාය විඥ්ඥත්ති, වචී විඥ්ඥත්ති, ශබ්ද, ලහුතා, මුදුතා, කම්මඤ්ඤතා යන රූප පසළොස චිත්තජ රූපය යි කී නියා යි.

ඍතුජ රූප සියල්ල තෙළෙසකි. එනම් ශබ්දය, ලහුතාදි ත්‍රිකය, අවිනිර්භෝග රූප ආකාශය යන මොහු යි. පඨවි, ආපො, තේජො, වායු, වණ්ණ, ගන්ධ, රස, ඕජා, ආකාශ ශබ්ද, ලහුතා, මුදුතා, කම්මඤ්ඤතා යන තෙළෙස ඍතුජ රූපය යි කී නියා යි.

ආහාරජ රූප සියල්ල දොළොසෙකි. එනම් ලහුතාදී ත්‍රිකය, අවිනිර්භෝග, ආකාශ යන මොහු යි. පඨවි, ආපෝ, තේජො, වායො, වණ්ණ, ගන්ධ, රස, ඕජා, ආකාශ ලහුතා, මුදුතා, කම්මඤ්ඤතා යන දොළොස ආහාරජ රූපය යි කී නියා යි.

**"අට්ඨාරස පණ්ණරස තෙරස ද්වාදසාති ච**
**කම්ම චිත්තොතුකාහාර ජාති හොන්තී යථාක්කමං".**

පිළිවෙලින් කර්මජ රූප අටළොසෙකි. චිත්තජ රූප පසළොසෙකි. ඍතුජ රූප තෙළෙසකි. ආහාර රූප දොළොසෙකි. යනු එහි භාව යි.

**"ජායමානාදිරූපානං සභාවත්තා හි කෙවලං**
**ලක්ඛණානි න ජායන්ති කෙහි චිති පකාසිතං"**

උච්චය, සන්තති, ජරතා, අනිච්චතා යන සතර ජායමානාදි රූපයන්ගේ ස්වභාව හෙයින් කුමකිනිදු නො හට ගනී ය යි කියන ලදි. ජායමාන නම් උපදනා.

**ප්‍රශ්න.**

1. රූප සමුට්ඨාන කෙතෙක් ද? කවරහු ද? එකක් එකක් බැගින් පැහැදිලි කරනු.
2. කම්මසමුට්ඨාන කෙතෙක් ද? කවරහු ද?
3. චිත්තසමුට්ඨාන රූප කෙතෙක් ද? කවරහු ද?
4. ඍතු, ආහාර සමුට්ඨාන රූප කෙතෙක් කෙතෙක් ද? කවර කවරහු ද?
5. එකජ, ද්විජ, ත්‍රිජ, චතුජ, අජ, රූප බෙදා දක්වනු.

# 9. රූප කලාප.

යට පාඩමින් රූප සමුට්ඨාන දක්වන ලදි. මෙහි රූප කලාප දක්වනු ලැබේ.

රූප කලාප නම් එක් වැ ම උපදින-එක් වැ ම නිරුද්ධ වන-එක ම නිශ්‍රය ඇති එක් වැ ම පවතින රූප සමූහයෝ ය. ඔව්හු මුළුල්ල එක්විස්සෙකි. ඉන් නවයෙක් කම්ම සමුට්ඨාන කලාප ය. සයෙක් චිත්ත සමුට්ඨාන කලාප ය. සතරෙක් ඍතු සමුට්ඨාන කලාප ය. දෙකෙක් ආහාර සමුටඨාන කලාප යි.

**කම්ම සමුට්ඨාන රූප කලාප නවය.**
චක්ඛුදසක, සෝතදසක, ඝාණදසක, ජිව්හාදසක, කායදසක, ඉත්ථිභාව දසක, පුම්භාව දසක, වත්ථු දසක, ජීවිත නවක යන මේ නවය කම්මසමුට්ඨාන කලාප යි. මොව්හු කර්මයෙන් ම හටගන්නෝ ය. කර්මජ රූප අටළොස කලාප වශයෙන් නවයකට සංග්‍රහ වූ බව දත යුතු යි.

චක්ෂුයෙන් උපලක්ෂිත වූ හෝ චක්ෂුව ප්‍රධාන කොට ඇත්තා වූ හෝ දසය චක්ඛු දසක ය යි. චක්ෂුඃ ප්‍රසාදය, ජීවිතින්ද්‍රිය, අවිනිර්භෝග යන මේ දසය චක්ඛුදසක ය. මේ දසය උපදින්නේ ද එකට ය. නිරුද්ධ වන්නේ ද එකට ය. මොවුන්ගේ නිඃශ්‍රය ද එකෙක් ම ය. පැවැත්ම ද එක්වැ ම ය. එහෙයින් මේ **චක්ඛු දසක කලාපයයි කියනු ලැබේ**. සෙස්සෙහි දු ක්‍රමය මෙසේ ය.

සොතප්පසාද, ජීවිතින්‍ද්‍රිය, අවිනිර්භෝග-සොත දසක ය. ඝාණප්පසාද, ජීවිතින්‍ද්‍රිය, අවිනිර්භෝග-ඝාණ දසකය. ජිව්හාප්පසාද, ජීවිතින්‍ද්‍රිය අවිනිර්භෝග-ජිව්හා දසකය. කායප්පසාද ජීවිතින්‍ද්‍රිය, අවිනිර්භෝග-කාය දසකය, ස්ත්‍රීභාව, ජීවිතින්‍ද්‍රිය අවිනිර්භෝග ඉත්ථිභාව දසකය, පුම්භාව, ජීවිතින්‍ද්‍රිය, අවිනිර්භෝග පුම්භාව දසකනය, හදයවත්‍ථු ජීවිතින්‍ද්‍රිය, අවිනිර්භෝග-වත්‍ථු දසකය, ජීවිතින්‍ද්‍රිය හා අවිනිර්භෝග-ජීවිත නවකයයි. මේ ලැබෙන සැටි මතු දැක්වේ.

### චිත්ත සමුට්ඨාන රූප කලාප සය.

සුද්ධට්ඨකය, කායවිඤ්ඤත්ති නවකය, වචීවිඤ්ඤත්ති දසකය, ලහුතාදෙකා දසකය, කායවිඤ්ඤත්ති ලහුතාදි ද්වාදසකය, වචීවිඤ්ඤත්ති සද්දලහුතාදි තෙරසකය යන සය චිත්ත සමුට්ඨාන කලාපයෝ ය. මොහු සිතින් නිපදෙත්.

සුද්ධට්ඨක නම් අවිනිර්භෝග රූපය. එම කාය විඤ්ඤත්තියා හා යුක්තවූයේ කාය විඤ්ඤත්ති නවකය වේ. වචීවිඤ්ඤත්ති ශබ්ද හා යුක්ත වූයේ වචීවිඤ්ඤත්ති දසකය වේ. ලහුතා මුදුතා කම්මඤ්ඤතා හා යුක්ත වූයේ ලහුතාදෙකා දසකය වේ. කාය විඤ්ඤත්ති ලහුතා මුදුතා කම්මඤ්ඤතා හා යුක්ත වූයේ කාය විඤ්ඤත්ති ලහුතාදි ද්වාදසකය වේ. වචීවිඤ්ඤත්ති සද්ද ලහුතා මුදුතා කම්මඤ්ඤතා හා යුක්තවූයේ වචීවිඤ්ඤත්ති සද්දලහුතාදි තෙරසකය වේ. යම් තැනෙක වචීවිඤ්ඤත්තිය ඇත්තේ නම් එහි ශබ්දය ද ඇත්තේ ය.

විතක්ක විප්ඵාර ශබ්දය වචීවිඤ්ඤත්ති රහිත ශබ්ද නවකයෙකැ යි ඇතැම් තැනෙක දක්වන ලදුවත් එය ආචාර්යයන් විසින් ප්‍රතික්ෂේප කරන ලදි.

විශුද්ධිමාර්ගයෙහි ද ශබ්දනවකයක් දක්වනලද හෙයින් සුද්ධට්ඨක, සද්දනවක, කායවිඤ්ඤත්ති නවක, වචීවිඤ්ඤත්ති දසක, ලහුතා දෙකාදසක, සද්ද ලහුතාදි ද්වාදසක, කාය විඤ්ඤත්ති ලහුතාදි ද්වාදසක, වචීවිඤ්ඤත්ති සද්දලහුතාදි තෙරසකය යි චිත්තජ රූපකලාප අටෙක් ඇතැම් ටීකායෙක දක්වන ලද්දේ ය.

### ඍතුසමුට්ඨාන රූප කලාප සතර

සුද්ධට්ඨක, සද්දනවක, ලහුතා දෙකාදසක, සද්දලහුතාදි ද්වාදසකය යි ඍතුසමුට්ඨාන රූපකලාප සතරෙකි. මොව්හු ඍතුයෙන් හටගන්නෝ ය.

සුද්ධට්ඨක නම් අවිනිර්භෝග රූප අට ය. එම සද්ද සමග යුක්ත වූයේ සද්දනවකය. ලහුතා මුදුතා කම්මඤ්ඤතා සමග යුක්ත වූයේ ලහුතා දෙකාදසකය. ශබ්ද ලහුතා මුදුතා කම්මඤ්ඤතා සමග යුක්ත වූයේ සද්ද ලහුතාදි ද්වාදසකය. මෙහි ශබ්ද ඍතුජ යි.

### ආහාර සමුට්ඨාන රූප කලාප දෙක.

සුද්ධට්ඨක, ලහුතා දෙකාදසකය යි ආහාර සමුට්ඨාන කලාප දෙකෙකි. මේ දෙක ආහාර ප්‍රත්‍යයෙන් හටගන්නේ ය.

සුද්ධට්ඨක, ලහුතා දෙකාදසකය යි ආහාර සමුට්ඨාන කලාප දෙකෙකි. මේ දෙක ආහාර ප්‍රත්‍යයයෙන් හටගන්නේ ය.

සුද්ධට්ඨක නම් අවිනිර්භෝග රූපය එම ලහුතා මුදුතා කම්මඤ්ඤතා සමග යුක්ත වූයේ ලහුතා දෙකාදසකය යි.

මේ එක්විසි රූප කලාප අතුරෙන් සුද්ධට්ඨක සද්ද නවක යන උතුසමුට්ඨාන කලාප දෙක බාහිරයෙහි ද ලැබේ. සෙසු සියල්ල අධ්‍යාත්මයෙහි ය.

**"කම්ම චිත්තොතුකාහාර සමුට්ඨානා යථාක්කමං,**
**නවච්ඡ චතුරො ද්වෙ ති කලාපා එකවීසති."**

කර්මජ රූප කලාප නවයෙකි. චිත්තජ රූප කලාප සයෙකි. උතුජරූප කලාප සතරෙකි. ආහාරජ රූප කලාප දෙකෙකි. මෙසේ මුළුල්ල එක්විස්ස ය.

ආකාශ ධාතුව කලාපයන්ගේ පරිච්ඡේද මාත්‍ර බැවින් කිසි රූප කලාපයෙක අඞ්ගත්වයට නොපැමිණේ. උපචයාදී ලක්‍ෂණ රූප ද රූපයන්ගේ උත්පාදාදී ලක්‍ෂණ මාත්‍ර බැවින් විඤ්ඤත්ති මෙන් රූප කලාප පිළිබඳ අඞ්ග නොවී ය.

කියන ලද මැ යි.

**"කලාපානං පරිච්ඡෙද ලක්ඛණත්තා විචක්ඛණා**
**න කලාපඞ්ගමිච්චාහු ආකාසං ලක්ඛණානිච."**

අර්ථ සුගම යි.

**ප්‍රශ්න.**

1. රූප කලාප යන්නෙහි අර්ථය පැහැදිලි කරනු. ඔව්හු සියල්ල කෙතෙක් ද?
2. කර්මජ රූප කලාප කෙතෙක් ද? කවරහු ද?
3. චිත්තජ රූප කලාප විස්තර කරනු.
4. ඍතුජ, ආහාරජ රූප කලාප දක්වනු.
5. කලාපාඞ්ග නො වන රූප දක්වා එයට හේතු දක්වනු. බාහිරයෙහි කවර කවර රූප කලාප ඇත්තේ ද?

## 10. රූප ප්‍රවෘත්ති ක්‍රම.

යට පාඩමෙන් රූප කලාප දක්වන ලද්දේ ය. මෙහි රූප පවත්නා පිළිවෙල දක්වනු ලැබේ.

කාම ලෝකය රූප ලෝකය යි රූපී ලෝක දෙ වැදෑරුම්. කාම ලෝක නම් සතර අපාය මිනිස් ලොව දෙව්ලොව යන එකොළොස් කාම භූමි යි. රූප ලෝක නම් බ්‍රහ්මපාරිසජ්ජාදි සොළොස් බ්‍රහ්ම භූමි යි. අරූපලෝකයෙහි කැලම රූප නැත්තේ ය.

**අණ්ඩජ, ජලාබුජ, සංසෙදජ, ඔපපාතිකය** යි සත්ත්වයන් ඇතිවීමේ ක්‍රම සතරෙකි. මොවුනට අණ්ඩජයොනි යනාදී වශයෙන් යොනි ය යි කියනු ලැබේ.

වදාළේ මැ යි, මහා සීහනාද සූත්‍රයෙහි: **"චතස්සොබො ඉමා සාරිපුත්ත යොනිසො කතමා චතස්සො! අණ්ඩජායොනි, ජලාබුජායොනි, සංසෙදජායොනි, ඔපපාතිකායොනි"** යි අණ්ඩයෙන් - බිජුවටින් උපදින්නෝ අණ්ඩජයෝ ය. පක්ෂි සර්පාදීහු යි. **"යෙ බො තෙ සාරිපුත්ත සත්තා අණ්ඩකොසං අභිනිබ්භිජ්ජ අභිනිබ්භිජ්ජ ජායන්ති අයං වුච්චති සාරිපුත්ත අණ්ඩජායොනි"** ශාරිපුත්‍රය, යම් සත්ත්ව කෙනෙක් අණ්ඩකෝෂය බිඳගෙනැ උපදිත් ද එය අණ්ඩජ යොනිය යි කියනු ලැබේ. යනු එහි අර්ථ යි. ජලාබුයෙන් උපදින්නෝ ජලාබුජයෝ ය. මනුෂ්‍යාදීහු යි. **"යෙ බො පන තෙ සාරිපුත්ත සත්තා වත්ථිකොසං අභිනිබ්භිජ්ජ අභිනිබ්භිජ්ජ ජායන්ති අයං වුච්චති සාරිපුත්ත ජලාබුජායොනි"** ශාරිපුත්‍රය, යම් සත්ත්ව කෙනෙක් වස්තිකෝෂය බිඳැ ගෙනැ උපදිද්ද එය ජලාබුජ යෝනිය යි. **"ජරං ජීරණං භෙදං යාති උපෙතීති ජලාබු. ජලං වුච්චති කලලං තං ආවුණාති පටිච්ඡාදෙතීති ජලාබු"** යනු හෙයින් ජීර්ණයට භෙදයට යන්නේ හෝ ජල සංඛ්‍යාත කලල රූපය වසන්නේ හෝ ජලාබු නම් වේ. ලෝකව්‍යවහාරයෙහි වැදැමසයයි කියනු ලැබේ. පෙළෙහි වස්තිකෝෂයයි කියනු ලදි. සංසේදයෙන් උපදින්නෝ සංසේදජයෝ ය. මැසි, මදුරු ආදීහු ය. **"යෙ බො තෙ සාරිපුත්ත සත්තා පූතිමච්ඡෙ වා ජායන්ති පූති කුණපෙ වා පූතිකුම්මාසෙ වා චන්‍දනිකාය වා ඔලිගල්ලෙ වා ජායන්ති අයං වුච්චති සාරිපුත්ත සංසෙදජා යොනි"** ශාරිපුත්‍රය, යම් සත්ත්ව කෙනෙක් කුණු මසෙහි හෝ කුණු මිනියෙහි හෝ කුණු බොජුන්හි හෝ ගම්දොර ගවරවල හෝ උපදිත් ද එය සංසෙදජයොනි යි. සංසේදජ නම් දියසීරාව ඇති තෙත් ස්ථාන යි. අපිරිසිදු තැන් වශයෙන් කුණු මස් ආදියද පිරිසිදු තැන් වශයෙන් පියුම් මල් ඵල ආදිය ද දත යුතු. මේ ත්‍රිවිධාකාරයෙන් ම වෙනස් වැ පරිපූර්ණාඞ්ග ප්‍රත්‍යඞ්ග ඇති වැ පහළ වන්නෝ ඔපපාතිකයෝ ය. දේවාදීහු යි. **"දෙවා නෙරයිකා එකච්චෙ ච මනුස්සා එකච්චෙ ච විනිපාතිකා අයං වුච්චති සාරිපුත්ත ඔපපාතිකා යොනි"** ශාරිපුත්‍රය, දෙවියෝ ද නෙරයිකයෝ ද ඇතැම් මනුෂ්‍යයෝ ද ඇතැම් විනිපාතිකයෝ ද ඔපපාතිකයෝනි යි කියනු ලැබේ. මෙහි දේව නාමයෙන් බ්‍රහ්මයෝ ද ගැනෙති. නෙරයික නිජ්ඣාමපෙත දේව බ්‍රහ්ම ඔපපාතික ය. තිරශ්චීන සෙසු ප්‍රේත අසුර මනුෂ්‍ය භූමිෂ්ඨදෙව සතරින් ම උපදිත්.

පරිපූර්ණ ඉන්ද්‍රිය ඇත්තෝය. අපරිපූර්ණ ඉන්ද්‍රිය ඇත්තෝ යයි ද සත්ත්වයෝ දෙ වැදෑරුම් වෙති. ඉන්ද්‍රිය සම්පූර්ණ වූවෝ පරිපූර්ණ ඉන්ද්‍රිය ඇත්තෝය. ඌන ඉන්ද්‍රිය ඇත්තෝ ද පරිපූර්ණ ඉන්ද්‍රිය ඇත්තෝ ය.

සත්ත්වයන්ගේ රූප ප්‍රවෘත්තිය ප්‍රතිසන්ධික්‍රමය ප්‍රවෘත්ති ක්‍රමය යි ද දෙ වැදෑරුම් වේ. උත්පත්තික්ෂණයෙහි රූප ප්‍රවෘත්තිය ප්‍රතිසන්ධි ක්‍රමය යි. පවත්නා කාලයෙහි රූප ප්‍රවෘත්තිය ප්‍රවෘත්ති ක්‍රමය යි. මතු දැක්වෙන පිළිවෙලින් එහි විශේෂ විභාග දත යුතු.

**යට දක්වුණු අටවිසි රූප ම වනාහි කාම ලෝකයෙහි සුදුසු පරිදි ප්‍රවෘත්ති කාලයෙහි ලැබෙන්නේ ය.**

ප්‍රවෘත්ති වශයෙන් කාම ලෝකයෙහි නොලැබෙන රූපයෙක් නැති. එසේ වුව ද යම් යම් සත්ත්වයන් කෙරෙහි එය අඩු වැඩි විය හැකිය. ඒ එසේමැ යි. ස්ත්‍රීන්ට පුරුෂ භාව රූපය නැත්තේ ය. පුරුෂයන්ට ස්ත්‍රීභාව රූපය නැත්තේ ය. නපුංසකයන්ට මේ දෙක ම නැත්තේ ය. අන්ධාදීන්ට චක්ඛුප්පසාදාදිය නැත්තේ ය. සුදුසු පරිදි ය කීයේ එහෙයිනි. සාමාන්‍යයෙන් බලත් හොත් කාම ලෝකයෙහි ප්‍රවෘත්ති වශයෙන් සියලු රූප ම ලැබේ.

ප්‍රතිසන්ධි කාලයෙහි වනාහි සංසේදජයන්ට හා ඕපපාතිකයන්ට චක්ඛු සෝත ඝාණ ජිව්හා කාය භාව වත්ථු දසක සංඛ්‍යාත සප්ත දසකයෝ උත්කෘෂ්ට වශයෙන් ලැබෙති. ඕමක වශයෙන් චක්ඛු සෝත ඝාණ භාව දසක ඇතැම්විට නො ලැබේ.

සංසේදජයෝ ප්‍රතිසන්ධියෙහි පරිපූර්ණ ඉන්ද්‍රිය ඇතිවැ උපදිති. එහෙත් ඔවුන්ගේ අඞ්ග ප්‍රත්‍යඞ්ග පසුවැ ක්‍රමයෙන් වැඩෙන්නේ ය. ඕපපාතිකයෝ ද පරිපූර්ණ ඉන්ද්‍රිය ඇති වැ උපදිති. එහෙත් ඔවුන්ගේ අඞ්ග ප්‍රත්‍යඞ්ග පසු වැ වැඩීමකට නො පැමිණේ. සොළොස් අටළොස් හැවිරිදි ශරීර ප්‍රමාණයෙන් ම දෙවියෝ ඕපපාතික වෙති. අපායාදියෙහි දු වැඩුණු අඞ්ග ප්‍රත්‍යඞ්ග ඇති වැ ම උපදිති. මතු වැඩීමෙක් නැති.

"ඕමක වශයෙන් චක්ඛුදසකාදිය ඇතැම් විට නො ලැබෙන්නේය" යි කීයේ ජාත්‍යන්ධ ජාතිබධිර ජාත්‍යඝ්‍රාණ නපුංසක ආදී කල්පිකයන්ගේ වශයෙනි. සුගතියෙහි මහානුභාව ඇති කර්මයෙන් උපදනා ඕපපාතිකයන්ට ඉන්ද්‍රිය විපරීතයෙක් නොවන්නේය. එබැවින් සුගතියෙහි චක්ඛු සෝත ඝාණ නො ලැබීම සංසේදජයන්ටය යි දත යුතු. එසේම සුගතියෙහි භාවරූපයාගේ නොලැබීම කියන ලද්දේ ආදී කල්පිකයන්ගේ වශයෙනි. දුර්ගතියෙහි චක්ඛු සෝත භාව රූපයන්ගේ නො ලැබීම සංසේදජ ඕපපාතික දෙපක්ෂයට ම වන්නේ ය. එයිනුදු ඝ්‍රාණය නොලැබීම සංසේදජයන්ට ය. "**අඝාණකො ඕපපාතිකො නත්ථි**" ඝ්‍රාණ රහිත ඕපපාතිකයෙක් නැතැ යි. **යමක** අටුවායෙහි දක්වන ලදි. ජිව්හා විකලතාවෙක් කිසිවකුට නොවන්නේ යයි ටීකාවෙක දක්වා තිබේ. මෙසෙයින් කලාප හානිවන පරිදි දත යුතු.

අණ්ඩජ ජලාබුජ සංඛ්‍යාත ගබ්භසෙය්‍යක සත්ත්වයන්ට ප්‍රතිසන්ධියෙහි කායදසක භාවදසක වත්‍ථුදසක සංඛ්‍යාතදසක තුන පහළ වන්නේ ය. එහි දු ඇතැම් විට අභාවක සත්ත්වයන්ගේ වශයෙන් භාව දසකය නො ලැබේ. ප්‍රවෘත්ති කාලයෙහි ඔවුන්ට ක්‍රමයෙන් චක්ඛුදසකාදිය ලැබේ.

මෙහි විස්තරය මෙසේ දත යුතු යි.

ගැබෙහි හෝනෝ ගබ්භසෙය්‍යකයයෝ ය. ඔහු නම් අණ්ඩජ ජලාබුජ සත්ත්වයෝ ය. අණ්ඩජ ජලාබුජ සත්ත්වයෝ මාතෘ කුක්ෂියෙහි පිළිසිඳ ගනිති. එසේ පිළිසිඳීම් වශයෙන් ලැබෙන රූප කාය භාව වත්‍ථු දසක ය යි කියන ලදි. නපුංසක නම් භාව දසකය නො ලැබේ. ඇතැම් තැනෙක කලල රූප ය යි දැක්වෙන්නේත් මේ ය. එය දේව නිර්මාණයෙක් හෝ මාතෘ පිතෘ නිර්මාණයෙක් හෝ නො වේ. කර්ම නිර්මාණයෙකි. ප්‍රතිසන්ධි චිත්තය කර්ම විපාකයෙකි. ඒ සමග ම පහළ වන මේ රූප තිස හෙවත් කලල රූපය කර්මජ යි. එහි ප්‍රමාණය සියුම් එළු ලෝමයක් ප්‍රසන්න තෙලෙක බහා ගසා ඇමූ කල අන්තිමට ලැබෙන බින්දු ප්‍රමාණ ය යි කියනු ලැබේ. මනුෂ්‍ය ඇසට විසය නො වන දිව්‍ය ඇසින් බලාගත යුත්තෙකි. කලල රූපය සතියක් ඉක්මීමෙන් අර්බුදාවස්ථාවට ද අර්බුද රූපය සතියක් ඉක්මීමෙන් පෙසි අවස්ථාවට ද පෙසි රූපය සතියක් ඉක්මීමෙන් ඝනාවස්ථාවට ද ඝන රූපය සතියක් ඉක්මීමෙන් පසාඛ අවස්ථාවට ද පැමිණේ. ඉක්බිති සයවන සතියෙහි සිට කෙසාදිය සෑදෙන්නේ ය වදාළේ මැ යි.

**"පඨමං කල්ලංහොති කලලාහොති අබ්බුදං**
**අබ්බුද ජායතෙ පෙසි පොසියා නිබ්බත්තතෙ ඝනො**
**ඝනා පසාඛාජා යන්ති කෙසා ලොමා නඛාපි ච."**

මෙහි අර්බුද රූපය මස් සේදූ ජලයක් බඳුය යි ද පෙසි රූපය දියවුණු ඊයම් බින්දුවක් බඳු ය යි ද ඝන රූපය කිකිළි බිජුවක් බඳු ය යි ද පසාඛා රූපය ඇත් දෙපා හිස පිණිස වෙන් වූ පිළක පසකින් යුක්ත ය යි ද දක්වන ලද්දේ ය.

මෙසේ ක්‍රමයෙන් වඩුත් වඩුත් එකොළොස් වන සතිය අවසානයෙහි චක්ඛු දසක සොතදසක ඝාණදසක ජිව්හාදසක යන දසක සතර ද පහළ වන්නේ ය.

මෙහි කිය යුත්තෙක් ඇති. ඇතැම් ආචාර්යවරයෝ සත්වන සතියෙහි පටන් චක්ඛු දසකාදි සතර ක්‍රමයෙන් පහළ වන්නේ ය යි කියති. එයට ඇතැම් ආචාර්යවරයෝ ඉඳුරා විරුද්ධ වැ සාධක දක්වමින් ප්‍රතික්ෂේප කරති. කථා වස්තු ප්‍රකරණ අටුවායෙහි "**සෙසානි චත්තාරි සත්ත සත්තති රත්තිම්හි ජායන්ති**" සෙසු සතර සැත්තෑ සත්වන රාත්‍රියෙහි උපදීය'යි දැක්වූ බැවින් එකොළොස් වන සතිය අවසන් වූ දා රාත්‍රී චක්ඛුදසකාදි සතර පහළ වන්නේ ය යි දත යුතු. තව ද සත්වන සතියෙහි චක්ඛු දසකය ද අට වන නව වන දස වන සතියෙහි පිළිවෙලින් සෝත ඝාණ ජිව්හා දසක ද පහළ වන්නේ ය. යන ආචාර්ය මතය ද කථා

වස්තු අටුවායෙන් ප්‍රතිශිද්ධ වන බව දත යුතු. ක්‍රමයෙන් යන්නට ඇතැම්හු ‘කම්මෙන’ යි ශුද්ධ කොටැ කර්මයෙන් ය යි කියත්.

වෛද්‍යශාස්ත්‍රයෙහි කලල රූපාදීන්ගේ උත්පත්තිය පිළිබඳ දැක්වුණු ක්‍රමය මෙයට වෙනස් ය. “**තත්‍ර පඨමෙ මාසි කලලං ජායතෙ**” යනාදීන් පළමුවන මාසයෙහි **කලල** රූපය සෑදෙන බව ද දෙවන මාසයෙහි සිහිල් උණු පවන් යන මෙයින් මොනවට මුහු කරනු ලබන මහාභූතයන්ගේ ඇඩි සම්බන්ධයෙන් **ඝනය** සෑදෙන බව ද එ ද ඉදින් කිකිළි බිජුවටක් සේ පිණ්ඩයෙක් වී නම් පිරිමියෙකු වන බව ද ගැහැණියක නම් **පෙසි** වන බව ද නපුංසකයෙක් නම් අර්බුද වන බව ද තුන්වන මාසයෙහි අත් පා හිස සඳහා පිළික පසක් නැගී සියුම් අඞ්ග ප්‍රත්‍යඞ්ග විභාගය වන බව ද සතර වන මාසයෙහි අඞ්ගප්‍රත්‍යඞ්ග විභාගය ප්‍රව්‍යක්තතර වන බව ද ගර්භ හෘදය ප්‍රව්‍යක්ත වීමෙහි චේතනා ධාතුව අභිව්‍යක්ත වන බව ද සුශ්‍රුතයෙහි දක්වන ලදි.

යට දැක්වුණු පරිදි ප්‍රතිසන්ධියෙහි පටන් කර්ම සමුත්ථාන රූපයෝ ද දෙවන චිත්තයෙහි හෙවත් ප්‍රතිසන්ධියට අනතුරු වැ ලැබෙන භවඞ්ගයෙහි පටන් චිත්ත සමුට්ඨාන රූපයෝ ද ප්‍රතිසන්ධි චිත්තයාගේ ස්ථිති කාලයෙහි පටන් ඍතු සමුත්ථාන රූපයෝ ද ඔජාඵරණයෙහි පටන් ආහාර සමුට්ඨාන රූපයෝ ඇයි චතුසමුට්ඨාන රූප කලාප සන්තතිය කාමලෝකයෙහි දීප ජාලාවක් මෙන් ද සංගාශ්‍රෝතයක් මෙන් ද ආයු ඇති තාක් නො සිඳී පවත්නේ ය.

කර්ම චිත්ත ඍතු ප්‍රත්‍යයයෙන් ද ඔජාව ලැබේ. විශේෂයෙන් ගැබ හොත් දරුවාට ඔජාව ලැබෙන්නේ මෑණියන් වළඳන භෝජනයෙන් ය. සුදුසු කාලයෙහි දරුවාගේ නැබෙන් නැඟුණු උපුල් දණ්ඩක් බඳු නාළයෙන් මෑණියන් වළඳන ආහාරයාගේ රසය දරුවාට ඔජාව දෙන්නේ ය. සංසෙදජ ඔපපාතිකයෝ ලැබුණු යම් කිසිවක් හෝ තමාගේ ම ඛෙලය හෝ ආහාර කොටැ ගෙනැ ඔජාව ලබත්.

මැරෙන කල චුති චිත්තයට මොබ සතළොස් වන චිත්තයාගේ ස්ථිති කාලය පටන් කර්මජ රූපයන්ගේ උපැද්ම නවතී. පළමු ඉපැද තුබුණු කර්මජ රූප ද චුති චිත්තය සමග ම නිරුද්ධ වන්නේ ය. චුති චිත්තයෙන් පසු සොළොස් වන චිත්තක්‍ෂණවස්ථායෙහි පමණ චිත්තජ රූප සන්තතිය ද ආහාරජ රූප සන්තතිය ද සිඳී යන්නේ ය. ඔවුන් අනුපාදින්නක සන්තානයෙහි නූපදනා බැවිනි. ඉක්බිති මෘත කලෙබර ය යි කියනු ලබන උතුසමුට්ඨාන රූප පරම්පරාව පවත්නේ ය. මළ සත්ත්වයනට වැළිත් භවාන්තරගත ප්‍රතිසන්ධියෙහි පටන් පෙර කී සේ රූප සන්තතිය වන්නේ ය.

**ප්‍රශ්න.**

1. චතුර්විධ යෝනි විස්තර කරනු.
2. සංසේදජ ඔපපාතිකයන්ගේ ප්‍රතිසන්ධියෙහි උත්කෘෂ්ට වශයෙන් ලැබෙන සප්තදශකය දක්වනු. ඔමක වශයෙන් කිමෙක් නො ලැබේ ද?

3. අණ්ඩජ ජලාබුජයන්ගේ ප්‍රතිසන්ධියෙහි ලැබෙන දසක තුන දක්වනු.
4. චක්ඛුදසකාදීන් පහළවීමෙහි අවස්ථාව හා මත භේද දක්වනු.
5. මරණාසන්න කාලයෙහි රූප නැති වන සැටි දක්වනු. මළ මිනියක පවත්නේ කවර රූප ද?

## 11. රූප ප්‍රවෘත්ති ක්‍රම (දෙවන කොටස.)

කාම ලෝකයෙහි රූප ප්‍රවෘත්තිය යට පාඩමින් දක්වන ලද්දේය. මෙහි රූප ලොකයෙහි රූප ප්‍රවෘත්තිය දක්වනු ලැබේ.

රූප ලෝකයෙහි ඝාණ දසක ජිව්හා දසක කාය දසක භාව දසකයෝ ද ආහාරජ කලාපයෝ ද නො ලැබෙති. භාව දසකය කාමරාග නිදාන කොටැ ඇති කර්මයෙන් නිපදෙන්නෙකි. එය දුරුකරනු පිණිස කළ භාවනා බලයෙන් උපදින බැවින් රූප ලෝකයෙහි භාවද්වය නො ලැබේ. වළඳන ආහාර නැති බැවින් එහි ආහාරජ කලාප ද නො ලැබේ. එබැවින් ම ආධ්‍යාත්මික ඔජායෙන් ද ආහාරජ රූප නූපදී. ඇතැම් ආචාර්ය කෙනෙක් රූප ලෝකයෙහි ගන්ධ රස ඔජා කැලම නැතැයි කියති. එවිට ඔවුන්ට ලැබෙන්නේ දසක නො වැ සප්තක ය.

රූපී බ්‍රහ්මයන්ට ප්‍රතිසන්ධි කාලයෙහි චක්ඛු දසක සෝත දසක වත්‍ථුදසක යන දසක තුන හා ජීවිත නවකය ම යන කම්ම සමුට්ඨාන කලාප සතර ද ප්‍රවෘත්ති කාලයෙහි චිත්ත සමුට්ඨාන කලාපයෝ ද ලැබෙත්.

රූප ලෝකයෙහි ජීවිත නවකය විශේෂ කොටැ කියන ලදි. කාමලෝකයෙහි මෙන් ජීවිතානුපාලක ආහාරජ කලාප හා කාය දසකාදිය නො ලැබෙන බැවිනි. "**ජීවිත නවකං නාම රූප ලොකෙ විසුංසියා**" යි එහෙයින් කියන ලදි. ජීවිත නවකය නම් රූප ලෝකයෙහි වෙන් වැ වන්නේ ය යනු අර්ථ යි.

අසඤ්ඤසත්තයන්ට වනාහි චක්ඛු දසක සෝත දසක වත්‍ථු දසක හා ශබ්ද නො ලැබෙන්නේ ය. එසමෙ සියලු චිත්තජ රූපයෝ ද නො ලැබෙති. ඔවුන්ගේ ප්‍රතිසන්ධියෙහි පවත්නේ ජීවිත නවකය පමණෙකි. ප්‍රවෘත්තියෙහි ශබ්ද වර්ජිත උතු සමුට්ඨාන රූප පවත්නේ ය.

මරණ කාලයෙහි කාම ලෝකයට වඩා රූප ලෝකයෙහි විශේෂ නැති. එහි දු චුති චිත්තයෙන් මොබ සතළොස් වන චිත්තයාගේ ස්ථිති කාලයෙහි පටන් කර්මජ රූපයන්ගේ උපැද්ම නවතී යනාදිය පෙරසේ ම ය. කියයුත්තෙක් ඇති. එහි ආහාරජ රූප නිරෝධ නැති. එසේ ම කලෙබර නික්ෂෙප ද නැත. ඔවුන්ගේ චුති චිත්තයෙන් මතු චිත්තජ උතුජ රූප සන්තතිය චිත්තක්ෂණ ස්වල්පයක් පැවැතිය ද එකවිට ම සියල්ල නිරුද්ධ වන්නා

සේ දක්නා ලැබේ. කාම ලෝකයෙහි දු ඕපපාතිකයන්ගේ මෘත කලෙබර නොපවත්නේ ය. ඔවුන්ගේ එකවිට ම පරිපූර්ණ වැ පහළ වූ කර්මජ රූප ඝන වැ බලවත් වැ පවතී. එය නිරුද්ධ වත් ම එහි පිහිටි දුර්බල වූ චිත්තජ ඍතුජ ආහාරජ රූප ද පවතින්නට අසමර්ථ වැ ඒ හා සමග ම නිරුද්ධ වන්නේ ය.

මෙසේ කාම රූප අසංඥ සංඛ්‍යාත තුන් තන්හි ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති වශයෙන් විවිධ වූ රූප ප්‍රවෘත්තිය දත යුතු.

**"අට්ඨවීසති කාමෙසු හොන්ති තෙවීස රූපිසු**
**සත්තරසෙවා සඤ්ඤීනං අරූපෙ නත්‍ථි කිඤ්චිපි**
**.**
**සද්දෙ විකාරො ජරතා මරණඤ්චෙපපත්තියං**
**න ලබ්භන්ති පවත්තෙ තු න කිඤ්චිපින ලබ්භතී."**

කාම රූපයෙහි රූප අට විස්ස ම ඇත්තේ ය. රූප භූමියෙහි තෙවිස්සෙක් ඇත්තේ ය. (ඝාණ ජිව්හා කාය හා භාවද්වය එහි නැති බැවිනි.) අසංඥීන්ට සතළොසක් ඇත්තේ ය. (චක්ඛු සෝත ඝාණ ජිව්හා කාය භාවද්වය හදයවත්‍ථු විඤ්ඤත්තිද්වය සද්ද නැති බැවිනි.) අරූපයෙහි කිසි දු රූපයෙක් නැති.

ශබ්ද විකාර ජරතා අනිච්චතා රූප ප්‍රතිසන්ධියෙහි නො ලැබේ. ප්‍රවෘත්තියෙහි නො ලැබෙන රූප නැත. සියල්ල ලැබෙති යි සේ යි.

**ප්‍රශ්න.**

1. රූප ලෝකයෙහි නො ලැබෙන රූප කලාප දක්වනු.
2. රූපී බ්‍රහ්මයන්ගේ ප්‍රතිසන්ධියෙහි ලැබෙන රූප දක්වනු.
3. අසංඥීන්ට පවත්නා රූප කවරේ ද?
4. බ්‍රහ්මයන්ගේ මරණයෙහි රූප නිරෝධය කෙසේ වේ ද?
5. කාමරූප අසංඥීන්හි ලැබෙන නො ලැබෙන රූප මේ මේ ය යි පැහැදිලි කොට දක්වනු. ප්‍රතිසන්ධියෙහි නො ලැබෙන රූප කවරේ ද?

## 12. නිර්වාණය.

යට දැක්වුණු සියලු පාඩම්වලින් චිත්ත චෛතසික රූප විභාගය දක්වන ලද්දේ ය. මෙහි නිර්වාණය දක්වනු ලැබේ.

**නිර්වාණය ලෝකෝත්තරය.** වදාළේ මැයි "**කතමෙ ධම්මා ලොකුත්තරා චත්තාරො ච අරියමග්ගා චත්තාරි ච සාමඤ්ඤ ඵලානි, අසංඛතා ච ධාතු ඉමෙ ධම්මා ලොකුත්තරා**" යි සතර ආර්ය මාර්ග ද සතර සාමඤ්ඤ ඵල ද අසංඛත ධාතු සංඛ්‍යාත නිර්වාණය ද ලෝකෝත්තරය යනු එහි අර්ථ යි. මෙයින් නිර්වාණය ප්‍රඥප්ති මාත්‍රයක් නො වන බව දැක්වූහ. ලෝක ව්‍යවහාර සිද්ධ ප්‍රඥප්ති ලෝකෝත්තර නො වන බැවිනි.

**නිර්වාණය සෝවාන් ආදි සතර මාර්ග ඥානයෙන් සාක්ෂාත් කටයුතු ය.** ප්‍රතිවේධ කළ යුතු ය. දැක්ක යුතු ය. ඇස් ඇත්තහු විසින් ඇසින් චන්‍ද්‍ර මණ්ඩලය සේ මාර්ගඥානලාභී ආර්යයන් විසින් මාර්ග ඥානයෙන් නිර්වාණය ප්‍රත්‍යක්ෂ කළ යුතු ය. මෙයින් ආර්යයන්ට නිර්වාණය ප්‍රත්‍යක්ෂ සිද්ධ බව කීහ. ජාත්‍යන්ධයනට චන්ද්‍ර මණ්ඩලය නො දැක්ක හැකි වුව ද චන්ද්‍රමණ්ඩලය නැතැ යි නො කිය හැකි ය. ප්‍රතිපත්ති විරහිත අන්ධ පෘථග්ජනයන්ට නිර්වාණය නො දැක්ක හැකි වුව ද නිර්වාණය නැතැ යි නොකිය යුතු ය. ප්‍රාඥ කල්‍යාණ පෘථග්ජනයන්ට නිර්වාණය අනුමාන සිද්ධය නොවත් හොත් ඒ පිණිස ව්‍යායාමය සිඳෙන්නේ ය.

**නිර්වාණය මාර්ග ඵලයන්ට අරමුණ ය.** නිර්වාණය නැත්නම් මාර්ග ඵල සිද්ධ නො වේ. මෙයින් නිර්වාණයාගේ විද්‍යමානත්‍වය ද තේජවන්ත බව ද කී නියා දත යුතු යි.

නිර්වාණය වාණ සංඛ්‍යාත තෘෂ්ණායෙන් නික්මුණේ ය. එහෙයින්ම එය නිබ්බාණ (නිර්වාණ) යයි කියනු ලැබේ. නිර්වාණය තෘෂ්ණාවට විෂය නො වන්නෙක. තෘෂ්ණා රාගීත්‍යයෙන් ම නිර්වාණය සිද්ධ යි.

ඒ මේ නිර්වාණය වනාහි ශාන්ති ස්වභාවයෙන් එකක් ම වුව ද කාරණ ලේශයෙන් **ස උපාදිසේස නිබ්බාණය, අනුපාදිසෙස නිබ්බාණය** යි ද්විවිධ වේ. උපාදි නම් පඤ්ච ස්කන්‍ධය යි තෘෂ්ණා දෘෂ්ටි විසින් ඇඩි වැ ගනු ලබන්නේ යන අර්ථයෙන් පඤ්චස්කන්‍ධ උපාදි ය යි කියනු ලැබේ. එක දෙශ වශයෙන් හෝ අනවශේෂ වශයෙන් හෝ කර්මක්ලේශ ප්‍රහීණ කල්හි ඒ පඤ්චස්කන්ධ ශේෂ වූයේ උපාදිසෙස ය. උපාදිසෙස සහිත වූ නිර්වාණ ස උපාදිසෙස නිර්වාණය යි. ක්ලේශ පරිනිර්වාණයෙන් පිරිනිවී ජීවත් වන්නහු පිළිබඳ නිර්වාණ සඋපාදිසෙස නිර්වාණ ය යි කී නියා යි. උපාදිසෙස රහිත නිර්වාණ අනුපදිසෙස නිර්වාණය ස්කන්ධ පරිනිර්වාණයෙන් පිරිනිවියනු පිළිබඳ නිර්වාණ අනුපාදිසෙස නිර්වාණය යි කී නියා යි. මාර්ග ඵල ලබා ජීවත්වන්නහු පිළිබඳ නිර්වාණය ස උපාදිසෙසය යි ද අර්හත් ඵලය ලබා අපවත් වූවහු පිළිබඳ නිර්වාණය ය යි ද කී යේ යි. "**ද්වෙ මා භික්ඛවෙ නිබ්බාණධාතුයො. කතමා දෙව? ස උපාදිසෙසා ච නිබ්බාණධාතු අනුපදිසෙසා ච නිබ්බාණ ධාතු**" යි. ඉතිවුත්තක යෙහි වදාළේ ය. පළමුවැන්න ක්ලේශ පරිනිර්වාණ ය යි ද දෙ වැන්න ස්කන්ධ පරිනිර්වාණය යි ද එසේ ම පළමුවැන්න දිට්ඨධම්ම නිබ්බාණ ය යි ද දෙවැන්න සම්පරායික නිබ්බාණ ය යි ද කියන ලදි.

එසේ ම නිර්වාණය **සුඤ්ඤත අනිමිත්ත අප්පණිහිතය** යි ආකාර භේදයෙන් ත්‍රිවිධ වේ.

ආරම්මණ වශයෙන් ද සම්ප්‍රයෝග වශයෙන් ද රාග ද්වේෂ මෝහයන්ගෙන් ශූන්‍ය බැවින් නිර්වාණය සුඤ්ඤත ය. එසේ ම රාගාදී නිමිත්ත රහිත බැවින් අනිමිත්ත ය. රාගාදි ප්‍රණිධි රහිත බැවින් අප්පණිහිත ය. තවද සකල සංස්කාරයන්ගෙන් ශූන්‍ය බැවින් හෝ නිර්වාණය සුඤ්ඤත ය. සකල සංස්කාර නිමිති රහිත බැවින් අනිමිත්තය ය. තෘෂ්ණා ප්‍රණිධි රහිත බැවින් අප්පණිහිත යි.

මෙහි විස්තරයෙක් මෙසේ දතයුතු.

සංඛත ධර්මයෝ පලිබෝධ සහිත ය. ඔව්හු නානා පලිබෝධයන්ගෙන් නිතර මහාජනයා පෙළති. ශාන්ත සුඛයක් ලැබ ගන්නට නො දෙති. අසංඛත සංඛ්‍යාත නිර්වාණය එ බඳු සියලු පලිබෝධයන්ගෙන් ශූන්‍ය ය. එ බැවින් සුඤ්ඤත ය.

සංඛත ධර්මයෝ නිමිත්ත සහිත ය. නිමිත්ත නම් ඉපැදුම් පැවතුම්වලට මුල් වන රාගාදි ය යි. ඒ නිමිත්තයෝ කෙලෙස්වලට ද ජරාමරණාදීන්ට ද සියලු අනර්ථයන්ට ද වස්තු වෙති. එ බඳු නිමිත්ත රහිත බැවින් අසංඛත සංඛ්‍යාත නිර්වාණය අනිමිත්ත ය.

සංඛත ධර්මයෝ ප්‍රණිධි සහිත ය. ප්‍රණිධි නම් ප්‍රාර්ථනාය-ආසා ය-පිපාසා යි. ප්‍රණිධි සහිත බැවින් ඔව්හු නිතර ආසා දුක් උපදවති. අසංඛත සංඛ්‍යාත නිර්වාණය ප්‍රණිධි රහිත ය. එ බැවින් අප්පණිහිත යි. වෙදයිත සුඛය ශාන්තිසුඛ ය යි සුඛය දෙවැදැරුම් වේ. මනුෂ්‍ය දේව බ්‍රහ්ම සම්පත් ලැබැ ඒ වැළඳීම් වශයෙන් ලැබෙන ප්‍රීතිසෞමනස්‍ය වෙදයිත සුඛ යි. එය විදුලියක් සේ ක්‍ෂණ ක්‍ෂණයෙහි බිඳී යන්නේ ය. සම්පත් අනිත්‍ය ස්වභාව යි. එද අනන්ත ආසා දුක් උපදවයි. එබැවින් වෙදයිත සුඛය දුඃඛයෙහි ම ඇතුළත් ය. "**යං කිංචි වෙදයිතං තං සබ්බං දුක්ඛස්මිං වදමි**" වෙදයිත සියල්ල දුක් යයි කියමි යි එබැවින් වදාළ සේක. විඳගන්නා සුවයෙක් නැත්නම් නිර්වාණයෙහි කවර සැපයෙක්දැ යි විචාරණ ලද සැරියුත් හිමියෝ ද "**එත දෙවෙත්ථ ආවුසො නිබ්බාණෙ සුඛං යදෙත්ථ වෙදයිතං නත්ථි**" විඳ ගැන්මක් නැති බව ම තමා ඇවැත්නි නිර්වාණයෙහි සුවය යි වදාළෝ ය. ශාන්ති සුඛය වනාහි පැමිණි යා වූ ද මතු පැමිණෙන්නා වූ ද ක්ලේශාදි දුක් ද අපායාදි දුක් ද සිඳලන්නේ ය. එබැවින් ඒ ශාන්ති සුඛය ම ඒකාන්ත සුවය යි. අචල සුවය යි. ශාන්ති සුඛය නොලත් සත්ත්වයෝ දෙව් මිනිස් සැප විඳින්නෝ ද අපාය දුක්වලට ද හිමි වෙති. මෙසේ සියලු ආසා දුක් සිඳුවන බැවින් නිර්වාණය අප්පණිහිත යි. නිර්වාණය පිළිබඳ කිය යුතු බොහෝ කරුණු ඇත ද ශිෂ්‍ය ඛෙද භීතියෙන් මෙතෙකින් නවතම්හ.

**"පදමච්චුත මච්චන්ත මසංඛතමනුත්තරං
නිබ්බාණමිති භාසන්ති වාණමුත්තා ම හසයො."**

ච්‍යුති රහිත - අන්ත රහිත - ප්‍රත්‍යයොත්පන්න නුවූ නිරුත්තර පදය නිර්වාණය යි ක්‍ෂීණාශ්‍රව මහර්ෂීහු කියති.

**මෙසේ තථාගතවරයෝ චිත්ත චෛතසික රූප නිර්වාණ යන සතර ආකාරයෙන් පරමාර්ථය ප්‍රකාශ කරත්.**

**"ඉති චිත්තං චෙතසිකං**
**රූප නිබ්බාණ මිච්චපි**
**පරමත්‍ථං පකාසෙන්ති**
**චතුද්ධාව තථාගතා."**

**ප්‍රශ්න.**

1. ලෝකෝත්තර ධර්ම කවරේ ද? නිර්වාණය කුමක් හෙයින් ලෝකෝත්තර ද?
2. නිර්වාණය කුමකින් දැක්ක යුතු ද? කුමකට අරමුණු වේද? කුමක් හෙයින් නිර්වාණය යි කියනු ලැබේ ද?
3. සඋපාදිසෙස අනුපාදිසෙස නිර්වාණ ධාතු විස්තර කරනු.
4. සුඤ්ඤත අනිමිත්ත අප්පණිහිත පැහැදිලි කරනු.
5. නිර්වාණ සුඛය පැහැදිලි කරනු.

**පූජ්‍ය පණ්ඩිත මාතර ශ්‍රී ධර්මවංශ ස්වාමීන් කළ අභිධර්ම චන්ද්‍රිකාවෙහි රූප පාදය යි.**

# සත්වන සමුච්චය පාදය.

**නමො භගවතො සම්බුද්ධස්ස.**

## 1. වස්තු ධර්ම හා චතුර්විධ සංග්‍රහ

**චිත්ත, චෛතසික, රූප, නිර්වාණ** සංඛ්‍යාත චතුර්විධ පරමාර්ථ චිත්තපාදාදි පරිච්ඡේද සයෙන් යට විස්තර කොටැ දක්වන ලද්දේ ය. චතුර්විධ පරමාර්ථ වනාහි **වස්තු ධර්ම** වශයෙන් වෙන් කොටැ ගත් කල්හි දෙ සැත්තෑවෙකි. වස්තු ධර්ම නම් ද්‍රව්‍ය මෙන් ආවේණික ලක්‍ෂණ වශයෙන් ස්වරූපයෙන් වෙන් වෙන් කොට ගත හැකි ධර්මයෝ ය. ඔහු මෙසේ ය.

| | | |
|---|---|---|
| චිත්ත | 1 | |
| චෛතසික | 52 | |
| රූප | 18 | |
| නිර්වාණ | 1 | |
| | 72 | වස්තු ධර්ම |

චිත්තය වනාහි චෛතසික හා සම්බන්‍ධයෙන් 89 වැදෑරුම් හෝ 121 වැදෑරුම හෝ වුව ද ආරම්මණ විජානන ලක්‍ෂණ වශයෙන් එක ම වස්තු ධර්මයෙකි. ඒ ඈම තන්හි ම පවත්නා සිත එකක් ම බැවිනි.

**චෛතසික** දෙපණස වස්තු ධර්ම දෙපණසෙකි. එක් එක් චෛතසිකය ඵුසන ලක්‍ෂණ වෙදයිත ලක්‍ෂණාදි වශයෙන් වෙන් වෙන් ලක්‍ෂණ ඇති බැවිනි.

අටවිසි රූප අතුරෙන් නිෂ්පන්න රූප අටළොස වස්තු ධර්ම ය. අනිෂ්පන්න රූප දසය වස්තු ධර්ම නොවේ. අනිෂ්පන්න රූප වනාහි තම තමා පිළිබඳ ස්වභාව ලක්‍ෂණ වශයෙන් හෝ අනිත්‍යාදි සාමාන්‍ය ලක්‍ෂණ වශයෙන් හෝ ලක්‍ෂණ වත් නො වන බැවිනි. ඔව්හු නිෂ්පන්න රූපයන්ගේ ම විකෘතීහු ය.

**නිර්වාණය** වස්තු ධර්මයෙකි. එය ශාන්ති ලක්‍ෂණයෙන් ලක්‍ෂණවත් ය. මාර්ග ඵල ප්‍රත්‍යවේක්‍ෂා ඥානයන්ට අරමුණු වන බැවින් ස්වරූපයෙන් ලැබෙන්නේ ය. මෙයින් නිර්වාණය අනිෂ්පන්න රූප මෙන් සෙසු ධර්මයන්ගේ විකෘති මාත්‍රයක් නො වන බව ද ප්‍රඥප්ති ධර්ම මෙන් පරමාර්ථච්ඡායාකාර මාත්‍රයක් නොවන බව ද හා අං, ඉබි ලොම්, කටුසු ලේ ආදිය මෙන් අභූත පරිකල්පිත ධර්ම මාත්‍රයක් නො වන බව ද දත යුතු.

මෙසේ දැක්වුණු දෙසැත්තෑ වස්තු ධර්ම පිළිබඳ සමුච්චය, 1 **අකුසල** සංග්‍රහය, 2 **මිශ්‍රක** සංග්‍රහය, 3 **බෝධිපාක්ෂික** සංග්‍රහය 4 **සර්ව** සංග්‍රහය යන සතර ආකාරයෙන් මතු විස්තර කරනු ලැබේ. සමුච්චය නම් සම්පිණ්ඩනය යි. සමූහය යි.

1. අකුශලයන්ගේ ආසවාදි වශයෙන් සංග්‍රහය අකුසල සංග්‍රහය යි. මෙහි අකුශල යනුවෙන් ඒකාන්ත අකුසල් ම ගත යුතු. අකුශල හා යෙදෙන චිත්ත ඵස්සාදිය නො ගත යුතු. 2. කුශල අකුශල අව්‍යාකෘත වශයෙන්, මිශ්‍රයන්ගේ හෙතු ආදි වශයෙන් සංග්‍රහය **මිශ්‍රක සංග්‍රහය** යි. 3. බෝධි නම් චතුමාර්ග ඥානය යි. තත් පක්ෂයෝ බෝධි පක්ෂයෝ ය. එහි ඇතුළත් වූවෝ බෝධිපාක්ෂිකයෝ ය. සත්තිස් ධර්ම යි. ඔවුන්ගේ සතිපට්ඨානාදි වශයෙන් සංග්‍රහය බෝධිපාක්ෂික සංග්‍රහය යි. 4. සියලු පරමාර්ථ ධර්මයන්ගේ ස්කන්ධාදි වශයෙන් සංග්‍රහය **සර්ව සංග්‍රහය** යි.

සර්ව සංග්‍රහයෙහි අනිෂ්පන්න රූප ද ලැබෙන බැවින් වස්තු ධර්ම දෙසැත්තෑවක් කොට ගැන්මෙහි විශේෂාර්ථයෙක් නො පෙනේ ය යි ඇතැම් ටීකාවෙක දක්වයි. අනිෂ්පන්න රූප නිෂ්පන්න රූපයන්හි ඇතුළත් බැවින් එය සාර්ථකය යි තවත් ටීකාවෙක දක්වා තිබේ.

ප්‍රශ්න.

1. සමුච්චය යනු කිම? මෙහි කවුරුන්ගේ සමුච්චය දැක්වේ ද?
2. වස්තු ධර්ම කෙතෙක් ද? කවරහු ද?
3. අනිෂ්පන්න රූප වස්තු ධර්ම නො වන්නටත් නිර්වාණය වස්තු ධර්ම වන්නටත් ඇති කරුණු දක්වනු.
4. චතුර්විධ සංග්‍රහ දක්වා එහි අර්ථය පැහැදිලි කරනු.
5. චතුර්විධ සංග්‍රහයට සියලු වස්තු ධර්ම ඇතුළත් වේ ද? සර්ව සංග්‍රහයෙහි අනිෂ්පන්න රූප ලැබෙතොත් මෙහි වස්තු ධර්ම වෙන් කිරීමේ ප්‍රයෝජනය කිම?

## 2. අකුසල සංග්‍රහය (ආසව, ඔඝ, යොග, ගන්ථ උපාදන)

යට දැක්වුණු චතුර්විධ සංග්‍රහය අතුරෙන් අකුශල සංග්‍රහය මෙහි දක්වනු ලැබේ. අකුශල වනාහි **ආසව, ඕඝ, යොග, ගන්ථ, උපාදන, නීවරණ, අනුසය, සංයෝජන, කිලෙස** යන නව ප්‍රකාරයෙකින් සංග්‍රහ වන බව දත යුතු. එහි දු ආසව සතරෙකි. ඔඝ සතරෙකි, යොග සතරෙකි, ගන්ථ සතරෙකි, උපාදාන සතරෙකි, නීවරණ සතරෙකි, අනුසය සතරෙකි, සංයෝජන දසයෙකි, කිලෙස දසයෙකි.

චතුරාසව

ආසව සතර නම්: 1 කාමාසව, 2 භවාසව, 3 දිට්ඨාසව, 4 අවිජ්ජාසව යන මොහු ය. ආසව යනු ලෝකයෙහි පුප්ඵාසවාදියට නම් ය. පුප්ඵාසවාදිය සත් අට දවස තෙමේත් පරිවාසිත වෙයි. ධරන කුම්භ ද පරිවාසිත කෙරෙයි. මේ කාමාදි සතර ද අනාදිමත් කාලයෙක සත්ත්ව සන්තානයෙහි පරිවාසිත වෙයි. සත්ත්ව සන්තානය ද පරිවාසිත කරයි. එ බැවින් චිර පරිවාසිත වශයෙන් ආසව බඳු හෙයින් මේ සතර ආසවය යි කියන ලදි. "**ආසමීයන්ති චීරං පරිවාසියන්තී ති ආසවා. ආසවන්ති චිරං පරිවාසෙන්ති තී ආසවා**" යන විග්‍රහ වශයෙනි. තව ද පුප්ඵාසවාදිය තමා පරිභෝග කළවුන් මත් කරවයි. මේ සතර ද තමා අයතියන් මත් කරවයි. එ බැවින් "**ආයවන්ති මදපෙන්තී ති ආසවා**" යි ආසව විය. තව ද ආසව යනු පූයාවට නමෙකි. පුයා වනාහි ව්‍රණ මුඛයෙන් වැගිරැ ලේ කඩ දූෂණය කරයි. මේ සතර ද චක්‍ෂුරාදි සදොරින් වැගිරැ ෂඩාරම්මණ දූෂණය කරයි. එ බැවින් "**ආසවන්ති විස්සන්දන්ති ආසවා**" යි නම් විය. තව ද "**භවතො ආභවග්ගං ධම්මතො ආගොත්‍රභූ සවන්ති ආරම්මණ කරණ වසෙන පවත්තන්තී ති ආසවා**" යි කී හෙයින් භව වශයෙන් භවාග්‍රය දක්වා ද ධර්ම වශයෙන් ගොත්‍රභූ ඥාණය දක්වා ද අරමුණු කිරීම් වශයෙන් පවත්නේ හෝ ආසව යි. මෙහි සීමාව අභිවිධි ය. භවාග්‍ර නම් නේවසඤ්ඤානාසඤ්ඤායතන යි.

1. **කාම** නම් කාම තෘෂ්ණා ය. "**කාමෙතී ති කාමො; කාමෙන්ති සම්පයුත්ත ධම්මා එතෙනාති කාමො**" යි විග්‍රහ වශයෙන් නොහොත් කාම නම් කාම ගුණ මුඛයෙන් වදාළ සියලු කාමාවචර ධර්ම සංඛ්‍යාත වස්තු කාම යි. "**කාමීයතෙ ති කාමො**" යි විග්‍රහ වශයෙන්. ඒ අරමුණු කොට පවත්නා තෘෂ්ණාව කාරණොපචාර වශයෙන් මෙහි කාමයයි දත යුතු. කාම වූයේත් එම ආසව වූයේත් එම නු යි, කාමාසව.

2. **භව** වනාහි කර්මභව උප්පත්ති භවය යි ද්විවිධ වේ. මෙහි රූපාවචර අරූපාවචර කුශල ධර්ම කර්ම භව ය. එයින් නිපදනා රූපාවචර අරූපාවචර විපාක උප්පත්ති භව ය. ඒ ද්විවිධ භවය අරමුණු කොට පවත්නා තෘෂ්ණාව කාරණෝපචාර වශයෙන්. මෙහි භව ය භව වූයේත් එම ආසව වූයේ ත් එම නු යි භවාසව. භවාසව නම් රූපාරූප රාගය යි.

3. **දිට්ඨි** නම් දෙ සැට මිථ්‍යාදෘෂ්ටිය යි. දිට්ඨි වූයේ ත් එම ආසව වූයේත් එම නු යි දිට්ඨාසව. මෙයින් දිට්ඨි චෛතසිකය කියවිණි.

4. චතුස්සත්‍යයෙහි හා පූර්වාන්ත අපරාන්ත පූර්වාපරාන්ත ප්‍රතීත්‍ය සමුත්පාදයෙහි හා නො දැන්ම අවිජ්ජා ය. අවිජ්ජා වූයේ ත් එම ආසව වූයේ ත් එම නු යි අවිජ්ජාසව. අවිජ්ජාසව නම් මෝහය යි.

### චතුරොඝ

ඔඝ සතර නම්: **කාමොඝ, භවොඝ, දිට්ඨොඝ, අවිජ්ජොඝ** යි. ඔඝ යනු දිය වතුරට හෙවත් ජල ප්‍රවාහයට නම්. එහි වැටුණ වුන් මැඩැ නසා ලන හෙයින් "**අත්තනි පතිතං ජනං අනස්සාසිකං කත්වා අජ්ඣොත්ථරන්තො හන්ති මාරෙතී ති ඔඝො**" යනු විග්‍රහ යි. කාමාදී

මේ සතරද අසුවුණුවුන් සසර සයුර හෙළා නසා ලන හෙයින් ඔඝ නම් විය. කාම භව දිට්ඨි අවිජ්ජා යන මොවුන්ගේ අර්ථ යට කී සේ ය.

## චතුයොග

**යොගසතර නම්: කාමයොග, භවයොග, දිට්ඨියොග, අවිජ්ජායොග** යි. යොග යනු. යොදනුවනට නමෙකි. කාමාදීහු සත්ත්වයන් භව යන්ත්‍රයෙහි යොදන්නෝ ය. එයින් සත්ත්වයෝ මිදී ගත නොහී කැකෑරෙමින් සිටිත්. කාමාදීන්ගේ අර්ථ යට කී සේ ය.

සෙසු අකුසල ඇත ද මොව්හු ප්‍රධාන වශයෙන් මේ ආසව ඔඝ යොග වෙති යි දත යුතු. මේ තුන් තන්හිම කාම භව වශයෙන් දැක්වුණේ තද් වස්තුක තෘෂ්ණාව ය. එ බැවින් ආසව ඔඝ යොග සතර බැගින් දැක්වුව ද වස්තු වශයෙන් බලත් හොත් ලැබෙන්නේ ලොභ දිට්ඨි අවිජ්ජා යන අකුශල චෛතසිකත්‍රය යි.

## චතුර් ග්‍රන්ථ

**ග්‍රන්ථ සතර නම්: 1 අභිජ්ඣා කාය ගන්ථ, 2 ව්‍යාපාද කාය ගන්ථ 3 සීලබ්බත පරාමාස කාය ගන්ථ, 4 ඉදං සච්චාභිනිවෙස කාය ගන්ථ** යන මොහු යි.

ගන්ථ යනු ගොතනුවනට - ගැටගසන්නවුනට නමෙකි. කාය ශබ්දයෙන් රූප කාය හා නාම කාය කියනු ලැබේ. නාම කායයෙන් රූප කායය ද අතීත කායයෙන් වර්තමාන කායය ද වර්තමාන කායයෙන් අනාගත කායය ද ගොතන්නෝ ගැටගසන්නෝ කාය ගන්ථයෝ ය. ඔහු සතර දෙනෙකි.

1. **අභිජ්ඣා** යනු ඇඩි ලෝභය යි. මෙහි වනාහි කාම රාග රූප රාග අරූප රාග සංඛ්‍යාත සියලු තෘෂ්ණාව ගනු ලැබේ. ලෝභය කාය ගන්ථයෙකි.
2. **ව්‍යාපාද** යනු ද්වේෂය යි. දෝසය කාය ගන්ථයෙකි.
3. සසර දුකින් මිදෙන්නට මාර්ග නො වූ ගොසීල ගොව්‍රතාදිය එයට මාර්ගය යි පර වශයෙන් ආමර්ශනය කිරීම-වරදවා ගැන්ම **සීලබ්බත පරාමාසය** යි. පර වශයෙන්-යථා ස්වභාව වූ සත්‍යයට විරුද්ධ වශයෙන් මෙයින් දිට්ඨිය කී නියා දත යුතු.
4. "මේ ම ය සස්. සෙස්ස හිස්" යි මිථ්‍යාභි නිවේසය වරදවා සැලකීම **ඉදං සච්චාභිනිවෙසය** යි. මෙයිනිදු දිට්ඨිය කියන ලදි. ගන්ථ සතරෙක් වුව ද වස්තු වශයෙන් ගත් කල්හි ලෝභ දෝස දිට්ඨි යි තුනෙකි.

## චතුරූපාදන

**උපාදන සතර නම්: 1 කාමූපාදන, 2 දිට්ඨුපාදන, 3 සීලබ්බතුපාදන, 4 අත්තවාදූපාදන** යන මොහු යි.

**"භුසං ආදියන්ති අමුඤ්චිත්වා ගණ්හන්තී ති උපාදනාති"**. නාගයා මැඩියා මෙන් අරමුණු ලිහිල් වැ යා නොදී ඇඩි වැ ගන්නෝ උපාදානයෝ ය. මෙහි උප ශබ්ද දෘඪාර්ථ යි උපාදාන සතරෙකි.

1. කාම නම් ක්ලේශකාම යි හෙවත් කාම තෘෂ්ණාව යි. කාම ම උපාදාන වූයේ කාමූපාදාන යි. වස්තු කාමය හෝ ඇඩි වැ ගන්නේ කාමූපාදාන යි. හෙද කාම තෘෂ්ණාව යි. ලෝභය උපාදානයෙකැ යි කී සේ ය.

2. සීලබ්බතඅත්තවාද හැර සෙසු සියලු මිථ්‍යාදෘෂ්ටි මෙහි දිට්ඨි ශබ්දයෙන් ගනු ලැබේ. දිට්ඨි ම උපාදාන වූයේ දිට්ඨුපාදාන යි. ත්‍රිවිධ මහා දෘෂ්ටි හෝ දෙසැට දෘෂ්ටි හෝ අන්‍ය වූ ත් ලොවැ මිත්‍යාග්‍රාහ වේ නම් ඒ හෝ දිට්ඨුපාදාන ය යි කී සේ ය.

3. ගො කක්කරාදීන්ගේ ඒ ඒ ප්‍රකෘති චාරිත්‍ර සීල ය. එය සමාදන් වැ ගන්නා ලද්දේ වත ය. ඒ සීල හා වත සංසාර විමුක්තියට මාර්ගය යි ඇඩි වැ ගන්නේ සීලබ්බතුපාදානය. මෙයිනුදු දිට්ඨියෙක් ම කියන ලදි.

4. අත්ත නම් අන්‍ය තීර්ථකයන් විසින් ආත්ම, ජීව, පුද්ගලාදි වශයෙන් කල්පනා කොටැ ගන්නා ලද කායෙශ්වර යි. එය කියන්නේ-පසස්නේ යමකින් ද එය අත්තවාද යි. එම උපාදාන වූයේ අත්තවාදූපාදාන යි. එනම් විංශද්විධ ස්වකාය දෘෂ්ටිය යි. රූපය ආත්මය, රූපවත් වූයේ ආත්මය, ආත්මයෙහි රූපය රූපයෙහි ආත්මය වේදනාව ආත්මය, වේදනාවත් වූයේ ආත්මය, ආත්මයෙහි වේදනාය, වේදනායෙහි ආත්මය, සංඥාව ආත්මය, සංඥාවත් වූයේ ආත්මය, ආත්මයෙහි සංඥාය, සංඥායෙහි ආත්මය, සංස්කාර ආත්මය, සංස්කාරවත් වූයේ ආත්මය, ආත්මයෙහි සංස්කාරය, සංස්කාරයෙහි ආත්මය, විඥානය ආත්මය, විඥානවත් වූයේ ආත්මය, ආත්මයෙහි විඥානය, විඥානයෙහි ආත්මය යනු විංසතිවිධ සක්කාය දිට්ඨියි මෙ ද දිට්ඨි විශේෂයකි. උපාදාන සතරක් වුව ද වස්තු වශයෙන් බලත්හොත් තණ්හා දිට්ඨි ය යි දෙකෙකි.

**ප්‍රශ්න.**

1. අකුසල කී ආකාරයෙකින් සංගෘහිත ද? ඒ කවරේ ද?
2. ආසව යනු කිම? ඒ කී වැදැරුම් ද? අර්ථ වශයෙන් කෙතෙක් ද?
3. ඔඝ යොග යනු කිම? ඒ කවරේ ද?
4. ගන්ථ යනු කිම? ඒ කවරේ ද?
5. උපාදාන යනු කිම? සතර උපාදාන විස්තර කරනු. වස්තු වශයෙන් ඒ කෙතෙක් ද?

## 3. අකුසල සංග්‍රහය (නීවරණ, අනුශය, සංයෝජන, කිලෙස.)

අකුශල සංග්‍රහයට ඇතුළත් ආසවාදි පස යට දැක්විණි. නීවරණාදි සතර මෙහි දක්වනු ලැබේ.

## ෂඩ් නීවරණ

**නීවරණ සය නම්: 1 කාමච්ඡන්‍ද නීවරණ, 2 ව්‍යාපාද නීවරණ, 3 ථීනමිද්ධ නීවරණ, 4 උද්ධච්ච කුක්කුච්ච නීවරණ, 5 විචිකිච්ඡා නීවරණ, 6 අවිජ්ජා නීවරණ** යන මොහු යි.

සත්ත්ව සන්තානයෙහි නූපන් කුශල ධර්ම උපදවා ගන්නට හෝ උපන් කුශල ධර්ම නවත්වා ගන්නට හෝ නො දී වළකා ලන්නෝ නීවරණයෝ ය. ප්‍රඥා චක්‍ෂුස හෝ අවුරා ලන්නෝ නීවරණයෝ ය. ඔහු සදෙනෙකි.

1. කාම වූයේ ත් එම ඡන්‍ද වූයේත් එම කාමච්ඡන්‍ද. එම නීවරණ වූයේ කාමච්ඡන්‍ද නීවරණ. මෙයින් පඤ්චකාමගුණික රාගය කියන ලදි. රූපා රූප රාග හැර සෙසු සියලු රාග-ලොභ මෙහි ඇතුළත් ය. ධ්‍යානයට ප්‍රතිපක්‍ෂ වන්නේ කාම රාගය යි.

2. ව්‍යාපාද නම් චිත්ත විකෘති සංඛ්‍යාත ද්වේෂය, එම නීවරණ වූයේ ව්‍යාපාද නීවරණ දශවිධ ආඝාත යි.

3. ථීනය හා මිද්ධයම නීවරණ වූයේ ථීනමිද්ධ නීවරණ.

4. උද්ධච්චය හා කුක්කුච්චය ම නීවරණ වූයේ උද්ධච්ච කුක්කුච්චම නීවරණ.

සෙසු තැන්හි මෙන් එක් එක් ධර්මය නො ගෙනැ මෙහි ධර්ම යුගල යුගල කුමක් හෙයින් ගන්නා ලද්දේ ද? ඔවුන්ගේ කෘත්‍ය හා ප්‍රත්‍යය හා ප්‍රතිපක්‍ෂ ධර්ම හා සමාන බැවිනි. ඒ එසේ මැයි. ථීනයෙහි කෘත්‍යය ලීනත්‍වය. මිද්ධයෙහි ද එසේ ය. ථීනයෙහි ප්‍රත්‍යය තන්‍දිය හා විජම්භිකා ය. මිද්ධයෙහි ද එසේ ය. ථීනයෙහි විපක්‍ෂ ධර්මය වීර්යය. මිද්ධයෙහි ද එසේ ය. උද්ධච්චයෙහි කෘත්‍යය අව්‍යූපශමය. කුක්කුච්චයෙහි ද එසේ ය. උද්ධච්චයෙහි ප්‍රත්‍යය ඥාති ව්‍යසනාදි විතර්කණය. කුක්කුච්චයෙහි ද එසේ ය. උද්ධච්චයෙහි ප්‍රතිපක්‍ෂ ධර්මය සමථය. කුක්කුච්චයෙහි ද එසේ ය. මෙසේ කෘත්‍ය ප්‍රත්‍යය විපක්‍ෂ ධර්මයන්ගේ සමානත්‍වයෙන් මේ ධර්ම යුගල එක්කොට දක්වන ලදි.

**"කිච්චාහාර විපක්ඛානං එකත්තං එකමෙත්ථ හි**
**කතමුද්ධච්ච කුක්කුච්චං ථීනමිද්ධං ච තාදිනා**
**.**
**ලීනතා සන්තතාකිච්චං තන්‍දිඤාතිවිතක්කණං**
**හෙතු විරිය සමථා ඉමෙ තෙසං විරොධිනො"**

අර්ථ සුගම යි. ආහාර නම් ප්‍රත්‍යය - හේතු යි සේ යි.

5. විචිකිච්ඡා ම නීවරණ වූයේ විචිකිච්ඡා නීවරණ.

6. අවිජ්ජාම නීවරණ වූයේ අවිජ්ජා නීවරණයි.

මෙහි නීවරණ සයක් වුව ද වස්තු වශයෙන් ගත් කල්හි ලෝභ, දෝස, ථීන, මිද්ධ, උද්ධච්ච, කුක්කුච්ච, විචිකිච්ඡා අවිජ්ජා යි අටෙකි.

## සප්තානුසය

**අනුසය සත නම්: 1 කාමරාගානුසය, 2 භවරාගානුසය, 3 පටිඝානුසය, 4 මානානුසය, 5 දිට්ඨානුසය, 6 විචිකිච්ඡානුසය, 7 අවිජ්ජානුසය** යන මොහු යි.

අනුසයයෝ නම් අනුරූප කාරණයක් ඇති කල්හි උපදින්නෝ ය. "**අනුසෙන්තීති අනුසයා**" යන විග්‍රහ වශයෙනි. මාර්ග ඥානය නො ලබන තාක් අතර ක්‍ෂයත්‍වයට නො පැමිණැ කාරණයක් ඇති කල්හි නැවත නැවත උපදින්නෝ හෝ අනුසයයෝ ය. "අනු අනුසෙන්තීති අනුසයා" යන විග්‍රහ වශයෙනි. මෙහි ඉපදීම නම් ඉපදීමට සුදුසු බවය. ස්වරූප වශයෙන් ඉපදීම ම නො වේ. තව ද පරියුට්ඨාන, වීථික්කම අවස්ථාවන්ට නොපැමිණැ සිතෙහි නිදියෙන ආකාරයෙන් හෝ පවත්නෝ අනුසයයෝ ය. අනුසයාවස්ථා, පර්යුත්ථානාවස්ථා, ව්‍යතික්‍රමාවස්ථා ය යි ක්ලේශයන්ගේ අවස්ථා තුනෙකි. අනුසයාවස්ථා නම් යට දැක්වූ පරිදි මාර්ග ඥානයකින් කෙලෙස් ක්‍ෂය කරන තාක් නො සිඳී කාරණයක් පැමිණි කල්හි නැගී ඒමෙහි බලය ඇති වැ කාරණයක් නැති කල්හි සම්ප්‍රයුක්ත ධර්ම මෙන් ජවන සමග ඉදිරිපත් නො වී සිතෙහි නිදියන කලක් මෙන් පවත්නා අවස්ථාව යි. කෙතෙක් ලෞකික ගුණ ලැබුව ද ඔවුන්ගේ අනුසයාවස්ථාව නො සිඳෙයි. පර්යුත්ථාන අවස්ථා නම් සිතෙහි ඒ ඒ කෙලෙස් ජවනයන් සමග පවත්නා අවස්ථාව යි. **ව්‍යතික්‍රම අවස්ථා** නම් කාමරාගාදිය ඉපිද කායාඞ්ග වාචාඞ්ග චලනය කරන අවස්ථා යි. එබඳු අනුසයයෝ සත් දෙනෙකි.

1. කාම රාගයම අනුසය වූයේ කාමරාගානුසය.
2. භව රාගයම අනුසය වූයේ භවරාගානුසය.

මේ දෙකින්ම ලෝභය කියන ලදැයි දත යුතු.

3. පටිඝය ම අනුසය වූයේ පටිඝානුසය. පටිඝ නම් ද්වේෂය.
4. මානය ම අනුසය වූයේ මානානුසය.
5. දිට්ඨියම අනුසය වූයේ දිට්ඨානුසය.
6. විචිකිච්ඡාව ම අනුසය වූයේ විචිකිච්ඡානුසය.
7. අවිජ්ජාම අනුසය වූයේ අවිජ්ජානුසය. අවිජ්ජා නම් මෝහ.

මෙහි අනුසය සතක් වුව ද වස්තු වශයෙන් ගත් කල්හි ලෝභ, දෝස, මාන, දිට්ඨි, විචිකිච්ඡා, මෝහ ය යි සයෙකි.

## දස සංයෝජන

**සංයෝජන දසය නම්: 1 කාම රාග සංයෝජන, 2 රූප රාග සංයෝජන, 3 අරූප රාග සංයෝජන, 4 පටිඝ සංයෝජන, 5 මාන සංයෝජන, 6 දිට්ඨි සංයෝජන 7 සීලබ්බත පරාමාස**

**සංයෝජන, 8 විචිකිච්ඡා සංයෝජන, 9 උද්ධච්ච සංයෝජන, 10 අවිජ්ජාසංයෝජන යන මොහු යි.** මේ සූත්‍රාන්ත ක්‍රමයෙනි.

භව යන්ත්‍රයෙහි සත්ත්වයන් බැඳැ ලන්නෝ සංයෝජනයෝ ය. මෙයින් බැඳීම නිසා සත්ත්වයෝ සසර සැරිසරමින් ඇවිදිති. ඔහු සූත්‍රාන්තික ක්‍රමය, අභිධර්ම ක්‍රමය යි විවිධ ය. සූත්‍රාන්තික ක්‍රමයට අයත් දසය යට දක්වන ලදි.

අභිධර්ම ක්‍රමයට අයත් සංයෝජන දසය මෙසේය.
**1 කාමරාග සංයෝජන, 2 භව රාග සංයෝජන, 3 පටිඝ සංයෝජන, 4 මාන සංයෝජන, 5 දිට්ඨි සංයෝජන, 6 සීලබ්බත පරාමාස සංයෝජන, 7 විචිකිච්ඡා සංයෝජන, 8 ඉස්සා සංයෝජන, 9 මච්ඡරිය සංයෝජන, 10 අවිජ්ජා සංයෝජන**

1. කාම රාගය ම සංයෝජන වූයේ කාම රාග සංයෝජන ය. සෙස්ස ද මෙසේ යි. කාම රාග, රූප රාග, අරූප රාග, භවරාග යන්නෙන් ලෝභය ද, පටිඝ යන්නෙන් ද්වේෂය ද, මාන යන්නෙන් මානය ද, දිට්ඨි, සීලබ්බතපරාමාස යන්නෙන් දිට්ඨිය ද, විචිකිච්ඡා, උද්ධච්ච, ඉස්සා, මච්ඡරිය යන්නෙන් ඒ ඒ ධර්මය ද, අවිජ්ජා යන්නෙන් මෝහය ද වස්තු වශයෙන් ගැනෙන බැවින් සංයෝජන නවයැයි දතයුතු. ඔවුන්ගේ ආකාර යට දක්වන ලදි. මච්ඡරිය වනාහි ආවාස මච්ඡරිය, කුල මච්ඡරිය, ලාභ මච්ඡරිය, වණ්ණ මච්ඡරිය, ධම්ම මච්ඡරිය යි පංචවිධ වේ. මෙයින් සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාස, කාම රාග, ව්‍යාපාද යන පස ඕරම්භාගිය සංයෝජන ය යි ද, රූප රාග, අරූප රාග, මාන, උද්ධච්ච, අවිජ්ජා යන පස උද්ධම්භාගිය සංයෝජනය ය යි ද කියන ලදි.

## දස ක්ලේශ

**ක්ලේශ දශය නම්: 1. ලෝභ, 2. දෝස, 3. මෝහ 4. මාන, 5. දිට්ඨි, 6. විචිකිච්ඡා, 7. ථීන, 8. උද්ධච්ච, 9. අහිරික 10. අනොත්තප්ප** යන මොහු යි.

සිත කෙලෙසන්නෝ-පෙළන්නෝ-තවන්නෝ ක්ලේශයෝ ය. මොවුන් කරණ කොටැ සත්ත්වයෝ මලින භාවයට-නිහීන භාවයට යෙත් නු යි හෝ ක්ලේශයෝ ය. ඔව්හු දස දෙනෙකි. ඔවුන්ගේ ආකාර යට දැක්වුණු බැවින් මෙහි විස්තර නො කරමු.

**"ආසවොඝා ච යොගා ච තයො ගන්ථා ච වත්ථුතො
උපාදනා දුවෙවුත්තා අට්ඨ නීවරණා සියුං
ඡළෙ වානුසයා හොන්තීනව සංයෝජනා මතා
කිලෙසා දස වුත්තොායං නවධා පාප සංගහො"**

ආසව, ඔඝ, යෝගයෝ ද ග්‍රන්ථයෝ ද වස්තු වශයෙන් තුන් දෙන ය, උපාදානයෝ දෙදෙන ය, නීවරණ අට ය, අනුසය සය, සංයෝජන නව ය, ක්ලේශ දශ ය. මෙසේ අකුශල සංග්‍රහය නවවිධ කොට දක්වන ලද්දේ ය.

### ප්‍රශ්න.

1. නීවරණ සය පැහැදිලි කොට එය අට වන සැටි දක්වනු. ථිනමිද්ධ හා උද්ධච්ච කුක්කුච්ච හා එක් කොටැ දැක්වුණේ කිම?
2. අනුසය යනු කිම? ඔහු කවරහුද? එක් එක් අනුසයෙක අර්ථ පැහැදිලි කොට එය සය වන සැටි දක්වනු. ක්ලේශයන්ගේ ත්‍රිවිධ අවස්ථා කවරේ ද?
3. දස සංයෝජන සූත්‍ර ක්‍රමයෙන් හා අභිධර්ම ක්‍රමයෙන් දක්වනු කුමක් හෙයින් ඔහු සංයෝජන නම් වූ ද?
4. දශ ක්ලේශ දක්වනු.
5. අකුශල සංග්‍රහයෙහි තණ්හා දිට්ඨි කවර කවර නම්වලින් දැක්විණිද?

## 4. මිශ්‍රක සංග්‍රහය

අකුශල සංග්‍රහයට අනතුරුව මිශ්‍රක සංග්‍රහය දක්වනු ලැබේ. “කුශල අකුශල අව්‍යාකෘත වශයෙන් මිශ්‍රයන්ගේ හේතු ආදි වශයෙන් සංග්‍රහය මිශ්‍රක සංග්‍රහය” යි යට දැක්විණි. ඒ වනාහි හේතු, ඣානාඞ්ග, මග්ගඞ්ග, ඉන්‍ද්‍රිය, බල, අධිපති, ආහාර වශයෙන් සප්තවිධ ය. **එහිදු හේතු සයෙකි. ඣානාඞ්ග සතෙකි. මග්ගඞ්ග දෙළොසෙකි. ඉන්‍ද්‍රිය දෙවිස්සෙකි. බල නවයෙකි. අධිපති සතරෙකි ආහාරද සතරෙකි.**

### ෂඩ් හේතු

**හේතු** සය නම්, **ලෝභ, දෝස, මෝහ, අලෝභ, අදෝස, අමෝහ** යන මොහුයි. මෙහි මුල් තුන අකුශල හේතු ය. සෙස්ස කුශල අව්‍යාකෘත හේතු යි. මොවුන් පිළිබඳ විභාගය යට කියන ලදි.

### සප්ත ධ්‍යානාඞ්ග

**ධ්‍යානාඞ්ග සත** නම්: **1 විතක්ක, 2 විචාර, 3 පීති 4 එකග්ගතා, 5 සෝමනස්ස, 6 දෝමනස්ස, 7 උපෙක්ඛා** යන මොහු යි.

මෙහි ධ්‍යානයෝ නම් අරමුණ උපනිජ්ඣායනය කරන්නෝ ය. උපනිජ්ඣායනය නම් බැලීම යි. කල්‍යාණ වූ හෝ පාප වූ හෝ අරමුණෙහි ඍජුව සිත පිළියෙල කිරීම යි. එහි අඞ්ග ධ්‍යානාඞ්ග යි. ඔහු වනාහි සත් දෙනෙකි. ඔවුන් පිළිබඳ විභාගය යට දක්වන ලදි. එහි දු දෝමනස්සය අකුශල ධ්‍යානාඞ්ග ය. සෙස්ස කුශල අකුශල අව්‍යාකෘතයෝ යි. තව ද වස්තු වශයෙන් ගත් කළ ධ්‍යානාඞ්ග පසෙකි. සෝමනස්ස දෝමනස්ස උපෙක්ඛා වේදනා බැවිනි.

### ද්වාදශ මාර්ගාඞ්ග

මාර්ගාඞ්ග දොළොස නම් : 1 සම්මාදිට්ඨි, 2 සම්මා සංකප්ප, 3 සම්මාවාචා, 4 සම්මා කම්මන්ත, 5 සම්මා කම්මන්ත, 6 සම්මා ආජීව, 6 සම්මා වායාම, 7 සම්මාසති, 8 සම්මා සමාධි, 9 මිච්ඡා දිට්ඨි, 10 මිච්ඡා සංකප්ප, 11 මිච්ඡා වායාම, 12 මිච්ඡා සමාධි යන මොහු යි.

සුගති දුර්ගති නිර්වාණ සංඛ්‍යාත ඒ ඒ දිශාවන්ට පමුණුවන්නෝ මාර්ගයෝ ය. ඔවුන් පිළිබඳ අඞ්ගයෝ මාර්ගාඞ්ගයෝ ය. ඔහු වනාහි සම්මාදිට්ඨි ආදී වශයෙන් දොළොසෙක, මින් සම්මාදිට්ඨි ආදී අට සුගති නිර්වාණ මාර්ගාඞ්ගය මිච්ඡාදිට්ඨි ආදී සතර දුගති මාර්ගාඞ්ග යි.

1. සම්මාදිට්ඨි නම් අවිපරීත දර්ශනය යි - මැනවින් බැලීම යි - ප්‍රඥාව යි. ඒ වනාහි “අත්ථි දින්නං" යනාදි වශයෙන් දශවිධ වේ. තවද නොයෙක් භෙද ඇත්තේ ය.

2. සම්මාසඞ්කප්ප නම් අවිපරිත විතර්කන යි. ඒ වනාහි නෙක්ඛම්ම සංකප්පාදි වශයෙන් ත්‍රිවිධ වේ.

3. සම්මාවාචා නම් අවිපරීත - සත්‍ය වචන යි. ඒ වනාහි මුසාවාදාදියෙන් වැළකීම වශයෙන් චතුර්විධ වේ.

4. සම්මාකම්මන්ත නම් නිවැරදි කර්මාන්ත යි. ප්‍රාණඝාතාදියෙන් වැළකීම් වශයෙන් ත්‍රිවිධ වේ.

5. සම්මා ආජීව නම් දැහැමින් දිවි පැවැත්ම යි. ඒ වනාහි වාචසික කායික සප්තවිධ දුශ්චරිතයෙන් වැළකීම් වශයෙන් සප්තවිධ වේ.

6. සම්මා වායාම නම් යහපත් වීර්ය යි. ඒ වනාහි නූපන් අකුසල් නූපදනා සේ වීර්ය කිරීම් ආදි වශයෙන් චතුර්විධ වේ.

7. සම්මා සති නම් මනා සිහිය යි. කායානුපස්සනා ආදි වශයෙන් චතුර්විධ වේ.

8. සම්මා සමාධි නම් යහපත් ඒකාග්‍රතා යි. ප්‍රථමාදි ධ්‍යාන වශයෙන් පංචවිධ හෝ චතුර්විධ වේ.

9. මිච්ඡාදිට්ඨි නම් විපරීත දර්ශනය යි. වරදවා ගැන්ම යි. ඒ නානාවිධ වේ.

10. මිච්ඡාසංකප්ප නම් විපරීත විතර්කනය යි. කාම විතර්ක ව්‍යාපාද විතර්ක විහිංසා විතර්ක යි.

11. මිච්ඡාවායාම නම් අයහපත් වීර්ය යි. සම්‍යක් ව්‍යායාමයට ප්‍රතිපක්ෂ ව්‍යායාමය යි.

12. මිච්ඡා සමාධි නම් අයහපත් ඒකාග්‍රතා යි. අකුශල සිත්හි ලැබෙන එකාග්ගතා යි.

සම්මාදිට්ඨි ආදි මාර්ගාඞ්ග අට පිළිබඳ විස්තරයෙක් මතු බෝධිපාක්ෂික විභාගයෙහම් පළවේ. වස්තු ධර්ම වශයෙන් බලත් හොත් මාර්ගාඞ්ග නවයෙකි. සම්මාසංකප්ප මිච්ඡා සංකප්ප විතර්කයෙහි ද, සම්මාවායාම මිච්ඡාවායාම විරියයෙහි ද, සම්මා සමාධි මිච්ඡාසමාධි එකග්ගතායෙහි ද, ඇතුළත් බැවිනි.

## බාවීසති ඉන්ද්‍රිය

ඉන්ද්‍රිය දෙවිස්ස නම්: **1 චක්ඛුන්ද්‍රිය, 2 සොතින්ද්‍රිය, 3 ඝාණින්ද්‍රිය, 4 ජිව්හින්ද්‍රිය, 5 කායින්ද්‍රිය, 6 ඉත්ථින්ද්‍රිය, 7 පුරිසින්ද්‍රිය, 8 ජිවිතින්ද්‍රිය, 9 මනින්ද්‍රිය, 10 සුඛින්ද්‍රිය, 11 දුක්ඛින්ද්‍රිය, 12 සෝමනස්සින්ද්‍රිය, 13 දෝමනස්සින්ද්‍රිය, 14 උපෙක්ඛින්ද්‍රිය, 15 සද්ධින්ද්‍රිය, 16 විරියින්ද්‍රිය, 17 සතින්‍ද්‍රිය, 18 සමාධින්ද්‍රිය, 19. පඤ්ඤින්ද්‍රිය, 20 අනඤ්ඤතංඤස්සාමීතින්ද්‍රිය, 21 අඤ්ඤින්ද්‍රිය, 22 අඤ්ඤතාවින්ද්‍රිය** යන මොහු යි.

ඉන්ද්‍රිය නම් - පරමාධිපති භාවය කරන ධර්ම යි.

පරමාධිපති භාවය නම් - අත්මාධීන ධර්ම ස්වකීය ගතියෙහි සර්වාකාරයෙන් පවත්වන්නට සමර්ථ බව යි. ඔහු දෙවිස්සෙකි.

1. **චක්ඛු** යනු චක්‍ෂු ප්‍රසාදය යි. එය දර්ශන කෘත්‍යයෙහි දී චක්‍ෂුර්විඥානයන්ට පරමාධිපති භාවය කරන හෙයින් චක්ඛුන්‍ද්‍රිය විය.

2. **සොත** යනු ශ්‍රොත්‍ර ප්‍රසාදය යි. එය ශ්‍රවණ කෘත්‍යයෙහි දී සෝත විඤ්ඤාණයන්ට පරමාධිපති භාවය කරන හෙයින් සොතින්‍ද්‍රිය විය.

3. **ඝාණ** යනු ඝ්‍රාණ ප්‍රසාදය යි. එය ආඝ්‍රායණ කෘත්‍යයෙහි දී ඝාණවිඤ්ඤාණයන්ට පරමාධිපති භාවය කරන හෙයින් ඝාණින්‍ද්‍රිය විය.

4. **ජිව්හා** යනු ජිව්හා ප්‍රසාදය යි. එය සායන කෘත්‍යයෙහි දී ජිව්හා විඤ්ඤාණයන්ට පරමාධිපති භාවය කරන හෙයින් ජිව්හින්‍ද්‍රිය විය.

5. **කාය** යනු කාය ප්‍රසාදය යි. එය ස්පර්ශ කෘත්‍යයෙහි දී කාය විඤ්ඤාණයන්ට පරමාධිපති භාවය කරන හෙයින් කායින්‍ද්‍රිය විය.

සත්ත්වයන්ගේ ප්‍රකට වූ රූප කාය පිළිබඳ ආත්ම දෘෂ්ටියේ ඇඩිවැ ගැන්ම හෝ එයින් මිදීම මේ පස නොදැන්මෙන් සිදුවන බව දක්වන්නට ප්‍රසාද ඉන්ද්‍රිය පස ආදි කොට දක්වන ලදි.

6. **ඉත්ථින්ද්‍රිය** නම් ස්ත්‍රීභාව රූපය යි. එය ස්ත්‍රී ආකාර වශයෙන් ප්‍රවෘත්ති කාලයෙහි චතුසමුට්ඨානික රූපයන්ට-පඤ්චස්කන්ධයට ම හෝ පරමාධිපති භාවය කෙරෙයි. ඒ එසේ මැ යි. යමකුගේ ප්‍රතිසන්ධියෙහි ස්ත්‍රී භාවය පිහිටියේ නම් ඇය පිළිබඳ කර්මාදි ප්‍රත්‍යය රූප උපදවන්නේ ස්ත්‍රී ආකාරයෙන් යුක්ත කොටැ ම උපදව යි. ඇයගේ ඡන්‍ද චිත්තාධිප්‍රායයෝ ද අවිසදාකාරයෙන් ම යුක්ත වෙත්.

7. **පුරිසින්ද්‍රිය** නම්: පුරුෂ භාව රූපය යි. එය පුරුෂාකාර වශයෙන් ප්‍රවෘත්ති කාලයෙහි චතුසමුට්ඨානික රූපයන්ට හෝ ස්කන්ධ පඤ්චකයට ම හෝ ඊශ්වරත්වය කෙරෙයි. ඒ එසේ මැයි. යමකුගේ ප්‍රතිසන්ධියෙහි පුරුෂ භාව රූපය පිහිටියේ නම් ඔහු පිළිබඳ කර්මාදි ප්‍රත්‍යය රූප උපදවන්නේ පුරුෂාකාරයෙන් යුක්ත කොටැ ම උපදවයි. ඔහුගේ ඡන්‍ද චිත්තාධිප්‍රායයෝ ද විසදාකාරයෙන් යුක්ත වෙත්.

සත්ත්වයන් පිළිබඳ ස්ත්‍රී පුරුෂ භාවය වන්නේ මේ භාව රූපද්වයයෙනි. එහි ග්‍රාහය හෝ විමුක්තිය වන්නේ මේ දෙක නොදැන් මෙන් හෝ දැන්මෙනි. එබැවින් පසාදින්‍ද්‍රියට අනතුරු වැ භාවින්‍ද්‍රිය දක්වන ලදි.

8. **ජීවිතින්ද්‍රිය** නම්: රූප අරූප ජීවිතින්‍ද්‍රිය යි. එය රූප අරූප සන්තතිය පිළිබඳ දිවස මසාදි වශයෙන් කල් පැවැත්මෙහි සහජාත ධර්මයන්ට ඊශ්වර භාවය කරයි.

සත්ත්වයා ජීව සංඥා ලබන්නේ මේ ජීවිතින්‍ද්‍රිය රූපයෙනි. එහි ග්‍රාහය හෝ විමුක්තිය මේ නොදැන්මෙන් හෝ දැන්මෙන් වන්නේ ය. එබැවින් භාවින්‍ද්‍රියට අනතුරු වැ ජීවිතින්‍ද්‍රිය දක්වන ලදි.

9. මනින්ද්‍රිය නම්: චිත්තය යි. එය විජානන කෘත්‍යයෙහි සහජාතයන්ට ඊශ්වර භාවය කෙරෙයි.

නාම කාය පිළිබඳ ආත්ම දෘෂ්ටියේ ඇඩි බව ගැන්ම හෝ එයින් මිදීම මේ නොදැන්මෙන් හෝ දැන්මෙන් වන බව දක්වන්නට නාමින්‍ද්‍රිය අතුරෙන් ආදි කොට මනින්‍ද්‍රිය දක්වන ලදි.

10-14 **සුඛින්ද්‍රිය, දුක්ඛින්ද්‍රිය, සෝමනස්සින්ද්‍රිය, දෙමනස්සින්ද්‍රිය උපෙක්ඛින්ද්‍රිය** නම් සුඛාදී වේදනා පංචකය යි. එය ආරම්මණ රසානුභවයෙහි සහජාතයන්ට ඊශ්වර භාවය කෙරෙයි.

ඒ අරූපී ආත්මය මේ සුඛාදි වශයෙන් කිලිටි ද චංචල ද වෙයි. එහි ග්‍රාහය හෝ එයින් මිදීම මේ පස නොදැන්මෙන් හෝ දැන්මෙන් වෙයි. එබැවින් එය දක්වන්නට සුඛාදි වේදනා පස ඉක්බිති වැ දක්වන ලදි.

15. **සද්ධින්ද්‍රිය** නම්: ශ්‍රද්ධා ය. එය ආරම්මණයෙහි මුක්තියෙහි සහජාත ධර්මයන්ට ඊශ්වර භාවය කරයි.

16. **විරියින්ද්‍රිය නම්:** වීර්ය ය. එය අලීන වෘත්තියෙහි සහ ජාත ධර්මයන්ට ඊශ්වර භාවය කරයි.

17. **සතින්ද්‍රිය නම්:** සතිය. එය අරමුණ වටහා ගැන්මෙහි සහජාත ධර්මයන්ට ඊශ්වර භාවය කරයි.

18. **සමාධින්ද්‍රිය නම්:** එකග්ගතා ය. එය අරමුණෙහි සහජාත ධර්ම නිශ්චලත්වයෙන් පිහිටුවීමෙහි ඊශ්වර භාවය කෙරෙයි.

**පඤ්ඤින්ද්‍රිය නම්:** ප්‍රඥා ය. එය අරමුණෙහි සහජාත ධර්මයන්ට අසම්මොහයෙහි ඊශ්වර භාවය කෙරෙයි.

19. වේදනා වශයෙන් කිළිටි වූ හෝ චංචල වූ හෝ සිත සද්ධින්ද්‍රියාදී පසින් පිරිසිදු කළ හැකි බැවින් එහි ග්‍රාහය වළකන්නට මේ පස ප්‍රතිපත්ති වන බැවින් ද වෙදනින්ද්‍රියට අනතුරු වැ සද්ධාදි ඉන්ද්‍රිය පස දක්වන ලදි.

20. **අනඤ්ඤතඤ්ඤස්සාමීතින්ද්‍රිය නම්:** සෝවාන් මාර්ග සිතෙහි යෙදෙන ප්‍රඥා ය. සසර දී කිසිකලෙකත් නො දක්නා ලද චතුරාර්යසත්‍යය හෝ නිර්වාණය "අනඤ්ඤාත" ය යි කියනු ලැබේ. ඒ "චතුරාර්යසත්‍යය හෝ නිර්වාණය දනිමි"යි පිළිපන්නහුගේ ඉන්ද්‍රිය අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය යි. එනම් සෝවාන් මාර්ග ඥානය යි. එය සෝවාන් මාර්ග ජවන්හි සම්ප්‍රයුක්ත ධර්මයන්ට ඊශ්වර භාවය කෙරෙයි.

21. ප්‍රථම මාර්ගයෙන් දක්නා ලද චතුරාර්යසත්‍යය හෝ නිර්වාණය නො ඉක්මැ දන්නහු පිළිබඳ ඉන්ද්‍රිය අඤ්ඤින්ද්‍රිය යි. එනම් සෝවාන් ඵල, සකදෘගාමී මාර්ග සකෘදාගාමි ඵල, අනාගාමි මාර්ග, අනාගාමි ඵල, අර්හත් මාර්ග සිත්හි ප්‍රඥා ය. එ ද සම්ප්‍රයුක්ත ධර්මයන්ට ඊශ්වර භාවය කෙරෙයි.

22. චතුරාර්ය සත්‍යය හෝ නිර්වාණය දැනීමේ අවසානයට පැමිණි ක්ෂීණාශ්‍රව අඤ්ඤතාවී ය. ඔහු පිළිබඳ ඉන්ද්‍රිය අඤ්ඤාතාවින්ද්‍රිය ය. එනම් අර්හත්ඵල සිතෙහි ප්‍රඥාව ය. එ ද සම්ප්‍රයුක්ත ධර්මයන්ට ඊශ්වර භාවය කෙරෙයි. වදාළේ මැ යි. විභඞ්ගයෙහි: "**තත්‍ථ කතමං අඤ්ඤතාවින්ද්‍රියං? යාතෙසං ධම්මානං අඤ්ඤතාවිනං දිට්ඨානං පත්තානං විදිතානං සච්ඡිකතානං සච්ඡිකිරියාය පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි ධම්මවිචය සම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං ඉදං වුච්චති අඤ්ඤතාවින්ද්‍රිය" යි.**

ඒ ප්‍රතිපත්තියෙන් මේ ධර්මය පළමුකොටැ තමා කෙරෙහි පහළ වන්නේ ය යි ප්‍රතිපත්තියෙහි නො සිස් බව දක්වනු සඳහා "අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය" ද එහිම ඵලය වන බැවින් ද එයට අනතුරු වැ ලැබිය යුතු බැවින් ද ඉක්බිති "අඤ්ඤින්ද්‍රිය" ද

මතු කළ යුතු නැතැයි දක්වනු සඳහා ඉක්බිති “අඤ්ඤාතාවින්‍ද්‍රිය” ද දක්වන ලදැ යි දතයුතු යි.

**ප්‍රශ්න.**

1. මිශ්‍රක සංග්‍රහ යනු කිම? එහි කෙතෙක් කොටස් ඇතුළත් ද?
2. හේතු සය දක්වනු. ඔවුන් කුශලාකුශල අව්‍යාකෘත වශයෙන් බෙදනු.
3. ධ්‍යානාඞ්ග සත කවරේද? ඔහු කුමක් හෙයින් ධ්‍යානාඞ්ග වූ ද? දෝමනස්සය කවර ධ්‍යානාඞ්ගයෙක් ද?
4. මාර්ගාඞ්ග කෙතෙක් ද? කවරහු ද? මිච්ඡාදිට්ඨි ආදිය මාර්ගාඞ්ග යයි කීයේ කිම?
5. ඉන්‍ද්‍රිය කෙතෙක් ද? කවරහු ද? ඔහු කුමක් හෙයින් ඉන්‍ද්‍රිය නම් වූ ද? ඔවුන්ගේ අර්ථ පැහැදිලි කරනු. මේ පිළිවෙලින් දැක්වුණේ කිම?

## 5. මිශ්‍රක සංග්‍රහය (බල, අධිපති.)

### නව බල

බල නවය නම්:- **1 සද්ධාබල, 2 විරියබල, 3 සතිබල, 4 සමාධිබල, 5 පඤ්ඤාබල, 6 හිරිබල, 7 ඔත්තප්පබල, 8 අහිරිකබල, 9 අනොත්තප්පබල** යන මොහු යි.

බල නම් නැගි නැගී එන විරුද්ධ ධර්ම මැඩැලන ධර්ම යි. විරුද්ධ ධර්ම විසින් මැඩැලිය නො හැකි ධර්ම හෝ, යම් ධර්මයෙකින් මැනවින් හෝ නො මැනවින් ජීවත් වෙත් ද ඒ ධර්ම හෝ, සම්ප්‍රයුක්තයෙන් ස්ථිර වැ පවත්වන ධර්ම හෝ, බල ය යි කිය යුතු. එබඳු බල නවයෙකි.

1. සද්ධාව අස්සද්ධිය සංඛ්‍යාත ප්‍රතිපක්ෂ ධර්මය මැඩැලයි. එ බැවින් සද්ධා ව **සද්ධාබලය** යි කියනු ලැබේ. සෙසු අර්ථ ද මෙ සේ යෙදිය යුතු.

2. කුසීත භාව සංඛ්‍යාත ප්‍රතිපක්ෂ ධර්මය මඩනා බැවින් විරිය **විරිය බලය** වේ.

3. සිහි මුළා බැව් සංඛ්‍යාත ප්‍රතිපක්ෂ ධර්මය මැඩැලන බැවින් සතිය **සතිබල** වේ.

4. උද්ධච්ච (නො සන්සුන් බැව්) සංඛ්‍යාත ප්‍රතිපක්ෂ ධර්මය මැඩැලන බැවින් සමාධිය **සමාධිබලය** වේ.

5. අවිද්‍යා සංඛ්‍යාත ප්‍රතිපක්ෂ ධර්මය මැඩැලන බැවින් පඤ්ඤාව **පඤ්ඤා බලය** වේ.

6. අහිරික සංඛ්‍යාත ප්‍රතිපක්ෂ ධර්මය මැඩැලන බැවින් හිරිය **හිරිබලය** වේ.

7. අනොත්තප්ප (පාපයෙහි බියනැති බැව්) සංඛ්‍යාත ප්‍රතිපක්‍ෂධර්මය මැඩැලන බැවින් ඔත්තප්පය ඔත්තප්පබලය වේ.

8. හිරි (ලජ්ජා) සංඛ්‍යාත ප්‍රතිපක්‍ෂ ධර්මය මැඩැලන බැවින් අහිරිකිය **අහිරිකබලය** වේ.

9. ඔත්තප්ප සංඛ්‍යාත ප්‍රතිපක්‍ෂ ධර්මය මැඩැලන බැවින් අනොත්තප්පය අනොත්තප්ප බලය වේ.

මින් විරිය හා සමාධි කුශල අකුශල අව්‍යාකෘත බල ය. අහිරික හා අනොත්තප්ප අකුශල බල ය. සෙසු පස කුශල බල යි. අකුශල බල දෙක සම්ප්‍රයුක්ත ධර්මයන්හි ස්ථිරාර්ථයෙන්ම බල නාමය ලබන්නේ ය යනු එක් ටීකා මතයෙකි.

## සතර අධිපති

අධිපති සතර නම්: **1 ඡන්දධිපති, 2 විරියාධිපති, 3 චිත්තාධිපති, 4 වීමංසාධිපති** යන මොහු යි.

අධිපති නම්:- ඊශ්වර ය-ස්වාමි ය. ඊශ්වර වනාහි ප්‍රදේශ ඊශ්වර ය, සකල ඊශ්වරය යි ද්විවිධ වේ. ප්‍රදේශ ඊශ්වර නම් තුමූත් අන්‍යයන්ගේ වශයෙහි සිටිමින් අන්‍යයනුත් තමන්ගේ වශයෙහි පවත්වන්නෝ ය. සකල ඊශ්වර නම් තුමූ අන්‍යයන්ගේ වශයෙහි නො සිටිමින් අන්‍යයන් තමන්ගේ වශයෙහි පවත්වන්නෝ ය. යට දැක්වුණු ඉන්ද්‍රිය ප්‍රදේශ ඊශ්වරයන් වැන්න. ඔව්හු පරමාධිපති භාවය කරතියි කිව ද මේ අර්ථයෙන් ය යි ගත යුතු. අධිපතීහු සකල ඊශ්වරයන් වැන්නෝ ය. ඔව්හු පූර්වාභිසංස්කාර වශයෙන් හෝ පූර්වාගමන වශයෙන් හෝ එසේ සම්ප්‍රයුක්තයන්ට අධිපති භාවය කෙරෙත්. පූර්වාභිසංස්කාර නම් මේ ජන්මයෙහි අභිසංස්කරණය යි. පූර්වාගමන නම් පූර්ව ජන්මයෙහි ආසෙවිතත්වය යි.

1. ඡන්දය ම අධිපති වූයේ **ඡන්දධිපති** ය. **"ඡන්දවතො කිං නාම න සිජ්ඣති"** ඡන්දය ඇත්තහුගේ කිමෙක් නම් සිද්ධ නො වේ දැ යි කී හෙයින් පූර්වාභිසංස්කාර වශයෙන් හෝ පූර්වාගමන වශයෙන් හෝ ඒ ඒ කල්‍යාණ හෝ පාපයන්හි සම්ප්‍රයුක්ත ධර්මයන් ආත්මාධීන (තමාට යටත්) කොටැ පවත්නා කත්තුකම්‍යතා ඡන්දය **ඡන්දධීපති** ය. මෙයින් අධිපති වැ පවත්නා ඡන්ද චෛතසිකය දැක්වුණු බව දත යුතු.

2. චිත්තය ම අධිපති වූයේ **චිත්තාධිපති** ය. පූර්වාභිසංස්කරණ වශයෙන් හෝ පූර්වාගමන වශයෙන් හෝ සම්ප්‍රයුක්ත ධර්මයෙන් ආත්මාධීන කොටැ පවත්නා චිත්තය **චිත්තාධිපති** ය. මෙයින් අධිපති වැ පවත්නා චිත්තය දැක්වුණු බව දත යුතු.

3. විරිය ම අධිපති වූයේ **විරියාධිපති** ය. පූර්වාභිසංස්කරණ වශයෙන් හෝ පූර්වාගමන වශයෙන් හෝ සම්ප්‍රයුක්ත ධර්මයන් ආත්මාධීන කොටැ පවත්නා විරිය **විරියාධිපති** ය. මෙයින් අධිපති වැ පවත්නා විරිය චෛතසිකය දැක්වුණු බව දත යුතු.

4. වීමංසා ම අධිපති වූයේ **වීමංසාධිපති** ය. පූර්වාභිසංස්කරණ වශයෙන් හෝ පූර්වාගමන වශයෙන් හෝ සම්ප්‍රයුක්ත ධර්මයන් ආත්මාධීන කොටැ පවත්නා ප්‍රඥාව **වීමංසාධිපති** ය. මෙයින් අධිපති වැ පවත්නා ප්‍රඥාව දැක්වුණු බව දත යුතු.

චිත්ත, විරිය, වීමංසා ඉන්ද්‍රිය වශයෙන් ද යට දැක්විණි. වීමංසා නම් ප්‍රඥා. සක්විති රජ පුරෝහිතයාගෙන් කිසිවක් දැන ගැන්ම ඔහුගේ ආධිපත්‍යයට බාධක නොවේ.

### ප්‍රශ්න.

1. බල කෙතෙක් ද? කවරහු ද? කුමක් හෙයින් ඔහු බල නම් වූ ද?
2. බල කුශලා කුශල අව්‍යාකෘත වශයෙන් බෙදනු.
3. අහිරික අනොත්තප්ප බල ය යි කීයේ කිම?
4. අධිපති කෙතෙක් ද? කවරහු ද? ඔවුන්ගේ අර්ථ පැහැදිලි කරනු.
5. ඉන්ද්‍රිය අධිපතීන්ගේ වෙනස දක්වනු.

## 6. මිශ්‍රක සංග්‍රහය. (ආහාර)

### චතුර්විධ ආහාර.

චතුර්විධ ආහාර නම්: 1 **කබලීකාරාහාර**, 2 **ඵස්සාහාර**, 3 **මනොසංචෙතනාහාර** 4 **විඤ්ඤාණාහාර** යන මොහු ය.

ඔජට්ඨමක රූපාදිය ආහරණය කරන්නෝ - ගෙනැ දෙන්නෝ ආහාරයෝ ය. ඒ එසේ මැ යි. කබලීකාරාහාරය ඔජට්ඨමක රූප ආහරණය කෙරේ. ඵස්සාහාරය වේදනාව ආහරණය කෙරේ. මනොසංචෙතනාහාරය විඤ්ඤාණය ආහරණය කෙරේ. විඤ්ඤාණාහාරය නාම රූප ආහරණය කෙරේ. විස්තර මෙසේ යः

1. කබලීකාරාහාර නම්: අටවිසි රූපයන්ට ඇතුළත් ඔජා සංඛ්‍යාත ආහාර රූපය යි. එය පෘථිවි, අප්, තේජස්, වායු, වර්ණ, ගන්ධ, රස, ඔජස් යන රූප අට ආහරණය කෙරේ. සාලි බීජයෙන් නැගෙන සාලි අංකුරය පෘථිවි අප් රස ලැබීමෙන් නො සිඳී පවත්නේ ය. ක්‍රමයෙන් වර්ධනය ද වන්නේය. එ මෙන් කර්මයෙන් උපදනා ප්‍රතිසන්ධි රූප වනාහි ඍතු ආහාර ප්‍රත්‍යය ලැබීමෙන් පවත්නේ ය. වර්ධනය වන්නේ ය. ඍතුජ රූපයාගේ ද පැවැත්මට හා වර්ධනයට ආහාර රූප උපස්ථම්භක ය. තවද කර්මයෙන් ජනිත රූපයට

ආහාර වනාහි ජනක මාතාවගෙන් උපන් දරුවාට කිරි මව මෙන් ද ගෙට රුකුල මෙන් ද උපස්ථම්භක වන බව දත යුතු.

2. **ඵස්ස** නම්: දෙපණස් චෛතසිකයන්ට ඇතුළත් ඵස්ස චෛතසිකය යි. එය වේදනාව ආහරණය කරන බැවින් **ඵස්සාහාරය** යි කියනු ලැබේ. "**ඵස්ස පච්චයා වෙදනා**" යනු සලකනු. පක්ෂීහු තම තුඩින් ආහාර ගෙන කා ජීවත් වෙති. තුඩ නැත් නම් ඔවුන්ට ආහාර ගත නො හැකිය. ආහාර නැත්නම් ජීවත්විය නො හැකි ය. එ මෙන් සිතෙහි ඵස්ස නැත්නම් වේදනා නො ලැබේ. වේදනා නැත් නම් සත්ත්වයන්ගේ පැවැත්මෙක් නො වේ. සත්ත්වයෝ ඵස්සයෙන් ආරම්මණ රස ගෙනැ වේදනා සංඛ්‍යාත උපභෝග පරිභෝග සම්පාදනය කොටැ තෘෂ්ණා විපුලත්වයට පැමිණ කර්ම, විපාක, ක්ලේශ සංඛ්‍යාත ත්‍රිවිධ වෘත්තය පුරත්.

**මනොසංචෙතනා** නම්: දෙපණස් චෛතසිකයන්ට ඇතුළත් චේතනා චෛතසිකය යි. කර්මය යි කියනු ලබන්නේ මේ ය. "**චෙතනාහං භික්ඛවෙ කම්මං වදාමි**" යනු සලකනු. එය ප්‍රතිසන්ධි විඥානය ආහරණය කරන බැවින් **මනොසංචෙතනාහාර** ය යි කියනු ලැබේ. "**සංඛාර පච්චයා විඤ්ඤාණං**" යනු සලකනු. මෙහි සංඛාර නම් කුශලා කුශල කර්ම සංඛ්‍යාත චේතනා ය. විඤ්ඤාණ නම් ප්‍රතිසන්ධි චිත්ත ය යි. පක්ෂීහු පියාපත් පැහැරීමෙන් අතර බිම නො හී රුකින් රුකට වනයෙන් වනයට යමින් ජීවත් වෙති. පියාපත් නැත්නම් ඔවුන්ට යා නො හැකිය. නො යා හැකි නම් ජීවත් වීමෙක් නො වේ. සත්ත්වයෝ ආයූහන ලක්‍ෂණ වූ චේතනාව කර්මත්වයට පමුණුවා එයින් භවයෙන් භවයට යෙමින් සැරිසරති. චේතනාව නැත්නම් කර්ම වෘත්තය නැත. කර්ම වෘත්තය නැත්නම් විපාක වෘත්තය නැත. විපාක වෘත්තය නැත්නම් ක්ලේශ වෘත්තය නැත. එ විට භව ප්‍රවෘත්තිය ම නො වන්නේ ය.

4. **විඤ්ඤාණ** නම්: ප්‍රතිසන්ධි චිත්තය යි. එය නාම රූප ආහරණය කරන බැවින් **විඤ්ඤාණාහාර** ය යි කියනු ලැබේ. ප්‍රතිසන්ධි චිත්තය ඵස්සාදි චෛතසිකයන්ගෙන් යුක්ත ය. එසේ ම ඒ සමග කාම රූප භවයෙහි කර්මජ රූප ද ඇත්තේය. ප්‍රතිසන්ධි චිත්තය නැත්නම් ඵස්සාදිය ද ඒ සමග පවත්නා රූප ද නැත. එ බැවින් ප්‍රතිසන්ධි චිත්තය නාම රූපයන්ගේ පැවැත්මට ප්‍රත්‍යය වේ. මෙහි ඒ බව ම ආහාරත්වයෙන් කීය. "**විඤ්ඤාණපච්චයා නාමරූපං**" යනු සලකනු. පක්ෂීහු තම තමන්ගේ ඇසින් ගොදුරු ඇති තැන් හෝ ඒ ඒ දිසාභාග හෝ බලා දැනැ දිවි පවත්වා ගනිති. ඇස නැත්නම් ඔවුන්ට ඒ ඒ තැන් දැකැ ගැන්මෙක් නොවේ. නොදක්නවුන්ට දිවි රැකැ ගැන්මෙක් නොවේ. එසේ ම සම්ප්‍රයුක්ත ඵස්සාදීහු ආරම්මණ විජානන ලක්‍ෂණ විඥානයෙන් ඒ ඒ අරමුණු ලබති. විඥානය නැත්නම් ඵස්සාදීහු කැල ම එහි නැත. රූප ද එහි නැත. විඥානයෙන් ම ඒ නාම රූප එහි ඇත. එබැවින් විඤ්ඤාණය නාම රූප ආහරණය කරන බැවින් විඤ්ඤාණාහාරය යි වදාළෝ ය.

අධ්‍යාත්ම සන්තතියට විශේෂ ප්‍රත්‍යය වන බැවින් මේ සතර පමණක් ආහාරය යි දැක්විණි. දැක්වුණු පිළිවෙල දේශනා ක්‍රමය විනා උත්පත්ති ක්‍රමය නො වේ ය යි දත යුතු.

## සැලකිය යුතු විශේෂ.

ධ්‍යානාඞ්ග, බල, මාර්ගාඞ්ගාදිය පිළිබඳ මතු දැක්වෙන කරුණු විශේෂයෙන් සැලකිය යුතු. ඒ ඒ සිත්හි යෙදෙන චෛතසික සිතා බලනු.

1. විතක්ක, විචාර, පීති, එකග්ගතා, සෝමනස්ස, දෝමනස්ස, උපෙක්ඛා යන මේ සත ධ්‍යානාඞ්ග යයි යට දක්වන ලදි. එහෙත් චක්ඛු විඤ්ඤාණ **පංච විඤ්ඤාණ සිත්හි** පවත්නා එකග්ගතා ද වේදනා ද ධ්‍යානාඞ්ග නො වන බව දත යුතු. ඒ සිත්හි විතර්ක නැති බැවිනි. විතර්ක නැති සිත්හි පවත්නා එකග්ගතාව ද වේදනාව ද දුර්බල බැවින් ධ්‍යානාඞ්ග නො වේ. ධ්‍යානයෙහි ප්‍රධාන වන්නේ විතර්කය යි. ඒ මෙහි නැති. "**විතක්ක පච්ඡිමකං ඣානං**" විතර්කය පශ්චිම කොටැ ඇත්තේ ධ්‍යානය යනු එ හෙයින් කියන ලදි.

2. සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා, හිරි, ඔත්තප්ප, අහිරික, අනොත්තප්ප යන මේ නවය බලය යි යට කියන ලදි. එහෙත් දෙපස් විඤ්ඤාණ, මනොධාතුත්තික, සන්තීරණත්තික යන මේ සොළොස් සිත්හි පවත්නා **සමාධි** බල නො වේ. ඒ සිත්හි විරිය නැති බැවිනි. විරිය නැති සිත්හි එකග්ගතා යෙදුණ ද එය දුර්බල බැවින් බල නො වේ. "**විරියං පච්ඡිමකං බලං**" වීර්යය පශ්චිම කොටැ ඇත්තේ බලය යනු එ හෙයින් කියන ලදි.

3. සම්මාදිට්ඨි සම්මාසඞ්කප්ප ආදි දොළොස මාර්ගාඞ්ග යයි යට කියන ලදි. එහෙත් අහේතුක සිත්හි පවත්නා එකග්ගතා මාර්ගාඞ්ග නො වේ. අහේතුක සිත්හි හේතු නැති බැවිනි. "**හේතු පච්ඡිමකං මග්ගං**" හේතු පශ්චිම කොටැ ඇත්තේ මාර්ගාඞ්ග යයි එහෙයින් කියන ලදි.

4. එකග්ගතාව විචිකිච්ඡා සම්පයුත්ත චිත්තයෙහි ද ඇත්තේ ය. එහෙත් ඒ එකග්ගතාව අධිමෝක්ෂ රහිත වැ යෙදෙන බැවින් මිච්ඡාසමාධි, සමාධින්ද්‍රිය, සමාධිබල බවට නො පැමිණෙයි. අධිමෝක්ෂ රහිත තන්හි පවත්නා එකග්ගතා චිත්ත ස්ථිති මාත්‍රය ය. සමාධි බල, ඉන්ද්‍රිය වීමට සමර්ථ නැති.

5. ඡන්‍ද, විරිය, චිත්ත, විමංසා ය යි අධිපති සතරෙක් යට දක්වන ලදි. මොව්හු ද්විහේතුක ත්‍රිහේතුක ජවන්හි ම යෙදෙති. මොමූහ ජවන් දෙකෙහි ද හසන ජවනයෙහි ද නො යෙදෙති. යෙදෙන්නෝ ද පූර්වාභිසංස්කාර වශයෙන් ද පූර්වාගමන වශයෙන් ද ලැබෙන පරිදි යෙදෙති. වීමංසාධිපති ද්විහේතුක ජවන්හි කැලම නැති. මේ සතරම ඇති කල්හි දු අධිපති වන්නේ එකෙක් මැ ය. දෙදෙනෙක් හෝ වැඩියෙක් හේ අධිපති නො වතී. වතොත් අධිපති යන අර්ථ ම ව්‍යර්ථ වේ.

"**ඡ හෙතු පංච ඣානඞ්ගා මග්ගඞ්ගා නව වත්‍ථුතො**

**සොළසින්ද්‍රිය ධම්මා ච බලධම්මා නවෙරිතා**
.
**චත්තාරොධිපති වුත්තා තථාහාරා ති සත්තධා,**
**කුසලාදිසමාකිණ්ණො වුත්තො මිස්සකසඞ්ගහො.”**

වස්තු වශයෙන් හේතු සයෙකි. ධ්‍යානාඞ්ග පසෙකි. සොම්නස්, දොම්නස් උපේක්ෂා වේදනා වශයෙන් එකක් ම බැවිනි. මාර්ගාඞ්ග නවයෙකි. ඉන්ද්‍රිය සොළසෙකි. බල නවයෙකි. අධිපති සතරෙකි. ආහාර සතරෙකි. මෙසේ කුසලාදීන් සමාකීර්ණ වූ මිශ්‍රක සංග්‍රහය සත් ආකාර වේ.

ප්‍රශ්න.

1. ආහාර සතර දක්වා පැහැදිලි කරනු. මේ සතර පමණක් ආහාර නමින් දැක්වුණේ කිම?
2. “එකග්ගතා ධ්‍යානාඞ්ගයෙකි.” කවර සිත්හි යෙදෙන එකග්ගතා කුමක් හෙයින් ධ්‍යානාඞ්ග නො වේ ද?
3. “එකග්ගතා බල ධර්මයෙකි.” කවර සිත්හි යෙදෙන එකග්ගතා කුමක් හෙයින් බල නම් නො වේ ද?
4. “එකග්ගතා කුමක් හෙයින් මාර්ගාඞ්ග නො වේ ද?
5. අධිපති සතර අධිපති වන තැන් දක්වනු. මේ සතරම එක විට අධිපති වේ ද?

## 7. බෝධිපාක්ෂික සංග්‍රහය.

මිශ්‍රක සංග්‍රහයට ඉක්බිති බෝධිපාක්ෂික සංග්‍රහය දක්වනු ලැබේ. ඒ වනාහි **සතිපට්ඨාන, සම්මප්පධාන, ඉද්ධිපාද, ඉන්ද්‍රිය, බල, බොජ්ඣංග මග්ග** වසයෙන් කොටස් සතකට බෙදන ලද්දේ ය. එහි දු සතිපට්ඨාන සතරෙකි. සම්මප්පධාන සතරෙකි. ඉද්ධිපාද සතරෙකි. ඉන්ද්‍රිය පසෙකි. බල පසෙකි. බොජ්ඣංග සතෙකි. මාර්ගාඞ්ග අටෙකි. සියල්ල සත්තිසෙ (37) කි. **සත්තිස් බෝධිපාක්ෂික ධර්ම** යනු මේ යි.

බෝධි යනු සෝවාන් ආදි සතර මාර්ග සිත්හි යෙදෙන ප්‍රඥාවට නමෙකි. “**බෝධි වුච්චති චතූසු මග්ගෙසු ඤාණං.**” යනු එහෙයින් කියන ලදි. මේ සතර මාර්ගඥානය දුක්ඛාදි චතුස්සත්‍යය අවබෝධ කරයි. එ බැවින් එය බෝධි ය යි කියනු ලැබේ. “**චත්තාරි සච්චානි බුජ්ඣතී ති බොධි**” යනු විග්‍රහ යි. පක්ෂ නම් කොට්ඨාසය-සම්භාරය, බෝධි වෘක්ෂයෙහි වූවෝ බෝධිපාක්ෂිකයෝ ය. ඔහු නම් සති ආදි සත්තිස් ධර්මයෝ ය. නිවන් අරමුණු කරන-සෝවාන් ආදි සතර මාර්ග සිත්හි යෙදෙන සති ආදි සමූහය බෝධිපාක්ෂික නමින් මෙහි දැක්වෙන බව දත යුතු යි. ඔව්හු කොටස් වසයෙන් සතෙකි. විස්තර වශයෙන්

සත්තිසෙකි. මෙහි ඇතැම් චෛතසික ඒ ඒ කෘත්‍ය වශයෙන් නම් කීපය බැගින් ලබන බව සැලකිය යුතු යි.

## සතර සතිපට්ඨාන

සතිපට්ඨාන සතර නම්:

1. **කායානුපස්සනා සතිපට්ඨානය,**
2. **වේදනානුපස්සනා සතිපට්ඨානය,**
3. **චිත්තානුපස්සනා සතිපට්ඨානය**
4. **ධම්මානුපස්සනා සතිපට්ඨානය** යන මොහු යි.

සති නම් සිහිය යි - එ නම් දෙපණස් චෛතසිකයන් අතුරෙහි දැක්වුණු සති චෛතසිකය යි. **පට්ඨාන** නම් ප්‍රමුඛ ව, ප්‍රධාන වැ සිටින්නේ යි-සම්ප්‍රයුක්තයන් අතුරෙහි ප්‍රධාන වැ නොයෙක් අරමුණුවල සිත දුවන්නට ඉඩ නො දී පවත්නේ යි. සති ම පට්ඨාන වූයේ සතිපට්ඨාන ය. සිත නොයෙක් අරමුණුවල දුවන්නට ඉඩ නො දී එක ම අරමුණක බැඳැ මෙන් පවත්වන සතිය සතිපට්ඨානය යි කී නියා යි. ඒ වනාහි අරමුණු වශයෙන් චතුර්විධ වේ.

1. ආශ්වාස ප්‍රශ්වාසාදි රූපකායයෙහි ඒ කය අනු වැ බැලීම් වශයෙන් පවත්නා සතිපට්ඨානය **කායානුපස්සනා සතිපට්ඨානය.** කයෙහි කය අනු වැ බැලීම ආශ්වාස ප්‍රශ්වාස වශයෙන්, ඉරියාපථ වශයෙන්, චතුසම්පජඤ්ඤ වශයෙන්, පටික්කූල මනසිකාර වශයෙන්, ධාතුමනසිකාර වශයෙන්, නව සීවථික වශයෙන් යැ යි තුදුස් ආකාරයෙකින් වන්නේ ය.

2. නවවිධ වේදනායෙහි ඒ වේදනා අනුව බැලීම් වශයෙන් පවත්නා සතිපට්ඨානය **වේදනානුපස්සනා සතිපට්ඨානය** යි. නවවිධ වේදනා නම්-සුඛ දුක්ඛ, උපේක්‍ෂා, සාමිස සුඛ, දුඃඛ, උපෙක්‍ෂා, නිරාමිස සුඛ, දුඃඛ උපෙක්‍ෂා යි.

3. සොළොස් වැදෑරුම් චිත්තයෙහි ඒ චිත්තය අනු වැ බැලීම් වශයෙන් පවත්නා සතිපට්ඨානය **චිත්තානුපස්සනා සතිපට්ඨානය** යි. සොළොස් වැදෑරුම් චිත්ත නම්-සරාග චිත්ත, වීතරාග චිත්ත, සදොස චිත්ත, වීතදොස චිත්ත, සමොහ චිත්ත, වීතමොහ චිත්ත, සංඛිත්ත චිත්ත, වික්ඛිත්ත චිත්ත, මහග්ගත චිත්ත, අමහග්ගත චිත්ත, සඋත්තර චිත්ත, අනුත්තර චිත්ත, සමාහිත චිත්ත, අසමාහිත චිත්ත, විමුත්ත චිත්ත, අවිමුත්ත චිත්ත යි.

4. පස්වැදෑරුම් ධර්මයෙහි ඒ ධර්මය අනු වැ බැලීම් වශයෙන් පවත්නා සතිපට්ඨාන **ධම්මානුපස්සනා සතිපට්ඨානය** යි. පස් වැදෑරුම් ධර්ම නම්-පඤ්චනීවරණ, පඤ්චස්කන්ධ, ද්වාදසායතනා සත්තබොජ්ඣඞ්ග-චතුරාර්ය සත්‍ය යි. විස්තර **සතිපට්ඨාන සූත්‍රයෙහි** ය.

මේ සතිය සීලවිසුද්ධි ආදි ආරම්භයෙහි පටන් ලෞකික ය. මාර්ගයෙහි ලෝකෝත්තරය යි දත යුතු.

## සතර සම්‍යක් ප්‍රධාන

සම්‍යක් ප්‍රධාන සතර නම්:-

1. **උපන් අකුසල ධර්ම ප්‍රහාණය කැරැ ගැන්ම පිණිස කරනු ලබන වීර්යය.**
2. **නූපන් අකුශල ධර්ම නූපදවා ගැන්ම පිණිස කරනු ලබන වීර්යය.**
3. **නූපන් කුශල ධර්ම උපදවා ගැන්ම පිණිස කරනු ලබන වීර්යය.**
4. **උපන් කුශල ධර්ම වර්ධනය කැරැ ගැන්ම පිණිස කරනු ලබන වීර්යය** යන මොහු යි.

සම්‍යක් ප්‍රධාන නම් යහපත් වීර්යය යි. දෙපණස් චෛතසික අතුරෙන් විරිය චෛතසිකය යි. මෙහි ප්‍රධාන යන්නෙන් වීර්යය කියනු ලැබේ. කෙ බඳු වීර්යයෙක් ද? "ඒකාන්තයෙන් මාගේ ශරීරයෙහි සම් ඇට නහර ඉතිරි වේවා, මස් ලේ වියලේවා, පුරුෂ ශක්තියෙන්, පුරුෂ පරාක්‍රමයෙන් යම් ගුණයක් ලබා ගත හැකි ද? ඒ නො ලබා වීර්යයාගේ නැවැත්මෙක් නො වේ" ය යි මෙසේ උපදනා නො පසු බස්නා වීර්යය යි. එය එකක් ම වුව ද කෘත්‍ය වශයෙන් චතුර්විධ වේ.

1. උපන් අකුශල ධර්ම ප්‍රහාණය කැරැ ගැන්ම පිණිස වීර්ය කිරීමනම්:- "අසුවල් කල අසුවල් දේශයෙහි දී අසුවල් තැන දී මට මෙබඳු අකුශලයෙක් සිදු විය. නිවන් හිමි කොටැ මම තවද එ බඳු අකුශලයක් නොකරමි"යි මෙසේ උපන් අකුසල් දුරු කැරැ ගැන්ම පිණිස ශීල පූරණ, සමථ, විදර්ශනා භාවනායෙහි ඇඩි ව්‍යායාම කිරීම යි. උපන් අකුසල් ඒ ඒ ඇසිල්ලෙහි ම නිරුද්ධ වෙයි. එහි ප්‍රහාණය කිමෙක් දැ යි නො සිතිය යුතු. ඒ ඒ උපන් අකුසල් ගැන සිතා එ බඳු අකුසල් මතු නොකරන සේ උත්සාහ කිරීමයි මේ කීයේ.

2. නූපන් අකුශල ධර්ම නූපදවා ගැන්ම පිණිස වීර්ය කිරීම නම්-ස්ව සන්තානයෙහි මේ තාක් නූපන්-අනුන් කරනු දුටු විරූ හෝ ධර්මයෙහි ඇසූ විරූ හෝ අකුසල වේ නම් එ බන්දක් මම කිසි කලෙක නූපදවමි යි උත්සාහ කිරීම ය.

3. නූපන් කුශල ධර්ම උපදවා ගැන්ම පිණිස වීර්ය කිරීම නම්, චතුර්භූමක කුශල අතුරෙන් හෝ සප්ත විසුද්ධි අතුරෙන් හෝ යමක් තමා මේ තාක් නො ලද්දේ නම් කල් නො ඉක්මැ ඒ ලැබ ගැන්ම පිණිස උත්සාහ කිරීම ය.

4. උපන් කුශල ධර්ම වර්ධනය කැරැ ගැන්ම පිණිස වීර්ය කිරීම නම්, "ශීලා දී වූ මාගේ යම් කුශල ධර්ම කෙනෙක් වෙත් ද එය මාර්ග ඥානය ලබන තාක් මාගේ යයි කිය නො හැකිය. හෙට හෝ අනිද්දා හෝ මතු ජන්මයෙහි හෝ බිඳී යා හැකිය." මෙසේ සිතා තම සතන්හි උපන් කුශල ධර්ම අකොප්‍ය වන සේ පවත්වා ගන්නට උත්සාහ කිරීම යි. නොහොත් තමහට ඉපිද තිබෙන ත්‍රෛභූමක කුශල ධර්ම බඳු අන්‍ය වූත් කුශල ධර්ම

උපදවා ගැන්ම පිණිස වීර්ය කිරීම යි. ලෝකෝත්තර කුශල වරක් උපන්නොත් එබන්දෙක් නැවත උපදිය යනු කැලම නැති.

මෙ ද ගොත්‍රභූ තාක් ලෞකික ය. මාර්ගයෙහි ලෝකොත්තර යි. මාර්ගයෙහි වීර්යය සතර කෘත්‍යය ම එක විට සිද්ධ කෙරේ.

ප්‍රශ්න.

1. බෝධිපාක්ෂික ධර්ම යන්නෙහි අර්ථය පැහැදිලි කරනු.
2. බෝධිපාක්ෂික ධර්ම කෙතෙක් ද? එය කොටස් කීයකට බෙදිණි ද? ඒ කවරේ ද?
3. සතර සතිපට්ඨාන කවරේ ද? සතිපට්ඨාන යන්නෙහි අර්ථය පැහැදිලි කරනු.
4. සම්‍යක් ප්‍රධාන සතර දක්වනු.
5. සම්‍යක් ප්‍රධාන යන්නෙහි අර්ථය පැහැදිලි කොට එය චතුර්විධ වීමේ හේතු දක්වනු.

## 8. බෝධිපාක්ෂික ධර්ම (ඍද්ධිපාද, ඉන්ද්‍රිය, බල)

සතර ඍද්ධිපාද.

ඍද්ධිපාද සතර නම්,

1 ඡන්දිද්ධිපාදය, 2 විරියිද්ධිපාදය, 3 චිත්තිද්ධිපාදය, 4 වීමංසිද්ධිපාදය යන මොහු යි.

ඍද්ධි නම් සිද්ධිය යි-සමෘද්ධ වීම යි. ඒ ඒ යෝග කර්මයාගේ නිපැද්ම යි. ඒ වනාහි අභිඥෙය ධර්මයාගේ අභිඥා සිද්ධිය, පරිඥෙය ධර්මයාගේ පරිඥාසිද්ධිය, ප්‍රහාතව්‍ය ධර්මයාගේ ප්‍රහාණ සිද්ධිය සාක්ෂාත් කටයුතු ධර්මයාගේ සාක්ෂාත් සිද්ධිය භාවිතව්‍ය ධර්මයාගේ භාවනා සිද්ධිය යි පස් වැදෑරුම් වේ. පාද නම් හේතුව-කාරණය. යථෝක්ත ධර්මයන්ගේ සමෘද්ධියට හේතු බලවත් උපාය ඍද්ධිපාද යි. ඒ ඍද්ධිපාද වනාහි චතුර්විධ අධිපතීන්ගේ වශයෙන් චතුර්විධ වේ.

1. අධිපති වූ ඡන්දය ම ඉද්ධිපාද වූයේ ඡන්දිද්ධිපාදය. සෝවාන් ආදි මාර්ග සිත්හි පවත්නා අධිපති වූ ඡන්දය චතුස්සත්‍යාවබෝධයට පාද-බලවත් උපාය වන්නේ ය. යම්කිසි උපායෙකින් බැහැර කට හැකි සාමාන්‍ය ඡන්දය එයට උපාය නො වන්නේ ය.

2. අධිපති වූ විරියම ඉද්ධිපාද වූයේ විරියිද්ධිපාදය. සෝවාන් ආදී සිත්හි පවත්නා අධිපති වූ විරිය චතුස්සත්‍යාවබෝධයට පාද-බලවත් උපාය වන්නේ ය. යම්කිසි උපායෙකින් බැහැර කට හැකි සාමාන්‍ය විරිය එයට උපාය නො වන්නේ ය.

3. අධිපති වූ චිත්තයම ඉද්ධිපාද වූයේ චිත්තිද්ධිපාදය සෝවාන් ආදි මාර්ග සිත ම චතුස්සත්‍යාවබෝධයට පාද-බලවත් උපාය වන්නේ ය. යම් කිසි උපායකින් බැහැර කළ හැකි චිත්තය එයට උපාය නො වන්නේ ය.

4. අධිපති වූ වීමංසා (ප්‍රඥා) වම ඉද්ධිපාද වූයේ වීමංසිද්ධිපාදය. සෝවාන් ආදී මාර්ග සිත්හි පවත්නා අධිපති වූ ප්‍රඥාවම චතුස්සත්‍යාවබෝධයට පාද - බලවත් උපාය වන්නේ ය. යම් කිසි පළිබෝධයකින් බැහැර කළ හැකි සාමාන්‍ය ප්‍රඥාව එයට උපාය නො වන්නේ ය.

සෝවාන් ආදි මාර්ග සිත්හි යෙදෙන ඡන්‍ද, විරිය, චිත්ත, ප්‍රඥා ඍද්ධිපාද වූ බව මෙයින් දත යුතුය. මාර්ග සිත්හි යෙදෙන කල මොව්හු ලෝකෝත්තර ය. සෙසු ශීලවිශුද්ධි ආදියෙහි ලෞකික යි.

ඍද්ධි නම් ඍද්ධිවිධ ඥානය යි. එයට පාද වූයේ ඍද්ධි පාද යි. මේ වශයෙන් ද ඍද්ධිපාද සතර දත යුතු යි. මෙහි දී වනාහි පළමු දැක්වුණු ක්‍රමය ම යෙදේ. බෝධිපාක්ෂික වශයෙන් කියන බැවිනි.

### පඤ්චින්‍ද්‍රිය

ඉන්‍ද්‍රිය පසනම්: **1 සද්ධින්ද්‍රිය, 2 විරියින්ද්‍රිය, 3 සතින්ද්‍රිය 4 සමාධින්ද්‍රිය, 5 පඤ්ඤින්ද්‍රිය** යන මොහු යි.

මොවුන්ගේ අර්ථ බාවීසතින්ද්‍රිය විභාගයෙහි දක්වන ලදි. මාර්ග සිත්හි පවත්නා ස්දධාව ඉන්‍ද්‍රිය වූයේ - ඊශ්වර වූයේ සද්ධින්‍ද්‍රිය ය. විරිය ඉන්‍ද්‍රිය වූයේ - ඊශ්වර වූයේ **විරියින්ද්‍රිය** ය. සතිය ඉන්‍ද්‍රිය වූයේ - ඊශ්වර වූයේ - **සතින්ද්‍රිය** ය. සමාධිය ඉන්‍ද්‍රිය වූයේ ඊශ්වර වූයේ - **සමාධින්ද්‍රිය** ය. ප්‍රඥාව ඉන්ද්‍රිය වූයේ - ඊශ්වර වූයේ **පඤ්ඤින්ද්‍රිය** ය. සද්ධින්ද්‍රිය සතර සෝතාපත්ති අංගයෙහි ද, විරියින්‍ද්‍රිය සතර සම්‍යක් ප්‍රධානයෙහි ද සතින්ද්‍රිය සතර සතිපට්ඨානයෙහි ද, සමාධින්ද්‍රිය චතුර්ථධ්‍යානයෙහි ද, පඤ්ඤින්‍ද්‍රිය චතුරාර්ය සත්‍යයෙහි ද දැක්ක යුතුයි.

මේ ද ශීලවිශුද්ධි ආදියෙහි ලෞකික ය. මාර්ගයෙහි ලෝකෝත්තර යි.

### පඤ්ච බල.

බල පස නම්:
**1 සද්ධාබල, 2 විරිය බල, 3 සති බල, 4 සමාධි බල, 5 පඤ්ඤා බල** යන මොහු යි.

මොවුන්ගේ අර්ථ නවබල විභාගයෙහි දක්වන ලදි. සද්ධාදි පස ම බලත්‍වයට පැමිණියේ සද්ධාබලාදි වන්නේ ය. සෙස්ස පඤ්චින්‍ද්‍රියෙහි මෙනි. මෙ ද ශීලවිශුද්ධි ආදියෙහි පටන් ලෞකික ය. මාර්ගයෙහි ලෝකෝත්තර යි.

**ප්‍රශ්න.**

1. ඍද්ධිපාද සතර දක්වනු. එහි අර්ථ ද පැහැදිලි කරනු.
2. පංච ඉන්ද්‍රිය කවරේ ද?
3. පංච බල කවරේ ද?
4. ඉන්‍ද්‍රිය, බල ධර්මයන්ගේ වෙනස දක්වනු.
5. මොවුන්ගේ ලෞකික ලෝකෝත්තර අවස්ථා දක්වනු.

## 9. බෝධිපාක්ෂික ධර්ම (සම්බොජ්ඣඞ්ග, මග්ගඞ්ග)

**සම්බොජ්ඣඞ්ග සත නම්,**
**1 සතිසම්බොජ්ඣඞ්ගය, 2 ධම්මවිචය බොජ්ඣඞ්ගය, 3 විරිය සම්බොජ්ඣඞ්ගය, 4 පීතිසම්බොජ්ඣඞ්ගය, 5 පස්සද්ධි සම්බොජ්ඣඞ්ගය, 6 සමාධි සම්බොජ්ඣඞ්ගය, 7 උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගය** යන මොහු යි.

සම්බෝධි යනු සතර මාර්ග ඥානයට නමෙකි. එයින් චතුස්සත්‍යය හෝ නිර්වාණය හෝ මනාකොට අවබෝධ කෙරෙයි යන අර්ථයෙන් සම්බෝධිය උපදවන අඞ්ගයෝ-සහකාරි බලවත් ප්‍රත්‍යයෝ සම්බොජ්ඣඞ්ගයෝ ය. සෝවාන් ආදි සතර මාර්ග ඥානය උපදවන්නා වූ එහි සම්ප්‍රයුක්ත වූ ධර්ම සමූහයෙක් චෛතසික කොටසෙක් සම්බොජ්ඣඞ්ගයෝ ය යි කී නිසා දත යුතුයි. “සතර මාර්ගඥානය උපදවන්නාවූ” යන මෙයින් ශීල විශුද්ධි ආදියෙහි යෙදෙන සති ආදි ලෞකික ද, “එහි සම්ප්‍රයුක්ත වූ යන්නෙන්” මාර්ගයෙහි යෙදෙන සති ආදි ලෝකෝත්තර ද කියවෙන්නේය. මෙහිලා ලෝකෝත්තරය විශේෂයෙන් අභිප්‍රේත යි.

1. සති ම සම්බොජ්ඣඞ්ග වූයේ සතිසම්බොජ්ඣඞ්ගය. සති යනු සති චෛතසිකය යි. ඒ වනාහි කායාදි චතුර්විධ අරමුණුයෙහි යොදා වඩන්නේ පිළිවෙලින් ප්‍රමාද පක්‍ෂය මැඩ අප්‍රමාද පක්‍ෂය පුරා චතුමාර්ගඥාන සංඛ්‍යාත සම්බෝධිය නංවා ලන්නේ ය.

2. ධම්මවිචය නම් ප්‍රඥාය. ධර්මයන් විචනය-උපධාරණය කරන්නේය යන අර්ථයෙන්. මෙහි ධර්ම යන්නෙන් විදර්ශනාවට භූමි වූ ආධ්‍යාත්මික වූ ද බාහිර වූ ද පඨවි ඵස්සාදි ත්‍රෛභූමක ධර්ම ගනු ලැබේ. විචයන නම් ඒ ධර්ම, රූප නම් කර්කශත්වාදි වශයෙන් හෝ අනිත්‍යාදි වශයෙන් හෝ විවිධාකාරයෙන් ද, නාම නම් ඵුසනාදි වශයෙන් හෝ අනිත්‍යාදි වශයෙන් හෝ විවිධාකාරයෙන් ද විශේෂයෙන් බැලීම යි. මෙසේ ධර්ම විචයන කරන්නේ ධර්මවිචය ය. ඒ කිමෙක් ද? ප්‍රඥා ය. ධම්ම විචය ම සම්බොජ්ඣඞ්ග වූයේ ධම්මවිචය සම්බොජ්ඣඞ්ගය. මෙයින් මාර්ග සිත් යෙදෙන ප්‍රඥාව කියන ලදැ යි දත යුතු. ඒ වනාහි තාමට විෂය වන ත්‍රෛභූමික ධර්මයෙහි භාවනා වශයෙන් නොවැ වැඩෙන්නේ

පිළිවෙලින් සියලු අවිද්‍යා පක්‍ෂ මැඩැ ගෙනැ සියලු ප්‍රඥා පක්‍ෂ පුරා ගෙනැ තෙමේ ම චතුමාර්ගඥාන සංඛ්‍යාත සම්බෝධි වන්නේ ය.

3. සතර සම්‍යක් ප්‍රධාන සංඛ්‍යාත වීර්යය ම සම්බොජ්ඣංග වූයේ **විරිය සම්බොජ්ඣංගය.** විරිය වනාහි ස්වකීය චතුර්විධ ගොචරයෙහි භාවනා වශයෙන් වඩන්නේ පිළිවෙලින් කුශල ධර්ම පිළිබඳ ඇකිලෙන පැකිලෙන මැලවෙන සියලු ක්ලේශ පක්‍ෂ මැඩැ සියලු ධුර-ප්‍රග්‍රහ පක්‍ෂ පුරා චතුමාර්ගඥාන සංඛ්‍යාත සම්බෝධිය නංවන්නේ ය.

4. පීතිය ම සම්බොජ්ඣංග වූයේ **පීතිසම්බොජ්ඣංගය.** පීතිය වනාහි ස්වකීය විෂයයෙහි මනා වැ වැඩෙන්නේ කුශල ධර්ම පිළිබඳ සියලු අරති, උකටලි පක්‍ෂ මැඩැ සියලු ධර්මරති, ධර්මනන්‍දි, ධර්මරාම පක්‍ෂ පුරා චතුමාර්ගඥාන සංඛ්‍යාත සම්බෝධිය නංවන්නේ ය.

5. පස්සද්ධිය ම සම්බොජ්ඣංග වූයේ **පස්සද්ධි සම්බොජ්ඣංගය.** පස්සද්ධි නම් කාය පස්සද්ධි චිත්ත පස්සද්ධි චෛතසික යුගලය යි. මෙහි ලා ඒ දෙක එකක් වශයෙන් සලකනු ලැබේ. පස්සද්ධිය වනාහි ස්වකීය විෂය ධර්මයෙහි භාවනා වශයෙන් මනාවැ වඩන්නේ චිත්තය පිළිබඳ සියලු තද-දැඩි බැව් මැඩැ සියලු ව්‍යුපශම-ශීතල පක්‍ෂ පුරා චතුමාර්ගඥානය සංඛ්‍යාත සම්බෝධිය නංවන්නේ ය.

6. සමාධිය ම සම්බොජ්ඣඞ්ග වූයේ **සමාධි සම්බොජ්ඣංගය.** සමාධි නම් එකග්ගතා යි. මෙ ද ස්වකීය ගොචරයෙහි භාවනා වශයෙන් වඩන්නේ චිත්තයාගේ නො සන්සුන් බව මැඩ එකඟ බව වඩා සම්බෝධිය නංවන්නේ ය.

7. උපෙක්‍ෂාව ම සම්බොජ්ඣංග වූයේ උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගය. උපෙක්ඛා නම් තත්‍රමජ්ඣත්තතා යි. එ ද ස්වකීය ගොචරයෙහි භාවනා වශයෙන් වඩන්නේ චිත්තය පිළිබඳ සියලු ලීන උද්ධච්ච පක්‍ෂ මැඩ මධ්‍යස්ථ පක්‍ෂ වඩා මාර්ගඥාන සංඛ්‍යාත සම්බෝධිය නංවන්නේ ය.

මේ ද ශීල විශුද්ධි ආදියෙහි ලෞකික ය. මාර්ගයෙහි ලෝකෝත්තරය යි දත යුතු යි.

## ආර්ය අෂ්ටාංගික මාර්ගය

ආර්ය මාර්ගාඞ්ග අට නම්:

**1 සම්මා දිට්ඨි, 2 සම්මා සංකප්ප, 3 සම්මා වාචා, 4 සම්මා කම්මන්ත, 5 සම්මා ආජීව, 6 සම්මා වායාම, 7 සම්මා සති, 8 සම්මා සමාධි** යන මොහු යි.

ආර්යමාර්ග යනු උතුම් මාර්ගය. චතුස්සත්‍යාවබෝධ පිණිස නිවන් යනු පිණිස පවත්නා උතුම් පාර ය. එය අංග අටෙකින් යුක්ත ය. මාර්ග වන්නේ මේ අංග අටම ය. අංග අට හැර මාර්ගය යි අනිකෙක් නැති.

1. **සම්මා දිට්ඨි** නම් ප්‍රඥා ය. එයින් මනා වැ-අවිපරීත වැ-දන්නේ ය යන අර්ථයෙන්. ඒ වනාහි දුක්ඛෙ ඤාණය, දුක්ඛ සමුදයෙ ඤාණය, දුක්ඛ නිරොධෙ ඤාණය, දුක්ඛ නිරොධගාමී පටිපදාය ඤාණය යි චතුර්විධ වේ. සෝවාන් ආදි මාර්ග සිත්හි යෙදෙන ප්‍රඥා චෛතසිකය සම්මාදිට්ඨි නමින් දැක්වෙන බව දත යුතු. එය මාර්ගාංග බැවිනි.

2. **සම්මා සංකප්ප** නම් යහපත් විතර්කය. එයින් මනා වැ-අවිපරීත වැ සංකල්පනය කරන්නේ ය යන අර්ථයෙන්. මාර්ග සිත් හි යෙදෙන විතර්ක චෛතසිකය සම්මා සංකප්ප නමින් දැක්වුණු බව දත යුතු යි.

3. **සම්මා වාචා 4 සම්මා කම්මන්ත, 5 සම්මා ආජීව** යනු විරතිත්‍රය ය. එහි විස්තර යට දැක්විණි.

6. **සම්මා වායාම** යනු යහපත් වීර්යය. සතර සම්‍යක් ප්‍රධාන වූයේත් මේ ය.

7. **සම්මා සති** යනු යහපත්-අවිපරීත සතිය යි. සතර සතිපට්ඨාන වූයේ ත් මේ ය.

8. **සම්මා සමාධි** යනු යහපත්-අවිපරීත එකග්ගතා යි.

මේ ද මාර්ග සිත්හි ලෝකෝත්තර ය ශීල විශුද්ධි ආදියෙහි ලෞකික ය. අෂ්ටාඞ්ගික මාර්ග පිළිබඳ විස්තර ප්‍රසිද්ධ බැවින් සංක්ෂිප්ත කරන ලදි.

**ප්‍රශ්න.**

1. සප්ත සම්බොජ්ඣඞ්ග දක්වනු.
2. සම්බොද්‍යඞ්ග යන්නෙහි අර්ථය පැහැදිලි කරනු.
3. සම්බොජ්ඣඞ්ග නමින් දැක්වුණු චෛතසික මේ මේය යි දක්වනු.
4. පස්සද්ධි සම්බොජ්ඣඞ්ගය යනු කිම?
5. මේ සත ලෞකික වන්නේ කොතැන්හි ද? ලෝකෝත්තර වන්නේ කොතැන්හි ද?

## 10. බෝධිපාක්ෂික සංග්‍රහය (තුදුස) (14) (පන්තිස) (35) වන සැටි.)

බෝධිපාක්ෂික ධර්ම සභාග සංග්‍රහ වශයෙන් කොටස් සතකට ද, ස්වභාව ධර්ම වශයෙන් තුදුසකට ද, ප්‍රභේද වශයෙන් පන්තිසකට ද බෙදනු ලැබේ. ඉන් සභාග සංග්‍රහ වශයෙන් කොටස් සතට බෙදෙන සැටි ද එහි විස්තර ද යට දක්වන ලදි. ස්වභාව ධර්ම වශයෙන් තුදුස මෙසේ ය.

බෝධිපාක්ෂික ධර්ම වනාහි ස්වභාව ධර්ම වශයෙන් බලතහොත් ඡන්දය, චිත්ත, උපෙක්‍ෂා, සද්ධා, පස්සද්ධි, පීති, පඤ්ඤා, විතක්ක, විරිය, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සති, එකග්ගතා යි තුදුසෙකි. සත්තිසක් වශයෙන් ප්‍රභේදයට ගියේ මේ තුදුස ය. සංග්‍රහ සතකට බෙදුණේ ඒ සත්තිස ය.

කියන ලද මැ යි.

**"ඡන්‍දෙ චිත්තමුපෙක්ඛා ච සද්ධා පස්සද්ධි පීතියො**
**සම්මා දිට්ඨී ච සංකප්පො වායාමො විරතිත්තයං**
**සම්මා සති සමාධීති චුද්දසෙතෙ සභාවතො**
**සත්තතිංස පභෙදෙන සත්තධා තත්‍ථ ස ගහො"** යි.

මින් සංකප්ප, (විතර්ක) පස්සද්ධි, පීති, උපෙක්ඛා, ඡන්ද, චිත්ත, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව යන මේ නවය, එකස්ථානික ය. හෙවත් එක් තැනෙක පමණක් ආයේ ය. ඒ එසේ මැ යි.

1. **සංකප්ප.** (විතර්කය) මෙය සම්මා සංකප්පය යි ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි පමණක් ආයේ ය. වෙන තැනෙක නො ආයේ ය.
2. **පස්සද්ධි.** පස්සද්ධි සම්බොජ්ඣංගය යි සම්බොජ්ඣංග ධර්මයෙහි පමණක් ආයේ ය. වෙන තැනෙක නො ආයේ ය.
3. **පීති.** පීති සම්බොජ්ඣංග නමින් සම්බොජ්ඣංග ධර්මයෙහි පමණක් ආයේ ය. වෙන තැනෙක නො ආයේ ය.
4. **උපෙක්ඛා.** උපෙක්ඛා සම්බොජ්ඣංග නමින් සම්බොජ්ඣංග ධර්මයෙහි ආයේ ය. වෙන තැනෙක නො ආයේ ය.
5. **ඡන්ද.** ඡන්දිද්ධිපාද නමින් ඉද්ධිපාද ධර්මයෙහි ආයේ ය. වෙන තැනෙක නො ආයේ ය.
6. **චිත්ත.** චිත්තිද්ධිපාද නමින් ඉද්ධිපාද ධර්මයෙහි ආයේ ය. වෙන තැනෙක නො ආයේ ය.
7. **සම්මා වාචා 8. සම්මා කම්මන්ත, 9. සම්මා ආජීව** යන විරති තුන මාර්ගාඞ්ග ධර්මයෙහි ආයේ ය. වෙන තැනෙක නො ආයේ ය. එක ස්ථානිකය යි කීයේ එ හෙයිනි.

**විරිය නවස්ථානික** ය-හෙවත් නව තැනෙක ආයේ ය. සතර සම්‍යක් ප්‍රධාන, විරියිද්ධිපාද, විරියින්‍ද්‍රිය, විරියබල, විරිය සම්බොජ්ඣඞ්ග, සම්මා වායාම යන මෙ වශයෙන්, එක ම විරිය සම්‍යක් ප්‍රධාන වැ ද, ඍද්ධිපාද වැ ද, ඉන්‍ද්‍රිය වැ ද, බල වැ ද, සම්බොජ්ඣඞ්ග වැ ද, මාර්ගාඞ්ග වැ ද, පවත්නා සැටි මෙයින් අවබෝධ කැරැ ගත යුතු.

සතිය අෂ්ටස්ථානික ය-හෙවත් අට තැනෙක ආයේ ය. සතර සතිපට්ඨාන, සතින්ද්‍රිය, සතිබල, සති සම්බොජ්ඣඞ්ග, සම්මා සති යන මේ වශයෙන් එක මස තිය සතිපට්ඨාන වැ ද, ඉන්ද්‍රිය වැ ද, බල වැද, බොජ්ඣංග වැ ද, මාර්ගාඞ්ග වැ ද පවත්නා සැටි මෙයින් අවබෝධ කැරැ ගත යුතු.

**සමාධිය චතුඃස්ථානික** ය-හෙවත් සතර තැනෙක ආයේ ය. සමාධින්ද්‍රිය, සමාධි බල සමාධි සම්බොජ්ඣංග සම්මා සමාධි යන මේ වශයෙන්. එක ම සමාධිය (එකග්ගතාව) ඉන්ද්‍රිය වැද බල වැ ද, බොජ්ඣංග වැ ද, මාර්ගාංග වැ ද පවත්නා සැටි මෙයින් අවබෝධ කැරැ ගත යුතු.

**ප්‍රඥාව පඤ්චස්ථානික** ය-හෙවත් පස් තැනෙක ආයේ ය. වීමංසිද්ධිපාද, පඤ්ඤින්‍ද්‍රිය, පඤ්ඤා බල, ධම්මවිචය සම්බොජ්ඣංග, සම්මා දිට්ඨි යන මේ වශයෙන්. එක ම ප්‍රඥාව ඍද්ධිපාද වැද, ඉන්‍ද්‍රිය වැ ද, බල වැ ද, බොජ්ඣංග වැ ද, මාර්ගාංග වැ ද, පවත්නා සැටි මෙයින් අවබෝධ කැරැ ගත යුතු.

ශ්‍රද්ධාව ද්විස්ථානිකය-හෙවත් දෙ තැනෙක ආයේ ය. සද්ධින්ද්‍රිය සද්ධා බල යන මේ වශයෙන්. එක ම ශ්‍රද්ධාව ඉන්ද්‍රිය වැ ද, බල වැ ද පවත්නා සැටි මෙයින් අවබෝධ කැරැ ගත යුතු යි.

කියන ලද මැ යි.

**"සංකප්ප පස්සද්ධි ච පීතුපෙක්ඛා**
**ඡන්‍දො ච චිත්තං විරතිත්තයං ච,**
**නවෙකඨානා විරියං නවට්ඨ**
**සති සමාධි චතුපඤ්ච පඤ්ඤා;**
**සද්ධා දුඨානු'ත්තම සත්තතිංස**
**ධම්මානමෙසො පවරො විභාගො"** යි.

මේ සත්තිස් බෝධිපාක්ෂික ධර්ම අෂ්ටවිධ ලෝකෝත්තරයෙහි ඒකාන්තයෙන් වන්නේ ය. මාර්ගයෙහි මෙන් ඵලයෙහි ද යෙදෙන බැවිනි. එසේ වුව ද විතර්ක ප්‍රීති වන්නේ ඒ දෙක ඇති විටෙක පමණ ය. ද්විතීය ධ්‍යානිකාදි ලෝකෝත්තර චිත්තයන්හි විතර්කය ද චතුර්ථ පඤ්චමධ්‍යානික ලෝකෝත්තර චිත්තයන්හි ප්‍රීතිය ද නැති බැවිනි.

තව ද ශීල විශුද්ධි ආදි ෂට් විශුද්ධියෙහි දී මේ ධර්ම ලෞකික සිත්හි ද සුදුසු පරිදි යෙදෙන බව දත යුතු. "සුදුසු පරිදිය" යි කීයේ විතර්ක, ප්‍රීති ඇති තැන යෙදෙන බව ද දක්වනු සඳහා ය.

කියන ලද මැ යි.

**"සබ්බෙ ලොකුත්තරෙ හොන්ති**
**නවා සංකප්ප පීතියො**
**ලොකියෙ පි යථායොගං**
**ඡබ්බිසුද්ධිප්පවත්තියං"** යි.

**ප්‍රශ්න.**

1. බෝධිපාක්ෂික ධර්ම පිඬු කළ හොත් කෙතෙක් ද? කවරහු ද?
2. එකස්ථානික බෝධිපාක්ෂික නවය දක්වනු.
3. විරිය, සති, සමාධි, පඤ්ඤා, සද්ධා, කති කති ස්ථානිකද? වෙන් වෙන් කොටැ දක්වනු.
4. “සබ්බෙ ලොකුත්තරෙ හොන්ති” යනාදි ගාථාවේ අදහස පැහැදිලි කරනු.
5. ලෝකෝත්තර සිත්හි යෙදෙන අබොධිපාක්ෂික දක්වනු. ඔවුන් බෝධිපාක්සික නො වන්නට හේතු කිම?

## 11. සර්ව සංග්‍රහය.

බෝධිපාක්ෂික සංග්‍රහයට අනතුරු වැ සර්ව සංග්‍රහය දක්වනු ලැබේ. එය වනාහි ස්කන්ධ, උපාදානස්කන්ධ, ආයතන, ධාතු, ආර්ය සත්‍යය වශයෙන් පඤ්චවිධ ය. එහි දු ස්කන්ධ පසෙකි. උපාදාන ස්කන්ධ පසෙකි. ආයතන දොළොසෙකි. ධාතු අටළොසෙකි. ආර්ය සත්‍ය සතරෙකි.

**පඤ්චස්කන්ධ.**

**ස්කන්ධ පස නම්: 1 රූපස්කන්ධ, 2 වෙදනාස්කන්ධ, 3 සංඥස්කන්ධ, 4 සංස්කාරස්කන්ධ, 5 විඥනස්කන්ධ** යන මොහු යි.

1. ස්කන්ධ යනු රාශිය-සමූහය. රූප පිළිබඳ රාශිය, සමූහය-රූපස්කන්ධය, රූප අට විස්සෙකි. එ ද වනාහි අතීත, අනාගත, පච්චුප්පන්න, අජ්ඣත්ත, බහිද්ධා, සුඛුම, ඕළාරික, හීන පණීත දූර සන්තික වශයෙන් නානාවිධ වේ. ඒ සියල්ල එකතු කොටැ සැලකීමෙන් මෙහි රූපස්කන්ධ ය යි කියන ලදි.

2. වෙදනා පිළිබඳ රාශිය-සමූහය, **වේදනාස්කන්ධය**. වෙදනා නම් දෙපණස් චෛතසිකයන් අතුරෙන් වේදනා චෛතසිකය. එ ද එක් එක් සිතෙක එක් එක් වේදනාව බැගින් නානාවිධ ය. එසේ ම අතීත, අනාගත, වර්තමානාදි වශයෙන් නානාවිධ ය. ඒ සියල්ල එකතු කොටැ සැලකීමෙන් වෙදනාස්කන්ධය යි කියන ලදි. එක ම වේදනාව රූඪී වශයෙන් වේදනා ස්කන්ධය යි කියන ලද ය යනු එක් මතයෙකි.

3. සංඥා පිළිබඳ රාශිය සමූහය සංඥා ස්කන්ධය. සංඥා නම් දෙපණස් චෛතසික අතුරෙන් සංඥා චෛතසිකය යි. එහි දු නානාවිධත්වය වේදනා ස්කන්ධයට කී සේ ය.

4. සංඛාර නම් දෙපණස් චෛතසික අතුරෙන් වේදනා සඤ්ඤා හැර සෙසු ඵස්සාදි චෛතසික පණස යි. ඒ සියල්ල එකතු කොට සැලකීම් වශයෙන් ද අතීතාදි භේද වශයෙන් ද ගෙනැ **සංස්කාරස්කන්ධය** යි කියන ලදි.

සංස්කරණය කරන්නෝ සංස්කාරයෝ ය. මේ ඵස්සාදීහු චක්ෂුරාදි ෂඩ් ද්වාරයෙහි හෝ කායාදි ත්‍රිවිධ කර්ම ද්වාරයෙහි හෝ එක් වැ ස්පර්ශ කිරීම් චෙතනා කිරීම් ආදි තම තමන්ගේ කෘත්‍ය වශයෙන් දර්ශන ශ්‍රවණාදිය ද කාය, කර්මාදිය ද, හිඳීම් සිටීම් යාම් ආදි කෘත්‍ය ද කරන්නෝ ය. එ හෙයින් ඔව්හු සංස්කාරයෝ නම් වූහ. වදාළේ මැ යි. "**කිඤ්ච භික්ඛවෙ සංඛාරෙ වදෙථ. සංඛතං අභිසංඛරොන්තීති ඛො භික්ඛවෙ තස්මා සංඛාරාති වුච්චන්ති**" යනාදි.

දෙපණස් චෛතසික අතුරෙන් වේදනා, සඤ්ඤා දෙක වෙන ම ස්කන්ධ දෙකක් වශයෙන් ද සෙසු සියල්ල එක් ස්කන්ධයක් වශයෙන් ද දේශනා කිරීමේ හේතු කිම? සුඛ යයි සලකනු ලබන ධර්ම අතුරෙන් වේදනාව සමාන උත්කෘෂ්ට සුවයෙක් සත්ත්වයන්ට නැත. සුඛ වේදනාවක් ලැබැ ගැන්ම පරමාර්ථ කොට ම සත්ත්වයෝ සියල්ල කෙරෙති. එසේ ම සංඥාව සමාන ප්‍රතිෂ්ඨාවෙක් ද සත්ත්වයන්ට නැත. සංඥායෙන් හැඳින ම සියල්ල කෙරෙති. එ බැවින් මේ වේදනා සංඥා දෙක වෙන ම ස්කන්ධ දෙකක් කොටැ වදාළේ ය. සෙසු සියල්ල එක් කොටැ සංස්කාර ස්කන්ධය යි වදාළේ ය.

5. විඥාන පිළිබඳ රාශිය - සමූහය විඥානස්කන්ධ යි. විඤ්ඤාණ නම් චිත්තය යි. එහි එකුන් අනූ හෝ එක්සිය එක්විසි භේදය ද අතීතාදින භේදය ද සලකා **විඥනස්කන්ධය** යි වදාළේය. නිත්‍යය යි සලකනු ලබන ධර්ම අතුරෙන් චිත්තයට වඩා උත්කෘෂ්ට ධර්මයෙක් ස්කන්ධයන්ට නැත. එ බැවින් චිත්තය ද වෙන ම ස්කන්ධයක් කොටැ වදාළේ ය.

මේ ස්කන්ධ සංග්‍රහයට සියලු චාතුර්භූමික ධර්ම සංග්‍රහ වන බව දත යුතුයි. භෙද නැති බැවින් නිර්වාණය සංග්‍රහ නො වේ.

**පංච උපාදන ස්කන්ධය**

උපාදාන ස්කන්ධ පස නම්:

1. **රූප උපාදන ස්කන්ධය**
2. **වේදනා උපාදන ස්කන්ධය**
3. **සඤ්ඤා උපාදන ස්කන්ධය**
4. **සංඛාර උපාදන ස්කන්ධය**
5. **විඤ්ඤාණ උපාදන ස්කන්ධය යන මොහු** යි.

උපාදාන නම් කාම, දිට්ඨි, සීලබ්බත, අත්තවාද, යන මේ සතර යි. මේ උපාදන සතරට විෂය වූ ස්කන්ධයෝ උපාදාන ස්කන්ධයෝ ය. ඔව්හු නම් රූපාදිය මැ යි. කාමාදි භවත්‍රය පිළිබඳ රූපාදි පස පංච උපාදාන ස්කන්ධය යි ගත යුතු. ලෝකෝත්තර සිත් අට ද එහි ඇතුළත් චෛතසික ද උපාදාන ස්කන්ධ සංඛ්‍යාවට නො ගැනේ. එය කාමාදි

උපාදානයන්ට විෂය නො වන බැවිනි. උපාදාන ස්කන්ධය යි පසෙක් වෙන් කොටැ දක්වන ලද්දේ එය ම විදර්ශනා භූමියට අයත් වන බැවිනි. ලෝකෝත්තර වනාහි විදර්ශනාවට නො ගැනේ. "**පංචුපාදනස්කන්ධා ති තථා තෙ භූමක මතා**" යනු බලනු.

### ප්‍රශ්න.

1. සර්වසංග්‍රහය කොටස් කීයකට බෙදන ලද්දේ ද? ඒ කොටස් හා එක් එක් කොටසට අයිති ධර්ම මෙතෙකැයි දක්වනු.
2. පංචස්කන්ධ මේ මේ යයි විභාග කොට දක්වනු.
3. පංචස්කන්ධ පංච උපාදානස්කන්ධ දෙකේ වෙනස දක්වනු.
4. වේදනා, සඤ්ඤා වෙන ම ස්කන්ධ වශයෙන් ගැනීමේ හේතු දක්වනු.
5. නිර්වාණය ස්කන්ධ සංග්‍රහයට නො ගැනුණේ කිම?

## 12. සර්වසංග්‍රහය (ආයතන, ධාතු, සත්‍ය)

### ද්වාදසායතන

ආයතන දොළොස නම්:

1. **චක්ඛායතන**
2. **සොතායතන**
3. **ඝාණායතන**
4. **ජිව්හායතන**
5. **කායායතන**
6. **මනායතන**
7. **රූපායතන**
8. **සද්දයතන**
9. **ගන්ධායතන**
10. **රසායතන**
11. **ඵොට්ඨබ්බායතන**
12. **ධම්මායතන**

යන මොහු යි.

ස්වකීය කෘතියෙහි ආයතනය - ප්‍රයත්නය කරන්නෝ ආයතනයෝ ය. යම් කෙනෙකුන් කරණ කොටැ ගෙනැ චිත්ත චෛතසික ධර්මයෝ ස්වකීය කෘතියෙහි ආයතනය-ප්‍රයත්නය කෙරෙත් ද ඔහු ආයතනයෝ ය. පූර්වය කර්තෘ කාරක වශයෙනි. දෙ වැන්න කරණ කාරක වශයෙනි. ආය යනු චිත්ත චෛතසිකයන්ට නමෙකි. ඔවුන් පතුරුවන්නෝ හෝ

ආයතනයෝ ය. ආයත යනු දීර්ඝ වූ සසර දුකට නමෙකි. ඒ ආයතනයට පමුණුවන්නෝ හෝ ආයතනයෝ ය. චිත්ත චෛතසිකයන්ට නිශ්‍රය වූ ද ආරම්මණ වූ ද ධර්මයෝ මෙයින් ගනු ලැබෙත්. ඔහු දොළොසෙකි.

චක්ඛුව ම ආයතන වූයේ **චක්ඛායතන** ය. එනම් චක්‍ෂුඃප්‍රසාදය යි. සෝතය ම ආයතන **සෝතායතන** ය. සෝතප්පසාදය යි. **ඝාණායතන, ජිව්හායතන, කායායතන** ද මෙසේ ය. මනස ම ආයතන වූයේ මනායතන ය. සිත් ය. මේ නිශ්‍රය වශයෙනි. රූපය ම ආයතන වූයේ **රූපායතන** ය. රූප සංඛ්‍යාත වර්ණය යි. **සද්දයතනාදිය** ද මෙසේ ය. **ධම්මායතන** නම් - චෛතසික දෙපණස. සොළොස් සූක්‍ෂම රූප, නිර්වාණ යන එකුන් සැත්තෑව ය. මේ ආරම්මණ වශයෙනි.

## අෂ්ටාරස ධාතු

ධාතු අටළොස නම්:

1. **චක්ඛු ධාතු**
2. **සෝත ධාතු**
3. **ඝාණ ධාතු**
4. **ජිව්හා ධාතු**
5. **කාය ධාතු**
6. **රූප ධාතු**
7. **සද්ද ධාතු**
8. **ගන්ධ ධාතු**
9. **රස ධාතු**
10. **ඵොට්ඨබ්බ ධාතු**
11. **චක්ඛුවිඤ්ඤාණ ධාතු**
12. **සෝතවිඤ්ඤාණ ධාතු**
13. **ඝාණවිඤ්ඤාණ ධාතු**
14. **ජිව්හාවිඤ්ඤාණ ධාතු**
15. **කායවිඤ්ඤාණ ධාතු**
16. **මනොධාතු**
17. **ධම්ම ධාතු**
18. **මනොවිඤ්ඤාණ ධාතු**

යන මොහුයි.

ස්වභාවය දරන්නෝ ධාතුහු ය, දෙව්ලොව මනුලොව ආදි කොතැන පිහිටිය ද ධාතු හු ස්වභාවය දරන්නෝ ය. ඔහු අටළොසෙකි.

චක්ඛු ම ධාතු වූයේ චක්ඛු ධාතු ය. චක්‍ෂුඃප්‍රසාදය යි. රූප ම ධාතු වූයේ රූප ධාතු ය. වර්ණ සංඛ්‍යාත රූපය යි. චක්ඛු විඤ්ඤාණ ම ධාතු වූයේ චක්ඛු විඤ්ඤාණ ධාතු ය.

චක්ඛු විඤ්ඤාණ සිත් දෙක යි. චක්ඛු හා රූප හා සට්ටනයෙන් චක්ඛු විඤ්ඤාණ උපදී. අධරාරණි හා උත්තරාරණි සට්ටනයෙන් ගින්න උපදින්නාක් මෙනි. සෝත ධාතු, සද්ද ධාතු, සෝත විඤ්ඤාණ ධාතු ආදිය ද මෙසේ ය. මනෝ ධාතු නම් පඤ්චද්වාරාවර්ජන, සම්පටිච්ඡන යුගල යන සිත් තුන යි. ධම්මධාතු ධම්මායතනයට කී සේ ය. මනෝ විඤ්ඤාණ ධාතු නම් චක්ඛු විඤ්ඤාණාදි දසය ද, මනෝ ධාතු ත්‍රිකය ද යන සිත් තෙලෙස හැරැ සෙසු සසැත්තෑ සිත් ය. යට දැක්වුණු මනායතනය ම මෙහි සත්තවිඤ්ඤාණ ධාතු වශයෙන් බෙදී ගිය බව සැලකිය යුතු යි.

## චතුරාර්ය සත්‍යය

ආර්ය සත්‍ය සතර නම්:

1. **දුඃඛාර්ය සත්‍යය,**
2. **දුඃඛ සමුදයාර්ය සත්‍යය,**
3. **දුඃඛ නිරොධාර්ය සත්‍යය,**
4. **දුඃඛ නිරෝධගාමි ප්‍රතිපදර්ය සත්‍යය**

යන මොහු යි.

ආර්යයෝ නම් බුදුවරයෝ ය. ආර්යයන් විසින් පරෝපදේශ රහිත වැ ස්වයම්භූ ඥානයෙන් ප්‍රතිවේධ කළ සත්‍ය ආර්ය සත්‍ය ය. ආර්ය නම් උත්තමය-ශ්‍රේෂ්ඨ ය. සත්‍ය නම් සබා. උතුම් වූ - ශ්‍රේෂ්ඨ වූ - බොරු නො වන්නා වූ - සබා - ආර්ය සත්‍ය ය. ඒ සිව් ආකාර ය.

1. දුඃඛ නම් විස්තර වශයෙන් බලත් හොත් ජාති, ජරා, ව්‍යාධි, මරණ, සෝක, පරිදේව, දුක්ඛ දෝමනස්සාදිය ය. සැකෙවින් බලත්හොත් පංච උපාදාන ස්කන්ධ සංඛ්‍යාත ත්‍රෛභූමික වෘත්තය යි. දුඃඛ ය ම ආර්ය සත්‍ය වූයේ දුඃඛාර්ය සත්‍ය ය.

2. දුඃඛ සමුදය නම් දුක් උපදවන්නා ය. එ නම් තෘෂ්ණාව ය. දුඃඛ සමුදය ම ආර්ය සත්‍ය වූයේ දුඃඛ සමුදයාර්ය සත්‍ය ය.

3. දුඃඛ නිරෝධ නම් දුක් නිරුද්ධ කරන්නා ය. යමක් අරමුණු කොට දුක් නිරෝධ වේ ද එය නම් නිර්වාණ ය. දුඃඛ නිරෝධය ම ආර්ය සත්‍ය වූයේ දුඃඛ නිරෝධාර්ය සත්‍ය ය.

4. දුඃඛ නිරෝධගාමී ප්‍රතිපදා නම් දුක් නිරුද්ධ කිරීමේ ප්‍රතිපත්තිය ය. එ නම් ආර්ය අෂ්ටාංගික මාර්ග යි. දුඃඛ නිරෝධගාමී ප්‍රතිපදාව ම ආර්ය සත්‍ය වූයේ දුඃඛ නිරෝධගාමී ප්‍රතිපදාර්ය සත්‍ය යි.

මෙහි විස්තර ප්‍රකට බැවින් සංක්ෂේප කරන ලදි. සර්ව සංග්‍රහය පිළිබඳ වූ ම මේ ගාථා ද උද්ග්‍රහණය කරනු.

**"රූපං ච වේදනා සඤ්ඤා සෙසා චෙතසිකා තථා**

**විඤ්ඤාණමිති පඤ්චෙතෙ පඤ්චක්ඛන්ධාති භාසිතා."**

රූප, වේදනා, සඤ්ඤා, සෙසු චෛතසික (සංඛාර) විඤ්ඤාණ යන මේ පස පංචස්කන්ධය යි කියන ලදි.

**"පංචූපාදනක්ඛන්ධා ති තථා තෙභූමකා මතා**
**භෙදභාවෙන නිබ්බාණං ඛන්ධසංගහනිස්සටං."**

එසේ ම ත්‍රෛභූමිකයෝ පඤ්චොපාදානස්කන්ධයෝය යි කියන ලදු. කාල, දිශා, දේශ, ස්ථානාදි වශයෙන් භේද නැති බැවින් නිර්වාණය ස්කන්ධ සංග්‍රහයෙන් බැහැර විණි.

**"ද්වාරාලම්බන භෙදන භවත්තායතනානි ච**
**ද්වාරාලම්බ තදුප්පන්න පරියායෙන ධාතුයො."**

ද්වාර ආලම්බන, භේදයෙන් ආයතනයෝ වෙති. ද්වාර ආලම්බන තදුප්පන්න යන මේ ක්‍රමයෙන් ධාතූහු වෙත්.

**"දුක්ඛං තෙභූමකං වට්ටං තණ්හා සමුදයො භවෙ**
**නිරොධො නාම නිබ්බාණං මග්ගො ලොකුත්තරො මතො."**

ත්‍රෛභූමක වෘත්තය දුඃඛ සත්‍ය ය. තෘෂ්ණාව සමුදය සත්‍යය, නිර්වාණය නිරෝධ සත්‍ය ය. ලෝකෝත්තර මාර්ගාඞ්ග අට මාර්ග සත්‍ය ය.

මෙසේ චතුරාර්ය සත්‍යයට අයත් ධර්ම දක්වා ඉක්බිති චතුරාර්ය සත්‍යයට අයත් නො වන බව දක්වති.

**"මග්ගයුත්තා ඵලා චෙව චතුසච්ච විනිස්සටා"** යි

මාර්ග සිත්හි යෙදුණු අෂ්ටාංගික මාර්ග සංඛ්‍යාත චෛතසික හැර සෙසු චෛතසික ද මාර්ග සිත් ද යන එකුන්විසි ධර්මයෝ ද ඵල සිත්හි යෙදුණු චෛතසික ද ඵල සිත් ද යන සත්තිස් ධර්මයෝ ද චතුරාර්ය සත්‍යයෙන් බැහැර ය හෙවත් චතුරාර්ය සත්‍යයට ඇතුළත් නො වෙත්.

**"ඉතිපඤ්චප්පභෙදෙන පවුත්තො සබ්බසඞ්ගහො"**

මෙසේ සර්ව සංග්‍රහය පස් ආකාරයකින් විස්තර කොටැ කියන ලද්දේ ය.

**ප්‍රශ්න.**

1. ආයතන දොළොස දක්වා එය පැහැදිලි කරනු. ආයතන යන්න තෝරනු.
2. ධාතු අටළොස දක්වනු. එය කෙසේ වූයේද? මනෝධාතු, ධම්මධාතු, මනො විඤ්ඤාණ ධාතු විස්තර කර දක්වනු.
3. චතුරාර්ය සත්‍යය දක්වා එයට ඇතුළත් ධර්ම මේ මේ ය යි පෙන්වනු.
4. චතුරාර්ය සත්‍යයට අයත් නො වන ධර්ම ඇත්තේ ද? ඇත්නම් මේ මේ ය යි දක්වා ඒ එහි ඇතුළත් නො වීමේ හේතු දක්වනු.
5. සමුච්චය පාදය උගෙනීමෙන් ලැබෙන විශේෂ ඵලය කිම?

**මාතර සිරිමංගල පිරිවෙන්හි ආචාර්ය පණ්ඩිත ශ්‍රී ධර්මවංශ ස්ථවිර ස්වාමීන් කළ අභිධර්මචන්‍ද්‍රිකායෙහි සමුච්චය පාදය යි.**

# අටවන පටිච්චසමුප්පාද පාදය.

**නමො භගවතො සම්බුද්ධස්ස.**

## 1. ප්‍රත්‍යය හා ප්‍රත්‍යයොත්පන්න

ප්‍රත්‍යය, ධර්මය, ප්‍රත්‍යයොත්පන්න ධර්මය යි ධර්ම දෙ කොටසෙකි. ප්‍රත්‍යය ධර්ම නම් යම් කිසිවෙක පැවැත්මට හෝ නිපැත්තමට උපකාර වන හේතු ධර්ම යි. හේතු කාරණ, බීජ යනාදිය එයට පර්යාය නාම යි. ප්‍රත්‍යයොත්පන්න ධර්ම නම් එම ප්‍රත්‍යයයෙන් පවත්නා වූ හෝ නිපදින්නා වූ ඵල ධර්ම යි. සංඛත සංඛාර යනාදිය එයට පර්යාය නාම යි. ජලයෙන් වෘක්‍ෂ ලතා පවතී. මෙහි ජලය ප්‍රත්‍යය ය. වෘක්‍ෂ ලතා ප්‍රත්‍යයොත්පන්න ය. වෘක්‍ෂ ලතාවන්ට ජලය ප්‍රත්‍යය වූයේ පැවැත්මට ය. නිපැත්මට නොවේ. බීජයෙන් අඞ්කුර සැදේ. මෙහි බීජය ප්‍රත්‍යය ය. අඞ්කුර ප්‍රත්‍යයොත්පන්න ය. බීජය අඞ්කුරයට ප්‍රත්‍යය වූයේ නිපැත්මට ය. පැවැත්මට නො වේ. මෙසේ ඵලයක පැවැත්මට හෝ නිපැත්මට උපකාර වන්නේ ප්‍රත්‍යය යයි ද පවත්නා වූ හෝ නිපදෙන්නා වූ ඵලය ප්‍රත්‍යයොත්පන්නය යි ද දතයුතු.

වරෙක ප්‍රත්‍යයොත්පන්නයක් පසු වරෙක ප්‍රත්‍යයයක් විය හැකි ය. එවිට එය ප්‍රත්‍යයය යි ම කියනු ලැබේ. බීජයෙන් වෘක්‍ෂ සැදේ. මෙහි බීජය ප්‍රත්‍යය ය. වෘක්‍ෂ ප්‍රත්‍යයොත්පන්න ය. ඒ වෘක්‍ෂයෙන් බීජ සැදේ. මෙහි වෘක්‍ෂය ප්‍රත්‍යය ය. බීජ ප්‍රත්‍යයොත්පන්න යි. පළමු ප්‍රත්‍යයොත්පන්නය පසු වැ ප්‍රත්‍යය වූ සැටි මෙයින් අවබෝධ කරගත හැකි ය.

ප්‍රත්‍යයොත්පන්නයන්ට සංඛත හෝ සංඛාර යනු පර්යාය නාමයෙකැ යි යට කියන ලදි. ප්‍රත්‍යයයෙන් සංස්කරණය කැරෙන්නේ සංඛතය-හෙවත් සංඛාර ය. මෙහි සංස්කරණය නම් පැවැත්ම හා නිපැත්ම යයි කිය යුතු යි. නාම රූප ධර්ම සංඛත හෝ සංඛාර ය ප්‍රත්‍යයෙන් පවත්නා බැවිනි. නිපදෙනා බැවිනි. නිර්වාණය අසංඛත හෝ අසංඛාර ය. එය ප්‍රත්‍යයයෙන් පවත්නේ ද නො වේ. නිපදෙන්නේ ද නො වේ. එබැවිනි.

සංඛත සංඛ්‍යාත නාමරූප ධර්මයන්ගේ විස්තර විභාගය යට **චිත්තපාදදි** පරිච්ඡේද සතින් දක්වන ලද්දේ ය. නාම රූප පරිච්ඡේද ඥානය නිර්වාණාවබෝධයට ප්‍රථමාධාර යි. දැන් දත යුත්තේ ඒ සංඛත සංඛ්‍යාත නාමරූප කවර කවර ප්‍රත්‍යයයෙකින් පවත්නේ ද නිපදින්නේ ද යනුයි. පච්චය පරිග්ගහ ඥාණය නිර්වාණාවබෝධයට ඉක්බිති ආධාර යි. මේ කාණ්ඩයෙන් ඒ ප්‍රත්‍යය විභාගය දක්වනු ලැබේ. ප්‍රත්‍යය විභාගය සමග ම ප්‍රත්‍යයොත්පන්නයන්ගේ විශේෂ විභාග ද ප්‍රත්‍යයයෙකින් ප්‍රත්‍යයොත්පන්නයන්ගේ පවතින නිපදෙන ආකාර ද තතු පරිදි දක්වනු ලැබේ.

ප්‍රත්‍යය වනාහි බුදුරජාණන් වහන්සේ විසින් **පටිච්ච සමුප්පාද ක්‍රමය, පට්ඨාන ක්‍රමය** යන දෙ ආකාරයෙකින් වදාරන ලද්දේය. පටිච්චසමුප්පාදකක්‍රමය නම් **පටිච්චසමුප්පාද**

**විභඞ්ගාදියෙහි** වදාළ ක්‍රමය යි. පට්ඨාන ක්‍රමය නම් **සමන්තපට්ඨාන මහාප්‍රකරණයෙහි** වදාළ ක්‍රමය යි.

"**තබ්භාවභාවිවාකාරමත්තොපලක්ඛිතො පටිච්ච සමුප්පාදනයො**" යනු අභිධර්මාර්ථසංග්‍රහයෙහි පටිච්චසමුප්පාද ක්‍රමය තේරූ සැටියි. ප්‍රත්‍යය ධර්ම ඇති කල්හි ප්‍රත්‍යයොත්පන්න ධර්ම ඇති වීම් ආකාර මාත්‍රයෙන් යුක්ත වූයේ පටිච්ච සමුප්පාද ක්‍රමය වේ. යනු එහි අර්ථ යි. "**ඉමස්මිං සති ඉදං හොති, ඉමස්ස උප්පාද ඉදං උප්පජ්ජති**" - මේ ඇති කල්හි මේ වන්නේ ය. මේ ඉපදීමේ මේ උපදින්නේ ය යි පැවති සංඛත ධර්ම නියාමය මෙයින් දැක්විණි යි දතයුතු. "**පටිච්ච ඵලං සමුප්පජ්ජති එතස්මාති පටිච්ච සමුප්පාදෙ**" යම් හේතුවකින් ඵලයෙක් උපදින්නේ ද ඒ හේතුව පටිච්ච සමුප්පාද යි. එවිට ඵලය පටිච්ච සමුප්පන්න යි දතයුතු. හේතුඵල ධර්මක්‍රමය පටිච්ච සමුප්පාද ක්‍රමය යි කී බව මෙයින් අවබෝධ කර ගත යුතු යි.

"**පට්ඨානනයො පන ආහච්ච පච්චයට්ඨිති මාරබ්භ පවුච්චති**" යනු පට්ඨාන නය තේරූ පරිදි යි. පට්ඨාන නය වනාහි ආහච්ච පච්ච යට්ඨිතිය අරබයා කියනු ලැබේ යනු එහි අර්ථයි. ආහච්ච පච්ච යට්ඨිතිය නම් විශේෂ ප්‍රත්‍යයන්ගේ පැවැත්ම යි. පටිච්ච සමුප්පාද ක්‍රමයෙන් යම් කිසි ප්‍රත්‍යයයෙකින් යම් කිසි ප්‍රත්‍යයොත්පන්නයෙක් වේ ය යි කීකල්හි ඒ ප්‍රත්‍යයයෙන් ඒ ප්‍රත්‍යයොත්පන්නය වීමට කවර කවර විශේෂ ප්‍රත්‍යය ඇත්තේ ද යනු දැක්වීම පට්ඨාන ක්‍රමය යි. අවිද්‍යායෙන් සංස්කාර වේ යනු පටිච්චසමුප්පාද ක්‍රමයයි. අවිද්‍යායෙන් සංස්කාර වීමට හේතු, ආරම්මණ, අධිපති ආදි සූවිසි ප්‍රත්‍යය අතුරෙන් කවර කවර විශේෂ ප්‍රත්‍යය ඇතිවිය යුතු ද? යනු දැක්වීම පට්ඨාන ක්‍රමය යි සේයි. "**නානප්පකාරානි ඨානානි පච්චයා එත්‍ථාති පට්ඨානං**" නානාප්‍රකාර ප්‍රත්‍යයෝ යම් තැනෙක දැක්වෙත් ද එය පට්ඨානය යි. එනම් **සමන්තපට්ඨාන මහා ප්‍රකරණය** යි. එහි දැක්වුණු ප්‍රත්‍යය ක්‍රමය පට්ඨාන ක්‍රමය යි.

ආචාර්යයෝ **විශුද්ධිමාර්ගාදියෙහි** මේ පටිච්චසමුප්පාද ක්‍රමය හා පට්ඨාන ක්‍රමය මිශ්‍ර කොට දක්වති. මෙහි වෙන් වෙන් වශයෙන් දක්වනු ලැබේ.

**ප්‍රශ්න.**

1. ප්‍රත්‍යය හා ප්‍රත්‍යයොත්පන්න පැහැදිලි කරනු. එයට පර්යාය නම් ද දක්වනු.
2. ප්‍රත්‍යයොත්පන්නයෙක් පසු වැ ප්‍රත්‍යය විය හැකි ද? උදාහරණ දෙනු.
3. සංඛත යනු කවරේ ද? අසංඛත යනු කවරේ ද?
4. පටිච්චසමුප්පාද යනු කිම? පටිච්චසමුප්පාද ප්‍රත්‍යය ක්‍රමය විස්තර කරනු.
5. පට්ඨාන යනු කිම? පට්ඨාන ප්‍රත්‍යය ක්‍රමය විස්තර කරනු.

## 2. පටිච්ච සමුප්පාද නය.

**අවිද්‍යා ප්‍රත්‍යයයෙන් සංස්කාර වන්නේ ය.**
**සංස්කාර ප්‍රත්‍යයයෙන් විඥාන වන්නේ ය.**
**විඥාන ප්‍රත්‍යයයෙන් නාමරූප වන්නේ ය.**
**නාම රූප ප්‍රත්‍යයයෙන් ෂඩායතන වන්නේ ය.**
**ෂඩායතන ප්‍රත්‍යයයෙන් ස්පර්ශ වන්නේ ය.**
**ස්පර්ශ ප්‍රත්‍යයයෙන් වේදනා වන්නේ ය.**
**වේදනා ප්‍රත්‍යයයෙන් තෘෂ්ණා වන්නේ ය.**
**තෘෂ්ණා ප්‍රත්‍යයයෙන් උපාදාන වන්නේ ය.**
**උපාදාන ප්‍රත්‍යයයෙන් භව වන්නේ ය.**
**භව ප්‍රත්‍යයයෙන් ජාති වන්නේ ය.**
**ජාති ප්‍රත්‍යයයෙන් ජරාමරණ ද සෝක පරිදේව දුක් දෙම්නස් ද වන්නේ ය.**

මෙසේ මේ හුදු දුඃඛස්කන්ධයාගේ සම්භවය වේ. යනු පටිච්ච සමුප්පාද ප්‍රත්‍යය ක්‍රමය යි.

මෙහි අද්ධ තුනෙක් ද, අඞ්ග දොළොසෙක් ද, ආකාර විස්සෙක් ද, සන්ධි තුනෙක් ද, සංක්‍ෂෙප සතරෙක් ද, වට්ට තුනෙක් ද, මුල් දෙකෙක් ද ඇතැ යි දතයුතු.

අද්ධ තුන නම් අතීත අද්ධ, අනාගත අද්ධ, පච්චුප්පන්න අද්ධ යන මේ ය. අවිද්‍යා, සංස්කාර අතීත අද්ධ ය. ජාති ජරා මරණ අනාගත අද්ධ ය. මැද අට පච්චුප්පන්න අද්ධ යි. අද්ධ අඞ්ග දොළොස නම් අවිද්‍යා, සංස්කාර, විඥාන, නාමරූප, ෂඩායතන, ස්පර්ශ, වේදනා, තෘෂ්ණා, උපාදාන, භව, ජාති, ජරා මරණ යන මේ ය. ශෝකාදිය නිස්සන්ද ඵල යි.

ආකාර විස්ස මෙසේ ය. අවිද්‍යා සංස්කාර ගනුත් ම තෘෂ්ණා උපාදාන භව ද ගැනෙන්නේ ය. තෘෂ්ණා, උපාදාන, භව ගනුත්ම අවිද්‍යා, සංස්කාර ද, ගැනෙන්නේ ය. ජාති ජරාමරණ ගනුත් ම විඥාන, නාමරූප, ෂඩායතන, ස්පර්ශ, වේදනා යන ඵල පස ගැනෙන්නේ ය. මෙසේ ගත් කල්හි අවිද්‍යා, සංස්කාර, තෘෂ්ණා, උපාදාන, භව යන පස අතීත හේතු ය. විඥාන, නාමරූප, ෂඩායතන, ස්පර්ශ, වේදනා යන පස වර්තමාන ඵල ය. තෘෂ්ණා, උපාදාන, භව, අවිද්‍යා, සංස්කාර යන පස වර්තමාන හේතු ය. විඥාන නාමරූප, ෂඩායතන ස්පර්ශ, වේදනා යන පස අනාගත ඵල යි. ජාති, ජරාමරණ විඥානාදියෙහි ම ඇතුළත් බව යට කියන ලදි.

සන්ධි තුන ද සංක්‍ෂේප සතර ද මෙහි ඇතුළති. ඒ මෙසේ ය. අවිද්‍යා සංස්කාර එක් සංක්‍ෂේපයක. එය අතීත හේතු සංක්‍ෂේපය යි. තෘෂ්ණා, උපාදාන, භව ද එහි ඇතුළත් වන බව දත යුතු. විඥාන, නාමරූප, ෂඩායතන, ස්පර්ශ, වේදනා එක් සංක්‍ෂේපයෙක. එය වර්තමාන ඵල සංක්‍ෂේපය යි. තෘෂ්ණා, උපාදාන, බව එක් සංක්‍ෂේපයෙක. එය වර්තමාන හේතු සංක්‍ෂේපය යි. අවිද්‍යා සංස්කාර ද එහි ඇතුළත් වන බව දත යුතු. ජාති, ජරා,

මරණ එක් සංක්ෂේපයෙක. එය අනාගත ඵල සංක්ෂේපය යි. විඥ්ඥාණ, නාමරූප, ෂඩායතන ස්පර්ශ වේදනා ද මෙහි ඇතුළත් බව දත යුතු යි.

මේ සංක්ෂේප සතර මැද සන්‍ධි තුන යි. ඒ මෙසේ ය. සංස්කාර විඥාන අතර එක් සන්‍ධියෙක. එය හේතු ඵල සන්‍ධි යි. වේදනා තෘෂ්ණා අතර එක් සන්‍ධියෙක. එය ඵල හේතු සන්‍ධි යි. භව ජාති අතර එක් සන්ධියෙක. එය හේතු ඵල සන්ධි යි. ප්‍රථම සන්ධිය අතීත හේතු හා වර්තමාන ඵල සම්බන්‍ධ කෙරේ. ද්විතීය සන්ධිය වර්තමාන ඵල හා වර්තමාන හේතු සම්බන්ධ කෙරේ. තෘතීය සන්ධිය වර්තමාන හේතු හා අනාගත ඵල සම්බන්ධ කෙරේ.

වට්ට තුන නම් කිලෙස වට්ට, කම්ම වට්ට, විපාක වට්ට යන මේ ය. අවිද්‍යා, තෘෂ්ණා, උපාදාන කිලෙස වට්ට ය කර්ම භව සංඛ්‍යාත භවෙකදෙසය ද සංස්කාර ද කම්ම වට්ට ය. උප්පත්ති භව සංඛ්‍යාත භවෙකදෙසය ද සෙස්ස ද විපාක වට්ට යි.

මුල් දෙක නම් අවිද්‍යා තෘෂ්ණා යි.

මේ මුල් දෙක සිඳීමෙන් යට දැක්වුණු ත්‍රිවිධ වෘත්ත ම සිඳී යෙයි. ජරා මරණ මූර්ච්ඡායෙන් නිතර පීඩිත වූවන්ට ආශ්‍රව උපදින්නේ ය. ආශ්‍රව හේතු කොට ගෙනැ අවිද්‍යාව වැඩෙන්නේ ය. මෙසේ සම්බන්‍ධ වූ අනාදිමත් ත්‍රෛභූමක වෘත්තය පටිච්ච සමුප්පාදය යි මහා මුනීන් වහන්සේ වදාළ සේක.

කීයේ මැ යි.

**"තෙසමෙව ච මූලානං නිරොධෙන නිරුජ්ඣති,**
**ජරාමරණමුච්ඡාය පීළිතානමභිණ්හසො**
**ආසවානං සමුප්පාද අවිජ්ජා ච පවඩ්ඪති.**
**වට්ටමාබද්ධමිච්චෙවං තෙභූමකමනාදිකං**
**පටිච්චසමුප්පාදොති පට්ඨපෙසි මහාමුනී."**
මේ සියල්ල පිළිබඳ විස්තරය මතු දැක්වේ.

**ප්‍රශ්න.**

1. පටිච්චසමුප්පාදනය දක්වනු.
2. එහි ඇතුළත් කොටස් වෙන්කොටැ දක්වනු.
3. අද්ධ තුන හා අඞ්ග දොළොස දක්වනු.
4. ආකාර විස්ස හා සන්ධි තුන දක්වනු.
5. තුන හා මුල් දෙක දක්වනු.

## 3. අවිද්‍යා ප්‍රත්‍යයයෙන් සංස්කාර වන්නේ ය.

1. අවිද්‍යාව නම් කිම? 2. සංස්කාර නම් කිම? 3. අවිද්‍යා ප්‍රත්‍යයයෙන් සංස්කාර වන්නේ කෙසේ ද? යනු මෙහිලා දැන ගත යුතු.

1. අවිද්‍යාව නම් මෝහ චෛතසිකය යි. (**චෛතසික පාදයේ අකුශල චෛතසික** බලනු.) මෝහය සර්වාකුශල සාධාරණයෙකි. දොළොස් අකුසල් සිත්හි සම්ප්‍රයුක්ත වශයෙන් ම යෙදෙයි. මෝහයට මෙහි අවිද්‍යාය යි කියන ලද්දේ නො දැන්මය යන අර්ථයෙනි. යම් නො දැන්මෙක් සත්ත්වයා අන්ත විරහිත සංසාරයෙහි දුවවන්නේ ද ඒ නො දැන්ම අවිද්‍යාව යි. ඒ වනාහි දුඃඛ සත්‍ය, සමුදයසත්‍ය, නිරෝධසත්‍ය, මාර්ගසත්‍ය යන චතුරාර්ය සත්‍යයෙහි ද, පූර්වාන්ත, අපරාන්ත, පූර්වාපරාන්ත, පටිච්චසමුප්පාද යන අටතන්හි නොදැන්මය යි දත යුතු.

අවිද්‍යාව නැත්තේ විද්‍යා සංඛ්‍යාත අර්හත් මාර්ගඥානයෙන් කෙලෙස් ප්‍රහාණ කළ රහතන්ට පමණෙකි. ඉන් මොබ සියල්ලන්ට අවිද්‍යාව ඇත්තේ ය. ඒ ඇති බව ද නොයෙක් ආකාර ය. අකුසල් කරන කල්හි ඒ අකුසල් සිත්හි අවිද්‍යාව හෙවත් මෝහය සම්ප්‍රයුක්ත වශයෙන් ම ඇත්තේ ය. කාමාවචර, රූපාවචර, අරූපාවචර කුශල කරන කල්හි ඒ කුසල සිත්හි අවිද්‍යාව හෙවත් මෝහය සම්ප්‍රයුක්ත වශයෙන් නැත. එහෙත් අනුශය වශයෙන් ඇත්තේ ය. අනුශය නම් මාර්ග ඥානයෙන් ප්‍රහාණය නො කළා වූ අරමුණු ලැබුණු කල්හි නැගී එන්නා වූ කෙලෙස් ය. ඔව්හු සත් දෙනෙකි. අවිද්‍යාව ද ඉන් එකෙකි. (**සමුච්චයපාදයේ අනුසය කොටස බලනු.**)

**අවිද්‍යාව අන්ධකාරය බඳු ය.** ලොව පිරී ඇත්තේ අන්‍ධකාරයෙනි. ආලෝක ධරන ධරන ප්‍රමාණයෙන් අන්‍ධකාර දුරු කළ හැකි ය. අකුශල කරන්නෝ අන්ධකාරයේම ගැලී සිටින්නෝ ය. කාමාවචර රූපාවචර අරූපාවචරන කුශල කරන්නෝ ඒ ඒ ප්‍රමාණයෙන් කාලික වශයෙන් අන්ධකාරයෙන් ඈත් වෙති. එහෙත් ඔවුන්ට අන්ධකාරය නැතැ යි නොකිය යුතු ය. සෝවාන්, සකෘදාගාමි, අනාගාමි, මාර්ග සිත් ලෝකෝත්තර කුසල් ය. එයිනුදු අන්ධකාරය එකදේශයෙකින් දුරු වේ. එහෙත් ඝන බහල මහාන්ධකාරය සූර්යයා මෙන් අර්හත් මාර්ගඥානය සමස්ත අවිද්‍යාව විහත විධ්වංසනය කරන්නේ ය. අර්හත් ඵලස්ථයෝ එහි විපාක එහි ම විඳිති. එසේ හෙයින් රහත් නො වූ සියලු සත්ත්වයන්ට සම්ප්‍රයුක්ත වශයෙන් හෝ අනුශය වශයෙන් හෝ අවිද්‍යාව ඇතැ යි දත යුතු යි.

2. **සංස්කාර** නම් ලෞකික කුශල කර්ම හා අකුශල කර්මය; හෙවත් ලෞකික කුශලාකුශල සිත්හි යෙදෙන චේතනා චෛතසික යි.

ශංඛාර ශබ්දයෙහි නොයෙක් අර්ථ ඇත්තේ ය.

**"සංඛාරොසංඛාතෙ පුඤ්ඤ-**

**භිසංඛාරාදිකෙ පි ච,**
**පයොගෙ කායසංඛාරා**
**ද්‍යභිසංඛරණෙසු ච"**

සංඛාර ශබ්දය ප්‍රත්‍යයොත්පන්නයෙහි ද, පුඤ්ඤාභිසංඛාරාදියෙහි ද, ව්‍යාපාරයෙහි ද, කායසංඛාරාදි අභිසංස්කරණයෙහි ද වැටේ යන ගාථායෙහි අර්ථ යි. සංඛාර ශබ්දයෙන් වාච්‍ය වන අර්ථ අතුරෙන් මෙහි පුඤ්ඤාභිසංඛාරාදිය කියවෙන බව දත යුතු. පුඤ්ඤාභිසංඛාරාදිය නම් **පුඤ්ඤභිසංඛාර, අපුඤ්ඤභිසංඛාර, ආනෙඤ්ජාභිසංඛාර** යන තුනයි. **පුඤ්ඤභිසංඛාර** නම් කාමාවචර කුශල චේතනා අට ද, රූපාවචර කුශල චේතනා පස ද යන තෙලෙස් කුශල චේතනා ය. **අපුඤ්ඤභිසංඛාර** නම් අකුශල චේතනා දොළොස ය. **ආනෙඤ්ජාභිසංඛාර** නම් අරූපාවචර කුශල චේතනා සතර ය.

මෙය ම **කායසංඛාර, වචීසංඛාර, මනොසංඛාර** යයි තුන් කොටසකට බෙදේ. කායද්වාරයෙහි පැවැති කුශලා කුශල චේතනා කායසංඛාරය - එනම් කාමාවචර කුසල චේතනා අට ද අකුසල චේතනා දොළොස ද යන කුසලාකුසල විස්ස ය. වාග් ද්වාරයෙහි පැවති කුශලාකුශල චේතනා වචී සංඛාරය. එනම් යට දැක්වුණු විස්සම ය. මනොද්වාරයෙහි පැවැති කුශලාකුශල චේතනා මනොසංඛාරය. එනම් කාමාවචර කුශල චේතනා අට ද, අකුශල චේතනා දොළොස ද, රූපාවචර අරූපාවචර කුසල චේතනා නවය ද යන එකුන් තිස් චේතනා යි.

චේතනාව කර්මය යි කියනු ලැබේ. එය ම මෙහි සංස්කාර යයි කියන ලද්දේ ය. මතු විපාක ලැබෙන පරිදි සංස්කරණය කැරෙන බැවිනි. "**කම්මං ඛෙත්තං**" - කර්මය කුඹුර ය. එය සකස් වුණු පමණින් රෝපිත බීජයෙන් ඉෂ්ට හෝ අනිෂ්ට ඵල ලැබේ.

3. **අවිද්‍යා ප්‍රත්‍යයයෙන් සංස්කාර වන්නේ කෙසේ ද?** යනු දැන් දතයුතු.

පැවැත්මට හෝ නිපැත්මට උපකාර වන ධර්ම ප්‍රත්‍යය බව යට කියන ලදි. මෙහි අවිද්‍යාව සංස්කාරයන්ට උපකාර වන්නේ පැවැත්මට ය. නිපැත්මට නො වේ. අවිද්‍යායෙන් සංස්කාර උපදින්නේය යි අර්ථ නො ගත යුතු. අවිද්‍යාව ඇති බව හේතු කොටැ ගෙන සත්ත්වයන් විසින් කරනු ලබන යහපත හේ අයහපත සංස්කාර හෙවත් කර්ම වන්නේය යි අර්ථ ගත යුතු. ව්‍යතිරෙක ක්‍රමය බලනු. අවිද්‍යාව නැත්නම් සංස්කාර ද නො වන්නේ ය. රහතන්ට අවිද්‍යාව නැත. එ බැවින් රහතන් විසින් කරනු ලබන යහපත වේවා, අයහපත වේවා, සංස්කාර හෙවත් කර්ම නො වන්නේ ය. එබැවින් ම එය ක්‍රියා යයි කියනු ලැබේ.

අවිද්‍යාව එකාන්ත අකුශලයෙක. සංස්කාර කුශල වූයේ ද ඇත. අකුශල වූයේ ද ඇත. අවිද්‍යායෙන් අපුඤ්ඤාභිසංඛාර සංඛ්‍යාත අකුසල වේවා, කොසඹ බීජයෙන් කොසොඹ පැල හටගනීවා, අවිද්‍යායෙන් පුඤ්ඤාභිසංඛාර ආනෙඤ්ජාභිසංඛාර සංඛ්‍යාත කුසල කෙසේ වන්නේ ද? කොසොඹ බීජයෙන් උක් හෝ මුද්‍රික හෝ හටගත හැකි ද? යනු

ප්‍රශ්නයෙකි. ඵලය හේතුවට සමාන ම විය යුතුය යන නියමයෙක් ලෝකයෙහි නැත. හේතුවට විරුද්ධ වූ ද අවිරුද්ධ වූ ද සමාන වූ ද අසමාන වූ ද ඵල ඇත්තේ ය. ගො ලෝමයෙන් කුසතණ නැගෙ යි. කොසොඹ බීජයෙන් කොසොඹ පැල හට ගනියි. එමෙන් අවිද්‍යා ප්‍රත්‍යයයෙන් කුශලාකුශල වන්නේ ය යි දතයුතු.

අවිද්‍යාව ප්‍රහීන නො වීම හේතු කොට ගෙනැ ජාති ජරා මරණාදි අනේකවිධ ආදීනවයෙන් යුක්ත වූ පුණ්‍ය ඵලය යි කියන ලද දෙව්මිනිස් ආදි සුඛ සම්මත දුක, දුක වශයෙන් නො දැන එය ලබා ගැන්ම සඳහා දෙවඟනක් දැකැ ඇය ලබාගන්නට මරු ප්‍රපාතයට නගින කාමුක පුරුෂයකු සේ සත්ත්වයා පුඤ්ඤාභිසංඛාර රැස් කරන්නේ ය. එසේ ම සුඛ සම්මත වූ ඒ පුණ්‍යඵල අවසානයෙහි විපරිනාම දුක් සහිත බව හෝ අල්පාස්වාද බව හෝ නො දැන දිලියෙන පහන් සිල්ලට පතින පලඟැටියා සේ ද මී වැකුණු කඩු මුණත ලෝනා පුරුෂයා සේ ද පුඤ්ඤාභිසංඛාර රැස් කරන්නේ ය.

මතු විපාක දෙන කාමසේවනාදියෙහි ආදීනව නො දැනැ සැපයෙක යන සංඥායෙන් ද ක්ලේශයන්ගෙන් අභිභූත බැවින් ද අශුචි ගෙනැ කෙළනා කොලුවකු සේ විස කා මැරෙනු කැමති පුරුෂයකු සේ අපුඤ්ඤාභිසංඛාර රැස් කරන්නේ ය.

අරූප විපාකයෙහි සංඛාර විපරිනාම දුක නො දැනැ ප්‍රේත පුර මාර්ගයට බැස ගත් මංමුළා වූවකු සේ ආනෙඤ්ජාභිසංඛාර රැස් කරන්නේ ය.

මෙසේ අවිද්‍යාව ඇති බව හේතු කොටැ ගෙනැ කුසල් ද අකුසල් ද වන බව දත යුතු. අවිද්‍යාව සංඛාරයන්ට පට්ඨාන නයෙන් කෙසේ කෙසේ ප්‍රත්‍යය වන්නේ ද යනු මතු දක්වනු ලැබේ.

**ප්‍රශ්න.**

1. අවිද්‍යාව නම් කිම? එය කවර සිතෙක සහජාත වශයෙන් ඇත්තේ ද? කවර සිතෙක අනුසය වශයෙන් ඇත්තේ ද? කවර සිතෙක සම්පූර්ණයෙන් නැත්තේ ද?
2. සංස්කාර නම් කිම? සංඛාර ශබ්දයෙන් වාච්‍ය වන අර්ථ කවරේද? මෙහි කවර අර්ථයෙක් ගත යුතු ද? පුඤ්ඤාභිසංඛාර අපුඤ්ඤාභිසංඛාර ආනෙඤ්ජාභි සංඛාර කායසංඛාර, වචීසංඛාර, මනො සංඛාර මේ මේ යයි දක්වනු.
3. අවිද්‍යායෙන් සංස්කාර වේ ය යි කුමක් හෙයින් කියනු ලැබේ ද?
4. අකුශල මූලයක් වූ අවිද්‍යායෙන් කුසල ඇතිවීමේ ක්‍රමය දක්වනු.
5. කුමක් හෙයින් සත්ත්වයෝ කාම, රූප, අරූප ලෝකයන්හි සැරිසරත් ද?

## 4. සංස්කාර ප්‍රත්‍යයයෙන් විඥානවන්නේ ය.

1. සංස්කාර යනු කිම? 2. විඥාන යනු කිම? 3. සංස්කාර ප්‍රත්‍යයයෙන් විඥාන වන්නේ කෙසේ ද? යනු මෙහි ලා දත යුතු.

1. **සංස්කාර** යනු යට දැක්වුණු පුඤ්ඤාභිසංඛාර, අපුඤ්ඤාභිසංඛාර, ආනෙඤ්ජාභිසංඛාර මැ යි. මින් පුඤ්ඤාභි සංඛාර අතුරෙන් අභිඤ්ඤා චේතනාව ද, අපුඤ්ඤාභිසංඛාර අතුරෙන් උපෙක්ඛා සහගත උද්ධච්චසම්පයුත්ත චේතනාව ද ප්‍රතිසන්ධි විපාක දීමෙහි ශක්ති නැති බව දත යුතු යි. එහෙත් ඒ දෙක ද, "**අවිජ්ජා පච්චයා සංඛාරා**" යන මෙහි සංඛාරයන්ට ඇතුළති.

2. **විඥාන** යනු විපාක විඥානය හෙවත් විපාක සිත් ය. ඒ වනාහි ප්‍රතිසන්ධි විපාක විඥානය ප්‍රවෘත්ති විපාක විඥාන යයි දෙවැදැරුම් වේ. ප්‍රතිසන්ධි විපාක විඥාන නම් එකුන්විසි ප්‍රතිසන්ධි සිත් ය. එ නම් කුසල අහේතුක විපාක වූ උපෙක්ඛා සහගත සන්තීරණය, කාමාවචර සහේතුක විපාක අට, රූපාවචර විපාක පස, අකුශල විපාක උපෙක්ඛා සහගත සන්තීරණය, අරූප විපාක සතර යන මේ ය.

ප්‍රවෘත්ති විපාක විඥාන නම් දෙතිස් ලෞකික විපාක සිත් ය. එ නම් කාමාවචර කුසල අහේතුක විපාක අට හා සහේතුක විපාක අට, රූපාවචර විපාක පස, අකුශල විපාක සත, අරූපාවචර විපාක සතර යන මේ ය. ලෝකෝත්තර විපාක මෙහි ඇතුළත් නොවන බව දත යුතු යි.

3. **සංස්කාර ප්‍රත්‍යයයෙන් විඥානය වන්නේ කෙසේ ද?** මෙය ගැඹුරු තැනෙකි. විස්තර කළ යුතු තැනෙකි. යට දැක්වුණු චිත්ත ප්‍රවෘත්ති ක්‍රමය උගත්තවුන්ට පහසුයෙන් තේරුම් ගත හැකි ය. නැතහොත් තේරුම් ගැනීම දුෂ්කර ය. සිහි උපදවා ගෙනැ බලනු.

පැවැත්මට හා නිපැත්මට උපකාර වන්නේ ප්‍රත්‍යය ය යි යට කියන ලදි. අවිද්‍යාව සංස්කාරයන්ට උපකාර වූයේ පැවැත්මට ය. නිපැත්මට නො වේ. එහෙත් සංස්කාර විඥානයට උපකාර වන්නේ නිපැත්මට ය. පැවැත්මට නො වේ. සංස්කාර ගිය ජාතියට අයත් ය. විඥාන මේ ජාතියට අයත් ය. ගිය ජාතියේ රැස් කළ සංස්කාර සංඛ්‍යාත කර්ම හේතු කොට ගෙනැ මේ ජාතියේ විඥාන සංඛ්‍යාත විපාක පහළ වේ යනු මෙහි යතාර්ථය යි. එය එ සේ ම යයි කෙසේ දත යුතු ද? ගිය ජාතියේ සංස්කාර නුවූයේ නම් මේ ජාතියේ විඥාන කැල ම නො ලැබෙන බැවිනි. එසේ නො වැ ලැබෙන්නේ නම් සියල්ල සමාන විය යුතු ය. ධාතු ගුණ නානාත්වයෙන් වෘක්ෂලතාදීන්ගේ ප්‍රභේදය වන්නා සේ සංස්කාර සංඛ්‍යාත කර්ම නානාත්වයෙන් විඥානයාගේ ප්‍රභේදය වන්නේ ය. එයින් ම සත්ත්ව ප්‍රභේද ද වන්නේ ය. මෙයින් නිර්මාතෘ වාදය ද අහේතුක අප්‍රත්‍යය වාදය ද නිරස්ත වන බව දත යුතු යි.

දැන් දැනැ ගත යුත්තේ කවර කවර සංස්කාරයෙකින් කවර කවර විඥාන වන්නේ ද යනු යි.

කාමාවචර කුසල සිත් අට ද, රූපාවචර කුසල සිත් පස දැයි පුඤ්ඤාභිසංඛාර තෙළෙසෙකි. මින් කාමාවචර කුශල අට අතුරෙන් ද්විහේතුක ඔමක කුශල සංස්කාර සතරින් මනුෂ්‍ය ලෝකයෙහි ජාත්‍යන්ධ ජාතිබදිරාදීන්ගේ වශයෙන් ද දිව්‍යලෝකයෙහි බූමාටු දෙවියන්ගේ හා විනිපාතික අසුරයන්ගේ වශයෙන් ද **කුශල විපාක උපෙක්ඛා සහගත සන්තීරණ** සංඛ්‍යාත ප්‍රතිසන්ධි විපාක විඥානය ලැබේ. ප්‍රවෘත්ති විපාක වශයෙන් කුශල අහේතුක විපාක විඥාන අට ලැබේ.

ත්‍රිහේතුක ඔමක කුශල සංස්කාර සතරින් හා ද්විහේතුක උත්කෘෂ්ට කුශල සංස්කාර සතරින් ද්විහේතුක ප්‍රතිසන්ධි විපාක විඥාන සතර ලැබේ. ප්‍රවෘත්ති විපාක වශයෙන් ත්‍රිහේතුක රහිත ද්වාදශ විපාක විඥාන ලැබේ.

ත්‍රිහේතුක උත්කෘෂ්ට කුශල සංස්කාර සතරින් ත්‍රිහේතුක ප්‍රතිසන්ධි විඥාන සතර ලැබේ. ප්‍රවෘත්ති විපාක වශයෙන් සොළොස් විපාක විඥාන ම ලැබේ.

රූපාවචර කුශල සංස්කාර පසින් රූපාවචර විපාක විඥාන පස ලැබෙන්නේ ය. මේ **පුඤ්ඤාභිසංඛාර ප්‍රත්‍යයයෙන් ලැබෙන විඥාන යි.**

අපුඤ්ඤාභිසංඛාර සංඛ්‍යාත දොළොස් අකුශල සංස්කාර අතුරෙන් උද්ධච්චසහගත චිත්තය හැර සෙසු එකොළොසින් සතර අපායයෙහි ප්‍රතිසන්ධි වශයෙන් අකුශල විපාක උපෙක්ඛා සහගත සන්තීරණ විඥානය ලැබේ. ප්‍රවෘත්ති කාලයෙහි ඒ දොළොසින් ම සප්ත අකුශල විපාක විඥාන ලැබේ. මේ අකුශල ප්‍රවෘත්ති විපාක සත සුදුසු පරිදි සියලු කාම භූමි රූප භූමින්හි ලැබෙන බවද දත යුතු. මේ අපුඤ්ඤාභිසංඛාර ප්‍රත්‍යයයෙන් ලැබෙන විඥාන යි.

ආනෙඤ්ජාභිසංඛාර සංඛ්‍යාත අරූපාවචර කුශල සංස්කාර සතරින් අරූපාවචර විපාක විඥාන සතර ලැබේ. මේ ආනෙඤ්ජාභිසංඛාර ප්‍රත්‍යයයෙන් ලැබෙන විඥාන යි. මේ සියල්ල පිළිබඳ විශේෂ විභාගයට **වීථිපාද, වීථිමුක්ත** පාදාදීන්හි දැක්වුණු බව දත යුතු යි.

කිය යුත්තෙක් ඇත. අවිද්‍යා හා සංස්කාර හා අතීත හේතු පසට අයත් ය. ඒ අවිද්‍යා සංස්කාර වත් ම තෘෂ්ණා, උපාදාන භව ද වන්නේ ය. එහෙයින් අවිද්‍යා සංස්කාර ගනුත් ම තෘෂ්ණා, උපාදාන, භව ද ගත යුතු යයි යට කියන ලදි. විඥාන වර්තමාන ඵල පසට අයත් ය. ඒ විඥාන සමග නාමරූප, සළායතන, ඵස්ස, වේදනා ද බොහෝ සෙයින් යෙදී සිටින බව දත යුතුය. ඒ පිළිබඳ විස්තර විභාගය මතු දැක්වේ.

විමසා බලනු. සංස්කාර සංඛ්‍යාත කර්ම ගිය ජාතියේ ය. ඒ සංස්කාර සංඛ්‍යාත කර්මයෙන් කිසිවක් මේ ජාතියෙහි විඥාන සංඛ්‍යාත විපාක බවට ආයේ ද? ආයේයයි ද නො කිය යුතු ය. ඔවුන් නැතිවැ වූයේය යි ද නො කිය යුතුය. ශබ්දයෙන් නැගෙන දෝංකාර, පහනින් දල්වා ගන්නා පහන්, මුද්‍රායෙන් ගන්නා සටහන්, මිනිසකුගෙන් ගන්නා ඡායාරූප

ගැනැ සිතනු. ඒ ශබ්දාදියෙන් දෝංකාරාදි බවට කිසිවක් ආයේ ද? නැත. ඒ ශබ්දාදිය නැත්නම් දෝංකාරාදිය වන්නේ ද? නැත. මේ ත් එ බඳු ය.

එසේ නම් එක ම පරම්පරා සම්බන්ධ හෙයින් සංස්කාර හා විඥාන හා හෙවත් කර්ම හා විපාක හා එකත්වයෙහි ලා නො කිය යුතු ද? නො කිය යුතු ය. කිරෙන් දී සෑදෙයි. කිරි හා දී හා එක ද? නැත. කිරි අනෙකෙකි. දී අනෙකෙකි. මේත් එ බඳු ය.

එසේ නම් කර්මය අනෙකෙකි. විපාකය අනෙකෙකි. එහි එකගත්වයෙක් නැත. නානාත්වය ඇතැයි නො කිය යුතු ද? එ සේත් නො කිය යුතු ය. දිය කිරි අයත් ය. නැතහොත් දී හා කිරි හා සම්බන්ධ නො විය යුතු යි. මේ ත් එ බඳු ය.

තව ද විමසනු. කර්මය කළ තැනැත්තා හෙවත් ඔහු පිළිබඳ ස්කන්ධසන්තතිය විපාක විඳින අවස්ථායෙහි නැත. හේ හෝ එය ඒ ඒ තන්හි ම භඞ්ග වැ ගියේ ය. කර්මයෙන් ද කිසිවක් විපාක බවට නො ආයේ ය. ඉතින් අනිකකු කළ කර්මයට අනිකෙක් විපාක විඳින්නේ නො වේ ද? නො වේ. අඹ බිජුවටින් අඹරුකෙක් සෑදේ. ඒ රුකෙහි අඹගෙඩි සෑදේ. මුල් අඹ බිජු වට නැත. එයින් කිසිවක් අර අඹ ගෙඩිවලට ආයේ ද? නැත. මුල් අඹබිජුවටෙහි සම්බන්ධයක් පසු අඹගෙඩිවලට නැත්තේ ද? ඇත්තේ ය. මේත් එ බඳු ය. කුඩා කල උගත් ශිල්පශාස්ත්‍ර ද කුඩා කල වැළඳූ බෙහෙත් ද වැඩුණුකල ද ඵල දෙන්නේ ය.

සංස්කාර සංඛ්‍යාත කර්ම මේ තාක් විද්‍යමාන වැ ඇති හෙයින් විපාක දෙන්නේ ද? නැතහොත් විද්‍යමාන වැ නැති හෙයින් විපාක දෙන්නේ ද? විද්‍යමාන වැ ඇති හෙයින් විපාක දෙන්නේ නම් කර්ම ප්‍රවෘත්ති ක්‍ෂණයෙහි ම විපාක දිය යුතු. විද්‍යමාන වැ නැති හෙයින් විපාක දෙන්නේ නම් කර්මයෙන් පළමු හෝ විපාක දිය යුතු ය. කර්මය විද්‍යමාන වැ ඇති බව හෝ නැති බව විපාකයට කරුණු නො වේ. කර්මය කළ බව ම කරුණු වේ. **"කාමාවචරස්ස කුසලස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා උප්පන්නං හොති චක්ඛුවිඤ්ඤාණං"** - කාමාවචර කුශල කර්ම කළ බැවින් චක්‍ෂුවිඥානය උපන්නේ වේ යනු බුද්ධවචනයයි. ණය ගත්තේ ය. ණය දුන්නේ ය. ගනුදෙනුව එයින් අවසාන ය. පොළිත් සමග ණය ගෙවිය යුත්තේ ණය ගනුදෙනුව මේ තාක් විද්‍යමාන වැ ඇති බැවින් හෝ නැති බැවින් නොවේ. කළ බැවිනි. මේ ත් එබඳු ය.

## ප්‍රශ්න.

1. විඥාන උපදවන සංස්කාර කවරේ ද? ප්‍රතිසන්ධි විඥාන නූපදවන සංස්කාරත් ඇත්තේ ද? ඒ කවරේ ද?
2. මෙහි විඥාන යනු කිම? ඒ කී වැදෑරුම් ද? කවර කවර සංස්කාරයෙකින් කවර කවර විඥාන වන්නේ ද?
3. විඥානය සංස්කාරයෙන් වන්නේ යයි කෙසේ දත යුතු ද? සංස්කාරයෙන් විඥාන බවට කිසිවක් එන්නේ ද?

4. විඥාන හා සංස්කාර හා එකත්වයෙහි හෝ නානාත්වයෙහි ලා නො කිය යුතු කිම?
5. කර්මය කෙළේ අනිකෙකි. විපාක විඳින්නේ අනිකෙකි යි නො කිය යුතු මන් ද? කර්මයට විපාක ලැබෙන්නේ ඒ කර්මය විද්‍යමාන වැ ඇති බැවින් ද? නැති බැවින් ද?

## 5. විඥාන ප්‍රත්‍යයයෙන් නාමරූප වන්නේ ය.

1. විඥාන යනු කිම? 2. නාමරූප යනු කිම? 3. විඥාන ප්‍රත්‍යයයෙන් නාමරූප වන්නේ කෙසේ ද? යනු මෙහි ලා දත යුතු ය.

1. **විඥාන** යනු යට දැක්වුණු විපාක විඥාන මැ යි. විපාක සිත් හි චිත්ත චෛතසික සම්ප්‍රයුක්ත වැ ම ඇත්තේ ය. එහෙත් මෙහි විඥාන යනුවෙන් චිත්ත පමණක් ම ගත යුතුය. චෛතසික කොටස නාමරූප යන තන්හි නාම යන්නෙන් දැක්වේ. "**සංඛාර පච්චයා විඤ්ඤාණං**" යි කී තන්හි ද විඤ්ඤාණ යන්නෙන් කියවුණේ චිත්තය පමණෙකි. චිත්ත චෛතසික එක්වැ යෙදුණද ඔවුන්ගේ සූක්‍ෂමභේදය නිතර සිත්හි තබාගත යුතු යි. "අවිජ්ජා" යි කීයේ මෝහ චෛතසිකය යි. සංඛාරයි කීයේ චේතනා චෛතසිකය යි. විඤ්ඤාණ යි කීයේ චිත්තය යි. චෛතසිකයෙන් තොර වැ චිත්තය පමණෙක් කිසි විටෙක පහළ වේ ද? නැත. විඤ්ඤාණ වත් ම නාම රූප සළායතන ඵස්ස වේදනා ද වන්නේ ය. එහෙත් විඤ්ඤාණ නැත්නම් චෛතසික කැල ම නැත. එ බැවින් "**සංඛාර පච්චයා විඤ්ඤාණං**" යි පළමු කොටැ කියන ලදි.

2. **නාම රූප** යන්නෙහි නාම නම් වේදනා සඤ්ඤා සංඛාර යන ස්කන්ධත්‍රය යි - හෙවත් චෛතසික යි. රූප නම් අට විසි රූප යි. මෙහි විපාක විඥාන සමග යෙදෙන නාම රූප ගත යුතු යි. තව ද "**නාමං ච රූපං ච - නාමරූපංඤ-නාමරූපං**" නාම ද රූප ද - නාමරූප යි එක ශේෂ කොටැ ගත යුතු යි. එවිට

(අ) විඥාන ප්‍රත්‍යයයෙන් නාම වන්නේ ය
(ආ) විඥාන ප්‍රත්‍යයයෙන් රූප වන්නේ ය
(ඉ) විඥාන ප්‍රත්‍යයයෙන් නාමරූප වන්නේ ය යි

ත්‍රෛවිධ්‍යයෙක් වෙ යි.

(අ) විඥාන ප්‍රත්‍යයයෙන් නාම පමණෙක් වන්නේ කොහි ද? චතුවොකාර භව සංඛ්‍යාත අරූපාවචරයෙහි ය සතර අරූප භවයෙහි රූප නැත. ඇත්තේ චිත්ත චෛතසික සන්තතිය පමණෙකි. එබැවින් විඥාන ප්‍රත්‍යයයෙන් නාමය වන්නේ ය යනු එහි යෙදේ.

(ආ) විඥාන ප්‍රත්‍යයයෙන් රූප පමණෙක් වන්නේ කොහි ද? එකවොකාර භව සංඛ්‍යාත අසඤ්ඤසත්තයෙහි ය. අසඤ්ඤසත්තයෙහි රූප සන්තතිය ම විනා චිත්ත චෛතසික කැල ම නැත. එ බැවින් විඥාන ප්‍රත්‍යයයෙන් රූප වන්නේ ය යනු එහි යෙදේ. රූප ප්‍රතිසන්ධික බැවින් එහි විඤ්ඤාණ ද නැත්තේ නො වේ ද? කුමක් හෙයින් විඥාන ප්‍රත්‍යයයෙන් රූප වන්නේ ය යි කීයේ ද? එහි විඤ්ඤාණ යන්නෙන් අනික් තන්හි සේ විපාක විඤ්ඤාණ නො ගත යුතු ය. අභිසංඛාර විඤ්ඤාණගත යුතු ය. ඔහු පිළිබඳ පංචවොකාර භවයෙහි අභිසංඛාර විඤ්ඤාණ ප්‍රත්‍යයයෙන් රූප වූයේය යි ගත යුතු ය. එවිට මෙය "**සංඛාර පච්චයා විඤ්ඤණං**" යි කී සේ වන්නේ ය. **පටිච්චසමුප්පාදයෙහි** මේ විශේෂ තැනෙකි.

**විශුද්ධිමාර්ගයෙහි:-**
**"නාමරූපස්ස යං හෙතු විඤ්ඤණංතං ද්විධා මතං**
**විපාකමවිපාකං ච යුත්ත මව යතො ඉදං"**

යි කියන ලද්දේ මේ සඳහා යි.

(ඉ) විඥාන ප්‍රත්‍යයයෙන් නාමරූප වන්නේ කොහි ද? පංචවොකාර භව සංඛ්‍යාත සෙසු තන්හි ය. සෙසු කාමරූප භවයන්හි විඥාන ප්‍රත්‍යයයෙන් නාම රූප දෙක ම වන්නේ ය.

**3. විඥන ප්‍රත්‍යයයෙන් නාම රූප වන්නේ කෙසේ ද?**
පැවැත්මට හා නිපැත්මට උපකාරවන්නේ ප්‍රත්‍යය යි යට කී බව සිහි කරන සංඛාර විඥානයට ප්‍රත්‍යය වූයේ නිපැත්මට ය. පැවැත්මට නොවේ. සංඛාර සංඛයාත ප්‍රත්‍යය අන්‍ය භවයෙක ය. විඥාන සංඛ්‍යාත ප්‍රත්‍යයොත්පන්නය අන්‍ය භවයෙක ය. (නාමරූප සළායතන ඵස්ස වේදනා ද විඥාන සමග ම බව මෙහි දී ද සලකනු.) විඥාන නාම රූපයට ප්‍රත්‍යය වන්නේ පැවැත්මට ය. නිපැත්මට නො වේ. විඥානවත් ම ඒ හේතුවෙන් නාම රූප ද වන්නේ ය යි එවිට අර්ථ ගත යුතු ය. විඥාන ප්‍රතිසන්ධි චිත්ත ය. නාම එහි යෙදෙන චෛතසික ය. රූප ඒ සමග ම උපදින කර්මජ රූප ය. මේ තුන් කොටසෙහි පහළ වීම ඉදිරි පසු නො වැ එක විට ම සිදු වන්නෙකි. ප්‍රධාන උණලීයක් සමග තව ද උණමිටි දෙකක් බැඳි උණමිටියෙක් අහසින් හෙයි. එය බිම පතිත වන්නේ එක විට ම පතිත වෙයි. කෙසගකු දු ඉදිරි පසු නො වේ. එහෙත් ප්‍රධාන උණලීය අනික් මිටි දෙකේ පැවැත්මට උපකාර ය. මේත් එබඳුයයි දත යුතු. එහි විශේෂ විභාගය මෙසේ ය.

**අණ්ඩජ, ජලාබුජ, සංසෙදජ, ඔපපාතිකය යි සත්‍වයන්ගේ උත්පත්ති ක්‍රම සතරෙකි.** බිජුවටින් හටගන්නා පක්ෂි සර්පාදි **අණ්ඩජ** ය. මව්කුස හටගන්නා මනුෂ්‍යාදි **ජලාබුජ** ය. මේ කිසි සම්බන්ධයක් නැති වැ පහළ වන දෙවාදි **ඔපපාතික** ය.

අණ්ඩජ ජලාබුජයෝ ඉදින් ස්ත්‍රීභාව පුරුෂභාව රහිතව උපදිත් නම් ඔවුන්ගේ ප්‍රතිසන්ධි විඥානය හා සමග කොටස් තෙවිස්සෙක් වෙයි. එනම් වේදනා, සඤ්ඤා, සංඛාර, කායදසක, දත්‍වුදසක යන මේ ය. වේදනා, සඤ්ඤා, සංඛාර, නාම ය. පඨවි, ආපෝ,

තේජෝ, වායු, වණ්ණ, ගන්ධ, රස, ඔජා, ජීවිතින්ද්‍රිය, කාය යනු කායදසකය යි. මුල් නවය ම හදයවත්‍ථු සමග වත්‍ථු දසක යි.

අණ්ඩජ, ජලාබුජයෝ ඉදින් භාව සහිත වැ උපදිත් නම් ඔවුන්ගේ ප්‍රතිසන්ධි විඥානය සමග කොටස් තෙතිසෙක් වෙයි. මෙහි භාවදසකයෙක් වැඩිණි.

ඕපපාතිකයන් අතුරෙන් බ්‍රහ්මයන්ගේ ප්‍රතිසන්ධි විඥානය සමග කොටස් දෙසාළිසෙකි. එ නම් වේදනා, සඤ්ඤා, සංඛාර, චක්ඛුදසක, සෝතදසක, වත්‍ථුදසක, ජීවිතින්ද්‍රිය නවක යන මේ ය.

කාමභවයෙහි සභාවක වැ පරිපූර්ණායතන වැ පහළ වන ඕපපාතිකයන්ගේ ද සංසේදජයන්ගේ ද ප්‍රතිසන්ධි විඥානය සමග කොටස් තෙසැත්තෑවෙ (73) ක් වෙයි. එනම් වේදනා, සඤ්ඤා, සංඛාර, චක්ඛුදසක, සෝතදසක, ඝාණදසක, ජිව්හා දසක, කායදසක, භාවදසක, වත්‍ථුදසක යන මේ ය. අභාවකයන්ගේ හෝ අපරිපූර්ණායතනයන්ගේ වශයෙන් මේ අඩු විය හැකි බව ද සලකනු.

අරූපීන්ගේ ප්‍රතිසන්ධි විඥානය සමග වේදනා, සඤ්ඤා, සංඛාර යන අරූප ස්කන්ධ තුන වේ.

අසඤ්ඤසත්තයන්ට ප්‍රතිසන්ධි වශයෙන් පහළ වන්නේ ජීවිත නවක ය යි.

මේ සියලු තන්හි විඥාන ප්‍රත්‍යයයෙන් වූ නාමරූප යි.

සිතින් රූප නැඟෙන සැටි ප්‍රත්‍යක්‍ෂ වශයෙන් දැක්ක හැකි ය. සිත ප්‍රසන්න කල්හි රූප ද ප්‍රසන්න වේ. සිත අප්‍රසන්න කල්හි රූප ද අප්‍රසන්න වේ. ප්‍රත්‍යක්‍ෂයෙන් අප්‍රත්‍යක්‍ෂය අනුමාන කළ හැකි ය. විඥාන ප්‍රත්‍යයයෙන් රූප වේ යනු මේ නයින් සිතා ගත යුතු යි.

**ප්‍රශ්න.**

1. විඥාන යනු කිම?
2. නාම රූප යනු කිම? කුමක් හෙයින් මෙය නාම ද, රූප ද, නාමරූප ද, නාමරූපය යි එකශේෂ කළ යුතු ද?
3. අසඤ්ඤසත්තයෙහි විඤ්ඤාණ නැත්තේ ය. එහි ‘විඤ්ඤාණ පච්චයා නාම රූපං’ යනු කෙසේ සිද්ධ වේද?
4. විඤ්ඤාණ හා නාමරූප හා එක්වට ම උපදින්නේ ද නැත හොත් වෙන් වෙන් වැ උපදින්නේ ද? පැහැදිලි කැරැ දක්වනු.
5. අණ්ඩජාදි සතර යෝනි පිළිබඳ විඥාන ප්‍රත්‍යයයෙන් වන නාම රූප මේ මේ ය යි විස්තර කරනු. විඤ්ඤාණයෙන් රූප වන්නේ ය යනු කෙසේ දැන ගත හැකි ද?

## 6. නාම රූප ප්‍රත්‍යයයෙන් ෂඩායතන වන්නේ ය.

1. නාමරූප යනු කිම? 2 ෂඩායතන යනු කිම? නාමරූප ප්‍රත්‍යයෙන් ෂඩායතන වන්නේ කෙසේ ද? යනු මෙහිලා දත යුතු යි.

1. නාමරූප යනු යට දැක්වුණු නාමරූප ම ය. එ ද නාම ද රූප ද නාමරූපය යි එකශේෂ කළ යුතු. නාම චතුවොකාර භව සංඛ්‍යාත අරූපාවචර සඳහා ය. නාමරූප පංචවොකාර භව සඳහා ය.

2. ෂඩායතන නම්; චක්ඛායතන, සෝතායතන, ඝාණායතන, ජිව්හායතන, කායායතන, මනායතන යන මේ සයයි. චක්ඛායතන නම් චක්‍ෂුඃප්‍රසාද රූප ය. සෝතායතනාදිය ශ්‍රෝත්‍ර ප්‍රසාදරූපාදිය යි. මනායතනය චක්ඛුවිඤ්ඤාණාදිය යි. මෙහි දු ෂෂ්ඨායතනය ද ෂඩායතනය ද ෂඩායතනය යි එකශේෂ කළ යුතු ෂෂ්ඨායතනය අරූපාවචර සඳහා ය. ෂඩායතන පංචවෝකාර භව සඳහා ය.

3. නාමරූප ප්‍රත්‍යයයෙන් ෂඩායතන වන්නේ කෙසේ ද? මෙහි දු පැවැත්මට උපකාර වන්නේ ප්‍රත්‍යය යි ගත යුතු. නාමරූප ඇති කල්හි ඒ නාමරූපයන්ට ම ඇතුළත් යයි කියයුතු වූ සයෙක් ඒ නාමරූප ඇතිහෙයින් ම ආයතන වන්නේ ය යි අර්ථ නො ගත යුතු.

විඤ්ඤාණ සමග ම නාමරූප සළායතන ඵස්ස වේදනා වෙති යි යට කියන ලදි. විඤ්ඤාණ වත් ම ඒ සමග ම නාම රූප ද වන්නේ ය. ෂඩායතනයෝ විඤ්ඤාණ නාම රූපවලින් බැහැරවූවෝ නො වෙති. එහි ම ඇතුළත් වූවෝ ය. විඤ්ඤාණ නාමරූප ගනුත්ම පරිපූර්ණ නාමකාය ද රූපකාය ද ගැනුණේ ය. එසේ වුව ද එහි වූ සත්ත්වප්‍රඥප්තියට ප්‍රධානය යි කිය යුතු වූද, ඵස්සාදි මතු දැක්වෙන අඞ්ග ඇතිවීමට ආධාරය යි කිය යුතු වූ ද, සත්ත්වයන් විසින් ආත්මග්‍රහ වශයෙන් බොහෝ සෙයින් ගනු ලබන්නේ ය යි කිය යුතු වූ ද සය ආයතනය යි වෙන් කොට දැක්වීමෙන් නාමරූප ප්‍රත්‍යයයෙන් ෂඩායතනය යි වෙන් කොට දැක්වීමෙන් නාමරූප ප්‍රත්‍යයයෙන් ෂඩායතන වන්නේය යි වදාළේ ය.

මේ ෂඩායතන ඇතිවීම පිළිබඳ ද විශේෂ ඇත්තේ ය. සංසෙදජ ඕපපාතිකයන්ට නාමරූප වන කල්හි ඒ සමග ම ෂඩායතන ද වේ. ඒ ඒ ලෝක වශයෙන් මේ අඩු විය හැකිය. බ්‍රහ්මයන්ට ඝාණායතනාදිය නැති බැවිනි. ඇතැම් සංසේදජ ඕපපාතිකයන්ට චක්ඛායතනාදීන් අතුරෙන් කිසිවක් ද නො පිහිටිය හැකි ය. ගබ්භසෙය්‍යකයන්ට චක්ඛායතන වන්නේ ප්‍රතිසන්ධියෙන් එකුන් පනස් දවසකින් පසු වැ යයි කියනු ලැබේ. සෝතායතනය වන්නේ ඉන් සතියකින් පසුවැ ය. ඝාණායතනය වන්නේ ඉන් සතියකින් පසු වැ ය. ජිව්හායතනය වන්නේ ඉන් සතියකින් පසු වැ යැ. ඇතැම් කෙනෙකුන්ට ඒ ඒ ආයතන නො පිහිටිය හැකි ය. සංස්කාර විශේෂය එයට හේතු යි.

අරූපාවචරයන්ට වන්නේ මනායතනය පමණෙකි. ඔවුන්ගේ වශයෙන් නාම ප්‍රත්‍යයයෙන් ෂඪායතනය වන්නේය යි කිය යුතු යි.

## ෂඩායතන ප්‍රත්‍යයයෙන් ස්පර්ශ වන්නේ ය.

1. ෂඩායතන යනු කිම? 2 ස්පර්ශ යනු කිම? ෂඩායතන ප්‍රත්‍යයයෙන් ස්පර්ශ වන්නේ කෙසේ ද? යනු මෙහි ලා දත යුතු ය.

1. ෂඩායතන යනු යට දැක්වුණු චක්ඛාදි ආයතන සය ම ය.

2. ස්පර්ශ යනු ඵස්ස චෛතසිකය යි. ඵස්සය සියලු සිත්හි ඇත්තේ ය. එහෙත් මෙහි විපාක සිත්හි යෙදෙන ඵස්සය ගත යුතු. එ ද මේ ආයතන සම්බන්ධයෙන් චක්ඛු සම්ඵස්ස සෝතසම්ඵස්ස ඝාණසම්ඵස්ස ජිව්හාසම්ඵස්ස කායසම්ඵස්ස මනෝසම්ඵස්සය යි සැවැදැරුම් වේ. චක්ඛායතන සම්බන්ධයෙන් ලැබෙන ඵස්සය චක්ඛුසම්ඵස්සය යි. සෝත සම්ඵස්සාදිය ද මෙසේ ය. දෙතිස් විපාක සිත්හි ඇති ඵස්ස වශයෙන් ස්පර්ශය දෙතිස් වැදැරුම් ය යි ද කිය යුතු ය.

3. ෂඩායතන ප්‍රත්‍යයයෙන් ස්පර්ශය වන්නේ කෙසේ ද? මෙහි දු පැවැත්මට උපකාර වන්නේ ප්‍රත්‍යය යි දත යුතු. ෂඩායතන ඇති හෙයින් ස්පර්ශ වන්නේ ය. ෂඩායතන නැත්නම් ස්පර්ශ කැල ම නො වන්නේ ය. ෂඩායතන ස්පර්ශ උපදවන්නේ ය යි නොගත යුතු. එහි චක්ඛායතනය රූපාරම්මණය හා ගැටීමෙන් චක්ඛුවිඤ්ඤාණ වේ. එහි ඵස්සය චක්ඛුසම්ඵස්සයයි. "**චක්ඛුංච පටිච්ච රූපෙච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං තිණ්ණං සඞ්ගති ඵස්සො**" යනු සැලකිය යුතු සෝතසම්ඵස්සාදිය ද මෙසේ ය. එවිට මනෝසම්ඵස්ස යනු මෙහි ලා දෙපස් විඤ්ඤාණ හැර සෙසු විපාක සිත්හි ඵස්ස යි.

## ස්පර්ශ ප්‍රත්‍යයයෙන් වේදනා වන්නේ ය.

මෙහි දු 1 ස්පර්ශ කිම? 2 වේදනා කිම? 3 ස්පර්ශ ප්‍රත්‍යයයෙන් වේදනා වන්නේ කෙසේ ද? යනු දත යුතු.

1. ස්පර්ශ යනු යට දැක්වුණු ඵස්සය මැ යි.

2. වේදනා යනු වේදනා චෛතසිකය යි; එ ද සියලු සිත්හි ඇත්තේ ය. මෙහි විපාක සිත්හි වේදනා ගත යුතු. එ ද චක්ඛුසම්ඵස්සජ වේදනා සෝතසම්ඵස්සජ වේදනා, ඝාණ සම්ඵස්සජ වේදනා ජිව්හා සම්ඵස්සජ වේදනා, කායසම්ඵස්සජ වේදනා, මනෝ සම්ඵස්සජ වේදනා ය යි, සවැදැරුම් වේ. චක්ඛු සම්ඵස්සයෙන් ඇති වන වේදනා චක්ඛුසම්ඵස්සජ වේදනා ය. සෙස්ස ද මෙසේ ය. දෙතිස් විපාක සිත් වශයෙන් වේදනා දෙතිස් වැදැරුම් ය යි ද කිය හැකි ය.

3. ස්පර්ශ ප්‍රත්‍යයයෙන් වේදනා වන්නේ කෙසේ ද? මෙහි දු පැවැත්මට උපකාරවන්නේ ප්‍රත්‍යය යි ගත යුතු. ඵස්සය ඇති හෙයින් වේදනා වන්නේ ය. ඵස්සය නැත්නම් කැල ම වේදනා නොවන්නේ ය. ඵස්සය වේදනා උපදවන්නේය යි නො ගත යුතු චක්ඛායතනය රූපාරම්මණයෙහි ගැටීමෙන් චක්ඛුවිඤ්ඤාණ වේ. එහි ඵස්සය චක්ඛුසම්ඵස්සය. එහි ම වේදනා චක්ඛුසම්ඵස්සජ වේදනා යි. ඵස්සය වත් ම වේදනා ද වන්නේ ය. "**ඵස්ස පච්චයා වෙදනා**" යි වදාළේ ය. සෝතසම්ඵස්සජ වේදනාදිය ද මෙසේ දත යුතු. වේදනාව ඵස්සය සේ ම සර්වචිත්ත සාධාරණ ය. එහි සුඛ, දුඃඛ, උපෙක්‍ෂා යන ත්‍රිවිධත්වය ප්‍රකට මැ යි.

චක්ඛුවිඤ්ඤාණ දෙසිතෙහි වේදනා චක්ඛුසම්ඵස්සජ වේදනා ය. සෝත විඤ්ඤාණාදියෙහි වේදනා සෝතසම්ඵස්සජ වේදනාදිය යි දෙපස් විඤ්ඤාණ හැර යට දැක්වුණු සෙසු විපාක සිත්හි වේදනා මනෝසම්ඵස්සජ වේදනා යි.

විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස වේදනා යන පස වර්තමාන ඵලපඤ්චක ය යි. මෙය විපාක වට්ටයට ද ඇතුළති.

**ප්‍රශ්න.**

1. නාමරූප ප්‍රත්‍යයයෙන් ෂඩායතන වන්නේ ය යන මෙහි ෂඩායතන කවරේ ද? ස්වරූප වශයෙන් දක්වනු. නාම රූපයට ඇතුළත් නො වන ෂඩායතන ඇත්තේ ද? කුමක් හෙයින් මෙය විශේෂ කොට දැක්විණි ද?
2. අණ්ඩජ, ජලාබුජ, සංසෙදජ, ඕපපාතිකයන් පිළිබඳ ෂඩායතන වීමේ විශේෂ ඇත්නම් දක්වනු.
3. ෂඩායතන ප්‍රත්‍යයයෙන් ස්පර්ශ වන්නේ ය යනු පැහැදිලි කරනු. ස්පර්ශ යනු කිම? ඒ කී ආකාර ද? ස්වරූප වශයෙන් දක්වනු.
4. ස්පර්ශ ප්‍රත්‍යයෙන් වේදනා වන්නේ ය යනු පැහැදිලි කරනු. වේදනා යනු කිම? ඒ කී ආකාර ද? ස්වරූප වශයෙන් දක්වනු.
5. ඵස්ස වේදනා සියලු සිත්හි ඇතත් මෙහි විපාක සිත්හි යෙදුණවුන් ගැනීමේ යුක්ති කවරේ ද?

## 7. වේදනා ප්‍රත්‍යයයෙන් තෘෂ්ණා වන්නේ ය.

1. වේදනා යනු කිම? 2 තෘෂ්ණා යනු කිම? 3 වේදනා ප්‍රත්‍යයයෙන් තෘෂ්ණා වන්නේ කෙසේ ද? යනු මෙහි දු දත යුතු.

1. වේදනා යනු යට දැක්වුණු වේදනා මැයි. "**යස්මා වෙත්‍ථ අධිප්පෙතා විපාක සුඛ වෙදනා**" යි විශුද්ධිමාර්ගයෙහි දැක්වුණු බැවින් විශේෂයෙන් මෙහි සුඛවේදනා ගත යුතු.

**"සුඛවෙදනා සදිසො තණ්හාය අවස්සයො නාම නත්ථි"** සුඛ වේදනා බඳු තෘෂ්ණාවට උපකාරයක් නැතැ යි ටීකාවෙක ද දක්වන ලදි. එහෙත්

**"දුක්ඛි සුඛං පත්‍ථයති සුඛී භීයොපි ඉච්ඡති.**
**උපෙක්ඛා පන සන්තත්තා සුඛමිච්චෙව භාසිතා"** යි.

පෙනෙන බැවින් ත්‍රිවිධ වේදනා ම මෙහි වේදනා ශබ්දයෙන් ගැනෙන බව ද විශුද්ධිමාර්ගයෙහි දැක්වේ. දුක් ඇත්තේ සුව පතා සුව ඇත්තේ වඩාත් සුව පතා. උපේක්‍ෂාව ශාන්ත බැවින් සුඛය යි කියන ලදී යනු ගාථායෙහි අර්ථ යි.

2. **තෘෂ්ණා** යනු ලෝභ චෛතසිකය යි. එය ලෝභ මූලික සිත් අටෙහි සම්ප්‍රයුක්ත වශයෙන් ම ඇත්තේ ය. පියාගේ නමින් පුතාට බ්‍රාහ්මණ පුත්‍රයා සිටු පුත්‍රයා කියන්නා සේ අරමුණේ නමින් තෘෂ්ණාවට ද රූපතෘෂ්ණා ශබ්ද තෘෂ්ණා, ගන්ධ තෘෂ්ණා, රස තෘෂ්ණා, ස්ප්‍රෂ්ටව්‍ය තෘෂ්ණා ධර්ම තෘෂ්ණා ය යි කියනු ලැබේ. එයින් තෘෂ්ණාව සවැදෑරුම්. රූපය අරමුණු කොටැ පවත්නා තෘෂ්ණාව රූප තෘෂ්ණා ය. සෙස්ස ද මෙසේ ය. ඒ යළිත් කාම තෘෂ්ණා, භව තෘෂ්ණා, විභව තෘෂ්ණා ය යි තුන් වැදෑරුම් වේ. **ඇසට අරමුණු වූ රූපය කාමාස්වා ද වශයෙන් ආශ්වාදනය කරන විට තෘෂ්ණාව කාමතෘෂ්ණා ය.** එම නිත්‍යය සදාකාලිකය යි ශාස්වතදෘෂ්ටි වශයෙන් ගන්නා විට තෘෂ්ණාව භවතෘෂ්ණා ය. **ශාස්වත දෘෂ්ටි සහගත තෘෂ්ණාව භවතෘෂ්ණාය** යි කියනු ලැබේ. රූපය උච්ඡේද වන්නේ ය යි ගන්නා විට තෘෂ්ණාව විභවතෘෂ්ණා ය. **උච්ඡේද දෘෂ්ටිසහගත තෘෂ්ණාව විභව තෘෂ්ණා** ය යි කියනු ලැබේ. ශබ්දා දි අරමුණු පිළිබඳ වැ ද මෙසේ ය. මෙයින් තෘෂ්ණාව අටළොස් වැදෑරුම් විය. ඒ වැළි ත් ආධ්‍යාත්මික බාහිර වශයෙන් වැඩුණු විට සතිස් වැදෑරුම් වේ. ඒ සතිස අතීත අනාගත වර්තමාන යන කාලත්‍රය වශයෙන් වැඩුණු විට එක්සිය අට වැදෑරුම් වේ. ඒ අටෝරාශියක් තෘෂ්ණා ම මෙහි තෘෂ්ණා යන්නෙන් ගතහැකි බව දත යුතු.

**3. වේදනා ප්‍රත්‍යයයෙන් තෘෂ්ණා වන්නේ කෙසේ ද?**
මෙහිදු පැවැත්මට උපකාර වන්නේ ප්‍රත්‍යය යි ගත යුතු. වේදනා ඇති හෙයින් තෘෂ්ණා වේ. වේදනා නැත් නම් තෘෂ්ණා ද නැති. මනුෂ්‍යයෝ පුතු ආස්වාදනය කොටැ පුතු කෙරෙහි මමත්‍වයෙන් කිරිමවට සත්කාර කරති. එමෙන් සත්ත්‍වයෝ වේදනාව ආස්වාදනය කොටැ වේදනාව කෙරෙහි මමත්‍වයෙන් රූපාදී අරමුණු දෙන චිත්‍රකාරාදීන් කෙරෙහි ද සත්කාර කරත්. එ බැවින් වේදනායෙන් තෘෂ්ණා වන්නේ ය යි දත යුතු.

මේ ඵල හේතු සන්ධියෙහි වේදනා ඵල පංචකයට අයත් ය. තෘෂ්ණා හේතු පඤ්චකයට අයත් ය. එසේ ම වේදනා විපාක වට්ට ය. චිත්ත සන්තතිය ජවනයට හෙවත් කර්මත්‍වයට බැසැ ගන්නා ක්‍රමය කී සැටි බලනු.

### තෘෂ්ණා ප්‍රත්‍යයයෙන් උපාදන වන්නේ ය.
1.තෘෂ්ණා කිම? 2. උපාදාන කිම? 3. තෘෂ්ණායෙන් උපාදාන වන්නේ කෙසේ ද?

1. තෘෂ්ණා නම් යට දැක්වුණු ලෝභ මැ යි.

2. උපාදාන නම් දැඩි ව ගැන්ම ය. ඒ වනාහි **කාමූපාදන, දිට්ඨූපාදන, සීලබ්බතූපාදන, අත්තවාදූප දනය** යි චතුර්විධ වේ.

වස්තු සඞ්ඛ්‍යාත කාමය උපාදානය කරන්නේ හෙවත් දැඩි වැ ගන්නේ කාමූපාදානය "උපායාස" යන්නෙහි මෙන් මෙහි උප ශබ්දය දැඩි යන අර්ථය දේ. කාමය ම උපාදාන වූයේ හෝ කාමූපාදාන ය. එය මෙසේ විස්තර කරති. "**තත්‍ථ කතමං කාමූපාදනං? යො කාමෙසු කාමච්ඡන්‍දෙ, කාමරාගො, කාමනන්‍දි කාමතණ්හා කාමසිනෙහො, කාමපරිළාහො, කාමමුච්ඡා, කාමජ්ඣොසානං ඉදං වුච්චති කාමූපාදනං**" යි මෙයින් තෘෂ්ණායෙහි දැඩි බව ම කාමූපාදානය යි වදාළ බව දත යුතු. පූර්ව පූර්ව තෘෂ්ණාව උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් මතු මතු දැඩි වෙයි. එසේ දැඩි වූ උත්තර තෘෂ්ණාව කාමූපාදානය යි සේ යි. තෘෂ්ණාව කාමූපාදානය යි සේ යි. තෘෂ්ණාව අත දිගු කිරීම මෙනැයි ද තෘෂ්ණොපාදානය දිගු කළ අතට අසු වූ දෙය තද කොටැ අල්ලා ගැනීම මෙනැ යි ද කියත්.

දිට්ඨූපාදාන, සීලබ්බතූපාදාන, අත්තවාදූපාදාන යන සෙසු උපාදාන ත්‍රයයෙන් ම දැක්වෙනනේ මිච්ඡාදිට්ඨිය යි. එයින් දිට්ඨූපාදාන නම් දශ වස්තුක මිථ්‍යාදෘෂ්ටිය යි වදාළේ මැ යි. "**තත්‍ථ කතමං දිට්ඨූපාදනං" නත්‍ථි දින්නං නත්‍ථි යිට්ඨං, නත්‍ථි හුතං, නත්‍ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො, නත්‍ථි අයං ලොකො, නත්‍ථි පරොලොකො, නත්‍ථි මාතා නත්‍ථි පිතා, නත්‍ථි සත්තා ඕපපාතිකා, නත්‍ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මා පටිපන්නා යෙ ඉමං ච ලොකං පරං ච ලොකං සයං අභිඤ්ඤ සච්ඡිකත්‍වා පවෙදෙන්තීති යා එවරූපා දිට්ඨි -පෙ- විපරියෙසගාහො ඉදං වුච්චති දිට්ඨූපාදනං**" යි සීලබ්බතූපාදාන නම් අජශිලාදියෙන් හා කුක්කරව්‍රතාදියෙන් ශුද්ධිය වන්නේය යි විශ්වාස ගැන්ම ය. වදාළේ මැ ය. "**තත්‍ථ කතමං සීලබ්බතූපාදනං සීලෙන සුද්ධි, වතෙන සුද්ධි, සීලබ්බතෙන සුද්ධීති යා එව රූපා දිට්ඨි -පෙ- විපරියෙසගාහො ඉදං වුච්චති සීලබ්බතූපාදනං**" යි.

අත්තවාදූපාදාන නම් විසි වැදෑරුම් සක්කායදිට්ඨිය යි වදාළේ මැ යි. "**තත්‍ථ කතමං අත්තවාදූපාදනං ඉධ අස්සුතවා පුථුජ්ජනො -පෙ- සප්පුරිස ධම්මෙ අවිනීතො රූපං අත්තතො සමනුපස්සති, රූපවන්තං වා අත්තානං අත්තනි වා රූපං, රූපස්මිං වා අත්තානං වෙදනං -පෙ- සඤ්ඤං, සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤණං අත්තතො සමනුපස්සති, විඤ්ඤණවන්තං වා අත්තානං, අත්තනි වා විඤ්ඤණං විඤ්ඤණස්මිං වා අත්තානං යා එවරූපා දිට්ඨි -පෙ- විපරියෙසගාහො ඉදං වුච්චති අත්තවාදූපාදනං**" යි.

මෙසේ මෙහි උපාදාන යන්නෙන් දැඩි වූ තෘෂ්ණාව හා දෘෂ්ටිය කියවිණි. දෘෂ්ටිය වනාහි තමන් කෙරෙහි ද තමන් විසින් ගන්නා ලද අරමුණු කෙරෙහි ද අස්සදන බමන රොචන භූත තෘෂ්ණාව ගේ වශයෙන් ම දැඩි වැ ගැන්ම ය. දිට්ඨිවිප්පයුත්ත ලෝභ මූලික සිත් ද දිට්ඨිසම්පයුත්ත ලෝභමූලික සිත් ද සිත් කරනු.

**3. තෘෂ්ණා ප්‍රත්‍යයයෙන් උපාදන වන්නේ කෙසේද?**
මෙහි දු පැවැත්මට උපකාර වන්නේ ප්‍රත්‍යය යයි ගත යුතු. ප්‍රථම තෘෂ්ණාව ඇති හෙයින් ම උත්තර වූ දෘඪ තෘෂ්ණාව දිට්ඨි රහිත වැ හෝ සහිත වැ වන්නේය. ප්‍රථම තෘෂ්ණාව නැත්නම් ඒ උපාදාන නො වන්නේ ය.

**ප්‍රශ්න.**

1. වේදනා කිම? ඒ කී වැදැරුම් ද? මෙහි කවර වේදනාගත යුතු ද?
2. තෘෂ්ණා යනු කිම? එහි භෙද දක්වනු.
3. වේදනායෙන් තෘෂ්ණා වන්නේ කෙසේ ද? මේ කවර සන්ධියෙක් ද? මේ දෙක කවර වට්ටයන්ට අයත් ද?
4. උපාදාන යනු කිම? එහි භේද දක්වා විස්තර කරනු.
5. තෘෂ්ණායෙන් උපාදාන වන්නේ කෙසේ ද? තෘෂ්ණා උපාදාන දෙක්හි වෙනස දක්වනු.

# 8. උපාදන ප්‍රත්‍යයයෙන් භව වන්නේ ය.

**උපාදන ප්‍රත්‍යයයෙන් භව වන්නේ ය.**

1. උපාදාන කිම? 2. භව කිම? උපාදාන ප්‍රත්‍යයයෙන් භව වන්නේ කෙසේ ද? යනු මෙහි දු දත යුතු.

1. **උපාදන** නම් යට දැක්වුණු උපාදන මැ යි. එ නම් දිට්ඨි සහිත වූ හෝ රහිත වූ හෝ දැඩි ලෝභය යි.

2. භව නම් වැඩීම ය. ඒ වනාහි කර්ම වශයෙන් වැඩීම ය. උප්පත්ති වශයෙන් වැඩීම යි දෙවැදැරුම් වේ. කර්ම වශයෙන් වැඩීම **කර්මභව** නමි. උප්පත්ති වශයෙන් වැඩීම **උප්පත්ති** භව නමි. භව ශබ්දයෙන් සාමාන්‍යයෙන් කිය හැක්කේ උප්පත්ති භවය යි. ඒ උප්පත්ති භවය ලැබීමට කාරණ වන බැවින් කර්ම භවය ද කියනු ලැබේ. බුද්ධෝත්පාදය සුඛයට කරුණු වන බැවින් "**සුඛො බුද්ධානං උප්පාදෙ**" යි කී මෙනි. එහෙත් මෙහි භව ශබ්දයෙන් විශේෂයෙන් කර්ම භවය කියවෙන බව සිහි තබා ගත යුතු යි.

කර්මභව නම් ලෞකික කුශලාකුශල චේතනා හා ඒ චේතනා සම්ප්‍රයුක්ත වූ අනභිධ්‍යාදිය හා අභිධ්‍යාදිය යි. වදාළේ මැ යි. "**තත්‍ථ කතමො කම්මභවො? පුඤ්ඤාභි සංඛාරො, අපුඤ්ඤාභි සංඛාරො, ආනෙඤ්ජාභිසංඛාරො පරිත්තභූමකො වා මහා භූමකො වා අයං වුච්චති කම්ම භවො. සබ්බං පි භවගාමි කම්මං කම්මභවො**" යි පරිත්ත භූමක වූ හෝ

මහාභූමක වූ හෝ පුඤ්ඤාභිසංඛාර ද අපුඤ්ඤාභිසංඛාර ද, ආනෙඤ්ජාභිසංඛාර ද කර්ම භව නම්. සියලු භවගාමී කර්මභව නම්. පරිත්තභූමක නම් ස්වල්ප විපාක ඇති. මහා භූමක නම් මහා විපාක ඇති. භවගාමි කර්ම නම් කුසල පක්‍ෂයෙහි චේතනා සම්ප්‍රයුක්ත වූ අලොභාදිය යි. අකුශල පක්‍ෂයෙහි ලෝභාදිය යි අභිසංඛාරය යි කියන ලද්දේ චේතනා යි.

**උප්පත්තිභව** නම් කර්මයෙන් නිපන් ස්කන්ධ ය. එ නම් ලෞකික විපාක ස්කන්ධ හා කර්මජරූපය. ඒ නවවිධ වේ. වදාළේ මැ යි. "**තත්‍ථ කතමො උප්පත්ති භවො? කාම භවො, රූපභවො අරූපභවො, සඤ්ඤාභවො, අසඤ්ඤාභවො, නේවසඤ්ඤානාසඤ්ඤාභවො, එකවොකාරභවො, චතුවොකාරභවො, පඤ්චවොකාරභවො, අයං වුච්චති උප්පත්තිභවො**" යි කාමභව, රූපභව, අරූපභව යට කියන ලදි. අසඤ්ඤාභව නම් අසංඥ තලය යි. නේවසඤ්ඤා නාසඤ්ඤා භව නම් නේවසඤ්ඤානාසඤ්ඤා භූමිය යි. සඤ්ඤා භව නම් සෙසු සියල්ල යි. එකවොකාර භව නම් අසංඥතලය යි. චතුවොකාර භව නම් අරූපාවචර සතර යි. පඤ්චවොකාර භව නම් සෙස්ස යි. වොකාර නම් ස්කන්ධ යි.

**3. උපාදාන ප්‍රත්‍යයයෙන් භව වන්නේ කෙසේ ද?**
මෙහි දු පැවැත්මට උපකාර වන්නේ ප්‍රත්‍යය යි ගත යුතු. උපාදාන ඇති හෙයින් ඒ හා යෙදෙන චේතනා කර්ම වන්නේ ය. එයින් උත්පත්තිභවය වේ යයි මෙහි ම ගතහොත් නිපැත්මට උපකාර වන්නේ ප්‍රත්‍යය යි ගත යුතු කර්මයෙන් උප්පත්ති භව නිපදෙන බැවිනි. "භව පච්චයා ජාති" යනුවෙන් මතු කියවේ.

ආදියෙහි "**අවිජ්ජා පච්චයා සංඛාරා**" යි කීයේත් මේ නොවේ ද? එසේ ය. එය අතීත අද්ධය ගෙනැ කීයේ ය. ගිය ජන්මයේ අවිද්‍යාව හේතු කොට ගෙනැ එහි යෙදුණු චේතනා සංස්කාර සංඛ්‍යාත කර්ම වූයේ ය. මේ කියන්නේ වර්තමාන අද්ධ ගෙනැ ය. වර්තමානයෙහි උපාදාන සංඛ්‍යාත දැඩි ලෝභය හේතු කොට ගෙනැ එහි යෙදෙන චේතනා භව සංඛ්‍යාත කර්ම වන්නේ ය. අවිද්‍යා සංස්කාරයන්ට තෘෂ්ණා උපාදාන භව ද තෘෂ්ණා උපාදාන භවයන්ට අවිද්‍යා සංස්කාරද නිතර එක් වෙන බව යට කියන ලද බව සැලකිය යුතු. අවිද්‍යා හා තෘෂ්ණා හා සංසාර මුල් ය. අවිද්‍යාව කුශල සංස්කාරයන්ට සම්ප්‍රයුක්ත වශයෙන් නැත ද අනුශය වශයෙන් ප්‍රත්‍යය වන බව එහි කීයේ ය. මෙහි දු උපාදාන කුශල කර්ම භවයන්ට අනුශය වශයෙන් ප්‍රත්‍යය වන්නේ ය යි කිය යුතු. තව ද මෙහි භව යන්නෙන් සියලු භවගාමි කර්ම ද කියවිණි. භවගාමි කර්ම නම් කුශල පක්‍ෂයෙහි අලෝභාදි ය යි. අකුශල පක්‍ෂයෙහි ලෝභාදිය යි. කුශල පක්‍ෂයෙහි එසේ වන්නේත් අනුශය වශයෙනි.

## භව ප්‍රත්‍යයයෙන් ජාති වන්නේ ය.

1. භව නම් කිම? 2 ජාති නම් කිම? 3 භව ප්‍රත්‍යයයෙන් ජාති වන්නේ කෙසේ ද? යනු මේහ ලා දත යුතු.

1. භව නම් යට දැක්වුණු කර්ම භව උප්පත්ති භව අතුරෙන් කර්ම භව මැ යි. උප්පත්ති භව මෙහි නොලැබේ. කුශලාකුශල චේතනා හා තත් සම්ප්‍රයුක්ත අලෝභාදිය හා ලෝභාදිය කර්ම භව බැව් යට කියන ලදි.

2. ජාති නම් උත්පත්තිය යි. එනම් ස්කන්ධයන්ගේ පහළ වීම යි. මෙයින් විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා යන ඵල පඤ්චකය කියවෙන බව දත යුතු. ජාති ජරා මරණ ගනුත් ම විඥාන, නාමරූප, ෂඩායතන, ස්පර්ශ, වේදනා යන ඵල පස ගැනෙන්නේ ය"යි දෙවන පාඩමෙහි දක්වන ලද්ද බලනු.

**3. භව ප්‍රත්‍යයයෙන් ජාතිවන්නේ කෙසේ ද?**
මෙහි නිපැදීමට උපකාර වන්නේ ප්‍රත්‍යය යි ගත යුතු. මේ ජන්මයෙහි කරනු ලබන කර්ම හේතු කොටැ ගෙනැ මරණයෙන් මතු ජාති සංඛ්‍යාත විඥානාදිය ඒ ඒ ලෝකයෙහි සුදුසු පරිදි පහළ වන්නේ ය. ඒ වනාහි දේවාදීන් විසින් මවනු ලබන්නේ හෝ අහේතුක වැ සිද්ධ වන්නේ හෝ නො වේ. කර්මයෙන් ම ලැබෙන්නේ ය.

ජාති සංඛ්‍යාත ස්කන්ධයන්ගේ පහළ වීම කර්මයෙන්ම වන්නේය යි කුමක් හෙයින් කියනු ලැබේ ද? බාහිර වූ ප්‍රත්‍යයයන් සම වැ ඇති කල්හි දු සත්ත්වයන්ගේ වෙනස් දක්නා ලැබෙන බැවිනි. ජනක ජනනී ශුක්‍ර ශ්‍රොණිත ආහාරාදිය සම වැ ඇති කල්හි දු නිඹුල් දරුවන්ගේ හීන ප්‍රණීත භේදය නො පෙනේ ද? "**කම්මං සත්තෙ විභජති යදිදං හීනප්පණීත්තාය.**" කර්මය තෙමේ සත්ත්වයන් හීන ප්‍රණීතත්‍වයෙන් බෙදන්නේ ය. එ බැවින් කර්ම ප්‍රත්‍යයයෙන් ම ජාති සංඛ්‍යාත ස්කන්ධයන්ගේ පහළ වීම වන්නේය යි දත යුතු.

"**සංඛාර පච්චයා විඤ්ඤාණං**" යි කීයේත් මේ නොවේ ද? එසේ ය. එය අතීත ජන්මයෙන් මෙහි උපැද්ම ගෙනැ කීයේ ය. මේ කියන්නේ මෙයින් අනාගත ජන්මයෙහි උපැද් ම ගෙනැ ය. අද්ධ තුනක් බෙදුයේ එහෙයිනි.

**ජාති ප්‍රත්‍යයයන් ජරා මරණ ද සෝක පරිදේව දුක්ඛ දෝමනස්ස ද වන්නේ ය.**

1. ජාති කිම? 2. ජරා මරණ සෝක පරිදේව දුක්ඛ දෝමනස්ස කිම? 3. ජාති ප්‍රත්‍යයයෙන් ජරා මරණ ද සෝක පරිදේව දුක්ඛ දෝමනස්ස ද කෙසේ වන්නේ ද යනු මෙහිලා දත යුතු.

1. ජාති නම් යට කියන ලද ජාති මැයි. එ නම් ස්කන්ධයන්ගේ පහළ වීම යි. විඤ්ඤාණාදි ඵල පඤ්චකය යි.

2. ජරා නම් ඒ ස්කන්ධයන්ගේ පැවතුම් සංඛයාත දිරුම්කඩ ය. **මරණ** නම් ඒ ස්කන්ධයන්ගේ බිඳැ යාම ය. **සෝක** නම් ඥාති ව්‍යසනාදියෙන් පෙළෙන්නවුන්ගේ ශෝචනාකාරයෙන් පවත්නා දෝමනස්ස වේදනා ය. **පරිදෙව** නම් එ බන්දන්ගේ ම

රොදනාකාරයෙන් පවත්නා අනිෂ්ට චිත්තජ ශබ්ද ය. **දුක්ඛ** නම් කායික දුඃඛ වේදනා ය. **දෝමනස්ස** නම් මානසික දුඃඛ වේදනා ය. **උපායාස** නම් ඥාති ඛ්‍යසනාදිය කරණ කොටැ ගෙනැ සංසිදන විසීදනාකාරයෙන් පැවැති ඇඩි ආයාසය යි.

මඳ ගින්නෙන් භාජනයක් ඇතුළේ කිසිවක් පැසීම මෙනි ශෝකය. ඇඩි ගින්නෙන් පැසෙන දෙය භාජනයෙන් බැහැරව වැගිරීම මෙනි පරිදේවය. බැහැර වැගිරැ ශේෂ වූ දෙය භාජනයේ පැසි පැසී තිබීම මෙනි උපායාසය.

**3. ජාති ප්‍රත්‍යයෙන් ජරා මරණ හා සෝක පරිදේව දුක්ඛ දෝමනස්ස වන්නේ කෙසේ ද?**
මේ විස්තර කළ යුතු නො වේ. ප්‍රත්‍යක්‍ෂයේ ම දැක්ක හැකි බැවිනි. ජාති නොවිණි නම් ජරා මරණාදිය කොයින් වේ ද?

මෙසේ පටිච්චසමුප්පාද නය පිළිබඳ ප්‍රත්‍යය ධර්මයන්ගේ හා ප්‍රත්‍යයොත්පන්න ධර්මයන්ගේ විස්තරයෙක් දක්වන ලද්දේ ය. ඔවුන් පිළිබඳ අද්ධ, අඞ්ග. ආකාර, සන්‍ධි, සංක්‍ෂෙප, වට්ට, මූල යන භෙද දෙවැනි පාඩමින් සැකෙවින් දැක්වුව ද විශේෂාවබෝධය සඳහා මතු ද විස්තරයෙක් දක්වනු ලැබේ.

**ප්‍රශ්න.**

1. භව යනු කිම? එහි භෙද දක්වා විස්තර කරනු.
2. උපාදාන ප්‍රත්‍යයෙන් භව වීමෙහිත් අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාර වීමෙහිත් වෙනසක් ඇත් නම් පැහැදිලි කරනු.
3. භව ප්‍රත්‍යයෙන් ජාති වන්නේ ය යන මෙහි කවර භවයෙක් ගනු ලැබේ ද? හේතු දක්වනු.
4. ජාති යනු කිම? භව ප්‍රත්‍යයෙන් ජාති වීමෙහිත් සංස්කාර ප්‍රත්‍යයෙන් විඥාන වීමෙහිත් වෙනසක් ඇත්නම් පැහැදිලි කරනු.
5. ජරා, මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස පහදා දෙනු.

## 9. අද්ධ, අඞ්ග, ආකාර, සන්‍ධි, සංක්‍ෂෙප, වට්ට, මූල.

පටිච්චසමුප්පාදය මැනෙවින් අවබෝධ කැරැ ගන්නට නම් එහි අද්ධ, අඞ්ගාදි භෙද විශේෂයෙන් දත යුතු ය.

**අද්ධ තුනෙකි.**
අතීත, අද්ධ, පච්චුප්පන්න අද්ධ, අනාගත අද්ධ යයි අද්ධ තුනෙකි. අද්ධ නම් කාල යි. **අවිද්‍යා, සංස්කාර, දෙක අතීත අද්ධ ය.** හෙවත් අතීත කාලයට අයත් ය. එය ගිය ජාතිය සම්බන්ධයේ ය සලකනු. **විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා, තණ්හා,**

**උපාදන, භව යන අට පච්චුප්පන්න අද්ධ ය.** හෙවත් මේ කාලයට අයත් ය. මේ ජාතිය සම්බන්ධයේ ය යි සලකනු. **ජාති ජරා මරණ අනාගත අද්ධ ය.** හෙවත් මතු කාලයට අයත් ය. ලබන ජාතිය සම්බන්ධයේ යයි සලකනු. මෙසේ මේ පටිච්චසමුප්පාදයෙහි ගිය ජාතියේ ද මේ ජාතියේ ද මතු ජාතියේ ද සම්බන්ධය ඇත්තේ ය. ගිය ජාතියේ අවිද්‍යාව හේතු කොටැ ගෙනැ පින් පව් කෙළේ ය. එයින් මේ ජාතියේ විඥ්ඤාණ, නාම රූප, සළායතන, ඵස්ස, වේදනා සංඛ්‍යාත ස්කන්ධ ලබා තණ්හා උපාදානයෙන් භව සංඛ්‍යාත කර්ම රැස් කොට එයින් මතු ජාතියෙහි උපදින්නේ ය. උපන්නවුන්ට ජරා මරණ ශෝක පරිදේව දුක් දොම්නස් නො අනුමාන ය. එයින් නැවත ලැබෙන්නේත් අවිද්‍යා ය. මෙසේ සසර පවත්නේ ය.

## අඞ්ග දෙළොසෙකි.

**අවිජ්ජා, සංඛාර, විඤ්ඤාන, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා, තණ්හා, උපාදන, භව, ජාති, ජරා මරණ** යයි අඞ්ග දොළොසෙකි. මොවුන් පිළිබඳ විස්තර යට දක්වන ලදි. ශෝකාදිය මේ අඞ්ගයන්ට ඇතුළත් නොවේ. එය ජාතියෙහි මහා ආදීනව රාශිය දක්වනු සඳහා වදාළේ ය. එහෙයින් එය නිස්සන්‍ද ඵලය යි කියන ලදි. නිස්සන්‍ද ඵල යනු අමුඛ්‍ය ඵලය යි ද කියත්. එහෙත් එම අවිද්‍යා සිද්ධියට හේතු වේ. "**සොකාදීහි අවිජ්ජා සිද්ධා**" යනු **විශුද්ධිමාර්ග** යි. ශෝකාදියෙන් අවිද්‍යා සිද්ධ වේ යනු අර්ථ යි.

අවිද්‍යාව භව චක්‍රයාගේ ආදිය ද? ආදිය යි කවුරු කීවෝ ද? එය ආදි වශයෙන් නො වැ ප්‍රධාන ධර්ම වශයෙන් වදාළෝ ය. අවිද්‍යාව ඇති හෙයින් ම සෙසු සියල්ල ලැබේ. අවිද්‍යාව නැත්නම් කුමකුත් නො ලැබේ. භව චක්‍රයාගේ ආදියෙක් නැත. "**අවිදි තාදිමිදං**" මේ නොදන්නා ලද ආදි ඇත්තේ ය. නො දන්න ලද්දේත් නැති හෙයින් ම ය.

## ආකාර විස්සෙකි.

අද්ධ තුනෙකින් ප්‍රතිමණ්ඩිත වූ මේ අඞ්ග දොළොස ආකාර වශයෙන් විස්සෙක් වේ.

අඞ්ග දොළොසින් අතීත අද්ධ වශයෙන් දැක්වූයේ අවිද්‍යා සංස්කාර දෙක පමණෙකි. අතීත අද්ධයට අයත් අඞ්ග එතෙක් ම ද? නැත. අවිද්‍යා සංස්කාර ගන්නා විට තණ්හා, උපාදාන, භව ද ගැනුණේ වේ. යම් තැනෙක අවිද්‍යා ඇත්නම් තණ්හා උපාදාන භව ද එහි ඇත. සංස්කාර යනු ද එකෙක් ම ය. එ බැවින් අතීත හේතු වශයෙන් අවිද්‍යා, සංස්කාර, තෘෂ්ණා, උපාදාන, භව යන පස ගත යුතු ය. කීයේ මැ යි. "**පුරිමකම්ම භවස්මිං මොහො අවිජ්ජා, ආයූහනා සංඛාරා, නිකන්ති තණ්හා, උපගමනං උපාදනං, චෙතනා භවො, ඉති ඉමෙ පඤ්චධම්මා පරිම කම්මභවස්මිං ඉධ පටිසන්‍ධියා පච්චයා**" යි. පූර්ව කර්මභවයෙහි මෝහ සංඛ්‍යාත අවිද්‍යාව ද, ආයූහන සංඛ්‍යාත සංස්කාර ද, නිකන්ති සංඛ්‍යාත තෘෂ්ණාව ද, උපගමන සංඛ්‍යාත උපාදානය ද චේතනා සංඛ්‍යාත කර්ම භවය ද යන මේ පඤ්චධර්ම මෙහි ප්‍රතිසන්‍ධියට ප්‍රත්‍යය වේ යනු එහි අර්ථ යි.

විඥාන, නාමරූප, ෂඩායතන, ස්පර්ශ, වේදනා යන පස වර්තමාන ඵල පස ය. කීයේ මැ යි. "**ඉධ පටිසන්ධිවිඤ්ඤාණං" ඔක්කන්ති නාමරූපං, පසාදෙ ආයතනං, ඵුට්ඨො ඵස්සො වෙදයිතං වේදනා ඉති ඉමෙ පඤ්චධම්මා ඉධුප්පත්ති භවස්මිං පුරෙ කතස්ස කම්මස්ස පච්චයා**" යි. මේ උප්පත්ති භවයෙහි ප්‍රතිසන්ධි සංඛ්‍යාත විඥාන ද, අවක්‍රාන්ති සංඛ්‍යාත නාමරූප ද, ප්‍රසාද සංඛ්‍යාත ආයතන ද, ස්පෘෂ්ට සංඛ්‍යාත ඵස්ස ද, වෙදයිත සංඛ්‍යාත වේදනා ද යන මේ පඤ්ච ධර්ම පූර්වකෘත කර්මයාගේ ඵල වේ යනු එහි අර්ථ යි.

තෘෂ්ණා, උපාදාන, භව ගන්නාවිට එහි ලා අවිද්‍යා සංස්කාර ද ගත යුතුය. යුක්ති යට කී පරිදි යි. එබැවින් තෘෂ්ණා, උපාදාන, භව, අවිද්‍යා, සංස්කාර යන පස වර්තමාන හේතු පසය, කීයේ මැ යි. **ඉධ පරිපක්කත්තා ආයතනානං මොහො අවිජ්ජා, ආයූහනා සංඛාරා, නිකන්තිතණ්හා උපගමනා උපාදනං, චේතනා භවො ඉති ඉමෙ පඤ්ච ධම්මා කම්මභවස්මිං ආයතිං පටිසන්ධියා පච්චයා**" යි මෙහි ආයතන මේරු බැවින් මෝහ සඞ්ඛ්‍යාත අවිද්‍යාව ද, ආයූහන සංඛ්‍යාත තෘෂ්ණාව ද, උපගමන සංඛ්‍යාත උපාදාන ද, චේතනා සංඛ්‍යාත කර්මභව ද යන මේ පඤ්ච ධර්ම ආයති ප්‍රතිසන්ධිය පිණිස ප්‍රත්‍යය වේ යනු එහි අර්ථ යි.

ජාති, ජරා, මරණ ගන්නා විට එහි විඤ්ඤාණ, නාමරූප සළායතන, ඵස්ස, වේදනා ඇතුළත් ය. ජාති නම් විඤ්ඤාණාදි පස මැ යි. එබැවින් ජාති ජරා මරණ හෙවත් විඤ්ඤාණ, නාම රූප, සළායතන, ඵස්ස, වේදනා යන පස අනාගත ඵල පස ය. කීයේ මැ යි. "**ආයතිං පටිසන්ධි විඤ්ඤාණං, ඔක්කන්ති නාම රූපං, පසාදෙ ආයතනං, ඵුට්ඨො ඵස්සො, වෙදයිතං වේදනා ඉති ඉමෙ පඤ්ච ධම්මා ආයතිං උප්පත්තිභවස්මිං ඉධ කතස්ස කම්මස්ස පච්චයා**" යි මතු උප්පත්ති භවයෙහි ප්‍රතිසන්ධි සංඛ්‍යාත විඥානය, අවක්‍රාන්ති සංඛ්‍යාත නාම රූපය, ප්‍රසාද සංඛ්‍යාත ආයතන ය. ස්පෘෂ්ට සංඛ්‍යාත ඵස්සය. වෙදයිත සංඛ්‍යාත වෙදනාය යන මේ පඤ්චධර්ම මෙහි කළ කර්මයට ඵල වේ යනු එහි අර්ථ යි. මේ සඳහා **අභිධර්මාර්ථ සංග්‍රහයෙහි** මේ ගාථාව දැක්වේ.

**"අතීතෙ හෙතවො පඤ්ච ඉදනි ඵලපඤ්චකං**
**ඉදනි හෙතවො පඤ්ච ආයතිං ඵලපඤ්චකං"** යි.

ගිය ජාතියෙහි සත්ත්වයා සම්බන්ධ අවිද්‍යා සංස්කාර, තෘෂ්ණා, උපාදාන, භව ඇත්තේ ය. එයින් මේ ජාතියෙහි විඤ්ඤාණ, නාම රූප, සළායතන, ඵස්ස, වේදනා සංඛ්‍යාත සත්ත්වයා පහළ වන්නේ ය. එසේ පහළ වූයේ ආයතන මේරීමෙන් මෙහි දී තෘෂ්ණා උපාදාන භව අවිද්‍යා සංස්කාර රැස් කරන්නේ ය. එසේ රැස් කොටැ එයින් මතු ජාති සංඛ්‍යාත විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනාය යි කියන ලද සත්ත්වයෙක් වැ උපදින්නේ ය. මතු ද එසේ ය. අතීතයෙහි ද එසේ ය. ලෝකයෙහි ස්කන්ධ සන්තතිය මෙසේ භ්‍රමණය වේ.

එක් ධර්මයක් ගත් කල්හි එයට සම්බන්ධ සෙසු ධර්ම ද ගැන්ම නෙත්තියෙහි හාර වශයෙන් **ලක්ඛණහාරය** යි. ලක්ඛණ හාර නම් එක් ධර්මයක් කී කල්හි එයට ඇතුළත්

සෙසු ධර්ම ද ගැන්මයි. න්‍යාය වශයෙන් **නන්දියාවට්ට** න්‍යාය ය. වතුසුදු මලේ එක් පෙත්තක් ගත් කල්හි ඒ සම්බන්ධ සෙසු පෙති ද ගැනේ. ධර්ම වශයෙන් **තබ්භාවභාවි භාවය** යි. ඒ යට කියන ලදි.

## සන්ධි තුනෙකි.

අඞ්ග දොළොස අද්ධ තුනෙහි හේතු ඵල වශයෙන් බෙදන කල්හි සන්ධි තුනෙක් ලැබේ. අවිද්‍යා, සංස්කාර, අතීත හේතු ය. (තෘෂ්ණා උපාදාන භව මෙහි ඇතුළත් වන බව යට කියන ලද මැ යි.) විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා, වර්තමාන ඵල ය. එ බැවින් මේ අතීත හේතු හා වර්තමාන ඵල හා අතර එක් සන්ධියෙක. සංඛාර විඤ්ඤාණ අතර මේ සන්ධිය විය. ඒ හේතු ඵල සන්ධි නම. හේතු හා ඵල අතර වූ සන්ධිය බැවිනි.

විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා වර්තමාන ඵල ය. තණ්හා, උපාදාන, භව, වර්තමාන හේතු ය. (අවිජ්ජා සංඛාර මෙහි ඇතුළත් බව දත යුතු. එ බැවින් මේ වර්තමාන ඵල හා වර්තමාන හේතු හා අතර එක් සන්ධියෙක. එය වේදනා තණ්හා දෙක අතර විය. ඒ ඵලහේතු සන්ධි නම. ඵල හා හේතු හා අතර වූ සන්ධිය බැවිනි.

තණ්හා, උපාදාන, භව (මෙහි දු අවිජ්ජා සංඛාර ගත යුතු යි.) වර්තමාන හේතු ය. ජාති ජරා මරණ අනාගත ඵල ය. (විඤ්ඤාණාදි පස මෙහි බව සැලකිය යුතු යි.) මේ වර්තමාන හේතු හා අනාගත ඵල හා අතර එක් සන්ධියෙක. එය භව ජාති අතර විය. එ ද හේතු ඵල සන්ධිය හේතු හා ඵල හා අතර සන්ධිය වූ බැවිනි. මේ ය සන්ධි තුන නම්.

## සංක්ෂේප සතරෙකි

සන්ධි තුනෙක් වන්නේ කැලි සතරෙක අතර ය. අවිජ්ජා සංඛාර එක් සංක්‍ෂෙපයෙක. විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා එක් සංක්ෂේපයෙක තණ්හා උපාදාන භව, එක් සංක්‍ෂෙපයෙකි. ජාති, ජරා, මරණ (විඤ්ඤාණ නාමරූප සළායතන ඵස්ස වේදනා) එක් සංක්ෂේපයෙකි. මේ ය සංක්‍ෂෙප සතර නම්,

## වට්ට තුනෙකි

මේ අඞ්ග දොළොසෙහි ක්ලේශ ද ඇත. කර්ම ද ඇත. විපාක ද ඇත. ක්ලේශ කිලෙස වට්ට ය. එ නම් අවිද්‍යා, තෘෂ්ණා, උපාදාන යි. මෝහ ලෝභ දිට්ඨි ක්ලේශ මැ යි. කර්ම කම්මවට්ටය. එනම් සංස්කාර හා කර්මභව යි. සංස්කාර යන්නෙන් ද කර්මභව යන්නෙන් ද කියවෙන්නේ චේතනා සංඛ්‍යාත කර්ම මැ යි. විපාක විපාකවට්ට යි. එ නම් උප්පත්ති භව සංඛ්‍යාත භවෛකදේශය හා සෙස්ස ය. විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා, උප්පත්ති භව, ජාති ජරා මරණ විපාක යි.

## මුල් දෙකෙකි.

අවිද්‍යාව හා සංස්කාර හා මෙහි මුල් ය. අවිද්‍යාව පූර්වාන්තයට මුල් ය. මෙහි පූර්වාන්ත නම් අතීත හේතු පස යි. තෘෂ්ණාව අපරාන්තයට මුල් ය. මෙහි අපරාන්ත නම් වර්තමාන හේතු පස යි. එක මුලක් ඇති තැන අනික් මුල ද ඇති බව සලකනු. මෝඩ කම නිසා එන්නේ ය. ලෝබකම නිසා යන්නේ ය. මේ දෙක සංසාර ශීර්ෂ වශයෙන් ද දක්වනු ලැබේ.

**"හෙතු ඵල හෙතු පුබ්බක**
**තිසන්ධි චතුභෙදසඞ්ගහං චෙතං**
**වීසති ආකාරාරං**
**තිවට්ටමනවට්ඨිතං භමති"**

මේ දෙක සිඳි කල්හි භවභ්‍රමණය සිඳේ. එසේ සිඳැ ගන්නට නම් අසංඛත සංඛ්‍යාත නිර්වාණය අරමුණු කළ යුතු ය. ඒ අරමුණු කැරැ ගැන්ම ද තමා විසින් ම ශීලවිශුද්ධි ආදියෙහි පිහිටා ත්‍රිලක්ෂණ භාවනායෙන් කළ යුතු ය. **දිට්ඨිවිස** නම් සර්ප විශේෂයෙකි. ඔහු දුටුයේ මරණයට පත් වේ. නිර්වාණය දකුත්ම ක්ලේශ ක්‍ෂය වේ. එයින් සංසාර ප්‍රවෘත්තිය නවතී. සෝවාන් වැ දුටු නම් සකල ක්ලේශක්‍ෂය ජාති සතකට සීමා වේ. රහත් වැ දුටු නම් ඒ ඇසිල්ලෙහි සකල ක්ලේශක්‍ෂය වැ මරණයෙන් සංසාර ප්‍රවෘත්තිය සිඳී ශාන්ත සුඛ ස්වරූප නිර්වාණධාතු වන්නේ ය. උච්ඡේදයට හෝ ශාස්වතයට හෝ නො බසිනු.

### ප්‍රශ්න.

1. අද්ධ තුන හා අඞ්ග දොළොස දක්වනු.
2. ආකාර විස්ස පැහැදිලි කරනු.
3. සන්ධි තුන හා සංක්‍ෂෙප සතර විස්තර කරනු.
4. වට්ට තුන හා මුල් දෙක පහදා දෙනු.
5. මේ ප්‍රත්‍යය ප්‍රත්‍යයොත්පන්න ධර්ම සන්තතිය කෙසේ සිඳෙන්නේ ද?

## 10. සත්‍ය ප්‍රභව, කෘත්‍ය, වාරණ, උපමා, ගම්භීර, නය.

පටිච්චසමුප්පාදය පිළිබඳ විශිෂ්ටාවබෝධය සඳහා සත්‍ය ප්‍රභවාදී ස ආකාරය දත යුතු ය. විශුද්ධිමාර්ගානුසාරයෙන් එය මෙහි සැකෙවින් දක්වනු ලැබේ.

### සත්‍ය ප්‍රභව.

පටිච්චසමුප්පාදයෙහි අඞ්ග කවර කවර සත්‍යයකට අයත් ද? කවර කවර සත්‍යයෙකින් කවර කවර සත්‍යයෙක් හටගනී ද යනු දැක්වීම සත්‍ය ප්‍රභවය යි. තෘෂ්ණාව සමුදය

සත්‍යය යි විශේෂයෙන් දක්වා ඇත ද මෙහි කුශලාකුශල කර්ම සමුදය සත්‍යය යි සාමාන්‍යයෙන් දත යුතු ය. "**කුසලා කුසලං කම්මං අවිසෙසෙන සමුදය සච්චං**" යි, සත්‍ය විභඞ්ගයෙහි දැක්වුණු බැවිනි. එ බැවින් අවිද්‍යාව සමුදය සත්‍යය. සංස්කාර ද සමුදය සත්‍යය. අවිද්‍යායෙන් සංස්කාර වේ යනු දෙවන සත්‍යයෙන් හටගන්නා දෙවන සත්‍යය යි. සංස්කාරයෙන් විඥාන දෙවන සත්‍යයෙන් හටගන්නා ප්‍රථම සත්‍යය යි. විඥාන දුඃඛසත්‍යයට අයත් ය, විඥානයෙන් නාමරූප ද නාමරූපයෙන් සළායතන ද, සළායතනයෙන් ඵස්ස ද ඵස්සයෙන් වේදනා ද ප්‍රථම සත්‍යයෙන් හටගන්නා ප්‍රථම සත්‍ය යි. වේදනායෙන් තෘෂ්ණා ප්‍රථම සත්‍යයෙන් හටගන්නා දෙවන සත්‍ය යි. තෘෂ්ණායෙන් උපාදාන දෙවන සත්‍යයෙන් හටගන්නා දෙවන සත්‍ය යි. උපාදානයෙන් භව දෙවන සත්‍යයෙන් හටගන්නා ප්‍රථම ද්විතීය සත්‍ය යි. භවයෙන් ජාති දෙවන සත්‍යයෙන් හට ගන්නා ප්‍රථම සත්‍ය යි. මේය සත්‍ය ප්‍රභව නමි.

## කෘත්‍ය.

මෙහි එක් එක් අඞ්ගය කෘතය දෙක දෙක කෙරේ. අවිද්‍යාව වස්තු කෙරෙහි ද සත්ත්වයා කෙරෙහිද මුළාව කෙරේ. සංස්කාරයනටද ප්‍රත්‍යය වේ. සංස්කාර කුශලාකුශල අභිසංස්කරණය කෙරේ. විඥානයට ද ප්‍රත්‍යය වේ. විඥාන වස්තු විජානනය කෙරේ. නාමරූපයන්ට ද ප්‍රත්‍යය වේ. නාමරූප ඔවුනොවුන්ට උපස්ථම්භ කෙරේ. ෂඩායතනයන්ට ද ප්‍රත්‍යය වේ. ෂඩායතන ස්වකීය අරමුණෙහි පැවැත්ම කෙරේ. ස්පර්ශයට ද ප්‍රත්‍යය වේ. ස්පර්ශය අරමුණ ස්පර්ශ කෙරේ. වේදනාවට ද ප්‍රත්‍යය වේ. වේදනා අරමුණු රස අනුභව කෙරේ. තෘෂ්ණාවට ප්‍රත්‍යය වේ. තෘෂ්ණා ඇල්ම කෙරේ. උපාදානයට ද ප්‍රත්‍යය වේ. උපාදාන දෘඪග්‍රහණය කෙරේ. භවයට ද ප්‍රත්‍යය වේ. භව නානා ගතිවල වික්ෂේපය කෙරේ. ජාතියට ද ප්‍රත්‍යය වේ. ජාති ස්කන්ධ උපදවා ජරා මරණයට ද ප්‍රත්‍යය වේ. ජරා මරණ ස්කන්ධයන් ගේ දිරුම් මැරුම් කෙරේ. සෝකාදියට කාරණ බැවින් පුනර්භව පිණිස ප්‍රත්‍යය වේ. මෙ ය කෘත්‍ය.

## වාරණ.

වාරණ නම් වැළැක්ම ය. මෙහි එක් එක් දැක්වීමෙකින් සත්ත්වයන් අතර පැතිර පවත්නා දුර්මත නිරාකරණය කෙරේ. "අවිද්‍යායෙන් සංස්කාර වේ" යි කීමෙන් මැවුම් කරුවෙක් ඇතැ යි යන කාරක ලබ්ධිය නිරාකරණය කෙරේ. "සංස්කාරයෙන් විඥාන වේ" යි කීමෙන් 'භවයෙන් භවයට ආත්මය සඞ්ක්‍රමණය කරන්නේ ය' යන ආත්මලබ්ධිය දුරු කෙරේ. විඥානයෙන් නාමරූප වේ" යි කීමෙන් ආත්මය යි වරදවා ගත් දෙය භෙද වැ යන සැටි දක්වන බැවින් ඝනසංඥාව දුරුකෙරේ. "නාම රූපයෙන් ෂඩායතන වේ. ෂඩායතනයෙන් ස්පර්ශ වේ" යනාදිය දැක්වීමෙන් "දක්නේ ආත්මය ය. අසන්නේ ආත්මය ය. -පෙ- දැනැ ගන්නේ ආත්මය ය ස්පර්ශ කරන්නේ ආත්මය විඳින්නේ ආත්මය ය" යනාදි ආත්ම සංඥා දුරු කෙරේ. මේ ය වාරණ.

## උපමා.

පටිච්චසමුප්පාදය උපමා වශයෙන් ද දත යුතුය. ධර්මයන්ගෙ ඇති ගතිය නොදක්නා බැවින් ගමන් ගත් අන්ධයකු මෙනි අවිද්‍යාව. අන්ධයා ගලෙක මුලෙක හැපී පැකිළීම මෙනි අවිද්‍යායෙන් සංස්කාර. පැකිළැ වැටීම මෙනි, සංස්කාරයෙන් විඥාන. වැටීමෙන් ගඩ

හටගැන්ම මෙනි විඥානයෙන් නාමරූප. හඩ බිඳී පිළක නැගීම මෙනි නාමරූපයෙන් ෂඩායතන, පිළක කිසිවක ගැටීම මෙනි ෂඩායතනයෙන් ස්පර්ශ. ගැටීමෙන් නැගුණු දුක මෙනි ස්පර්ශයෙන් වේදනා. දුකට පිළියම් කැමැත්ත මෙනි වේදනායෙන් තෘෂ්ණා. පිළියම් කැමැත්තෙන් නුසුදුසු බෙහෙත් ගැනීම මෙනි තෘෂ්ණායෙන් උපාදාන. ගත් නුසුදුසු බෙහෙත ගෑම මෙනි උපාදානයෙන් භව. නුසුදුසු බෙහෙත ගෑමෙන් ගඩ විකාරයෙන් බිඳීයාම මෙනි ජාතියෙන් ජරා මරණ.

තව ද ඇසෙහි පටලය මෙනි අවිද්‍යාව, පටපණුවා තමාගේ නූලෙහි වෙළීම මෙනි අවිද්‍යායෙන් සංස්කාර. පරිනායක පරිගෘහිත රාජ කුමාරයා රාජ්‍යයෙහි පිහිටීම මෙනි සංස්කාරයෙන් විඥාන. මායාකාරයා මායා දැක්වීම මෙනි විඥානයෙන් නාමරූප. සුභූමියෙහි වැඩෙන වන ලැහැබ මෙනි නාමරූපයෙන් ෂඩායතන. ගිනිකූර ගිනි පෙට්ටියෙහි හැපී ගිනි හටගැන්ම මෙනි ෂඩායතනයෙන් ස්පර්ශ. ගින්නෙන් දැවුණුහට දාහය මෙනි ස්පර්ශයෙන් වේදනා. ලුණුදිය බිවුහට පිපාසා මෙනි වේදනායෙන් තෘෂ්ණා. පිපාසිතයා පැන් ඉස්නා මෙනි තෘෂ්ණායෙන් උපාදාන. මත්ස්‍යයා බිලිය ගිලීම මෙනි උපාදානයෙන් භව. බීජයෙන් අඞ්කුරය මෙනි භවයෙන් ජාති. වැඩෙන රුක වැටීම මෙනි ජාතයාට ජරා මරණ. මේ ය උපමා.

### ගම්භීර.

ගම්භීර නම් පටිච්චසමුප්පාදයෙහි ගැඹුරු බව යි. ඒ වනාහි අර්ථ වශයෙන් ද ගැඹුරු ය. ධර්ම වශයෙන් ද ගැඹුරු ය. දේශනා වශයෙන් ද ගැඹුරු ය. ප්‍රතිවේධ වශයෙන් ද ගැඹුරු යි.

මෙහි අර්ථ නම් ප්‍රත්‍යයොත්පන්නය හෙවත් ඵල ය. ධර්ම නම් ප්‍රත්‍යය හෙවත් හේතුය. ඵල වශයෙන් බැලුව ද හේතු වශයෙන් බැලුව ද පටිච්චසමුප්පාදය ගැඹුරු මැ යි. දේශනා නම් බුදුන්ගේ දේශනා ය, සර්වඥතාඥානයෙන් විනා අන් කිසි නුවණෙකින් මේ දැක්විය හැකි නොවේ. සර්වඥයන් වහන්සේ මෙය ඇතැම් තැනෙක අනුලෝම වශයෙන් ද, ඇතැම් තැනෙක ප්‍රතිලෝම වශයෙන් ද, ඇතැම් තැනෙක අනුලෝම ප්‍රතිලෝම වශයෙන් ද, ඇතැම් තැනෙක මධ්‍යයෙහි පටන් දෙකෙළෙවරට ද, ඇතැම් තැනෙක ත්‍රිශන්ධි චතුඃසංක්‍ෂෙප වශයෙන්ද, ඇතැම් තැනෙක ද්විසන්ධි ත්‍රිසංක්‍ෂෙප වශයෙන්ද, ඇතැම් තැනෙක එක සන්ධි ද්විසංක්‍ෂෙප වශයෙන් ද වදාළ සේක. එ බැවින් මෙය දේශනා වශයෙන් ද ගම්භීර ය. මෙහි එක් එක් කරුණක් පවා ප්‍රතිවේධයට දුෂ්කර ය. එහෙයින් මෙය ප්‍රතිවේධ වශයෙන් ද ගම්භීර යි. මේ ය ගම්භීර.

### නය

**එකත්ත නය, නානත්ත නය, අබ්‍යාපාර නය, ධම්මතා නය** ය යි නය සතර වැදෑරුම් වේ. අවිද්‍යායෙන් සංස්කාර වේ. සංස්කාරයෙන් විඥාන වේ යනාදීන් පරම්පරාව නොසිඳ පැවැත්ම **එකත්ත නය** යි. අවිද්‍යාදි එක් එක් ධර්මය පිළිබඳ ලක්‍ෂණ ව්‍යවස්ථාව **නානත්ත නය** යි. “අවිද්‍යාවට මා විසින් සංස්කාර උපදවනු ලැබේ” යි කියා හෝ “සංස්කාරයට මා විසින් විඥාන උපදවනු ලැබේ”යි කියා හෝ ව්‍යාපාර නැති බව අබ්‍යාපාර නය යි.

අවිද්‍යාදීන් කරණකොට ගෙනැ ම සංස්කාරාදිය වන්නේය යි ගැන්ම **ධම්මතා නය** යි. මේ ය නය.

**"සච්චප්පභවතො කිච්චා වාරණා උපමාහි ච,**
**ගම්භීරනයභෙද ච විඤ්ඤෙය්‍යතබ්බං යථාරහං"**

**ප්‍රශ්න.**

1. පටිච්චප්පාදයෙහි එක් එක් අඞ්ගය සත්‍ය වශයෙන් දක්වනු.
2. එක් එක් අඞ්ගයෙකින් කවර කවර දුර්දර්ශන දුරු කෙරේද?
3. එක් එක් අඞ්ගයෙක් කවර කවර කෘත්‍ය කෙරේ ද?
4. පටිච්චසමුප්පාදයට උපමා දක්වනු.
5. පටිච්චසමුප්පාදයේ ගම්භීරත්‍ව හා නය භෙද දක්වනු.

## 11. පට්ඨාන නය.

බුදුරජාණන් විසින් පටිච්චසමුප්පාද නය පට්ඨාන නය යන දෙ ආකාරයෙකින් ප්‍රත්‍යය වදාළේ ය. පටිච්චසමුප්පාදනය යට පාඩම්වලින් විස්තර කරන ලදි. දැන් දැක්විය යුත්තේ පට්ඨාන නය යි. පට්ඨාන නය ද යට සැකෙවින් දක්වන ලදුවත් විස්තර මෙහි පළ වේ.

ප යන්නෙහි අර්ථ නානා ප්‍රකාර යනු යි. ඨාන යන්නෙහි අර්ථ ප්‍රත්‍යය යනු යි. නානාප්‍රකාර ප්‍රත්‍යය වශයෙන් වදාළේ පට්ඨාන යි. මෙයින් එක් එක් ප්‍රත්‍යය පට්ඨාන නම්වූ බව දත යුතු. එ බඳු ප්‍රත්‍යය සමූහය ඇති ප්‍රකරණය ද **පට්ඨාන** ය.

තව ද පට්ඨාන යන්නෙහි බෙදන්නේ ය යන අර්ථය ද ඇත්තේ ය. කුශලාදි ධර්ම හේතු ආදී වශයෙන් බෙදන්නේ පට්ඨාන ය. මෙයින් ද එක් එක් ප්‍රත්‍යය පට්ඨාන නම් විය. එ බඳු ප්‍රත්‍යය සමූහය ඇති ප්‍රකරණය ද පට්ඨාන ය.

තව ද පට්ඨාන යන්නෙහි ගමනාර්ථය ද ඇත්තේ ය. සර්වඥතාඥානය අනිස්සඞ්ග වශයෙන් ගියේ මෙහි ය. එ බැවින් මෙ පට්ඨාන යි.

ඒ පට්ඨානයෙහි වදාළ ප්‍රත්‍යය සූවිස්සෙකි.

**සූවිසි පට්ඨාන පච්චය.**

1. හේතු පච්චය
2. ආරම්මණ පච්චය

3. අධිපති පච්චය
4. අනන්තර පච්චය
5. සමනන්තර පච්චය
6. සහජාත පච්චය
7. අඤ්ඤමඤ්ඤ පච්චය
8. නිස්සය පච්චය
9. උපනිස්සය පච්චය
10. පුරෙජාත පච්චය
11. පච්ඡාජාත පච්චය
12. ආසෙවන පච්චය
13. කම්මපච්චය
14. විපාක පච්චය
15. ආහාර පච්චය
16. ඉන්ද්‍රිය පච්චය
17. ඣාන පච්චය
18. මග්ග පච්චය
19. සම්පයුත්ත පච්චය
20. විප්පයුත්ත පච්චය
21. අත්‍ථි පච්චය
22. නත්‍ථි පච්චය
23. විගත පච්චය
24. අවිගත පච්චය,

මේ එක් එක් ප්‍රත්‍යයෙහි තේරුම ද, අවිජ්ජාදිය සංඛාරාදියට මේ පට්ඨාන ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වන සැටි ද නාමාදිය නාමාදියට ප්‍රත්‍යය වන සැටි ද මතු පාඩම් වලින් දක්වනු ලැබේ.

**ප්‍රශ්න.**

1. ප්‍රත්‍යය කී විධියකට වදාරන ලද්දේ ද? ඒ විධි කවරේ ද?
2. පට්ඨාන යනු ප්‍රත්‍යයන්ට ද ග්‍රන්‍ථයට ද නම් වූ සැටි දක්වනු.
3. සූවිසි පට්ඨාන ප්‍රත්‍යය ලියනු.

## 12 1. හේතු ප්‍රත්‍යය, 2. ආරම්මණ පච්චය, 3. අධිපති පච්චය.

### 1. හේතු ප්‍රත්‍යය

හේතු ප්‍රත්‍යය නම් හේතු වශයෙන් උපකාර වීම ය. හේතු නම් ස්ථිරභාවය සිද්ධ කරන ධර්ම යි. මුල් ගසෙක ස්ථිර භාවය සිද්ධ කරන්නා සේ යම් ධර්මයෙක් සම්ප්‍රයුක්තයන්ගේ ස්ථිරභාවය සිද්ධ කෙරේ නම් ලෝභ, ද්වේෂ, මෝහ, අලෝභ, අද්වේෂ, අමෝහ යන සය යි. මින් ලෝභාදි තුන අකුශලයන්ගේ ද අලෝභාදි තුන කුශල අව්‍යාකෘතයන්ගේ ද ස්ථිර භාවය සිද්ධ කෙරේ. හේතු රහිත සිත් හෙවත් අහේතුක සිත් අටළොස ජලතලයෙහි සෙවෙල් මෙන් අස්ථිරය. හේතු සංඛ්‍යාත මුල් නැති බැවිනි. හේතු සහිත සිත් හෙවත් සහේතුක සිත් මුල් සහිත වෘක්ෂ මෙන් ස්ථිරය. ඔවුන්ගේ එක හේතුකත්ව ද්විහේතුකත්ව යට කියන ලදි. (**තුන් වන පාදයේ හේතු සංග්‍රහය බලනු.**) මෙසේ හේතු තත් සම්ප්‍රයුක්තයන්ට හේතු ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වන්නේ ය. හේතු ප්‍රත්‍යය වන්නේ තත් සම්ප්‍රයුක්තයන්ට පමණෙක් ද? නැත. තජ්ජරූපයන්ට ද ප්‍රත්‍යය වේ. හේතුයෙන් උපදින රූප නම් කර්මජ රූප හා චිත්තජ රූපයි. එබැවින් කර්මජ රූපයන්ට ද සහේතුක චිත්තජ රූපයන්ට ද හේතු හේතු ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. වදාළේ මැ යි. පට්ඨානයෙහි: "**හේතු හේතුසම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානං ච රූපානං හේතු පච්චයෙන පච්චයො**" යි හේතු හේතුසම්ප්‍රයුක්ත ධර්මයන්ට ද, තත් සමුත්ථාන රූපයන්ට ද හේතු ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ යනු එහි අර්ථ යි. ප්‍රත්‍යය වීම හෙවත් උපකාර වීම නූපන්නවුන්ගේ උපදීමට ද, උපන්නවුන්ගේ ස්ථිතියට භාවෘද්ධියට ද වේ.

පටිච්චසමුප්පාදයෙහි "අවිජ්ජා ප්‍රත්‍යයයෙන් සංස්කාර වේ." කී තන්හි අවිද්‍යාව ත්‍රිවිධ සංස්කාර අතුරෙන් අපුඤ්ඤාභි සංඛාරයන්ට මේ හේතු ප්‍රත්‍යය වේ. එසේ ම තෘෂ්ණාව උපාදානයන්ට ද උපාදාන භාවයට ද හේතු ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. එහි සූක්ෂම භෙද පරීක්ෂායෙන් උගත යුතු යි. නාමරූප සළායතනයට ද හේතු ප්‍රත්‍යය වන සැටි සලකනු.

## 2. ආරම්මණ ප්‍රත්‍යය.

ආරම්මණ ප්‍රත්‍යය නම් අරමුණු වශයෙන් උපකාර වීම ය. ආරම්මණ නම් චිත්ත චෛතසිකයන්ගේ උපදීමට හා පැවැත්මට ආලම්බන වන ධර්ම යි. දුර්වල පුරුෂයකුට සැරයටි ආදි කිසිවක එල්බැ මුත් නො එල්බැ නැඟී නො සිටිය හැකි සේ චිත්ත චෛතසිකයන්ට ද රූපාදි කිසිවක එල්බැ ඉපදිය සිටිය නො හැකිය. එසේ චිත්ත චෛතසික ඉපිද එල්බ සිටින ධර්ම සයෙකි. එ නම් රූප, ශබ්ද, ගන්ධ, රස, ස්ප්‍රෂ්ටව්‍ය, ධර්ම යන මොහු යි. මේ රූපාදි සය චිත්ත චෛතසිකයන්ගේ උපැත්මට හා පැවැත්මට අරමුණුවීම් වශයෙන් උපකාර වන සෙයින් ආරම්මණ ප්‍රත්‍යය යි කියනු ලැබේ. රූපාදිය කවර කවර සිත්වලට අරමුණු වන්නේ ද යනු **තුන්වන පාදයෙහි** ආරම්මණ සංග්‍රහයෙහි දක්වන ලදි. වදාළේ මැ යි පට්ඨානයෙහි:

"**ආරම්මණපච්චයොති. රූපායතනං චක්ඛුවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානං ච ධම්මානං ආරම්මණ පච්චයෙන පච්චයො සද්දායතනං සොතවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානංච ධම්මානං ආරම්මණපච්චයෙන පච්චයො ගන්ධායතනං ඝාණවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානංච ධම්මානං ආරම්මණපච්චයෙන පච්චයො. රසායතනං ජිව්හාවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානං ච ධම්මානං ආරම්මණපච්චයෙන පච්චයො. ඵොට්ඨබ්බායතනං කාය විඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානංච ධම්මානං ආරම්මණ පච්චයෙන පච්චයො. රූපායතනං සද්දායතනං ගන්ධායතනං රසායතනං**

**ඵොට්ඨබ්බායතනං මනොධාතුයා තං සම්පයුත්තකානංච ධම්මානං ආරම්මණපච්චයෙන පච්චයො සබ්බෙ ධම්ම මනොවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානං ච ධම්මානං ආරම්මණපච්චයෙන පච්චයො යං යං ධම්මං ආරබ්භ යෙ යෙ ධම්මා උප්පජ්ජන්ති චිත්තචෙතසිකා ධම්මා තෙ තෙ ධම්මා තෙසං තෙසං ධම්මානං ආරම්මණ පච්චයෙන පච්චයො**" යි.

රූපායතනය චක්ඛුවිඤ්ඤාණ සිත් දෙකට හා තත් සම්ප්‍රයුක්ත චෛතසිකයන්ට ද, ශබ්දායතනය සෝතවිඤ්ඤාණ සිත් දෙකට හා තත් සම්ප්‍රයුක්ත චෛතසිකයන්ට ද, ගන්ධායතනය ඝාණවිඤ්ඤාණ සිත් දෙකට හා තත් සම්ප්‍රයුක්ත චෛතසිකයන්ට ද රසායතනය ජිව්හා විඤ්ඤාණ සිත් දෙකට හා තත් සම්ප්‍රයුක්ත චෛතසිකයන්ට ද ඵොට්ඨාබ්බායතනය කායවිඤ්ඤාණ සිත් දෙකට හා තත් සම්ප්‍රයුක්ත චෛතසිකයන්ට ද රූපායතනාදි පස මනොධාතු සංඛ්‍යාත පඤ්චද්වාරා වර්ජන සම්පටිච්ඡන යුගල යන සිත් තුනට හා තත්සම්ප්‍රයුක්ත චෛතසිකයන්ට ද, සියලු ධම්ම මනෝවිඥාන ධාතු සිත්වලට හා තත්සම්ප්‍රයුක්ත චෛතසිකයන්ට ද, ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. යම් යම් ධර්මයක් අරබයා යම් යම් චිත්තචෛතසික ධර්මයන්ට ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ යනු එහි සංක්‍ෂෙපාර්ථ යි.

**පටිච්චසමුප්පාදයෙහි** ලා අවිද්‍යාව සංඛාරයන්ට ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. එහි අවිද්‍යාව කාමාවචර පුඤ්ඤාභි සංඛාරයන්ට ප්‍රත්‍යය වන්නේ ඒ අවිද්‍යාව ඛය වය වසයෙන් සම්මර්ශනය කරන විට ය. රූපාවචර පුඤ්ඤාභිසංඛාරයන්ට ප්‍රත්‍යය වන්නේ අභිඥා සිතින් සමෝහ සිත් දැනැ ගන්නා විට ය. අපුඤ්ඤාභිසංඛාරයන්ට ප්‍රත්‍යය වන්නේ අවිද්‍යාව අරබයා රාගාදීන් උපදිනා විට ය.

"සළායතන පච්චයා ඵස්සො" යූ තන්හි බාහිරයෙහි රූපායතනාදිය චක්ඛුසම්ඵස්සාදියට ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

### 3. අධිපති ප්‍රත්‍යය.

අධිපති ප්‍රත්‍යය නම් අධිපති වශයෙන් උපකාර වීම ය. සක්විති රජ අන්‍ය රාජ රාජමහාමාත්‍යාදීන්ගේ ආධිපත්‍යය මැඩැ රටවැස්සන්ගේ ශුභසිද්ධිය සඳහා තමාගේ අධිපති භාවය පවත්නා සේ යම් ධර්ම කෙනෙක් සෙසු චිත්ත චෛතසිකාදීන්ගේ අධිපති භාවය මැඩැ තමන්ගේ අධිපති භාවය පවත්වත් ද ඒ ධර්ම අධිපති ප්‍රත්‍යය යි. ඒ අධිපති වනාහි සහජාතාධිපති ආරම්මණාධිපතිය යි ද්විවිධ වේ. සහජාතාධිපති නම් ඡන්ද, විරිය, චිත්ත, වීමංසා යන සතර යි. ඡන්දය තමා හා යෙදුණු සෙසු චිත්ත චෛතසිකයන්ට ද තත් සමුත්ථාන රූපයන්ට ද අධිපති ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. චිත්තාදිය ද මෙසේය. මේ සතරිනි දු එකක් අධිපති වනවිට සෙසු තුනෙහි අධිපති භාවය නොපවත්නා බව දත යුතු. මේ සහජාතාධිපති යි. යම් අරමුණක් අධිපති කොටැ චිත්ත චෛතසික පවතී ද ඒ අරමුණ ආරම්මණාධිපති යි. මෙසේ ඡන්දාදි සතරින් එකක් හෝ යම් කිසි ගරු කොටැ ගත් අරමුණක් හෝ අධිපති ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වන බව දත යුතු යි. වදාළේ මැ යි.
**පට්ඨානයෙහි:**

**"අධිපතිපච්චයොති. ඡන්දධිපති ඡන්දසම්පයුත්තකානං ධම්මානං තංසමුට්ඨානානං ච රූපානං අධිපතිපච්චයෙන පච්චයො. විරියාධිපති විරියසම්පයුත්තකානං ධම්මානං තංසමුට්ඨානානංච රූපානං අධිපතිපච්චයෙන පච්චයො. චිත්තාධිපති චිත්තසම්පයුත්තකානං ධම්මානං තංසමුට්ඨානානං ච රූපානං අධිපතිපච්චයෙන පච්චයො. වීමංසාධිපති වීමංසා සම්පයුත්තකානං ධම්මානං තංසමුට්ඨානානං ච රූපානං අධිපතිපච්චයෙන පච්චයො. වීමංසාධිපති වීමංසා සම්පයුත්තකානං ධම්මානං තංසමුට්ඨානානං ච රූපානං අධිපතිපච්චයෙන පච්චයො යං යං ධම්මං ගරුං කත්වා යෙ යෙ ධම්මා උප්පජ්ජන්ති චිත්තචෙතසිකා ධම්මා, තෙ තෙ ධම්මා තෙසං තෙසං ධම්මානං අධිපති පච්චයෙන පච්චයො"** යි.

අර්ථ සුගම යි. වීමංසා නම් ප්‍රඥා යි. පටිච්චසමුප්පාදයෙහි අවිද්‍යාව සංස්කාරයන්ට අධිපති ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. එසේ වන්නේ අවිද්‍යාව ගරු කොටැ ආස්වාදනය කරන විට ය. එබැවින් එය ආරම්මණාධිපති යි.

ප්‍රශ්න.

1. හේතු ප්‍රත්‍යය යනු කිම? පටිච්චසමුප්පාදයෙහි හේතු ප්‍රත්‍යය ලැබෙන තැන් දක්වනු.
2. ආරම්මණ ප්‍රත්‍යය යනු කිම? කවර කවර ආරම්මණයෙක් කවර කවර චිත්තචෛතසිකයනට අරමුණු වේ ද?
3. ෂඩායතන හා සත්තවිඤ්ඤාණ ධාතු දක්වනු.
4. අධිපති ප්‍රත්‍යය යනු කිම? ඒ කී වැදැරුම් ද? ඡන්දාදීන්ට සහ ජාතාධිපතිය යි කීයේ මන්ද? ආරම්මණාධිපති වන්නේ කිමෙක් ද?
5. පටිච්චසමුප්පාදයෙහි ආරම්මණ ප්‍රත්‍යය හා අධිපති ප්‍රත්‍යය ලැබෙන තැන් දක්වනු.

# 13 4. අනන්තර ප්‍රත්‍යය, 5. සමනංතර ප්‍රත්‍යය, 6. සහජාත ප්‍රත්‍යය.

### 4. අනන්තර ප්‍රත්‍යය

අනන්තර ප්‍රත්‍යය නම් අනන්තර භාවයෙන් උපකාර වීම ය. අනන්තර භාවය නම් අතරක් නැති බව ය. ඉක්බිති වැවීම ය. සක්විති රජ්ජුරුවන් ගේ පැවිදිවීම පුත් කුමරාගේ රාජ්‍යප්‍රාප්තියට උපකාර වන්නා සේ පළමු පළමු සිත ඉක්බිති ඉක්බිති සිතට උපකාර වන්නේ ය. චක්ඛුවිඤ්ඤාණ සිත සම්පටිච්ඡන සිතට ද, සම්පටිච්ඡන සිත සන්තීරණ සිතට ද, සන්තීරණ සිත වොට්ඨපන සිත ජවනයට ද, පළමු පළමු ජවන ඉක්බිති ජවනයට ද ජවන තදාලම්බනයට ද, තදාලම්බන භවඞ්ගයට ද, භවඞ්ග පඤ්චද්වාරාවර්ජනයට ද, පඤ්චද්වාරා වර්ජන චක්ඛුවිඤ්ඤාණයට ද යනාදී ක්‍රමයෙන් අනන්තර ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වන්නේ ය. මෙසේ ආදි ආදි සිත ඉක්බිති ඉක්බිති සිත උපදීමට උපකාර වීම අනන්තර ප්‍රත්‍යය යි දත යුතු. වදාළේ මැ යි.

**පට්ඨානයෙහි:**

"අනන්තරපච්චයො ති, චක්ඛුවිඤ්ඤාණධාතු තං සම්පයුත්තකා ච ධම්මා මනොධාතුයා තං සම්පයුත්තකා නං ච ධම්මානං අනන්තරපච්චයෙන පච්චයො. මනො ධාතු සම්පයුත්තකා ච ධම්මා මනොවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානංච ධම්මානං අනන්තරපච්චයෙන පච්චයො. සොතවිඤ්ඤාණධාතු තං සම්පයුත්තකා ච ධම්මා මනොධාතුයා තං සම්පයුත්තකානං ච ධම්මානං අනන්තරපච්චයෙන පච්චයො. මනොධාතු තං සම්පයුත්තකා ච ධම්මා මනොවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානං ච ධම්මානං අනන්තර පච්චයෙන පච්චයො. ඝාණවිඤ්ඤාණ ධාතු -පෙ- මනොධාතු -පෙ- ජිව්හාවිඤ්ඤාණධාතු -පෙ- මනොධාතු -පෙ- කායවිඤ්ඤාණධාතු -පෙ- මනොධාතු -පෙ- පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං අනන්තර පච්චයෙන පච්චයො. පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං අනන්තරපච්චයෙන පච්චයො පුරිමා පුරිමා අකුසල ධම්මා පච්ඡිමානං අකුසලා නං ධම්මානං අනන්තරපච්චයෙන පච්චයො. පුරිමා පුරිමා අකුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං අනන්තරපච්චයෙන පච්චයො. පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං අනන්තරපච්චයෙන පච්චයො. පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං අනන්තර පච්චයෙන පච්චයො. පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං අනන්තර පච්චයෙන පච්චයො. යෙසං යෙසං ධම්මානං අනන්තරා යෙ යෙ ධම්මා උප්පජ්ජන්ති චිත්ත චෙතසිකා ධම්මා තෙ තෙ ධම්මා තෙසං තෙසං ධම්මානං අනන්තර පච්චයෙන පච්චයො"යි.

මෙහි චක්ඛුවිඤ්ඤාණධාතු නම් චක්ඛුවිඤ්ඤාණ සිත් දෙක. තත් සම්ප්‍රයුක්ත නම් එහි චෛතසික. මනොධාතු නම් සම්පටිච්ඡන යුගල. (පඤ්ච ද්වාරාවර්ජනය ද මනොධාතු යි.) සොත විඤ්ඤාණාදිය ද එසේ ය. පුරිම පුරිම කුසලධම්ම නම් කුසල ජවන්. අකුසලධම්ම නම් අකුසල ජවන්. අබ්‍යාකත නම් විපාක ක්‍රියා. තදාලම්බන භවඞ්ගාදිය විපාක. මනොද්වාරාවර්ජනාදිය ක්‍රියා. විස්තර ඌහනය කළ යුතු යි.

**පටිච්චසමුප්පාදයෙහි** අවිද්‍යාව අපුණ්‍යාභිසංස්කාරයන්ට මේ අනන්තර ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. එසේ වන්නේත් ජවනාවස්ථායෙහි යි.

### 5. සමනන්තර ප්‍රත්‍යය.

සමනන්තර ප්‍රත්‍යය නම් සමනන්තර භාවයෙන් උපකාර වීම ය. සමනන්තර භාව නම් මොනොවට අනන්තර වීම ය. සක්විති රජ්ජුරුවන්ගේ මරණය පුත් කුමරුවාගේ රාජ්‍ය ප්‍රාප්තියට උපකාර වන්නා සේ ආදි ආදි සිත ඉක්බිති ඉක්බිති සිතට මනා සේ උපකාරවන්නේ සමනන්තර ප්‍රත්‍යය යි. සං යන උපසර්ගයෙන් යුක්ත වීම විනා මේ ප්‍රත්‍යය දෙකෙහි වෙනසක් නැතැ යි **පට්ඨාන අටුවායෙහි** දක්වයි. අත්‍ථානන්තරය අනන්තර ප්‍රත්‍යය, කාලානන්තරය සමනන්තර ප්‍රත්‍යය යන ඇතැම් ආචාර්යවරයන්ගේ මතය ද බැහැර කරයි. පෙළෙහි ද මේ ප්‍රත්‍යය දෙක එකසේ ම වර්ණනා කරති.

**පට්ඨානයෙහි:**

**"සමනන්තර පච්චයො ති, චක්ඛුවිඤ්ඤාණධාතු තං සම්පයුත්තකා ච ධම්මා මනොධාතුයා තං සම්පයුත්තකානං ච ධම්මා නං සමනන්තර පච්චයෙන පච්චයො. මනො ධාතු තං සම්පයුත්තකා ච ධම්මා මනොවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානං ච ධම්මානං සමනන්තර පච්චයෙන පච්චයො. සොතවිඤ්ඤාණධාතු"** යනාදි වශයෙන් සියල්ල අනන්තර ප්‍රත්‍යය සමාන යි.

**පටිච්චසමුප්පාදයෙහි** අනන්තර ප්‍රත්‍යය සේ ම ජවනාවස්ථායෙහි අවිද්‍යාව අපුණ්‍යාභිසංස්කාරයන්ට මේ සමනන්තර ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ.

### 6. සහජාත ප්‍රත්‍යය.

සහජාත ප්‍රත්‍යය නම් එක් වැ උපදීම් වශයෙන් උපකාර වීම ය. එක් වැ උපදීම නම් එකක් උපදනා කල්හි අනික ද උපදින්නේ ය, නූපදිතොත් නූපදින්නේ ය, එසේ උපදින්නේත් ඉදිරි පසු නො වැ එකවට ම උපදන්නේ ය, එසේ උපදීම යි. ප්‍රදීපය දල්වන්නාහා ම ආලෝකය ප්‍රකාශවන්නාක් මෙනි. වේදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාණ යන අරූප ධර්ම සතර එකක් උපදින විට අනික් තුන ද උපදින්නේ ය. එබැවින් එකෙක් අන්‍යොන්‍යයන්ට සහජාත ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය යි. එසේ ම සතර මහාභූත අන්‍යොන්‍යයන්ට ද, ප්‍රතිසන්ධික්‍ෂණයෙහි නාමරූප අන්‍යොන්‍යයන්ට ද, චිත්ත චෛතසික චිත්තජරූපයන්ට ද, මහාභූත උපාදාය රූපයන්ට ද, සහජාත ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය යි. හෘදයවස්තුව අරූපී ධර්මයන්ට කලෙක සහජාත ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. කලෙක නො වේ. සිතා බලනු. වදාළේ මැ යි.

**පට්ඨානයෙහි:**
**සහජාතපච්චයොති, චත්තාරො ඛන්ධා අරූපිනො අඤ්ඤමඤ්ඤං සහජාත පච්චයෙන පච්චයො. චත්තාරො මහාභූතා අඤ්ඤමඤ්ඤං සහජාත පච්චයෙන පච්චයො ඔක්කන්තික්ඛණෙ නාමරූප අඤ්ඤමඤ්ඤං සහජාත පච්චයෙන පච්චයො චිත්ත චෙතසිකා ධම්මා චිත්තසමුට්ඨානානං රූපානං සහජාතපච්චයෙන පච්චයො. රූපිනො ධම්මා අරූපීනං ධම්මානං කිංචිකාලෙ සහජාත පච්චයෙන පච්චයො. කිංචිකාලෙන සහජාතපච්චයෙන පච්චයො"** යි. අර්ථ යට දක්වන ලදි.

**පටිච්චසමුප්පාදයෙහි** අවිද්‍යාව අපුණ්‍යාභිසංස්කාරයන්ට සහජාත ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. මෝහය සර්වාකුශල සාධාරණ යි. එසේ ම විඤ්ඤාණය නාමරූපයට ද, නාමරූප සළායතනයට ද, මනායතනය ඵස්සයට ද, ඵස්සය වේදනාවට ද, තණ්හාව උපාදානයට ද, උපාදානය කර්මභවයට ද, සහජාත ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. විශේෂ පරීක්‍ෂායෙන් බලනු.

### ප්‍රශ්න.

1. අනන්තර ප්‍රත්‍යය පහදා දෙනු.
2. පටිච්චසමුප්පාදයෙහි අනන්තර ප්‍රත්‍යය කොතැන ලැබේද?

3. සමනන්තර ප්‍රත්‍යය දක්වනු. අනන්තර සමනන්තර දෙක්හි වෙනසෙක් ඇත්නම් පෙන්වනු.
4. සහජාත ප්‍රත්‍යය විස්තර කරනු. ඒ කොතැන්හි කොතැන් හි වේ ද? විකල්ප ගැන පෙන්වනු.
5. පටිච්චසමුප්පාදයෙහි සහජාත ප්‍රත්‍යය ලැබෙන තැන් දක්වනු.

## 14 7 අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය, 8 නිස්සය ප්‍රත්‍යය, 9 උපනිස්සය ප්‍රත්‍යය.

### 7. අඤ්ඤමඤ්ඤ (අන්‍යොන්‍ය) ප්‍රත්‍යය.

අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය නම් අන්‍යොන්‍යයන්ගේ උපදීමට පැවැත්මට උපස්ථම්භ වශයෙන් උපකාර වීම ය. ත්‍රිදණ්ඩය හෙවත් කත්තිරික්කය එකක් අනිකෙහි ද එය අනිකෙහි ද වශයෙන් නො වැටී සිටීමට උපකාර වන්නේ ය. එසේ යමෙක් අන්‍යොන්‍යයන්ට උපකාර වේ ද එය අන්‍යොන්‍ය ප්‍රත්‍යය යි. අරූප ස්කන්ධ සතර එකෙක් එකෙක් අන්‍ය අන්‍යයන්ට අන්‍යොන්‍ය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. එසේ ම මහාභූත සතර ද ප්‍රතිසන්ධි ක්‍ෂණයෙහි නාමරූප ද අන්‍යොන්‍ය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. වදාළේ මැ යි.

**පට්ඨානයෙහි:**
**"චත්තාරො ඛන්ධා අරූපිනො අඤ්ඤමඤ්ඤ පච්චයෙන පච්චයො. චත්තාරො මහාභූතා අඤ්ඤමඤ්ඤ පච්චයෙන පච්චයො. ඔක්කන්තික්ඛණෙ නාමරූපං අඤ්ඤමඤ්ඤ පච්චයො."** යි.

**පටිච්චසමුප්පාදයෙහි** අවිද්‍යාව අපුඤ්ඤාභිසඞ්ඛාරයන්ට ද, විඤ්ඤාණය නාමරූපයන්ට ද, නාමරූප සළායතනයන්ට ද, මනායතනය ඵස්සයට ද ඵස්සය වේදනාවට ද, තණ්හාව උපාදානයන්ට ද, උපාදාන කර්මභවයට ද, අන්‍යොන්‍ය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. විශේෂ ස්ථාන සලකනු.

### 8. නිස්සය (නිශ්‍රය) ප්‍රත්‍යය.

නිශ්‍රය ප්‍රත්‍යය නම් අධිෂ්ඨාන භාවයෙන් හෙවත් ආධාර වශයෙන් උපකාර වීම ය. පෘථිවිය වෘක්‍ෂ ලතාවන්ගේ ද වස්ත්‍ර පත්‍ර ආදිය චිත්‍රකර්මයන්ගේ ද පැවැත්මට ආධාර වේ. එමෙන් යම් ධර්මයෙක් අන්‍ය ධර්මයන්ගේ පැවැත්මට ආධාර වේ ද එය නිශ්‍රය ප්‍රත්‍යය යි. අරූපස්කන්ධ සතර අන්‍යොන්‍යයන්ට ද, මහාභූත අන්‍යොන්‍යයන්ට ද, ප්‍රතිසන්ධි ක්‍ෂණයෙහි නාමරූප අන්‍යොන්‍යයන්ට ද, චිත්ත චෛතසික චිත්තජ රූපයන්ටද, මහාභූත උපාදාය රූපයන්ට ද, චක්ඛායතනය චක්ඛුවිඤ්ඤාණ ධාතුවට හා තත් සම්ප්‍රයුක්තයන්ට ද, එසේ ම සෝතායතනාදිය සෝත විඤ්ඤාණාදීන්ට හා තත් සම්ප්‍රයුක්තයන්ට ද, වස්තුරූප මනොධාතු මනෝ විඤ්ඤාණ ධාතුන්ට ද, නිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. වදාළේ මැයි.

**පට්ඨානයෙහි:**
**නිස්සයපච්චයොති, චත්තාරො ඛන්ධා අරූපිනො අඤ්ඤමඤ්ඤං නිස්සයපච්චයෙන පච්චයො. චත්තාරො මහාභූතා අඤ්ඤමඤ්ඤං -පෙ- ඔක්කන්තික්ඛණෙ නාමරූපං අඤ්ඤමඤ්ඤං -පෙ- චිත්තචෙතසිකා ධම්මා චිත්ත සමුට්ඨානානං රූපානං -පෙ- මහාභූතා උපාදරූපානං -පෙ- චක්ඛායතනං චක්ඛුවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානං ච ධම්මානං -පෙ- සෝතායතනං -පෙ- ජිව්හායතනං -පෙ- කායායතනං -පෙ- යං රූපං නිස්සාය මනොධාතු ච මනොවිඤ්ඤාණ ධාතු ච වත්තන්ති තං රූපං මනොධාතුයා ච මනොවිඤ්ඤාණධාතුයා ච තං සම්පයුත්තකානං ච ධම්මානං නිස්සයපච්චයෙන පච්චයො**"යි.

පටිච්චසමුප්පාදයෙහි අවිද්‍යාව අපුඤ්ඤාභිසංඛාරයන්ට නිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. එසේ ම විඤ්ඤාණය නාමරූපයන්ට ද, නාමරූප සළායතනයන්ට ද, සළායතන ඵස්සයට ද ඵස්සය වේදනාවට ද, තණ්හාව උපාදානයන්ට ද, උපාදාන කර්ම භාවයට ද, නිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. තණ්හාව දිට්ඨුපාදානාදි තුනට පමණක් නිස්සය වන සැටි සලකනු.

## 9. උපනිස්සය (උපනිශ්‍රය) ප්‍රත්‍යය.

උපනිශ්‍රය ප්‍රත්‍යය නම් ඉතා බලවත් නිශ්‍රය වශයෙන් උපකාර වීම ය. හැල් බතක් සම්පාදනය කැරැ ගැන්මට අරක්කැමියා ද සැළිය ද දර හා ගිනි ද නිශ්‍රය යි. කුඹුර හා වැසි ධාරා උපනිශ්‍රය යි. කුඹුර හා වැසි ධාරා නො වී නම් අරක්කැමි ආදීන්ට එය සම්පාදනය කළ නො හැකි ය. මෙසේ අතිශය බලවත් නිශ්‍රය උපනිශ්‍රය යි දතයුතු. උපායාස යන තන්හි සේ මෙහි උප ශබ්ද අතිශයාර්ථද්‍යොතක යි. ඒ **උපනිස්සය වනාහි 1 ආරම්මණූපනිස්සය, 2 අනන්තරූප නිස්සය, 3 පකතූප නිස්සය යි තුන් වැදෑරුම් වේ.**

1. **ආරම්මණූනිස්සය** නම් බලවත් අරමුණු යි. "දන් දී, සිල් රැක, පෙහෙවස් සමාදන් වැ, එය ගරු කොටැ අරමුණු කරයි. පෙර තමා විසින් පුරුදු කළ යහපත් ධර්ම ගරු කොටැ අරමුණු කරයි. ධ්‍යානයෙන් නැඟී ධ්‍යානය ගරු කොටැ අරමුණු කරයි. ශෛක්ෂයෝ ගොත්‍රභූ, වොදාන ගරු කොට අරමුණු කරයි. ශෛක්‍ෂයෝ මාර්ගයෙන් නැඟී මාර්ගය ගරුකොටැ අරමුණු කරයි" යන මේ ආදි තන්හි ආරම්මණූපනිස්සය ලැබෙන බව දත යුතු. ආරම්මණාධිපති හා ආරම්මණූපනිස්සය සමානසේ පෙණුන ද ගරුකොටැ ගැන්ම ආරම්මණාධිපති වන බව ද එම බලවත් කොටැ ගැන්ම ආරම්මණූපනිස්සය වන බව ද සැලකිය යුතුයි. අරමුණු ගරු කටයුතු වශයෙන් ගැන්ම ආරම්මණාධිපති යි. එම බලවත් වශයෙන් ගැන්ම ආරම්මණූපනිස්සය යි.

2. **අනන්තරූපනිස්සය** නම් බලවත් වශයෙන් අභ්‍යන්තර වීම ය. පූර්ව සිත පසු සිතට සාමාන්‍ය වශයෙන් අනන්තර වීම අනන්තර ප්‍රත්‍යය යි. විශේෂ බලවත් වශයෙන් අනන්තර වීම අනන්තරූපනිස්සය යි. පූර්ව පූර්ව කුශල ධර්ම පශ්චිම පශ්චිම කුශල ධර්මයන්ට උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. පූර්ව පූර්ව කුශලධර්ම පශ්චිම පශ්චිම අකුශල ධර්මයන්ට ද ඇතැම් විට උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. පූර්ව පූර්ව

කුශලධර්ම පශ්චිම පශ්චිම අව්‍යාකෘත ධර්මයන්ට උපනිශ්‍රය ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. පූර්ව පූර්ව අකුශලධර්ම පශ්චිම පශ්චිම අකුශල ධර්මයන්ට ද අබ්‍යාකෘත ධර්මයන්ට ද ඇතැම්විට කුශලධර්මයන්ට ද උපනිශ්‍රය ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. පූර්ව පූර්ව අව්‍යාකෘත ධර්ම පශ්චිම පශ්චිම අව්‍යාකෘත ධර්මයන්ට ද කුශලධර්මයන්ට ද අකුශල ධර්මයන්ට ද උපනිශ්‍රය ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ.

3. **පකතූපනිස්සය** නම් ස්ව සන්තානයෙහි ම නිපන් ශ්‍රද්ධා ශීලාදිය යි. උපසේවිත වූ හෝ ඍතුභෝජනාදිය යි. ශ්‍රද්ධා ශීලාදි යන තන්හි ආදි ශබ්දයෙන් ශ්‍රැත, ත්‍යාග ප්‍රඥා ද, රාග ද්වේශ මෝහ මාන දෘෂ්ටි ප්‍රාර්ථනා ද ගත යුතු යි. ඍතු භෝජනාදි යන තන්හි ආදි ශබ්දයෙන් කායික සුඛ, කායික දුක්ඛ, පුද්ගල සේනාසන ගත යුතු යි. 'ශ්‍රද්ධාව නිසා දන් දෙයි. සිල් රකියි. ධ්‍යාන, විදර්ශනා, මාර්ග, අභිඥා, සමාපත්ති උපදවයි' යනාදි තන්හි ශ්‍රද්ධාදිය පකතූපනිස්සය යි දත යුතු. පකත නම් මනා වැ ඇඩි වැ කරන ලද යි. පකති උපනිස්සය හෝ පකතූපනිස්සය යි. පකති නම් අනික් අරමුණු හා අසම්මිශ්‍ර වීම යි. ප්‍රකෘතියෙන් උපනිශ්‍රය වූයේ ප්‍රකෘත්‍යුපනිශ්‍රය යි. එවිට ගත යුතු යි. වදාළේ මැ යි.

**පට්ඨානයෙහි:**

**"උපනිස්සයපච්චයොති පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං උපනිස්සය පච්චයෙන පච්චයො. පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අකුශලානං ධම්මානං කෙසංචී -පෙ- අබ්‍යාකතානං ධම්මානං උපනිස්සයපච්චයෙන පච්චයො. පුරිමා පුරිමා අකුශලා ධම්මා පච්චිමානං පච්ඡිමානං අකුශලානං ධම්මානං -පෙ- කුසලානං ධම්මානං කෙසංචි -පෙ- අබ්‍යාකතානං ධම්මානං උපනිස්සය පච්චයෙන පච්චයො. පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං -පෙ- කුසලානං ධම්මානං -පෙ- අකුශලානං ධම්මානං උපනිස්සය පච්චයෙන පච්චයො. උතුභොජනං පි උපනිස්සයපච්චයෙන පච්චයො. පුග්ගලො පි -පෙ- සෙනාසනං පි උපනිස්සය පච්චයෙන පච්චයො"**යි.

**පටිච්චසමුප්පාදයෙහි** අවිද්‍යාව සංස්කාරයන්ට ද, සංස්කාර විඥානයට ද, ඵස්සය වේදනාවට ද, වේදනාව තෘෂ්ණාවට ද, තෘෂ්ණාව උපාදානයට ද, උපාදානය භවයට ද, භවය ජාතියට ද, ජාතිය ජරාමරණයන්ට ද, මේ උපනිශ්‍රය ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. විශේෂ ස්ථාන සලකා බැලිය යුතු යි.

**ප්‍රශ්න.**

1. අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය පහදා දී පටිච්චසමුප්පාදයෙහි ඒ ලැබෙන තැන් දක්වනු.
2. නිස්සය ප්‍රත්‍යය කිම? එ ද පටිච්චසමුප්පාදයෙහි කො තැන ලැබේ ද?
3. උපනිස්සය ප්‍රත්‍යය තෝරනු. ඒ කී වැදෑරුම් ද?
4. ආරම්මණූපනිස්සයේ හා ආරම්මණාධිපති ප්‍රත්‍යයෙහි වෙනස දක්වනු.

5. පකතූපනිස්සය පැහැදිලි කරනු. අනන්තර අනන්තරූප නිස්සය දෙකේ වෙනස දක්වනු.

## 15 10 පුරෙජාත ප්‍රත්‍යය, 11 පච්ඡාජාත පච්චය, 12 ආසෙවන ප්‍රත්‍යය, 13 කර්ම ප්‍රත්‍යය, 14 විපාක ප්‍රත්‍යය.

### 10 පුරෙජාත ප්‍රත්‍යය

පුරෙජාත ප්‍රත්‍යය නම් පළමු වැ උපදීම් වශයෙන් උපකාර වීම ය. කල්පාරම්භයෙහි පහළ වූ සඳ හිරු පසු වැ උපදින ආලෝකය නිශ්‍රය කොට ඇති සත්ත්වයන්ට උපකාර වන්නාක් මෙනි. පළමු කොටැ උපදී තිබෙන චක්ඛායතනය පසු වැ එහි උපදින චක්ඛුවිඤ්ඤාණයන්ට හා තත් සම්ප්‍රයුක්තයන්ට පුරෙජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. එසේ ම සෝත, ඝාණ, ජිව්හා, කායායතන සෝතවිඤ්ඤාණාදීන්ට හා තත් සම්ප්‍රයුක්තයන්ට ද, රූප, ශබ්ද, ගන්‍ධ, රස, ස්පර්ශව්‍යායතන මනෝධාතුවට හා මනෝවිඤ්ඤාණධාතුවට ද තතත් සම්ප්‍රයුක්තයන්ට ද, හෘදය වස්තුව මනෝධාතුවට හා තත්සම්ප්‍රයුක්තයන්ට ද, එ ම හෘදය වස්තුව ඇතැම් විටෙක මනෝවිඤ්ඤාණධාතුවට හා තත්සම්ප්‍රයුක්තයන්ට ද පුරෙජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. වදාළේ මැ යි.

**පට්ඨානයෙහි:**

**"පුරෙජාතපච්චයොති චක්ඛායතනං චක්ඛුවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානං ච ධම්මානං පුරෙජාත පච්චයෙන පච්චයො. සොතායතන -පෙ- ඝාණායතනං -පෙ- ජිව්හායතනං -පෙ- කායායතනං කායවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානං ච ධම්මානං පුරෙජාත පච්චයෙන පච්චයො. රූපායතනං චක්ඛුවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානං ච ධම්මානං පුරෙජාත පච්චයෙන පච්චයො. සද්දයතනං -පෙ- ගන්ධායතනං -පෙ- රසායතනං -පෙ- ඵොට්ඨබ්බායතනං කායවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානං ච ධම්මානං පුරෙජාත පච්චයෙන පච්චයො. රූපායතනං සද්දයතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං මනො ධාතුයා තං සම්පයුත්තකානං ච ධම්මානං පුරෙජාත පච්චයෙන පච්චයො යං රූපං නිස්සාය මනොධාතු ච මනො විඤ්ඤාණධාතු ච වත්තන්ති තං රූපං මනොධාතුයා තං සම්පයුත්තකානං ච ධම්මානං පුරෙජාත පච්චයෙන පච්චයො. මනොවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානං ච ධම්මානං කිංචිකාලෙ පුරෙජාත පච්චයෙන පච්චයො, කිංචිකාලෙ න පුරෙජාතපච්චයෙන පච්චයො"** යි.

පටිච්චසමුප්පාදයෙහි නාමරූප අතුරෙන් චක්ඛායතනාදි පස හා හෘදයවස්තු රූපය මනායතනයට ද සළායතන ඵස්සයට ද, පුරෙජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. සළායතන අතුරෙන් මනායතනයෙහි විශේෂය ද බාහිරායතන සම්බන්‍ධය ද සලකනු.

### 11 පච්ඡාජාත ප්‍රත්‍යය.

පච්ඡාජාත ප්‍රත්‍යය නම් පළමු උපන්නවුන්ට පසු වැ උපදීම් වශයෙන් උපකාර වීම ය. පසු වැ වත් කරනු ලබන ජලය පළමු සිටුවා තිබෙන රුක් ලිය ආදියේ වර්ධනයට උපකාර

වේ. මෙන් පසු වැ පහළ වන ධර්ම පළමු පහළ වැ තිබෙන ධර්මයන්ට උපකාර වීම පච්ඡාජාත ප්‍රත්‍යයයි. පසු වැ උපදින ආහාරාසා චේතනාව පළමු ගිජුලිහිණි පැටවුන්ගේ ශරීරයට උපකාර වේ ය යි අටුවාවෙහි මේ සඳහා උපමා දැක්විණි. වදාළේ මැ යි.

**පට්ඨානයෙහි:**

**"පච්ඡාජාතපච්චයොති පච්ඡාජාතා චිත්තචෙතසිකා ධම්මා පුරෙජාතස්ස ඉමස්ස කායස්ස පච්ඡාජාත පච්චයෙන පච්චයො"** යි පසු වැ හටගන්නා චිත්ත චෛතසික පළමු උපන් මේ කයට පච්ඡාජාත ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ යනු එහි අර්ථ යි.

**පටිච්චසමුප්පාදයෙහි** නාමරූප ප්‍රත්‍යයයෙන් සළායතන වේ ය යි කියූ තන්හි ප්‍රවෘත්ති කාලයෙහි චක්ඛායතනාදියට චක්ඛුවිඤ්ඤාණය පච්ඡාජාත ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ ය යි දත යුතු. චක්ඛුවිඤ්ඤාණාදිය උපදින්නේ චක්ඛායතනාදියට පසු වැ ය.

## 12 ආසෙවන ප්‍රත්‍යය.

ආසෙවන ප්‍රත්‍යය නම් නැවත නැවත සෙවන වශයෙන් උපකාර වීම ය. පළමු හදාළ ග්‍රන්ථය පසු පසු වැ ද හැදෑරීමෙන් ප්‍රබල වේ. පළමු සුවඳ ලූ තැන නැවත නැවත සුවඳ ලීමෙන් වඩා ලා ත් සුවඳ වේ. පළමු පළමු ජවනයන්ගේ ආසේවනය ලැබීමෙන් පසු පසු ජවන බලවත් වේ. වදාළේ මැ යි.

**පට්ඨානයෙහි:**

**"ආසෙවන පච්චයොති පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං ආසෙවන පච්චයෙන පච්චයො. පුරිමා පුරිමා අකුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං ආසෙවනපච්චයෙන පච්චයො. පුරිමා පුරිමා කිරියා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කිරියා අබ්‍යාකතානං ධම්මානං ආසෙවන පච්චයෙන පච්චයො"** යි. පූර්ව පූර්ව කුසල අකුසල ක්‍රියා ජවන පසු පසු ජවනයන්ට ආසේවන ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. යනු එහි අර්ථයි. කුසල අකුසල සත් වන ජවන් උපපද්‍යවෙද්‍ය කර්ම වේ. ආසෙවන ලැබීමෙනි.

**පටිච්චසමුප්පාදයෙහි** අවිද්‍යාව අපුඤ්ඤාභිසංඛාරයන්ට ද්විතීය තෘතීයාදි ජවනයන්හි දී ආසේවන ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ.

## 13 කර්ම ප්‍රත්‍යය.

කර්ම ප්‍රත්‍යය නම් කර්ම වශයෙන් උපකාර වීම ය. කර්ම නම් කායාඞ්ග වාචාඞ්ග චිත්තාඞ්ග අභිසංස්කරණය කිරීම් සංඛ්‍යාත චිත්තප්‍රයෝගයෙකි. ඒ නම් චේතනා යි. එය **සහජාත කර්ම ප්‍රත්‍යය, නානා ක්‍ෂණික කර්ම ප්‍රත්‍යය යි ද්විවිධ වේ.** සහජාත කර්මප්‍රත්‍යය නම් කුශලාකුශල චිත්තයන්හි සහජාත චේතනා ඒ ඇසිල්ලෙහි සම්ප්‍රයුක්තයන්ට ද එයින් උපදනා රූපයන්ට ද ප්‍රත්‍යය වීම ය. නානා ක්‍ෂණික කර්ම ප්‍රත්‍යය නම් එය මතු ප්‍රතිසන්ධි

ප්‍රවෘත්ති විපාකයන්ට හා කර්මජ රූපයන්ට ප්‍රත්‍යය වීම ය. සාලිබීජාදිය සංස්කාර කරන ලද්දේ මතු අංකුරොත්පාදනයට උපකාර වන්නාක් මෙනි. ස්ත්‍රී පුරුෂ සංසර්ගය ඒ ඇසිල්ලෙහි ආස්වාදනයට උපකාර වීම සහජාත කර්ම ප්‍රත්‍යය මෙනැ යි ද මතු දාරකොත්පාදනයට උපකාර වීම නානාක්ෂණික කර්ම ප්‍රත්‍යය මෙනැ යි ද **ටීකායෙක** දක්වයි. වදාළේ මැ යි.

**පට්ඨානයෙහි:**

"**කම්මපච්චයොති කුසලාකුසලා කම්මං විපාකානං ඛන්‍ධානං කටත්තා ච රූපානං කම්මපච්චයෙන පච්චයො. චේතනා සම්පයුත්තකානං ධම්මානං තංසමුට්ඨානානං ච රූපානං කම්මපච්චයෙන පච්චයො**" යි කුශලාකුශල කර්ම විපාකස්කන්‍ධයන්ට හා කර්ම රූපයන්ට කර්ම ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. නානාක්ෂණික කර්මප්‍රත්‍යය යි. චේතනා සම්ප්‍රයුක්තයන්ට ද තත්සමුත්ථාන රූපයන්ට ද කර්මප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. මේ සහජාත කර්ම ප්‍රත්‍යය යි.

**පටිච්චසමුප්පාදයෙහි** සංඛාර විඤ්ඤාණයට ද, කර්මභවය ජාතියට ද, කර්මප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

## 14 විපාක ප්‍රත්‍යය.

විපාක ප්‍රත්‍යය නම් විපාක වශයෙන් උපකාර වීම ය. විපාක නම් විශේෂ පැසීමෙකි. කුශලාකුශල කර්ම නිරුද්ධ වුව ද කවදා හෝ පැසීම් අවස්ථාවකට පැමිණේ. බීජයෙන් නැඟෙන අංකුරය මෙනි. වෘක්ෂලතාවන් හි මල් ඵල හටගැනීම මෙනි. එය නිරුත්සාහ ශාන්තභාවයෙන් සිද්ධ වේ යයි කියනු ලැබේ. රැයක් මුළුල්ලේ නිදිගත් කල්හි ලැබෙන විපාක සිත් ශාන්තභාවයෙන් ම අවසන් වේ. මෙසේ පැසීම් වශයෙන් උපකාර වන ධර්මවිපාක සත්‍යය යි. වදාළේ මැයි.

**පට්ඨානයෙහි:**

"**විපාකපච්චයොති විපාකා චත්තාරො ඛන්‍ධා අරූපිනො අඤ්ඤමඤ්ඤං විපාකපච්චයෙන පච්චයො**"යි. විපාක අරූප ස්කන්‍ධ සතර අන්‍යොන්‍යයන්ට විපාක ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ යනු එහි අර්ථ යි. තව ද විපාක ප්‍රවෘත්තියෙහි තත් සමුත්ථාන රූපයන්ට ද, ප්‍රතිසන්‍ධියෙහි කර්මජ රූපයන්ට ද, ඒ ඇමතන්හි ම සම්ප්‍රයුක්තයන්ට ද විපාක ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. වදාළේ මැයි. "**විපාකාව්‍යාකතො එකො ඛන්‍ධො තිණ්ණන්තං ඛන්‍ධානං චිත්ත සමුට්ඨානානං ච රූපානං විපාකපච්චයෙන පච්චයො. පටිසන්‍ධික්ඛණෙ විපාකාබ්‍යාකතො එකො ඛන්‍ධො තිණ්ණන්තං ඛන්‍ධානං කටත්තා ච රූපානං, තයො ඛන්‍ධා එකස්ස ඛන්‍ධස්ස, ද්වෙ ඛන්‍ධා ද්වින්නං ඛන්ධානං කටත්තා ච රූපානං විපාක පච්චයෙන පච්චයො. ඛන්ධා වත්‍ථුස්ස විපාකපච්චයෙන පච්චයො**" යි. අර්ථ විමසා බලනු.

**පටිච්චසමුප්පාදයෙහි විඤ්ඤාණය නාමරූපයට ද, නාමරූප සළායතනයට ද, සළායතන ඵස්සයට ද, ඵස්සය වේදනාවට ද, විපාක ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. විශේෂ භෙද පිරිසිඳැ දත යුතුයි.**

**ප්‍රශ්න.**

1. පුරෙජාත ප්‍රත්‍යය දක්වනු.
2. පච්ඡාජාත ප්‍රත්‍යය පැහැදිලි කරනු.
3. ආසෙවන ප්‍රත්‍යය කිම?
4. කම්මපච්චය කී වැදැරුම් ද? විස්තර කරනු.
5. විපාක ප්‍රත්‍යය දක්වනු? මේ එක් එක් ප්‍රත්‍යය පටිච්ච සමුප්පාදයෙහි කවර කවර තන්හි ලැබේ ද?

# 16 15 ආහාර ප්‍රත්‍යය, 16 ඉන්ද්‍රිය ප්‍රත්‍යය, 17 ධ්‍යාන ප්‍රත්‍යය, 18 මාර්ග ප්‍රත්‍යය, 19 සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය.

### 15 ආහාර ප්‍රත්‍යය.

ආහාර ප්‍රත්‍යය නම් ආහාර වශයෙන් උපකාර වීම ය. ආහාර නම් ගෙයකට බලකරු මෙන් උපස්ථම්භ වන දේ ය. **ඒ වනාහි කබලීකාරාහාරය, ඵස්සාහාරය, මනොසංචෙතනාහාරය, විඤ්ඤණාහාරය යි. චතුර්විධ වේ.** කබලිකාරාහාරය නම් ඔජාව ය. එය මේ කයට උපස්ථම්භ දෙන්නේ ය. ඵස්සාහාරය නම් ඵස්ස චෛතසිකය යි. එය තත්සම්ප්‍රයුක්තයන්ට ද තත් සමුත්ථාන රූපයට ද උපස්ථම්භ දෙන්නේ ය. මනොසඤ්චෙතනාහාර නම් චේතනාව ය. විඤ්ඤාණාහාර නම් චිත්තය යි. ඒ දෙක ද තත්සම්ප්‍රයුක්තයන්ට හා තත්සමුත්ථාන රූපයට උපස්ථම්භ දෙන්නේ ය. වදාළේ මැ යි.

**පට්ඨානයෙහි:**

**"ආහාරපච්චයොති කබලීකාරො ආහාරො ඉමස්ස කායස්ස ආහාරපච්චයෙන පච්චයො. අරූපිනො ආහාරා සම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානං ච රූපානං ආහාර පච්චයෙන පච්චයො"**යි. අරූපී ආහාර නම් ඵස්ස චේතනා විඤ්ඤාණ යි.

**පටිච්චසමුප්පාදයෙහි** විඤ්ඤාණය නාමරූපයට ද, නාමරූප සළායතනයට ද, සළායතන ඵස්සයට ද, ඵස්ස වේදනාවට ද, ආහාර ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වන්නේ ය. විශේෂ ස්ථාන සලකනු.

### 16 ඉන්ද්‍රිය ප්‍රත්‍යය.

ඉන්‍ද්‍රිය ප්‍රත්‍යය නම් ඊශ්වර භාවයෙන් උපකාර වීම ය. රජෙක් රාජාමාත්‍යාදීන්ට ඊශ්වර භාවය කරන්නාක් මෙනි. ඉන්‍ද්‍රිය වනාහි චක්ඛුන්‍ද්‍රිය, සොතින්‍ද්‍රිය, ඝාණින්‍ද්‍රිය, ජිව්හින්‍ද්‍රිය, කායින්‍ද්‍රිය, ජීවිතින්‍ද්‍රිය, මනින්‍ද්‍රිය, සුඛින්‍ද්‍රිය, දුක්ඛින්‍ද්‍රිය, සොමනස්සින්‍ද්‍රිය, දොමනස්සින්‍ද්‍රිය, උපෙක්ඛින්‍ද්‍රිය, සද්ධින්‍ද්‍රිය, විරියින්‍ද්‍රිය, සතින්‍ද්‍රිය, සමාධින්‍ද්‍රිය, පඤ්ඤින්‍ද්‍රිය, අනඤ්ඤාතඤ්ඤස්සාමිතින්‍ද්‍රිය, අඤ්ඤින්‍ද්‍රිය, අඤ්ඤාතාවින්‍ද්‍රියයි විස්සෙකි. දෙවිසි ඉන්ද්‍රියයන් අතුරෙන් ඉත්ථින්‍ද්‍රිය හා පුරිසින්‍ද්‍රිය ඉන්ද්‍රිය ප්‍රත්‍යයට ඇතුළත් නො වන බැව් දත යුතු. ප්‍රත්‍යය වන්නේ ජනකත්‍වයක් හෝ උපස්ථම්භකත්‍වයක් හෝ අනුපාලකත්‍වයක් හෝ කරන ධර්ම ය. භාවරූපද්වය ඒ එකකුදු නො කෙරේ. එ බැවින් ඒ ඉන්‍ද්‍රිය විනා ඉන්‍ද්‍රිය ප්‍රත්‍යය නොවේ. මෙහි චක්ඛුන්ද්‍රියාදි පස චක්ඛුවිඤ්ඤාණාදියට හා තත්සම්ප්‍රයුක්තයන්ට ද, රූප ජීවිතින්‍ද්‍රිය කර්මජරූපයන්ට ද, අරූප ඉන්ද්‍රිය තත්සම්ප්‍රයුක්තයන්ට හා තත්සමුත්‍ථාන රූපයන්ට ද ඉන්ද්‍රිය ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. වදාළේ මැයි.

**පට්ඨානයෙහි:**

**"ඉන්‍ද්‍රියපච්චයොති චක්ඛුන්‍ද්‍රියං චක්ඛුවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානංච ධම්මානං ඉන්‍ද්‍රියපච්චයෙන පච්චයො. සොතින්‍ද්‍රිය -පෙ- ඝාණින්ද්‍රියං -පෙ- ජිව්හින්ද්‍රියං -පෙ- කායින්ද්‍රියං කායවිඤ්ඤාණධාතුයානං සම්පයුත්තකානං ච ධම්මානං ඉන්ද්‍රිය පච්චයෙන පච්චයො, රූපජීවිතින්ද්‍රියං කටත්තාරූපානං ඉන්ද්‍රිය පච්චයෙන පච්චයො. අරූපීනො ඉන්ද්‍රියා සම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානං ච රූපානං ඉන්ද්‍රියපච්චයෙන පච්චයො" යි.**

**පටිච්චසමුප්පාදයෙහි** විඤ්ඤාණය නාමරූපයට ද, නාමරූප සළායතනයටද, සළායතන ඵස්සයට ද, ඉන්ද්‍රිය ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. විශේෂ ස්ථාන විමසා බලනු.

## 17 ධ්‍යාන ප්‍රත්‍යය.

ධ්‍යාන ප්‍රත්‍යය නම් ධ්‍යාන වශයෙන් උපකාර වීම ය. ධ්‍යාන නම් අරමුණ කරා එළඹැ මෙන් බැලීම යි. පර්වතයක් මුදුනට නැඟී බලන්නහුට ඒ බැලීම දුර ආසන්න බව දැනැගැන්මට උපකාර වන්නාක් මෙනි. ඒ ධ්‍යාන වනාහි අඞ්ග වශයෙන් විතර්ක, විචාර, ප්‍රීති, එකාග්‍රතා, සෝමනස්ස, දෝමනස්ස, උපෙක්‍ෂා ය යි සත්වැදැරුම් වේ. මේ ධ්‍යානාඞ්ග තත්සම්ප්‍රයුක්තයන්ට හා තත්සමුත්‍ථාන රූපයන්ට ධ්‍යාන ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. දෙපස් විඤ්ඤාණයෙහි සුඛ දුඃඛ ධ්‍යානාඞ්ග නොවන බැව් යට කියන ලදි.

**පට්ඨානයෙහි:**

**"ඣානපච්චයො'ති ඣානඞ්ගානි ඣානසම්පයුත්තකානං ධම්මානං තංසමුට්ඨානානං ච රූපානං ඣාන පච්චයෙන පච්චයො" යි.**

**පටිච්චසමුප්පාදයෙහි** ධ්‍යාන ප්‍රත්‍යය ලැබෙන තැන් නො දැක්විණි.

## 18 මාර්ග ප්‍රත්‍යය.

මාර්ග ප්‍රත්‍යය නම් මාර්ග වශයෙන් උපකාර වීම ය. මාර්ග නම් සුගතියට හෝ දුර්ගතියට හෝ නිර්වාණයට හෝ පමුණුවන ධර්ම යි. එතරින් මෙතරට තරණය කරන පුරුෂයාට නැව එතරින් නික්මැ යාමට උපකාර වන්නාක් මෙනි. මාර්ග වනාහි අඞ්ග වශයෙන් සම්මාදිට්ඨි, සම්මාසංකප්ප, සම්මාවාචා, සම්මා කම්මන්ත, සම්මාආජීව, සම්මාවායාම, සම්මාසති, සම්මාසමාධි, මිච්ඡාදිට්ඨි, මිච්ඡාසංකප්ප, මිච්ඡාවායාම, මිච්ඡාසමාධිය යි දොළොසෙකි. මෙයින් මුල් අට සුගති හෝ නිර්වාණ මාර්ගාඞ්ග ය. අග සතර දුර්ගති මාර්ගාඞ්ග යි. මේ මාර්ගාඞ්ග වනාහි තත්සම්ප්‍රයුක්තයන්ට ද, තත්සමුත්ථාන රූපයන්ට ද මාර්ගප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. වදාළේ මැ යි.

පට්ඨානයෙහි:

**“මග්ගපච්චයො’ති. මග්ගඞ්ගානි මග්ගසම්පයුත්තකානං ධම්මානං තංසමුට්ඨානානං ච රූපානං මග්ගපච්චයෙන පච්චයො”** යි අහේතු සිත්හි එකග්ගතා මාර්ගාඞ්ග නොවන බව දත යුතු යි.

**පටිච්චසමුප්පාදයෙහි** මාර්ග ප්‍රත්‍යය නො දැක්විණි.

## 19. සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය.

සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය නම් එකවස්තුක, එකාරම්මණ, එකුප්පාද, එකනිරොධ සංඛ්‍යාත සම්ප්‍රයුක්තභාවයෙන් හෙවත් එක් වැ යෙදීම් වශයෙන් උපකාර වීමය. කිරි ගිතෙල් මී සකුරු යන චතුමධුර එක්වීම මෙනි. වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන සතර අරූප ධර්ම ඔවුනොවුන්ට සම්ප්‍රයුක්ත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. වදාළේ මැ යි.

පට්ඨානයෙහි:

**“සම්පයුත්ත පච්චයොති. චත්තාරො ඛන්ධා අරූපිනො අඤ්ඤමඤ්ඤං සම්පයුත්ත පච්චයෙන පච්චයො”**යි.

**පටිච්චසමුප්පාදයෙහි** අවිද්‍යාව අපුඤ්ඤාභිසංඛාරයන්ට ද, විඤ්ඤාණය නාමරූප අතුරෙන් නාමයට ද, නාමය ෂඩායතනයට ද, මනායතනය මනොසම්ඵස්සයට ද, ඵස්සය වේදනාවට ද, තණ්හාව දිට්ඨුපාදානාදි තුනට ද, උපාදානය භවයට ද, සම්ප්‍රයුක්ත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

## ප්‍රශ්න.

1. ආහාර ප්‍රත්‍යය විස්තර කරනු.
2. ඉන්ද්‍රිය ප්‍රත්‍යය වන්නේ කවර ඉන්ද්‍රිය ද? හේතු කිම?

3. ධ්‍යාන ප්‍රත්‍යය හා මාර්ග ප්‍රත්‍යය පැහැදිලි කරනු.
4. සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය දක්වනු.
5. මේ ප්‍රත්‍යය පස පටිච්චසමුප්පාදයෙහි ලැබෙන තැන් දක්වනු.

## 17. 20 විප්පයුත්ත ප්‍රත්‍යය, 21 අස්තිප්‍රත්‍යය, 22 නාස්ති ප්‍රත්‍යය 23 විගත ප්‍රත්‍යය, 24 අවිගත ප්‍රත්‍යය.

### 20 විප්‍රයුක්ත ප්‍රත්‍යය

විප්‍රයුක්ත ප්‍රත්‍යය නම් විප්‍රයුක්ත වශයෙන් උපකාර වීම ය. විප්‍රයුක්ත නම් එකවට උපන්න ද මිශ්‍ර නො වැ වෙන් වැ තිබීම ය. මධුරාම්ලාදි ෂට්රසය එකට මිශ්‍ර කළ කළ ද එක් නො වැ වෙන් වැ මැ තිබී ඔවුනොවුන්ට උපකාර වන්නාක් මෙනි. රූපී ධර්ම අරූප ධර්මයන්ට විප්‍රයුක්ත ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. වදාළේ මැ යි.

**පට්ඨානයෙහි:**

**"විප්පයුක්තපච්චයො'ති. රූපිනො ධම්මා අරූපීනං ධම්මා නං විප්පයුත්තපච්චයෙන පච්චයො අරූපිනො ධම්මා රූපීනං ධම්මානං විප්පයුත්තපච්චයෙන පච්චයො"**යි.

මේ වනාහි **සහජාතවිප්‍රයුක්තය, පශ්චාජ්ජාතවිප්‍රයුක්තය, පුරෙජාතවිප්‍රයුක්තය ය යි ත්‍රිවිධ වේ. සහජාත විප්‍රයුක්ත** නම් එක් වැ හටගනිමින් ම වෙන් වැ යෙදීම ය. සහජාත කුසලස්කන්ධ චිත්තසමුට්ඨාන රූපයන්ට ද, ප්‍රතිසන්ධික්ෂණයෙහි විපාක අව්‍යාකෘත කර්මජරූපයන්ට ද, සහජාත විප්‍රයුක්ත ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය යි. **පශ්චාජ්ජාත විප්‍රයුත්ත නම්** පසු වැ හටගනිමින් ම වෙන් වැ යෙදීම ය. පශ්චාජ්ජාත කුශල ස්කන්ධ පුරෙජාත මේ කයට විප්‍රයුක්ත ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය යි. **පුරෙජාත විප්‍රයුක්ත නම්** පළමු හටගනිමින් ම වෙන් වැ යෙදීම ය. පුරෙජාත චක්ඛායතනාදිය චක්ඛුවිඤ්ඤාණාදියට පුරෙජාත විප්‍රයුක්ත ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය යි. විස්තර උභය යි.

**පටිච්චසමුප්පාදයෙහි** විඤ්ඤාණය රූපයට ද, නාමය චක්ඛායතනාදියට හා රූපය මනායතනයට ද, චක්කායතනාදි පස චක්ඛුඵස්සාදි පසට ද විප්‍රයුක්ත ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. සූක්ෂම භෙද සලකා උගත යුතු යි.

### 21 අස්ති ප්‍රත්‍යය.

අස්ති ප්‍රත්‍යය නම් විද්‍යමාන භාවයෙන් උපකාර වීම ය. විද්‍යමාන භාවය නම් ඇති බව යි. යට දැක්වූ ප්‍රත්‍යය අතුරෙන් යමෙක් ඇති බවය යි කියන ලද ක්ෂණ ප්‍රත්‍යුත්පන්න භාවයෙන් යුක්ත වැ එ බඳු වූ ම ක්ෂණ ප්‍රත්‍යුත්පන්න භාවයෙන් යුක්ත ධර්මයකට සහජාතාදි වශයෙන් උපකාර වන්නේ නම් ඒ අස්ති ප්‍රත්‍යය යි දත යුතු. හිමාලය පර්වතය තමාගේ විද්‍යමානභාවය එහි ම වෘක්ෂලතාදියට උපකාර වන්නාක් මෙනි. සතර

අරූපස්කන්ධ අන්‍යොන්‍යයන්ට අස්තිප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. එසේ ම සතරමහාභූත හා ප්‍රතිසන්ධික්ෂණයෙහි නාමරූප අන්‍යොන්‍යයන්ට අස්ති ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. චිත්ත චෛතසික තත් සමුත්ථාන රූපයන්ට ද, මහාභූත උපාදාය රූපයන්ට ද, චක්ඛායතනාදි පස චක්ඛුවිඤ්ඤාණාදියට හා තත්සම්ප්‍රයුක්තයන්ට ද, රූපායතනාදි පස චක්ඛුවිඤ්ඤාණාදියට හා මනොධාතුවට හා තත්සම්ප්‍රයුක්තයන්ට ද, හෘදය වස්තු රූපය මනොධාතු මනො විඤ්ඤාණධාතුන්ට හා තත්සම්ප්‍රයුක්තයන්ට ද අස්ති ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. වදාළේ මැ යි.

පට්ඨානයෙහි:

**"අත්‍ථිපච්චයො'ති. චත්තාරො ඛන්ධා අරූපිනො අඤ්ඤමඤ්ඤං අත්‍ථිපච්චයෙන පච්චයො. චත්තාරො මහාභූතා අඤ්ඤමඤ්ඤං අත්‍ථිපච්චයෙන පච්චයො. ඔක්කන්තික්ඛණෙ නාමරූපං අඤ්ඤමඤ්ඤං අත්‍ථිපච්චයෙන පච්චයො. චිත්තචෙතසිකා ධම්මා චිත්තසමුට්ඨානං නං රූපානං -පෙ- මහාභූතා උපාදරූපානං -පෙ- චක්ඛායතනං චක්ඛුවිඤ්ඤණධාතුයා තංසම්පයුත්තකානං ච ධම්මානං -පෙ- සොතායතනං -පෙ- ඝාණායතනං -පෙ- ජිව්හායතනං -පෙ- කායායතනං කායවිඤ්ඤණ ධාතුයා තංසම්පයුක්තකානංච ධම්මානං -පෙ- රූපායතනං චක්ඛුවිඤ්ඤණධාතුයා තංසම්පයුත්තකානං ච ධම්මානං -පෙ- සද්දයතනං -පෙ- රසායතනං -පෙ- ඵොට්ඨබ්බායතනං කායවිඤ්ඤණධාතුයා තං සම්පයුක්තකානං ච ධම්මානං -පෙ- රූපායතනං සද්දයතනං රසායතනං ඵොට්ඨබ්බායතනං මනොධාතුයා තං සම්පයුත්තකානං ච ධම්මානං -පෙ- යං රූපං නිස්සාය මනොධාතු ච මනොවිඤ්ඤණධාතු ච වත්තන්තී තංරූපං මනොධාතුයාච මනො විඤ්ඤණධාතුයා ච තං සම්පයුත්තකානං ච ධම්මානං අත්‍ථිපච්චයෙන පච්චයො"** යි.

මේ වනාහි සහජාත අස්තිප්‍රත්‍යය, පුරෙජාත අස්ති ප්‍රත්‍යය, පශ්චාජ්ජාත අස්තිප්‍රත්‍යය, කබලීකාරාහාර අස්ති ප්‍රත්‍යය, රූප ජීවිතෙන්ද්‍රිය අස්තිප්‍රත්‍යය යි පංචවිධ වේ.

පටිච්චසමුප්පාදයෙහි අවිද්‍යාව අපුණ්‍යාභිසංස්කාරයන්ට ද, විඥානය නාමරූපයන්ට ද, නාමරූප සළායතනයන්ට ද, සළායතන ඵස්සයට ද, ඵස්සය වේදනාවට ද, තණ්හාව දිට්ඨුපාදානාදී තුනට ද, උපාදාන කර්මභවයට ද අස්තිභවයට ද අස්තිප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ.

## 22 නාස්ති ප්‍රත්‍යය.

නාස්ති ප්‍රත්‍යය නම් අවිද්‍යමාන භාවයෙන් උපකාර වීම ය. අවිද්‍යමාන භාවය නම් නැති බවයි. පහන නිවී යාම අන්ධකාරය ඇතිවීමට උපකාර වන්නාක් මෙනි. තමහට අනතුරු වැ උපදින අරූප ධර්මයන්ගේ පැවැත්මට අවකාශ දීමෙන් උපකාර වන සමනන්තර නිරුද්ධ චිත්තචෛතසික නාස්ති ප්‍රත්‍යයයි. වදාළේමැ යි.

**"නත්‍ථිපච්චයො'ති. සමනන්තර නිරුද්ධා චිත්තචෙතසිකා ධම්මා පච්චුප්පන්නානං චිත්තචෙතසිකානං ධම්මානං නත්‍ථිපනච්චයෙන පච්චයො"** යි.

පටිච්චසමුප්පාදයෙහි අවිද්‍යාව දුතියජවනාදියෙහි ලා අපුඤ්ඤාභිසංඛාරයන්ට නාස්ති ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ.

## 23 විගත ප්‍රත්‍යය.

විගත ප්‍රත්‍යය නම් විගතභාවයෙන් උපකාර වීම ය. විගත භාවය නම් වෙන් වැ යාම ය- අභක් වැ යාම ය. තමා උන් කල්හි වෙන ධර්ම නූපදි යි. වෙන ධර්මයන්ට උපදීම සඳහා අවකාශ දී මුලින් තිබී අභක් වැ යන චිත්තචෛතසික විගත ප්‍රත්‍යය යි දත යුතු. සූර්යාලෝකය අභක් වැ යාම චන්ද්‍ර ලෝකයාගේ පැතිරීමට උපකාර වන්නාක් මෙනි. මෙය නාස්තිප්‍රත්‍යය බඳු යි. සමනන්තර විගත චිත්ත චෛතසික වර්තමාන චිත්තචෛතසිකයන්ට විගත ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. වදාළේ මැ යි. **පට්ඨානයෙහි:**

**"විගතපච්චයො'ති. සමනන්තර විගතා චිත්තචෙතසිකා ධම්මා පච්චුප්පන්නානං චිත්තචෙතසිකානං ධම්මානං විගත පච්චයෙන පච්චයො"** යි.

පටිච්චසමුප්පාදයෙහි අවිද්‍යාව දුතියජවනාදියෙහි ලා අපුඤ්ඤාභිසංඛාරයන්ට නාස්ති ප්‍රත්‍යයයෙන් සේ ම විගත ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ.

## 24 අවිගත ප්‍රත්‍යය.

අවිගත ප්‍රත්‍යය නම් අවිගතභාවයෙන් උපකාර වීම ය. අවිගතභාවය නම් වෙන් වැ නොයාමය - අභක් වැ නොයාම ය. තමාගේ වර්තමානත්‍වය ම සෙසු ධර්මයන්ගේ පැවැත්මට උපකාර වේ නම් ඒ අවිගත ප්‍රත්‍යය යි. සමුද්‍රය එහි සත්ත්‍වයන්ට උපකාර වන්නාක් මෙනි. අවිගත ප්‍රත්‍යය අස්ති ප්‍රත්‍යය බඳු යි. බලනු.

**පට්ඨානයෙහි:**

**"අවිගතපච්චයොති චත්තාරො ඛන්ධා අරූපිනො අඤ්ඤමඤ්ඤං අවිගතපච්චයෙන පච්චයො චත්තාරො මහාභූතාඅඤ්ඤමඤ්ඤ -පෙ- ඔක්කන්තික්ඛණෙනාමරූපං අඤ්ඤමඤ්ඤං -පෙ- චිත්තචෙතසිකා ධම්මා චිත්තසමුට්ඨානානං රූපානං -පෙ- මහාභූතා උපාදරූපානං -පෙ- චක්ඛායතනං චක්ඛුවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානං ච ධම්මානං -පෙ- සොතායතනං -පෙ- ඝාණායතනං -පෙ- ජිව්හායතනං -පෙ- කායායතනං කායවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානං ච ධම්මානං -පෙ- රූපායතනං -පෙ- සද්දයතනං -පෙ- ගන්ධායතනං -පෙ- රසායතනං -පෙ- ඵොට්ඨබ්බායතනං කායවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානං ච ධම්මානං -පෙ- රූපායතනං සද්දයතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං මනො ධාතුයා තංසම්පයුත්තකානං ච ධම්මානං -පෙ- යං රූපං නිස්සාය මනොධාතු ච මනොවිඤ්ඤාණධාතු ච වත්තන්ති තං රූපං මනොධාතුයා ච මනොවිඤ්ඤාණධාතුයා ච තං සම්පයුත්තකානං ච ධම්මානං අවිගතපච්චයෙන පච්චයො"** යි.

අස්තිප්‍රත්‍යය සේ ම මේ අවිගතප්‍රත්‍යය ද සහජාත පුරෙජාත, පශ්චාජ්ජාත, කබලීකාරාහාර රූපජීවිතින්ද්‍රිය යි පඤ්චවිධ වේ.

**පටිච්චසමුප්පාදයෙහි** අවිද්‍යාව අපුණ්‍යාභිසංඛාරයන්ට ද, විඥානය නාමරූපයන්ට ද, නාමරූප සළායතනයන්ට ද, සළායතන ඵස්සයට ද, ඵස්සය වේදනාවට ද, තණ්හාව දිට්ඨුපාදානාදී තුනට ද, උපාදාන කර්මභවයට ද, අස්තිප්‍රත්‍යයයෙන් සේ ම මේ අවිගත ප්‍රත්‍යයයෙන් ද, ප්‍රත්‍යය වේ.

අස්ති අවිගත ප්‍රත්‍යය දෙක ද නාස්ති විගත ප්‍රත්‍යය දෙක ද සමාන ය. දේශනාවිලාසය ද විනෙයපුද්ගල විශේෂය ද එය එසේ වදාරන්නට කරුණු බව දත යුතු යි.

**ප්‍රශ්න.**

1. විප්‍රයුක්ත ප්‍රත්‍යය පහදා දෙනු.
2. අස්තිප්‍රත්‍යය කිම? එහි භෙද දක්වනු.
3. නාස්තිප්‍රත්‍යය විස්තර කරනු.
4. විගත අවිගත ප්‍රත්‍යය පැහැදිලි කරනු.
5. මේ ප්‍රත්‍යය පස පටිච්චසමුප්පාදයේ යෙදෙන තැන් දක්වනු.

## 18. පටිච්චසමුප්පාදයෙහි පට්ඨාන නය.

අනන්ත නය **සමන්තපට්ඨාන** මහා ප්‍රකරණයෙහි වදාළ සූවිසි ප්‍රත්‍යය විභාගය ද ඒ එක් එක් ප්‍රත්‍යය පටිච්චසමුප්පාදයෙහි ඒ ඒ තැන යෙදෙන සැටි ද යට පාඩම්වලින් දක්වන ලද්දේ ය. පටිච්ච සමුප්පාදයෙහි එක් එක් ප්‍රත්‍යයක් එක් එක් ප්‍රත්‍යයොත්පන්නයකට පට්ඨාන ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යයවන සැටි මෙහි දක්වනු ලැබේ.

**1 අවිද්‍යාව පුණ්‍යාභිසංස්කාරයන්ට ආරම්මණ ප්‍රත්‍යයයෙන් හා උපනිශ්‍රය ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ.** ඒ මෙසේ ය. අවිද්‍යාව ක්‍ෂය ව්‍යය වශයෙන් සම්මර්ශනය කරන කල්හි කාමාවචර පුණ්‍යාභිසංස්කාරයන්ට ද, අභිඥා සිතින් සමොහ සිත් දැනැ ගන්නා කල රූපාවචර පුණ්‍යාභිසංස්කාරයන්ට ද අවිද්‍යාව ආරම්මණ ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. ඒ අවිද්‍යාව දුරු කැරැගැන්ම සඳහා දානාදි පින් කරන කල්හිද රූපාවචර ධ්‍යාන උපදවන කල්හි ද එසේ මැ කාමාවචර රූපාවචර පුණ්‍යාභිසංස්කාර දෙකොටසටම උපනිශ්‍රය ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. අවිද්‍යාවෙන් මුළා වැ කාම රූප භව සම්පත් පතමින් ඒ දෙවැදෑරුම් පින්කරන කල ද එසේ ම උපනිශ්‍රය ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ.

**අවිද්‍යාව අපුණ්‍යාභිසංස්කාරයන්ට නොයෙක් ආකාරයෙන් ප්‍රත්‍යය වේ.** ඒ එසේ මැ යි. අවිද්‍යා අරමුණු කිරීමෙන් රාගාදිය උපදින කල ආරම්මණ ප්‍රත්‍යයයෙන් ද, අවිද්‍යාව ගරු වශයෙන් ආස්වාදනය කරන කල ආරම්මණාධිපති ප්‍රත්‍යයයෙන් හා ආරම්මණොපනිශ්‍රය ප්‍රත්‍යයයෙන් ද, අවිද්‍යායෙන් මුළා වැ ප්‍රාණඝාතාදිය කරන කල උපනිශ්‍රය ප්‍රත්‍යයයෙන් ද

ද්විතීය ජවනාදීන්ට අනන්තර සමනන්තර අනන්ත රූපනිස්සය ආසෙවන නත්‍ථි විගත ප්‍රත්‍යයයන්ගෙන් ද, අකුසල් කරන කල හේතු සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය සම්පයුත්ත අත්‍ථි අවිගත ප්‍රත්‍යයන්ගෙන්ද, ප්‍රත්‍යය වේ.

**අවිද්‍යාව ආනෙඤ්ජාභිසංඛාරයන්ට එකම උපනිශ්‍රය ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ.**

**2 සංස්කාර විඥනයන්ට උපනිශ්‍රය ප්‍රත්‍යයයෙන් හා කර්ම ප්‍රත්‍යයයෙන්** ප්‍රත්‍යය වේ.

**3 විඥනය නාමයන්ට** සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, සම්පයුත්ත, විපාක, ආහාර ඉන්ද්‍රිය, අත්‍ථි, අවිගත යන නව ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. එසේ ම ඒ විඥානය ප්‍රතිසන්ධියෙහි වස්තු රූපයට සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, විපාක, ආහාර, ඉන්ද්‍රිය, විප්පයුත්ත, අත්‍ථි, අවිගත නය නව ප්‍රත්‍යයයෙන් ද වස්තු රූපය හැර සෙසු රූපයන්ට මේ නවයෙන් අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය හැර සෙසු අෂ්ට ප්‍රත්‍යයයෙන් ද ප්‍රත්‍යය වේ. අභිසංඛාර විඤ්ඤාණය අසඤ්ඤසත්ත රූපයට හෝ පඤ්චවොකාර භවයෙහි කර්මජ රූපයට හෝ උපනිස්සය ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. ප්‍රථම භවාඞ්ගයෙහි පටන් අවශේෂ සියලු විඤ්ඤාණ ඒ ඒ නාමරූපයන්ට සුදුසු සුදුසු පරිදි ප්‍රත්‍ය වේ. විස්තර සැලකිය යුතු යි.

4 අරූප භවයෙහි **විපාක නාමය** මනායතනයට ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති දෙක්හිම සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, සම්පයුත්ත, විපාක, අත්‍ථි, අවිගත යන සප්ත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. මෙහි හේතු ප්‍රත්‍යය හා ආහාර ප්‍රත්‍යය ලැබෙන සැටිද සලකනු. ප්‍රවෘත්තියෙහි ද අවිපාක නාමය මනායතනයට යට දැක්වුණු සප්තප්‍රත්‍යයන් අතුරෙන් විපාක ප්‍රත්‍යය හැර සෙසු ෂට්ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. එහි දු හේතු ප්‍රත්‍යය හා ආහාර ප්‍රත්‍යය ලැබෙන සැටි සලකනු.

පඤ්චවෝකාර භවයෙහි **විපාක නාමය** හෘදයවස්තු සහාය වැ මනායතනයට ප්‍රතිසන්ධියෙහි දී අරූප භවයට දැක්වූ සප්තප්‍රත්‍යයයෙන් ම ප්‍රත්‍යය වේ. චක්ඛායතනාදි වූ පසට චතුර්මහාභූත සහාය වැ සහජාත, නිස්සය, විපාක, විප්පයුත්ත, අත්‍ථි, අවිගත යන ෂට් ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. මෙහි දු හේතු, ආහාර ප්‍රත්‍යය ලැබෙන සැටි සලකනු. ප්‍රවෘත්තියෙහි දී ප්‍රතිසන්ධියට කී පරිදිම විපාක නාමය විපාක මනායතනයට සප්තප්‍රත්‍යයයෙන් ද අවිපාකනාමය අවිපාක මනායතනයට විපාක ප්‍රත්‍යය හැර සෙසු ෂට් ප්‍රත්‍යයයෙන් ද චක්ඛායතනාදි වූ පසට පච්ඡාජාත, විප්පයුත්ත, අත්‍ථි, අවිගත යන සතර ප්‍රත්‍යයයෙන් ද ප්‍රත්‍යය වේ. අවිපාක නාමය ද මෙසේ දත යුතු. මේ නාමය ෂඩායතනයන්ට ප්‍රත්‍යය වන සැටියි.

අරූපභවයෙහි කිසි ද රූපයෙක් කිසි ද ආයතනයකට ප්‍රත්‍යය නොවේ. එහි රූප කැල ම නැති බැවිනි.

පංචවොකාර භවයෙහි **වස්තුරූප මනායතනයට** ප්‍රතිසන්ධියෙහි දී සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, විප්පයුත්ත අත්‍ථි, අවිගත යන ෂට් ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. භූතරූප සතර ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති දෙක්හි ම ලැබෙන ලැබෙන පරිදි චක්ඛායතනාදි පසට සහජාත, නිස්සය, අත්‍ථි, අවිගත යන සිව් ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. ජීවිතින්ද්‍රියරූපය චක්ඛායතනාදි පසට ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි දෙක්හි ම අත්‍ථි, අවිගත, ඉන්ද්‍රිය යන තුන් ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. ආහාර රූපය අත්‍ථි, අවිගත, ආහාර යන තුන් ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. එ ද ආහාර රූප ජීවීන්ට ය. එ ද ප්‍රවෘත්තියෙහි ය. චක්ඛායතනාදි පස චක්ඛු-සෝත-ඝාණ-ජිව්හා කායවිඤ්ඤාණ සංඛ්‍යාත මනායතනයට තස්සය පුරෙජාත, ඉන්ද්‍රිය, විප්පයුත්ත, අත්‍ථි, අවිගත යන ෂට් ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. එ ද ප්‍රවෘත්තියෙහි ය. **වස්තුරූපය** ඒ පඤ්චවිඤ්ඤාණ හැර සෙසු මනායතනයට නිස්සය, පුරෙජාත, විප්පයුත්ත, අත්‍ථි, අවිගත යන පඤ්චප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. එ ද ප්‍රවෘත්තියෙහි ය. මේ රූපය ෂඩායතනයන්ට ප්‍රත්‍යය වන සැටි යි.

ස්කන්ධත්‍රය වස්තුරූප සංඛ්‍යාත **නාම රූප දෙක මනායතනයට** සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, විපාක, සම්පයුත්ත, විප්පයුත්ත, අත්‍ථි, අවිගතාදි ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. සෙසු තැන් ද මෙසේ සැලකිය යුතු යි.

මේ ඉතා දුර්බොධ ය. සිහි නුවණ උපදවා උගත යුතු යි.

**5 චක්ඛායතනාදි පස චක්ඛුසම්ඵස්සාදි පසට** නිස්සය පුරෙජාත ඉන්ද්‍රිය, විප්පයුත්ත, අත්‍ථි අවිගත යන ෂට් ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. විපාක මනායතනය විපාක මනොඵස්සයට සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, විපාක ආහාර ඉන්ද්‍රිය, සම්පයුත්ත අත්‍ථි අවිගත යන නව ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. බාහිර වූ රූපායතනාදි පස චක්ඛුසම්ඵස්සාදි පසට ආරම්මණ පුරෙජාත, අත්‍ථි, අවිගත යන සිව් ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. ඒ රූපායතනාදි පස ද ධම්මාරම්මණය ද මනොසම්ඵස්සයට ආරම්මණ ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ.

**6 චක්ඛුසම්ඵස්සාදි ඵස්ස පස** පඤ්චද්වාරයෙහි චක්ෂුඃ ප්‍රසාදාදි වස්තුක වූ **පඤ්චවේදනාවන්ට** සහජාත, අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක, ආහාර, සම්පයුත්ත, අත්‍ථි, අවිගත යන අෂ්ට ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. ඒ පස ම එක් එක් ද්වාරයෙහි සෙසු සම්පටිච්ඡන සන්තීරණ තදාරම්මණ වශයෙන් පැවැති කාමාවචර විපාක වේදනාවන්ට උපනිශ්‍රය ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. සහජාත මනොසම්ඵස්ස සංඛ්‍යාත ඵස්සය මනොද්වාරයෙහි තදාරම්මණ වශයෙන් පැවැති කාමාවචර විපාක වේදනාවන්ට මුල දැක්වුණු අෂ්ට ප්‍රත්‍යයෙන්ම ප්‍රත්‍යය වේ. පටිසන්ධි භවඞ්ග චුති වශයෙන් පැවැති ත්‍රෛභූමක විපාක වේදනාවන්ට ද ඒ මනෝසම්ඵස්සය එසේ ම ප්‍රත්‍යය වේ. මනොද්වාරයෙහි තදාරම්මණ වශයෙන් පැවැති කාමාවචර වේදනාවන්ට මනොද්වාරාවර්ජන සම්ප්‍රයුක්ත මනොසම්ඵස්සය උපනිශ්‍රය ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ.

**7 වේදනාව තණ්හාවට** උපනිශ්‍රය ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ.

8. **තණ්හාව කාමුපාදනයට** උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් ද දිට්ඨුපාදානාදි තුනට සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, සම්පයුත්ත, අත්‍ථි, අවිගත, හෙතු යන සප්ත ප්‍රත්‍යයෙන් ද ප්‍රත්‍යය වේ.

9. **උපාදනය භවයට** උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

10. **භවය ජාතියට** කර්ම උපනිශ්‍රය යන ද්වි ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. මෙහි භව නම් කර්ම භවය යි.

11. **ජාති ජරාමරණාදීන්ට** උපනිශ්‍රය ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. මෙය විශුද්ධිමාර්ගය ඇසුරු කොටැ සැකෙවින් ලියන ලදි. විශේෂ විභාග එහි බැලිය යුතු යි.

**ප්‍රශ්න.**

1. අවිද්‍යාව ත්‍රිවිධ සංස්කාරයන්ට කවර කවර පට්ඨාන ප්‍රත්‍යයන්ගෙන් ප්‍රත්‍යය වී ද?
2. සංස්කාර විඥානයට හා භවය ජාතියට කවර කවර ප්‍රත්‍යයන්ගෙන් ප්‍රත්‍යය වී ද?
3. විඥාන නාමරූපයන්ට කවර කවර ප්‍රත්‍යය ලැබැ ප්‍රත්‍යය වී ද?
4. නාම රූපයන්ගෙන් ෂඩායතන වන කල ලැබෙන පට්ඨාන ප්‍රත්‍යය දක්වනු.
5. ෂඩායතන ස්පර්ශයට ද, ස්පර්ශ වේදනාවට ද, වේදනාව තෘෂ්ණාවට ද, තෘෂ්ණාව උපාදානයන්ට ද, උපාදාන භවයට ද ප්‍රත්‍යය වන්නට කවර කවර ප්‍රස්ථාන ප්‍රත්‍යය ලැබිය යුතු ද? ජාති ජරා මරණයන්ට කවර ප්‍රත්‍යය ලැබැ වී ද? සෝකාදිය අවිද්‍යාවට කෙසේ ප්‍රත්‍යය වී ද?

## 19. සූවිසි පට්ඨාන පිළිබඳ ෂඩ්විධ සඞ්ග්‍රහය.

පටිච්චසමුප්පාදයෙහි එක් එක් පටිච්චසමුප්පාදයෙක් එක් එක් පටිච්චසමුප්පන්නයකට මේ මේ පට්ඨාන ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වන්නේ යයි යට පාඩමින් දක්වන ලද්දේ ය. නාම, රූප, ප්‍රඥප්ති සම්බන්ධ වැ ගෙනැ බලන කල්හි 1. නාමය නාමයට ද, 2. නාමය නාමරූපයන්ට ද, 3. නාමය රූපයට ද, 4. රූපය නාමයට ද, 5. ප්‍රඥප්ති නාම රූප නාමයට ද, 6. නාමරූප නාම රූපයන්ට ද කවර කවර පට්ඨාන ප්‍රත්‍යයයන්ගෙන් ප්‍රත්‍යය වන්නේ දැ යි දක්වනු සඳහා මෙය ලියනු ලැබේ.

**1. නාමය නාමයට ෂට් ප්‍රත්‍යයෙකින් ප්‍රත්‍යය වන්නේ ය.**
ඒ මෙසේ යි. නාම නම් වේදනාදි සතර අරූපස්කන්ධය - හෙවත් චිත්ත චෛතසික යි.

අනන්තර නිරුද්ධ චිත්ත චෛතසික ප්‍රත්‍යුත්පන්න චිත්ත චෛතසිකයන්ට **අනන්තර, සමනන්තර, නත්‍ථි, විගත** යන සිව් ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. එක් සිතක් තිබී නැති වූ කල්හිම තව සිතෙක් උපදී. නැති වූ මුල් සිත ඊළඟ උපදින දෙවන සිතට අනන්තර,

සමනන්තර, නත්‍ථි, විගත වශයෙන් ප්‍රත්‍යය වේ. වීථි සිත්හි ද වීථිමුක්ත සිත්හි ද මේ ක්‍රමය මෙසේ මැ යි.

පුරිම ජවන පශ්චිම ජවනයන්ට **ආසෙවන** ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. ජවන නාම ය, හෙවත් චිත්ත චෙතෙසිකය, මෙහි ලා මුල් දැක්වුණු ප්‍රත්‍යය සතර නො ලැබෙති යි නො සිතිය යුතු. එහෙත් මෙහි ආසෙවන විශේෂ ය. ආසෙවන ප්‍රත්‍යය වන්නේ ජවන් පමණෙකි. එහි දු ලෝකෝත්තර ජවන ආසෙවන නො වන බව දත යුතු. මාර්ග ජවන ඵල ජවනයන්ට ආසෙවන නො වෙයි. ඵල ජවන ද මාර්ග ජවනයාගේ ආසෙවන නො ල බයි. භින්න ජාතික ධර්ම අන්‍යොන්‍යයන්ට ආසෙවන දෙන්නට හෝ අන්‍යොන්‍යයන්ගේ ආසෙවන ගන්නට හෝ අසමර්ථ ය. "**ලොකුත්තරො පන ආසෙවනපච්චයො නාම නත්‍ථි**" යනු එහෙයින් කියන ලදි. ගොත්‍රභූ සිත මාර්ග සිතට ආසෙවන ප්‍රත්‍යය වේ. "**ගොත්‍රභූ මග්ගස්ස ආසෙවන පච්චයෙන පච්චෙයා. වොදනං මග්ගස්ස ආසෙවන පච්චයෙන පච්චයො,**" යනු පට්ඨාන යි. ගොත්‍රභූ ලෝකෝත්තර නො වේ. ඵල සිත ද ඵල සිතකට ආසෙවන නො වේ. විපාක සිත් කැල ම ආසෙවන ප්‍රත්‍යය නො වේ. ක්‍රියා සිත්වලින් ආවර්ජනද්වය ආසෙවන ප්‍රත්‍යය නො වේ. ජවන නො වන බැවිනි.

සහජාත චිත්ත චෙතෙසික අන්‍යොන්‍යයන්ට සම්පයුක්ත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. චිත්ත ද නාම ය. චෛතසික ද නාම ය. එය අන්‍යොන්‍යයන්ට සම්ප්‍රයුක්ත ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. රූප සහජාත වුව ද සම්ප්‍රයුක්ත නො වේ.

මෙසේ නාමය නාමයට අනන්තර සමනන්තර, නත්‍ථි විගත, ආසෙවන, සම්ප්‍රයුක්ත යන ෂට්ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වන බව දත යුතු යි.

**2. නාමය නාමරූපයන්ට පඤ්ච ප්‍රත්‍යයයෙකින් ප්‍රත්‍යය වන්නේ ය.** ඒ මෙසේ ය.

හේතු නාමරූපයන්ට **හේතුප්‍රත්‍යයයෙන්** ප්‍රත්‍යය වේ. හේතු නම් ලෝභාදි ෂඩ් හේතු ය. ඒ නාම ය. හේතු තමා හා යෙදුණු චිත්ත චෛතසිකයන්ට හා තත් සමුත්‍ථාන රූපයන්ට ධ්‍යාන ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ.

ඣානඞ්ග 'නාමරූපයන්ට **මාර්ග ප්‍රත්‍යයයෙන්** ප්‍රත්‍යය වේ. ඣානඞ්ග නම් විතර්කාදි ධ්‍යානාඞ්ග සත ය. ඒ ද නාමය ධ්‍යානාඞ්ග තත් සම්ප්‍රයුක්තයන්ට හා තත් සමුත්‍ථාන රූපයන්ට ධ්‍යාන ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ.

මාර්ගාඞ්ග නාම රූපයන්ට **මාර්ගප්‍රත්‍යයයෙන්** ප්‍රත්‍යය වේ. මාර්ගාඞ්ග නම් සම්මාදිට්ඨි ආදි දොළොස ය. ඒ ද නාම ය. මාර්ගාඞ්ග සම්ප්‍රයුක්තයන්ට හා තත් සමුත්‍ථාන රූපයන්ට මාර්ගප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ.

චේතනා නාමරූපයන්ට **කර්මප්‍රත්‍යයයෙන්** ප්‍රත්‍යය වේ. ඒ වනාහි සහජාතචේතනාය, නානාක්‍ෂණික චේතනා ය යි ද්විවිධ වේ. සහජාත චේතනා ද කර්මය යි කිය යුතු සංවිධාන බැවිනි. ඒ සියලු සිත්හි ඇත්තේ ය. ඒ සම්ප්‍රයුක්ත නාමයයන්ට ද තත්

සමුත්ථාන රූපයන්ට ද සහජාත කර්ම ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. නානාක්‍ෂණික චේතනා නම් මතු විපාක සිත් හා කර්මජ රූප නිපදවීමෙහි සමර්ථ වූ චේතනා ය. එය බීජ නිධාන කෘත්‍යය සිද්ධ කෙරේ. කුශලාකුශල සිත්හි පමණක් ඇත්තේ ය. එය කර්මාභිනිර්වෘත්ත නාමරූපයන්ට නානාක්‍ෂණික කර්මප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ.

විපාකස්කන්ධ අන්‍යෝන්‍යයන්ට ද තත්සමුත්ථාන රූපයන්ට ද **විපාකප්‍රත්‍යයයෙන්** ප්‍රත්‍යය වේ. විපාක ද නාමය.

මෙසේ හේතු ආදි නාම නාමරූපයන්ට හේතු, ඣාන, මග්ග, කම්ම, විපාක යන පඤ්චප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වන බව දත යුතුයි.

3. **නාමය රූපයට එක් ප්‍රත්‍යයයෙකින් ප්‍රත්‍යය වන්නේ ය.** ඒ මෙසේ ය. පසු වැ උපදින චිත්ත චෛතසික පූර්ව වැ උපන් මේ කයට පශ්චාජ්ජාත ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. විස්තරය යට කියන ලදි. මෙසේ නාමය රූපයට එක් ප්‍රත්‍යයයෙකින් ප්‍රත්‍යය වන බව දත යුතු යි.

4. **රූපය නාමයට එක් ප්‍රත්‍යයයෙකින් ප්‍රත්‍යය වන්නේ ය.** ඒ මෙසේ ය. චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය, හදය යන වස්තු රූප සය චක්ඛුවිඤ්ඤාණ ධාතු ආදි සත්ත විඤ්ඤාණ ධාතුන්ට පුරෙජාත ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. එසේ ම රූපාදි ආලම්බන පස චක්ඛුවිඤ්ඤාණවීථි ආදි වීථි චිත්තයන්ට පුරෙජාත ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. මෙහි විස්තර ද යට දක්වන ලදි. මෙසේ රූපය නාමයට එක් ප්‍රත්‍යයයෙකින් ප්‍රත්‍යය වන බව දත යුතු යි.

5. **ප්‍රඥප්ති නාමරූප නාමයට ආරම්මණ, උපනිශ්‍රය යන ද්විප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ.**

ප්‍රඥප්ති මතු තෝරා දෙනු ලැබේ. නාම නම් මෙහි චිත්ත චෛතසික ය. රූප නම් යට දැක්වුණු රූප මැ යි. ආරම්මණ ප්‍රත්‍යය යන්නෙහි ආරම්මණ වනාහි රූපාරම්මණාදි වශයෙන් ෂඩ්විධ වේ. උපනිශ්‍රය ප්‍රත්‍යය ද **ආරම්මණූප නිස්සය, අනන්ත රූපනිස්සය, පකතූපනිස්සය** යි ත්‍රිවිධ වේ. ගරුකත ආරම්මණ **ආරම්මණූපනිස්සය** ය. ඒ වනාහි ප්‍රත්‍යවෙක්‍ෂණ වශයෙන් ද ආස්වාදනාදි වශයෙන් ද ගරුකොට ගන්නා ලද ඉෂ්ටාරම්මණය යි. ගරු කොටැ ගැන්ම ද ඒ ඒ සත්ත්වයන්ගේ රුචිය වශයෙනි. ගූථ කුණපාදිය සුනඛ නිල මැසි ආදීන්ට රුචි වේ. එ බැවින් එය ඔවුන්ට ගරුකත ආරම්මණ යි. අනන්තර නිරුද්ධ චිත්ත චෛතසික අනන්තරූපනිස්සය යි. **පකතූපනිස්සය** නම් ප්‍රකර්ෂයෙන් කරන ලද්දෙන් වූ උපනිශ්‍රය යි. නොහොත් ප්‍රකෘතියෙන් අන්‍යයන් හා අමිශ්‍රණයෙන් වූ උපනිශ්‍රය යි. ශ්‍රද්ධාදිය ද රාගාදිය ද, සුඛ, දුඃඛ, පුද්ගල, භොජන, ඍතුසේනාසන ද අධ්‍යාත්මයෙහි හා බාහිරයෙහි කුශලාදීන්ගේ උපත්තියට පකතූපනිස්සය යි. එසේ ම කර්මය විපාකයට පකතූපනිස්සය යි. එහි විශේෂ විභාගයෙක් සැකෙවින් මෙසේ දත යුතු. යට ද සාමාන්‍යයෙන් දැක්විණි.

ශ්‍රද්ධාදිය අධ්‍යාත්මයෙහි හා බාහිරයෙහි කුශලාදීන්ගේ උත්පත්තියට පකතූපනිස්සය යි. ශ්‍රද්ධාදි යන්නෙහි ආදි ශබ්දයෙන් ශීල, ශ්‍රැත, ත්‍යාග, ප්‍රඥාදිය ගන්නේ ය. ශ්‍රද්ධාව නිසා දන් දෙයි, සිල් ගනියි, ධ්‍යානාදිය උපදවයි. මෙහි ශ්‍රද්ධාව කුශලයන්ට උපනිශ්‍රය ප්‍රත්‍යය යි. ශ්‍රද්ධාව නිසා මානය උපදවයි. දෘෂ්ටි ගනියි. මෙහි ශ්‍රද්ධාව අකුශලයන්ට උපනිශ්‍රය ප්‍රත්‍යය යි. ශ්‍රද්ධාව නිසා ශරීරය තවයි, දුක් විඳියි. මෙහි ශ්‍රද්ධාව අව්‍යාකෘතයන්ටත උපනිශ්‍රය ප්‍රත්‍යය යි. ශීලාදිය නිසා ද මෙසේ යි.

රාගාදිය අධ්‍යාත්මයෙහි හා බාහිරයෙහි අකුශලාදීන්ගේ උත්පත්තියට උපනිශ්‍රය ප්‍රත්‍යය යි. රාගාදි යන්නෙහි ආදි ශබ්දයෙන් දෝස, මෝහ, මාන, දිට්ඨි, පත්‍ථනා, දස අකුසල, පඤ්චානන්තරිය ගන්නේ ය. රාගය නිසා සතුන් මරයි. හොරකම් ආදිය කරයි. මෙහි රාගය අකුශලයන්ට උපනිශ්‍රය ප්‍රත්‍යය යි. රාගය නිසා දන් දෙයි. සිල් ගනියි. ධ්‍යානාදිය උපදවයි. මෙහි රාගය කුශලයන්ට උපනිශ්‍රය යි. රාගය නිසා ශරීරය තවයි, දුක් විඳියි. මෙහි රාගය අව්‍යාකෘතයන්ට උපනිශ්‍රය යි.

සුඛ, දුඃඛාදිය ද අධ්‍යාත්මයෙහි හා බාහිරයෙහි කුශලාදීන්ට උපනිශ්‍රය ප්‍රත්‍යය යි. කායික සුඛය නිසා දන් දෙයි, සිල් ගනියි, ධ්‍යානාදිය උපදවයි. මෙහි සුඛය කුශලයන්ට උපනිශ්‍රය ප්‍රත්‍යය යි. ඒ සුඛය නිසා ප්‍රාණඝාත කරයි. සොරකම් ආදිය කරයි. මෙහි සුඛය අකුශලයන්ට උපනිශ්‍රය ප්‍රත්‍යය යි. දුඃඛාදිය නිසා ද මෙසේ ය.

බලවත් වූ කර්මය විපාකයට උපනිශ්‍රය ප්‍රත්‍යය යි. මේ සියල්ල පකතූපනිස්සය බව දත යුතු. උපනිශ්‍රය ප්‍රත්‍යය ඉතා විස්තර ය. මෙයට ප්‍රත්‍යයොපදේශය යි කියනු ලැබේ. විස්තර **පට්ඨාන පඤ්හවාරයෙහි** බලනු.

**ප්‍රශ්න.**

1. නාමය නාමයට ප්‍රත්‍යය වන ෂට් ආකාරය ලියති.
2. නාමය නාමරූපයන්ට ප්‍රත්‍යය වන පස් ආකාරය දක්වනු.
3. නාමය රූපයට ප්‍රත්‍යය වන ආකාරය ලියනු.
4. රූපය නාමයට ප්‍රත්‍යය වන ආකාරය ලියනු.
5. ප්‍රඥප්ති නාම රූප නාමයට ප්‍රත්‍යය වන දෙ ආකාරය ලියා උපනිශ්‍රය ප්‍රත්‍යය පිළිබඳ විස්තරයක් දක්වනු.

## 20. සූවිසි පට්ඨාන පිළිබඳ ෂඩ්විධ සංග්‍රහ (දෙවන කොටස)

6. **නාමරූප නාමරූපයන්ට අධිපති, සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, ආහාර, ඉන්ද්‍රිය, විප්පයුත්ත, අත්‍ථි, අවිගත යන නව ප්‍රත්‍යයයෙන් සුදුසු පරිදි ප්‍රත්‍යය වන්නේ ය.** මෙහි සුදුසු පරිදි යනු විශේෂයෙන් සිහි කටයුතු යි. වෙන් වෙන් වැ දැක්වූ කල්හි තේරුම් ගැනීම පහසු බැවින් එසේ දක්වනු ලැබේ.

නාමරූප නාමරූපයන්ට අධිපති ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. අධිපති ප්‍රත්‍යය යට දක්වන ලදි. මෙහි තව ද ස්වල්පයෙක් දක්වනු ලැබේ. අධිපති වනාහි ආලම්බනාධිපති සහජාතාධිපති ය යි දෙ වැදෑරුම්. ගරු කත ආලම්බන ආලම්බනාධිපතිය. එය නාමයට පමණක් ප්‍රත්‍යය වේ. කුශල, අකුශල, අව්‍යාකෘත කුශලාදීන්ට ආලම්බනාධිපති ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වන සැටි බලනු. දන් දී, සිල් සමාදන් වැ ඒ දානාදිය ගරු කොටැ අරමුණු කරන විට ද, පෙර කළ පින් ගරු කොටැ අරමුණු කරන විට ද, ධ්‍යානයෙන් නැඟී ඒ ධ්‍යාන ගරු කොටැ අරමුණු කරන විට ද, ශෛක්‍ෂයන් ගොත්‍රභූ වොදාන ගරු කොට අරමුණු කරන විට ද කුශල කුශලයන්ට ආලම්බනාධිපති ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. දන් දීම් ආදිය කොටැ ඒ ගරු කොටැ ගෙන ආස්වාදන අභිනන්‍දන, රාගාදිය උපදවන විට කුශල අකුශලයන්ට ආලම්බනාධිපති ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. රහතන් මාර්ගයෙන් නැඟී ඒ මාර්ගය ගරු කොටැ අරමුණු කරන විට කුශල අව්‍යාකෘතයන්ට ආලම්බනාධිපති ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. අකුශලාදීන්ට ආලම්බනාධිපති වන සැටි ද මේ නියායෙන් සලකනු. සහජාත වූ ඡන්‍දාදි අධිපති ධර්ම සතර සහජාත වූ නාමරූපයන්ට සහජාත අධිපති ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. විස්තර යට දක්වන ලදි. මෙසේ නාමරූප නාමරූපයන්ට අධිපති ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ.

නාමරූප නාමරූපයන්ට සුදුසු පරිදි සහජාත ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. සහජාත ප්‍රත්‍යය යට දක්වන ලදි. චිත්ත චෛතසික අන්‍යොන්‍යයන්ට හා සහජාත රූපයන්ට ද, මහාභූත අන්‍යොන්‍යයන්ට හා උපාදාරූපයන්ට ද ප්‍රතිසන්ධි ක්‍ෂණයෙහි වස්තු විපාක අන්‍යොන්‍යයන්ට ද සහජාත ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. මෙයින් සහජාත ත්‍රිවිධ වූ සැටි ද සලකනු.

නාමරූප නාමරූපයන්ට සුදුසු පරිදි අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය ද යට දක්වන ලදි. චිත්ත චෛතසික අන්‍යොන්‍යයන්ට ද, මහා භූත අන්‍යොන්‍යයන්ට ද, වස්තු විපාක අන්‍යොන්‍යයන්ට ද අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. මෙයින් එය ත්‍රිවිධ වූ සැටි ද සලකනු.

නාමරූප නාමරූපයන්ට සුදුසු පරිදි නිස්සය ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. නිස්සය ප්‍රත්‍යය ද යට දක්වන ලදි. චිත්ත චෛතසික අන්‍යොන්‍යයන්ට හා සහජාත රූපයන්ට ද මහාභූත අන්‍යොන්‍යයන්ට හා උපාදාරූපයන්ට ද, චක්‍ෂුරාදි වස්තු සය චක්ඛුවිඤ්ඤාණාදී සප්ත විඥාන ධාතුන්ට ද, නිස්සය ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. මෙයින් එ ද ත්‍රිවිධ වූ සැටි සලකනු.

නාමරූප නාමරූපයන්ට සුදුසු පරිදි ආහාර ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. ආහාර ප්‍රත්‍යය ද යට දක්වන ලදි. කබලීකාරාහාර මේ කයට ද ඵස්සාදි අරූපාහාර තුන සහජාත නාමරූපයන්ට ද ආහාර ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. මෙයින් ආහාර ප්‍රත්‍යය ද්විවිධ වූ සැටි සලකනු.

නාමරූප නාමරූපයන්ට සුදුසු පරිදි ඉන්ද්‍රිය ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. ඉන්‍ද්‍රිය ප්‍රත්‍යය ද යට දක්වන ලදි. චක්ඛුන්‍ද්‍රියාදි ඉන්‍ද්‍රිය පස චක්ඛුවිඤ්ඤාණාදි දෙපස්විඤ්ඤාණයන්ට ද රූප

ජීවිතින්‍ද්‍රිය කර්මජ රූපයන්ට ද, මනින්‍ද්‍රියාදි අරූප ඉන්‍ද්‍රිය සහජාත නාමරූපයන්ට ද ඉන්‍ද්‍රිය ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. මෙයින් ඉන්‍ද්‍රිය ප්‍රත්‍යය ත්‍රිවිධ වූ සැටි ද සලකනු.

**නාමරූප නාමරූපයන්ට සුදුසු පරිදි විප්‍රයුක්ත ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ.** විප්‍රයුක්ත ප්‍රත්‍යය ද යට දක්වන ලදි. ප්‍රතිසන්‍ධි ක්‍ෂණයෙහි හෘදය වස්තුව විපාකයන්ට සහජාත විප්‍රයුක්ත වශයෙන් ද, චිත්ත චෛතසික සහජාත රූපයන්ට සහජාත විප්‍රයුක්ත වශයෙන් හා ඒ චිත්ත චෛතසික පළමු පහළ වූ මේ කයට පච්ඡාජාත විප්‍රයුක්ත වශයෙන් ද චක්‍ෂුරාදි වස්තු සය ප්‍රවෘත්ති කාලයෙහි චක්ඛුවිඤ්ඤාණාදි සප්ත විඥානයන්ට පුරෙජාත විප්‍රයුක්ත වශයෙන් ද ප්‍රත්‍යය වේ. මෙයින් විප්‍රයුක්ත ප්‍රත්‍යය සහජාත විප්‍රයුක්ත, පුරෙජාත විප්‍රයුක්ත, පශ්වාජ්ජාත විප්‍රයුක්ත වශයෙන් ත්‍රිවිධ වූ සැටි ද සලකනු.

**නාමරූප නාමරූපයන්ට සුදුසු පරිදි අස්ති ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ.** අස්ති ප්‍රත්‍යය ද යට දක්වන ලදි. ඒ වනාහි සහජාත අස්ති, පුරෙජාත අස්ති, පච්ඡාජාත අස්ති, ආහාර අස්ති, ඉන්ද්‍රිය අස්ති ය යි පඤ්චවිධ වේ. සහජාත අස්තිය ද සහජාත ප්‍රත්‍යයට කී පරිදි තුන් ආකාර යි. එක් වැ හටගැනීම් වශයෙන් ඇත්තේ ය යනු එහි අර්ථ යි. පුරෙජාත අස්ති ද පුරෙජාත ප්‍රත්‍යයට කී පරිදි දෙ ආකාර යි. පළමු උපදීම් වශයෙන් ඇත්තේ ය යනු එහි අර්ථ යි. පච්ඡාජාත අස්ති ද පශ්වාජ්ජාත ප්‍රත්‍යයට කී පරිදි එක විධ ය. පසු වැ හටගැනීම් වශයෙන් ඇත්තේ ය යනු එහි අර්ථ යි. ආහාර අස්ති යන්නෙන් කබලීකාරාහාර ගන්නේ ය. "**කබලීකාරො ආහාරො ඉමස්ස කායස්ස අත්‍ථිපච්චයෙන පච්චයො**" යනු පට්ඨාන යි. ඉන්ද්‍රිය අස්ති යන්නෙන් රූප ජීවිතින්ද්‍රිය ගන්නේ ය. "**රූපජීවිතින්ද්‍රියං කටත්තා රූපානං අත්‍ථිපච්චයෙන පච්චයො**" යනු පට්ඨාන යි. ඒ දෙක ද එකවිට ය. විස්තර **පට්ඨාන පඤ්හවාරයෙහි** ය. සිහියෙන් සලකා උගත යුතු යි.

**නාමරූප නාමරූපයන්ට අවිගත ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ.** එ ද යට දැක්විණි. සහජාත අවිගත, පුරෙජාත අවිගත, පච්ඡාජාත අවිගත, ආහාර අවිගත, ඉන්ද්‍රිය අවිගත යයි අවිගත ප්‍රත්‍යය ද පඤ්චවිධ වේ. සියල්ල අස්ති ප්‍රත්‍යය බඳු යි.

"**සහජාතං පුරෙජාතං පච්ඡාජාතං ච සබ්බථා
කබලීකාරො ආහාරො රූපජීවිතමිච්චයං
පංචවිධො හොති අත්‍ථිපච්චයො ච අවිගතපච්චයො ච.**"

යනු සඞ්ග්‍රහ ගාථා යි.

මෙසේ නාමරූප නාමරූපයන්ට අධිපති සහජාතාදි නව ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වන්නේ යි.

"**ඡද්ධා නාමං තු නාමස්ස පංචධා නාමරූපිනං
එකධා පුන රූපස්ස රූපං නාමස්ස චෙකධා
පඤ්ඤත්ති නාමරූපානි නාමස්ස දුවිධා ද්වයං
ද්වයස්ස නවධා චෙති ඡබ්බිධා පච්චයා කථං**"

යනු සංග්‍රහ යි.

නාමය නාමයට ස ආකාරයෙකින් ද, නාමය නාමරූපයන්ට පස් ආකාරයෙකින් ද, නාමය රූපයට එක් ආකාරයෙකින් ද, රූපය නාමයට එක් ආකාරයෙකින් ද පඤ්ඤත්ති නාමරූප නාමරූප නාමයට දෙ ආකාරයෙකින් ද නාමරූප නාමරූපයන්ට නවාකාරයෙකින් ද ප්‍රත්‍යය වේ. මෙයින් ප්‍රත්‍යය ක්‍රම ෂඩ්විධ විය. මේ පාඩම් දෙකින් දැක්වුණේ මේ බව දත යුතුයි.

**ප්‍රශ්න.**

1. නාමරූප නාමරූපයන්ට කෙතෙක් ප්‍රත්‍යයන්ගෙන් ප්‍රත්‍යය වේ ද? ඒ කවරහු ද?
2. නාමරූප නාමරූපයන්ට අධිපති, සහජාත, අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යයන්ගෙන් ප්‍රත්‍යය වන සැටි දක්වනු.
3. නාමරූප නාමරූපයන්ට නිස්සය, ආහාර, ඉන්ද්‍රිය ප්‍රත්‍යයන්ගෙන් ප්‍රත්‍යය වන සැටි දක්වනු.
4. නාමරූප නාමරූපයන්ට විප්පයුත්ත අත්‍ථි, අවිගත ප්‍රත්‍යයන්ගෙන් ප්‍රත්‍යය වන සැටි දක්වනු.
5. ෂඩ්විධ සංග්‍රහ ගාථා ලියනු.

## 21. පට්ඨාන ප්‍රත්‍යය සංග්‍රහ.

නාමාදිය නාමාදියට ස ආකාරයෙකින් ප්‍රත්‍යය වන සැටි යට පාඩම් දෙකින් දක්වන ලද්දේ ය. සූවිසි පට්ඨාන ප්‍රත්‍යය එහිම ප්‍රත්‍යය සතරෙක ඇතුළත් වන සැටි මෙහි දක්වනු ලැබේ.

**ආරම්මණ ප්‍රත්‍යය, උපනිශ්‍රය ප්‍රත්‍යය, කර්මප්‍රත්‍යය, අස්ති ප්‍රත්‍යය යන මේ සතර ප්‍රත්‍යයෙහි සියලු පට්ඨාන ප්‍රත්‍යය ඇතුළත් වන්නේ ය.** ඒ මෙසේ ය.

අධිපතිප්‍රත්‍යය ආරම්මණාධිපති, සහජාතාධිපතිය යි ද්විවිධය. ඉන් ආරම්මණාධිපති කර්මප්‍රත්‍යය හැර සෙසු තුන් ප්‍රත්‍යයෙහි ඇතුළත් වේ. ආරම්මණ ප්‍රත්‍යය පවා කර්ම ප්‍රත්‍යයෙහි ඇතුළත් නො වන බව ද ආරම්මණාධිපති කැල ම එහි ඇතුළත් නො විය හැකි බව ද **ටීකාවෙක** දක්වයි. සහජාතාධිපති අස්තිප්‍රත්‍යයෙහි ඇතුළති.

නිශ්‍රය ප්‍රත්‍යය සහජාත, වස්තු පුරෙජාත, වත්‍ථාරම්මණ පුරෙජාතය යි ත්‍රිවිධ ය. ඉන් සහජාත, වස්තුපුරෙජාත නිශ්‍රය ප්‍රත්‍යය දෙක අස්ති ප්‍රත්‍යයෙහි ඇතුළති. වත්‍ථාරම්මණ නිස්සය වනාහි ආරම්මණ අස්ති යන ප්‍රත්‍යය දෙකෙහි ඇතුළති. එ ද ඉදින් ගරුකත නම් උපනිශ්‍රය ප්‍රත්‍යයෙහි ඇතුළති.

පුරෙජාත ප්‍රත්‍යය ද ආරම්මණ පුරෙජාත, වස්තුපුරෙජාත, වත්‍ථාරම්මණ පුරෙජාතය යි ත්‍රිවිධ ය. ඉන් වස්තුපුරෙජාත අස්තිප්‍රත්‍යයයෙහි ද සෙසු දෙක ආරම්මණ අස්ති යන ප්‍රත්‍යය දෙකෙහි ද ඒ දෙක ද ඉදින් ගරුකත නම් උපනිශ්‍රය ප්‍රත්‍යයයෙහි ද ඇතුළති.

කර්මප්‍රත්‍යය සහජාතකර්ම, නානාක්‍ෂණික කර්මය යි ද්විවිධ ය. ඉන් සහජාත කර්මප්‍රත්‍යය අස්තිප්‍රත්‍යයයෙහි ඇතුළති. නානාක්‍ෂණික කර්ම ප්‍රත්‍යය බලවත් ය. දූර්වලය යි ද්විවිධ ය. ඉන් බලවත් නානාක්‍ෂණික කර්මප්‍රත්‍යය උපනිශ්‍රය ප්‍රත්‍යයයෙහි ද, දූර්වල නානාක්‍ෂණික කර්මප්‍රත්‍යය කර්ම ප්‍රත්‍යයයෙහි ද ඇතුළති.

සියලු ආහාර ප්‍රත්‍යය ද, සියලු ඉන්ද්‍රිය ප්‍රත්‍යය ද අස්ති ප්‍රත්‍යයෙහි ඇතුළති.

විප්‍රයුක්ත ප්‍රත්‍යය සහජාත, වස්තුපුරෙජාත, වත්‍ථාරම්මණ පුරෙජාත, පච්ඡාජාතය යි චතුර්විධ ය. ඉන් මුල් දෙක හා අන්තිම එක අස්තිප්‍රත්‍යයයෙහි ඇතුළති. වත්‍ථාරම්මණ පුරෙජාත විප්‍රයුක්ත ප්‍රත්‍යය වනාහි ආරම්මණ, අස්ති යන ප්‍රත්‍යය දෙක්හි ඇතුළති. එ ද ඉදින් ගරුකත නම් උපනිශ්‍රය ප්‍රත්‍යයයෙහි ය.

සෙසු සතළොස් ප්‍රත්‍යය අතුරෙන් හේතු, සහජාත, අඤ්ඤමඤ්ඤ, විපාක, ඣාන, මග්ග, සම්පයුත්ත, අවිගත, පච්ඡාජාත යන ප්‍රත්‍ය නවය අස්තිප්‍රත්‍යයයෙහි ඇතුළති. අනන්තර, සමනන්තර, අසෙවන, නත්‍ථි, විගත යන පඤ්ච ප්‍රත්‍යය උපනිශ්‍රය ප්‍රත්‍යයයෙහි ඇතුළති.

මෙසේ සියලු පට්ඨාන ප්‍රත්‍යය සභාග සඞ්ග්‍රහ වශයෙන් මේ ආරම්මණාදි චතුඃප්‍රත්‍යයයෙහි ඇතුළත් වන බව දත යුතුයි. **පරමත්‍ථදීපනීටීකාව** ඇසුරු කොට මේ ලියන ලදි. විභාවිණියෙහි දැක්වුණු ක්‍රමය මතිමාත්‍රය යි ද යුක්තියුක්ත නො වේ යයි ද එහි කියයි.

තව ද කිය යුත්තෙක් ඇත. යට දැක්වුණු සියලු තන්හි ම සහජාතරූපය යි කීයේ ප්‍රවෘත්ති කාලයෙහි ලා චිත්තජරූපයන් ට ය. ප්‍රතිසන්ධිකාලයෙහි ලා කර්මජරූපයන්ට ය. එ බැවින් සහජාත රූප චිත්තජ කර්මජ වශයෙන් දෙවැදෑරුම් වන බව දත යුතු.

එහි දු කර්මජ රූප නැති තැන චිත්තජරූප නො ලැබේ. කර්මජ රූප ඇති තන්හි ම චිත්ත චිත්තජ රූප උපදවීමෙහි සමර්ථය. අරූපභවයෙහි රූපජනන ශක්ති ඇති කාමාවචර සිත් ඉපදුණ ද ඒ චිත්තජ රූප නූපදවයි. එහි කර්මජරූප කැලම නැත.

තව ද මේ සූවිසි පට්ඨාන ප්‍රත්‍යයයෝ ලැබෙන ලැබෙන පරිදි ත්‍රෛකාලික වශයෙන් ද, කාලමුක්ත වශයෙන් ද, ආධ්‍යාත්මික වශයෙන් ද, බාහිර වශයෙන් ද, සංඛත වශයෙන් ද අසංඛත වශයෙන් ද බෙදත හැකි ය. එසේ බෙදුණු ඔව්හු ප්‍රඥප්ති, නාම, රූපය යි තුන් කොටසකට ඇතුළත් වෙති ඒ මෙසේ ය.

ආරම්මණ, අධිපති, උපනිස්සය යන ප්‍රත්‍යය තුන ත්‍රෛකාලික හා කාලමුක්ත ය. කර්මප්‍රත්‍ය වර්තමානකාලික හා අතීතකාලික ය. අනන්තර, සමනන්තර, ආසෙවන නත්‍ථි, විගත යන ප්‍රත්‍යය පස අතීතකාලික ය. සෙසු පසළොස වර්තමාන කාලික යි.

ආරම්මණ අධිපති, සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, උපනිස්සය, පුරෙජාත, ආහාර, අත්‍ථි, අවිගත යන ප්‍රත්‍යයයෝ ආධ්‍යාත්මික ද බාහිර ද වෙති. සෙසු තුදුස ආධ්‍යාත්මික ම වේ.

ආරම්මණ, අධිපති, උපනිස්සය යන ප්‍රත්‍යය තුන සංඛත ද අසංඛත ද වේ. සෙස්ස සංඛත මැ යි. මේ තෝරා ගැන්ම සිහි නුවණ එළවා බලන කල්හි අපහසු නො වේ. එහෙයින් විස්තර නො කරන ලදි.

මෙසේ කාලික, කාලමුක්ත, ආධ්‍යාත්මික, බාහිර, සංඛත, අසංඛත වශයෙන් බෙදුණු සූවිසි ප්‍රත්‍යය ධර්ම ප්‍රඥප්ති, නාම රූප යන තුන් කොටසට ඇතුළත් වේ. එහි රූප නම් රූපස්කන්‍ධ ය. නාම නම් චිත්තචෛතසික සංඛ්‍යාත සතර අරූපස්කන්‍ධ හා නිර්වාණය ය. ඒ නාම අරූපය යි ද කියනු ලැබේ. නිර්වාණය මෙහි නාමය යි ගන්නා ලද බව දත යුතු. ඒ නාමරූප දෙකින් අවශිෂ්ට වූයේ ප්‍රඥප්ති ය. ප්‍රඥප්ති මීළඟ පාඩමෙන් දැක්වේ.

**"ඉති තෙකාලිකා ධම්මා කාලමුත්තා ච සම්භවා**
**අජ්ඣත්තං ච බහිද්ධා ච සංඛතා සංඛතා තථා**
**පඤ්ඤත්ති නාමරූපානං වසෙන තිවිධා ඨිතා**
**පච්චයා නාම පට්ඨානෙ චතුවීසති සබ්බථා."**

අර්ථ යට දක්වන ලදි.

**ප්‍රශ්න.**

1. සූවිසි ප්‍රත්‍යය කවර සතර ප්‍රත්‍යයයෙහි ඇතුළත් ද?
2. ආරම්මණ ප්‍රත්‍යයයෙහි ඇතුළත් වන ප්‍රත්‍යය දක්වනු.
3. උපනිස්සය, කර්ම, අස්ති ප්‍රත්‍යයන්හි ඇතුළත් වන ප්‍රත්‍යය දක්වනු.
4. කාල, කාලමුක්ත, ආධ්‍යාත්මික, බාහිර, සංඛත, අසංඛත ප්‍රත්‍යය මේ මේ ය යි දක්වනු.
5. ප්‍රඥප්ති, නාම රූප යන්නෙහි නාම, රූප මේ මේ යයි දක්වනු. නිර්වාණය කුමක් හෙයින් නාමයෙහි ඇතුළත් විණි ද?

## 22. ප්‍රඥප්ති.

සම්මුතිය, පරමාර්ථය යි ධර්ම ද්විවිධ ය. පරමාර්ථ යට දක්වන ලදි. ඒ වනාහි නාම, රූප, චිත්ත, චෛතසික, රූප, නිර්වාණ, රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ, චක්ඛාදි ආයතන, චක්ඛාදි ධාතු ආදි වශයෙන් දක්වන ලද්දේ ය. සම්මුති නම් ප්‍රඥප්ති ය.

ප්‍රඥප්ති යන්නෙන් පනවනු ලබන දේද, පනවන නම් ද ගනු ලැබේ. එයින් එය අර්ථ ප්‍රඥප්තිය නාම ප්‍රඥප්ති ය යි ද්විවිධ වන බව දත යුතු. අර්ථ ප්‍රඥප්ති නම් පරමාර්ථ

වශයෙන් බලන කල්හි නැතැයි කිය යුතු වූ එහෙත් ඒ පරමාර්ථයන්ගේ ම ඡායාකාරයෙන් සිතට අරමුණු වන්නා වූ දේ ය. එය ඒ ඒ ආකාර වශයෙන් සලකා එසේ ගණන් ගනු ලැබේ. එබැවින් එයට සංඛාය යි කියති. එසේ දන්නා ලැබේ. එබැවින් එයට **සමඤ්ඤය** යි කියති. එසේ ව්‍යවහාර කරනු ලැබේ. එබැවින් එයට **වොහාරය** යි කියති. එසේ පනවනු ලැබේ යන අර්ථයෙන් **පඤ්ඤත්තිය** යි කියත්.

ඒ පඤ්ඤත්ති වනාහි සමූහ පඤ්ඤත්ති, සණ්ඨාන පඤ්ඤත්ති, සත්ත පඤ්ඤත්ති, දිසාපඤ්ඤත්ති, කාලපඤ්ඤත්ති, ආකාසපඤ්ඤත්ති, නිමිත්ත පඤ්ඤත්ති ආදි වශයෙන් නානාවිධ ය.

පෘථිවි ආදි මහාභූතයන්ගේ පැතිරීම්, ඝන ආදි භෙද ඇති ඒ ඒ විශේෂාකාර ගෙනැ ව්‍යවහාර කරනු ලබන්නේ සමූහපඤ්ඤත්තිය, පෘථිවි, පර්වත, නදී, සාගර යනාදිය මෙනි.

දර මැටි වැල් ආදි උපකරණයන්ගේ සටහන් ආකාරය ගෙනැ ව්‍යවහාර කරනු ලබන්නේ **සණ්ඨානපඤ්ඤත්තිය** රථ, සකට, සට පට ආදිය මෙනි.

හේතු ඵල පරම්පරා වශයෙන් පවත්නා විඤ්ඤත්ති ඉන්ද්‍රිය සහිත ස්කන්ධපඤ්චකය ගෙනැ ව්‍යවහාර කරනු ලබන්නේ **සත්තපඤ්ඤත්තිය** පුරුෂ, පුද්ගල, දිව්‍ය, මනුෂ්‍ය ආදිය මෙනි.

චන්ද්‍රසූර්යයන්ගේ උදාවීම් ආදිය ගෙනැ දිසාපඤ්ඤත්ති ලැබේ. පූර්වදිශා පශ්චිමදිසා ආදිය මෙනි. සූර්යයා උදාවූ කල්හි දවස පිළිබඳ පූර්වභාගාදිය ගෙනැ **කාලපඤ්ඤත්තිය** ලැබේ. පූර්වාහ්න, මධ්‍යාහ්න ආදිය මෙනි.

ඒ ඒ රූපකලාපයන්ගේ අසම්ඵුට්ඨාකාරය ගෙනැ **ආකාස පඤ්ඤත්තිය** ලැබේ. කූප, ගුහාදිය මෙනි.

ඒ ඒ කාසිණමණ්ඩල ස්වභාවාදි භෙද ඇති මහාභූත නිමිති ද පරිකර්මාදි භෙද ඇති භාවනා විශේෂ ද ගෙනැ **නිමිත්තපඤ්ඤත්ති** ලැබේ. පරිකර්ම නිමිත්ත, උද්ග්‍රහනිමිත්ත ආදිය මෙනි. මේ ය අර්ථ ප්‍රඥප්ති නම්,

නාම ප්‍රඥප්ති නම් පරමාර්ථයන්ට හෝ ඒ අර්ථ ප්‍රඥප්තියට හෝ පනවන නම් ය. එය නාම, නාමකර්ම, නාමධෙය, නිරුක්ති, ඛ්‍යඤ්ජන, අභිලාප යන නම් වලින් ද හඳුන්වනු ලැබේ. එසේ පනවන්ෙන් ය යන අර්ථයෙන් පඤ්ඤත්තිය යි ද කියනු ලැබේ. එ ද **විද්‍යමාන ප්‍රඥප්ති, අවිද්‍යමාන ප්‍රඥප්ති, විද්‍යමානයෙන් අවිද්‍යමාන ප්‍රඥප්ති, අවිද්‍යමානයෙන්, විද්‍යමාන ප්‍රඥප්ති, විද්‍යමානයෙන් විද්‍යමාන ප්‍රඥප්ති අවිද්‍යමානයෙන් අවිද්‍යමාන ප්‍රඥප්තිය** යි ෂඩ්විධ වේ.

පරමාර්ථ වශයෙන් රූප වෙදනාදිය ඇත්තේ ය. ඒ ඇත්තා වූ ම රූප වේදනාදියට රූප වේදනා ආදිය යි කියති. ඒ **විද්‍යමාන ප්‍රඥප්ති** යි.

පරමාර්ථ වශයෙන් භූමි පර්වතාදිය නැත්තේ ය. නැත්තා වූ භූමිපර්වතාදියට භූතවිශේෂාකාරය ගෙනැ භූමිපර්වතාදිය යි කියති. ඒ **අවිද්‍යමාන ප්‍රඥප්ති** යි.

ෂට් අභිඥා ලාභියෙකුට ෂඩභිඥ ය යි කියනු ලැබේ. පරමාර්ථ වශයෙන් අභිඥා ඇත්තේ ය. ඒ ලාභි පුද්ගලයෙක් යයි කිය යුත්තෙක් නැත්තේ ය. එහෙත් එබන්දකුට ෂඩභිඥය යි කියති. ඒ **විද්‍යමානයෙන් අවිද්‍යමාන ප්‍රඥප්ති** යි.

ස්ත්‍රීශබ්දය යි කී කල්හි පරමාර්ථවශයෙන් ස්ත්‍රියක් නැත. ශබ්දයෙක් නම් නැත. මෙය **අවිද්‍යමානයෙන් විද්‍යමාන ප්‍රඥප්ති** යි.

චක්ෂුර් විඥානය යි කී කල්හි පරමාර්ථ වශයෙන් චක්‍ෂු ද ඇත්තේ ය. විඥාන ද ඇත්තේ ය. එ බැවින් එය **විද්‍යමානයෙන් විද්‍යමාන ප්‍රඥප්ති** යි.

රාජ පුත්‍රය යි කී කල්හි පරමාර්ථ වශයෙන් රාජයෙක් ද නැත්තේ ය. පුත්‍රයෙක් ද නැත්තේ ය. එ බැවින් එය **අවිද්‍යමානයෙන් අවිද්‍යමාන ප්‍රඥප්ති** යි.

නාමපඤ්ඤත්තිය මේ ගාථායෙන් පැහැදිලි කරනු ලැබේ.

**"වචීඝොසානුසාරෙන සොත විඤ්ඤණවීථියා**
**පවත්තානන්තරුප්පන්න මනොද්වාරස්ස ගොචරා**
**අත්‍ථා යස්සානුසාරෙන විඤ්ඤයන්ති තතොපරං**
**සායං පඤ්ඤත්ති විඤ්ඤෙය්‍යා ලොකසඞ්කෙත නිම්මිතා"**

රූප, වේදනා, භූමි, පර්වත යනාදි ශබ්ද ඇසීමෙන් ඇති වන සොතවිඤ්ඤාණ වීථි ප්‍රවෘත්තියට අනතුරු වැ උපදින මනොද්වාර වීථියට අරමුණු වන අර්ථයෝ එයින් මතු යම් ප්‍රඥප්තියෙක අනුසාරයෙන් දැනගනු ලැබෙත් ද ලෝක සඞ්කෙත නිර්මිත ව එය (නාම) ප්‍රඥප්තිය යි දත යුතු යනු එහි අර්ථ යි.

ප්‍රඥප්ති අවබෝධයට පහසු බැවින් සංක්‍ෂෙප කරන ලදි.

**ප්‍රශ්න.**

1. ප්‍රඥප්ති යනු කිම? ඒ කී වැදැරුම් ද?
2. අර්ථ ප්‍රඥප්ති කීපයක් දක්වා උදාහරණ දෙනු.
3. නාමප්‍රඥප්ති කී වැදැරුම් ද? ඒ කවරේ ද?
4. වේදනා, පර්වත, ෂඩභිඥ මේ කවර ප්‍රඥප්තිවලට ඇතුළත් ද?
5. ප්‍රඥප්ති ප්‍රකාශක ගාථා ලියා අර්ථ පැහැදිලි කරනු.

**පටිච්චසමුප්පාදය** නානා නයයෙන් ප්‍රතිමණ්ඩිත ය. මහා සමුද්‍රය මෙන් ගම්භීර ය. අර්ථකථාචාර්ය බුද්ධඝෝෂ ස්වාමි මෙයට අටුවා ලියන්නට ගොස්, "මම මහමුහුදෙහි

වැටුණකු මෙන් ප්‍රතිෂ්ඨා නො ලදිමි”යි කීයේ ය. මෙහි දක්වන ලද්දේ දිඞ්මාත්‍රයෙකි. විශේෂ විභාග ආචාර්ය මුඛයෙන් හා ග්‍රන්ථාන්තරයෙන් උගත යුතු යි.

**පූජ්‍ය පණ්ඩිත මාතර ශ්‍රී ධර්මවංශ ස්වාමීන්ද්‍රයන් කළ අභිධර්මචන්ද්‍රිකාවේ පටිච්චසමුප්පාද පාදයයි.**

# නවවන කර්මස්ථාන පාදය.

**නමො භගවතො සම්බුද්ධස්ස.**

## 1. සමථ භාවනා හා විදර්ශනා භාවනා.

චිත්තපාදාදි යට පරිච්ඡෙද අටින් නාමරූපාදීන් පිළිබඳ විශේෂ විස්තර දක්වන ලද්දේ ය. ධ්‍යාන අභිඥා ලබා සමෘද්ධිමත් වනු කැමැත්තවුන් විසින් ද මාර්ග ඵල ලබා සමාධිමත් වනු කැමැත්තවුන් විසින් ද මාර්ග ඵල ලබා නිවන් අවබෝධ කරනු කැමැත්තවුන් විසින් ද ඒ නාමරූපාදීන් අතුරෙන් කිසිවක් අරමුණු කොට ගෙනැ භාවනා කළ යුතු ය. භාවනා නම් වැඩීමය-නැවත නැවත සිහිකිරීම ය. ඒ භාවනා පිළිබඳ විශේෂ විභාග **කර්මස්ථාන පාදය** යන නමින් මෙහි දක්වනු ලැබේ.

භාවනා වනාහි **සමථ භාවනා විදර්ශනා භාවනා** ය යි ද්විවිධ වේ. **සමථ භාවනා** නම් කාමච්ඡන්දාදි කෙලෙස් හෝ විතර්කාදි ඖදාරික ධර්ම හෝ සන්සිඳුවන භාවනා ය. සමථ යන්නෙන් එකාග්‍රතා සංඛ්‍යාත සමාධිය කියවෙන බව දත යුතු. ඒ සමථ භාවනායෙන් ධ්‍යාන අභිඥා ලද හැකි ය. **විදර්ශනා භාවනා** නම් විශේෂයෙන් බලන භාවනා ය. විශේෂයෙන් බැලීම නම් සාමාන්‍ය ලෝකයා සේ පඤ්ච ස්කන්ධාදිය ස්ත්‍රී පුරුෂාදි වශයෙන් හෝ නිත්‍ය, සුඛ, ආත්ම වශයෙන් හෝ නො බලා ස්කන්ධාදි වශයෙන් ද, අනිත්‍ය, දුඃඛ, අනාත්ම වශයෙන් ද බැලීම ය. විදර්ශනා යන්නෙන් ප්‍රඥාව කියවෙන බව දත යුතු. ඒ විදර්ශනා භාවනායෙන් නිවන් ලද හැකි ය.

සමථ හෝ විදර්ශනා භාවනා කරන්නේ යෝගී හෙවත් යෝගාවචර ය යි කියනු ලැබේ. භාවනාවට බස්නා යෝගි ත්‍රිහේතුක ප්‍රතිසන්ධිකයකු විය යුතුය. පිරිසිදු සිල්වතකු විය යුතුය. ආවාසාදි දස විධ පළිබෝධයෙන් දුරු විය යුතු ය. කර්මස්ථාන දෙන කල්‍යාණ මිත්‍රයකු වෙත එළඹිය යුතු ය. භාවනාවට නුසුදුසු විහාර හැරැ පියා සුදුසු විහාරයෙක විසිය යුතු ය. කුඩා පළිබෝධ සිඳැ ලිය යුතු ය. නියමිත භාවනා විධි නොපිරිහෙළා භාවනා කළ යුතු ය.

මෙහි ත්‍රිහේතුක ප්‍රතිසන්ධිකයෙක් නො වැ අහේතුක ද්විහේතුක ප්‍රතිසන්ධි විණි නම් කෙතෙක් උත්සාහ කළ ද භාවනා සඵල නො වේ. **සිල් නැත්තහුට** හෝ දූෂිත සිල් ඇත්තහුට සිත එකග කැරැ ගත නො හැකි ය. **ආවාසාදි දසවිධ** පළිබොධ නම් ආවාස, කුල, ලාභ, ගණ, කර්ම, ගමන, ඥාති, ආබාධ, ග්‍රන්ථ, ඍද්ධි යන මේ ය. **කල්‍යාණ මිත්‍රයා** නම් ප්‍රිය, ගරු, සම්භාවනීය වරද දුටු විට කියන, වචනක්ෂම, ගැඹුරු කථා ඇති, අස්ථානයෙහි නො යොදන ආචාර්ය ය. **කර්මස්ථාන වනාහි** සමථ කර්මස්ථාන විදර්ශනා කර්මස්ථාන ය යි ද්විවිධ වේ. සමථ භාවනාවට ගත යුතු කර්මස්ථාන සමථ කර්මස්ථාන ය. විදර්ශනා භාවනාවට ගත යුතු කර්මස්ථාන විදර්ශනා කර්මස්ථාන ය. කර්මස්ථාන නම් යෝගී කර්මයට සුදුසු තැන් ය-අරමුණු ය. **චරිත** වනාහි රාග චරිත, ද්වේෂ චරිත,

මෝහචරිත, ශ්‍රද්ධාචරිත, බුද්ධිචරිත, විතර්කචරිතය යි ෂඩ්විධ වේ. ද්වේෂාදිය ද ඇතත් රාගය අධික වූයේ-උත්සන්න වූයේ රාගචරිත ය. ද්වේෂචරිතාදිය ද මෙසේ ය. **භාවනාවට නුසුදුසු විහාර නම්** මහා ආවාස, නව ආවාස, ජරා ආවාස, මහා මාර්ගාසන්න ආවාස. ගල් පොකුණු ඇති ආවාස, පලාපත් ඇති ආවාස, මල් ඇති ආවාස, ගෙඩි ජාති ඇති ආවාස, මහාජනයා ගැවසෙන ආවාස, නගරාසන්න ආවාස, දැව දඬු ඇති ආවාස, ක්‍ෂෙත්‍රාසන්න ආවාස, විසභාග පුද්ගලයන් ඇති ආවාස, පටුන් අසල ආවාස, පර්‍යන්ත ආවාස, රාජ්‍ය සීමා අසල ආවාස, විසභාග රූපාදිය හෝ අමනුෂ්‍යයන් හෝ ඇති ආවාස, කල්‍යාණ මිත්‍රයන් නැති ආවාස යන අටළොස් විහාර ය. **භාවනාවට සුදුසු විහාර නම්** ඉතා නුදුරු, නොළං, ගමනාගමනයට පහසු මහාජනයා නොගැවසෙන ශබ්ද කලබල නැති, මැසි මදුරු ආදී උවදුරු නැති, සිව්පස පහසු, සුදුසු කල්‍යාණ මිත්‍රයන් ඇති ස්ථාන යි. කුඩා පළිබෝධ නම්, දික් නිය, කෙස්, කිලිටි සිවුරු, අපිසිදු සෙනසුන් ආදිය යි. **නියමිත භාවනා විධි නම්** කසිණ භාවනාදිය වඩන්නේ නම්, එයට සුදුසු පිළිවෙලින් මේ සම්බන්ධ විස්තර **සිංහල විසුද්ධිමාර්ගයෙන්** උගත යුතු යි.

යට දැක්වූ ද්විවිධ භාවනා අතුරෙන් විදර්ශනා භාවනා මතු දක්වනු ලැබේ. සමථ භාවනා මෙසේ ය. එහි ලා කර්මස්ථාන සතළිසෙකි. චරිත සයෙකි. භාවනා තුනෙකි. නිමිත්ත ද තුනෙකි.

**සතළිස් කර්මස්ථාන සත් ආකාරයකින් බෙදේ.**

| | |
|---|---|
| කසිණ | 10 |
| අසුභ | 10 |
| අනුස්සති | 10 |
| අප්පමඤ්ඤා | 4 |
| ආහාර පටික්කුල සඤ්ඤා | 1 |
| චතුධාතු වවත්ථාන | 1 |
| ආරුප්ප | 4 |
| සමථ කර්මස්ථාන | 40 |

**චරිත සය**

රාග චරිත, ද්වේෂචරිත, මෝහචරිත, ශ්‍රද්ධාචරිත, බුද්ධි චරිත, විතර්කචරිත මෙය යට ද දැක්විණි.

**භාවනා තුන.**

පරිකර්ම භාවනා, උපාචාර භාවනා, අර්පණා භාවනා

**නිමිත්ත තුන.**

පරිකර්ම නිමිත්ත, උද්ග්‍රහ නිමිත්ත, ප්‍රතිභාග නිමිත්ත, විස්තර පිළිවෙලින් දක්වනු ලැබේ.

ප්‍රශ්න.

1. භාවනා යනු කිම? ඒ කී වැදෑරුම් ද? කවරේ ද?
2. ද්විවිධ භාවනායෙන් ලැබිය හැකි ඵල කවරේ ද? යෝගී හෝ යෝගාවචර යනු කවරෙක් ද?
3. යෝගියෙකු පිළිබඳ ඇතිවිය යුතු ගණ කවරේ ද?
4. සතළිස් කර්මස්ථාන බෙදා දක්වනු.
5. චරිත සය ද භාවනා තුන ද නිමිත්ත තුන ද දක්වනු.

## 2. දස කසිණ.

දස කසිණ නම්: **1. පඨවිකසිණ, 2. ආපොකසිණ, 3. තෙජොකසිණ, 4. වායොකසිණ, 5. නීලකසිණ, 6. පීත කසිණ, 7. ලොහිතකසිණ, 8. අවදතකසිණ, 9. ආකාස කසිණ, 10. ආලොකකසිණ** යන මේ ය.

1. **පඨවිකසිණය.** පඨවි නම් පෘථිවි ය. කසිණ නම් සියල්ල ය. මෙහි පෘථිවිය කෘත්‍රිම ය, ප්‍රකෘතිය ය යි දෙ වැදෑරුම්. කෘත්‍රිම නම් සාදා ගන්නා ලද්ද ය. ප්‍රකෘති නම් ස්වභාවයෙන් පිහිටියේ ය. එ නම් කලවිටි තැන් හෝ සා පෝරු ගෑ කුඹුරු තැන් හෝ ආදිය. කෘත්‍රිමය ද සංහාරිමය, තත්‍රස්ථකය යි දෙ වැදෑරුම් සංහාරිම නම් කැමැති තැනකට ගෙන යා හැකි සේ සාදා ගන්නා ලද්දය. තත්‍රස්ථක නම් එහි ම තිබෙන සේ පිළියෙල කැරැ ගන්නා ලද්ද ය. මෙයින් කසිණ මණ්ඩලයක් සාදා ගනු කැමැත්තහු විසින් රෙදි කඩෙක හෝ සම් පටෙක හෝ කලාල ආදි කිසිවෙක හෝ තණ රොඩු කැට ගල් ආදිය නැති සිහින් සිනිඳු අරුණු වන් මැටි බහා එක් වියත් සතරඟුල් නෙමිය වන පමණට බෙර ඇසක් සේ ඔප මට්ටම් කොටැ, වටා වෙන පැහැයෙකින් පරිච්ඡෙද කොටැ ගත යුතු ය. නිල් රතු කහවන් හෝ එයින් මිශ්‍ර වන් හෝ මැටි නො ගත යුතු ය. අරුණු වන් මැටි මඳ නම් වෙන මැට්ටක් ඇතුළේ ලා පිටත අරුණු වන් මැටි ගෑ යුතුය. එසේ සාදා ගන්නහු විසිනු දු විහාර මැද සාමණේරාදීන් ගැවසෙන තැනැ නො සාදා විහාර කෙළවර ප්‍රතිච්ඡන්න තැනෙක හෝ ගල්ගේ ආදි විවේක තැනෙක හෝ සාදා ගත යුතු ය. එසේ සාදා ගන්නා ලද හෝ ප්‍රකෘති හෝ පෘථිවිය එක දේශයක් නො වැ මුළුල්ල ම අරමුණු කළ යුතු බැවින් **පඨවිකසිණය** යි කියනු ලැබේ.

2. **ආපොකසිණය.** ආප නම් ජලය. කසිණ නම් සියල්ල ය. මෙහි ජලය ද **කෘත්‍රිමය, ප්‍රකෘතිය** යි දෙ වැදෑරුම් වේ. කෘත්‍රිම නම් පිළියෙල කැරැ ගන්නා ලද්ද ය. නිල් පැහැ වූ හෝ කහ පැහැ වූ හෝ රත් පැහැ වූ හෝ සුදු පැහැ වූ හෝ ජලය නො ගෙනැ විප්‍රසන්න නො කැලත් ජලය ගත යුතු ය. වැසි දිය බිම වැටෙන්නට පෙර අහස්හි දී ම සුදු වස්ත්‍රයෙකින් පෙරා ගන්නා ලද්දේ වඩා සුදුසු ය. එ බඳු පිරිසිදු ළිං ආදියෙක ජලය ගත ද

වරද නො වේ. එ ද පාත්‍රයෙක හෝ කෙංඩියක හෝ මුව විට තෙක් පුරා ගත යුතු ය. පඨවි කසිණයට කී පරිදි විවේක තැනෙක තබා ගත යුතු ය. **ප්‍රකෘති අප් නම්** වැව් පොකුණු කලපු මුහුදු ආදියෙහි තිබෙන පියවි ජලය යි. ඒ ආප ද එක දේශයක් නො වැ මුළුල්ල ම අරමුණු කළ යුතු බැවින් **ආපොකසිණය** යි කියනු ලැබේ.

3. **තෙජොකසිණය.** තෙජ නම් ගිනි ය. කසිණ නම් සියල්ල ය. එ ද කෘත්‍රිම ය ප්‍රකෘති ය යි දෙ වැදැරුම් වේ. කෘත්‍රිම නම් දල්වා ගන්නා ලද්ද ය. ප්‍රකෘති නම් ස්වභාවයෙන් දැල්වෙමින් තිබෙන පහන් ගිනි උදුන් ගිනි ලැව්ගිනි ආදිය යි. දල්වා ගත යුතු මෙසේ ය. සිනිඳු හර ඇති දර පලා වේලා මිටි මිටි කොට රුක් මුලකට හෝ වෙන විවේක තැනෙකට හෝ ගෙනැ ගොස් දැල්විය යුතු යි. කලාලෙක හෝ සම්පටෙක හෝ වස්ත්‍රයෙක හෝ එක් වියත් සතරඟුල් පමණ වන සිදුරක් කොටැ එය ඉදිරියෙහි තබා සිදුරින් ඒ ගිනි දැල් දෙසැ බැලිය යුතු යි. එහි වර්ණය හෝ උෂ්ණය හෝ අරමුණු නො කොටැ ගින්න මැ අරමුණු කළ යුතු යි. ප්‍රකෘති ගින්න අරමුණු කළ යුතු ද මෙසේ ය. මෙ ද එක දේශයක් නො වැ සියල්ල අරමුණු කළ යුතු බැවින් තේජොකසිණය යි කියනු ලැබේ.

4. **වායොකසිණය.** වායු නම් සුළඟ ය. කසිණ නම් සියල්ල ය. වායු ද දිට්ඨවායු, ඵුට්ඨවායු ය යි දෙ වැදැරුම් වේ. උක්, උණ ආදි ගසෙක අග හේ යටත් පිරිසෙයින් හිසෙක කෙස් හෝ යම් වායුවෙකින් සැලේ ද ඒ දිට්ඨවායු ය. සුළං කවුළුවකින් හෝ බිත් සිදුරෙකින් හෝ හමා යම් වායුවෙක් ඇඟ වැදැ ගනී ද ඒ ඵුට්ඨවායු ය. එ ද සියල්ල අරමුණු කළ යුතු බැවින් වායොකසිණය. **පඨවි ආදි මේ සතර භූත කසිණ යි.**

5. **නීලකසිණය.** නිල නම් නිල් පැහැ ය. කසිණ නම් සියල්ල ය. එ ද කෘත්‍රිම ය, ප්‍රකෘතිය යි දෙ වැදැරුම් වේ. කෘත්‍රිම නම් පිළියෙල කැරැ ගන්නා ලද්ද ය. නිලුපුල් ගින්නේරිය ආදි නිල් මල් පෙති වලින් භාජනයක් පුරවා ගත යුතු ය, නිල් රෙදි පොට්ටනියක් හෝ භාජනයෙක දමා ගත යුතු ය. භාජනයෙක මුවවිට හෝ බෙර ඇසක් සේ නිල් කඩෙකින් බැන්ද යුතු ය. වටා වෙන පැහැයෙකින් පරිච්ඡේද කළ යුතු ය. මේ කෘත්‍රිම නිල යි. ප්‍රකෘති නීලය මල් ගස් වල හෝ පිදූ මල් අසුන් හි හෝ නිල්මිණි නිල්වත් ආදියෙහි හෝ ලැබේ. මෙ ද සංහාරිම ද තත්‍රස්ථක ද වේ. බිත්තියෙහි එක් වියත් සතරඟුල් වටා නිල් සායම් ආලේප කළ කල තත්‍රස්ථක යි. එ ද සියල්ල අරමුණු කළ යුතු බැවින් නීල කසිණ යි.

6. **පීතකසිණය.** නීලකසිණයට කී පරිදි කහ පැහැ ගත් කල පීත කසිණය වේ. මල් කිණිහිරි ආදිය.

7. **ලොහිතකසිණය.** නීලකසිණයට කී පරිදි රත් පැහැ ගත් කල ලෝහිත කසිණය වේ. මල් බඳුවද ආදිය.

8. **අවදාත කසිණය.** නීලකසිණයට කී පරිදි සුදු පැහැ ගත් කල ඔදාත කසිණය වේ. මල් සමන් හෙළ පියුම් ආදි ය. ඊයම්, රිදී, සඳ මඬල ද මෙහි යෙදේ. නීලාදි සතර වර්ණකසිණ යි.

9. **ආකාසකසිණය.** ආකාස නම් අහස ය. කසිණ නම් සියල්ල ය. මෙහි අහස යන්නෙන් බිත්ති සිදුරින් හෝ සුළං කවුළුයෙන් හෝ පෙනෙන අහස ගත යුතු ය. ප්‍රතිච්ඡන්න මණ්ඩපයෙක හෝ සම් කලාල ආදියෙක හෝ එක්වියත් සතරඟුල් සිදුරක් කොටැ එයින් පෙනෙන අහස හෝ ගත යුතු ය.

10. **ආලොක කසිණය.** ආලෝක නම් එළිය. කසිණ නම් සියල්ල. මෙහි එළිය යන්නෙන් බිත්ති සිදුරින් හෝ සුළං කවුළු ආදියෙන් හෝ බිමට වැටුණු සූර්යාලෝක චන්‍ද්‍රාලෝක මණ්ඩල ගත යුතු ය. ඝන වූ රුක් පතරින් වැටුණු ආලෝක මණ්ඩල හෝ ගත යුතු ය. නැතහොත් කළයක් තුළ පහනක් දල්වා මුව වසා කළයේ පසෙක මණ්ඩලාකාර සිදුරක් කොටැ ඒ සිදුරින් බිත්තියට වැටෙන ආලෝක මණ්ඩලය හෝ ගත යුතු ය. එ ද සියල්ල අරමුණු කළ යුතු බැවින් ආලෝක කසිණ යි.

**ප්‍රශ්න.**

1. කසිණ දසය නම් වශයෙන් දක්වනු.
2. භූතකසිණ, වර්ණකසිණ බෙදා පෙන්වනු.
3. පඨවිකසිණ යනු කිම? එය කෙසේ ලැබිය හැකිද?
4. කෘත්‍රිම, ප්‍රකෘති සංහාරිම, තත්‍රස්ථක කසිණ තෝරනු.
5. අප්කෘත්ස්නාදි නවය පැහැදිලි කැරැ දක්වනු.

## 3. දස අසුභ, දස අනුසසති.

**දස අසුභ නම්:**

**1 උද්ධුමාතක, 2 විනීලක, 3 විපුබ්බක, 4 විච්ඡිද්දක, 5 වික්ඛායිතක, 6 වික්ඛිත්තක, 7 හත වික්ඛිත්තක 8 ලොහිතක, 9 පලවක 10 අට්ඨික** යන මේ ය.

1. ඉදිමී ගිය මළ මිනිය උද්ධුමාත ය. එය කුත්සිතාර්ථයෙන් - පිළිකුල් කටයුතු යන අර්ථයෙන් **උද්ධුමාතකය** යි කියනු ලැබේ. සෙස්සෙහි ද කප්‍රත්‍යයාර්ථය මෙසේ ය.

2. විපරිභින්න වර්ණ ඇති පිළිකුල් මළ මිනිය **විනීලකය.** ඉදිමී ගිය මෘතශරීරය ඒ ඒ තන්හි බොහෝ සෙයින් නීලවර්ණයට හැරේ. එය මෙහි විනීලක අසුභ ය.

3. පැළුණු පැළුණු තැනින් සැරව වැගිරෙන පිළිකුල් මළ මිනිය **විපුබ්බක** ය. පුබ්බ යනු පූයා ය. සැරව ය.

4. යුද්ධ භූමි ආදියෙහි මැදින් කපා හෙළූ පිළිකුල් මළ මිනිය **විච්ඡිද්දක** ය.

5. බලු කැණහිල් ආදීන් විසින් ඒ ඒ කොටස් කා දැමූ පිළිකුල් මළ මිනිය **වික්ඛායිතක** ය.

6. බලු කැණහිල් ආදීන් විසින් ම කඩ කඩ කොටැ කා ඒ ඒ තැන්හි කැබලි වශයෙන් ලූ පිළිකුල් මළ මිනිය **වික්ඛිත්තක** ය.

7. ආයුධයෙන් අඟ පසඟ කපා ඒ ඒ තැන ලූ පිළිකුල් මළ මිනිය **හතවික්ඛිත්තක** ය.

8. ඔබින් මොබින් ලේ වැගිරෙන පිළිකුල් මළ මිනිය **ලොහිතක** ය.

9. පණුවන් කා හැළෙන පිළිකුල් මළ මිනිය **පුළවක** ය.

10. මුළු ඇටසැකිල්ල ම හෝ එක් එක් ඇටයෙක් හෝ අට්ඨි ය. එ ම පිළිකුල් හෙයින් අට්ඨික ය.

මේය දස අසුභ.

**දස අනුස්සති නම්:**

**1 බුද්ධානුස්සති, 2 ධම්මානුස්සති, 3 සඞ්ඝානුස්සති, 4 සීලානුස්සති, 5 චාගානුස්සති, 6 දෙවතානුස්සති, 7 උපසමානුස්සති, 8 මරණානුස්සති, 9 කායගතාසති, 10 ආනාපාණසති** යන මේ ය. නැවත නැවත සිහි කිරීම අනුස්සති ය. එයට අරමුණු දසයෙකි.

1. "**ඉති පි සො භගවා අරහං**" යනාදීන් බුදුගුණ සිහි කිරීම **බුද්ධානුස්සති** ය.

2. "**ස්වාක්ඛාතො භගවතා ධම්මො**" යනාදීන් ධර්ම ගුණ සිහිකිරීම **ධම්මානුස්සති** ය.

3. "**සුපටිපන්නො භගවතො සාවකසංඝො**" යනාදීන් සංඝ ගුණ සිහිකිරීම **සංඝානුස්සති** ය.

4. අඛණ්ඩ, අච්ඡිද්‍ර, අසබල, අකම්මාස, භුජිස්ස, විඤ්ඤුප්පසත්‍ථ, අපරාමට්ඨ, සමාධිසංවත්තනික යන අෂ්ට ගුණයෙන් උපලක්ෂිත වූ ස්වකීය ශීලය සිහි කිරීම **සීලානුස්සති** ය. මුල හෝ අග හෝ සිල් පද නො බිඳුණේ අඛණ්ඩ ය. මැද සිල් පද නො බිඳුණේ අච්ඡිද්‍ර ය. පිළිවෙලින් සිල් පද දෙක තුන නො බිඳුණේ අසබල ය. අතරින් පතර සිල්පද නො බිඳුණේ අකම්මාස ය. තෘෂ්ණාදාසත්‍වයෙන් මිදුණේ භුජිස්ස ය. බුද්ධාදි

විඥයන් විසින් පසස්නා ලද්දේ විඤ්ඤුප්පසත්‍ථ ය. කිසිවකු විසිනුත් දොස් නො කිය හැක්කේ අපරාමට්ඨ ය. උපචාර අර්පණා සමාධියට හෝ මාර්ගඵල සමාධියට හෝ පවත්නේ සමාධිසංවත්තනික ය.

5. තමාගේ ම ත්‍යාග ගුණය සිහි කිරීම **චාගානුස්සති** ය. නිතර දන් දෙන්නහුට ද, මේ භාවනාව වඩනු කැමැති වැ අද පටන් නො දී නො වළඳමියි සමාදන් වැ ගෙනැ ගුණ විශිෂ්ටයකුට දී එය සලකන්නාහට ද මේ භාවනාව වැඩිය හැකිය.

6. "දෙවියෝ යම් ශ්‍රද්ධාවකින්, ශීලයකින්, ශ්‍රැතයකින්, ත්‍යාගයකින්, ප්‍රඥාවෙකින් දේවත්වයට ගියෝ ද ඒ ශ්‍රද්ධා ශීල ශ්‍රැත ත්‍යාග ප්‍රඥා මා කෙරෙහි ද ඇතැ"යි දෙවියන් ශාක්‍ෂ්‍ය කොටැ ස්වකීය ශ්‍රද්ධාදී පඤ්චකය සිහි කිරීම **දේවතානුස්සතිය** යි.

7. වත් පිළිවෙත් වශයෙන් හෝ ධුතඞ්ග සමාදාන වශයෙන් හෝ ධ්‍යාන සමාපත්ති වශයෙන් හෝ විදර්ශනා වශයෙන් හෝ ස්ව සන්තානයෙහි පැවැති කාමරාගාදීන්ගේ ව්‍යපසමය, තමා විසින් ප්‍රතිවේධ කරන ලද නිර්වාණය හෝ සිහි කිරීම **වුපසමානුස්සතිය** යි. විශේෂයෙන් මෙහි නිර්වාණය ම **විශුද්ධිමාර්ගයෙහි** දක්වන ලදි. එ ද දශවැන්න කොටැ දක්වන ලද්දේ ය.

8. ආයුඃක්‍ෂය වූ හෝ කර්මක්‍ෂය වූ හෝ උභයක්‍ෂය වූ හෝ උපච්ඡේදක වූ හෝ ජීවිතේන්ද්‍රියොපච්ඡේද සංඛ්‍යාත මරණය සිහි කිරීම **මරණානුස්සතිය** යි.

9. "**අත්‍ථි ඉමස්මිං කායෙ කෙසා ලොමා නඛා දන්තා තචො**" යනාදීන් සජීව ශරීරයෙහි පිළිකුල් බව සිහි කිරීම **කායාගතාසතිය** යි.

10. "**දීඝං වා අස්සසන්තො දීඝං අස්සසාමීති පජානාති**" යනාදීන් දක්වන ලද පරිදි ආශ්වාස ප්‍රශ්වාස සිහි කිරීම **ආනාපානසතිය** යි.

**ප්‍රශ්න.**

1. දස අශුභ දක්වනු.
2. එක් එක් අශුභයෙක ආකාර දක්වනු.
3. දස අනුස්සති කවරේ ද?
4. සීලානුස්සති, දේවතානුස්සති පැහැදිලි කරනු.
5. උපසමානුස්සති, මරණානුස්සති, කායගතාසති, ආනාපානසති සැකෙවින් කෝරනු.

## 4. චතුඅප්පමඤ්ඤා, ආහාරපටික්කූලසඤ්ඤා, චතුධාතු වවත්ථාන, චතුරාරුප්ප.

අප්පමඤ්ඤා සතර නම්: 1 මෙත්තා, 2 කරුණා, 3 මුදිතා, 4 උපෙක්ඛා යන මේ ය.

අප්‍රමාණ සත්ත්වයන් කෙරෙහි පැතිරවිය යුතු බැවින් මේ අප්පමඤ්ඤාය යි කියනු ලැබේ. මෙතෙක් සත්ත්වයන් කෙරෙහි පැතිරවිය යුතු ය. ඉන් ඔබ්බෙහි නො පැතිරවිය යුතුය යි මෙහි නියමයෙක් නැත. සියලු සත්ත්වයන් කෙරෙහිම පැතිරවිය යුතු ය. එසේ වුව ද මෛත්‍රී වඩන ආදිකම්මිකයා විසින් පළමු කොටැ තමා කෙරෙහි ද ඉක්බිති ආසන්නාදීන් කෙරෙහි ද ඔධි වශයෙන් පතුරුවා පසු වැ අනොධි වශයෙන් පැතිරවිය යුතු යි. ඔධි නම් සීමා ය. මෙය බ්‍රහ්මවිහාරය යි ද කියනු ලැබේ. බ්‍රහ්මයාගේ මෙන් මෘදු විහරණයක් බැවින් ද ශ්‍රේෂ්ඨ විහරණයක් බැවින් ද එසේ කියනු ලැබේ. බ්‍රහ්ම යි ශ්‍රේෂ්ඨ ද කියවේ.

1. මෙත්තා නම් මෛත්‍රිය යි-මිත්‍රභාවය යි-සියලු සත්ත්වයන් කෙරෙහි හිතු එරණය යි. මෙත්තා භාවනායෙහි යෙදෙන යෝගී ද්වේෂයෙහි ආදිනව ද ක්‍ෂාන්තියෙහි ආනිසංස ද සැලකිය යුතු. පළමු කොටැ අප්‍රියයන් කෙරෙහි ද, අතිප්‍රියයන් කෙරෙහි ද, මධ්‍යස්ථයන් කෙරෙහි ද, වෛරීන් කෙරෙහි ද, මෛත්‍රී නො වැඩිය යුතු. එසේ ම සීමා සහිත කොට ලිංග විසභාගයන් කෙරෙහි ද, මළවුන් කෙරෙහි ද නො වැඩිය යුතු. තමා කෙරෙහි මෛත්‍රී වඩා ඉක්බිති පිළිවෙලින් සියලු සත්ත්වයන් කෙරෙහි වැඩිය යුතු යි.

2. කරුණා නම් දුඃඛිත සත්ත්වයන් දුටු විට ඔවුන් කෙරෙහි පහළවන හෘදය කම්පනය යි. කරුණා භාවනානුයොග යොගී මෛත්‍රියට කී සේ ම ද්වේෂයෙහි ආදීනව ද කරුණායෙහි ආනිසංස ද සලකා පළමු කොටැ අප්‍රියාදීන් කෙරෙහි නො වඩා දුඃඛිත සත්ත්වයකු දැක ඔහු කෙරෙහි කරුණා වැඩිය යුතු මෙසේ එ බඳු සියලු සත්ත්වයන් කෙරෙහි වැඩිය යුතු යි.

3. මුදිතා නම් සුඛිත සත්ත්වයන් දුටු ඔවුන් කෙරෙහි පහළ වන ප්‍රමෝදය යි. එය අතිප්‍රිය පුද්ගලයකුගෙන් පටන් ගෙනැ එ බඳු සියලු සතුන් කෙරෙහි වැඩිය යුතු යි.

4. උපෙක්‍ෂා නම් සත්ත්වයන් කෙරෙහි මෛත්‍රී වඩන්න හෝ කරුණා කරන්නට හෝ මුදිත වන්නට හෝ නො ගොස් ඔවුනොවුන්ගේ කර්ම ස්වකතා සලකා මධ්‍යස්ථතා වැඩීම යි.

මේය චතු අප්පමඤ්ඤා.

ආහාර පටික්කූල සංඥව. කබලීකාරාහාර, ඵස්සාහාර, මනොසඤ්චෙතනාහාර විඤ්ඤාණාහාරය යි ආහාර චතුර්විධ ය. එයින් මෙහි කබලීකාරාහාරය ම ගත යුතු. එහි පිළිකුල් බව සැලකීම ආහාර පටික්කූලසඤ්ඤා යි. ඒ වනාහි ගමන, පර්යේෂණ, පරිභෝග, ආසය, නිධාන, අපරිපක්ව, පරිපක්ව, ඵල, නිස්සන්‍ද, සම්මක්ඛණ යන දස

ආකාරයෙන් සැලකිය යුතුයි. ආහාර සඳහා යන ගමන ද පිළිකුල් ය. ගෙන් ගෙට ගොස් ආහාරය සෙවීම ද පිළිකුල් ය. සොයා ගත් ආහාරය මුව තුළ ලා සපා වැළඳීම ද පිළිකුල් ය. වැළඳූ ආහාරය වැටෙන ස්ථානය ද පිළිකුල් ය. වැටී තිබෙන තැන ද පිළිකුල් ය. වැටී නො පැසී තිබෙන කල ද පිළිකුල් ය. පැසුණු කළ ද පිළිකුල් ය. පැසීමෙන් වැඩෙන කෙස් ලොම් නිය දත් ආදිය ද පිළිකුල් ය. නො පැසීමෙන් නැගෙන දද වණ ආදිය ද පිළිකුල් ය. එක් දොරකින් ඇතුළු වුව ද කබ කැඳුරා සොටු ආදි වශයෙන් නවදොරකින් වැගිරීම ද පිළිකුල් ය. වළඳන කල ගෑවෙන ගෑවෙන තැන් ද පිළිකුල් ය. මෙසේ දස ආකාරයෙන් ආහාරයෙහි පිළිකුල් බව සැලකීම **ආහාර පටික්කූල සඤ්ඤ** යි.

**චතුධාතු වවත්ථානය.** පෘථිවි, අප්, තේජස්, වායු යන ධාතු සතර ව්‍යවස්ථා කිරීම චතුධාතුවවත්ථානය යි. ධාතුමනස්කාර, ධාතුකර්මස්ථාන යනුදු මේ ය. නො දන්නා කල සත්ත්ව, පුද්ගල, ස්ත්‍රී, පුරුෂය යි ගන්නේ. මේ භාවනායෙන් ඒ ගැන්ම දුරු කොටැ ධාතු වශයෙන් දකී. ගවයා මරා මස් කොටැ අංගානියේ එල්වූ කල ගවයෙක යන සංඥාව දුරු වැ මස් යන සංඥාව වන්නාක් මෙනි. මෙය සංක්ෂිප්ත වශයෙන් ද විස්තර වශයෙන් දැ යි දෙ ආකාරයෙකින් වේ. ස්තබ්ධ ලක්‍ෂණ ඇත්තේ පෘථිවිධාතු ය. ආබන්ධන ලක්‍ෂණ ඇත්තේ අබ්ධාතු ය. පරිපාචන ලක්‍ෂණ ඇත්තේ තේජෝධාතු ය. විත්ථම්භන ලක්‍ෂණ ඇත්තේ වායුධාතු ය යි සැලකීම සංක්ෂිප්ත ක්‍රමය යි. එය තීක්‍ෂණ ප්‍රාඥයාට ය. දෙසාළිස් ආකාරයෙන් සැලකීම විස්තර ක්‍රමය යි. කෙසාදී විසි කොටසෙහි තද ගතිය ඇලෙන්නේ ය. පිත්තාදි දොළොස් කොටසෙහි ආබන්ධන ගතිය ඇත්තේ ය. තැවීම්, පැසවීම්, දිරවීම්, මිහිකිරීම් යි සිව් ආකාරයෙකින් පරිපාචන ගතිය ඇත්තේ ය. උද්ධංගමාදී සයාකාරයෙකින් විත්ථම්භන ගතිය ඇත්තේ ය. මෙසේ විස්තර වශයෙන් සැලකීම මන්‍දප්‍රාඥයාට යි. මෙහි තව ද විස්තර **විසුද්ධිමාර්ගයෙහි** බලනු.

**චතු ආරුප්ප.** ආකාසානඤ්චායතන, විඤ්ඤාණඤ්චායතන, ආකිඤ්චඤ්ඤායතන, නේවසඤ්ඤානාසඤ්ඤායතන යන මේ සතර චතු ආරුප්ප ය. මෙහි ආකාසානඤ්චායතනයට කසිණුග්ඝාටිමාකාසය අරමුණු වේ. කසිණුග්ඝාටිමාකාසය නම් කිසුණු ඉගුළු අහස ය. කසිණාලෝකය යම් තැනෙක පතුරුවන ලද්දේ ද ඒ ආලෝකය ඉවත් වූ කල ලැබෙන අහස කිසුණු ඉගුළු අහස ය. විඤ්ඤාණඤ්චායතනයට ආකාසානඤ්චායතන චිත්තය අරමුණු වේ. ඒ ආකාසානඤ්චායතන චිත්තයාගේ අභාවය ආකිඤ්චඤ්ඤායතනයට අරමුණු වේ. ආකිඤ්චඤ්ඤායතන චිත්තය නේවසඤ්ඤානාසඤ්ඤායතනයට අරමුණු වේ. එය සන්ත වශයෙන් ප්‍රණීත වශයෙන් ගැන්ම යි මෙහි අරමුණු වීම නම්. මෙහි විස්තරයෙක් මතු ද පළ වේ.

### ප්‍රශ්න.

1. අප්පමඤ්ඤා සතර කවරේ ද? කුමක් හෙයින් එයට ඒ නම් ලැබේ ද?
2. ආහාරපටික්කූලසඤ්ඤාව විස්තර කරනු.
3. චතුධාතුවවත්ථානය දක්වනු. එහි සංක්ෂිප්ත ක්‍රමය හා විස්තර ක්‍රමය කෙසේ ද?
4. ආරුප්ප සතර දක්වනු. එය කවුරුන්ට ලැබිය හැකි ද?

5. සතළිස් කර්මස්ථාන දක්වනු.

## 5. චරිතානුකූල කර්මස්ථාන.

රාගචරිත, ද්වේෂචරිත, මෝහචරිත, ශ්‍රද්ධාචරිත, බුද්ධිචරිත, විතර්කචරිතය යි චරිතවත් පුද්ගලයෝ සදෙනෙක් වෙති යි යට දක්වන ලදි. මේ රාගචරිතයෙක, මේ ද්වේෂචරිතයෙක යනාදීන් දැනැ ගැන්ම පහසු නො වේ. තමහට ද තමාගේ චරිතය දුර්බෝධ ය. එහෙත් ඔවුනොවුන්ගේ ඉරියව්වෙන් ද, කෘත්‍යයෙන් ද, භෝජනයෙන් ද, දර්ශනාදියෙන් ද, ධර්මප්‍රවෘත්තියෙන් ද චරිත ස්වභාවය සාමාන්‍යයෙන් දත හැකි ය.

රාගචරිතයාගේ සතර ඉරියව්ව ම මිහිරි ය. ප්‍රසාදජනක ය. හේ යන්නේ සෙමෙන් ලීලායෙන් යෙයි. සිටින්නේ මිහිරි මිහිරි වැ සිටියි. ඉන්නේ ද මිහිරි මිහිරි වැ හිඳියි. නිදන්නේ මොනවට සයන පනවා ගෙනැ මිහිරි වැ නිදයි. හැමදීම් ආදි කරන්නේ දුටුවන් පහදින සේ, මනා වැ කරයි. වළඳන්නේ සිනිඳු මිහිරි භෝජන කැමැත්තෙන් වළඳයි. බැලීම් ආදිය කරන්නේ ප්‍රියරූප දැක විස්මිත වෙයි. බොහෝ වේලා ඒ දිසා බලා හිඳියි. සුළු ගුණයෙහි ඇලෙයි. ඇති දොස් ද ගණන් නො ගනි යි. **මායා, සාඨෙය්‍ය, මාන, මහිච්ඡතා, පාපිච්ඡතා, අසන්තුට්ඨිතා, චපලතා** ආදිය ඔහුගේ ධර්ම ප්‍රවෘත්ති යි. මෙබඳු **රාගචරිතයාහට වනාහි දශ අශුභ ද කායගතාසති සංඛ්‍යාත කොට්ඨාස භාවනාව ද සප්පාය වන්නේ ය.**

ද්වේෂචරිතයාගේ සතර ඉරියව්ව ම කෲර ය. හේ යන්නේ පා අගින් පොළෝ කණන්නා සේ වෙළෙවි වෙළෙවි වැ යයි. සිටින්නේ රෞද්‍රාකාරයෙන් සිටියි. ඉන්නේ ද එ සේ ය. නිදන්නේ නපුරු වැ මුහුණ හකුළා ගෙනැ නිදයි. පුබුදුවනු ලබන්නේත් කෝප සහිත වැ පුබුදියි. හැමදීම් ආදිය කරන්නේ තරයේ මුස්න ගෙනැ රළු හඬ නඟා හැමදීම් ආදිය කරයි. එහෙත් පිරිසිදු වැ හමදියි. වළඳන්නේ කටුක ඇඹුල් වැඩි භෝජන මුව පුරා ගෙනැ වෙළෙවි වැ වළඳයි. අමිහිරක් ලද නම් කෝප දක්වයි. බැලීම් ආදිය කරන්නේ නො සිත් කලු රූ දැක කෝපවෙයි. කවර රූපයක් හෝ වැඩි වේලා නො බලයි. බලා හැරැ යන්නේ අපේක්ෂා රහිත වැ ම යයි. කොධ, උපනාහ, මක්ඛ, පලාස, ඉස්සා, මච්ඡරිය ආදිය ඔහුගේ ධර්ම ප්‍රවෘත්ති යි. මෙ බඳු **ද්වේෂ චරිතයා හට වනාහි සතර අප්පමඤ්ඤා ද, නීලාදි වර්ණ කසිණ සතර ද සප්පාය වන්නේ ය.**

මෝහචරිතයාගේ සතර ඉරියව්ව ම අවුල් ය. යාම් ආදිය කරන්නේ ආකුල වැ ම කරයි. නිදන්නේ අවුල් කැරැ ගත් ආසනයෙහි බොහෝ විට යටිමුව වැ නිදයි. පුබුදු වනු ලබන්නේත් හුම් හුම් ගාමින් සිටැ අමාරුයෙන් නැගිටියි. හැමදීම් ආදිය කරන්නේ මුස්න ලිහිල් වැ ගෙනැ අපිරිසිදු සේ විසම වැ හැමදීම් ආදිය කරයි. වළඳන්නේ අසවල් රස රුචිය යි නියම නැති වැ එහෙත් මෙහෙත් ඉහිරුවමින් අතේ කටේ සැම තැන ගා ගනිමින් වළඳයි. යමක් දැකැ අන්‍යයෝ ගුණ කියත් නම් තෙමේත් ගුණ කියයි. අන්‍යයයෝ දොස් කියත් නම් තෙමේත් දොස් කියයි. තමහට එහි විවේචන බුද්ධියක්

නැත. ථීන, මිද්ධ, උද්ධච්ච, කුක්කුච්ච, විචිකිච්ඡාදිය ඔහුගේ ධර්ම ප්‍රවෘත්ති යි. මෙබඳු **මෝහචරිතයා හට වනාහි ආනාපානසතිය සප්පාය වන්නේ ය.**

ශ්‍රද්ධාචරිතයාගේ ඉරියව් ආදී සියල්ල බොහෝ සෙයින් රාගචරිතයාට කී බඳුය. **බුද්ධානුස්සති, ධම්මානුස්සති, සංඝානුස්සති, සීලානුස්සති, චාගානුස්සති, දේවතානුස්සති යන සය ඒ ශ්‍රද්ධාචරිතයා හට සප්පාය වන්නේ ය.**

බුද්ධචරිතයාගේ ඉරියව් ආදි සියල්ල බොහෝ සෙයින් ද්වේෂචරිතයා හට කී බඳු ය. **මරණානුස්සති, උපසමානුස්සති, ආහාරපටික්කූලසඤ්ඤ, චතුධාතුවවත්‍ථාන යන සතර බුද්ධි චරිතයා හට සප්පාය වන්නේ ය.**

විතර්ක චරිතයාගේ ඉරියව් ආදිය ද මෝහ චරිතයා හට කී බඳු ය. **ආනාපානසතිය ඒ විතර්ක චරිතයා හට සප්පාය වන්නේ ය. "ආනාපානසති භාවෙතබ්බා විතක්කු පච්ඡෙදය"** යනු පාළි යි. මෝහ චරිතයා ද ප්‍රකෘතියෙන් ප්‍රමාද බහුලයෙකි. වික්ෂිප්ත සිත් ඇත්තෙකි. එ බැවින් ඔහුට ද මේ ම සප්පාය යි කීයේ ය.

පඨවිකසිණ, ආපොකසිණ, තේජොකසිණ, වායොකසිණ යන භූතකසිණ සතර ද, ආකාසකසිණය ද, ආලෝක කසිණය ද, ආරුප්ප සතර ද යන දශය ශ්‍රද්ධාචරිතාදි සියල්ලන්ට සප්පාය වන්නේ ය. එහිදු කලවිටි ප්‍රමාණ වූ පුළුල් කසිණ මණ්ඩලය මෝහ චරිතයාට සප්පාය වේ. ඔහුගේ සිත කුඩා නිමිත්තයෙහි මනාව නො පිහිටන බැවිනි. වියත් සතරඟුල් පමණ කුඩා කසිණමණ්ඩලය විතර්කයා හට සප්පාය වේ. මහත් වුව විතර්කය ම දිවෙන බැවිනි.

මේ සතළිස් කර්මස්ථාන අතුරෙන් දස අසුභ, ආහාර පටික්කූලසඤ්ඤා කායගතාසති යන දොළොස චාතුර්මහාරාජිකාදි ෂට්කාමස්වර්ගයෙහි නැත. සෙසු අටවිස්ස ඇත. එහෙත් එහි වායොකසිණය ම බොහෝ සෙයින් ලැබේ. රූපී බ්‍රහ්ම ලෝකයෙහි ඒ දොළොස හා ආනාපානසතිය යන තෙළෙස නැත. සෙසු සත්විස්ස ඇත. එහි දු අසංඥ තලයෙහි කිසි දු කර්මස්ථානයෙක් නැත. අරූපලෝකයෙහි ආරුප්ප සතර පමණෙක් ඇත. සෙසු සතිස නැත. මනුෂ්‍ය ලෝකයෙහි මේ සතළිස ම ලැබෙන බව දත යුතුයි.

### ප්‍රශ්න.

1. රාගචරිතයාගේ ආකාර දක්වා ඔහුට සුදුසු කර්මස්ථාන දක්වනු.
2. ද්වේෂ චරිතයාගේ ලක්ෂණ දක්වනු. ඔහුට කවර කමටහන් සැප ද?
3. මෝහ චරිතයාගේ ලක්ෂණ පෙන්වනු. ඔහුට සුදුසු කමටහන කිම?
4. ශ්‍රද්ධා බුද්ධි විතර්ක චරිත ලක්ෂණ දක්වා ඔවුන්ට කර්මස්ථාන ද දක්වනු.
5. කාමරූප අරූප ලෝකයෙහි කවර කවර කර්මස්ථාන ලැබේද? කවර කවර කර්මස්ථාන නො ලැබේ ද?

## 6. ත්‍රිවිධ භාවනා හා ත්‍රිවිධ නිමිති.

**පරිකර්ම භාවනා, උපචාර භාවනා, අර්පණා භාවනා යයි භාවනා ත්‍රිවිධ වේ.**

සතළිස් කර්මස්ථාන අතුරෙන් කිසිවක් අරමුණු කොටැ ගෙනැ මතු දැක්වෙන ප්‍රතිභාග නිමිත්ත ලැබෙන තාක් සිත නැවත නැවත එහි මෙහෙයන්නේ ද ඒ සිත මෙහෙයීම **පරිකර්ම භාවනා** ය යි කියනු ලැබේ. ඒ වනාහි සතලිස් කර්මස්ථාන විෂයයෙහි ම ලැබෙන්නේ ය.

ප්‍රතිභාග නිමිත්ත ලැබුණු කල්හි එය අරමුණු කොටැ ධ්‍යානය ලැබෙන තාක් එහි සිත මෙහෙයීම උපචාර භාවනා ය යි කියනු ලැබේ. එ ද සතළිස් කර්මස්ථානයෙහි ම ලැබෙන්නේ ය.

ඒ ප්‍රතිභාග නිමිත්ත ම අරමුණු කොටැ ධ්‍යානය ලැබෙන අවස්ථාවහෙි එහි සිත මෙහෙයීම අර්පණා භාවනාය යි කියනු ලැබේ. අර්පණා නම් මෙහි ධ්‍යාන ප්‍රාප්තිය යි. මේ අර්පණා භාවනාව වනාහි බුද්ධානුස්සති, ධම්මානුස්සති, සඞ්ඝානුස්සති, සීලානුස්සති, චාගානුස්සති, දේවතානුස්සති, උපසමානුස්සති, මරණානුස්සති යන අනුස්සති අටෙහි ද, ආහාරපටික්කූලසඤ්ඤා, චතුධාතුවවත්ථාන යන දෙක්හි ද යන දශ කර්මස්ථානයෙහි නො ලැබෙන බව දත යුතු. කුමක් හෙයින් ද? බුද්ධ, ධර්ම, සඞ්ඝ, සීල, ත්‍යාග, දේවතා, උපසම යන මොවුන් පිළිබඳ ගුණ ගැඹුරු බැවින් හා අනන්ත බැවින් ය. ඒ එසේ මැ යි. බුද්ධාදීන් පිළිබඳ ගුණ ගැඹුරු ය. ඒ ගැඹුරු ගුණ අරමුණු කොටැ ගැඹුරු සයුරෙහි සාවකුට පිහිටා ගන්නට බැරි සේ සිතට නිශ්චල වැ පිහිටා ගන්නට බැරි ය. එසේ ම ඒ බුද්ධාදි ගුණ මෙතෙකැ යි ප්‍රමාණ නැත. එබැවින් ඒ අනන්ත ගුණ අරමුණු කොට ද සිත අර්පණා කැරැ ගන්නට බැරිය. මරණය ස්වභාව ධර්මයක් බැවින් හා සංවෙජනිය ධර්මයක් බැවින් ද, ආහාරේ පටික්කූලතාව හා චතුධාතුවවත්ථානය ස්වභාව ධර්ම බැවින් හා ගැඹුරු බැවින් ද ඒ තුනෙහි ද අර්පණා ලබන්නට බැරිය. එසේ නම් ගැඹුරු වූ නිර්වාණය අරමුණු කොටැ ද ඇතැම් අරූපාවචර සිත් අරමුණු කොට ද මාර්ගාදි අර්පණා කෙසේ ලබන්නේ දැ යි නො සිතිය යුතු යි. නිර්වාණය අරමුණු කොටැ අර්පණා වන්නේ දෘෂ්ටි විශුද්ධියෙහි පටන් සම්මර්ශනඥානයෙහි පටන් පිළිවෙලින් මතු මතු පැවති විශුද්ධිභාවනාවන්ගේ බලයෙන් ය. අරූපාවචර සිත් අරමුණු කොටැ අර්පණා වන්නේ පඤ්චම ධ්‍යානිකයාට ය. මේ දශය හැරැ සෙසු සමතිස් කර්මස්ථානයෙහි අර්පණා භාවනා ලැබෙන්නේ’ ය. ඒ ලැබෙන්නේත් එක සේ නො වේ. නොයෙක් සේ ය. එහි ක්‍රමය මෙසේ යි.

**දසකසිණ ද ආනාපාන සතිය ද යන එකොළස පඤ්චක ධ්‍යානික ය.** මේ එකොළොස් කර්මස්ථාන වඩා ප්‍රථමධ්‍යානාදි ධ්‍යාන පස පිළිබඳ අර්පණා ලැබිය හැකිය යි සේ යි. දස **අශුභය ද කායගතාසති ද යන එකොළොස ප්‍රථමධයානික ය.** මේ එකොළොස වඩා ප්‍රථමධ්‍යානය පමණක් ලැබිය හැකි ය. පිළිකුල් අරමුණෙහි විතර්ක රහිත සිත් නො පවතී. එහෙයින් මෙහි අවිතර්ක ධ්‍යාන නො ලැබේ.

**මෙත්තා, කරුණා, මුදිතා යන තුන චතුෂ්ක ධ්‍යානික ය.** මේ තුන වඩා ප්‍රථමධ්‍යානාදී ධ්‍යාන සතර ලැබිය හැකිය. මෛත්‍රී කරුණා මුදිතා දොම්නසින් නැගෙන ව්‍යාපාද විහිංසා, අරති දුරු කරයි. එය සොම්නසින් වෙන් වැ නො ලැබේ. එ බැවින් සුඛ වේදනා රහිත පඤ්චම ධ්‍යානාදිය මෙහි නො ලද හැකිය.

උපෙක්‍ෂා පඤ්චම ධ්‍යානික ය. උපෙක්‍ෂා වඩා පඤ්චම ධ්‍යානය පමණක් ලද හැකි ය යි සේ යි. සත්ත්වයන් කෙරෙහි මධ්‍යස්ථ හෙයින් මෙහි සුඛධ්‍යාන නො ලැබේ.

**ආරුප්ප සතර අරූපධ්‍යානික ය.** කසිණුඝොටිමාකාසාදිය වඩා අරූපධ්‍යාන පමණක් උපදවිය හැකිය.

උපචාර සමාධි පමණක් ලැබෙන බුද්ධානුස්සති ආදි දශය කාමාවචර කර්මස්ථානය යි ද, ප්‍රථමධ්‍යානාදි අර්පණා ලැබෙන සව්ස්ස රූපාවචර කර්මස්ථානය යි ද, ආකාසානඤ්චායතනාදි සතර අරූපාවචර කර්මස්ථානය යි ද කිවයුතු

**පරිකර්මනිමිත්ත, උද්ග්‍රහ නිමිත්ත, ප්‍රතිභාග නිමිත්තය යි නිමිති ද ත්‍රිවිධ වේ.**

සතලිස් කර්මස්ථාන අතුරෙන් යමක් අරමුණු කොටැ ගෙනැ පළමු පළමු භාවනා කරන්නේ ද එය පරිකර්ම නිමිත්තය යි කියනු ලැබේ. ඒ පරිකර්ම නිමිත්ත සතලිස් කර්මස්ථානයෙහි ම ලැබේ.

පරිකර්ම නිමිත්ත දිසා බලාගෙනැ භාවනා කරන කල්හි සිය දහස් වර හෝ භාවනා කරන කල්හි යම් නිමිත්තයෙක් සිතට අරමුණු වේ ද ඇස පියා බැලුව ද වෙන දිසාවෙක බැලුව ද යම් නිමිත්තයෙක් සිතට පෙනෙන්නාක් මෙන් වේ ද එය උද්ග්‍රහ නිමිත්තය යි කියනු ලැබේ.

ඒ උද්ග්‍රහ නිමිත්ත අරමුණු කොටැ ගෙනැ භාවනා කරන කල්හි එය පලා ගෙනැ නැංගාක් බඳු එයට වඩා සිය දහස් ගුණයෙන් පිරිසිදු වූ යම් නිමිත්තයෙක් පහළ වේ ද එය ප්‍රතිභාග නිමිත්තය යි කියනු ලැබේ. ප්‍රතිභාග නිමිත්ත වනාහි පඨවිකසිණයෙහි නම් ථවිකායෙන් මැත් කොටැ ගත් දර්පණ තලයක් මෙන් ද කොපුයෙන් හයාගත් අසිපතක් මෙන් ද වලාගැබින් නික්මුණු පුන්සඳක් මෙන් ද අත්‍යන්ත නිර්මල ය. උද්ග්‍රහ නිමිත්තෙහි කසිණ දෝස පෙනේ. මෙහි එ බඳු දෝෂ නො පෙනේ. සර්ව නිර්මල වේ. මේ ප්‍රතිභාග නිමිත්ත සියලු කර්මස්ථානයෙහි මැ නො ලැබේ. ලැබෙන්නේ දසකසිණ, දස අශුභ, කායගතාසති, ආනාපාන සති යන දෙවිසි කර්මස්ථානයෙහි ය. එහෙත් සියලු ප්‍රතිභාග නිමිති එක් බඳුය යි නො සිතිය යුතු.

**ආපොකසිණයෙහි** උද්ග්‍රහනිමිත්ත සැලෙන්නාක් බඳු ය. ප්‍රතිභාග නිමිත්ත නිශ්චල ය. අහස තුබූ මිණිතල් වැටක් හෝ මිණිමුවා දර්පණ තලයක් හෝ බඳු ය.

**තේජෝකසිණයෙහි** උද්ග්‍රහ නිමිත්ත ගිනි දැල් සිඳි සිඳී වැටෙන්නාක් බඳු ය. ප්‍රතිභාග නිමිත්ත නිශ්චල ය. අහස තුබූ රත්කම්බල කඩක් හෝ රන් තල්වැටක් හෝ රන්වැඹක් හෝ බඳු ය.

**වායොකසිණයෙහි** උද්ග්‍රහ නිමිත්ත උදුනින් බා ගත් කිරි බතෙහි හුමාලය සේ චංචල ය. ප්‍රතිභාග නිමිත්ත සන්සුන් ය. නිශ්චල ය.

**නීලකසිණයෙහි** උද්ග්‍රහ නිමිත්ත ඉදින් කසිණය නිල් මල් නම් කෙසුරු නැටි පෙති ආදිය පෙනේ. ප්‍රතිභාග නිමිත්ත අහස මිණිතල් වැටක් සේ පිරිසිදු ය.

**පීත, ලොහිත, ඔදත කසිණයන්හි** ද මෙසේ ය. වර්ණය වෙනසි.

**ආලොක කසිණයෙහි** උද්ග්‍රහ නිමිත්ත බිත්තියෙහි හෝ බිම හෝ නැගි ආලෝක මණ්ඩලයක් බඳු ය. ප්‍රතිභාග නිමිත්ත ඝන වූ ප්‍රසන්න ආලෝක පුඤ්ජයක් බඳු ය.

**ආකාසකසිණයෙහි** උද්ග්‍රහ නිමිත්ත භිත්තිපර්යන්තාදියත් සමග සිදුරක් බඳු ය. ප්‍රතිභාග නිමිත්ත ආකාශ මණ්ඩල ම ය.

**උද්ධුමාතකයෙහි** උද්ග්‍රහ නිමිත්ත විරූප වූ බිහිසුණු ඉදිමී ගත් සිරුරෙකි. ප්‍රතිභාග නිමිත්ත රිසි තාක් වළඳා හොත් ස්ථූල වූ අඟපසඟ ඇති පුරුෂයෙකි.

**විනීලකයෙහි** උද්ග්‍රහ නිමිත්ත කබර වර්ණ ය. ප්‍රතිභාග නිමිත්ත උත්සඳ වූ නීලවර්ණ ය.

**විපුබ්බකයෙහි** උද්ග්‍රහ නිමිත්ත පූයා වැගිරෙන්නාක් බඳු ය. ප්‍රතිභාග නිමිත්ත නිශ්චල ය.

**විච්ඡිද්දකයෙහි** උද්ග්‍රහ නිමිත්ත මැදින් සිඳුනා බඳු ය. ප්‍රතිභාග නිමිත්ත පරිපූර්ණ ය.

**වික්ඛායිතක, වික්ඛිත්තක, හතවික්ඛිත්තකයන්හි** ද ප්‍රතිභාග නිමිත්ත සම්පූර්ණ ය.

**ලෝහිතකයෙහි** උද්ග්‍රහ නිමිත්ත සැලෙන රත් පතාකාවක් සේ ලේ වැගිරෙන්නාක් බඳු ය. ප්‍රතිභාග නිමිත්ත නිශ්චල ය.

**පුලවකයෙහි** ද උද්ග්‍රහ නිමිත්ත සැලෙන්නාක් බඳු ය. ප්‍රතිභාග නිමිත්ත හැල් බත් පිඩක් සේ නිශ්චල ය.

අට්ඨිකයෙහි එක ඇටයක් නම් උද්ග්‍රහ නිමිත්ත හා ප්‍රතිභාග නිමිත්ත එක් බඳු ය. ඇටසැකිල්ලෙහි නම් උද්ග්‍රහ නිමිත්ත විවර සහිත ය. ප්‍රතිභාග නිමිත්ත සම්පූර්ණ ය.

කායගතාසතියෙහි උද්ග්‍රහ නිමිත්ත කේශාදීන්ගේ වර්ණ සණ්ඨාන, දිසා, ඔකාස පරිච්ඡේද වශයෙන් වැටහේ. ප්‍රතිභාග නිමිත්ත සර්වාකාරයෙන් ම පිළිකුල් වැ වැටහේ.

ආනාපානසතියෙහි ප්‍රතිභාග නිමිත්ත කපුපුළුන් සේ වාත ධාරා සේ සුවපහස් දෙමින් උපදියි. ඇතැම් කෙනෙකුන්ට තරු හෝ මිණිගුළි හෝ මුතුගුළි හෝ බඳු වැ ද ඇතැම් කෙනෙකුන්ට කපු ඇට හෝ දැව හර සූචි හෝ බඳු වැ ද ඇතැම් කෙනෙකුන්ට රිදී හවඩි හෝ මල්දම් හෝ දුම්සිලු හෝ බඳු වැ ද ඇතැම් කෙනෙකුන්ට මකුළු නූල් හෝ වලාපටල හෝ පියුම් කුසුම් හෝ රියසක් රිවිමඬල සඳමඬල හෝ බඳු වැද උපදියි.

උපචාර සමාධි හා අර්පණා සමාධි හා පවත්නේ මේ ප්‍රතිභාග නිමිත්ත අරමුණු කොටැ ගෙනැ ය.

**ප්‍රශ්න.**

1. පරිකර්මභාවනා, උපචාර භාවනා, අර්පණා භාවනා පැහැදිලි කරනු.
2. කවර ස්ථානයන්හි මේ ත්‍රිවිධ භාවනා ලැබේ ද? කවර කර්මස්ථානයන්හි නො ලැබේ ද? අර්පණා ලැබිය හැකි කර්මස්ථාන දක්වනු.
3. අසවල් කර්මස්ථානවලින් අසවල් ධ්‍යාන ලැබිය හැකිය යි කරුණු සහිත වැ පෙන්වනු.
4. පරිකර්ම නිමිති, උද්ග්‍රහ නිමිති පැහැදිලි කරනු. මේ ලැබෙන්නේ කවර කවර කර්මස්ථානයන්හි ද?
5. ඒ ඒ කර්මස්ථානයන්හි ප්‍රතිභාග නිමිතිවල ආකාර දක්වනු.

## 7. පඨවිකසිණය වඩා ප්‍රථමධ්‍යානය ලබා ගන්නා ආකාරය.

සතළිස් කර්මස්ථාන ද, ත්‍රිවිධ භාවනා ද, ත්‍රිවිධ නිමිති ද යට දක්වන ලදි. පඨවිකසිණය වඩා ප්‍රථමධ්‍යානය ලබා ගත හැකි ආකාරය මෙහි දක්වනු ලැබේ.

ආදි කර්මික වූ යමෙක් යට දැක්වුණු පරිදි පඨවිකසිණ මණ්ඩලයක් ගෙනැ ඒ අරමුණු කොටැ භාවනා කරන්නේ ද ඔහුගේ ඒ අරමුණ පරිකර්ම නිමිත්තය යි ද භාවනාව පරිකර්ම භාවනායයි ද කියනු ලැබේ. යම් විටෙක ඒ පරිකර්ම නිමිත්ත සිතට නැගුණේ ද-ඇසට පෙනුණු සේ ම සිතට පෙනේ ද එවිට ඒ සිතට නැගුණු අරමුණ උද්ග්‍රහ නිමිත්තය යි කියනු ලැබේ. දැන් ඔහුගේ භාවනාව පරිකර්ම සමාධියෙන් සමාධිමත් ය. ඒ උද්ග්‍රහ නිමිත්ත අරමුණු කොටැ පරිකර්ම සමාධිමත් භාවනායෙන් භාවනා කරත්ම යම් විටෙක ඒ උද්ග්‍රහ නිමිත්ත සමාන වූ වස්තු ධර්මයෙන් තොර වූ ප්‍රඥප්ති සංඛ්‍යාත අරමුණෙක් සිතට පෙනේ ද එවිට ප්‍රතිභාග නිමිත්ත උපන්නේය යි කියනු ලැබේ. එ තැන් පටන්

නීවරණොපද්‍රවයෙන් තොර කාමාවචර සමාධි සංඛ්‍යාත උපචාර භාවනාව ද නිපන්නේ වෙයි. එ තැන් පටන් ඒ ප්‍රතිභාග නිමිත්ත උපචාර සමාධිමත් භාවනායෙන් භාවනා කරත් ම රූපාවචර ප්‍රථම ධ්‍යානය අර්පණා වන්නේ ය.

**ශ්‍රී ශාරිපුත්‍ර සංඝරාජ මහා ස්වාමීහු මේ අර්ථය මෙසේ සමර්ථනය කරති.**

"ආදියෙහි වනාහි චතුපාරිසුද්ධි සීලය ශුද්ධ කොටැ ආවාසාදි දශවිධ පලිබොධොපච්ඡේදය කොටැ ප්‍රිය ගුරු භාවනීයාදි ගුණයෙන් සමන්විත වූ කල්‍යාණ මිත්‍රයකු සමීපයට එළඹැ තමාගේ චරිතයට අනුකූල කර්මස්ථානයක් ගෙන මහාවාසාදි අෂ්ටාදශවිධ වූ අනනුරූප විහාරය දුරු කොටැ නාතිදූර නාත්‍යාසන්නාදි වූ පඤ්චාඞ්ගයෙන් සමන්විත වූ අනුරූප විහාරයෙහි වසන්නා වූ කෙශනඛ හරණාදි වූ ක්‍ෂුද්‍ර පළිබෝධ දුරු කොටැ එක් වියත් සතරඟුල් පළල ඇති වට වූ කිසුණු මඬුල්ල අභිමුඛ කොටැ දෙරියන් වියත් හස්ත පාර්ශව ප්‍රමාණ ස්ථානයෙහි මනා කොටැ පනවන ලද වියත් සතරඟුල් පමණ උස ඇති අස්නෙහි සුවෙන් හිඳැ **"අප්පස්සාදකාමා"** යනාදීන් කාමයෙහි ආදීනව ප්‍රත්‍යවෙක්‍ෂා කොටැ සර්වදුඃඛ සමතික්‍රමයට කාරණ වූ නෛෂ්ක්‍රම්‍යයෙහි සඤ්ජතාභිලාෂා ඇතිව බුද්ධ, ධර්ම, සඞ්ඝ ගුණානුස්මරණයෙන් ප්‍රතිප්‍රමොද උපදවා **"මේ ප්‍රතිපත්ති තොමෝ සියලු බුද්ධ ප්‍රත්‍යෙකබුද්ධ ආර්ය ශ්‍රාවකයන් විසින් ප්‍රතිපන්න වූ නෛෂ්ක්‍රම්‍ය ප්‍රතිපත්තිය"** යි ප්‍රතිපත්තියෙහි සඤ්ජාත ගෞරව ඇති වැ සිත් පිහිටුවා **"අද්ධා ඉමාය පටිපත්තියා පවිවෙකසුඛස්ස භාගී භවිස්සාමි"** යි මෙසේ උත්සාහ උපදවා සම වූ ආකාරයෙන් ඇස දල්වා කිසුණෙහි වර්ණය ප්‍රත්‍යවෙක්‍ෂා නො කොටැ ලක්‍ෂණය මනස්කාර නො කොටැ වර්ණය නො හැරැ ම උත්සද වශයෙන් ප්‍රඥප්ති ධර්මයෙහි සිත් පිහිටුවා එකග වූ සිතින් **"පඨවි පඨවි"** යනාදීන් ඒ ඒ භාවනානු ක්‍රමයෙන් පෘථුවි කෘත්ස්නාදි වූ ඒ ඒ අරමුණෙහි නිමිත්ත ග්‍රහණය කරන්නාහට ඒ ආරම්මණය පරිකර්ම නිමිත්තය යි කියනු ලැබේ. ඒ භාවනා ද පරිකර්ම භාවනා නම් වේ.

මෙහි යට කී පරිද්දෙන් නිමිත්ත ග්‍රහණය කොටැ භාවනා කරන යෝගාවචරයා විසින් කලෙකින් ඇස දල්වා කලෙකින් ඇස පියාලා ආවර්ජනා කොටැ උද්ග්‍රහ නිමිත්තය ඉපදවිය යුතු.

උද්ග්‍රහ නිමිත්තය යම් තාක් කල් නො උපදී ද ඒ තාක්කල් කාල ශතයකුදු කාල සහස්‍රයකුදු ඊට වඩා ද මෙම ක්‍රමයෙන් භාවනා කටයුත්තේ යැ. එසේ භවන්නාහට යම් කලෙක්හි ඇස පියා ද ආවර්ජනා කරන්නාහට ඇස ඇල්වූ කල්හි මෙන් අරමුණු ආපාතගත වූයේ වේ ද ඒ සමයෙහි උද්ග්‍රහ නිමිත්තය උපන්නා නම් වේ. ඒ උද්ග්‍රහ නිමිත්තය ලද තැන් පටන් ඒ ස්ථානයෙහි නො හිඳැ තමා වසන්නා වූ ස්ථානයට වැදැ එහි හුන්නාහු විසින් හැවිය යුතු.

ඉදින් තරුණ වූ සමාධිය කිසි අසප්පායයෙකින් නටුයේ වී නම් නැවත ඒ ස්ථානයට ගොස් නිමිත්තය උපදවා නැවත අවුත් සුවසේ උන්නහු විසින් නැවත නැවත හැවිය යුතු. මෙසේ භවන්නාවූ යෝගාවචරයා හට අනුක්‍රමයෙන් කාමච්ඡන්දාදී නීවරණයෝ විෂ්කම්භිත

වෙති. ක්ලෙශොත්පත්තිය නො වන්නී යැ. උපචාර සමාධීන් චිත්තය මනාව පිහිටන්නේ යැ. ප්‍රතිභාග නිමිත්තය ද උපදනේ යි.

එහි උද්ග්‍රහ නිමිත්ත ප්‍රතිභාග නිමිත්තයන්ගේ වෙනස මෙසේ දතයුතු. උද්ග්‍රහ නිමිත්තයෙහි කසිණයෙහි ඇති දෝෂය පෙනෙන්නේ යැ. ප්‍රතිභාග නිමිත්තය වනාහි ථවිකායෙන් පිටත් කොටැ මදනා ලද දර්පණ තලයක් මෙන් ද සුධොත ශංඛයක් මෙන් ද මෙඝමුඛයෙන් නිෂ්ක්‍රාන්ත පූර්ණ චන්ද්‍ර මණ්ඩලය මෙන් උද්ග්‍රහ නිමිත්තය ප්‍රදාලනය කොටැ නික්මුණාක් මෙන් ඒ උද්ග්‍රහ නිමිත්තයට ශත ගුණයෙන් සහස්‍ර ගුණයෙන් සුපරිශුද්ධ වැ වැටහෙන්නේ යි. ඒ ප්‍රතිභාග නිමිත්තය පටන් යෝගාවචරයා හට පඤ්චනීවරණයෝ විෂ්කම්භිත වූවාහු ම වෙති. ක්ලේශයන්ගේ උත්පත්තිය ද නො ම වන්නී ය. උපචාර සමාධීන් චිත්තය සමාහිත වන්නේ යි.

එහි සමාධිතෙමේ උපචාර සමාධිය අර්පණා සමාධිය යි ද්විප්‍රකාර වෙයි. ඒ උපචාර සමාධියහුගේ ප්‍රතිලාභයෙහි පඤ්චනීවරණයන්ගේ ප්‍රහාණයෙන් චිත්තය සමාහිත වන්නේ ය. අර්පණා සමාධි ප්‍රතිලාභයෙහි විතර්කාදි අංශයන්ගේ පහළ වීමෙන් චිත්තය සමාහිත වන්නේ ය. ඒ සමාධීන් දෙදෙනා අතුරෙහි උපචාර සමාධියෙහි අඞ්ගයෝ ස්ථිර වැ පවත්නාහු නො වෙති. අර්පණා චිත්තයෙහි අඞ්ගයෝ ස්ථිර වැ පවත්නාහ. එසේ හෙයින් අර්පණා චිත්තය දවසක් මුළුල්ලෙහිත් සිටිනේ ය.

එහි උපචාර සමාධිය හා සමග යම් ඒ ප්‍රතිභාග නිමිත්තයෙක් උපන්නේ වේ ද ඒ යෝගාවචර එම පර්යඞ්කයෙන් ඒ ප්‍රතිභාග නිමිත්තය වඩා අර්පණාවට පැමිණෙන්නට ඉදින් සමර්ථ වී නම් යහපත. ඉදින් අසමර්ථ වී නම් චක්‍රවර්තීති ගර්භයක් මෙන් දුර්ලභ රත්නයක් මෙන් ද නිරන්තරයෙන් අප්‍රමත්තයා විසින් රක්‍ෂා කටයුතු. කියන ලද මැ යි.

**"සත්තං අප්පමත්තෙන රක්ඛිතබ්බං සතිමතා**
**නිමිත්තං රක්ඛතො ලද්ධ පරිහානි න විජ්ජති**
**.**
**ආරක්ඛණෙ අසන්තස්මිං ලද්ධං තස්ස විනස්සති**
**රක්ඛිතබ්බං හි තං තස්මා තත්‍රායං රක්ඛනා විධි**
**.**
**ආවාසො ගොචරං හස්සං පුග්ගලො භොජනං උතු**
**ඉරියාපථොති සත්තෙතෙ අසප්පායෙ විවජ්ජයෙ**
**.**
**සප්පායෙ සත්ත සෙවෙථ එවං හි පටිපජ්ජතො**
**න චිරෙනෙ ච කාලෙන හොති භික්ඛුස්ස අප්පනා"** යි

මෙසේ දශවිධ අර්පනා කෞශල්‍යය සම්පාදනය කරන්නා වූ යෝගාවචරයා හට ප්‍රතිලබ්ධ වූ ප්‍රතිභාග නිමිත්තය විෂය කොටැ අර්පණා පවත්නේ ය. ඉදින් මෙසේ අර්පණාව නො උපදනේ වී නම් නුවණැත්තා වූ යෝගාවචර තෙමේ තමාගේ චිත්ත ප්‍රවෘත්ති ආකාරය සලකා නැවත නැවත වීර්යයාගේ සමත්‍වය යොදන්නේ ය. අත්‍යාරබ්ධා වීර්යය හැර

ලිනොද්ධත භාවයෙන් චිත්තය මුදා සම කොටැ සිත මෙහෙයන්නා හට දැන්ම අර්පණා සමාධි උපදනේ ය යි කී සමයෙහි භවාඞ්ග චිත්තය සිඳැ ගෙනැ එම පෘථිවි කසිණය අරමුණු කොටැ මනොද්වාර වීථියෙහි මනොද්වාරාවර්ජන චිත්තය උපදනේ ය.

තදනන්තර වැ එම අරමුණු කොටැ ජවනයෝ සතර දෙනෙක් හෝ පස්දෙනෙක් හෝ උපදනාහ. ජවනයන් සතරදෙනා ද්වාරයෙහි ප්‍රථම ජවනය අර්පණාවට පරිකර්ම වැ සිටි හෙයින් පරිකර්මය යි කියා ද සමීපචාරී හෙයින් උපචාරය යි කියා ද කියනු ලැබෙයි. දෙවන චිත්තය පූර්වභාගයෙහි පරිකර්මචිත්තයන්ට ද මත්තෙහි අර්පණාවටද අනුකූල බව හෙයින් අනුලෝම නම් වෙයි. තුන්වන චිත්තය පරිත්ත ගොත්‍රය පෘථග්ජන ගොත්‍රය ද අභිභවනය කරන හෙයින් මහද්ගත ගොත්‍රය ද වඩන හෙයින් ගොත්‍රභූ නම් වෙයි. සතර වැනි වැ අර්පණා චිත්තය උපදනේ යි. ජවනයන් පස්දෙනකු උපදනා ද්වාරයෙහි ප්‍රථම ජවනය යට කී පරිද්දෙන් පරිකර්ම නම් වෙයි. දෙවන චිත්තය උපචාර නම් වෙයි. තුන්වන චිත්තය අනුලෝම නම් වෙයි. සතරවන චිත්තය ගොත්‍රභූ නම් වෙයි. පස්වැනි වැ අර්පණාව උපදනේ යි. මෙසේ අර්පණාචිත්තය සතරවැනි වැ හෝ පස්වැනි වැ මුත් සවැනි වැ හෝ සත්වැනි වැ හෝ නො උපදනේ යි කුමක් හෙයින් ද යත්?

යම්සේ අලබ්ධ වූ ආසෙවන ඇති අනුලෝම චිත්තය ගොත්‍රභූ චිත්තය උපදවන්නට අසමර්ථ වූයේ වේ ද ලබ්ධ වූ ආසෙවන ප්‍රත්‍යය ඇත්තේ ද සවැනි වැ සත්වැනි වැ භවාඞ්ගයට ආසන්න බැවින් ප්‍රපාතාසන්න පුරුෂයා මෙන් අර්පණා වශයෙන් පිහිටන්නට අසමර්ථ වේ ද එසේ හෙයින් සතර වැන්නෙන් මැත හෝ පස්වැන්නෙන් මත්තෙහි හෝ අර්පණා නොවන්නේ යය යි දත යුතු”යි.

ප්‍රශ්න.

1. ප්‍රථමධ්‍යානය ලැබීමට ආදි කර්මිකයා පළමු කොටැ කිමෙක් කළ යුතු ද?
2. පරිකර්ම නිමිත්ත හා පරිකර්ම භාවනා කවරේ ද?
3. උද්ග්‍රහ නිමිත්ත හා ප්‍රතිභාග නිමිත්ත දක්වනු.
4. උපචාර භාවනා හා අර්පණා භාවනා කෙසේ ද?
5. ප්‍රථමධ්‍යාන චිත්තවීථී දෙක අඳිනු.

## 8. පංචවිධ වසිතා හා ද්විතීය ධ්‍යානාදිය.

ප්‍රථම ධ්‍යානය ලත් යෝගී විසින් **ආවජ්ජන, සමාපජ්ජන, අධිට්ඨාන, වුට්ඨාන, පච්චවෙක්ඛන** යන පස් ආකාරයෙන් එය වශප්‍රාප්ත කැරැ ගත යුතු ය.

**ආවජ්ජනවසිතා**-ප්‍රථම ධ්‍යානයෙන් නැගී පළමු කොටැ විතර්කය ආවර්ජනය කළ යුතු ය. ඉක්බිති විචාරය ඉක්බිති පීතිය ඉක්බිති සුඛය ඉක්බිති එකග්ගතාව ආවර්ජනය කළ යුතු

ය. නැවත ද විතර්කය ආවර්ජනය කළ යුතු ය. ඉක්බිති විචාරාදිය පිළිවෙලින් ආවර්ජනය කළ යුතු. මෙසේ ආවර්ජනය කරත් ම ජවන සතර පසකින් භවඞ්ග කීපයකින් ඔබ්බට නොගොස් නැවත නැවත ධ්‍යානාඞ්ග ආවර්ජනය කරන්නට සමර්ථ බව **ආවජ්ජනවසිතා** නම් වේ.

**සමාපජ්ජනවසිතා**-ධ්‍යානයට සමවදනට කැමැති වූ ඇසිල්ලෙහි ශීඝ්‍ර වැ එයට සමවදනට සමර්ථ බව **සමාපජ්ජනවසිතා** නම් වේ.

**අධිට්ඨානවසිතා**-සම වැදුණු ධ්‍යානය අසුරුසණක් හෝ ඉන් වැඩියක් හෝ කැමැති තාක් කල් තබා ගන්නට සමර්ථ බව **අධිට්ඨානවසිතා** නම් වේ.

**වුට්ඨානවසිතා**-සමවැදුණු ධ්‍යානයෙන් කැමැති ඇසිල්ලෙහි ශීඝ්‍ර වැ නැඟී සිටින්නට සමර්ථ බව **වුට්ඨානවසිතා** නම් වේ.

**පච්චවෙක්ඛණවසිතා**-ආවජ්ජනවසිතාව සිද්ධ කල්හි මෙ ද සිද්ධ වුයේ වේ. "විතර්කාදි අඞ්ගයන් විෂය කොටැ ශීඝ්‍ර වැ ඉපද වූ ආවර්ජනානන්තර වැ ප්‍රත්‍යවෙක්‍ෂා ජවනයන් ලසු කොටැ පවත්නට සමර්ථ බව ප්‍රත්‍යවෙක්‍ෂාවශිතා නම් වේ." යනු පුරාණ සන්නයි.

මෙසේ පස් ආකාරයෙකින් ප්‍රථමධ්‍යානය වශප්‍රාප්ත කොටැ ගෙනැ ඉක්බිති ද්විතීය ධ්‍යානාදිය උපදවනු කැමැති නම් විතර්කාදි ඖදාරික අඞ්ග බැහැර කරනු පිණිස ද විචාරාදි සූක්‍ෂම අඞ්ග උපදවනු පිණිස ද භාවනා කොට ද්විතීය ධ්‍යානාදිය අර්පණාවත් කැරැ ගත යුතු. මේ සඳහා විස්තරයෙක් යට **චිත්තපාදයෙහි** දක්වන ලදි. **ශ්‍රී ශාරිපුත්‍ර සංඝරාජ ස්වාමීහු එය මෙසේ පහද දෙති.**

## ද්විතීය ධ්‍යානය

"මෙහි ආවර්ජනාදී පඤ්චවශිතායෙහි වශීභූතයා විසින් ප්‍රගුණ වූ ප්‍රථමධ්‍යානයෙන් නැගී "මේ සමාපත්ති තොමෝ ආසන්න නීවරණ සංඛ්‍යාත ප්‍රතිපක්‍ෂයෙන් ඇත්තීය යි ද විතර්කයාගේ ඖදාරිකත්වයෙන් අඞ්ග දුර්බලය යි ද ඒ ප්‍රථමධ්‍යානයෙහි දෙෂ දැක ද්විතීය ධ්‍යානය ශාන්ත හෙයින් මනස්කාර කොටැ ප්‍රථමධ්‍යානයෙහි නිකාන්ති දුරු කොටැ ද්විතීය ධ්‍යානාධිගමය පිණිස භාවනායොග කටයුත්තේ ය. ඉක්බිති ප්‍රථමධ්‍යානයෙන් නැඟී ස්මෘති සම්ප්‍රඥානයෙන් යුක්ත වූ ධ්‍යානාඞ්ගයන් ප්‍රත්‍යවෙක්‍ෂා කරන්නා වූ ඒ යෝගාවචරයා හට යම් කලෙක්හි විතර්කයා ඖදාරික හෙයින් වැටහේ ද විචාර ප්‍රීතිසුඛ ද චිත්තෙකාග්‍රතාව ද යනු මොහු ශාන්ත හෙයින් වැටහෙත් ද ඒ සමයෙහි ඕහට ඖදාරිකාඞ්ග ප්‍රහාණය පිණිස ශාන්තාඞ්ග ප්‍රතිලාභ පිණිස ද එම ප්‍රතිභාග නිමිත්තය "පඨවි පඨවි" යි නැවත මනස්කාර කරන්නා ම ද්විතීය ධ්‍යානය උපදනේය යි යන සමයෙහි භවාඞ්ගය සිඳ ගෙනැ එම පෘථිවි කසිණය අරමුණු කොටැ මනොද්වාරාවර්ජනය උපදනේ ය. ඉක්බිති එම අරමුණ නිමිත්ත කොටැ ගෙනැ යට කී පරිද්දෙන් සතර පස් ජවන කෙනෙක් පරිකර්මාදි නාමයෙන් උපදිති. ඔවුන්ගේ අවශානයෙහි විතර්ක වර්ජිත වූ විචාර ප්‍රීති සුඛ

චිත්තෛකාග්‍රතායෙන් යුක්ත වූ එක ම රූපාවචර ද්විතීයධ්‍යානය උපදනේ ය. සෙස්ස යට කී පරිද්දෙන් දත යුත්තේ යි.

යම්සේ ප්‍රථමධ්‍යානයෙන් උපචාරක්‍ෂණයෙහි නීවරණයෝ ප්‍රහීණ වෙත් ද එපරිද්දෙන් ද්විතීය ධ්‍යානයාගේ උපචාරක්‍ෂණයෙහි විතර්කය ප්‍රහීණ වන්නේ නො වෙයි, අර්පණායෙහි ම විතර්ක රහිත වූ ද්විතීය ධ්‍යානය උපදනේ යි.

## තෘතීය ධ්‍යානය

මෙසේ ද්විතීය ධ්‍යානය අධිගත කල්හි යට කී පරිද්දෙන් ම ආවර්ජනාදී පඤ්චශිතායෙහි කරන ලද පරිචය ඇති යෝගාවචරයා විසින් ප්‍රගුණ වූ ද්විතීය ධ්‍යානයෙන් නැඟී "මේ සමාපත්ති තොමෝ ආසන්න විතර්ක සංඛ්‍යාත ප්‍රතිපක්‍ෂයා ඇත්තීය යි ද විචාරයාගේ ඖදාරිකත්වයෙන් අඞ්ග දුර්බලය"යි ද ඒ ද්විතීය ධ්‍යානයෙහි දෝෂ දැක තෘතීය ධ්‍යානය ශාන්ත හෙයින් සලකා ද්විතීයධ්‍යානයෙහි නිකාන්තිය දුරු කොටැ තෘතීය ධානාධිගමය පිණිස භාවනා යෝග කටයුත්තේ ය. එහි යෙදෙන්නා වූ ස්මෘතිසම්ප්‍රඥානයෙන් යුක්ත වූ යෝගාවචරයා හට ද්විතීය ධ්‍යානයෙන් නැඟී ධ්‍යානාඞ්ගයන් ප්‍රත්‍යවේක්‍ෂා කරන්නා හට විචාරය ඖදාරික හෙයින් වැටහෙන්නේ ය. ප්‍රීති සුඛ ද චිත්තෛකාග්‍රතාව ද ශාන්ත හෙයින් වැටහෙන්නේ ය. ඒ සමයෙහි ඖදාරිකාඞ්ග ප්‍රහාණය පිණිස ද ශාන්තාඞ්ග ප්‍රතිලාභය පිණිස ද එම ප්‍රතිභාග නිමිත්ත "**පඨවි පඨවි**" කියා නැවත නැවත මනස්කාර කරන්නාහට දැන් තෘතීයධ්‍යාන උපදනේ ය යනාදීන් යට ප්‍රථම ධ්‍යානයෙහි කී පරිද්දෙන් විචාර වර්ජිත වූ ප්‍රීති සුඛ චිත්තෛකාග්‍රතා වශයෙන් ත්‍ර්‍යඞ්ගික වූ තෘතීය ධ්‍යානය ද,

## චතුර්ථධ්‍යානය

එසේ ම යට කී පරිද්දෙන් ප්‍රීති වර්ජිත වූ සුඛ චිත්තෛකාග්‍රතායෙන් යුක්ත වූ චතුර්ථධ්‍යානය ද,

## පඤ්චමධ්‍යානය

සුඛවර්ජිත වූ උපෙක්‍ෂා චිත්තෛකාග්‍රතායෙන් යුක්ත වූ පඤ්චමධ්‍යානය ද උපදනේ යි. මෙහි දු ප්‍රීත්‍යාදි ඖදාරිකාඞ්ගයන්ගේ ප්‍රහාණය උපචාරක්‍ෂණයෙහි නො වැ අර්පණාක්‍ෂණයෙහි වන්නේය යි දත යුතු යි. "මෙසේ පඨවිකසිණාදි දෙවිසි කර්මස්ථානයෙහි ප්‍රතිභාග නිමිත්ත ලැබේ. සෙසු බුද්ධානුස්මෘති ආදින් අතුරෙන් අප්පමඤ්ඤා සතර සත්ත්ව ප්‍රඥප්තියෙහි පවතී.

## ප්‍රශ්න.

1. පඤ්චවශිතා විස්තර කරනු.
2. ප්‍රථමධ්‍යානය ලැබැ ගන්නා ආකාරය කෙසේ ද?
3. ද්විතීය ධ්‍යානය ලැබැ ගන්නා ආකාරය කෙසේ ද?
4. තෘතීය ධ්‍යානය ලැබැ ගන්නා ආකාරය කෙසේ ද?
5. චතුර්ථ පඤ්චම ධ්‍යානය ලැබැ ගන්නා ආකාරය කෙසේ ද?

# 9. අරූපාවචර ධ්‍යාන

## ආකාසානඤ්චායතනය.

දස කසිණ අතුරෙන් ආකාස කසිණය හැර සෙසු නවයෙන් කිසි කසිණයක් මෙනෙහි නො කිරීම වශයෙන් උගුළා ලත් ආකාසය "**අනන්තො ආකාසො අනන්තො ආකාසො**"යි පරිකර්ම කරන්නා හට ආකාසානඤ්චායතන සංඛ්‍යාත ප්‍රථම රූප්‍ය විඥානය අර්පණා වන්නේ ය. ආකාස කසිණය උගුළා ලිය නො හැකි ය.

**ශාරිපුත්‍ර සාමි එය මෙසේ විස්තර කරයි**

"මෙහි අරූපාවචර ධ්‍යාන උපදවනු කැමැති යෝගාවචර තෙමේ රූපය නිසා දණ්ඩාදාන ශස්ත්‍රාදාන කලහ විග්‍රහ විවාද යන මොවුන්ගේ ද චක්‍ෂුශ්ශ්‍රොත්‍රරෝගාදි ආබාධ සහස්‍රයන්ගේ ද වශයෙන් කරජකායයෙහි ආදීනව දැක මෙකී ආදීනවා අරූප්‍යයෙහි සර්වප්‍රකාරයෙන් නැතැ යි රූපයාගේ සමතික්‍රමණය පිණිස පරිච්ඡින්නාකාස කසිණය හැර පඨවි කසිණාදි වූ නව කසිණයන් අතුරෙන් එක්තරා කසිණයෙක්හි චතුර්ථධ්‍යාන උපදවා ඒ ධ්‍යාන යට අරමුණ වූ කසිණ රූපයෙහි උද්වෙග ඇති ව ඒ එයින් දුරු වනු කැමැත්තේ පඤ්චප්‍රකාරයෙකින් පුරුදු කරන ලද වසිතා ඇති වැ ප්‍රගුණ වූ රූපාවචර චතුර්ථධ්‍යානයෙන් නැගී මා විසින් කළකිරෙන ලද මේ රූපය අරමුණු කරන්නේය යි කියා ද ආසන්න සෞමනස්‍ය සංඛ්‍යාත ප්‍රතිපක්‍ෂයා ඇත්තේය යි කියා ද ශාන්ත විමොක්‍ෂ හෙයින් ඖදාරිකය යි කියා ද ධ්‍යානයෙහි ආදීනව දක්නේ ය. දැක එහි නිකාන්තිය දුරු කොටැ ඒ කසිණ චක්‍රවාට පර්යන්ත කොටැ හෝ තමා කැමැති යම් කට්ටලයකට හෝ පතුරුවා එයින් ස්පෘෂ්ට වූ ආකාශය අරභයා "**ආකාසො ආකාසො**" යි ද "**අනන්තො ආකාසො අනන්තො ආකාසො**" යි නැවත නැවත මනස්කාර කරන්නා හට නීවරණයෝ ප්‍රහීණ වෙති. උපචාරය හා සමග චිත්තය මනා කොටැ පිහිටන්නේ ය. එම නිමිත්ත නැවත නැවත ආසේවනය කරන්නා හට පඨවිකසිණාදියෙහි රූපාවචර චිත්තය මෙන් ආකාශය විෂය කොටැ ආකාසානඤ්චායතන චිත්තය පිහිටන්නේ යි. මෙබඳු පූර්ව භාගයෙහි කාමාවචර චිත්තයෝ පරිකර්මාදි නාමයෙන් තුන්දෙනෙක් හෝ සතර දෙනෙක් හෝ උපෙක්‍ෂා වේදනා සම්ප්‍රයුක්ත වූවාහු ම වෙති. සතර වැනි වැ හෝ පස්වැනි වැ අරූපාවචර චිත්තය උපදනේ යි. සෙස්ස පඨවිකසිණයෙහි කී පරිද්දෙන් දත යුත්තේ ය. මේ වනාහි වෙනස යි. මෙසේ අරූපාවචර චිත්තය උපන් කල්හි ඒ යෝගාවචර තෙම පූර්වයෙහි කසිණ මණ්ඩලය ධ්‍යාන චක්‍ෂුසින් බලමින් වැසැ "**ආකාසො ආකාසො**" යන පරිකර්ම මනසිකාරයන් ඒ නිමිත්තය වහා දුරු කරන ලද කල්හි ආකාශය ම බලමින් වසන්නේ යි.

## විඤ්ඤාණඤ්චායතනය

ආකාසානඤ්චායතනය ලත් යෝගී ද්විතීයාරූප්‍යය ලබනු කැමැත්තේ ඒ තමාගේ ආකාසානඤ්චායතන චිත්තය ම අරමුණු කොටැ ගෙනැ "**අනන්තං විඤ්ඤාණං අනන්තං**

විඤ්ඤාණං" යි භාවනා කරන්නේ ය. එසේ භාවනා කරත් ම යථාක්‍රමයෙන් ද්විතීයාරූප්‍ය සංඛ්‍යාත විඤ්ඤාණඤ්චායතනය අර්පණා වන්නේය.

**ශාරිපුත්‍ර ස්වාමී ඒ මෙසේ දක්වයි.**
"මෙහි විඤ්ඤාණඤ්චායතන ධ්‍යානය උපදවනු කැමැති යෝගාවචර තෙම පස් ආකාරයෙකින් ආකාසානඤ්චායතන සමාපත්තියෙහි පුරුදු කරන ලද වශිතා ඇත්තේ මේ සමාපත්ති තොමෝ ආසන්න රූපාවචර ධ්‍යාන සංඛ්‍යාත ප්‍රතිපක්ෂයෙන් ඇත්තීය යි ද, විඤ්ඤාණඤ්චායතනය මෙන් නො මැ ශාන්තය යි කියා ද ආකාසානඤ්චායතනයෙහි ආදීනව දැකැ එහි නිකාන්ති දුරු කොටැ විඤ්ඤාණඤ්චායතනය ශාන්ත හෙයින් මනස්කාර කෙරෙයි. ඒ ආකාශස්ඵරණය කොටැ සිටියා වූ විඤ්ඤාණය "**විඤ්ඤාණං විඤ්ඤාණං**" කියා නැවත නැවත මනස්කාර කරන්නා හට එම නිමිත්තයෙහි නැවත නැවත චිත්තය හසුරුවන්නා හට නීවරණයෝ විෂ්කම්භිත වෙති. ස්මෘතිය එහි ම පිහිටන්නේ ය. උපචාරය හා සමග චිත්තය සමාහිත වන්නේ ය. එ ම නිමිත්තය නැවත ආසෙවන වශයෙන් බහුල කරන්නා හට ආකාශය විෂය කොටැ ආකාසානඤ්චායතනය මෙන් ආකාශයෙහි පතළා වූ විඤ්ඤාණය විෂය කොටැ විඤ්ඤාණඤ්චායතන චිත්තය පිහිටන්නේයි. අර්පණා ක්‍රම පෙර කී පරිද්දෙන් දත යුත්තේ ය.

## ආකිඤ්චඤ්ඤායතනය.

විඤ්ඤාණඤ්චායතනය ලබත් ම ඔහුගේ ආකාසානඤ්චායතනය අභාවයට යන්නේ ය. හෙතෙම තෘතීයාරූප්‍යය ලබනු කැමැත්තේ ඒ අභාව මාත්‍රය අරමුණු කොටැ "**නත්‍ථි කිඤ්චි නත්‍ථි කිඤ්චි**" යි භාවනා කරන්නේ ය. එසේ භාවනා කරත් ම ඔහුට යථා ක්‍රමයෙන් තෘතීයාරූප්‍යසංඛ්‍යාත ආකිඤ්චඤ්ඤායතනය අර්පණා වන්නේ ය.

**ශාරිපුත්‍ර ස්වාමී එය මෙසේ දක්වයි.**
"මෙහි තෘතීයාරූප්‍යය උපදවනු කැමැත්තා වූ යෝගාවචර තෙමේ යට කී පරිද්දෙන් පඤ්චවශිත ප්‍රාප්ත වූයේ මේ සමාපත්ති තොමෝ ආසන්න ආකාසානඤ්චායතන සංඛ්‍යාත ප්‍රතිපක්ෂයන් ඇත්තීය යි ද ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය මෙන් ශාන්ත නො වන්නීය යි කියා ද විඤ්ඤාණඤ්චායතනයෙහි ආදීනව දැකැ එහි නිකාන්ති දුරු කොටැ ආකිඤ්චඤ්ඤායතන ශාන්ත හෙයින් මනස්කාර කොටැ විඤ්ඤාණඤ්චායතනයට අරමුණු වූ ආකාසානඤ්චායතන විඤ්ඤාණයාගේ අභාවය "නත්‍ථි නත්‍ථි" කියා හෝ "**සුඤ්ඤං සුඤ්ඤං**" කියා හෝ "**විවිත්තං විවිත්තං**" කියා හෝ නැවත නැවත මනසකාර කරන්නා හට ඒ නිමිත්තයෙහි ම චිත්තය හසුරු වන්නා හට නීවරණයෝ විෂ්කම්භිත වෙති. ස්මෘතිය එහි ම පිහිටන්නී ය. උපචාරය හා සමග චිත්තය සමාහිත වන්නේ ය. මෙම නිමිත්තය නැවත නැවත ආසේවනය කරන්නා හට බහුල කරන්නා හට ආකාශයෙහි පතළා වූ මහග්ගත විඤ්ඤාණයෙහි විඤ්ඤාණඤ්චායතනය මෙන් ආකාශය ඵරණය කොටැ ප්‍රවෘත්ත වූ මහග්ගත විඤ්ඤාණයාගේ සුඤ්ඤ, විවිත්ත, නාස්තිත්ව විෂය කොටැ ආකිඤ්චඤ්ඤායතන චිත්තය පිහිටන්නේ යි. මෙහිදු අර්පණාක්‍රම යට කී පරිද්දෙන් දත යුත්තේ ය. එහි අර්පණා චිත්තය උපන් කල්හි ඒ යෝගාවචර තෙමේ ද්විතීයාරූප්‍ය විඥානයාගේ අපගම සංඛ්‍යාත වූ අභාවය ම දකිමින් වසන්නේ යි."

**නෙවසඤ්ඤානාසඤ්ඤයතනය.**

තතියාරූප්‍යය අරමුණු කොටැ ගෙනැ "**සන්තමෙතං පණීත මෙතං**" යි භාවනා කරත් ම චතුර්ථාරූප්‍ය සංඛ්‍යාත නෙවසඤ්ඤානාසඤ්ඤායතනය අර්පණා වන්නේ යි.

විස්තර මෙසේ ය:

"මෙහි චතුර්ථාරූප්‍ය විඥානය උපදවනු කැමැති යෝගාවචර තෙමේ ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියෙහි පුරුදු කරන ලද පඤ්චවශිතා ඇත්තේ මේ සමාපත්ති තොමෝ ආසන්න විඤ්ඤාණඤ්චායතන සංඛ්‍යාත ප්‍රතිපක්ෂයන් ඇත්තීය යි ද, නේවසඤ්ඤානාසඤ්ඤායතනය මෙන් ශාන්ත නොවන්නීය යි කියා ද ආකිඤ්චඤ්ඤානාසඤ්ඤායතනයෙහි ආනිසංස දැකැ ආකිඤ්චඤ්ඤායතනය නිකාන්තිය දුරු කොටැ නේවසඤ්ඤානාසඤ්ඤායතනය ශාන්ත හෙයින් මනස්කාර කොටැ ද්විතීයරූප්‍ය විඥානයාගේ නාස්තිත්‍වය විෂය කොටැ ප්‍රවෘත්ති වූ ආකිඤ්චඤ්ඤායතන චිත්තය "**සන්තමෙතං පණීතමෙතං**" කියා නැවත ආවර්ජනා කරන්නා හට එම නිමිත්තයෙහි චිත්තය නැවත නැවත හසුරු වන්නා හට නීවරණයෝ විෂ්කම්භිත වෙත්. එහි ම ස්මෘතිය පිහිටන්නී ය. උපචාරය හා සමග චිත්තය සමාහිත වන්නේ යි. මෙසේ ඒ නිමිත්තය ආසේවනය බහුලීකරණ කරත් කරත් විඤ්ඤාණාපගමය විපය කොටැ උපන් ආකිඤ්චඤ්ඤායතන සංඛ්‍යාත චතුඃස්කන්ධ විෂය කොටැ නේවසඤ්ඤානාසඤ්ඤායතන චිත්තය පිහිටන්නේ යි. මෙහි දු අර්පණා ක්‍රම යට කී පරිද්දෙන් දත යුතුයි.

ධ්‍යාන උපදවීමෙන් රූපි අරූපි බ්‍රහ්මලෝක සැප ද, අභිඥාද දිට්ඨධම්ම සුඛ ද, විදර්ශනා ද ලබාගත හැකි ය.

**ප්‍රශ්න.**

1. ආකාසානඤ්චායතනය ලැබිය හැක්කේ කවරකුට ද? එහි අරමුණ කිමෙක් ද? එය ලබන ආකාරය දක්වනු.
2. විඤ්ඤාණඤ්චායතනය ලබන ආකාරය දක්වනු.
3. ආකිඤ්චඤ්ඤායතනය ලබන ආකාරය දක්වනු.
4. නෙවසඤ්ඤානාසඤ්ඤායතනය පැහැදිලි කරනු.
5. ධ්‍යාන ලැබීමෙන් ලැබෙන ඵලය කිමෙක් ද?

## 10. (පඤ්චාභිඥා) ඍද්ධිවිධි.

ධ්‍යාන උපදවීමෙන් අභිඥා ලද හැකිය යි යට කියන ලදි. අභිඥා නම් විශිෂ්ට ඥාන විශේෂයෙකි. ඒ වනාහි **ඉද්ධිවිධ, දිබ්බසොත, පරචිත්තවිජානන, පුබ්බෙනිවාසානුස්සති,** දිබ්බචක්ඛු යි පස් වැදැරුම් වේ.

අභිඥා ලබනු කැමැති ධ්‍යානලාභී විසින් භූත කසිණ සතරෙහි ද වර්ණ කසිණ සතරෙහි ද යන අට කසිණයෙහි වෙන් වෙන් වැ අෂ්ට සමාපත්ති උපදවිය යුතු. (මෙහි අෂ්ට සමාපත්ති යනු චතුෂ්කනයයෙන් කී බව දත යුතු. එයින් රූපී අරූපී සමාපත්ති නවය ම කියවිණ) එසේ උපදවා කසිණානුලෝම, කසිණපටිලොම, කසිණානුලොම පටිලොම, ඣානානුලොම, ඣානපටිලොම, ඣානානුලොම පටිලොම, ඣානුක්කන්තික, කසිණුක්කන්තික, ඣානකසිණුක්කන්තික, අඞ්ගසඞ්ගන්තික, ආරම්මණසංකන්තික අඞ්ගාරම්මණ සඞ්කන්තික අඞ්ගවවත්‍ථාපන ආරම්මණවවත්‍ථාපන යන තුදුස් ආකාරයෙන් සිත පුරුදු කළ යුතු.

**කසිණානුලොම** නම් මුල සිට අග දක්වා කසිණ පිළිවෙලින් ධ්‍යානයට සම වැදීම ය. පළමුකොට පඨවි කසිණයෙහි ධ්‍යානයට සම වැද ඉක්බිති ආපොකසිණයෙහි ඉක්බිති තේජොකසිණයෙහි මේ ආදී වශයෙන් අට කසිණයෙහි ම සිය දහස් වරකුදු ධ්‍යානයට සම වදින්නේ ය.

**කසිණපටිලොම** නම් අග සිට මුල දක්වා ධ්‍යානයට සම වැදීම ය. පළමු කොටැ ඔදාත කසිණයෙහි ධ්‍යානයට සම වැද ඉක්බිති ලොහිත කසිණයෙහි ඉක්බිති පීත කසිණයෙහි මේ ආදී වශයෙන් අග සිට මුල තෙක් සිය දහස් වරකුදු ධ්‍යානයට සම වදින්නේ ය.

**කසිණානුලොම පටිලොම** නම් මෙසේ මුල සිටැ අග දක්වා ද ධ්‍යානයට සම වැදීම ය.

**ඣානානුලොම** නම් ධ්‍යාන පිළිවෙලින් සම වැදීම ය. පළමු ප්‍රථමධ්‍යානයට සම වැද ඉක්බිති ද්විතීයධ්‍යානයට මේ ආදි වශයෙන් නේවසඤ්ඤානාසඤ්ඤායතනය තෙක් සම වදින්නේ ය.

**ඣානපටිලොම** නම් නේවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි පටන් ප්‍රථමධ්‍යානය දක්වා සම වැදීම ය.

**ඣානානුලොම පටිලොම** නම් මෙසේ මුල සිට අග දක්වා ද සම වැදීම ය.

**ඣානුක්කන්තික** නම් ධ්‍යාන එකක් හැරැ එකකට සම වැදීම ය. පඨවි කසිණයෙහි ප්‍රථමධ්‍යානයට සමවැද එහි මැ තෘතීය ධ්‍යානයට සමවැද එම උගුළා ආකාශානඤ්චායතනයට ද එයින් ම ආකිඤ්චඤ්ඤායතනයට ද සම වදින්නේ ය. ආපොකසිණාදියෙහි ද මෙසේ ය.

**කසිණුක්කන්තික** කසිණ එකක් හැරැ එකකට සමවැදීමය පඨවි කසිණයෙහි ප්‍රථමධ්‍යානයට සම වැදැ ඉක්බිති තේජොකසිණයෙහි ද ඉක්බිති නීලකසිණයෙහි ද ඉක්බිති ලොහිත කසිණයෙහි ද ප්‍රථමධ්‍යානයට ම සම වදින්නේ ය. ද්විතීයධයානාදියට ද මෙසේ ය.

**ඣානකසිණුක්කන්තික** නම් ධ්‍යාන හා කසිණ දෙකොටස ම එකක් හැර එකකට සම වැදීම ය. පඨවි කසිණයෙහි ප්‍රථම ධ්‍යානයට සමවැද තේජොකසිණයෙහි තෘතීයධ්‍යානයට සම වැදීම ආදි වශයෙනි.

**අඞ්ගසඞ්කන්තික** නම් අඞ්ග පිළිවෙලින් සම වැදීම ය. පඨවි කසිණයෙහි ප්‍රථමධ්‍යානයට සම වැදී එහි ම ද්විතීය ධ්‍යානාදියට ද සම වදින්නේ ය.

**ආරම්මණසඞ්කන්තික** නම් ආරම්මණ පිළිවෙලින් සම වැදී ම ය. පඨවිකසිණයෙහි ප්‍රථමධ්‍යානයට සමවැද ආපොකසිණාදියෙහි ද ප්‍රථමධ්‍යානයට සම වදින්නේ ය. සෙස්සෙහි ද එසේ ය.

**අඞ්ගාරම්මණ සඞ්කන්තික** නම් අඞ්ග අරමුණු දෙකටම එකන්තරික වශයෙන් සම වැදීම ය. පඨවි කසිණයෙහි ප්‍රථම ධ්‍යානයට සමවැද ආපොකසිණයෙහි ද්විතීය ධ්‍යානයට ද තේජො කසිණයෙහි තෘතීයධ්‍යානයට ද සම වදින්නේ ය. සෙස්ස ද එසේ ය.

**අඞ්ගවවත්‍ථාපන** නම් ප්‍රථමධ්‍යානය පඤ්චාඞ්ගික ය යනාදී වශයෙන් අඞ්ගමාත්‍ර ව්‍යවස්ථා කිරීම ය.

**ආරම්මණවවත්‍ථාපන** නම් යම් පඨවි කසිණය මේ ආපො කසිණය යනාදී වශයෙන් ආරම්මණ මාත්‍ර ව්‍යවස්ථා කිරීම ය.

මේ තුදුස් ආකාරයෙන් සිත පුරුදු නො කොට ඍද්ධි විධි ලබන්නේය යනු කිසි කලෙක සිද්ධ නොවන්නෙකි. පළඳනා කරනු කැමැති රන්කරු රන් මනා වැ මෘදු කැර ගත යුතු ය. බඳුන් කරන කුඹලා මැටි මනා වැ පදම් කැර ගත යුතු ය. එසේ ම ඍද්ධි විධි කරනු කැමැති යෝගී මේ තුදුස් ආකාරයෙන් සිත පිළියෙල කැර ගත යුතු ය. එසේ පිළියෙල කැර ගත් කල්හි ඔහුගේ සිත පිරිසිදු ය. ප්‍රභාස්වර ය, අනඞ්ගණ ය, උපක්ලේශ රහිත ය, මෘදු ය. කර්මණ්‍ය ය, ස්ථිත ය, අචඤ්චල ය, එවිට ම ඔහුට ඍද්ධි විධි පිණිස තමාගේ සිත නමාලිය හැකි ය.

ඍද්ධි වනාහි අධිට්ඨාන ඍද්ධි විකුබ්බන ඍද්ධි, මනොමය ඍද්ධි, ඤාණවිප්ඵාර, ඍද්ධි සමාධිවිප්ඵාර ඍද්ධි, අරිය ඍද්ධි කම්ම විපාකජ ඍද්ධි, පුණ්‍යවත් ඍද්ධි විජ්ජාමය ඍද්ධි, පයොගපච්චය ඍද්ධි ය යි දස වැදැරුම් වේ.

අධිෂ්ඨාන වශයෙන් නිපදෙන ඍද්ධි **අධිෂ්ඨාන ඍද්ධි** යි තෙමේ එකෙක් වැ සියයෙක් දහසෙක් වේවා යි ඉටු කල්හි එසේ වන්නේ ය.

ප්‍රකෘති ශරීරය හැර අන්‍ය වෙශයෙන් පෙනී සිටීම **විකුබ්බන ඍද්ධි** යි. තෙමේ භික්‍ෂු වැ කුමාර වශයෙන් හෝ හස්ති ආදි වශයෙන් හෝ පෙනී සිටින්නේ ය.

ස්වකීය ශරීරය ඇතුළෙහි අන්‍ය වූ මනෝමය ශරීර නිපදවීම **මනෝමය ඍද්ධි** යි. හේ සිය සිරුර සිදුරෙක් වේවා යි ඉටා එහි අන්‍ය කයක් මවා කොපුවෙන් කඩුව මෙන් එය ඇද දක්වන්නේ ය.

ඥානානුභාවයෙන් නිපදන විශේෂ අනුහස **ඤාණවිප්ඵාර ඍද්ධි** යි. බක්කුල ස්වාමි ද සංකිච්ච ස්වාමි ද භූතපාල දරු ද මරණ ගැලවුණේ ඤාණවිප්ඵාර ඍද්ධියෙනි. ඒ ජන්මයෙහි රහත් වන්නට හේතු ඇත්තෝ කවර විපතකින් හෝ ගැලවෙත්.

සමාධියෙන් ලැබෙන අනුහස **සමාධි විප්ඵාර ඍද්ධි** යි. ශාරිපුත්‍ර ස්වාමි පුනුපොහෝදා සඳපහනේ යකු දුන් ටොකු පහරින් ද සඤ්ජීව ස්වාමි ගොපලුන් දුන් ගිනිදැල්ලෙන් ද, ඛාණු කොණ්ඩඤ්ඤ ස්වාමි පල්හොරුන්ගේ බඩු බරින් ද, උත්තරා නම් පුණ්ණක සිටු දූ සිරිමා නම් ගැණි විසින් ඉසි උණු තෙලින් ද, සාමාවති උදෙන රජු වීදි ඊ පහරින් ද ගැලවුණේ සමාධි විප්ඵාර ඍද්ධියෙනි.

චෙතොවශප්‍රාප්ත ආර්යයන්ගේ පිළිකුලෙහි නො පිළිකුල් බව සැලකීම් ආදිය **ආර්ය ඍද්ධි** යි. ඔවුහු පිළිකුල් අරමුණක් දුටු විට එහි මෙත් වඩා හෝ ධාතු වශයෙන් සලකා හෝ නො පිළිකුල් අරමුණක් කැරැ ගනිති.

පක්ෂීන්ගේ ද දෙවාදීන්ගේ ද අහස් ගමන් ආදිය **කම්මවිපාකජ ඍද්ධි** යි.

චක්‍රවර්ති රජුන්ගේ අහස් ගමන් ආදිය **පුණ්‍ය ඍද්ධි** යි. එසේ ම මෙණ්ඩක, ජොතිය, ජටිලක, ඝොසිතාදීන්ගේ අනුහස් පුණ්‍ය ඍද්ධිය යි.

විද්‍යාධරයන්ගේ අහස් ගමන් ආදිය **විද්‍යාමය ඍද්ධි** යි.

ඒ ඒ ක්‍රියා මනාව කිරීමෙන් සමෘද්ධවීම **ප්‍රයෝග ප්‍රත්‍යය ඍද්ධි** යි. නෛෂ්ක්‍රම්‍යයෙන් කාමච්ඡන්දය ප්‍රහාණ වේ. අර්හත් මාර්ගයෙන් සියලු කෙලෙස් ප්‍රහාණ වේ. ශිල්පකර්මාන්ත වෙදකම් ගොවිකම් ආදිය ද ප්‍රයෝග සත්‍යය ඍද්ධියෙහි ඇතුළති.

මේ දශවිධ ඍද්ධි අතුරෙන් මෙහි ලා ගත යුත්තේ අධිෂ්ඨාන, විකුබ්බන, මනෝමය යන ඍද්ධිත්‍ර ය යි,

ඍද්ධිය පිළිබඳ භූමි සතරෙක් ද, පාද සතරෙක් ද, පද අටෙක් ද, මුල් සොළොසෙක් ද ඇත්තේ ය.

භූමි සතර නම් පඨමජ්ඣාන, දුතියජ්ඣාන, තතියජ්ඣාන, චතුත්ථජ්ඣාන යන ධ්‍යාන සතර යි. මින් මුල් තුන සම්භාර භූමි ය. අන්තිමය ප්‍රකෘති භූමි යි.

පාද සතර නම් ඡන්දිද්ධිපාද, විරියිද්ධිපාද, චිත්තිද්ධිපාද, වීමංසිද්ධිපාද යන සතර යයි.

පාද අට නම් ඡන්ද, සමාධි, විරිය, සමාධි, චිත්ත, සමාධි, වීමංසා, සමාධි යන අට යි.

මුල් සොළොස නම් "**අනොනත්තං චිත්තං කොසජ්ජෙන ඉඤ්ජතී ති ආනෙඤ්ජං**" යනාදීන් දක්වන ලද්දේ ය. මේ සියල්ල පිළිබඳ විස්තර **විශුද්ධි මාර්ගයෙහි** ය.

මෙසේ ඍද්ධිය පිළිබඳ භූමි, පාද, පද, මූලධර්ම සම්පාදනය කොටැ ගෙනැ අභිඥාපාදක ධ්‍යානයට සමවැද එයින් නැඟී ඉදින් සියයක් වනු කැමැත්තේ නම් "**සතං හොමි සතං හොමි**" යි පරිකර්ම කොටැ නැවත අභිඥාපාදක ධ්‍යානයට සමවැද යින් නැඟී අධිෂ්ඨාන කළ යුතු ය. අධිෂ්ඨානය හා සමග ම සියයෙක් වන්නේ ය. පුරාණ සන්නයෙහි මේ අර්ථය මෙසේ දක්වති.

"ලෞකික පඤ්චාභිඥා උපදවනු කැමැත්තා වූ ආදි කම්මික යෝගාවචරයා විසින් අවදාත කෘතසනය කෙළවර කොටැ ඇති අට කසිණයෙහි අෂ්ට සමාපත්ති උපදවා "**කසිණානුලොම තො කසිණපටිලොමතො**" යනාදීන් දක්වන ලද තුදුස් ආකාරයෙන් චිත්තය දමා "**එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධ**" යනාදීන් දක්වන ලද අෂ්ටාඞ්ගයෙන් සමන්විත වූ චිත්තයෙහි අභිඥා ඉපදවිය යුතු ය. මෙහි එක දේශයකින් ඍද්ධිවිධඥානයට මතු භාවනා විධි දක්වනු ලැබේ. එහි යට කී පරිද්දෙන් පඨවිකසිණය විෂය කොටැ රූපාවචර අෂ්ට සමාපත්ති උපදවා කසිණානුලොමතාදී වූ තුදුස් ආකාරයෙකින් චිත්තය දමා අභිනීහාර ක්‍ෂම කොටැ අභිඥාපාදක පඤ්චමධ්‍යානයට සමවැද එයින් නැඟී ඉදින් සතයක් ම වනු කැමැත්තේ වී නම් "**සතං හොමි සතං හොමි**" යි භාවනා කොටැ නැවත පාදක ධ්‍යානයට සමවැද එයින් නැඟී අධිෂ්ඨාන කටයුත්තේ ය. අධිෂ්ඨාන චිත්තය හා සමග මැ ශතයෙක් ම වන්නේ ය. සහස්‍රාදියෙහි දු මෙසේ මැ යි" යි.

**ප්‍රශ්න.**

1. අභිඥා කී වැදැරුම් ද? අභිඥා යන්නෙහි තේරුම කිම?
2. ඍද්ධි ලැබීම පිණිස සිත පුරුදු කළ යුතු තුදුස් ආකාරය දක්වනු.
3. ඍද්ධි කී වැදැරුම් ද? ඒ විස්තර කරනු.
4. ඍද්ධි පිළිබඳ භූමි, පාද, පද, මුල් දක්වනු.
5. අධිෂ්ඨාන ඍද්ධිය වන පරිදි දක්වනු.

## 11. (පංචාභිඥා) දිබ්බසොත, පරචිත්ත විජානන, පුබ්බෙනිවාසානුස්සති, දිබ්බචක්ඛු.

**දිබ්බසොතය.**

දෙවියන්ගේ ශ්‍රොත්‍ර හෙවත් කන් ඉතා පිරිසිදු ය. සෙම් ආදියෙන් අපළිබුද්ධ බැවින් ඉතා දුරවූ ශබ්ද එහි හැපෙන්නේ ය. භාවනා බලයෙන් නිපදවා ගන්නා එ බඳු ඥාන ශ්‍රොත්‍ර ධාතුවෙක් මෙහි **දිබ්බසොතය** යි කියනු ලැබේ. එය ලබා ගන්නා ආකාරය මෙසේ ය.

දිබ්බසොතය ලැබැ ගනු කැමැති යෝගී විසින් අභිඥා පාදක ධ්‍යානයට සමවැද එයින් නැගී පරිකර්ම සමාධි සිතින් ප්‍රකෘති ශ්‍රොතයෙහි වැටෙන ආරණ්‍යයෙහි සිංහාදීන්ගේ ශබ්ද පටන් කුරු කුහුඹුවන්ගේ ශබ්ද දක්වා ඇසිය යුතු ය. ඒ ශබ්ද දිශා වශයෙන් අසුවල් අසුවල් දිශාවෙහි ය යි ව්‍යවස්ථා කටයුතු ය. ඒ ශබ්ද ප්‍රකෘති ශ්‍රොත්‍රයට ද ප්‍රකට වත ත් පරිකර්ම සිතට වඩාලාත් ප්‍රකට වන්නේ ය. මෙසේ ශබ්ද නිමිත්ත මෙනෙි කරත් ම දැන් දිබ්බසෝත ධාතුව උපදින්නේය යි ඒ ශබ්ද අතුරෙන් කිසිවක් අරමුණු කොටැ මනොද්වාරාවර්ජනය උපදින්නේ ය. ඒ නිරුද්ධවත් ම පරිකර්ම උපචාර අනුලෝම ගොත්‍රභූ සිත් ඉපිදැ චතුර්ථධ්‍යානය අර්පණා වන්නේ ය. ඒ අර්පණා සිතෙහි පවත්නා ප්‍රඥාව දිබ්සෝත ධාතුය යි දත යුතු. එය ශක්තිමත් කැරැ ගනු කැමැත්තහු විසින් "මේ අතර පවත්නා ශබ්ද අසමි" යි අඟුල්, දැඟුල්, සිව් අඟුල්, අටඟල්, වියත් රියත් ආදි වශයෙන් ද එක් සක්වළක් වශයෙන් ද ඉනුත් ඔබ ලෝකය වශයෙන් ද රිසි තාක් පරිච්ඡේද කොට කොටැ වැඩිය යුතු ය. එසේ වඩා ඒ අතර ශබ්ද ඇසිය යුතු ය. ඔහුට මුළු ලොවැ පුරා සිට නානාවිධ ශබ්ද මේ අසුවල් ශබ්දය මේ අසුවල් ශබ්දය ය යි වෙන් කොටැ ද දත හැකි ය.

### පරචිත්ත විජානනය.

පරචිත්ත විජානනය නම් අනුන්ගේ සිත් දැනැ ගන්නා නුවණය. "**චෙතොපරියඤාණය**" යනු දු මේ ය. එය දිව්‍ය චක්‍ෂුරභිඥාන වශයෙන් ලැබෙන්නකි. පරිකර්ම ද දිව්‍ය චක්‍ෂුරභිඥානයට කියන ලද සේ ය. එබඳු යෝගී විසින් ආලෝක වඩා දිවැසින් අන්‍යයන්ගේ හෘදය වස්තුව නිසා පවතින ලෙයෙහි වර්ණය බලා ඒ විසින් සිත කිය යුතු ය. සිත සොම්නස් වැ පවත්නා කල පැසුණු නුග ඵලයක් සේ ලෙය රත් පැහැ වන්නේ ය. සිත උපෙක්ෂාව පවත්නා කල ප්‍රසන්න තල තෙල් සේ ප්‍රසන්න වන්නේ ය. එසේ හෙයින් හෘදය වස්තුගත රුධිර වර්ණය බලා සිත කිය යුතු ය. මේ ඥානය ක්‍රමයෙන් ශක්තිමත් වූ කල්හි මේ කාමාවචර චිත්තය, මේ රූපාවචර චිත්තය යනාදිය ද කිය හැකි ය. අරූපාවචරයන්ට හෘදය වස්තු නැත. ඔවුන්ගේ සිත කීම විශේෂ ඍද්ධියෙකි. සිතින් සිතට සංක්‍රමණය වන්නේ එයද කියන්නේ ය.

### පුබ්බෙනිවාසානුස්සතිය.

පුබ්බෙනිවාසානුස්සති නම් පෙර වුසූ කඳ පිළිවෙල දන්නා නුවණ ය. හෙවත් අතීත ජාතීන්හි තමාගේ ස්කන්ධ ප්‍රවෘත්ති පරිපාටිය දන්නා නුවණ ය. මේ නුවණ වනාහි තීර්ථකයන්ට ද බුද්ධ ශ්‍රාවකයන්ට ද, මහා ශ්‍රාවකයන්ට ද, අග්‍ර ශ්‍රාවකයන්ට ද, පසේ බුදුවරයන්ට ද, සම්මාසම්බුදුවරයන්ට ද ඇත්තේ ය. එයින් තීර්ථකයෝ සතළිස් කපක් ම දකින්නට සමර්ථ වෙති. ඉන් ඔබ දක්නට සමර්ථ නොවෙති. බුද්ධ ශ්‍රාවකයෝ කල්ප සියයක් දහසක් ද, අසූමහා ශ්‍රාවකයෝ කල්ප ලක්‍ෂයක් ද, දැගසව්වෝ එකා සංඛ්‍ය කල්ප ලක්‍ෂයක් ද, පසේ බුදුවරයෝ දෙයාසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් ද දකින්නට සමර්ථ වෙති. සම්මාසම්බුදුවරයෝ රිසි තාක් දක්නට සමර්ථ වෙත්. එහි ප්‍රමාණ නියමයෙක් නැත.

පුබ්බෙනිවාසය සිහි කරනු කැමැති ආදිකර්මික යෝගී විසින් දවල් දානය වැළඳීමෙන් පසු රහොගත වැ විවේක ස්ථානයකට එළඹැ පිළිවෙලින් චතුර්ථධ්‍යානයන්ට සමවැද අභිඥාපාදක වූ ඒ චතුර්ථධ්‍යානයෙන් නැඟී (මේ චතුස්කනය වශයෙනි. පඤ්චම ධ්‍යානය ද මෙහි ය.) එහි අන්තිම හිඳ ගැන්ම සිහි කළ යුතු. ඉක්බිති අසුන පනවා ගැන්ම ද, සෙනසුනට පැමිණීම ද, පා සිවුරු තැන්පත් කිරීම ද, වැළඳූ කාලය ද, ගමින් ආ කාලය ද, ගමෙහි පිඬු පිණිස හැසුරුණු කාලය ද, විහාරයෙන් නික් මැ ගිය කාලය ද ආදි වශයෙන් ගතවුණු සියල්ල ප්‍රතිලෝම වශයෙන් සිහිකළ යුතු ය. මෙය ප්‍රකෘති සිතට ද ප්‍රකට ය. පරිකර්ම සමාධි සිතට විශේෂයෙන් ප්‍රකට ය. යම් තැනෙක් සිහියට නො නැඟේ නම් එහිදී පාදක ධ්‍යානයට සමවැද එයින් නැඟී නැවත සිහි කළ යුතු ය. එවිට පහන් එළියෙන් මෙන් පෙනෙන්නේ ය. මෙසේ පෙර දවසද එයටත් පෙර දවසදැයි අවුරුදු දැ අවුරුදු ආදී වශයෙන් යට යට සිහි කරන්නේ ය. අන්තිමයේ දී බිහිවුණු කාලය ද ප්‍රතිසන්ධි කාලය ද සිහි කරන්නේ ය. මේ ජන්මයෙහි ප්‍රතිසන්ධිය සිහි කළ ද එය පූර්වනිවාසානුස්මෘතිය නො වේ. ප්‍රතිසන්ධියෙන් ඔබ ගිය ජාතියෙහි ච්‍යුතික්ෂණය සිහිකළ හොත් එය පූර්වනිවාසානුස්මෘති ඥානය වන්නේ ය. ඒ සිහි කිරීම ඉතා දුෂ්කර ය. සිහි නොවත් හොත් බැරිය යි නො සිතා පාදක ධ්‍යානයට සම වැද එයින් නැඟී නැවත ද සිහි කරන්නේ ය. ගස් කපන මිනිසෙක් ගස බොහෝ දුර කපා පොරොව මොට වූ කල්හි බැරිය යි නො නැවතැ පොරොව යළිදු මුවහත් කොට ගෙනැ ගස කපා හෙලයි ද එමෙන් මේ යෝගාවචර ද කෙසේ හෝ ගිය ජාතියෙහි චුතිය පිළිබඳ නාමරූප දක්නේ ය. එසේ දුටු නාම රූප අරමුණු කොට මනොද්වාරාවර්ජනය ඉපිද නිරුද්ධ වූ කල්හි පරිකර්මාදි නාමයෙන් ජවන් සතරක් පසක් දිවෙන්නේ ය. සතර වැනි හෝ පස්වැනි ජවනය රූපාවචර චතුර්ථධ්‍යානික අර්පණා චිත්තය යි. එහි පවත්නා ප්‍රඥාව පූර්වෙනිවාසානුස්මෘති ඥානය යි. ඒ ප්‍රඥායෙන් යුක්ත වූ ස්මෘතියෙන් ජාති එකක් දෙකක් ආදි වශයෙන් ද සංවට්ට කල්පාදි වශයෙන් ද අතීතය සිහි කරන්නේ ය.

## දිබ්බචක්ඛු

දෙවියන්ගේ ඇස දිබ්බචක්ඛු ය. සෙම් ආදියෙන් අපළි බුද්ධ බැවින් එයට දුර පවත්නා රූප ද හැපෙන්නේ ය. පර්වතාදියෙන් පවා නිරාවරණ වැ ඇත පවත්නා අරමුණු ද එයට පෙනෙන්නේ ය. භාවනා බලයෙන් නිපදවා ගත් ප්‍රඥා චක්ෂුව ඒ දිව්‍ය චක්ෂු සමාන බැවින් දිබ්බචක්ඛුය යි කියනු ලැබේ. දිව්‍යචක්ෂුරභිඥානය යි. චුතූපපාතඤාණය යනුදු මේ ය. චුතූපපාතඤාණය නම් චුති උප්පත්ති ද දන්නා දක්නා නුවණ ය. ඇතැම්හු චුතිය පමණක් දකිති. උප්පත්තිය නො දකිති. ඔවුහු උච්ඡෙද දෘෂ්ටිකයෝ වෙත්. ඇතැම්හු උප්පත්තිය දකිති. චුතිය නො දකිති. ඔව්හු නව සත්ව ප්‍රාදුර්භාවය හෙවත් සත්ත්වයෝ අළුතින් උපදිති යන හැඟීම ගනිති. චුතූපපාතඤාණය ඇත්තෝ දිට්ඨිවිසුද්ධිකයෝ ය. මේ දිබ්බචක්ඛුඤාණය විශුද්ධ ය. මනුෂ්‍යත්වය ඉක්මැ සිටියේ ය. එයින් චුත වන්නා වූ ද උපදින්නාවූ ද සුගතියට යන්නාවූ ද දුර්ගතියට යන්නා වූ ද සත්ත්වයන් දක්නේ ය. ඔවුන් ඒ සුගති දුර්ගති වන කර්මය ද දක්නේ ය. ඉන් මුල් කොටස දිව්‍යචක්ෂු කෘත්‍යයට අයත් ය. කර්ම දක්නා කොටස යථා කම්මුපගඤාණ කොටසට අයත් ය.

**දිබ්බචක්ඛුඤාණය ලැබැ ගන්නා ආකාරය මෙසේ ය:**

දිවැසින් ලොව දක්නා කැමැති ධ්‍යානලාභී ආදි කාර්මිකයා විසින් තේජෝකසිණ, ඔදාතකසිණ, ආලොකකසිණ යන තුන් කසිණ අතුරෙන් එකක් උපචාර ධ්‍යානයට ගෝචර කොටැ වඩා ගත යුතු ය. එහි අර්පණාවට නො පැමිණිය යුතු ය. මේ තුනින් ආලොක කසිණය වඩා යෝග්‍ය යි. එ බැවින් ආලොක කසිණය හෝ අනික් දෙකින් එකක් හෝ කසිණ භාවනා ක්‍රමයෙහි කී සේ උපදවා ගෙන උපචාර භූමියෙහි සිටැ වැඩිය යුතු ය. වඩන ක්‍රමය එහි කියන ලද්දේ ය. ඒ වැඩූ තන්හි ඇතුළත් වූ රූප බැලිය යුතු ය. ඒ රූප බලත් ම ඔහුගේ පරිකර්මවාරය ඉක්මැ යයි. එවිට ආලෝකය ද අන්තර්ධාන වේ. ආලෝකය අන්තර්ධාන වූ කල්හි රූප ද නො පෙනී යයි. එවිට ඔහු විසින් පාදක ධ්‍යානයට සම වැද එයින් නැඟී ආලෝක පැතිරවිය යුතු. ඒ ආලෝකය ක්‍රමයෙන් බලසම්පන්න වන්නේ ය. මෙතෙක් තන්හි ආලෝකය වේවා යි යම් තාක් තැන් පරිච්ඡේද කැර ගනී ද ඒ තාක් තන්හි ආලෝකය පවත්නේ ය. දවස මුළුල්ලෙහි වුවද බලත් හොත් රූප පෙනෙන්නේ ය. මිනිසෙක් රෑ ගිනි හුලක් ගෙන ගමනක් යයි, යන අතර ඔහුගේ ගිනි සුල නිවෙයි. ඔහුට කිසිවෙක් නොපෙනී යයි. හෙතෙම ගිනි සුල බිම ගසා නැවත දල්වා ගනියි. එවිට පෙරටත් වඩා ගිනි සුල පත්තු වෙයි. යළි යළි නිවුණු කල්හි එසේ දල්ව දල්වා යත් ම සූර්යයා උදා වෙයි. හේ දැන් ගිනි සුලින් කම් නැතැ යි ඒ ඉවත ලා, සූර්යාලෝකයෙන් යයි. මෙය මුල කී අර්ථයට උපමා වශයෙන් යොදා ගත යුතු යි. යම් කලෙක ඔහුට මසැසට නො පෙනෙන හෘදය වස්තු ගත වූ හෝ භිත්ති ප්‍රාකාර පර්වතවලින් පිටත වූ හෝ සක්වල ගලින් පිටත වූ හෝ රූපය ඥාන චක්‍ෂුවට ආපාතගත වේ ද මසැසට පෙනෙන්නා සේ ම පෙනේ ද එවිට දිව්‍ය චක්‍ෂුව උපන්නේ ය යි කිය යුතු ය. මෙහි දී පෘථග්ජනයෙකුට නම් උපද්‍රවයෙක් පැමිණෙ යි. එ නම් ආලෝකය වැඩූ තැන්හි භයානක වූ යක්‍ෂරාක්‍ෂසාදී අමනුෂ්‍ය රූප පෙනීම යි. ඒ දුටු විට ඔහුට භය උපදිය හැකි ය. භය උපන් විට චිත්තය වික්‍ෂෙපප වී ධ්‍යානයෙන් ද පිරිහිය හැකි ය. එබැවින් මෙහිදී පෘථග්ජනයා එසේ නො වන්නට අප්‍රමාද විය යුතු යි.

පඤ්චාභිඥා පිළිබඳ වැ මෙහි දක්වන ලද්දේ සංක්‍ෂෙපය යි. විස්තර **විශුද්ධිමාර්ගයෙන්** දත යුතු යි.

**සමථ කර්මස්ථාන ක්‍රමය යි.**

**ප්‍රශ්න.**

1. ඍද්ධිවිධඥානය විස්තර කරනු.
2. දිව්‍යශ්‍රොත්‍රඥානය ලබා ගත හැකි ක්‍රමය දක්වනු.
3. පරචිත්ත විජානන ඥානය කිමෙක් ද?
4. පූර්වනිවාසානුස්මෘතිඥානය කෙසේ ලැබිය හැකි ද?
5. දිව්‍යචක්‍ෂුරභිඥානය කිම?

## 12. විදර්ශනා කර්මස්ථානය.

සමථ කර්මස්ථාන විධි යට දක්වන ලදි. විදර්ශනා කර්මස්ථාන විධි මෙහි දක්වනු ලැබේ. ඒ සඳහා **සප්ත විශුද්ධි, ත්‍රිලක්‍ෂණ, ත්‍රිවිධ අනුපස්සනා, දශවිදර්ශනා, ත්‍රිවිධ විමොක්‍ෂ, ත්‍රිවිධ විමොක්‍ෂ සුඛ** යන මේ උගත යුතු ය.

**සප්ත විශුද්ධි නම්** - සීල විශුද්ධි, චිත්ත විශුද්ධි, දිට්ඨි විශුද්ධි, කංඛාවිතරණ විශුද්ධි, මග්ගාමග්ගඤාණදස්සන විශුද්ධි, පටිපදා ඤාණදස්සන විශුද්ධි, ඤාණදස්සන විශුද්ධි යන මේ ය.

**ත්‍රිලක්‍ෂණ නම්** - අනිත්‍ය ලක්‍ෂණ, දුඃඛ ලක්‍ෂණ, අනාත්ම ලක්‍ෂණ යන මේ ය.

**ත්‍රිවිධ අනුපස්සනා නම්**- අනිච්චානුපස්සනා, දුක්ඛානුපස්සනා, අනත්තානුපස්සනා යන මේ ය.

**දශ විදර්ශනා ඥාන නම්**-සම්මසන ඤාන, උදයව්‍යය ඤාණ, භඞ්ගඤාණ, භයඤාණ, ආදීනවඤාණ, නිබ්බිදාඤාණ, මුඤ්චිතුකම්‍යතාඤාණ, පටිසංඛානඤාණ, සංඛාරුපෙක්ඛඤාණ, අනුලොමඤාණ යන මේ ය.

**ත්‍රිවිධ විමොක්‍ෂ නම්**-සුඤ්ඤත විමොක්‍ෂ, අනිමිත්ත විමොක්‍ෂ, අප්පණිහිත විමොක්‍ෂ යන මේ ය.

**ත්‍රිවිධ විමොක්‍ෂ මුඛ නම්**- සුඤ්ඤතානුපස්සනා, අනිමිත්තානුපස්සනා, අප්පණිහිතානුපස්සනා යන මේ ය.

මේ උගත් කල්හි විදර්ශනාකර්මස්ථාන විධි උගත්තේ වේ. සාමාන්‍ය ලෝකයා සේ සත්ත්ව පුද්ගල ස්ත්‍රී පුරුෂාදී වශයෙන් හෝ නිත්‍ය සුඛ ආත්මාදි වශයෙන් හෝ නො බලා ස්කන්ධ ධාතු ආයතනාදි වශයෙන් ද බලන්නේ විදර්ශනා ය. කර්ම නම් භාවනා ප්‍රයෝගය යි. විදර්ශනා පිළිබඳ කර්ම-භාවනා ප්‍රයෝග විදර්ශනා කර්මයට ස්ථාන වන්නේ භූමි වන්නේ විදර්ශනා කර්මස්ථාන යි.

### ප්‍රශ්න.

1. විදර්ශනාකර්මස්ථාන යනු කිම?
2. සප්ත විශුද්ධි කවරේ ද?
3. ත්‍රිලක්‍ෂණ ද ත්‍රිවිධ අනුපස්සනා ද දක්වනු.
4. දශවිදර්ශනාඥාන කවරේ ද?
5. ත්‍රිවිධ විමොක්‍ෂ හා ත්‍රිවිධ විමොක්‍ෂ මුඛ දක්වනු.

## 13. (සප්ත විශුද්ධි) සීල විසුද්ධිය.

විදර්ශනා භාවනාවෙන් නිවන් අවබෝධ කළ හැකිය යි යට කියන ලදි. නිවන් අවබෝධ කටැටියා සත් ආකාරයෙකින් විශුද්ධ විය යුතුය. සත්වන වර විශුද්ධ වත්ම ඔහුට නිවන් පෙනෙන්නේ ය. එහි පළමුවන විශුද්ධිය ශීල විශුද්ධිය යි. බීජ රෝපණයට පෙර භූමිය සකස් කැරැ ගත යුතු සේ චිත්ත විශුද්ධියට පෙර ශීලය සකස් කළ යුතු ය. ශීලය අපිරිසිදු නම් චිත්තය ද පිරිසිදු නො වන්නේ ය. ශීලය නම් කය වචන දෙක්හි සංවරය යි. එය පංචශීල අෂ්ටාඞ්ග ශීල දශශීලාදි වශයෙන් නානාවිධ ය. එහි මුල පංච ශීලය යි කිය යුතු. සික්ඛාපද විභඞ්ගයෙහි වදාළේත් පඤ්ච ශීලය යි. උත්කෘෂ්ටය සතර සංවර ශීලය යි. සතර සංවර ශීල නම් ප්‍රාතිමොක්‍ෂ සංවර ශීල, ඉන්‍ද්‍රිය සංවර ශීල, අජීවපාරිශුද්ධි ශීල, ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීල යන මේ ය. මේ ම ශීලවිශුද්ධිය යි දත යුතු.

### ප්‍රාතිමොක්‍ෂ සංවරශීලය.

ප්‍රාතිමොක්‍ෂ සංවර ශීලය නම් ශික්‍ෂාපද ශීලය යි. බුදුරජාණන් වහන්සේ විනයයෙහි වදාළ ශික්‍ෂාපද රැකීම ප්‍රාතිමෝක්‍ෂ සංවර ශීලය යි සේ යි. විනය වනාහි **විභඞ්ග, ඛන්‍ධක, පරිවාරය** යි කොටස් තුනකට බෙදන ලද්දේ ය. **විභඞ්ග** නම් භික්ඛු විභඞ්ග භික්ඛුනී විභඞ්ග යන උභතො විභඞ්ගයෙන් යුත් පාරාජික පාළි, පාචිත්තිය පාළි යන පොත් දෙක ය. **ඛන්‍ධක** නම් චුල්ලවග්ගපාළි, මහාවග්ගපාළි යන පොත් දෙක ය. **පරිවාර** නම් පරිවාර පාළි යන පොත ය. මේ සියල්ලෙහි ඇතුළත් ශික්‍ෂාපද පාරාජික, සංඝාදිසෙස, පාචිත්තිය, පාටිදෙසනීය, දුක්කට යන ආපත්ති ස්කන්‍ධ පසර හෝ පාරාජික, සංඝාදිසෙස, ථුල්ලච්චය, පාචිත්තිය, පාටි දෙසනීය, දුක්කට, දුබ්භාසිත යන ආපත්ති ස්කන්‍ධ සතට හෝ ඇතුළත් කරන ලද්දේ ය. එහි දැක්වුණු එක ශික්‍ෂා පදයකුදු ව්‍යතික්‍රමණය කිරීමෙන් ආපත්තීන්ට නො පැමිණ, හදිසියේ පැමිණිය ද එයින් නැඟී ශුද්ධ වැ විසීම ප්‍රාතිමොක්‍ෂ සංවර ශීලය යි.

විශුද්ධිමාර්ගයෙහි ප්‍රාතිමොක්‍ෂ සංවර ශීලය මෙසේ දක්වයි. “**ඉධ භික්ඛු පාතිමොක්ඛසංවරසංවුතො විහරති, ආචාර ගොචර සම්පන්නො අනුමත්තෙසු වජ්ජෙසු භය දස්සාවී සමාදය සික්ඛති සික්ඛාපදෙසු**” යි ප්‍රාතිමොක්‍ෂ සංවරයෙන් සංවෘත වැ ආචාර ගෝචර දෙකින් යුක්ත වැ ස්වල්ප මාත්‍ර වරදෙහි පවා බිය දක්නා සුලු වැ ශික්‍ෂාපද සමාදන් වැ ගෙනැ විසීම ප්‍රාතිමොක්‍ෂ සංවර ශීලය වේ යනු එහි අර්ථ යි.

“**ප්‍රාතිමොක්‍ෂ සංවරයෙන් සංවෘත වැ**” යන්නෙහි තේරුම යට කියන ලද්ද ම ය.

“**ආචාර ගෝචර දෙකින් යුක්ත වැ**” යන මෙහි ආචාර ද ඇත. අනාචාර ද ඇත. ගෝචර ද ඇත. අගෝචර ද ඇත. **අනාචාර** නම් කයෙන් වචනයෙන් ශික්‍ෂාපද ව්‍යතික්‍රම කිරීම ය. සියලු දුසිල් කර්ම ය. වෙළුදානාදි අෂ්ට කුල දූෂණ එක්විසි අනෙසනාදියෙන් දුරු වැ විසීම ය. **අගෝචර** නම් වෙසඟනන්, වැන්දඹුවන්, ළමිස්සියන්, පණ්ඩකයන්, භික්‍ෂුනීන්,

පානාගාරයන්, රාජ රාජාමාත්‍යයන්, තීර්ථකශ්‍රාවකයන් ඇසුරු කිරීම ය, නුසුදුසු ගිහි සංසර්ගයෙන් විසීම ය, භික්ෂූන්ට ආක්‍රොශ පරිභව බෙණෙන ශ්‍රද්ධා ප්‍රසාද නැති කුලයන් ඇසුරු කිරීම ය. **ගෝචර** නම් එසේ නුසුදුස්සන් ඇසුරු නො කොටැ සුදුසු තැන් ඇසුරු කිරීම යි. මෙහි තව ද විස්තර ඇත්තේ ය. සෙස්ස සුබොධයි.

## ඉන්‍ද්‍රිය සංවර ශීලය.

ඉන්‍ද්‍රිය සංවර ශීලය නම් චක්ෂුරාදි ෂඩින්‍ද්‍රියයන් සංවර කොටැ ගෙනැ විසීම ය. ඒ එසේ මැ යි. එයින් යුක්ත තැනැත්තා ඇසින් රූප දුටුව ද එහි නිමිති නො ගන්නේ ය. කුඩා නිමිති හෝ නො ගන්නේ ය. ඇසින් අසංවර වන්නහු කරා ලෝභද්වේෂාදි පාපධර්මයෝ ළං වෙති. එසේ ළංවන්නට අවකාශ නොතබා ඇස සංවර කැරැ ගෙනැ වසන්නේ ය. කනින් ශබ්ද ඇසුව ද, නැහැයෙන් ගඳ සුවඳ ගත ද, දිවින් රස විඳිය ද, ශරීරයෙන් ස්පර්ශ ලදුව ද සිතින් අරමුණු ලදුව ද එහි නිමිති හෝ නො ගන්නේ ය. ශ්‍රොත්‍රාදිය සංවර කැරැ ගෙනැ වසන්නේ ය.

## ආජීව පාරිසුද්ධි ශීලය.

ආජීව පාරිශුද්ධි ශීලය නම් ආජීවය පිරිසිදු කැරැගෙන විසීම ය. ආජීවය නිසා ශික්ෂාපද සයක් මර්දනය කළ හැකි ය. තමා කෙරෙහි නැති උතුරු මිනිස් දම් ගුණ ඇතැ යි අඟවා පාරාජික විය හැකි ය. කපු කම් කථා කොට සංඝාදිසෙසයට පත්විය හැකි ය. අන්‍යොපදේශයෙන් උතුරු මිනිස්දම් අඟවා ථුල්ලච්චයට පැමිණිය හැකි ය. නොගිලන් වැ පිණිබොජුන් ඉල්ලාගෙනැ වළඳා පාචිත්තියට පැමිණිය හැකි ය. භික්ඛුනියට ද නො ගිලන් වැ පිණි බොජුන් ඉල්ලා ගෙනැ වළඳා පාටිදෙසනීයට පැමිණිය හැකි ය. භික්ඛුනියට ම නො ගිලන් වැ සූපබ්‍යඤ්ජන ඉල්ලා ගෙනැ වළඳා දුක්කටයට පැමිණිය හැකි ය. තව ද "කුහනා, ලපනා, නෙමිත්ත කතා, නිප්පෙයිකතා, ලාභෙන ලාභංනිජිගිංසනතා" යන පාප ධර්මයන්ගේ වශයෙන් ද ආජීවය රැකැ ගත හැකි ය. (විස්තර **සිංහල විසුද්ධිමාර්ගයෙහි** බලනු) එසේ නො කොටැ දැහැමින් සෙමෙන් දිවි පැවැත්ම ආජීව පාරිශුද්ධි ශීලය යි.

## ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලය.

සිව්පස වළඳනා කල සිහිකල්පනායෙන් වැළඳීම ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලය යි. ඒ එසේ මැ යි. **සිවුරු හඳනා පොරෝනා කල** මෙසේ සැලකිය යුතු ය. "මම මේ සිවුරු කල්පනායෙන් යුක්තවැ පරිභොග කරමි. මම මේ පරිභොග කරන්නේ ශීත, උෂ්ණ, මැසි, මදුරු, අවු, සුළං, සර්ප යන මොවුන්ගේ ස්පර්ශ නැති කැරැ ගැන්ම සඳහා ය. ලජ්ජාස්ථාන මුවහ කැරැ ගැන්ම සඳහා ය" යි. **පිණ්ඩපාතය වළඳනා කල** මෙසේ සැලකිය යුතු ය. "මම මේ පිණ්ඩපාතය කල්පනාවෙන් යුක්ත වැ වළඳමි. මම මේ වළඳන්නේ සෙල්ලම් පිණිස හෝ මද පිණිස අඟ පසඟ පිනවා ගැන්ම පිණිස හෝ අලංකාර පිණිස හෝ නො වේ. මම මේ වළඳන්නේ මේ ශරීරය වැටී යා නො දී සිටුවා ගැන්ම පිණිස ය. යැපීම පිණිස ය. බඩ ගිනි හිංසා වළකා ගැන්ම පිණිස ය. බ්‍රහ්මචරියාවට අනුබල දීම පිණිස ය. මම මේ පිණ්ඩපාතය වැළඳීමෙන් පැරැණි බඩගිනි වේදනා නැති කැරැ ලන්නෙමි. අළුත් වේදනා නූපදවා ගන්නෙමි. මෙයින් මගේ දිවි පැවැත්ම වන්නේ ය. නිවරද බව ද පහසු වාසය ද වන්නේ ය"යි. **සෙනසුන් පරිභෝග කරන කල** මෙසේ සැලකිය යුතු ය. "මම

කල්පනායෙන් යුක්ත වැ මේ සෙනසුන් පරිභෝග කරමි. මම මේ පරිභෝග කරන්නේ ශීත, උෂ්ණ, මැසි, මදුරු, අවු, සුළං, දීර්ඝ සර්ප යන මොවුන්ගේ ස්පර්ශ වළකා ගැන්ම පිණිස ය. ඍතු පීඩා වළකා ගැන්ම පිණිස ය. විවේක සුවය ලැබැගන්නා පිණිස ය" යි **ගිලන්පස බෙහෙත් පිරිකර වළඳනා කල** මෙසේ සැලකිය යුතුය. "මම කල්පනායෙන් යුක්ත වැ ගිලන්පස බෙහෙත් පිරිකර වළඳමි. මම මේ වළඳන්නේ ඉපිද තිබෙන නානාවිධ ආබාධ වේදනා නැතිකැර ගැන්ම පිණිසය. නිදුක් බව පිණිස ය" යි.

මින් ප්‍රාතිමෝක්‍ෂසංවර ශීලය ඇවැත් දෙසීමෙන් පිරිසිදු වන බැවින් දේශනා ශුද්ධිය යි ද, ඉන්ද්‍රියසංවර ශීලය සංවරයෙන් ශුද්ධ වන බැවින් සංවරශුද්ධිය යි ද, ආජීව පාරිශුද්ධිශීලය පර්යේෂණයෙන් ශුද්ධ වන බැවින් පර්යේෂණ ශුද්ධිය යි ද, ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලය ප්‍රත්‍යවේක්‍ෂායෙන් ශුද්ධ වන බැවින් ප්‍රත්‍යවේක්‍ෂාශුද්ධිය යි ද කියනු ලැබේ. මේ සතර ආකාර පාරිශුද්ධිය යි ද දත යුතු. (විස්තර විශුද්ධිමාර්ගයෙහි ය.)

### ප්‍රශ්න.

1. ශීලවිශුද්ධි යනු කවරේ ද?
2. ප්‍රාතිමොක්‍ෂසංවර ශීලය විස්තර කරනු.
3. ඉන්ද්‍රියසංවර ශීලය කවරේ ද?
4. ආජීව පාරිශුද්ධි ශීලය කෙසේ වේ ද?
5. ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලය ලැබෙන පරිදි දක්වනු.

## 14. චිත්ත විසුද්ධි, දිට්ඨි විසුද්ධි, කංඛාවිතරණ විසුද්ධි.

### චිත්තවිශුද්ධිය.

**චිත්තවිශුද්ධි නම් නීවරණයන්ගෙන් සිත පිරිසිදු කැරැගැන්ම ය.** මෙහි චිත්ත නම් සමාධි යි. ඒ වනාහි උපචාර සමාධි, අර්පණා සමාධි ය යි ද්විවිධ වේ. උපචාර සමාධි නම් අර්පණා ප්‍රාප්තියට පූර්වයෙන් ලැබෙන කාමාවචර සමාධි ය. අර්පණාසමාධි නම් රූපාවචර අරූපාවචර සමාධි සංඛ්‍යාත අෂ්ට සමාපත්ති ය. මෙහි විස්තර යට දැක්විණි. ශීලවිශුද්ධිය ඇත්තහුට චිත්තවිශුද්ධිය ලැබිය හැකි ය.

### දිට්ඨි විශුද්ධිය.

චිත්ත විශුද්ධිය ලත් යෝගී විසින් දෘෂ්ටි විශුද්ධියට පැමිණිය යුතු ය. දෘෂ්ටි විශුද්ධි නම් නාමරූප පරිග්‍රහය හෙවත් නාමරූප පිළිබඳ පිරිසිඳ දැන්මයි. ඒ දැන්ම වනාහි සංක්‍ෂෙප වශයෙන් ද කළ හැකි ය. විස්තර වශයෙන් ද කළ හැකි ය. අධ්‍යාත්ම ධර්ම දෙ කඩ කොටැ සිතා මේ නාම ය රූප නො වේ. මේ රූපය නාම නො වේ. නාමය අනෙකෙක. රූපය අනෙකක. ඒ නාම රූප දෙකින් අන්‍ය වූ ආත්මයෙක් හෝ ජීවියෙක් හෝ සත්ත්වයෙක් හෝ පුද්ගලයෙක් හෝ මනුෂ්‍යයෙක් හෝ දෙවියෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ

නැතැයි දැන ගැන්ම සංක්‍ෂෙප පරිග්‍රහ යි. මේ සඳහා නාම-රූප **ලක්‍ෂණ, රස, ප්‍රත්‍යුපස්ථාන, පදස්ථාන** වශයෙන් පිරිසිඳිය යුතු ය. **ලක්‍ෂණ නම්** ගින්නෙහි උෂ්ණත්වය මෙන් ධර්මයන්ගේ සාමාන්‍ය ස්වභාවය යි. **රස නම්** ගින්නෙහි පැසවන බබළන ගතිය මෙන් ධර්මයන්ගේ කෘත්‍ය හා සම්පත්ති යි **ප්‍රත්‍යුපස්ථාන නම්** ගින්නෙහි දුම මෙන් ධර්මයන්ගේ ඵලය යි. **පදස්ථාන නම්** ගින්න ඇතිවීමට හේතු මෙන් ධර්මයන්ගේ අසාධාරණ ප්‍රත්‍යය සංඛ්‍යාත ආසන්න කාරණය යි. මේ සිව් ආකාරයෙන් නාම රූප පරිග්‍රහය දෘෂ්ටි විශුද්ධි යි. මෙයින් සක්කාය දිට්ඨිය විෂ්කම්භනය වන බව දත යුතු. එයින්ම සංඥාවිපර්යාශ, චිත්තවිපර්යාෂදෘෂ්ටි විපර්යාශ යන ත්‍රිවිධ විපර්යාශ ද තුනී වන බව දත යුතු.

නාම-රූප දෙක ලක්‍ෂණාදි වශයෙන් මෙන් මැ පඨවි ධාතු ආදි චතුර්විධ ධාතු වශයෙන් ද, රූපස්කන්ධාදි පඤ්ච ස්කන්ධ වශයෙන් ද, චක්ඛායතනාදි ද්වාදස ආයතන වශයෙන් ද චක්ඛුධාතු ආදි අෂ්ටාරස ධාතු වශයෙන් ද පිරිසිඳැ දැන්ම දිට්ඨිවිසුද්ධිය යි. මේ සංක්‍ෂෙප ක්‍රමය යි.

විස්තර වශයෙන් වනාහි එක් එක් ධාතුවකට ද එක් එක් ස්කන්ධයකට ද එක් එක් ආයතනයකට ද එක් එක් චක්ඛාදි ධාතුවකට ද අයත් ඵස්සාදි නාම ද කෙසාදි රූප ද වෙන් කර දත යුතු යි. එසේ වෙන් කැරැ දැන ඒ එක් එක් නාමයක හෝ රූපයෙක හෝ ලක්‍ෂණාදිය වෙන් වෙන් වැ බැලිය යුතුය. ඒ විස්තරය **විශුද්ධි මාර්ගයෙහි** ඇත්තේ ය. යට ද දක්වන ලදි. මෙසේ බලත් ඔහුට යථාභූත දර්ශනය පහළ වේ. මේ යථාභූත දර්ශනය නැත්තේ සත්ත්වයෙක් ජීවියෙක් ආත්මයෙක් ඇතැ යි ගෙනැ එහි අවිනාශය සලකන්නේ ශාස්වත දෘෂ්ටියෙහි වැටෙයි. විනාශය සලකන්නේ උච්ඡේද දෘෂ්ටියෙහි වැටෙයි. යථාභූත දර්ශනය ඇත්තේ අඞ්ගසම්භාරය විනා රථයෙක් යි වෙනම දෙයෙක් නැතැ යි ගන්නා සේ නාම රූප දෙකින් පිටත් වෙන ම සත්ත්වාදියෙක් නැතැ යි ගන්නේ ය. අන්ධයා හා පිළා හා එක් වැ ගමන් ගන්නා සේ නාම හා රූප හා එක් වැ පවත්නේ ය යි ගන්නේ ය. විස්තර **විශුද්ධි මාර්ගයෙහි** බලනු.

## කංඛාවිතරණ විසුද්ධිය.

දිට්ඨිවිසුද්ධිය ලත් යෝගී විසින් කංඛාවිතරණ විසුද්ධියට පැමිණිය යුතු ය. කංඛාවිතරණ විසුද්ධි නම් යට දැක්වුණු නාම රූපයන්ගේ ප්‍රත්‍යය පරිග්‍රහය යි. හෙවත් නාම රූප ඇතිවන හේතු පිරිසිඳැ දැන්ම යි. ඒ දැන්ම ද සංක්‍ෂෙප වශයෙන් ද විස්තර වශයෙන් ද ලැබ ගත හැකි ය. වස්තු හා ආරම්මණ නාම ඇති වීමේ හේතු ය. කර්ම, චිත්ත, ඍතු, ආහාර, රූප ඇතිවීමේ හේතුය. අවිද්‍යා තෘෂ්ණා, උපාදාන, කර්ම, නාමරූප ඇතිවීමේ හේතු යි. මේ සංක්‍ෂෙප පරිග්‍රහය යි. පටිච්චසමුප්පාදයෙහි පට්ඨානනය වශයෙන් දැන් ම විස්තර පරිග්‍රහය යි.

විශුද්ධිමාර්ගාගත ක්‍රමයෙන් බිඳු මාත්‍රයෙක් මෙසේ ය:

කංඛාවිතරණ විසුද්ධියට පැමිණෙනු කැමැති යෝගී දක්‍ෂ වෙදෙක් රෝගියකු දැකැ රෝග නිදානය සොයන්නා සේ අනුකම්පා සහිත පුරුෂයෙක් වීථියෙක උඩුකුරු වැ වැටී හුන් ළදරුවකු දැකැ ඔහුගේ මව්පියන් සොයන්නා සේ නාම රූප දැකැ ඒ නාම රූප කෙසේ වී දැ යි ඔවුන්ගේ ප්‍රත්‍යය සොයන්නේ ය. මේ කය පියුම් උපුල් තුළෙක හෝ මිණිමුතු ආරෙක හෝ උපදින්නේ නො වෙයි. පරමසම්බාධ දුර්ගන්‍ධ කුස තුළ ගවරවළෙක පණුවකු මෙන් උපදින්නේ ය. එයට අවිද්‍යා තෘෂ්ණා උපාදාන කර්ම යන සතර නිබ්බත්තක හේතු ය. ආහාරය උපත්‍ථම්භක ප්‍රත්‍යය. ඉතිදු අවිද්‍යා තෘෂ්ණා උපාදාන මව මෙවන් ද කර්මය පියා මෙන් ද ආහාරය කිරි මව මෙන් ද උපකාර වේ. මෙසේ රූපකාය ප්‍රත්‍යය දැනැ ඇස හා රූපය නිසා චක්ඛුවිඤ්ඤාණ සිත උපදින්නේ ය යනාදීන් නාමකාය ප්‍රත්‍යය ද දැන ගන්නේ ය. මේ මෙසේ මෙකල ප්‍රත්‍යය වූවා සේ පෙර ද ප්‍රත්‍යය වූයේ ය. මතු ද ප්‍රත්‍යය වන්නේ ය යි දැනැ ගන්නේ ය. එසේ දැන ගනුත් ඔහුට පූර්වාන්තය නිසා පවත්නා “මම් පෙර වූයෙම් ද නො වූයෙම් ද, කෙසේ වූයෙම් ද, කෙබඳු වූයෙම් ද, කවරෙක් වැ කවරෙක් වූයෙම් ද යන පඤ්චවිධ විචිකිච්ඡා ද “මම මතු වන්නෙම් ද, නො වන්නෙම් ද යනාදීන් අපරාන්තය නිසා ඇතිවන පංචවිධ විචිකිච්ඡා ද “මම ද? නැත් ද? මම කවරෙකිම් ද, කෙබන්දෙකිම් ද, මේ සත්‍ය කොයින් ආයේ ද, හේ කොයි යන්නේ ද යන වර්තමානය නිසා පවත්නා ස වැදෑරුම් විචිකිච්ඡා ද යන සොළොස් වැදෑරුම් විචිකිච්ඡා නැති වන්නේ ය. එසේ කංඛා-විචිකිච්ඡා විතරණය කරන හෙයින් ම මෙයට කංඛාවිතරණ විසුද්ධිය යි කියනු ලැබේ.

තව ද කිසිවෙක් නාමය පිළිබඳ සාධාරණ අසාධාරණ යන ද්විවිධ හේතු ද, රූපය පිළිබඳ කර්මාදි චතුර්විධ හේතු ද සොයන්නේ ය. චක්‍ෂුරාදි ද්වාර සය හා රූපාදි ආරම්මණ සය නාමයාගේ සාධාරණ හේතු ය. කුසලාකුසලාදි සියල්ල එයින් ම වන බැවිනි. යෝනිසෝමනස්කාරාදිය අසාධාරණ හේතු ය. යෝනිසෝමනස්කාර සද්ධර්ම ශ්‍රවණාදිය කුශලයන්ට ද අයෝනිසෝමනස්කාරාදිය අකුශලයන්ට ද, කර්මය විපාකයන්ට ද භවාඞ්ගාදිය ක්‍රියාවන්ට ද ප්‍රත්‍යය වන බැවිනි. කර්ම චිත්ත ඍතු ආහාර යන සතර රූපයට ප්‍රත්‍යය. මෙකල මෙන් පෙර ද මේ මෙසේ ප්‍රත්‍යය වූයේ ය. මතු ද වන්නේ ය යි සිතත් ඔහුට තුන් කල් පිළිබඳ කංඛාවිතරණ වන්නේ ය.

තව ද කිසිවෙක් නාමරූප පිළිබඳ පටිච්චසමුප්පාදනයයෙන් ප්‍රත්‍යය සොයන්නේ ය. එයිනු දු ඔහුගේ තුන් කල් පිළිබඳ කංඛා විතරණ වන්නේ ය.

තව ද කිසිවෙක් අතීත හේතු පස හා වර්තමාන ඵල පස වශයෙන් ද වර්තමාන හේතු පස හා අනාගත ඵල පස වශයෙන් ද යනු කම්මවට්ට විපාකවට්ට වශයෙන් නාමරූප පිළිබඳ ප්‍රත්‍යය සොයන්නේ ය. එසේ සොයත් ඔහුට අතීත අනාගත වර්තමාන ධර්ම චුති පටිසන්ධි වශයෙන් ප්‍රකට වැ දැනෙන්නට පටන් ගනියි. ඤාතපරිඤ්ඤා යනු මේ ය. හේ මෙසේ සලකයි. “අතීත කර්ම ප්‍රත්‍යයයෙන් නිපන් ස්කන්‍ධ එහි ම නිරුද්ධ විය. අතීත කර්ම ප්‍රත්‍යයයෙන් මෙහි අන්‍ය ස්කන්‍ධ පහළ විය. අතීත භවයෙන් මෙහි එක ද දෙයෙක් නො ආයේය. මේ භවයෙහි දු කර්ම ප්‍රත්‍යයයෙන් නිපන් ස්කන්‍ධ නිරුද්ධ වෙයි. මතු භවයෙහි උපදින්නේ අන්‍ය ස්කන්‍ධය මේ භවයෙන් මතු භවයට කිසිවකු දු නො යයි. එහෙත් අතීත කර්ම හේතුයෙන් මෙහි දු මෙහි කර්ම හේතුයෙන් මතු ද ස්කන්‍ධ පහළ

නො වන්නේ නොවේ" යි. මෙසේ ච්‍යුති ප්‍රතිසන්‍ධි වශයෙන් සියලු ධර්ම දනුත් ඔහුට සියලු ආකාරයෙන් නාම රූප පිළිබඳ ප්‍රත්‍යය පරිග්‍රහ ඥානය වන්නේ ය. එයින් යට දැක්වුණු සොළොස් වැදෑරුම් සැක දුරු වෙයි. එසේම "සත්‍ථරිකංඛති" යනාදීන් දැක්වෙන අෂ්ටවිධ කංඛා ද නො වෙයි. දෙසැට මිථ්‍යාදෘෂ්ටි විෂ්කම්භනය වෙයි. මෙසේ නානා නයයෙන් නාම රූප පිළිබඳ ප්‍රත්‍යය දැක්මෙන් තුන් කල්හි සැක දුරු කැර සිටිනා නුවණ කංඛාවිතරණ විසුද්ධි ය යි දත යුතු. **ධම්මට්ඨිත ඤාණ, යථාභූත ඤාණ, සම්‍යග් දර්ශන** යනු ද මේ කංඛාවිතරණ විශුද්ධිය යි. බුද්ධශාසනයෙන් පිහිට ලද්දේ මේ නුවණ ලත් තැනැත්තේ යයි කිය යුතු. **චුල්ලසොතාපන්න** යනු දු මේ යි.

**ප්‍රශ්න.**

1. චිත්තවිශුද්ධිය යනු කිම? පැහැදිලි කරනු.
2. දිට්ඨිවිසුද්ධිය විස්තර කරනු. එය ලැබැ ගත හැකි ක්‍රම දක්වනු.
3. කංඛාවිතරණ විශුද්ධිය කවරේ ද?
4. කංඛාවිතරණ විශුද්ධිය සඳහා ප්‍රත්‍යය පරිග්‍රහය කී ආකාරයකින් කළ හැකි ද?
5. මෙයට කුමක් හෙයින් ධම්මට්ඨිතඤාණ, යථාභූතඤාණ, සම්‍යග්දර්ශන යන නම් ව්‍යවහාර කෙරේ ද? චුල්ලසෝතාපන්නයා කවරේ ද?

## 15. මග්ගාමග්ගඤාණදස්සන විසුද්ධිය.

කංඛාවිතරණ විසුද්ධි ලත් යෝගී විසින් මග්ගාමග්ග ඤාණ දස්සන විසුද්ධියට පැමිණිය යුතු. එයට පැමිණියහු විසින් කංඛා විතරණ විසුද්ධියෙහි දී පිරිසිඳැ ගන්නා ලද අතීතාදි භේද භින්න ත්‍රෛභූමික සංස්කාරයන්හි ස්කන්‍ධාදී ක්‍රමයෙන් කලාප වශයෙන් හකුළා ක්‍ෂයාර්ථයෙන් අනිත්‍යය, භයාර්ථයෙන් දුඃඛය, අසාරාර්ථයෙන් අනාත්මය යි අද්ධාන වශයෙන් සන්තති වශයෙන් ක්‍ෂණ වශයෙන් ත්‍රිලක්‍ෂණ සම්මර්ශනය කළ යුතු. ඒ ත්‍රෛභූමික සංස්කාරයන්හි ම ප්‍රත්‍යය වශයෙන් ක්‍ෂණ වශයෙන් උදයව්‍යය බැලිය යුතු. එසේ සම්මර්ශනය කරත් එසේ බලත්. ඒ විදර්ශකයා හට ඔභාසාදි දශ විදර්ශනානොපක්ලෙශ පහළ වන්නේ ය. ඒ විදර්ශනානොපක්ලෙශ මාර්ග නො වෙයි. මාර්ගයට පරිපන්‍ථය යි ඔහු විසින් මාර්ගාමාර්ග ව්‍යවස්ථා කළ යුතු ය. එසේ මාර්ගාමාර්ග ව්‍යවස්ථා කරන ඥානය මග්ගාමග්ග ඤාණදස්සන විසුද්ධිය යි.

විස්තර මෙසේ ය:
**අතීතාදි භෙද භින්න ත්‍රෛභූමික සංස්කාරයන්හි** අතීතාදි භෙද භින්න නම් **"යංකිඤ්චි රූපං අතීතානාගත පච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙවා යා කාචි වෙදනා"** යනාදීන් වදාළ අතීත අනාගත වර්තමාන වූ ආධ්‍යාත්මික වූ බාහිර වූ හෝ ඖදාරික වූ හෝ සූක්‍ෂම වූ හෝ හීන වූ හෝ ප්‍රණීත වූ දුර වූ හෝ සන්තික වූ හෝ එකොළොස් ආකාර රූපය වේදනාදිය ද එසේ ය.

ත්‍රෛභූමික සංස්කාර නම් කාමාවචර රූපාවචර අරූපාවචර ධර්ම යි. ලෝකෝත්තර වනාහි විදර්ශනාවට අරමුණු නො වේ. විදර්ශනාවට අරමුණු වන්නේ සානුසය ධර්ම යි. විදර්ශනාව අනුශය ප්‍රහාණය පිණිස බැවිනි.

**ස්කන්ධාදි වශයෙන් කලාප වශයෙන් හකුළා-** ත්‍රෛභූමික ධර්ම පඤ්චස්කන්ධාදි ක්‍රමයෙන් කලාප වශයෙන් පිඬු කළ යුතු ය. මෙහි ආදි ශබ්දයෙන් ෂඩ්ද්වාර, ෂඩාලම්බන, ෂඩ්විඥාන, ෂඩ් ස්පර්ශ, ෂඩ්වේදනා, ෂඩ්සංඥා, ෂඩ්චෙතනා, ෂඩ්තෘෂ්ණා, ෂඩ්විතර්ක, ෂඩ්විචාර, ෂඩ්ධාතු, දසකසිණ, දෙතිස් කොට්ඨාස, ද්වාදස ආයතන, අටළොස් ධාතු, දෙවිසි ඉන්ද්‍රිය, ත්‍රිධාතු, නවභව, චතුර් ධ්‍යාන, චතුර්විධ අප්පමඤ්ඤා, සතර සමාපත්ති, දොළොස් පටිච්ච සමුප්පාද ගන්නේ ය. මේ ක්‍රමයෙන් රූපස්කන්ධ වශයෙන් කලාප සම්මර්ශනය මෙසේ ය. "යංකිඤ්චි රූපං අතීතානාගත පච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා යං පණීතං වා දූරෙ සන්තිකෙ වා සබ්බං රූපං අනිච්චං ඛයට්ඨෙන, දුක්ඛං භයට්ඨෙන, අනත්තා අසාරකට්ඨෙන" වේදනාදිය පිළිබඳ ද කලාප සම්මර්ශනය මෙසේ ය.

**"ක්‍ෂයාර්ථයෙන් අනිත්‍යය, භයාර්ථයෙන් දුඃඛය, අසාරාර්ථයෙන් අනාත්මය යි"** රූපාදිය ක්‍ෂයයට පැමිණෙන්නේ ය. එබැවින් අනිත්‍ය යි. යමෙක් ක්‍ෂයයට පැමිණේ නම් එය භය ජනක ය. රූපාදිය භයජනක හෙයින් දුඃඛ ය, ආත්මාදි වශයෙන් ගත යුතු සාර නැති හෙයින් අනාත්ම ය.

**"අද්ධාන වශයෙන්"** එක් එක් භවයෙන් පරිච්ඡින්න කාල වශයෙන් එක් භවයෙක පහළ වූ රූපාදිය අනෙක් භවයකට නො යයි. ඒ ඒ භවයෙහිදී ම නිරුද්ධ වෙයි. එක් භවයෙහි දු තුන් වයස්හි, දස දසකයෙහි, අවුරුදු සෘතු මාස පක්‍ෂ සති දවස් රූ දවල් යාමාදියෙහි පහළ වූ රූපඅ නෙක් වයස් ආදියට නො ගොස් එහි ම නිරුද්ධ වෙයි.

**"සන්තති වශයෙන්"** - රූපසන්තති වශයෙන් හා අරූප සන්තති වශයෙන් ශාරිපුත්‍ර ස්වාමීහු සන්තති වශයෙන් කලාප සම්මර්ශනය මෙසේ විස්තර කරති.

"මෙහි රූපසන්තති අරූපසන්තති වශයෙන් කලාප සම්මර්ශනය නම්:

**"ආදානනික්ඛෙපනතො වයොවුද්ධත්‍ථගාමිතො**
**ආහාරතො ච උතුතො කම්මතො චාපි චිත්තතො**
**ධම්මතා රූපතො සත්ත විත්‍ථාරෙන විපස්සති"** යි.

කියනු ලබන මේ සත්පරිද්දෙන් කරන විදර්ශනා යි.

මෙහි **ආදාන නික්ඛෙප** හෙයින් විදර්ශනා නම් ප්‍රතිසන්ධි ච්‍යුති වශයෙන් පරිච්ඡින්න එකෙකි. භවයෙහි රූපයෝ අන්‍ය භවයට නො ගොස් ඒ ඒ භවයෙහි ම නිරුද්ධ වෙති.

ඉති බැවින් අනිත්‍ය ය. අනිත්‍ය හෙයින් මැ දුඃඛ ය. දුඃඛ හෙයින් මැ අනාත්ම යැ යි ද විදර්ශනා කිරීම. (ආදාන නම් ප්‍රතිසන්‍ධි, නික්ඛෙප නම් චුති.)

**වයොවුද්ධත්‍ථගාමි හෙයින්** විදර්ශනා කෙසේ ද යත් හවුරුදු සියක් දවස් ප්‍රථම මධ්‍යම පශ්චිම අවස්ථා හෙයින් තුන් කොටසක් කොටැ තෙතිස් හව්රුද්දකින් පරිච්ඡින්න වූ පළමු වැනි අවස්ථායෙහි පැවැති රූපයන් ද්විතීයාවස්ථාවට නො පැමිණැ එහි මැ නිරුද්ධ වන බැවින් ද සතිස් හව්රුද්දකින් පරිච්ඡින්න වූ ද්විතීය අවස්ථායෙහි පැවැති රූපයන් තෘතීය අවස්ථාවට නො පැමිණැ එහි ම නිරුද්ධ වන බැවිනු දු තෙතිස් හව්රුද්දකින් පරිච්ඡින්න වූ පශ්චිමාවස්ථායෙහි පැවැති රූපයන් මරණින් මත්තට නො ගොස් එහි ම නිරුද්ධ වන බැවිනුදු අනිත්‍යය දුඃඛය අනාත්මයැ යි වයොවුද්ධත්‍ථගාමී හෙයින් විදර්ශනා කෙරෙයි. නැවත එ මැ වර්ෂ ශතය.

**"මන්ද ඛිඩ්ඩා ච වණ්ණා ච බලාපඤ්ඤා ච හායනා**
**පබ්භාරා ච පවංකා ච මොමූහා සයනා දස"** යි.

කියන ලද දශකවශයෙන් දශ කොටසක් කොටැ නැවත පස් හව්රුදු හෙයින් විසි කොටසක් කොටැ නැවැත සතර හව්රුදු හෙයින් පස්විසි කොටසක් කොටැ තුන් හවුරුදු බැවින් තෙතිස් කොටසක් කොටැ දෙ හව්රුදු බැවින් පනස් කොටසක් කොටැ එකෙකි හව්රුදු බැවින් සියක් කොටසක් කොටැ එකෙකි හව්රුද්දෙහි හිමත්, ගිමන්, වසත් යන ඍතු හෙයින් තුන්කොටසක් කොටැ නැවත හිම ශිශිර වසන්ත ග්‍රීෂ්ම වර්ෂා ශරත් යන ඍතු හෙයින් සකොටසක් කොටැ නැවත එකෙකි. මස් හෙයින් දොළොස් කොටසක් කොටැ නැවැත එකෙකි මස කෘෂ්ණපක්ෂ ශුක්ලපක්ෂ හෙයින් දො කොටසක් කොටැ නැවැත එක් අඩ මසක් දවස් හෙයින් පසළොස් කොටසක් කොටැ නැවත එක් දවසක් රාත්‍රින්දිව හෙයින් දෙකොටසක් කොටැ නැවැත යම් හෙයින් සකොටසක් කොටැ යට කී පරිද්දෙන් විදර්ශනා කෙරෙයි. නැවත අභික්කම පටික්කම ආලොකිත විලොකිත සම්මිඤ්ජිත පසාරිත හෙයින් පිරිසිඳැ අභික්‍රමණයෙහි පැවැති රූපයෝ ප්‍රතික්‍රමණයට නො පැමිණැ එහි ම නිරුද්ධ වෙති යි යනාදීන් වෙන් වෙන් කොටැ කී සෙයින් මැ මෙනෙහි කෙරෙයි. නැවත එක් පදවාරයක් උද්ධරණ අතිහරණ වීතිහරණ වොස්සජ්ජන සන්තික්ඛෙපන සන්නිරුම්භන වශයෙන් සකොටසක් කොටැ උද්ධරණයෙහි පැවැති රූපයෝ අතිහරණයට නොගොස් එහි මැ නිරුද්ධ වෙති යනාදීන් වෙන් වෙන් කොටැ කී සෙයින් මැ විදර්ශනා කෙරෙයි. මෙ කී තාක් පරිද්දෙන් විදර්ශනා කරන්නේ **වයොවුද්ධත්‍ථගාමී සෙයින් සම්මර්ශනය කරන්නා නම් වේ.**

සුහිතකාලයෙහි පැවැති රූපයෝ ක්‍ෂුධාදුඃඛයෙන් පීඩිත අවස්ථාවට නො පැමිණැ ඒ ඒ තැනැ ම නිරුද්ධ වෙති. ක්‍ෂුධා දුඃඛයෙන් පීඩිතාවස්ථායෙහි පැවැති රූපයෝ සුහිත කාලයට නො පැමිණැ ඒ ඒ තැනැ මැ නිරුද්ධ වෙති. ඉති බැවින් අනිත්‍යය දුඃඛය අනාත්මය යි ආහාරජරූප වශයෙන් මෙනෙහි කරන්නේ **ආහාර හෙයින් මෙනෙහි කරන්නා නම් වේ.**

ශීතකාලයෙහි පැවැති රූපයෝ උෂ්ණ කාලයට නො පැමිණැ, හුණු කල පැවැති රූපයෝ සිහිල් කලට නො පැමිණැ එකල්හි මැ නිරුද්ධ වෙති යි ඍතු සමුත්ථාන වශයෙන් මෙනෙහි කරන්නේ **ඍතු හෙයින් මෙනෙහි කරන්නා නම් වේ.**

චක්ෂුර්ද්වාරයෙහි පැවැති කර්මජරූපයෝ අනෙක් තැනකට නො ගොස් එ තැනැ මැ නිරුද්ධ වෙති. ශ්‍රොත්‍ර ඝ්‍රාණ ජිහ්වා කාය ද්වාර හෘදයවස්තුයෙහි පැවැති කර්මජ රූපයෝ ඔබ්බට නොගොස් ඒ ඒ තැනැ මැ නිරුද්ධ වෙති. ඉති බැවින් අනිත්‍යය යනාදීන් **කර්ම හෙයින් මෙනෙහි කරන්නා නම් වේ.**

සොම්නස් කල්හි පැවැති රූප දොම්නස් කලට නො පැමිණ දොම්නස් කලැ පැවැති රූ සොම්නස් කලට නො පැමිණැ එ තැන ම නිරුද්ධ වෙයි. චිත්තජරූප වශයෙන් මෙනෙහි කරන්නේ **චිත්ත හෙයින් මෙනෙහි කරන්නා නම් වේ.**

ආම්‍රවෘක්ෂාදියෙහි අඞ්කුරාදි වූ නොයෙක් අවස්ථායෙන් වැටෙන අනින්ද්‍රිය බද්ධසන්තානයෙහි වැටෙන රූපයන් අතුරෙන් ඒ ඒ අවස්ථායෙහි පැවැති රූපයෝ අන්‍ය අන්‍ය අවස්ථාවට නො පැමිණැ ඒ ඒ තන්හි ම නිරුද්ධ වෙති. මෙසේ ධර්මතා රූප වශයෙන් මෙනෙහි කරන්නේ **ධර්මතා රූප වශයෙන් සම්මර්ශනය කරන්නා නම් වේ.** මෙසෙයින් රූපසප්තක වශයෙන් විදර්ශනා කෙරෙයි.

**අරූපසප්තක වශයෙන් කෙසෙයින් විදර්ශනා කෙරෙයි යත්**

**"කලාපතො යමකතො ඛණතො පටිපාටිතො**
**දිට්ඨි උග්ඝාටනා මාන සමුග්ඝාත්නතො පි ච**
**නිකන්තිපරියාදනා සත්තාරූප විපස්සනා"** යි.

කියන ලද මේ සප්ත ප්‍රකාරයෙන් විදර්ශනා කෙරෙයි. මෙහි යට රූප සප්තකයෙහි ආදාන නික්ඛෙපාදි වශයෙන් සත් සත් තන්හි පැවැති විදර්ශනා සිත් එක් කොටැ අනිත්‍යය දුඃඛය අනාත්මය යි මෙනෙහි කරන්නේ **කලාප වශයෙන් විදර්ශනා කරන්නා නම් වේ.**

ආදානනික්ඛෙප වශයෙන් රූපයන් අනිත්‍යාදි හෙයින් විදර්ශනා කොටැ ඒ රූපයන් විදර්ශනා කළ සිතු දු අනිත්‍යාදි හෙයින් විදර්ශනා කොටැ එයින් වයොවෘද්ධත්ථගාමී ආදි එකෙකි. රූපයන් විදර්ශනා කොට ඒ රූපයන් විදර්ශනා කළ සිතු දු විදර්ශනා කිරීම් වශයෙන් මෙසේ මෙසේ රූපාරූප විදර්ශනාවන් යුගල කොටැ පවත්නේ **යුග්ම හෙයින් විදර්ශනා නම් වේ.**

ආදානනික්ඛෙප හෙයින් රූප විදර්ශනා කොටැ එයින් දෙවන සිත් තුන්වන සිත් සතරවන සිත් පස්වන සිත් විදර්ශනා කොටැ මෙසෙයින් මැ වයොවුද්ධත්ථගාමි ආදි එකෙකි රූප විදර්ශනා කොටැ ඒ ඒ විදර්ශනා කළ සිත් විදර්ශනා කෙරෙමින් සතරවන සිත් දක්වා විදර්ශනා කරන්නේ **ක්‍ෂණ හෙයින් විදර්ශනා කරන්නා නම් වේ.**

මෙකී පරිද්දෙන් ආදානනික්ඛෙපාදි විදර්ශනා කොටැ පිළිවෙලින් දසවන සිත් දක්වා විදර්ශනා කරන්නේ **පටිපාටි හෙයින් විදර්ශනා කරන්නා නම් වේ.**

අනත්තානුපස්සනා විසින් ආත්මය යි නො දක්නා බැවින් ආත්මදෘෂ්ටි උගුළුවන විදර්ශනා කරන්නේ **දෘෂ්ටි උද්ඝාට හෙයින් විදර්ශනා කරන්නා නම් වේ.**

අනිච්චානුපස්සනා විසින් මානයට වස්තු වූ මැනවක් නො දන්නා බැවින් මාන නසන විසින් විදර්ශනා කරන්නේ **මාන සමුග්ඝාත හෙයින් විදර්ශනා කරන්නා නම් වේ.**

දුක්ඛානුපස්සනා විසින් පැතිය යුතුවක් නො දක්නා බැවින් නිකාන්ති ක්‍ෂය කරන විසින් විදර්ශනා කරන්නේ **නිකාන්ති පර්යාදන හෙයින් විදර්ශනා කරන්නා නම් වේ.**

"**ක්‍ෂණ වශයෙන්**" රූපාරූප ධර්මයන්ගේ ආයුඃ ප්‍රමාණ සංඛ්‍යාත ක්‍ෂණ වශයෙන්, ක්‍ෂණ වශයෙන් සම්මර්ශනය බුදුවරයන්ට විනා සෙස්සන්ට නො ලැබෙතියි කියත්. එය සෙස්සන්ට නොදැක්ක හැකි බැවිනි.

"**ත්‍රිලක්‍ෂණ සම්මර්ශනය කළයුතු**" යට කී පරිදි තිලකුණු මෙනෙහි කළ යුතුයි. (මේ සම්මර්ශනයෙහි ලා තවද නොයෙක් ක්‍රම ඇත්තේ ය. **විශුද්ධිමාර්ගය** බලනු.)

මෙතෙකින් ත්‍රිලක්‍ෂණ සම්මර්ශන ක්‍රමයද දක්වන ලදි. ඉක්බිති කී උදය ව්‍යය බලන සැටි ද දශ විදර්ශනොපක්ලෙශ ද මතු පාඩමින් දක්වනු ලැබේ.

**ප්‍රශ්න.**

1. මග්ගාමග්ග ඤාණදස්සන විසුද්ධිය සැකෙවින් දක්වනු.
2. කලාප සම්මර්ශනයෙහි ලා ආකාර කීයෙක් ද? ඒ දක්වනු.
3. ත්‍රි ලක්‍ෂණය යනු කිම? පැහැදිලි කරනු.
4. අද්ධාන වශයෙන් සන්තති වශයෙන් ක්‍ෂණ වශයෙන් සම්මර්ශනය කරන්නේ කෙසේ ද?
5. රූපසන්තති සත හා අරූපසන්තති සත දක්වනු.

## 16. මග්ගාමග්ගඤාණදස්සන විසුද්ධිය. උදයව්‍යය විදර්ශනාව හා විදර්ශනොපක්ලෙශ.

යට දැක්වුණු පරිදි ත්‍රෛභූමික සංස්කාරයන්ගේ ත්‍රිලක්‍ෂණ සම්මර්ශනය කොටැ ඉක්බිති ඔවුන්ගේ ම ප්‍රත්‍යය වශයෙන් ක්‍ෂණ වශයෙන් උදයව්‍යය බැලිය යුතු. පඤ්චස්කන්‍ධ වශයෙන් එය විස්තර කරත් සම පණස් ආකාර වේ.

උදය නම් නාම රූපයන්ගේ නිබ්බත්ති ලක්‍ෂණ උපැත්මය. වය නම් විපරිනාම ලක්‍ෂණ භඞ්ගය, වීණාව වාදනය කරන කල්හි එහි නාදය යම් තැනෙක තිබී එන්නේ නොවේ. නැති වන කල්හි ගොස් යම් තැනෙක රැස්වන්නේ ද නොවේ. වීනා උපවීණා පුරුෂවීර්‍ය්‍ය යන මේ තුන නිසා ඇතිවැ නැති වන්නේ ය. එමෙන් මේ නාම රූපය ද යම් තැනෙක රැස් වැ තිබී එයින් උපදින්නේ නො වේ. නැති වන කල්හි ද යම් තැනෙක ගොස් ගොඩ ගැසෙන්නේ නො වේ ඇති වැ නැති වන්නේ ය. ඇතිවීම උදය යි. නැති වීම වය යි. ප්‍රත්‍යය නම් කර්මාදිය යි. ක්‍ෂණ නම් නිබ්බත්ති ක්‍ෂණය හා වය ක්‍ෂණය යි.

**රූපස්කන්‍ධයාගේ ප්‍රත්‍යය වශයෙන් හා ක්‍ෂණ වශයෙන් උදය ව්‍යය බලන ආකාරය මෙසේ ය.**

අවිද්‍යාසමුදයෙන් රූපසමුදය වන්නේ ය. තෘෂ්ණා සමුදයයෙන් රූප සමුදය වන්නේ ය. කර්මසමුදයයෙන් රූප සමුදය වන්නේ ය. (මේ ප්‍රත්‍යය වශයෙන් බලන සැටි යි.) රූපස්කන්‍ධයාගේ නිබ්බත්ති ලක්‍ෂණය ද බලන්නේ ය (මේ ක්‍ෂණ වශයෙන් බලන සැටි යි.)

අවිද්‍යානිරෝධයෙන් රූපනිරෝධය වන්නේ ය. තෘෂ්ණා නිරෝධයෙන් රූපනිරෝධය වන්නේ ය. කර්මනිරෝධයෙන් රූප නිරෝධය වන්නේ ය. ආහාරනිරෝධයෙන් රූප නිරෝධය වන්නේ ය. (මේ ප්‍රත්‍යය වශයෙන් බලන සැටි ය.) රූපස්කන්‍ධයාගේ විපරිනාම ලක්‍ෂණය ද බලන්නේ ය. (මේ ක්‍ෂණ වශයෙන් බලන සැටි යි.) සෙස්සෙහි ද විස්තරය මෙසේ දතයුතු.

**වේදනාස්කන්‍ධයාගේ ප්‍රත්‍යය වශයෙන් හා ක්‍ෂණ වශයෙන් උදය ව්‍යය බලන ආකාරය මෙසේ ය.**

අවිද්‍යාසමුදයයෙන්, තෘෂ්ණා සමුදයයෙන්, කර්මසමුදයයෙන්, ස්පර්ශ සමුදයයෙන් වේදනා සමුදය වන්නේ ය. වේදනාවගේ නිබ්බත්ති ලක්‍ෂණය ද බලන්නේ ය. අවිද්‍යා නිරෝධයෙන්, තෘෂ්ණානිරෝධයෙන්, කර්මනිරෝධයෙන්, ස්පර්ශ නිරෝධයෙන් වේදනා නිරෝධය වන්නේ ය. වේදනාවගේ විපරිනාම ලක්‍ෂණය ද බලන්නේ ය.

**සංඥස්කන්‍ධයාගේ උදය ව්‍යය බලන සැටි මෙසේය:**
අවිද්‍යා, තෘෂ්ණා, කර්ම, ස්පර්ශ සමුදයයෙන් සංඥාසමුදය වන්නේ ය. සංඥාවගේ නිබ්බත්ති ලක්‍ෂණය ද බලන්නේ ය. සංඥාවගේ විපරිනාම ලක්‍ෂණ ද බලන්නේ ය.

**සංස්කාරස්කන්‍ධයාගේ උදය ව්‍යය බලන සැටි මෙසේ ය:**

අවිද්‍යා, තෘෂ්ණා, කර්ම, ස්පර්ශ සමුදයයෙන් සංස්කාර සමුදය වන්නේ ය. සංස්කාරයන්ගේ නිබ්බත්ති ලක්‍ෂණය ද බලන්නේ ය. අවිද්‍යා, තෘෂ්ණා, කර්ම, ස්පර්ශ නිරෝධයෙන් සංස්කාරයන්ගේ විපරිනාම ලක්‍ෂණය ද බලන්නේ ය.

**විඥනස්කන්‍ධයාගේ උදය ව්‍යය බලන සැටි මෙසේ ය:**
අවිද්‍යා, තෘෂ්ණා, කර්ම, නාමරූප සමුදයයෙන් විඥාන සමුදය වන්නේ ය. විඥානයාගේ නිබ්බත්ති ලක්‍ෂණය ද බලන්නේ ය. අවිද්‍යා, තෘෂ්ණා, කර්ම, නාමරූප නිරෝධයෙන් විඥාන නිරෝධය වන්නේ ය. විඥානයාගේ විපරිනාම ලක්‍ෂණය ද බලන්නේ ය.

මෙසේ සම පණස් ආකාරයෙන් උදය ව්‍යය බලත් ඔහුගේ ඥානය විශදතර වේ. ඒ ඥානය තරුණ විදර්ශනා ඥානය යි කියනු ලැබේ. මෙසේ බලන්නා ආරද්ධවිදර්ශකයා යි කියනු ලැබේ.

## දශ විදර්ශනොපක්ලේශ.

මෙසේ තරුණ විදර්ශනාඥානයෙන් යුත් ආරද්ධවිදර්ශකයාට **ඔභාස, ඤාණ, පීති, පස්සද්ධි, සුඛ, අධිමොක්ඛ, පග්ගහ, උපට්ඨාන, උපෙක්ඛා, නිකන්ති** යන දශ විදර්ශනොපක්ලේශ පහළ වන්නේ ය.

"ඔභාසො පීති පස්සද්ධි අධිමොක්ඛො ච පග්ගහො
සුඛං ඤාණමුපට්ඨාන උපෙක්ඛා ච නිකන්ති ච."

**ඔභාස** නම් විදර්ශනා චිත්තයෙන් උපදනා ශරීරාලෝකය යි. මෙය ඇතැම් කෙනෙකුන්ට තමා උන් පළඟ පමණ වැ ද ඇතැම් කෙනෙකුන්ට ඔවරකය පමණ වැ ද ඇතැම් කෙනෙකුන්ට විහාරය පමණ වැ ද ඇතැම් කෙනෙකුන්ට ගව් දෙගව් අඩ යොදුන් යොදුන් දෙයොදුන් ආදි පමණ වැ ද උපදියි. බුදුරජාණන් වහන්සේට දස දහසක් ලෝකධාතුව පුරා උපන්නේ ය. මේ උපන් කල්හි ඇතැම්හු මාර්ගය ලද්දෙමි. ඵලයට පැමිණියෙමි යි සිතා මතු උත්සාහය හැර පියති. එ බැවින් මේ විදර්ශනෝපක්ලේශ යි.

**ඤාණ** නම් විදර්ශනා ප්‍රඥා ය. නාම රූප ධර්ම පිරිසිඳුත් ඒ යෝගීහට ඉඳුවජ්‍ර සේ තීක්‍ෂණ වූ අතිවිශ ද නුවණෙක් පහළ වන්නේ ය.

**පීති** නම් විදර්ශනා ප්‍රීති ය. එ විට ඔහුගේ මුළු සිරුර පස්වනක් ප්‍රීතියෙන් පිනා යන්නේ ය.

**පස්සද්ධි** නම් කායපස්සද්ධි හා චිත්තපස්සද්ධි ය. කාය චිත්තයන්ගේ දරථ දුරු කෙරෙමින් සැහැල්ලු බවෙක් වන්නේ ය. එයින් ඔහුට අමානුස රතියෙක් ඇති වේ.

**සුඛ** නම් විදර්ශනා සුඛය. ඔහුගේ මුළු සිරුර තෙමමින් අති ප්‍රණීත සුවයෙක් වන්නේ ය.

**අධිමොක්ෂ** නම් ශ්‍රද්ධාධිමොක්ෂය ඔහුට අතිශය ප්‍රසාද ජනක බලවත් ශ්‍රද්ධාවෙක් වන්නේ ය.

**පග්ගහ** නම් වීර්යය. සිථිල ද නො වූ අත්‍යාරබ්ධ ද නො වූ ප්‍රගෘහීත වීර්යයෙක් වන්නේ ය.

**උපට්ඨාන** නම් ස්මෘතිය. විදර්ශනා සම්ප්‍රයුක්ත වූ පර්වත රාජයක් සේ අචල සිහියෙක් වන්නේ ය.

**උපෙක්ඛා** නම් විදර්ශනා උපෙක්‍ෂාව හා ආවර්ජන උපෙක්‍ෂාවයි ද එ ද ඔහුට තියුණු වැ උපදින්නේ ය.

**නිකන්ති** නම් සිහින් තෘෂ්ණා යි. ඔභාසාදි සහිත විදර්ශනා වට ආලය කෙරෙමින් සිහින් වූ තෘෂ්ණාවෙක් වන්නේ ය. මේ නිකාන්තිය ම විදර්ශනොපක්ලේශ ය යි කිය යුතු ය. ඔභාසාදිය එයට වස්තු බැවින් උපක්ලේශ වි ය.

මේ ඔභාසාදිය උපන් කල "මට මෙයින් පෙර මෙබඳු ආලොකයෙක්, ඥානයෙක්, ප්‍රීතියෙක්, පස්සද්ධියෙක්, සුඛයෙක්, අධිමොක්‍ෂයෙක්, වීර්යයෙක්, ස්මෘතියෙක්, උපෙක්‍ෂාවෙක්, නූපන්නේ ය දැන් ඒ උපන්නේ ය. ඒකාන්තයෙන් මම මාර්ගය ලද්දෙමි. ඵලයට පැමිණියෙමි" යි ඔහුට අමාර්ගයෙහි මාර්ගසංඥාවෙක් අඵලයෙහි ඵලසංඥාවෙක් වන්නේ ය. ඉදින් යෝගී අව්‍යක්තයෙක් නම් මෙයින් අධිමාන වැ වැටෙයි. ව්‍යක්තයෙක් නම් එ විට ම සිහි උපදවා "හා මට ඒ ඔභාසාදියෙහි ම ය මගේ ම මාගේ ආත්මය යි නිකාමනාකාරයෙක් වෙයි. මේ ලෝකොත්තර ධර්මයෙක් නම් එ බන්දෙක් නො වන්නේ ය. එකාන්තයෙන් මේ උපන්නේ සංක්ලේශ ධර්මයෙකි. එය වැටුණොත් මට නිවන් මග ඇව්රෙයි. සසර මග හෙළිවෙයි. එහෙයින් එහි ලා තිලකුණු වඩා නිකාන්තිය දුරු කොටැ ගෙනැ විදර්ශනා වීථිය සලසා ගන්නෙමි"යි සිතා ඒ ඔභාසාදිය ම අනිත්‍ය දුඃඛ අනාත්ම වශයෙන් සලකන්නේ ය. එසේ සලකා ගන්නා ඥාණය මග්ගාමග්ගඤාණ දස්සන විසුද්ධිය යි දත යුතු. අමාර්ග වූ ඔභාසාදියෙහි මාර්ගසංඥා මලයෙන් ද යථෝක්ත නිකන්ති මලයෙන් ද පිරිසිදු වන බැවින් මේ මග්ගාමග්ගඤාණදස්සන විසුද්ධි නම් වේ.

දැන් මේ යෝගී දිට්ඨිවිසුද්ධියෙන් දුඃඛසත්‍යය ද, කංඛාවිතරණ විසුද්ධියෙන් සමුදය සත්‍යය ද, මග්ගාමග්ගඤාණ දස්සනවිසුද්ධියෙන් මාර්ග සත්‍යය ද ව්‍යවස්ථා කැරැ ගන්නා ලදැයි දත යුතු.

## ප්‍රශ්න.

1. උදය ව්‍යය යනු කිම?
2. ප්‍රත්‍යය වශයෙන් ද ක්‍ෂණ වශයෙන් ද උදයව්‍යය බලන සැටි දක්වනු.

3. සමපණ්ණස් උදයව්‍යය දක්වනු.
4. දශ විදර්ශනොපක්ලේශ විස්තර කරනු.
5. මග්ගාමග්ගඤාණදස්සන විසුද්ධිය තෝරනු.

## 17. පටිපදාඤාණදස්සන විසුද්ධිය.

මග්ගාමග්ගඤාණදස්සන විසුද්ධියට අනතුරු පටිපදා ඤාණදස්සන විසුද්ධියට පැමිණිය යුතු ය. පටිපදාඤාණදස්සවිසුද්ධි නම් උදයබ්බයානුපස්සනා ඤාණ, භඞ්ගානුපස්සනා ඤාණ, භයතුපට්ඨාන ඤාණ මුඤ්චිතුකම්‍යතා ඤාණ, පටිසඞ්කානුපස්සනා ඤාණ, සඞ්කාරුපෙක්ඛාඤාණ, සච්චානුලොමික ඤාණ යන නව විදර්ශනා ඥානයි. උදයව්‍යඥාන භඞ්ග ඥානාදි වශයෙන් යට දැක්වුණේ මේ ය.

### උදයබ්බයපස්සනා ඤාණය.

උදයබ්බයපස්සනා ඤාණය නම් උදය හා ව්‍යය බලන නුවණ ය. මේ ආදියෙහි ද ලද්දේ නො වේ ද? එසේ ය. ආදියෙහිද ලද්දේ ය. එහෙත් එය විදර්ශනෝපක්ලේශයන්ගෙන් කිලිටි විය. එ බැවින් යථාවසරසයෙන් ත්‍රිලක්‍ෂණ මෙනෙහි කළ නො හැකි විය. දැන් මේ උපක්ලේශයන්ගෙන් මිදුණු බැවින් මොනවට කළ හැකි ය. එ බැවින් ඒ සඳහා නැවත ද මේ යෝගය යි.

කුමක් මෙනෙහි නො කිරීම නිසා කුමකින් ප්‍රතිච්ඡන්න වීම නිසා ත්‍රිලක්‍ෂණ මනා වැ නො වැටහේ ද? උදයව්‍යය මෙනෙහි නො කිරීම නිසා සන්තතියෙන් ප්‍රතිච්ඡන්න වීම නිසා අනිත්‍ය ලක්‍ෂණය නො වැටහේ නිතර ඇති පීඩා මෙනෙහි නො කිරීම නිසා ඉරියව්වලින් ප්‍රතිච්ඡන්න වීම නිසා දුඃඛ ලක්‍ෂණය නො වැටහේ. නානා ධාතු විනිර්භෝගය මෙනෙහි නො කිරීම නිසා ඝනයෙන්ප්‍රතිච්ඡන්න වීම නිසා අනාත්ම ලක්‍ෂණය නො වැටහේ. දැන් ඒ යෝගී උපක්ලේශයන්ගෙන් මිදුණු වීථිප්‍රතිපන්න විදර්ශනා සංඛ්‍යාත උදයබ්බයපස්සනා ඤාණයෙන් ත්‍රිලක්‍ෂණ මනා වැ මෙනෙහි කරයි.

### භඞ්ගානුපස්සනා ඤාණය.

එසේ මෙනෙහි කොටැ නැවත නැවතත් අනිත්‍යය, දුඃඛය, අනාත්මය යි රූපා රූප ධර්ම පිරිසිඳුත් ඔහුගේ නුවණ තියුණු වෙයි. සංස්කාර වහ වහා වැටහෙයි. නුවණ තියුණුවත් ම සංස්කාර වහ වහා වැටහෙත් ම ඔහුගේ සිහිය උත්පාද, ස්ථිති, ප්‍රවෘත්ති නිමිත්තයෙහි නො සිටැ ක්‍ෂය ව්‍යය භේද නිරෝධයෙහි ම සිටින්නේ ය. එසේ භඞ්ගය දක්නා නුවණ භඞ්ගානුපස්සනා ඤාණය යි. හෙතෙම උපන් රූපාදීන්ගේ භඞ්ගය දැකැ ඒ රූපාදිය අරමුණු කොටැ උපන් චිත්තයන්ගේ ද භඞ්ගය දක්නේ ය. මහවැසි වස්නා කලැ

ගංතෙරක හෝ පොකුණු තෙරෙක හෝ සිටැ බලන්නෙකුට දිය බුබුළු නැග වහ වහා බිඳි බිඳී යනු පෙනෙයි. එමෙන් හෙතෙම සංස්කාරයන්ගේ භඞ්ගාවස්ථාව ම දක්නේ ය.

## භයතුපට්ඨාන ඥාණය.

එසේ භඞ්ගානුපස්සනා ඥාණයෙන් සියලු සංස්කාරයන්ගේ භඞ්ගය දකුත් දකුත් ඔහුට සංස්කාර සුවසේ ජීවත්වනු කැමැත්තකු හට සිංහ ව්‍යාග්‍ර කොටි වලස් යක්‍ෂ රාක්‍ෂසයන් මෙන් භය ජනක වැ වැටහෙන්නේ ය. 'අතීත සංස්කාර බිඳී ගියේ ය. වර්තමාන සංස්කාර මේ බිඳෙයි. අනාගත සංස්කාර ද මෙසේ ම බිඳී යන්නේ ය යි ඔහුට වැටහෙයි. පුතුන් තුන් දෙනෙකුන් ඇති ස්ත්‍රියකි. රජ පුතුන්ගේ ඉස් ගසා දමන්නට අණ කෙළේය. වධකයෝ ඇය බලා හින්ද දී ම එක් පුත්‍රයකුගේ හිස සින්දේ ය. දෙවැන්නා ගේ හිස මේ සිඳියි. ඕ තුන්වැන්නා කෙරෙහි දු අපේක්‍ෂාව හැරැ පියන්නී ය. ඒකාන්තයෙන් හිස සිඳින බැවිනි. මේ යෝගී ද අතීත සංස්කාර බිඳී ගියා දැකැ වර්තමාන සංස්කාර බිඳෙනු දැකැ අනාගත සංස්කාර කෙරෙහි ද බිඳෙති යි තීරණය කරන්නේ ය. මේ භයතුපට්ඨානය බිය වීමෙක් ම නො වේ. තීරණයෙකි. ගිනි වළක් දුටු නුවණැතියකු හට බිය මෙන් උපදින්නේ බිය ම නොවේ. මෙහි වැටී මිනිස්සු මැරෙති යි තීරණයෙකි. මේ ත් එබඳු ය යි දත යුතු.

## ආදීනවානුපස්සනා ඥාණය.

මෙසේ භයතුපට්ඨාන ඥාණයෙන් සංස්කාර බිය වශයෙන් දකුත් දකුත් ඔහුට භව ගතියෙහි සත්ත්වාවාස සංඛ්‍යාත කිසි තැනෙක්හි ත්‍රානයෙක් ලෙණයෙක් ප්‍රතිෂ්ඨාවක් ඇතැයි නො සිතෙන්නේ ය. කිසි තැනෙක කිසි සංස්කාරයෙක ප්‍රාර්ථනාවෙක් පරාමාසයෙක් නො වන්නේ ය. භවත්‍රය කකියන අඟුරු පිරුණ ගිනි වළක් මෙන් ද, සතර මහා භූත විෂඝොර සර්පයන් මෙන් ද පඤ්චස්කන්ධ කඩු අමෝරා ගත් වධකයන් මෙන් ද, ආධ්‍යාත්මික ආයතන ශූන්‍ය ගම් මෙන් ද, බාහිරායතන ගම් පහරන සොරුන් මෙන් ද, සප්ත විඥානස්ථිති හෝ නව සත්ත්වාවාස එකොළොස් ගින්නෙන් ඇවිල ගත්තාක් මෙන් ද, සියලු සංස්කාර ගඩ මෙන් රෝග මෙන් හුල් මෙන් ද නිරස වැ නීරස්වාද වැ මහා ආදීනව රාශියක් වැ වැටහෙන්නේ ය. සුවසේ ජීවත් වන කැමැති පුරුෂයකු වනයකට වන් කල ඔහුට වනය චණ්ඩ සතුන් සහිත මෙන්ද ගුහා කොටි වලස් සහිත මෙන් ද, ජලස්ථාන දිය රකුසන් ඇති තැන් මෙන් ද වැටහෙන්නේ ය. හේ බිය පත් වැ ඒ වනයෙහි ආදීනව ම දක්නේ ය. මේ යෝගී ද එසේ භය වශයෙන් දුටු සංස්කාරයන් කෙරෙහි ආදීනව දක්නේ ය. එසේ ආදීනව දක්නා නුවණ ආදීනවානුපස්සනා ඥාණය යි.

## නිබ්බිදානුපස්සනා ඥාණය.

ආදීනව දුටු ඒ සංස්කාරයන් කෙරෙහි ගවර වළෙහි ස්වර්ණ රාජ හංසයා සේ මේ යෝගී නො ඇලෙන්නේ ය. කලකිරෙන්නේ ය. එසේ නො ඇලීම් වශයෙන් කලකිරීම් වශයෙන් උපදනා නුවණ නිබ්බිදානුපස්සනා ඥාණය යි. නිබ්බිදා නම් උකටලු බව ය. කලකිරුම්

බව ය. හේ සංස්කාරයන් කෙරෙහි කලකිරෙමින් ම ශාන්ති පදයෙහි ඇලෙන්නේ ය. ඒ රාජ හංසයා චිත්‍රකූට පර්වතයෙහි මෙනි.

යට දැක්වුණ භයතුපට්ඨාන ඥානය ද, ආදීනවානුපස්සනා ඤාණය ද මේ නිබ්බිදානුපස්සනා ඤාණය ද යන ඥානත්‍රය ඛ්‍යඤ්ජන වශයෙන් වෙනස් වුව ද අර්ථ වශයෙන් එකෙක් ම යයි කියා තිබේ.

### මුඤ්චිතුකම්‍යතා ඤාණය.

එසේ කලකිරුණු ඒ යෝගී දැලෙහි බැඳුණු මත්ස්‍යයා ඒ දැලින් මෙන් ද ප්‍රඥාමුඛයට අසුවුණ මැඩියා ඒ සර්ප මුඛයෙන් මෙන් ද ඒ සියලු සංස්කාරයන් කෙරෙහි මිදෙනු කැමැති වන්නේ ය. එසේ මිදෙනු කැමැති වීම් වශයෙන් උපදනා ඥානය මුඤ්චිතුකම්‍යතා ඥානය යි.

### පටිසංඛානුපස්සනා ඤාණය.

එසේ මිදෙනු කැමැති වූ හෙතෙම මිදීමෙහි උපාය සෙවීම් වශයෙන් නැවත ඒ සංස්කාරයන් තිලකුණට නඟා මෙනෙහි කරන්නේ ය. සියලු සංස්කාර අනිත්‍යාන්තික හෙයින් තාවකාලික හෙයින් උත්පාද ව්‍යය පරිච්ඡින්න හෙයින් පලොක හෙයින් චල හෙයින් පභඞ්ගු හෙයින් අද්ධුව හෙයින් විපරිනාම ධර්ම හෙයින් අසාර හෙයින් විභව හෙයින් සංඛත හෙයින් මරණ ධර්ම හෙයින් අනිත්‍ය යයිද නිතර පීඩාකාර හෙයින් දුඃක්‍ෂම හෙයින් දුඃඛ වස්තු හෙයින් රෝග හෙයින් ගණ්ඩ හෙයින් සල්ල හෙයින් අඝ හෙයින් ජාති ධර්මාදි හෙයින් දුඃඛය යි ද අමිහිරි දුර්ගන්ධ පිළිකුල් ආදී හෙයින් අශුභය යි ද, හිස් හෙයින් ශූන්‍ය හෙයින් අස්වාමිකාදී හෙයින් අනාත්ම ය යි ද සලකන්නේ ය. එසේ සැලකීම් වශයෙන් උපදනා නුවණ පටිසංඛානුපස්සනා ඤාණය යි. මේ වනාහි මසුන් අල්ලන්නට ගිය මිනිසා කෙමන අටවා එහි සතකු අසු වූ බව දැන මසු ගන්මි යි අත පොවා ඔසවා බලා සොවැති දැකැ මසු ය යි ගත්තේ නයෙකැ යි දැනැ බිය වැ උගෙන් වන ආදීනව සලකා මිදෙනු කැමැති වැ ඉක්මන් නො වැ මිදීමෙහි උපාය සොයන්නාක් වැනි ය. හේ හීන් සීරුවේ නගුට අතින් ගෙනැ වෙලුම ලිහා අත ඔසවා තුන් යළක් හිස වට කරකවා “යා දුෂ්ට සර්පයැ”යි හඬ ගා වීසි කොටැ විල් ඉවුරට නැඟී ‘නපුරු සර්පයකුගෙන් මිදුනෙමි’යි ආ මග බලන්නේ ය.

### සංඛාරුපෙක්ඛා ඤාණය.

පටිසංඛානුපස්සනා ඤාණයෙන් යළි තිලකුණට නඟා මෙනෙහි කරනු ලබන ඒ සංස්කාරයන් කෙරෙහි බයක් හෝ ආලයක් හෝ නො කොටැ එහි උදාසීන වීම් වශයෙන් උපදනා නුවණ සංස්කාරුපෙක්ඛා ඤාණය යි. ඒ සංස්කාර කෙරෙහි උදාසීන වන්නේ එහි ශූන්‍යත්වය මෙනෙහි කිරීමෙනි. ශූන්‍යත්වය මෙනෙහි කිරීම ද දෙයාකාරයෙකින් ද සතර ආකාරයෙකින් ද ස ආකාරයෙකින් ද අට ආකාරයෙකින් ද දස ආකාරයකින් ද දොළොස්

ආකාරයකින් ද දෙසාළිස් ආකාරයකින් ද කළ යුතු ය. එසේ ශූන්‍ය වශයෙන් සලකා තිලකුණට නඟා මෙනෙහි කරන්නේ සංස්කාර කෙරෙහි මධ්‍යස්ථ වන්නේ ය. පණට මෙන් ප්‍රේම කළ භාර්යාව කෙරෙහි පසුවැ මධ්‍යස්ථ වන පුරුෂයා මෙනි. එක් පුරුෂයකුට භාර්යාවක් ඇත්තී ය. හේ ඇයට මහත් සේ ප්‍රේම කරයි. ඇය අන් පුරුෂයකු දෙස බැලීම හෝ ඔහුට වේදනා උපදව යි. එහෙත් ඕ පර පුරුෂයන් ම පතන්නී ය. පුරුෂයා ඇය කෙරෙහි කෝප වැ ඇය භාර්යත්වයෙන් බැහැර කෙළේ ය. ඉන් පසු ඇය රඟමඬලෙහි නටනු දුට ද ඔහුගේ සිත ඇය කෙරෙහි මධ්‍යස්ථ ය. විකෘති නැත. මේ ත් එබඳුය යි දත යුතු.

එසේ සංස්කාරයන් කෙරෙහි මධ්‍යස්ථ වූ ඔහුගේ සිත මදක් නැමුණු පියුම් පතෙක ජලය මෙන් භව යෝනි ගති ආදියෙහි නො ඇලෙයි. ගින්නෙහි කුකුළු පියාපත මෙන් හැකිලෙයි. එවිට ඔහුට සංඛාරුපෙක්ඛා ඥාණය උපන්නේ නම් වේ. **ත්‍රිවිධානුපස්සනා ත්‍රිවිධ විමොක්ෂමුඛ සප්ත ආර්ය පුද්ගල විභාගය වන්නේ මෙහිදී ය.**

යට දැක්වුණු මුඤ්චිතුකම්‍යතා ඥාණය ද පටිසංඛානුපස්සනා ඥාණය ද, මේ සංඛාරුපෙක්ඛා ඥාණය ද අර්ථ වශයෙන් එකෙක් ම ය යි කියා තිබේ. ආදියෙහි මුඤ්චිතුකම්‍යතා ඥාණ මධ්‍යයෙහි පටිසංඛානුපස්සනා ඥාණ, අන්තයෙහි සංඛාරුපෙක්ඛාඥාණ වශයෙනි.

මේ සංඛාරුපෙක්ඛා ඥාණයෙන් යුත් යෝගිහුගේ විදර්ශනා ශිඛා ප්‍රාප්ත ය. උට්ඨානගාමි ය. එහෙයින් මෙයට ශිඛා ප්‍රාප්ත විදර්ශන උට්ඨානගාමි විපස්සනා යන නම් කියනු ලැබේ. ශිඛා ප්‍රාප්ත නම් උතුම් බවට පැමිණි. වුට්ඨාන ගාමි නම් මාර්ගය කරා යන වුට්ඨාන යන්නෙන් මෙහි සෝවාන් ආදී මාර්ග කියනු ලැබේ. බාහිර නිමිති වලින් ද අධ්‍යාත්මික පැවතුම් වලින් ද නැගී සිටින බැවිනි.

## සච්චානුලොමික ඥාණය.

මේ සංඛාරුපෙක්ඛා ඥාණය වඩ වඩාත් ඒ යෝගීහට බලවත්තර ශ්‍රද්ධාධිමෝක්ෂයෙක් වේ. ඔහුගේ වීර්ය සූපගෘහිත වේ. ස්මෘතිය ද සූපස්ථිත වේ. චිත්තය සුසමාහිත වේ. සංඛාරුපෙක්ඛාව තීක්ෂණතර වේ. ඔහුට ඇසිල්ලෙකින් මාර්ග සිත උපදින්නේ ය යි කියයුතු අවස්ථාවට පැමිණේ. හේ ඒ සංඛාරුපෙක්ඛා සංස්කාරම අනිත්‍යය දුඃඛය අනාත්ම ය යි සම්මර්ශනය කරයි. ඔහුගේ සිත වෙන් වැ නම් කිවද මේ සිත් තුනට ම ආසෙවනය යි ද පරිකර්ම ය යි ද උපචාරය යි ද අනුලෝමය යි ද කිය යුතු ය. සච්චානුලොමික ඥාණය යනු මේ යි. කුමක් හෙයින් මෙයට ඒ නම කියත් ද? යට විපස්සනා ඥානාදී ඥාන අටට ද මතු සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන්ට ද අනුලොම් වන බැවිනි. රජෙක් විනිශ්චයකාරයකුගේ විනිශ්චයට සතුටු වන්නේ ඒ විනිශ්චයට ද පුරාණ රාජධර්මයට ද සතුටු වන්නේ ය. මේ ඥාණය රජු මෙනි. යට අෂ්ටඥාන විනිශ්චයකාර මෙනි. සත්සිත් බෝධිපාක්ෂික ධර්ම පුරාණ රාජ ධර්මය මෙනි.

මෙසේ උදයබ්බය ඤාණයෙහි පටන් මේ අනුලෝම ඤාණය දක්වා ඇති ඤාණ පරම්පරාව **පටිපදාඤාණ දස්සන විසුද්ධිය** යි දත යුතු.

### ප්‍රශ්න.

1. පටිපදාඤාණදස්සන විසුද්ධි යනු කිම?
2. පටිපදාඤාණදස්සන විසුද්ධියෙහි ඇතුළත් ඤාණ දක්වා එය සංක්ෂිප්ත කොට ද දක්වනු.
3. උදයව්‍යය ඤාණ, භඞ්ගඤාණ විස්තර කරනු.
4. භය ඤාණ, ආදීනව ඤාණ, නිබ්බිදා ඤාණ පැහැදිලි කරනු.
5. මුඤ්චිතුකම්‍යතාඤාණ, පටිසංඛාඤාණ, සංඛාරුපෙක්ඛා ඤාණ හඳුන්වා දෙන්න. අනුලෝම ඤාණය ද පැහැදිලි කරනු.

## 18. ඤාණදස්සන විසුද්ධිය.

### එකුන්විසි ප්‍රත්‍යවෙක්‍ෂාඥාන හා පුද්ගල භේද

මාර්ග වීථියෙහි අනුලෝමය දක්වා යට සඳහන් කරන ලදි. අනුලෝමයට අනතුරු ව උපදින්නේ ගොත්‍රභූ ඥානය යි. එය මාර්ගයට ආවර්ජන ස්ථානික ව උපදින බැවින් පටිපදාඤාණ දස්සන විසුද්ධියට ඇතුළත් නො වේ. මාර්ග නො වන බැවින් ඤාණදස්සන විසුද්ධියට ද ඇතුළත් නොවේ. ගොත්‍රභූඥානයට අරමුණු වනනේ නිර්වාණය යි. ගොත්‍රභූඥානය නිවන් අරමුණු කොට උපදින නමුදු ක්ලේශ ක්‍ෂය නො කෙරේ. එබැවිනි එය මාර්ග සංඛ්‍යාත ඤාණ දස්සන විසුද්ධියට ඇතුළත් නො වන්නේ. ඤාණදස්සන විසුද්ධි වන්නේ සෝතාපත්තිමග්ග ඤාණය යි. සෝතාපත්තිමග්ග ඤාණය සේ ම සකෘදාගාමි, අනාගාමි, අරහත්ත මග්ග ඤාණ ද ඤාණදස්සනවිසුද්ධි යි. එ බැවින් මාර්ගඥාන සතර ඤාණදස්සන විසුද්ධිය යි දත යුතු. තදනුකූල ප්‍රවෘත්ති වශයෙන් ඵලඥාන ද මෙහි ගැනේ.

එහි පිළිවෙලින් සතර මාර්ගඥාන ද ප්‍රත්‍යවෙක්‍ෂා ඥාන ද උපදින ක්‍රමය මෙසේ දතයුතු.

### සෝතාපත්ති මාර්ග ඥානය

යට දැක්වුණු සේ පිළිවෙලින් අනුලෝම ඥානය ලැබූ යෝගී හට නිර්වාණය අරමුණු වෙමින් ශ්‍රොත්‍රභූඥානය උපදින්නේ ය. පෘථග්ජන ගොත්‍රය මැඩ පියන බැවින් ද ආර්යගොත්‍රයට පමුණුවන බැවින් ද එයට ගොත්‍රභූය යි කියනු ලැබේ. එයට අනුතරු ව මැ මාර්ගය දුඃඛ සත්‍යය දන්මින් සමුදය සංඛ්‍යාත තෘෂ්ණාව දුරු කරමින් නිරෝධ සංඛ්‍යාත නිර්වාණය ප්‍රත්‍යක්‍ෂ කරමින් මාර්ග සංඛ්‍යාත ආර්ය අෂ්ටාංගික මාර්ගය වැඩීම්

වශයෙන් අර්පණා ප්‍රාප්ත වන්නේ ය. ආර්ය අෂ්ටාංගික මාර්ග සංඛ්‍යාත සෝතයට පළමු පැමිණීම හෙයින් මෙයට සෝතාපත්තිය යි ද එම නිර්වාණය මාර්ගනය කරන (දකින) බැවින් හෝ කෙලෙස් මරමින් යන බැවින් හෝ මාර්ගය යි ද කියනු ලැබේ. මාර්ගයට අනතුරුවැ ම ඒ නිර්වාණය ම අරමුණු කරමින් දෙතුන් ඵල සිත් කෙනෙක් ඉපිද භවාඞ්ග වන්නාහ. ඉක්බිති භවාඞ්ගය චලනය වැ උපච්ඡේද වැ මාර්ග, ඵල, නිර්වාණ, ප්‍රහීණ කෙලෙස්. ශේෂ කෙලෙස්, අරමුණු කොටැ මනොද්වාරාර්ජනයට අනතුරු වැ ප්‍රත්‍යවෙක්‍ෂා ජවන් පවත්නේ ය.

**"මග්ගං ඵලං ච නිබ්බාණං පච්චවෙක්ඛති පණ්ඩිතො**
**හීනෙ කිලෙසෙ සෙසෙ ච පච්චවෙක්ඛති වා න වා"**

ප්‍රාඥ වූ ආර්ය ශ්‍රාවක අධිගත මාර්ගය ප්‍රත්‍යවෙක්‍ෂා කරයි. ලත් ඵලය ප්‍රත්‍යවෙක්‍ෂා කරයි. අරමුණු වූ නිර්වාණය ප්‍රත්‍යවෙක්‍ෂා කරයි. ප්‍රහීණ වූ කෙලෙස් ප්‍රත්‍යවෙක්‍ෂා කරයි. ශේෂ වූ කෙලෙස් ප්‍රත්‍යවෙක්‍ෂා කරයි. මෙයින් මුල් තුන ඒකාන්ත වශයෙන් ද දෙවෙනි දෙක අනියම වශයෙන් ද ප්‍රත්‍යවෙක්‍ෂා කරන බව දත යුතු. සෝවාන් වූ මහානාමයන් තමාගේ කවර කෙලෙස් අප්‍රහීණ වී දැ යි බුදුන් විචාළේ එහෙයිනි. මේ පසින් එකක් හෝ ප්‍රත්‍යවෙක්‍ෂා කරන බව ඇතැම් තැන දක්වයි.

සෝවාන් මාර්ගඥානය ලබන්නා ම ඔහු පිළිබඳ සියලු ක්ලේශයන්ගේ අපායගාමී ශක්තිය සිඳෙන්නේ ය. සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාස යන සංයොජනත්‍රය මූලොච්ඡින්න වන්නේ ය. හේ ඉන්පසු මාතෘඝාතක, පිතෘඝාතක, අර්හත්ඝාතක, ලොහිතොතපාදක, භික්‍ෂුණීදූෂක, සංඝභේදක යන බලවත් අකුසල් කිරීමෙහි විශේෂයෙන් අභව්‍යයෙක් වන්නේ ය.

ඒ සෝවාන් පුද්ගලයා එකබීජී, කොලංකොල, සත්තක්ඛත්තු පරමය යි ත්‍රිවිධ වේ. එක් වරක් මතු උපදින්නේ එක බීජී ය. සත්වන වර දක්වා උපදින්නේ සත්තක්ඛත්තුපරමය. මේ දැ තුරේ උපදින්නේ කොලංකොල ය. මේ උපැද්ම ද කාමභවය ගෙනැ කියනු ලැබේ.

මන්‍දප්‍රාඥයාගේ වශයෙන් පරිකර්ම උපචාර අනුලෝම ගොත්‍රභූන්ට අනතුරු වැ මාර්ගය ලබා ඵල සිත් දෙකක් උපදී. තීක්‍ෂණ ප්‍රාඥයාගේ වශයෙන් උපචාර අනුලෝම ගොත්‍රභූන්ට අනතුරු වැ මාර්ගය ලබා ඵල සිත් තුනෙක උපදී. ගිනි ඉවත් කළ තැන දිය වත්කොට නිවීම මෙනි. මාර්ගයට අනතුරු ඵල. ඇසින් දුටු දේ වුව ද නැවැත සිහි කිරීම මෙනි ප්‍රත්‍යවෙක්‍ෂා.

### සකෘදගාමි මාර්ගඥනය.

සෝවාන් වූ ආර්යශ්‍රාවක ඒ ආසනයෙහි මැ හිඳැ හෝ පසු කලෙකැ හෝ තමා සතන්හි පවත්නා කාමරාග ව්‍යාපාද තුනී කැරැ ගැන්ම සඳහා දෙවන ලෝකෝත්තර ඥානය ලබා ගැන්ම සඳහා යළි උත්සාහ කරයි. හේ පෙර කී සේ ම විදර්ශනා වඩන්නේ පරිකර්ම

උපචාර අනුලෝම ගොත්‍රභූන්ට අනතුරු වැ දුඃඛ සත්‍යය දන්මින් සමුදය සංඛ්‍යාත තෘෂ්ණාව දුරුකරමින් නිරෝධ සංඛ්‍යාත නිර්වාණය සාක්‍ෂාත් කරමින් මාර්ග සංඛ්‍යාත ආර්ය අෂ්ටාංගික මාර්ගය වැඩීම් වශයෙන් සකෘදාගාමි මාර්ගය ලබන්නේ ය. මෙහි චතුස්සත්‍ය කෘත්‍ය පෙරට වඩා විශද බව දත යුතු යි. මෙහි ගොත්‍රභූ වොදානය යි කියනු ලැබේ. එයට ඉක්බිති ඵල සිත් දෙකක් හෝ තුනක් හෝ ඉපිද භවාඞ්ග වැ ප්‍රත්‍යවෙක්‍ෂා ජවන් වන්නේ ය. විස්තර යට කී පරිදි යි.

සකෘදාගාමි මාර්ගයෙන් එක ක්ලේශයෙකුදු මූලොච්ඡින්න නො වේ. එහෙත් කාමරාග ව්‍යාපාද තුනී වෙයි. මෝහය ද තුනී වෙයි. **"රාග දෝස මොහානං තනුකරත්තා"** යනු එහෙයින් කියන ලදි. සකෘදාගාමි යන්නෙහි අර්ථය වරක් එන්නේ යනුයි. පස්වැන්නාගේ වශයෙන් නම් ලැබිණ. විස්තර යට කියන ලදි. මෙහි දු මාර්ග, ඵල, නිර්වාණ, ප්‍රහීණ ක්ලේශ, ශේෂ ක්ලේශ, ප්‍රත්‍යවෙක්‍ෂා කිරීම් වශයෙන් ප්‍රත්‍යවෙක්‍ෂා ඥාන පසෙකි.

## අනාගාමි ඥානය.

සකෘදාගාමි ආර්ය ශ්‍රාවක ඒ ආසනයෙහි ම හිඳැ හෝ පසු කලෙක හෝ තමා සතන්හි තුනී වැ පවත්නා කාමරාග ව්‍යාපාද මූලොච්ඡින්න කරනු සඳහා-තෘතීය ලෝකෝත්තර ඥානය ලබා ගැනීම සඳහා උත්සාහ දරන්නේ පෙර සේ ම විදර්ශනා කොටැ පරිකර්ම උපචාර අනුලෝම ගොත්‍රභූ (වොදානය)න්ට අනතුරු වැ චතුස්සත්‍ය කෘත්‍ය සාදමින් අනාගාමී මාර්ගඥානය ලබන්නේ ය. එයට අනතුරු වැ අනාගාමි ඵල සිත් දෙකක් හෝ තුනක් හෝ ඉපිද භවාඞ්ග වැ පෙර සේ ම ප්‍රත්‍යවෙක්‍ෂා ජවන් දිවෙන්නේ ය. මෙහි චතුස්සත්‍ය කෘත්‍යය පෙරට ද වඩා විශදය. ප්‍රත්‍යවෙක්‍ෂා ඥාන ද පසෙකි.

අනාගාමි මාර්ගයෙන් පෙර තුනී වැ පැවැති කාමරාග ව්‍යාපාද මූලොච්ඡින්න වේ. හේ මෙහිදී රහත් වැ නො පිරිනිවියේ නම් පංචසුද්ධාවාසයෙහි ඉපිදැ එහි දී රහත් වැ පිරිනිවෙයි. ප්‍රතිසන්ධි වශයෙන් නැවත මෙහි නො එයි. අනාගාමි යන්නෙහි අර්ථ ද ඒ ය.

## අර්හත්මාර්ගඥානය.

අනාගාමි ආර්ය ශ්‍රාවක ඒ ආසනයෙහි ම හිඳ හෝ පසු කලෙක හෝ ස්වකීය සකලක්ලේශ මුලසුන් කරනු සඳහා චතුර්ථ මාර්ගඥානය ලබනු සඳහා උත්සාහ දරන්නේ පෙර සේ ම විදර්ශනා වඩා පරිකර්ම උපචාර අනුලෝම ගොත්‍රභූ (වොදානය)න්ට අනතුරු වැ සම්පූර්ණ චතුස්සත්‍ය කෘත්‍ය සාදමින් අර්හත් මාර්ගඥානය ලබන්නේ ය. එයට අනතුරු වැ අර්හත් ඵල සිත් දෙකක් හෝ තුනක් හෝ ඉපිද නිරුද්ධ වූ පසු ප්‍රත්‍යවෙක්‍ෂා ජවන් දිවෙන්නේ ය. මෙහි ප්‍රත්‍යවෙක්‍ෂා ඥාන සතරෙකි. මාර්ගය ප්‍රත්‍යවෙක්‍ෂා කරයි. ඵලය ප්‍රත්‍යවෙක්‍ෂා කරයි. නිර්වාණය ප්‍රත්‍යවෙක්‍ෂා කරයි. ප්‍රහීණ කෙලෙස් ප්‍රත්‍යවෙක්‍ෂා කරයි. ශේෂ කෙලෙස් නැති බැවින් ඒ ප්‍රත්‍යවෙක්‍ෂාවක් නැත. මහරහතන් වහන්සේ යනු මුන්වහන්සේ ය. මුන්වහන්සේ අන්තිම දෙහධාරී සේක. ඔහිතභාර සේක. අනුප්‍රාප්ත

ස්වර්ථ ඇති සේක. ක්‍ෂය කළ භවසංයෝජන ඇති සේක. කෘතකෘත්‍ය සේක. සකල ලෝකයා හට අග්‍රදක්ෂිණාර්හ වන සේක.

මෙහි පුද්ගල වශයෙන් සෝවාන් මාර්ගස්ථ ඵලස්ථාදි වශයෙන් අටදෙනෙකි. ප්‍රත්‍යවෙක්ෂාඥාන එකුන් විස්සෙකි.

**"ඡබ්බිසුද්ධික්කමෙනෙවං භාවෙතබ්බො චතුබ්බිධො**
**ඤාණදස්සන විසුද්ධි නාම මයග්ගා පවුච්චති."**

මෙසේ ෂට්විසුද්ධි යි ක්‍රමයෙන් ඉපදවිය යුතු චතුර්විධ මාර්ග ඥාන දර්ශන විශුද්ධිය යි කියනු ලැබේ. පුද්ගල භේදය ද මෙහි ම ඇතුළත් විය.

**ප්‍රශ්න.**

1. ඥාණදස්සන විසුද්ධි යනු කිම? එයින් කිමෙක් ගනු ලැබේද?
2. සතර මාර්ගඥාන ලැබෙන ක්‍රම දක්වා එකින් එකින්න ප්‍රහීණ වන කෙලෙස් ද දක්වනු.
3. ගොත්‍රභූඥානය කිසි විශුද්ධියකට ඇතුළත් නුවූයේ මන්ද? එයට අරමුණ කිම?
4. එකුන්විසි ප්‍රත්‍යවෙක්ෂාඥාන දක්වනු.
5. ආර්ය පුද්ගලයන් අටදෙන දක්වනු.

## 19. ලක්ෂණ, අනුපස්සනා, විමොක්ෂ, විමොක්ෂමුඛ.

අනිත්‍ය ලක්ෂණ, දුඃඛ ලක්ෂණ, අනාත්ම ලක්ෂණය යි ලක්ෂණ තුනෙකි. නිත්‍ය නො වන්නේ අනිත්‍ය ය. අනිත්‍යම ලක්ෂණ වන්නේ අනිත්‍ය ලක්ෂණ ය. සුඛ නො වන්නේ දුඃඛ ය. දුඃඛ ම ලක්ෂණ වන්නේ දුඃඛ ලක්ෂණ ය. ආත්ම නො වන්නේ අනාත්ම ය. අනාත්ම ම ලක්ෂණ වන්නේ අනාත්ම ලක්ෂණ ය.

අනිච්චානුපස්සනා, දුක්ඛානුපස්සනා, අනත්තානුපස්සනා යි. අනුපස්සනා තුනෙකි. සංස්කාර අනිත්‍ය වශයෙන් බැලීම-සිතීම-මෙනෙහි කිරීම අනිච්චානු පස්සනාය. දුඃඛ වශයෙන් බැලීම-සිතීම මෙනෙහි කිරීම දුක්ඛානුපස්සනා ය. අනාත්ම වශයෙන් බැලීම-සිතීම-මෙනෙහි කිරීම අනත්තානුපස්සනා යි.

සුඤ්ඤත විමොක්ෂ, අනිමිත්ත විමොක්ෂ, අප්පණිහිත විමොක්ෂය යි විමොක්ෂ තුනෙකි. සුඤ්ඤත විමොක්ෂමුඛ, අනිමත්ත විමොක්ෂමුඛ, අප්පණිහිත විමොක්ෂමුඛය යි විමොක්ෂමුඛ ද තුනෙකි. විමොක්ෂ නම් කෙලෙසුන් කෙරෙන් මිදීම ය. එනම් මාර්ග යි. මාර්ගා ගමන වශයෙන් ඵල ද මෙහි ඇතුළත් වේ. කෙලෙසුන් කෙරෙන් මිදීමට ද්වාර

වන්නේ උපකාර වන්නේ විමොක්ෂමුඛ ය. එ නම් අනුපස්සනා යි. ත්‍රෛභූමක සංස්කාර අනාත්ම ය යි බැලීමෙන් ආත්මාභිනිවෙශය හෙවත් ආත්මය යන දෘෂ්ඨිග්‍රහණය දුරු කරන්නේ ය. එබැවින් අනත්තානුපස්සනාව සුඤ්ඤත විමොක්ෂමුඛය යි එසේ ම ත්‍රෛභූමක සංස්කාර අනිත්‍ය ය යි බැලීමෙන් සංඥා චිත්ත දෘෂ්ටි විපර්යාස සංඛ්‍යාත විපල්ලාස නිමිති දුරු කරන්නේ ය. එබැවින් අනිච්චානුපස්සනාව අනිමිත්තවිමොක්ෂමුඛ යි. ත්‍රෛභූමක සංස්කාර දුඃඛය යි බැලීමෙන් තෘෂ්ණා ප්‍රාර්ථනා දුරු කරන්නේ ය. එබැවින් දුක්ඛානුපස්සනාව අප්පණිහිත විමොක්ෂ මුඛය යි.

මෙසේ හෙයින් යට දැක්වුණු ව්‍යුත්ථානගාමි සංඛ්‍යාත සානුලොම විදර්ශනාව සංස්කාර ධර්මයන් අනාත්ම වශයෙන් විදර්ශනා කෙරේ ද? එසේ විදර්ශනා කිරීමෙන් ලබන මාර්ගය සුඤ්ඤත විමොක්ෂ නම් වන්නේ ය. අනිත්‍ය වශයෙන් විදර්ශනා කෙරේ ද, එසේ විදර්ශනා කිරීමෙන් ලැබෙන මාර්ගය අනිමිත්ත විමොක්ෂ නම් වන්නේ ය. දුඃඛ වශයෙන් විදර්ශනා කෙරේ ද, එසේ විදර්ශනා කිරීමෙන් ලැබෙන මාර්ගය අප්පණිහිත විමොක්ෂ නම් වන්නේ ය.

ඒ ඒ මාර්ගයට අනතුරු වැ ලැබෙන ඵලය ද මාර්ගාගමන වශයෙන් සුඤ්ඤත විමොක්ෂ, අනිමිත්ත විමොක්ෂ, අප්පණිහිත විමොක්ෂ නම් වන්නේ ය. ඵල සමාපත්ති වීථියෙහි දී ලැබෙන ඵල සිත් විදර්ශනා ගමන වශයෙන් සුඤ්ඤත විමොක්ෂාදි නම් වන්නේ ය. ඵල සමාපත්ති වීථියෙහි මාර්ග ලාභයෙක් නැත. එබැවින් එහි මාර්ග ගමන වශයෙන් නම් නො ලැබේ. විදර්ශනා වශයෙන් ම නම් ලැබේ.

සප්ත ආර්ය පුද්ගල විභාගය ද මෙහි දී වන්නේ ය යි යට කියන ලදි. සුඤ්ඤත **විමොක්ෂයෙන් විමුක්ත** වූ ආර්ය ශ්‍රාවක ශ්‍රොතආපත්ති මාර්ගක්ෂණයෙහි **ධම්මානුසාරි** නම් වේ. සොතාපත්තිඵල සකෘදාගාමි මාර්ග ඵල අනාගාමි මාර්ග ඵල අර්හත් මාර්ග යන මේ මධ්‍ය මාර්ග ඵල සයෙහි **දිට්ඨිප්පත්ත** නමි. අර්හත් ඵල ක්ෂණයෙහි **පඤ්ඤාවිමුත්ත** නම් වේ. **අනිමිත්ත විමොක්ෂයෙන් විමුක්ත** වූ ආර්ය ශ්‍රාවක සොතාපත්ති මාර්ග ක්ෂණයෙහි **සද්ධානුසාරි** නම් වේ. මතු සත් තන්හි ම **සද්ධාවිමුත්ත** නම් වේ. අප්පණිහිත විමොක්ෂයෙන් විමුක්ත වූ ආර්ය ශ්‍රාවක අට තන්හි ම **කායසක්ඛි** නම් වේ. හේ ම අරූපධ්‍යාන පාදක කොටැ විමුත්ත වූයේ අර්හත් ඵලයෙහි **උභතොභාග විමුත්ත** නම් වේ.

තව ද කිය යුත්තෙක් ඇත. සුඤ්ඤත, අනිමිත්ත, අප්පණිහිත යන නම් නිර්වාණයට ද කියනු ලැබේ. නිර්වාණය සියලු සංස්කාරයන් කෙරෙන් ශූන්‍යහෙයින් සුඤ්ඤත ය. සියලු සංස්කාර නිමිත්ත රහිත හෙයින් අනිමිත්ත ය. තෘෂ්ණා ප්‍රණිධි රහිත හෙයින් අප්පණිහිත ය. පඨවිකසිණය අරමුණු කොටැ ලත් ධ්‍යානය පඨවි කසිණය යි කියන්නා සේ සුඤ්ඤතාදී නම් ඇති නිර්වාණය අරමුණු කොටැ ලත් මාර්ග ඵල සුඤ්ඤතවිමොක්ෂාදිය යි කිය හැකි ය. එවිට ඒ නම් සියලු මාර්ග ඵලයන්ට සාධාරණ ය. විදර්ශනා වශයෙන් ලැබුණු පරිදි විශේෂ නම් නො ලැබේය යි සේ යි.

තවද මාර්ගයන්ගේ කෘත්‍ය වශයෙන් බලත් හොත් එවිට ද මේ සුඤ්ඤත විමොක්ෂාදි නම් සියලු මාර්ග ඵලයන්ට සාධාරණය. ආත්ම ග්‍රහණය ගලවන බැවින් සියලු මාර්ග ඵල සුඤ්ඤත විමොක්ෂ ය. නිත්‍ය නිමිත්ත ගලවන බැවින් සියලු මාර්ග ඵල අනිමිත්ත ය. සුඛ ග්‍රහණය ගලවන බැවින් සියලු මාර්ග ඵල අප්පණිහිත යි.

මුල කී ක්‍රමය ආලම්බන වශයෙන් සුඤ්ඤත විමොක්ෂාදි නම් සියලු මාර්ග ඵලයන්ට සම වැ ලැබුණු සැටි ය. දෙවනු කී ක්‍රමය සරස වශයෙන් සම වැ ලැබුණු සැටි යි.

**ප්‍රශ්න.**

1. ලක්‍ෂණ තුන ද අනුපස්සනා තුන ද දක්වනු.
2. විමොක්ෂ තුන ද විමොක්ෂ මුඛ තුන ද දක්වනු.
3. සුඤ්ඤත විමොක්ෂාදි නම් මාර්ග ඵලයන්ට වෙන වෙන ම ලැබෙන සැටි ද සාධාරණ වැ ලැබෙන සැටි ද දක්වනු.
4. සප්ත ආර්ය පුද්ගල විභාගය කරනු.
5. සුඤ්ඤත විමොක්ෂාදී නම් ද ආර්ය පුද්ගල විභාගය ද වන්නේ කොතැන්හි ද?

## 20. සමාපත්ති භෙදය.

සමාපත්ති වනාහි ඵල සමාපත්ති, නිරෝධ සමාපත්තිය යි ද්විවිධ වේ. ඵල සමාපත්ති ඒ ඒ ඵල ලාභීන්ට සාධාරණ ය. සොතාපත්ති ඵල ලාභීන්ට සොතාපත්තිඵල සමාපත්තියට සම වැදිය හැකි ය. සකෘදාගාමි අනාගාමි අර්හත් ඵල ලාභීන්ට ඒ ඒ ඵල සමාපත්තින්ට සම වැදිය හැකි ය. එසේ සම වැදුණේ ඉදින් කැමැති නම් ආහොරාත්‍රයක් නිවන් සුව වළඳන්නේ ය. ඵල සිතට අරමුණු වන්නේ නිර්වාණය ම බැවිනි.

නිරෝධ සමාපත්තියට සම වැදිය හැක්කේ අෂ්ටසමාපත්තිලාභී අනාගාමීන්ට හා රහතන් වහන්සේට පමණකි. අනාගාමි හෝ රහත් හෝ වුව ද අෂ්ට සමාපත්ති නො ලද්දාහුට චිත්ත නිරෝධය කළ නො හැකි ය. අෂ්ට සමාපත්ති ලද ද සෝවාන් සකෘදාගාමි චිත්ත නිරෝධය කළ නො හැකිය. කාමරාග ප්‍රහීණ නො කළ බැවිනි. කාමරාගය ප්‍රහීණ කළ ධ්‍යානලාභී ආර්යයෝ ම නිරෝධයට සම වදිති. නිරෝධ සමාපත්ති නම් චිත්ත සන්තති ප්‍රවෘත්තිය වැළැක්ම ය. චිත්තය නැති බැවින් අරමුණෙක් කැල ම නැත. මෘත කලේබරයෙහි ද චිත්ත ප්‍රවෘත්ති නැත. එහෙත් එහි ඇස් ආදි සියල්ල දුර්වල වේ. ප්‍රතිභාවයට පැමිණේ. නිරෝධයට සම වන්නහුගේ ශරීරය විකෘති නො වේ. චිත්තය නො පවතින තව තැනෙක් නම් අසංඥතලය යි.

නිරෝධ සමාපත්තියට සම වදිනු කැමැති අනාගාමි හෝ අර්හත් බත් කිසෙන් පසු අත් පා මොනවට සෝදා ගෙනැ විවේකස්ථානයෙක හිඳ පළඟ බැඳ ගෙනැ පළමු කොටැ

ප්‍රථමධ්‍යානයට සම වැද එයින් නැඟී එහි සංස්කාර අනිත්‍යාදී වශයෙන් විදර්ශනා කරන්නේ ය. ඉක්බිති ද්විතීය ධ්‍යානාදියට ද පිළිවෙලින් සමවැද එසේ ම විදර්ශනා කොටැ ආකිඤ්චඤ්ඤායතනයට සම වදින්නේ ය. එයින් නැඟී විදර්ශනා කොටැ ඉක්බිති චතුර්විධ අධිෂ්ඨාන කරන්නේ ය. **චතුර්විධ අධිෂ්ඨානය නම් නානාබද්ධ අවිකොපන, සංඝපතිමානන, සත්‍ථුපක්කොසන, අද්ධාන පරිච්ඡෙද** යන මේ ය. සත් දවස තුළ තමා හා එකාබද්ධ නොවූ පා සිවුරු ඇඳ පුටු ගේ ආදි පිරිකර ගිනි දිය සොර සතුරු ආදීන්ගෙන් විනාශ නොවන සේ අධිෂ්ඨාන කිරීම **නානාබද්ධ අවිකොපන** ය. සත් දවස තුළ සඞ්ඝයාගේ වචනයෙන් අවුත් කැඳවීමට පළමු ම නැඟෙමි යි අධිෂ්ඨාන කිරීම **සංඝපතිමානන** ය. බුදුන්ගේ වචනයෙන් අවුත් කැඳවීමට පළමු ම නැඟෙමි යි අධිෂ්ඨාන කිරීම **සත්‍ථුපක්කොසන** ය. සත්දවස තුළ ආයුඃ සංස්කාරය පවතී දැයි බැලීම් **අද්ධාන පරිච්ඡේදය** යි. මේ විශේෂයෙන් බැලිය යුතු ය. නො බලා සම වැදුණ ද මරණය වැළකිය හැකි නො වේ. නිරෝධ සමාපත්තිය තුළ මරණය ද සිදු නො වේ. එබැවින් ඉන් මොබ නිරෝධයෙන් නැඟීම වෙයි.

මෙසේ අධිෂ්ඨාන කොටැ ඉක්බිති නේවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තියට සම වදින්නේ ය. එහි අර්පණා ජවන් එකින් දෙකින් පසු අචිතනක වේ. නිරෝධයට සම වැදුණේ වේ. එයින් නැඟෙන කල්හි අනාගාමීන්ට අනාගාමි ඵල සිත ද, රහතන්ට අර්හත් ඵල සිත ද, එක් වරක් ම ඉපිද භවාඞ්ග වන්නේ ය. භවාඞ්ගයෙන් නැඟී නේවසඤ්ඤානාසඤ්ඤායතන චිත්තයෙහි චිත්ත චෛතසික ධර්මයන් ප්‍රත්‍යවේක්‍ෂා කරන්නේ ය. ඵල ප්‍රත්‍යවෙක්‍ෂා කරන්නේ ය යි. ඇතැම්හු කියත්.

**ප්‍රශ්න.**

1. සමාපත්ති කී වැදැරුම් ද?
2. ඵලසමාපත්ති පැහැදිලි කරනු.
3. නිරෝධ සමාපත්තිය යනු කිමෙක් ද? එය කවුරුන් විසින් ලැබිය හැකි ද? හේතු කිම?
4. චතුර්විධ අධිෂ්ඨාන විස්තර කරනු.
5. නිරෝධයෙන් නැඟෙත් ම උපදින සිත කිමෙක් ද? ඉක්බිති කිමෙක් වේ ද?

**විදර්ශනා කර්මස්ථානය යි.**

**"භාවෙතබ්බං පනිච්චෙවං භාවනාද්වය මුත්තමං**
**පටිපත්තිරසස්සාදං පත්‍ථයන්තෙන සාසනෙ."**

බුද්ධශාසනයෙහි ප්‍රතිපත්ති රසාස්වාදනය පතන යෝගී විසින් මේ සමථ විදර්ශනාභාවනාද්වය යට දැක්වුණු පරිද්දෙන් වැඩිය යුතු යි.

**නව වන කර්මස්ථාන පාදය නිමි.**

**මාතර වල්පොළ සිරි මංගල පිරිවෙනෙහි ආචාර්ය පණ්ඩිත මාතර ශ්‍රී ධර්මවංශ ස්ථවිර ස්වාමීන් කළ අභිධර්මචන්ද්‍රිකා පොත යි.**